# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2013

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්

ප්‍රකාශයට පත් කරන ලදී

2014

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය විසින් සම්පාදනය කොට කෘෂිකර්ම මුද්‍රණ ඒකකය මගින් මුද්‍රණය කරන ලදී.

සියලුම හිමිකම් ඇවිරිණි. විවේචනය හා පුනරීක්ෂණය සඳහා කෙටි වාක්‍ය ඛණ්ඩවල උපුටා ගැනීම් හැරුණුවිට, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ණ අනුමැතියෙන් තොරව, නැවත ඉදිරිපත් කිරීම, පුනරුත්පාපනය කළ හැකි වන සේ ගබඩා කර තැබීම, විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාස්ථිත, පටිගත කිරීම හෝ වෙනත් ක්‍රම උපයෝගී කරගනිමින් සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ. අසාධාරණයක් නොවන පරිදි වාණිජ නොවන ස්වරූපයේ කටයුතු සඳහා මෙම අවසරය ලබාදීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන ප්‍රකාශන වල, වාණිජ නොවන, කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේදී ගාස්තු ගෙවීම අනවශ්‍යවේ. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණාත්මක සොයාගැනීම් සඳහා අව්‍යාජව යොදා ගැනීමට මෙම හිමිකම් ඇවිරීමේ ප්‍රකාශය බාධාවක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# ඉදිරිදැක්ම

ජාතියේ සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

# මෙහෙවර

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශ්වකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්කර ගැනීම.

# අධ්‍යක්ෂ මණ්ඩලය

ආචාර්ය ආර්.ආර්. ඒ. විජේකෝන් මයා - කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

ඩබ්. ජී. එම්. ජී. දයාවංශ මයා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)

ආචාර්ය ඊ. එම්. දසනායක මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ)

එච්. පී. ඩී. එම්. සරච්චන්ද්‍ර මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)

ටි. එච්. සී. එස්. පෙරේරා මයා - අධ්‍යක්ෂ (සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය)

ඩී. ජේ. එල්. සුනිල් ගෝවින්න මයා - අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය)

කේ. බී. වහුන්දෙණිය මයා - අධ්‍යක්ෂ (උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය)

ආචාර්ය ඩබ්. එම්. ඒ. ඩි. බි. වික්‍රමසිංහ මයා - අධ්‍යක්ෂ

(ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය)

එස්. ඩබ්. අබේසේකර මයා - අධ්‍යක්ෂ (වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය)

ආචාර්ය ඩබ්. එම්. ඩබ්. වීරකෝන් මයා - අධ්‍යක්ෂ

(ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය)

ආර්. එස්. විජේසේකර මයා - අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය)

ආචාර්ය එච්. එම්. එස්. හින්කෙන්ද මයා - අධ්‍යක්ෂ (පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය )

ඩබ්. ඒ. ජී. සිසිර කුමාර මයා - අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය)

පරාක්‍රම ප්‍රේමරත්න මයා - ප්‍රධාන ගණකාධිකාරි

එම්. එච්. එම්. ඒ. බණ්ඩාර මයා - ප්‍රධාන ඉංජිනේරු

කේ. උපාලි රණවක මයා - අධ්‍යක්ෂ (පාලන)

**ප්‍රධාන උපදේශකත්වය**

ඩබ්. ජී. එම්. ජී. දයාවංශ

**සංස්කරණය**

ආචාර්ය ඊ. එම්. දසනායක

ආචාර්ය කීර්ති හෙට්ටිආරච්චි

ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ

පී. සී. පිරිස්

කේ. එන්. එස්. රණතුංග

**සම්බන්ධීකරණය**

පී. සී. පිරිස්

එච්. එම්. ආර්. බණ්ඩාර

ඊ. එම්. අයි. සී. කේ. වේරපිටිය

**පරිවර්තනය හා සෝදුපත් කියවීම**

ඩබ්. ඒ. ඩී. නිරංජලා

ඊ. එම්. එස්. කේ. ඒකනායක

ඒ. එම්. එන්. විජයතිලක

**යතුරු ලියනය සහ පිටු සැකසුම**

කේ. ජේ. මධුභාෂිණී ජයසිංහ

**පිටකවරය නිර්මාණය**

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

# පටුන


පෙරවදන ..... viii
1.1 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහ ඉලුප්පල්ලම ..... 1
1.1.1 මාෂ බෝග සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණකොළපැලැස්ස ..... 17
1.1.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල ..... 29
1.1.3. කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චිය ..... 35
1.2 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නොරුව ..... 39
1.2.1 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නොරුව ..... 65
1.2.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල ..... 69
1.2.3 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර ..... 77
1.2.4 කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - සීතා එළිය ..... 85
1.2.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල ..... 93
1.2.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ ..... 99
1.3 පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය - හොරණ ..... 103
1.3.1 පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - ගන්නොරුව ..... 121
1.3.2 පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම ..... 127
1.4 වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - බතලගොඩ ..... 135
1.4.1 කලාපීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල ..... 157
1.5 ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය ..... 165
2.1 බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව ..... 181
2.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නොරුව ..... 187
2.1.2 පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නොරුව ..... 201
2.1.3 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය ..... 207
2.1.4 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නොරුව ..... 221
2.2 ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක ..... 227
2.3 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය ..... 233
2.4 සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය ..... 249
3.1 ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය ..... 255
3.2 තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය - පේරාදෙණිය ..... 281
4.1 පාලන අංශය ..... 293
4.2 ඉංජිනේරු අංශය - පේරාදෙණිය ..... 301
4.2.1 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය - මහ ඉලුප්පල්ලම ..... 307
4.3 මුදල් අංශය - පේරාදෙණිය ..... 311
4.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය ..... 315
5. කාලගුණ වාර්තාව ..... 323
6. ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම් ..... 337
7. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය (2013.12.31 දිනට) ..... 347
8. තාක්ෂණික කාර්ය මණ්ඩල සුදුසුකම් ..... 373
9. කාර්ය මණ්ඩල ස්ථාපිතය ..... 375

# පෙරවදන

සියවසකට අධික අභිමානවත් ඉතිහාසයක් ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ වගකීම දරන ප්‍රධාන ආයතනය වන අතර දීප ව්‍යාප්තව විහිදි ආයතන, මධ්‍යස්ථාන හා ඒකක 192කින් හා 10,000කට අධික කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

මෙම කාර්ය සාධන වාර්තාව මගින් 2013 වසර තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවා අංශ 10 හා ආධාරක සේවා අංශ 03 මගින් ඉටුකරන ලද කාර්යයන් ඉදිරිපත් කර ඇත. මෙහි සඳහන් තොරතුරු ඉදිරි කටයුතු සැලසුම් කිරීම සඳහා පර්යේෂකයින්ට මෙන්ම ප්‍රතිපත්ති හා නීති සම්පාදකයන්ට ද මගඟු අත්වැලක් වනු ඇත.

2013 වසර සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලද සමස්ත ප්‍රතිපාදනය රුපියල් මිලියන 3,880ක් වූ අතර එයින් රුපියල් මිලියන 450කට අධික මුදලක් බීජ නිෂ්පාදනය හා මිලදී ගැනීම සහ ගොවිපළ සංවර්ධනය සඳහා වැය කරන ලදී.

කෘෂිකර්මාන්තය තරුණ ආකර්ෂණය හා පිළිගැන්මක් සහිත ලාභදායී, අධි තාක්ෂණික හා පරිසර හිතකාමී කාර්මාන්තයක් බවට පත් කරලීම අරමුණු කොට ගෙන හරිත විප්ලවයෙන් ශ්වේත ආරක්ෂිත ගෘහ පදනම් කර ගත් කෘෂිකර්මාන්තයේදී මෙන් වසර පුරා අඛණ්ඩ නිෂ්පාදනයක් කළ හැකි ශ්වේත විප්ලවයක් කරා යන ගමනේ ඉදිරි පියවර තබමින් 2013 වසරේදී නව වී ප්‍රභේද 3ක් සහ නව එළවළු ප්‍රභේද 4ක් ජනනය කර 2012 වසරට සාපේක්ෂව සහතික කළ අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදනය 16%කින් ද එළවළු බීජ නිෂ්පාදනය 50%කින් ද වැඩි කිරීමට සමත් විය.

නව තාක්ෂණය ගොවි ජනතාව වෙත බෙදාදීම වැඩිදියුණු කිරීම සඳහා නව කෘෂි සේවා පියස 04ක් ස්ථාපිත කරන ලද අතර කාන්තා කෘෂි ව්‍යවසායකත්වය වැඩිදියුණු කිරීම මෙන්ම දේශීය ආහාර ප්‍රචලිත කිරීම අරමුණු කොට ගෙන නව හෙළ බොජුන් අලෙවි පියසි 02ක් පේරාදෙණියේ හා බටඅත ස්ථාපිත කරන ලදී. 2013 වසරේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේ හොඳම ප්‍රදර්ශන කුටියට හිමි සම්මානය ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හිමි විය. 2013 වසරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලද තවත් ජයග්‍රහණයක් වූයේ වසර ගණනාවක් පුරා පැවති දැඩි කාර්ය මණ්ඩල හිඟය මග හරවා ගනිමින් වසරක් තුළ සිදුකළ වැඩිම බඳවා ගැනීම් සංඛ්‍යාව සිදු කිරීමයි.

මෙවන් ප්‍රගතියක් හා ජයග්‍රහණ රැසක් අත්කර ගැනීමට දායක වූ දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ කැපවීම හා සහයෝගය වෙනුවෙන් මාගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරමි. එමෙන්ම විවිධ දුෂ්කරතා මධ්‍යයේ මෙම වාර්තාව සම්පාදනය හා සංස්කරණය කර එළිදැක්වීමට දරන ලද ප්‍රයත්නය වෙනුවෙන් ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකයේ කාර්ය මණ්ඩලයටද පරිවර්තන කටයුතු සිදුකළ නිලධාරීන්ටද මාගේ ස්තුතිය පළකරමි.



ආචාර්ය රොහාන් විජේකෝන්
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

# 1.1 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහ ඉලුප්පල්ලම

මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ එහි අනෙකුත් සහායක ආයතන බෝග ප්‍රභේද සහ ඒ හා සම්බන්ධ තාක්ෂණයන් වැඩිදියුණු කිරීම සහ මූලික වශයෙන් ඒ හා සම්බන්ධ උනන්දුවක් දක්වන්නා වූ අනෙකුත් පාර්ශ්වයන්හට එම තාක්ෂණයන් සහ බෝග ප්‍රභේදයන් ලබාදීම වැනි කාර්යයන් පිළිබඳව වගකීම දරයි. මෙයට අමතරව මෙම ආයතනය යටතට පවරා අධීක්ෂණය යටතේ වූ සියළුම බෝගවල මූලික බීජ ප්‍රමාණවත් ප්‍රමාණවලින් නිපදවීමද කලාපීයව වැදගත් වී සහ වියළි කලාපීය පලතුරු සහ එළවළුවල ඵලදායීතාවය ඉහළ නැංවීමේ කටයුතුද සිදු කරයි. සියලුම වියළි කලාපීය ආහාර බෝගවල ස්ථානීය සංරක්ෂණය සහ සියළුම දේශීය පලතුරු බෝගවල සහ එළවළු ජනකප්ලාස්ම උපයෝගීකර ගැනීමද මෙම ආයතනය සතු වගකීමකි.

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතන පද්ධතිය, මහ ඉලුප්පල්ලම ප්‍රධාන පර්යේෂණ ස්ථානය, අඟුණකොළපැලැස්ස මාෂ සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අරලගංවිල සහ කිලිනොච්චි පිහිටි කලාපිය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, තිරුනෙල්වේලි, වවුනියාව, කරදියනාරු පිහිටි කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සහ මුලතිවු කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය යන ආයතනයන්ගෙන් සමන්විත වේ.

## අයවැය

**වගුව 1.1.1: වාර්ෂික අයවැය ලේඛනය 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 26,014,207 | 22,314,567 | 86 |
| පුනරාවර්තන | 30,963,654 | 30,341,903 | 98 |
| **ව්‍යාපෘති** | | | |
| අමුමිරිස්, බඩඉරිඟු සහ ලූනු දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම | 65,000,000 | 39,720,469 | 61 |
| ජා.කෘ.ප. ව්‍යා. | | | |
| i. ලූනු | 1,000,000 | 920,310 | 92 |
| ii. අමුමිරිස් | 1,000,000 | 965,744 | 97 |
| iii. ජල කළමනාකරණය | 1,928,000 | 1,533,930 | 80 |
| iv. එළවළු | 200,000 | 167,097 | 84 |
| අ.කෘ.කො.ව්‍යා. (KOPIA) | 3,131,000 | 1,113,759 | 36 |
| **එකතුව** | **129,236,861** | **97,104,779** | **75** |

## ප්‍රගතිය

# භෝග ප්‍රවර්ධනය

## කුළුබඩු

### මිරිස්

**මිරිස් දෙමුහුම් ප්‍රභේද සංවර්ධන වැඩසටහන**

- **ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා F1 දෙමුහුම්**
  ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් යටතේ දේශීය F1 දෙමුහුම් 18ක් පරීක්ෂා කරනු ලැබූ අතර F1 දෙමුහුම් 6ක් අත්හදා බැලීම් සඳහා තෝරා ගනු ලැබිණි.
- **නව F1 මුහුම්කරණ**
  නව F1 මුහුම්කරණ 20ක් සිදුකරනු ලැබූ අතර ක්ෂේත්‍ර ඇගයීම සඳහා බීජ නිෂ්පාදනය කරනු ලැබිණි.
- **මව් ආර වැඩිදියුණු කිරීම**
  වඩාත් උසස් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සහිත පරම්පරා 150ක් F4 පරම්පරාව දක්වා උසස් කරනු ලැබූ අතර වඩාත් උසස් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සහිත පරම්පරා 25ක් F2 පරම්පරාව දක්වා වැඩිදියුණු කෙරිණි.
- **පුං වඳ ආර වැඩිදියුණු කිරීම**
  බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් මව් ආර 5ක් පුං වඳ ආර සමඟ මුහුම් කිරීම සිදු කරනු ලැබූ අතර පළමු පිළිදෙමුහුම සම්පූර්ණ කරනු ලැබීය.
- **විදේශීය මිරිස් දෙමුහුම් ඇගයීම**
  විදේශීය මිරිස් දෙමුහුම් 25ක් අගයනු ලැබූ අතර විදේශීය දෙමුහුම් මිරිස් 5ක් දේශීය තත්ත්වයන් යටතේ අනුවර්තීබව හඳුනාගනු ලැබිණි.

**මිරිස් විවෘත පරාගන ප්‍රභේද සංවර්ධන වැඩසටහන**

- **මිරිස් විවෘත පරාගන ප්‍රභේද නිෂ්පාදනය**
  F1පරම්පරාව
  F1 නව මුහුම්කරණ (තනි, ද්විත්ව සහ ත්‍රිත්ව මුහුම්කරණ) 30ක් සිදු කරනු ලැබූ අතර ක්ෂේත්‍ර ඇගයීම උදෙසා බීජ නිෂ්පාදනය කෙරිණි.
  කොච්චි සමඟ F1 නව මුහුම්කරණ 8ක් සිදු කරනු ලැබූ අතර පත්‍ර කොඩවීමට ප්‍රතිරෝධී ලක්ෂණ ලබාදීම උදෙසා කලල වෙන් කර වෙනම මාධ්‍යයක වගා කිරීමේ තාක්ෂණය සිදු කෙරෙමින් පවතී.
  වෛරස් ප්‍රතිරෝධීතා ලක්ෂණ MI -1 ප්‍රභේදයට හඳුන්වාදීම උදෙසා “වැරනියා” ප්‍රභේද, MI -1 ප්‍රභේද සමඟ මුහුම්කරණ සහ පිළි දෙමුහුම් සිදු කරනු ලැබීය. අධ්‍යනයන් අඛණ්ඩව සිදු වේ
- **F2 පරම්පරාව**
  වඩාත් උසස් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සහිත තෝරාගත් ගහන 17ක් ක්ෂේත්‍ර ඇගයීම උදෙසා උසස් කරනු ලැබිණි.
- **“වැරනියා” ප්‍රභේද පාරිශුද්ධකරණය, වරණය සහ ඇගයීම**
  “වැරනියා ග්‍රීන්” වර්ගයේ ගහනය වෙන් කිරීමෙන් පැළ තෝරා ගනු ලැබිණි. පාරිශුද්ධකරණ වැඩසටහන සඳහා පැළ 60ක් තෝරා ගනු ලැබිණි
- **දේශීය මිරිස් වගා දර්ශ නඩත්තුව සහ ඇගයීම**
  යාපනය වරණයහි සහ හේන් මිරිස් අපේක්ෂිත ලක්ෂණ පැළ විශාල ලෙස තෝරා ගැනිණි. වෙනත් ප්‍රභේදීයන් ඉවත් කරනු ලැබීය.
- **MI – 02 ප්‍රභේදය පාරිශුද්ධකරණය**
  වෙනත් ප්‍රභේද වර්ග ඉවත් කරනු ලැබූ අතර MI – 02 ප්‍රභේදයේ ජානමය නුමුහුම්බව ඒ ආකාරයෙන්ම පවත්වා ගැනිම උදෙසා එක සමාන ලක්ෂණ සහිත පැළ තෝරා ගනු ලැබිණි.
- **බලාපොරොත්තු තැබිය හැකි මිරිස් ආර**
  බලාපොරොත්තු තැබිය හැකි PC 1 මිරිස් ආරය අමුමිරිස් සහ වියළි මිරිස් යන දෙකම සඳහා යෝග්‍ය වේ. මෙය ලා කොළ පැහැති අධික සැරක් සහිත කෙටි

කේතු ආකාර හැඩති කරල් වලින් සමන්විතය. මෙමගින් අමුමිරිස් හෙ/ටො 15කට වැඩි අස්වැන්න ප්‍රමාණයක් ලබාගත හැකි බව පෙන්නුම් කෙරිණි. මෙම ආරය ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

## ලූනු

- ප්‍රභේද ප්‍රවර්ධන වැඩසටහනේ දී "දඹුල්ල වරණයට" වඩා ඉහළ සුවිශේෂී ආරයක් හඳුනාගනු ලැබිණි. ප්‍රතිඵල තහවුරු කිරීම සිදුකෙරෙමින් පවතී.
- ලූනුවල ප්‍රභේද වැඩිදියුණු කිරීමේදී බල්බ ගබඩාකිරීමේ හැකියාව ඉතාමත් වැදගත් සාධකයකි. අගයනු ලැබූ ආර 18ක් අතුරෙන් නිර්දේශිය "දඹුල්ල වරණය" ප්‍රභේදයට වඩා ලොකු ලූනු ආර 4ක් ගබඩා කිරීමේ හැකියාව වැඩි බව පෙන්නුම් කෙරිණි.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සිදු කරනු ලැබිණි. අනුවර්තිත ප්‍රභේද හඳුනාගනු ලැබිණි.
- මුහුම්කරණ වැඩසටහනේදී F2 පරම්පරාවේ කුල 10ක් F3 පරම්පරාව දක්වා උසස් කරනු ලැබිණි. නව F1 පරම්පරා 2ක් වැඩිදියුණු කෙරිණි.
- ලූනු විකෘතිවල විචල්‍යතාවයන්ගේ විවිධත්වය වැඩිකිරීම උදෙසා රසායනික ක්‍රම මගින් විකෘති ඇතිවීම ප්‍රේරණය කෙරිණි. පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.
- විදේශීය ප්‍රභේදයන් ගොවීන්ට හඳුන්වාදීමට පෙර දේශීය පාරිසරික තත්ත්වයන් යටතේ එම ප්‍රභේද වගා කිරීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබිය යුතුය. 2013 යල කන්නයේදී ඇගයීමට භාජනය කළ විදේශීය ලොකු ලූනු ප්‍රභේද 8ක් අතුරෙන් ප්‍රභේද 2ක් දඹුල්ල වරණයට සමාන අස්වැන්නක් ලබාදුණි.
- පොකුරු ලූනු ආර 17ක් ඇගයීම සහ වරණය උදෙසා සිදුකළ පරීක්ෂණයන්හිදී ආර 4ක අස්වැන්න නිර්දේශිත "වේදලාන්" සහ "තින්නවෙලි රතු" යන ප්‍රභේදයන්ට වඩා වැඩි අස්වැන්නක් ලබාදුණි. ප්‍රතිඵල තහවුරු කිරීම උදෙසා පරීක්ෂණ නැවත සිදු කරනු ලබයි.
- බීජ හටගන්නා පොකුරු ලූනු ප්‍රභේද වැඩිදියුණු කිරීම කාලීන අවශ්‍යතාවයකි. පාලක "වේදලාන්" ප්‍රභේදය සමඟ බීජ හටගන්නා පොකුරු ලූනු ආරයන් එහි බීජ නිපදවීමේ හැකියාව පරීක්ෂා කිරීම උදෙසා අගයනු ලැබීය. එම ආරය "වේදලාන්" ප්‍රභේදයට වඩා වැඩි අස්වැන්නක් ලබාදුණි.
- අනුවර්තී ප්‍රභේද හඳුනාගැනීම උදෙසා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කරනු ලැබිණි.
- ලූනු වගාව සඳහා පසෙහි ලවණතාවය ඉතා දැඩි බලපෑමක් ඇති කරයි. වියළි කලාපයේ අධික ජල ප්‍රමාණයක් සහිත වාරික්‍රමය හේතුවෙන් මෙම ලවණතා තත්ත්වය ඉහළ නැගිය හැකි අතර එමගින් අඩු අස්වැන්න ප්‍රතිඵල කරයි. කුඹුරුවල ලවණතාවය අඩු කිරීම උදෙසා බාගෙට පිලිස්සූ දහයියා උපයෝගී කරගනු ලබයි. බල්බ සහ බීජ නිෂ්පාදනය යන දෙකම උදෙසා දඹුල්ල වරණය ලූනු ප්‍රභේදය, පාත්තියේ විවිධ ගැඹුරු මට්ටම්හිදී බාගෙට පිලිස්සූ දහයියාවල බලපෑම අධ්‍යනය කිරීම උදෙසා පරීක්ෂණයක් සැලසුම් කරනු ලැබිණි. 2013 යල කන්නයේදී මෙම පරීක්ෂණය ආරම්භ කරනු ලැබූ අතර 2015 යල කන්නය දක්වා පරීක්ෂණ අඛණ්ඩව සිදු කරනු ලබයි.
- ලූනු වල බල්බ ඇතිවීමේ හැකියාව රතු පැහැය මත පදනම් වේ. විශේෂයෙන් ආලෝකය ලැබෙන කාලයේදී මෙම රතු පැහැය ලබාදීම ඉතාම වැදගත් වේ. එමනිසා ලූනු බල්බ සහ බීජ නිෂ්පාදනයේදී වැසි ආවරණයන් ලෙස සුදු විනිවිද පොලිතීන් වලට වඩා පාට පොලිතීන් යොදා ගැනීමේ

ඵලදායීතාවය පරීක්ෂා කිරීම උදෙසා 2013 යල කන්නයේදී පරීක්ෂණයක් සිදු කරනු ලැබිණි. මෙම පරීක්ෂණ 2014/15 මහ කන්නය තෙක් ක්‍රියාත්මක වේ.

## රළු ධාන්‍ය

### බඩඉරිඟු

- ඉන්දුනීසියානු විවෘත පරාගන ප්‍රභේදයක් වන "Srikandikuning MIOPV1" ප්‍රභේදය, ගොවි ක්ෂේත්‍රයන්හිදී හෙ/ටො 4-5 අතර අස්වැන්නක් "රුවන්" පරීක්ෂණ ප්‍රභේදය හා සමානවම ලබාදුණි.
- මෙක්සිකෝවේ අන්තර්ජාතික බඩඉරිඟු සහ තිරිඟු ප්‍රවර්ධන මධ්‍යස්ථානයෙන් (CIMMYT : International maize and Wheat Improvement Center) බඩඉරිඟු ප්‍රභේද 6ක් ලැබිණි. මෙම දෙමුහුම් ප්‍රභේද වාණිජමය පරීක්ෂණ දෙමුහුම් ප්‍රභේද හා සමානවම හෙ/ටො 6-7 අතර අස්වැන්නක් ලබාදුණි. මෙම දෙමුහුම් 6හි නුමුහුම් මව්ආරද මෙක්සිකෝවේ මෙම ආයතනයෙන් ලැබිණි. තෝරාගත් දෙමුහුම් වල F1බීජ නිෂ්පාදනය සිදු කෙරිණි.
- ඉන්දියාවේ අන්තර්ජාතික බඩඉරිඟු සහ තිරිඟු ප්‍රවර්ධන මධ්‍යස්ථානයෙන් (CIMMYT : International maize and Wheat Improvement Center) පරීක්ෂණ බඩඉරිඟු දෙමුහුම් 14ක් ලැබිණි. මෙම දෙමුහුම් ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී සහ මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී අගයනු ලැබිණි. සාමාන්‍ය අස්වැන්න හෙ/ටො 5.5 – 6.5 දක්වා ප්‍රමාණයක් ලැබෙන බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් 3ක් තෝරා ගනු ලැබිණි.
- අන්තර්ජාතික බඩඉරිඟු සහ තිරිඟු ප්‍රවර්ධන මධ්‍යස්ථානයෙන් (CIMMYT : International maize and Wheat Improvement Center) ලැබු නව බඩඉරිඟු නුමුහුම් ආරවලින් නව බඩඉරිඟු තනි මුහුම් 94ක් වැඩිදියුණු කෙරිණි. මෙම තනි මුහුම් අස්වැන්න උදෙසා අගයනු ලබයි.
- විදේශීය බඩඉරිඟු දෙමුහුම් 09ක් (පෞද්ගලික ආයතනයන් මගින් ආනයන කළ) සහ විළඳ ඉරිඟු දෙමුහුම් 2ක් අගයනු ලැබිණි. PAC 296, PAC 293, Bigking, F4452, P4181, DK 9955, Dk 9901 සහ Dk 6818 යන බඩඉරිඟු දෙමුහුම්වල ඇගයීම් වාර්තා ඉදිරිපත් කරනු ලැබිණි.

### කුරක්කන්

- බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් එකතුන් 04ක් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් යටතේ පරීක්ෂා කරනු ලැබිණි. මෙම එකතුන් විශේෂත්වය, ඒකාත්මිකතාව ස්ථායීතාවය උදෙසා පරීක්ෂා කිරීමට ඉදිරිපත් කරනු ලැබිණි.
- උසස් අස්වනු අත්හදා බැලීම් යටතේ බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් එකතුන් 08ක් ඇගයිණි. මෙම එකතුන් හෙ/ටො 3.4 – 3.8 අතර සාමාන්‍ය අස්වැන්නක් ලබාදුණි.

### සෝගම්

- උසස් අස්වනු අත්හදා බැලීම් යටතේ බලාපොරොත්තු තැබිය හැකි සෝගම් එකතුන් 06ක් අගයනු ලැබිණි. මෙම එකතුන් හෙ/ටො 3.5 – 4.0ක සාමාන්‍ය අස්වැන්නක් පෙන්නුම් කෙරිණි.

### තණහාල්

- උසස් අස්වනු අත්හදා බැලීම් යටතේ තණහාල් එකතුන් 06ක් අගයනු ලැබිණි. මෙම එකතුන් හෙ/ටො 2.0 – 2.5 දක්වා සාමාන්‍ය අස්වැන්නක් ලබාදුණි.

## රනිල කුලය

### මුං

- බලාපොරොත්තු තැබිය හැකි අපේක්ෂිත ලක්ෂණ සහිත මුං F1 ගහන 11ක් ක්ෂේත්‍රයේ වගා කරනු ලැබිණි.
- පරම්පරා වැඩිදියුණු කිරීම උදෙසා (F1 හා F2 පරම්පරාවෙන් තෝරාගත්) F2 පරම්පරා 21ක් සහ F3 පරම්පරා 9ක් ක්ෂේත්‍රයේ ගහන ලෙස වගා කරනු ලැබිණි.
- හෙ/ටො 2ක අස්වැන්නක් ලබාදිය හැකි බලාපොරොත්තු තැබිය හැකි ආර 5ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් යටතේ පරීක්ෂා කරනු ලැබිණි.
- ගොවි ක්ෂේත්‍රවල අනුවර්තීබව පරීක්ෂා කිරීම උදෙසා MIMB 901සහ MIMB 904 යන වැඩි අස්වනු ආර ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් යටතේ පරීක්ෂා කරනු ලැබිණි.
- වැඩි අස්වනු MIMB ආරය විශේෂත්වය, ඒකාත්මිකතාවය, ස්ථායීතාවය පරීක්ෂා කිරීම උදෙසා ඉදිරිපත් කරනු ලැබිණි.

### කව්පි

- මුහුම්කරණයෙන් කව්පි F1 පරම්පරා 8ක් ලබා ගත් අතර මෙම මුහුම්කරණ ප්‍රභේදවල ගුණාත්මකබව ප්‍රවර්ධනය උදෙසා සිදු කරනු ලැබිණි.
- F1 සිට F4 පරම්පරාවන්ගෙන් තෝරාගත් කව්පි ගහන 07ක් පරම්පරා උසස් කිරීම උදෙසා ක්ෂේත්‍රයේ ස්ථාපිත කෙරිණි.
- වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ බලාපොරොත්තු තැබිය හැකි කව්පි ආර/ ප්‍රභේද 5ක් අගයනු ලැබිණි
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් යටතේ කව්පි ආර 5ක් සම්මත ප්‍රභේද 3ක් සමඟ අගයනු ලැබිණි.

### උඳු

- බලාපොරොත්තු තැබිය හැකි අපේක්ෂිත ලක්ෂණ සහිත හඳුනාගත් F1 පරම්පරා 9ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කෙරිණි.
- පරම්පරා උසස් කිරීම උදෙසා F2 පරම්පරා 5ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කෙරිණි.

## තෙල් බීජ බෝග

### සෝයා බෝංචි

- විශාල ක්‍රීම් පැහැති බීජ, වැඩි අස්වනු (හෙ/ටො 6.5ට වැඩි), ඉක්මනින් පරිනතවන (දින 85 - 90), නිශ්චිත වර්ධනයක් සහිත, ඉහළ නයිට්‍රජන් තිර කිරීමේ හැකියාවක් ඇති, බීජ විසිරීමට, කරල් වැටීමට සහ පැළ ඇදවැටීමට ප්‍රතිරෝධී සෝයා බෝංචි F1 පරම්පරා 08ක් අගයනු ලැබිණි.
- ආසියානු එළවළු පරියේෂණ සංවර්ධන මධ්‍යස්ථානයෙන් (AVRDC) ලැබූ සෝයා බෝංචි ජනකප්ලාස්ම 07ක් අනාගත මුහුම්කරණ වැඩසටහන් සඳහා වඩාත් හොඳ මව් ආර හඳුනාගැනීම උදෙසා අගයනු ලැබිණි.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්හිදී PB 1 සම්මත ප්‍රභේදය සමඟ එළවළු සෝයා බෝංචි ආර 5ක් අගයනු ලැබිණි.

## එළවළු

### බණ්ඩක්කා

- මීළඟ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් උදෙසා OKS 1 සහ OKS 3 යන බණ්ඩක්කා ආර 02 හඳුනාගනු ලැබිණි.
- අනාගත අභිජනන වැඩසටහන් සඳහා යෝග්‍ය මව් ආර ලෙස බණ්ඩක්කා ආර 3ක් හඳුනා ගනු ලැබිණි.
- නව F1 මුහුම්කරණ 6ක් සිදුකරනු ලැබූ අතර බීජ නිෂ්පාදනය කෙරිණි.

- දේශීය පාරිසරික තත්ත්වයන් යටතේ සාමාන්‍ය වශයෙන් දක්නට ලැබෙන පළිබෝධකයින්ට සහ රෝග වලට ගොදුරුවීමේ හැකියාව පරීක්ෂා කිරීමට විදේශීය බණ්ඩක්කා දෙමුහුම් 03ක් අගයනු ලැබිණි.

## පලතුරු

### මිදි

- විවිධ මිදි ප්‍රභේද සමග විවිධ පුහුණු ව්‍යුහයන් අගයනු ලැබිණි. මෙම සියලුම පුහුණු ක්‍රමයන් යටතේ "French MI" සහ "Israel Blue" යන ප්‍රභේද හොඳින්ම ක්‍රියාකරන ප්‍රභේද වේ.
- මිදි පුහුණු කිරීම සඳහා පිරිවැය ඵලදායී විකල්ප කණු ලෙස "ග්ලිරිසීඩියා", "ගන්සූරියා", "ඉපිල් - ඉපිල්" සහ "කිලවයා" යන ශාකවල කඳවල් මගින් ලබා ගත හැකි කණු පරීක්ෂා කරනු ලැබිණි.
- මිදි ජනකප්ලාස්ම ප්‍රභේද 16ක් නඩත්තු කරනු ලැබිණි. මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන අතරතුර මව් ශාක ලෙස මිදි නිර්දේශිත ප්‍රභේද නඩත්තු කරනු ලැබිණි.

### අඹ

- විදේශීය ප්‍රභේද 26ක් සහ දේශීය ප්‍රභේද 7ක් අනාගත බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා නඩත්තු කරනු ලැබිණි. මෙයට අමතරව විවිධ ප්‍රභේද බද්ධ කිරීම මගින් ලබාගත් පැළ 100ක් ආයතනය තුළ වගා කෙරිණි.

### දිවුල්

- ශ්‍රී ලංකාවේ වියළි කලාපයෙන් එකතු කරගත් දිවුල් එකතුන් 8ක් වඩාත් හොඳ ගුණාත්මක තත්ත්වයෙන් යුත් වැඩි අස්වනු එකතුන් හඳුනාගැනීම උදෙසා අගයනු ලැබිණි.

### කොමඩු

- විදේශීය ප්‍රභේද 8ක් අගයනු ලැබූ අතර වියළි කලාපයේ වගාකිරීම සඳහා එක් ප්‍රභේදයක් යෝග්‍ය බව හඳුනාගනු ලැබිණි.

### ශෂ්‍ය විද්‍යාව

- 'Apsim Oryza' බෝග ආදර්ශය වී සඳහා පරාමිතිකකරණය සහ තහවුරු කිරීම සිදු කෙරෙමින් පවතී.
- පාරිසරික වෙනස්වීම් හේතුවෙන් ඇතිවන උෂ්ණත්ව වෙනස්වීම උදෙසා බඩඉරිඟු ප්‍රභේදය දක්වන ප්‍රතිචාරය අධ්‍යනය කරනු ලැබිණි. බඩඉරිඟු ශාකයේ වර්ධනයට සහ අස්වැන්න සඳහා සංඛ්‍යාත්මක වශයෙන් මානය කළ හැකි සැලකිය යුතු ප්‍රතිචාරයන් දක්නට ලැබිණි. "රුවන්" බඩඉරිඟු ප්‍රභේදය සඳහා වර්ධනයට සහ අස්වැන්නට තිබිය යුතු උපරිම උෂ්ණත්වය හඳුනාගනු ලැබිණි.
- කුණ්ඩසාලය සහ මහ ඉලුප්පල්ලමෙහි මුං වගා කළ විට එහි ජීව සෘතු විද්‍යාව, වර්ධනය සහ අස්වැන්නෙහි සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය කෙරිණි. මෙම ස්ථාන දෙකහි උෂ්ණත්ව වෙනස්වීම්වලට එරෙහිව මෙම බෝග දැක්වූ විවිධ ප්‍රතිචාරයන් හේතුවෙන් මෙම වෙනස්කම් ඇති විය හැක.
- අඛණ්ඩව කන්න තුනකදී මිරිස් සඳහා ගැඹුරට හෑම, ග්ලිරිසීඩියා භූමි වැසුම් සහ කොම්පෝස්ට් යන සියල්ලෙහි සමෝධානික බලපෑම අධ්‍යයනය කෙරිණි. ගැඹුරට හෑම මගින් පැළ වර්ධනයට සහ අස්වැන්නට පළමු කන්නයේදී පමණක් සැලකිය යුතු බලපෑමක් පෙන්නුම් කෙරිණි. එම භූමියේ අඛණ්ඩව කන්න 3කදී ග්ලිරිසීඩියා හෙ/ටො. 5ක අනුපාතයෙන් වසුන් ලෙස යෙදීමෙන් සහ හෙ/ටො. 10 බැගින් කොම්පෝස්ට් පොහොර යෙදීමත් තුළින් අඛණ්ඩව

කන්න තුනේදීම ශාක වර්ධනයට සහ අස්වැන්නට සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති කෙරිණි.

- මහ කන්නයේ අවසන් කාලය තුළදී අවාරයේදී ලොකු ලූනු මව් බල්බ නිෂ්පාදනය උදෙසා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරිණි. මහ ඉලුප්පල්ලම (DL1b), කල්පිටිය (DL3), විලච්චිය (DL1f), මොරගොල්ලාගම (DL1b), මාහෝ (IL3), පදවිය (DL1e), මුතුකණ්ඩිය (DL1b) සහ වීරවිල (DL5) යන ප්‍රදේශවල මෙම වගාවන් ස්ථාපිත කෙරිණි. විලච්චිය, පදවිය, මුතුකණ්ඩිය සහ වීරවිල යන ප්‍රදේශයන්හට වැසි හේතුවෙන් වගාවට දැඩි බලපෑමක් ඇති විය. මාහෝ සහ මහ ඉලුප්පල්ලම ප්‍රදේශ අවාරයට වගා කිරීමට යෝග්‍ය වේ. කෙසේ වුවද සාමාන්‍ය කන්නයේදී ලැබෙන බල්බයේ ප්‍රමාණයට වඩා අවාරයේදි ලැබෙන ලූනුවල බල්බයේ ප්‍රමාණය කුඩාය. පරීක්ෂණ අඛණ්ඩව සිදුවේ.
- "MI - Green" මිරිස් ප්‍රභේදය සඳහා ක්ලොරොෆිල් මීටර (SPAD මීටරය) සහ පත්‍ර වර්ණ ප්‍රස්ථාර සටහනෙහි (Leaf Colour Chart) ක්‍රමාංකනය උදෙසා පරීක්ෂණයක් පැවැත්විණි. මිරිස් සඳහා හෙ/ටො 150 නිර්දේශිත නයිට්‍රජන් අනුපාතය, උපරිම නයිට්‍රජන් අනුපාතය බව සොයා ගැනිණි. MI – Green ප්‍රභේදය ක්ලොරොෆිල් මීටර (SPAD මීටර) පරීක්ෂාවේදී 42ට වඩා වැඩි මානයන් පැළ සිටුවා සති 3 – 4 කාලය තුළදී නඩත්තු කළ යුතුය. 56ට වැඩි මානයන් පැල සිටුවා සති 5 – 12 අතර කාල පරාසය තුළදී නඩත්තු කළ යුතුය. පත්‍ර වර්ෂ සටහනෙහි 4ට වැඩි මානයන් සම්පූර්ණ වර්ධන අවධිය පුරාම නඩත්තු කල යුතුය. ප්‍රතිඵල සනාථ කිරීම උදෙසා අඛණ්ඩව පරීක්ෂණ සිදු කෙරේ.
- ඉන්දුනීසියාවෙන් ගෙන්වන ලද විවෘත පරාගන බඩඉරිඟු ප්‍රභේද 3ක් විදේශීය "Pacific 999 super", දේශීය දෙමුහුම් "සම්පත්" සහ දේශීය විවෘත පරාගන ප්‍රභේදය "රුවන්" සමඟ ඉහළ ශාක ඝනත්වයක් (75 X 15 cm) සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත ශාක ඝනත්වය (60 X 30 cm) යටතේ නිර්දේශිත නයිට්‍රජන් හෙ/කි.ග්‍රෑ 200 සහ හෙ/කි.ග්‍රෑ 150 යන මට්ටම් 2ක සමඟ පරීක්ෂා කරනු ලැබිණි. අස්වැන්නෙහි සැලකිය යුතු වෙනස්කම් දක්නට ලැබිණි. "Srikandikuning" සහ "Sukumaragala" යන ඉන්දුනීසියානු ප්‍රභේද "Pacific" ප්‍රභේදය හා සාපේක්ෂව අඩු අස්වැන්නක් ලබාදුන් අතර "රුවන්" සහ "සම්පත්" යන ප්‍රභේදයන් හා සැසඳීමේදී එක සමාන අස්වැන්නක් ලබාදුණි. වර්තමාන නිර්දේශිත තත්ත්වයන් හා සැසඳීමේදී ඉහළ පැළෑටි ඝනත්වයක් සහ ඉහළ පොහොර මට්ටම් ලබාදීම යන කළමනාකරණ මට්ටම්හිදී 22%ක ඉහළ අස්වනු ප්‍රතිශතයක් නිරීක්ෂණය කළ හැකි විය.
- මිරිස් සහ කුරක්කන් සඳහා "පැරෂුට් ට්‍රේ" සහ "මධ්‍යම ප්‍රමාණ පැළ තවාන් ට්‍රේ" (ට්‍රේ එකකට සිදුරු 128) උපයෝගී කර ගනිමින් විකල්ප පැළ තවාන් ක්‍රමෝපායන් පරීක්ෂා කෙරිණි. මෙම ක්‍රමයේදී මිරිස් සඳහා සාමාන්‍ය භූමි පැළ තවාන් සහ සහ මධ්‍යම පැළ තවාන් අතර පැහැදිලි වෙනසක් දක්නට නොලැබිණි. කුරක්කන් සඳහාද "පැරෂුට් ට්‍රේ", "භූමි පැළ තවාන්"සහ "මධ්‍යම ප්‍රමාණ පැළ තවාන් ට්‍රේ" යන ක්‍රම තුනෙහි පැහැදිලි වෙනස්කම් දක්නට නොලැබුණි. ඉහත පරීක්ෂණයන්හි වඩාත් ආර්ථිකමය ඵලදායී විකල්ප තවාන් ක්‍රමයක් වැඩිදියුණු කිරීම උදෙසා අනාගතයේදී පරීක්ෂණ සිදු කරනු ලබයි.

- පූමාංගී ආරවල මල් ජායාංගී ආරවල මල් සමග අතිපිහිත වීම උදෙසා බඩඉරිඟුවල එකවර මල් හට ගැනීම පිළිබඳව අධ්‍යයනය කෙරිණි. වර්ධන අවධි දින [(Growing Degree Days (GDD)] ගණනය කිරීම මගින් මෙම අතිච්ඡාදනය ගණනය කළ හැක. පරීක්ෂණ භූමියෙහි පූමාංගී ආරය සහ ජායාංගී ආරය අතර පැළ සිටුවීමේ කාල පරාසය දින 7කි. උෂ්ත්වය වෙනස්වීම් හේතුවෙන් පාරිසරික අහිතකර තත්ත්වයන් හි වෙනස්වීම පූමාංගී සහ ජායාංගී ආරවල මල්පිපිම සම්න්ධයෙන් බලපෑම් ඇති කිරීම හේතුවෙන් බහු ස්ථානයන්හි මෙම පරීක්ෂණ නැවත සිදු කළ යුතුය.
- ලූනු සත්‍ය බීජ නිෂ්පාදනය ඉහළ දැමීමේ අරමුණු ඇතිව $KNO_3$ ප්‍රතිකර්ම පරීක්ෂණය ආරම්භ කෙරිණි. 10% $KNO_3$ ද්‍රාවණයෙහි ගිල්වා තැබීය මගින් බීජ නිෂ්පාදනයෙහි සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. අත්හදා බැලීම් අඛණ්ඩව නැවත සිදුකරනු ලබයි.
- ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයෙහි යල කන්නයේදී පසෙහි තෙතමනය වෙනස්වීමේ තත්ත්වයන් මුං ජාන දර්ශයන්ට සිදුවන බලපෑම පරීක්ෂා කිරීමට අධ්‍යයනයන් ආරම්භ කෙරිණි. මෙම පරීක්ෂණයන් මගින් MIMB 901 නියඟයන්ට ප්‍රතිරෝධී ජාන දර්ශයක් බවත් "ආරි" සාමාන්‍ය නියඟයන්ට ප්‍රතිරෝධී ජාන දර්ශයක් බවත් MI6 නියඟයන්ට ප්‍රතිරෝධී නොවන ජාන දර්ශයක් බවත් හඳුනා ගැනිණි. ප්‍රතිඵල සත්‍යොක්ෂණය සහ තහවුරු කිරීම උදෙසා අධ්‍යයනයන් නැවත සිදු කරනු ලබයි.
- සවායු තත්ත්වයන් සඳහා උස් වගා භූමීන්හි ප්‍රභේද පරීක්ෂාව සිදු කරනු ලැබූ අතර Bg 10 – 2907 ප්‍රභේදය හෙ/ටො 3.17ක වැඩිම අස්වැන්නක් ප්‍රතිඵල කෙරිණි. Ar 08 – 513 හි ඉහළම පරාගන සරුබව (100% සරු) වාර්තා විණි.
- ක්ෂේත්‍රයේ සාමාන්‍ය පාරිසරික තත්ත්වයන් යටතේ වී, සෝයා සහ බඩඉරිඟුවල පරාගන වන්ද්‍යතාවය සඳහා වියන් මට්ටමේ උෂ්ණත්වයෙහි බලපෑම අධ්‍යයනය කෙරිණි. 45% RH සමඟ 37.8C$^{o}$ උපරිම වියන් මට්ටමේ උෂ්ණත්වයකදී At 06 – 631 ප්‍රභේදය පරාග අර්ධ වන්ද්‍යතාවයකට (80%) ලක් විය. මුල් අවස්ථාවේ MISB 1 සෝයා ප්‍රභේදය සහ CMl 348 බඩඉරිඟු ප්‍රභේදය රෝපණයේදී වැඩිම පරාග සාපල්‍යතාවයක් වාර්තා විය.
- බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සහයෝගීත්වයෙන් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන් පවත්වනු ලැබිණි.

## බෝග ආරක්ෂණය

### ශාක ව්‍යාධිවේදය

- ශ්‍රී ලංකාවේ බඩඉරිඟු වගාවේ දක්නට ලැබෙන ප්‍රධාන රෝගය කොපු අංගමාරයයි. ශ්‍රී ලංකාවේ පාරිසරික තත්ත්වයන්ට අනුකූලව බඩඉරිඟු කොපු මයිටා රෝගය උදෙසා ප්‍රභේද පරීක්ෂණ ක්‍රමවේදයක් අත්‍යවශ්‍ය වේ. මෙම ක්‍රමවේදයන් අතර කොපුව තුළට ස්ලෙරොටියා (Sclerotia) ඇතුල් කිරීම මගින් දින 04කදී රෝග ලක්ෂණ ද දින 11කදී 100%ක් රෝගයද පෙන්නුම් කෙරිණි. පරීක්ෂණ අඛණ්ඩව සිදු කෙරේ.
- මුං කහ විචිත්‍ර වෛරස් රෝගය (MYMV) සඳහා මුං ජනකප්ලාස්ම 42ක් පරීක්ෂා කෙරිණි. පරීක්ෂා කළ ජනකප්ලාස්ම 42 අතුරෙන් 25ක් රෝගයට පාත්‍රවීමේ ඉහළම නැඹුරුතාවයක්ද 5ක් සාමාන්‍ය නැඹුරුතාවයක්ද 2ක් සාමාන්‍ය ප්‍රතිරෝධිතාවයක්ද 7ක් ඉහළ

ප්‍රතිරෝධීතාවයක්ද පෙන්නුම් කෙරිණි. පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.

- උඳු ජනකප්ලාස්ම 26ක් කහ විචිත්‍ර වෛරසය සඳහා පරීක්ෂා කෙරිණි. පරීක්ෂා කළ ජනකප්ලාස්ම 26 අතුරෙන් කහ විචිත්‍ර වෛරස් රෝගය සඳහා 2ක් රෝගයට පාත්‍රවීමේ ඉහළම නැඹුරතාවයක්ද 12ක් සාමාන්‍ය තත්ත්වයට වඩා ඉහළ නැඹුරුතාවයක්ද 4ක් සාමාන්‍ය ප්‍රතිරෝධීතාවයක්ද 6ක් ඉහළ ප්‍රතිරෝධීතාවයක්ද පෙන්නුම් කෙරිණි. පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.
- කව්පි ආර 2ක් පරීක්ෂණ ප්‍රභේද සමඟ ඇන්ත්‍රැක්නෝස් සහ පිටිපුස් රෝගයට එරෙහිව පරීක්ෂා කෙරිණි. මේ අතුරෙන් IT 98K - 205 - 8 ඇන්ත්‍රැක්නෝස් රෝගයට බඳුන් වූ අතර පිටිපුස් රෝගයට ප්‍රතිරෝධී විය. IT 97K - 499- 39 ඇන්ත්‍රැක්නෝස් රෝගයට සාමාන්‍ය ප්‍රතිරෝධීතාවක් දැක් වූ අතර පිටිපුස් රෝගය සඳහා ද ප්‍රතිරෝධී විය. පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.
- සෝයා බෝංචි ආර 2ක් පරීක්ෂණ ප්‍රභේද 2ක් සමඟ පරීක්ෂා කෙරිණි. දැනට පවතින කාලගුණ තත්ත්වයන් යටතේ මෙම නව ආර 2ක සෝයා බෝංචි විචිත්‍ර වෛරසය සඳහා ප්‍රතිරෝධී විය.
- අසොසිස්ට්‍රොබින් (azoxystrobin) 250 ග්‍රෑ/ලී SC නව දිලීරනාශකය මිදි වගාවේ යටිපුස් රෝගය පාලනය උදෙසා ඵලදායීබවක් පෙන්නුම් කෙරිණි. මෙම ප්‍රතිඵල තහවුරු කිරීම උදෙසා නියමු මට්ටමෙන් මෙම අධ්‍යයනය නැවත සිදු කළ යුතුය.
- මිරිස්වල ප්‍රධාන රෝගී තත්ත්වයන් හට විවිධ නයිට්‍රජන් මට්ටම්හි බලපෑම හඳුනාගැනීම උදෙසා අධ්‍යනයක් සිදු කෙරිණි. මෙම අධ්‍යනයන්හි ප්‍රතිඵලවලට අනුකූලව දෙපාර්තමේන්තු නිර්දේශිත නයිට්‍රජන් මට්ටම වන හෙක්ටයාරයකට 150 කිලෝග්‍රෑම් මට්ටම මිරිස් වගාවේ රෝග සෑදීමේ හැකියාව අවම කරන බව පෙන්නුම් කෙරිණි. නයිට්‍රජන් මට්ටම වැඩි කිරීමත් සමඟ රෝගී තත්ත්වය වැඩිවන බව හඳුනා ගැනිණි.
- මිරිස් වගාවේදී රෝග කළමනාකරණය වඩාත් ඵලදායී නයිට්‍රජන් පොහොර වර්ගය හඳුනා ගැනීමට අධ්‍යයනයක් සිදු කෙරිණි. දෙපාර්තමේන්තු නිර්දේශිත පොහොර සමඟ විවිධ වර්ගයේ පොහොර වර්ග 3ක් (කැල්සියම් නයිට්‍රේට්, ඇල්බර්ට් ද්‍රාවණය සහ ඇමෝනියම් සල්ෆේට්) මෙම පරීක්ෂණයේදී උපයෝගී කර ගැනිණි. අනෙකුත් ප්‍රතිකර්මවලට සාපේක්ෂව කැල්සියම් නයිට්‍රේට් යෙදූ වගා භූමියෙහි ශාක රෝග වලට බඳුන් වීම අඩු බවට වාර්තා විය.
- ලොකු ලූනු වගාවේදී ඇන්ත්‍රැක්නොස් සහ දම්පුල්ලි රෝගය ප්‍රධාන රෝගයන් වේ. එමනිසා ලූනු ආර 13ක් ඇන්ත්රැක්නෝස් සහ දම් පුල්ලි රෝගයට දක්වන ප්‍රතිරෝධීතාවය අගයනු ලැබිණි. ඇන්ත්‍රැක්නෝස් සහ දම්පුල්ලි රෝගයට ප්‍රතිරෝධී ආර සොයා ගැනීමට නොහැකි විය.
- ශ්‍රී ලංකාවේ බණ්ඩක්කා වගාවේදී කහ විචිත්‍ර වෛරස් රෝගය ප්‍රධාන බාධකයකි. කහ විචිත්‍ර වෛරසයට එරෙහිව බණ්ඩක්කා විදේශීය ප්‍රභේද 13ක් ඇගයිණි. එක් ප්‍රභේදයක් වෛරස් රෝගයට එරෙහිව ප්‍රතිරෝධීතාවයක් පෙන්නුම් කෙරිණි.
- අවාරයේදී විදේශීය ලූනු ප්‍රභේද 5ක් ඇන්ත්‍රැක්නෝස් සහ දම්පුල්ලි රෝගයට එරෙහිව ඇගයිණි. එක් ප්‍රභේදයක් දම්පුල්ලි රෝගයට එරෙහිව සාමාන්‍ය ප්‍රතිරෝධීතාවයක් පෙන්වන බව හඳුනා ගැනිණි.
- කොච්චි/නයිමිරිස් එකතුන් 7ක් පත්‍ර කොඩවීමේ වෛරස් රෝගයට එරෙහිව ඇගයිණි. එකතුන් එකක් වෛරස් රෝගයට එරෙහිව ප්‍රතිරෝධීතාවයක් පෙන්වන බව හඳුනා ගැනිණි.

- ලොකු ලූනු වගාවේ ඇන්ත්‍රැක්නෝස් රෝගයට එරෙහිව විවිධ දිලීරනාශක පරීක්ෂා කිරීම උදෙසා පරීක්ෂණයක් සිදු කෙරිණි. පරීක්ෂාවට ලක්කළ දිලීර නාශක අතුරෙන් ඇසොසිස්රොබින් ලී/ග්‍රෑ 250 SC (Azoxysrobin 250 g/ℓ SC) ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම උදෙසා ඵලදායි බව හඳුනා ගැනිණි. පරීක්ෂණ නැවත සිදු කරනු ලබයි.

## කීට විද්‍යාව

- විවිධ නයිට්‍රජන් මට්ටම් පොහොර ප්‍රභවයන් සහ පත්‍ර කොඩවීමේ රෝගය අතර සම්බන්ධතාවය සොයා ගැනීම උදෙසා පරීක්ෂණයක් දියත් කෙරිණි. අනෙකුත් ප්‍රතිකර්මවලට සාපේක්ෂව සැසඳීමේදී කැල්සියම් නයිට්‍රේට් යෙදූ වගා භූමිවල සහ ද්‍රව පොහොර යෙදූ වගා භූමිවල පත්‍ර කොඩවීමේ රෝග අවම වූ බව නිරීක්ෂණය කෙරිණි. කැල්සියම් නයිට්‍රේට් යෙදූ භූමිවල වියලි මිරිස් අස්වැන්න සැලකිය යුතු ඉහළ ප්‍රමාණයක් විය.
- දේශීය නිර්දේශිත "දඹුල්ල" වරණය සමග ලූනු ආර 20ක් පළිබෝධ හානියට එරෙහිව ඇගයිණි. සියලුම ප්‍රභේද / ආර පැළ මැක්කාගේ හානියට බඳුන් විය. මෙම කන්නයේදී ලූනු දළඹුවාගේ හානිය නිරීක්ෂණය කිරීමට නොහැකි විය.
- පාරිසරිකව ශේෂ වන රසායන ද්‍රව්‍යයන් විශාල ප්‍රමාණයක් උපයෝගී කරගනිමින් පාංශු බාධක ප්‍රතිකර්මය වේයන් පාලනය සඳහා පවතින ක්‍රමවේදයකි. එමනිසා එක්ස්ටෙරා ඇම පද්ධති (Exterra baiting System) ක්‍රමවේදය පරීක්ෂා කරනු ලැබූ අතර වේයන් මර්ධනයේදී ඵලදායී ක්‍රමවේදයක් බව නිර්දේශ කෙරිණි.
- කීඩෑ හානිය සඳහා වූ ප්‍රතිරෝධීතාව පරීක්ෂාව උදෙසා මුං ප්‍රභේද 10ක් පරීක්ෂණාගාර අධ්‍යයනයන් සිදු කෙරිණි. කොරියාවෙන් ලැබූ ප්‍රභේද 5ක් පරීක්ෂා කෙරිණි. (EOUL, J41, DAHYEON, SOHYEON, JANGAHU) ආසියානු එළවළු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය [(Asian Vegetable Research and Development Center (AVRDC)] ලැබූ ප්‍රභේද 4ක් දේශීයව නිර්දේශිත MI - 6 ප්‍රභේදය සමග ඇගයිණි. මුං ආර 3ක් (MIMB 933, MIMB 94, MIMB 940) කීඩෑ හානියට ප්‍රතිරෝධී බව හඳුනා ගැනිණි.
- දේශීය දෙමුහුම් සම්පත් ප්‍රභේදය සමඟ විදේශීය බඩඉරිඟු ප්‍රභේද 10ක් කෘමි පළිබෝධ හානිය සඳහා පරීක්ෂා කෙරිණි. සියළුම විදේශීය ප්‍රභේද කඳ විදින්නා විසින් හානි කෙරිණි. මෙම කන්නය තුළදී දෙමුහුම් වර්ග කිසිවක්ම කුඩිත්තන්ගේ හානියට බඳුන් නොවිණි.
- ලූනු වගාවේ බල්බ මයිටා bulb mite, (*Rhizoglyphus* spp), මල් කන කුරුමිණියා (*Oxycetonia versicolor*) සහ ආකන්ධ සළඹයා (*Phthormaea operculella*) නව පළිබෝධකයින් ලෙස හඳුනා ගැනිණි.

## වල් කළමනාකරණය

- බඩඉරිඟුවල වල් පාලනයේ කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම උදෙසා හැලොසල්ෆියුරන් මෙතිල් 75% WG (Halosulfuron – methy 75% WG) සහ නිකොසල්ෆියුරන් (Nicosulfuron) සාන්ද්‍රණ 3ක් පරීක්ෂා කෙරිණි. නිකොසල්ෆියුරන් (Nicosulfuron) Nicosulfuron 240% SL, Nicosulfuron 4% SC සහ Nicosulfuron 75% WDG පිළිවෙලින් හෙ/මි.ලී 200, හෙ/මි.ලී 1250 සහ හෙ/ග්‍රෑ. 50 යන අනුපාත වලින් පසු නිර්ගමන වල්නාශක ලෙස වල් පාලනය සඳහා සාර්ථකව යොදා ගත හැක. හැලොසල්ෆියුරන් - මෙතිල් 75% WG හෙ/ග්‍රෑ .80ක අනුපාතයෙන්

පසුනිර්ගමන වල්නාශක ලෙස බඩඉරිඟු වගාවේ පත් වැනි තෘණ වර්ග පාලනය සඳහා ඵලදායී ලෙස යොදා ගත හැක.

- ලූනු වගාවේ වල් පාලනය උදෙසා ඔක්සිෆ්ලුර්ෆෙන් (Oxyfluorfen 480g/l SC) යොදා ගැනීමේ හැකියාව පරීක්ෂා කෙරිණි. ලූනු වගාව සඳහා දැනට නිර්දේශිත වල් නාශකය වන ඔක්සිෆ්ලුර්ෆෙන් ලී/ග්‍රෑ 240 Ec (Oxyfluorfen 240 g/l EC) වලට වඩා නව වල් නාශකය වල් පාලනය උදෙසා සාර්ථකව යොදා ගත හැකිබව නිරීක්ෂණය කෙරිණි. හෙ/මි.ලී 300ක අනුපාතයෙන් වල් පාලනය උදෙසා පූර්ව නිර්ගමන වල් නාශක ලෙස මෙය යොදා ගත හැක.

## පාංශු සාරවත්බව

- වෙනත් ක්ෂේත්‍ර බෝගයන් හා සැසඳීමේදී බඩඉරිඟු යනු වැඩිම රසායනික පොහොර ප්‍රමාණයක් යොදන වගාවකි. එමනිසා නයිට්‍රජන් අවශ්‍යතාව පදනම් පොහොර කළමනාකරණයක් මගින් බෝගයේ නයිට්‍රජන් පොහොර කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කළ හැක. පත්‍ර වර්ණ සටහනෙහි මට්ටම පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කරනු ලැබූ අතර එමගින් පත්‍ර වර්ණ සටහන නයිට්‍රජන් නාස්තිවීම අවම කරමින් බඩඉරිඟු වල නයිට්‍රජන් අවශ්‍යතාව තීරණය කිරීමට යොදා ගත හැකි. බවට හඳුනා ගැනිණි.
- යූරියා යනු ලූනු බෝගයට බොහෝ අවස්ථා වලදී උපයෝගී කරගනු ලබන නයිට්‍රජන් පොහොරකි. කෙසේ වුවද යූරියා නයිට්‍රජන් පොහොරක් ලෙස උපයෝගී කර ගැනීමේ කාර්යක්ෂමතාව ඉතාමත් අවමය. ලූනු වගාව සඳහා යූරියා සහ ඇමෝනියම් සල්ෆේට් පොහොර භාවිතයේ කාර්යක්ෂමතාව සැසඳීම උදෙසා පරීක්ෂණයක් සිදු කරනු ලැබිණි. යූරියා වලට වඩා ඇමෝනියම් සල්ෆේට් කාර්යක්ෂමතාව ඉහළ බව පෙන්නුම් කෙරිණි. ප්‍රතිඵල තහවුරු කිරීම උදෙසා පරීක්ෂණ නැවත සිදු කරනු ලබයි.
- බඩඉරිඟු සඳහා ට්‍රිපල් සුපර් ෆෝස්ෆේට් (TSP) වෙනුවට දේශීයව නිෂ්පාදනය කළ එප්පාවල සින්ගල් සුපර් ෆෝස්ෆේට් යොදා ගැනීමේ හැකියාව පිළිබඳ නැවතත් පරීක්ෂණ ශ්‍රේණියක් සිදු කිරීමට සැලසුම් කෙරිණි. මෙම සිදුකළ පරීක්ෂණවලදී මෙම පොහොර වර්ග සඳහා සැලකිය යුතු වෙනස්කම් සහිතව ප්‍රතිචාරයක් නොදැක්විණි. පරීක්ෂණ නැවතත් සිදු කරනු ලබයි.

## ජල කළමනාකරණය

- ශ්‍රී ලංකාව තුළ දෙමුහුම් බඩඉරිඟු සඳහා වාරි නිර්දේශයන් නොමැත. එමනිසා රතුවන් දුඹුරු පසෙහි විවිධ වර්ධන අවස්ථාවේ පවතින බඩඉරිඟුවලට විවිධ වාරි ජල අවශ්‍යතාවන් අධ්‍යයනය කිරීමට ක්ෂේත්‍ර පරීක්ෂණයක් පවත්වනු ලැබිණි. එකිනෙකට වෙනස් වාරි ජලය (IW) / සමුච්චිත තැටි වාෂ්පීකරණ අනුපාතය (CPE) 5ක් තෝරා ගනු ලැබ "Pacific 999 Super" දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදයේ විවිධ වර්ධන අවස්ථාවන්හිදී (මාස 1, මාස2 සහ මාස 3 කාලය) හිදී යොදනු ලැබිණි. වැඩිම අස්වැන්නක් එනම් හෙ/ටො 9.3ක් පිළිවෙලින් වර්ධන අවස්ථා 3නෙහිදී 0.85, 1.15, 1.15 යන අනුපාතයන් යටතේ ඒකාබද්ධ ප්‍රතිකර්මයන්හිදී වාර්තා වනු ලැබිණි. පළමු සහ 3 වන වර්ධන අවස්ථාවන් සමඟ සැසැඳීමේදී බඩඉරිඟු අස්වැන්න සඳහා 2වන මාසය ඉතාමත් වැදගත් බව නිරීක්ෂණය කෙරිණි. දෙමුහුම් බඩඉරිඟු රතුවන් දුඹුරු පසෙහි වගාවේදී සමස්තයක් ලෙස වර්ධන අවස්ථා 3 නෙහි වඩාත් උචිත වාරි ජල ප්‍රමාණය (IW) 0.7, 1.15, 1.15 ප්‍රායෝගිකව යොදා ගත හැකිය.

- මුං වගාවේදී තද බීජ ඇට පැවතීම ප්‍රධාන ගැටළුවකි. පසෙහි ජල ප්‍රමාණය තද බීජ ඇතිවීමේ ප්‍රමාණය ඉහළ යන බව "හර්ෂ" ප්‍රභේදයේ පෙර වගාවන්ගෙන් ලැබූ අත්දැකීම් මත නිරීක්ෂණය කෙරිණි. එමනිසා විවිධ ප්‍රභේදයන් සඳහා තද බීජ ඇතිවීම අවම කිරීම උදෙසා තිබිය යුතු උචිතම තෙතමන මට්ටම සොයා බැලීමට පරීක්ෂණ සිදු කෙරිණි. MI 6 ප්‍රභේදයේ අවම තද බීජ ප්‍රමාණයක් දක්නට ලැබිණි. MI 6 ප්‍රභේදයේදී පාංශු තෙතමන මට්ටම වෙනස් වීම මගින් තද බීජ ඇතිවීම ප්‍රවර්ධනය නොකෙරිණි.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව විධිමත්ව සිදුකළ පරීක්ෂණ සොයාගැනීම් පදනම්ව මිරිස් වගාව සඳහා නිශ්චිත පොහොර මිශ්‍රිත ජල නිර්දේශයක් නොමැත. රතු දුඹුරු පසෙහිදී අතින් පොහොර යොදනවාට වඩා වගාවට ජල සැපයුමක් සමඟ පොහොර මිශ්‍රිත ජලය යෙදීම මගින් අමුමිරිස් අස්වැන්න 22%කින්ද ජල භාවිත කාර්යක්ෂමතාව 25%කින්ද ඉහළ දැමිය හැකි බව 2013 යල කන්නයේ සිදුකළ පරීක්ෂණයන් මගින් හෙළිදරවු විය. ප්‍රතිඵල තහවුරු කිරීම උදෙසා අධ්‍යයනයන් නැවත සිදුකරනු ලබයි.
- කෘෂි කර්මාන්තයේහිදී ජල භාවිත කාර්යක්ෂමතාව ඉහළ දැමීමට සහ නිෂ්පාදන පිරිවැය අඩුකිරීමට විසුරුම් වාරි ජල සැපයුම් පද්ධති පැතිකඩ ඉතාමත් වැදගත් වේ. රතු දුඹුරු පසෙහි ලූනු වගාවේදී වර්ධනය සහ අස්වනු ලබාගැනීමේ ඵලදායීතාවය විසුරුම් වාරි ජල සැපයුම් පද්ධතියෙහි විවිධ පැතිකඩවල් ඇගයීම උදෙසා 2013 දී අධ්‍යයනයක් ආරම්භ කෙරිණි. රතු දුඹුරු පසෙහි ලූනු වගාවේ ප්‍රතිඵලයන්ට අනුකූලව ලූනු වගාවේ මෙවලම් පිරිවැය මෙන්ම ජල පරිභෝජනය අවම කිරීම උදෙසා විසුරුම් ජල සම්පාදන ක්‍රමයේ සැලසුමේදී 40% විසුරුම් කලාප අතිපිහිත වීම යොදා ගනු ලැබිය හැක. ප්‍රතිඵල තහවුරු කිරීම උදෙසා අධ්‍යයනයන් නැවත සිදුකරනු ලබයි.
- පාංශු සංරක්ෂණ බැම් යනු වියළි කලාපීය උඩරට පාංශු සංරක්ෂණ ක්‍රමවේදයන් අතරින් වඩාත් ප්‍රායෝගික ක්‍රමවේදයක් බව සොයා ගනු ලැබිණි. කෙසේ වුවද මෙම ක්‍රමවේදය යොදා ගැනීමේදී ප්‍රායෝගික අපහසුකම් කිහිපයක් දක්නට ලැබේ. වියළි කලාපයේදී වාර්ෂාපෝෂිත උඩරට සඳහා අතිරේක වාරි පහසුකම් සහිතව විවිධ බහු කාර්ය පාංශු සංරක්ෂණ බැම් පද්ධතින් ඇගයීම උදෙසා දිගු කාලීන අධ්‍යනයක් ආරම්භ කෙරිණි. දිගු කාලීන අධ්‍යයනයක් ලෙස මෙම පරීක්ෂණ අඛණ්ඩව සිදු කරනු ලබයි.

## ජෛව තාක්ෂණය

- මිරිස් පත්‍ර කොඩවීමේ රෝගය සඳහා ප්‍රතිරෝධී ආර /ප්‍රභේද හඳුනා ගැනීම සහ තහවුරු කිරීම
  - දේශීය මිරිස් එකතුන් 10ක් ක්ෂේත්‍රයේදී පරීක්ෂා කරනු ලැබූ අතර එයින් එකතුන් 2ක් ව්‍යුහාත්මකව මිරිස් කොළ කොඩවීමේ රෝගයට ප්‍රතිරෝධීබව හඳුනා ගැනිණි. අනුක ක්‍රමවේදයට අනුව මෙම ප්‍රතිඵල තහවුරු කිරීම් උදෙසා අධ්‍යයනයන් අඛණ්ඩව සිදු කරනු ලබයි.
- වඩාත් පුළුල් මිරිස් මුහුම්කරණ වැඩසටහන තුළින් රෝගයන්ට ප්‍රතිරෝධී ලක්ෂණ ආරයන් හට ලබාදීම ආරම්භ කෙරිණි.
  - මිරිස් සඳහා කලල ආරක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කෙරිණි.
- අනුක සලකුණු උපයෝගී කරගනිමින් බඩඉරිඟු ගුණාත්මක ප්‍රෝටීන් (QPM) ඒකාබද්ධ බඩඉරිඟු ආර/ ප්‍රභේද වැඩිදියුණු කිරීම
  - ආර හුදකලා කිරීම උදෙසා F1 ගහන අතරම මුහුම් සහ පළමු

පිළිදෙමුහුම් සාර්ථකව සම්පූර්ණ කෙරිණි.

- බීජ රෝපණය මගින් වැදගත් මිදි ප්‍රභේදවල ක්ෂුද්‍ර ප්‍රචාරණය

  නලස්ථ තත්ත්වයන් යටතේ බීජ රෝපණය තුළින් විශාල ලෙස රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ආරම්භ කරනු ලැබූ අතර රෝපණ ආරම්භ තත්ත්වයන් ලබාදීම අඛණ්ඩව සිදු වනු ලැබේ.

- විකෘති කල්ලි මගින් නව ලොකු ලූනු ආර වැඩිදියුණු කිරීම

  කණක ඇතිවීම උදෙසා විවිධ ක්‍රමවේද පරීක්ෂා කරනු ලබමින් තිබේ.

- මිරිස් පත්‍ර කොඩවීමේ වෛරසය සඳහා ජාන වෙනස්වීමට ප්‍රතිරෝධීබව වැඩිකිරීම උදෙසා ජාන අනුපිළිවෙළ හඳුනාගැනීම

## බීජ නිෂ්පාදනය

### අභිජනන සහ සහතික කළ / වාණිජමය බීජ නිෂ්පාදනය

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය විසින් පහත ප්‍රමාණයේ අභිජනන සහ සහතික කළ/ වාණිජමය බීජ නිෂ්පාදනය කරනු ලැබ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය වෙත ලබාදුණි.

**වගුව 1.1.2: 2013 වර්ෂය තුළදී නිෂ්පාදනය කළ අභිජනන සහ සහතික කළ / වානිජ බීජ**

| බෝගය | ප්‍රභේදය | අභිජනන බීජ නිෂ්පාදනය (kg) | සහතික කළ වානිජමය බීජ නිෂ්පාදනය (kg) |
|---|---|---|---|
| බඩඉරිඟු | රුවන් | 39.0 | - |
| | භද්‍රා | 39.0 | - |
| කුරක්කන් | රාවණා | 29.0 | - |
| | ඕෂද | 29.0 | - |
| මිරිස් | MI – Green | 3.5 | 52.0 |
| | ගල්කිරියාගම වරණය | 2.0 | 23.0 |
| | MI 2 | 3.5 | 35.0 |
| | MICH 3 | 5.0 | - |
| මුං | ආරි | 27.0 | 33.0 |
| | MI 5 | 31.5 | 21.0 |
| | MI 6 | 49.0 | 14.0 |
| ලොකු ලූනු | දඹුල්ල වරණය | සත්‍ය බීජ 8.5 | 6.5 |
| උඳු | MI 1 | 34.0 | - |
| | අනුරාධ | 38.0 | 79.0 |
| සෝයා බෝංචි | Pb 01 | 175.0 | 55.0 |
| | MISB 01 | 80.0 | 70.0 |

| බෝගය | ප්‍රභේදය | අභිජනන බීජ නිෂ්පාදනය (kg) | සහතික කළ වානිජමය බීජ නිෂ්පාදනය (kg) |
|---|---|---|---|
| කව්පි | ධවල | 5.5 | 2.0 |
| | MICP 01 | 57.0 | - |
| | MI 35 | 10.0 | 4.6 |
| | වරුණි | 46.0 | - |
| | බොම්බේ | 24.6 | - |
| බණ්ඩක්කා | හරිත | - | - |
| | MI 7 | 5.8 | - |
| කරවිල | MC 43 | 7.0 | - |
| තක්කාලි | KCI | 0.25 | - |
| පතෝල | MI – Short | 1.9 | - |
| මුරුංගා | බද්ධ - ප්‍රභේදය | - | 8.0 |

## තාක්ෂණ ව්‍යාප්තිය

- ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ විද්‍යාර්ථවේදීන් සම්පත් දායකයින් ලෙස විවිධ වැඩසටහන්වලට සහභාගී වීම.
  - නිලධාරීන්, ගොවීන්, පාසල් සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සහ කාර්මික විද්‍යාලයන්හි ශිෂ්‍යයින් සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග පිළිබඳව පුහුණු වැඩසටහන් 100කට වැඩි සංඛ්‍යාවක් පවත්වනු ලැබිණි.
  - පැළෑටි සායන 6ක් පවත්වනු ලැබිණි.
  - ජාතික ප්‍රදර්ශනය හට සහභාගී වීම.
  - ගොවි සතිය ප්‍රදර්ශනයට සහභාගී වීම.
  - ව්‍යාප්ති නිලධාරීන් සමඟ ක්ෂේත්‍ර චාරිකා 250කට වැඩි සංඛ්‍යාවක් පැවැත්වීම.
- ආයතනය වෙත පැමිණි සහ දුරකථනය තුළින් සම්බන්ධ වූ සේවා දායකයින් 600කට වැඩි ප්‍රමාණයකට තාක්ෂණික උපදේශ ලබාදීම.
- තාක්ෂණික කරුණු පිළිබඳ වූ පත්‍රිකා 14,000ක් පමණ බෙදා හරිනු ලැබිණි.
- ගොවීන් සහ වෙනත් ආයතන සඳහා නොමිලේ රෝපණ ද්‍රව්‍ය නිකුත් කෙරිණි.

  බීජ රෝපණ ද්‍රව්‍ය : 55 (මිරිස්, ලොකු ලූනු, මුං, උඳු, බඩඉරිඟු, සෝගම්, කව්පි, සෝයා බෝංචි, කුරක්කන්, රටකජු, සූරියකාන්ත, බණ්ඩක්කා, තක්කාලි, කරවිල, මෛනේරි, තණහාල්, මුරුංගා)
- විශ්ව විද්‍යාල සිසුන් 7 දෙනෙකු පැළ පිළිබඳ ස්වකීය පුහුණුව ආයතනයේදී සම්පූර්ණ කරනු ලැබිණි. උපාධිය හදාරන ශිෂ්‍යයින් 5 දෙනෙකු ස්වකීය අවසන් වසර ව්‍යාපෘතිය සම්පූර්ණ කරනු ලැබිණි.

## රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන්

- 2013 වර්ෂය තුළදී ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ

සහභාගිත්වය ඇතුව ගුවන් විදුලි වැඩසටහන් 7ක් සහ රූපවාහිනී වැඩසටහන් 3ක් විකාශය කරනු ලැබිණි.

### පුවත්පත් ලිපි

- 2013 වර්ෂය තුළදී ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ විද්‍යාර්ථවේදීන් සහභාගීත්වය ඇතුව පුවත්පත් ලිපි 6ක් ප්‍රකාශයට පත් කෙරිණි.

### සංවර්ධන ව්‍යපෘති

මිරිස්, බඩඉරිඟු සහ ලූනුවල දෙමුහුම් සහ විවෘත පරාගන ප්‍රභේද වැඩිදියුණු කිරීම උදෙසා බෝග ප්‍රවර්ධන වැඩසටහනට සහාය වීම උදෙසා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන උප ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ පහත කාර්යයන් සැලසුම් කරනු ලැබ ආරම්භ කෙරිණි.

- පාලිත පාරිසරික තත්ත්වයන් යටතේ පරීක්ෂණ සිදුකිරීම සඳහා පාරිසරික වශයෙන් පාලනය කළ හැකි විශාල පරිමාණයේ පැළ ගෘහ ඉදිකිරීම.
- ප්‍රභේද නියඟයන්ට ඔරොත්තු දීමේ හැකියාව පරික්ෂා කිරීම උදෙසා වැසි සහිත තත්ත්වයන්ගෙන් ආරක්ෂා කරගත හැකි පරිදි වහලවල් ඉදිකිරීම (Rainout Shelter)
- වැසි ආවරණ තත්ත්වයන් යටතේ පරීක්ෂණ පැවැත්වීම උදෙසා වැසි ආවරණ ඉදිකිරීම
- ප්‍රභේදවලට අවශ්‍ය උෂ්ණත්වයන් පරික්ෂා කිරීම උදෙසා උෂ්ණත්වය ශ්‍රේණියක් සේ වෙනස් වන කුටීර ඉදිකිරීම.
- වාරි පහසුකම් ශක්තිමත් කිරීම උදෙසා දැනට පවතින ප්‍රෘෂ්ඨීය වාරිමාර්ග පද්ධතීන් ප්‍රතිසංස්කරණය මගින් ප්‍රවර්ධනය කිරීම සහ ජල සැපයුම් කාර්යක්ෂමතාව ඉහළ දැමීම උදෙසා ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධතීන් හඳුන්වාදීම
- පවතින පරීක්ෂණාගාර, පැළ ගෘහ සහ ගබඩා පහසුකම් සංවර්ධනය මහා පරිමාණ ශීත ගබඩා 2ක් ඉදිකිරීම
- ක්ෂේත්‍ර කටයුතුහිදී උචිත යාන්ත්‍රිකරණය උදෙසා වූ ක්ෂේත්‍ර යන්ත්‍ර ලබාගැනීම
- පරීක්ෂණාගාර උපකරණ ලබා ගැනීම
- වටේ පවතින වැටවල් ශක්තිමත් කිරීම.

## 2014 සැලසුම

### පර්යේෂණ

- බෝග ප්‍රවර්ධන සහ ප්‍රභේද වැඩිදියුණු කිරීම
- වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා කාළගුණික වෙනස්වීම් බලපෑම
- වෙනත් ක්ෂේත්‍ර බෝගයන් සඳහා නව පළිබෝධ සහ රෝග කළමනාකරණ ක්‍රමෝපායන් සංවර්ධනය
- වෙනත් ක්ෂේත්‍ර බෝගවල ජල භාවිත කාර්යක්ෂමතාව සහ පෝෂක භාවිත කාර්යක්ෂමතාව ඉහළ දැමීම.

### අභිජනන බීජ නිෂ්පාදනය

- නිර්දේශිත වෙනත් බෝග ප්‍රභේද සහ තක්කාලි, බණ්ඩක්කා සහ කරවිල අභිජනන බීජ නිෂ්පාදනය
- නිර්දේශිය ලූනු ප්‍රභේදයන්හි (දඹුල්ල වරණය) අභිජනන මව් බල්බ සහ බීජ නිෂ්පාදනය.

## කාර්ය මණ්ඩලය

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරී | 25 |
| කෘෂිකර්ම නිලධාරී | 01 |

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 03 |
| පර්යේෂණ සහකාර | 19 |
| කෘෂිකර්ම උපදේශක | 05 |
| පර්යේෂණ උපසහකාර | 09 |
| තාක්ෂණික සහකාර | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 14 |
| ගොවිපල පවිත්‍රකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| රියදුරු | 08 |
| බද්ධකරු | 01 |
| ගබඩාකරු | 02 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 04 |
| මුරකරු | 30 |
| කම්කරු (ස්ථිර) | 119 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 204 |
| **එකතුව** | **454** |

# 1.1.1 මාෂ බෝග සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණකොළපැලැස්ස

මාෂ බෝග සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය දකුණු වියළි කලාපයේ පිහිටා ඇති ප්‍රධාන කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානයයි. මාෂ බෝග හා තෙල් බෝග සහ කලාපීය වශයෙන් වැදගත් වන එළවළු හා පලතුරු බෝගවලට අදාළ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් කෙරෙහි මෙය ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරයි. වීරවිල පිහිටි සිය උප පර්යේෂණ ස්ථානය සමග එක්ව කෘෂිකාර්මික ඵලදායිතාව වර්ධනය කිරීම පිණිස තාක්ෂණය ලබාදීම මෙයට පැවරී ඇති තවත් වගකීමකි. සියලුම පර්යේෂණ වැඩසටහන් ජාතික හා කලාපීය පර්යේෂණ අවශ්‍යතා මත පදනම්ව බෝග වැඩිදියුණු කිරීම, ශස්‍ය විද්‍යාව, පැළෑටි සංරක්ෂණය, පාංශු හා ජල කළමනාකරණය යන ක්ෂේත්‍රවලට අදාළව සැලසුම් කෙරේ.

එයට අමතරව, මෙම මධ්‍යස්ථානය අභිජනන බීජ හා මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයේ ද ස්ථානීය විශේෂිත පොහොර නිර්දේශ ලබාදීමේ ද ක්ෂේත්‍ර නිලධාරීන්ට, ගොවීන්ට සහ උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වයන්ට තාක්ෂණික තොරතුරු ප්‍රචාරණය කිරීමෙහි ද නියැළෙයි.

## අයවැය

**වගු අංක 1.1.1.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 7,959,500 | 6,383,223 | 80 |
| පුනරාවර්තන | 22,671,600 | 20,945,365 | 92 |
| **ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘති** | | | |
| • මධ්‍ය කාලීන, ඉහළ අස්වනු ගෙනදෙන හා විශාල බීජ සහිත රටකජු ප්‍රභේද බිහි කිරීම | 268,700 | 264,700 | 99 |
| • තේරාගත් අබ ආරවල අනුවර්තන හැකියාව පරීක්ෂා කර බැලීම | 562,400 | 560,525 | 100 |
| • ඉහළ අස්වනු ගෙනදෙන, කඳ හා මුල් කුණුවීමේ රෝගයට ඔරොත්තු දෙන, බීජ සුදු පැහැති තල ප්‍රභේද බිහි කිරීම | 410,500 | 404,500 | 99 |
| • නියඟයට ඔරොත්තු දෙන කව්පි ප්‍රභේද වැඩිදියුණු කිරීම | 538,000 | 532,335 | 99 |
| • කුඹුරු ඉඩම්වල මැද කන්න බෝගයක් වශයෙන් වගා කිරීමට සුදුසු ඉහළ අස්වනු ගෙනදෙන කෙටි කාලීන මුං ප්‍රභේදයක් බිහි කිරීම | 350,800 | 350,800 | 100 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| • කව්පි සහ මුං සඳහා කාර්යක්ෂම ජල කළමනාකරණ පිළවෙත් මාලාවක් බිහි කිරීම | 840,000 | 792,976 | 94 |
| • කව්පි වගාවේ වයිරස් රෝග හඳුනා ගැනීම සහ එම රෝග පාලන පිළිවෙත් මාලාවක් බිහි කිරීම | 492,500 | 492,000 | 100 |
| • රටකජු අස්වැන්න කෙරෙහි වල් පැළ මගින් ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම සහ බෝගය හා වල් පැළ අතර තරඟකාරීත්වයක් ඇති වන තීරණාත්මක කාල සීමාව නිශ්චය කිරීම | 196,100 | 192,453 | 98 |
| • බීජ රහිත මිදි ප්‍රභේද බිහි කිරීම සඳහා මිදි ජනකප්ලාස්ම එක්රැස් කිරීම, සංරක්ෂණය සහ ඇගයීම | 1,317,400 | 1,265,225 | 96 |
| • මිලියන 100 ව්‍යාපෘතිය | 21,505,000 | 12,597,623 | 59 |
| **එකතුව** | **57,112,500** | **44,681,725** | **78** |

# ප්‍රගතිය

## පර්යේෂණ

### ශස්‍ය විද්‍යාව

- දකුණු වියළි කලාපයේ ($DL_{1b}$, $DL_5$) වර්ෂා පෝෂිත කෘෂිකාර්මික ක්‍රමයේ ස්වභාවය හඳුනා ගැනීම පිණිස සමීක්ෂණයක් සාර්ථකව සිදු කර නිම කෙරිණි. වෙනත් ක්ෂේත්‍ර බෝග වගා බිම් ප්‍රමාණය වැඩි වශයෙන්ම සුළු පරිමාණ වගාවන්ට සීමා විය. වෙනත් ක්ෂේත්‍ර බෝග අතරින් වඩාත්ම ප්‍රචලිත වූයේ කව්පි සහ රටකජුය. වැඩි වශයෙන්ම කෙසෙල් සහ පොල් කෙරෙහි ගොවීන්ගේ වැඩි කැමැත්ත හිමි විය. ජනගහනයෙන් බහුතරය කලාගුණික විපර්යාසය පිළිබඳව දැනුවත් වුව ද පාංශු සහ තෙතමන සංරක්ෂණ ක්‍රියාමාර්ග අනුගමනය කරනුයේ මඳ වශයෙනි. ගොවීන් නව තාක්ෂණයන් භාවිත කිරීමේ කැමැත්තෙන් පසු වුවද සාම්ප්‍රදායික වාර්ෂාපෝෂිත ක්‍රම තුළ තාක්ෂණ භාවිතය අවම මට්ටමක පවතී.

- අඟුණකොළපැලැස්ස කෘෂි පාරිසරික කලාපයේ ($DL_{1b}$) මුං වගාවට රයිසෝබියම් ආමුකුලනය කිරීමෙන් පෙනී ගියේ රයිසෝබියම්+කෘෂිකර්ම දෙපාර්තමේන්තු ෆොස්ෆරස්, පොටෑසියම් පොහොර නිර්දේශය හේතුවෙන් සැලකිය යුතු ඉහළ පර්ව සංඛ්‍යාවක් ඇති වූ නමුත් අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් ඇති නොවූ බවකි.

- පරිණතවීම සඳහා දින 60කටද වඩා වැඩි කාලයක් ගත වූ නමුත් උඳු, මෙනේරි සහ එළවළු සෝයා බෝංචි වැනි වෙනත් ක්ෂේත්‍ර බෝග තෙවන කන්නයේදී (යල කන්නයේ අවසානයත් සමගම රොපණය කිරීම) මනා ක්‍රියාකාරීත්වයක් පෙන්විය.

## ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

### කව්පි

- නව කව්පි වර්ග 4ක් MICP 1, වරුණි හා බොම්බේ යන සම්මත සැසඳුම් ප්‍රභේද සමග ඇගයීමට ලක් කරන ලදී.

### මුං

- නව මුං වර්ග 5ක් MI 5 සහ MI 6 යන සම්මත සැසඳුම් ප්‍රභේද සමග ඇගයීමට ලක් කරන ලදී.

### බඩඉරිඟු

- එළමහනේ පරාගණය වූ බඩඉරිඟු වර්ග 3ක් රුවන් නමැති සම්මත සැසඳුම් ප්‍රභේදය සමග ඇගයීමට ලක් කෙරිණි.
- ඉන්දියාවේ පිහිටි අන්තර්ජාතික බඩඉරිඟු හා තිරිඟු වැඩිදියුණු කිරීමේ මධ්‍යස්ථානයෙන් ලද ජාත්‍යන්තර දෙමුහුම් 14ක් බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් වන NK 40 සහ පැසිෆික් 984 සමග ඇගයීමට ලක් කෙරිණි.
- CML 451 සහ CML 171 යන බලාපොරොත්තු තැබිය හැකි නුමුහුම් බඩඉරිඟු ආර ගුණනය කරන ලදී.

## බෝග වැඩිදියුණු කිරීම

### තෙල් බෝග

### රටකජු

- බලාපොරොත්තු තැබිය හැකි මධ්‍ය කාලීන, මධ්‍යම ප්‍රමාණයේ රටකජු ප්‍රභේද (ICGV 87187, ICGV 86590 සහ ICGV 01276) බිහිකර නිල වශයෙන් නිදසස් කිරීම සඳහා ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුවට ඉදිරිපත් කරන ලදී.
- බලාපොරොත්තු තැබිය හැනි විශාල බීජ සහිත මාස 4 වයස් කාණ්ඩයේ රටකජු ආර 4ක් (ICGV 05200, ICGV 06189, ICGV 06216, ICGV 05198), විශාල බීජ සහිත මාස 3.5 වයස් කාණ්ඩයේ ආර 2ක් (ICGV 06214, ICGV 06233) සහ මධ්‍යම ප්‍රමාණයේ බීජ සහිත මාස 3.5 වයස් කාණ්ඩයේ ආර 3ක් (ICGV 00068, ICGV 04195, ICGV 00073) ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා හඳුනා ගන්නා ලදී.

### අබ

- බලාපොරොත්තු තැබිය හැකි අබ ආර 3ක් ගොවි ක්ෂේත්‍ර තුළ අත්හදා බලා ඒ අතරින් C 241 සහ බුත්තල වරණය ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව වෙත නම් කිරීම සඳහා හඳුනා ගන්නා ලදී.

### තල

- බලාපොරොත්තු තැබිය හැකි සුදු බීජ සහිත (ANKWS 22 හා ANKWS 38) හා කළු බීජ සහිත (ANKBS 9) තල ආර ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළ තවදුරටත් ඇගයීම සඳහා හඳුනා ගැනිණි.
- තල එකතුන් 30ක් ඇගයීමට ලක් කර ඉන් ආර 6ක් අස්වනු අත්හදා බැලීම් සඳහා තෝරා ගන්නා ලදී.

### සෝයා බෝංචි

- සෝයා බෝංචි ආර 14ක් අස්වනු අත්හදා බැලීම් දක්වා වැඩිදියුණු කර ඉදිරියට ගෙන යන ලදී.

### සූර්යකාන්ත

- සූර්යකාන්ත දෙමුහුම් 2ක් (හයිඔලෙයික් 41 සහ S40) ක්ෂේත්‍ර තත්ත්වය තුළ ඇගයීමට ලක්කර ශ්‍රී ලංකාවේ වගා කිරීම සඳහා යෝග්‍ය බවට හඳුනා ගන්නා ලදී. S40 දෙමුහුම පත්‍ර පුල්ලි රෝගයට මධ්‍යස්ථ මට්ටමකින් ගොදුරුවීමේ හැකියාවෙන් යුතු විය.

## මාෂ බෝග

### මුං

- මුං එකතුන් 45ක් ඇගයීමට ලක්කර ඉන් ආර 6ක් මූලික අස්වනු අත්හදා බැලීම් සඳහා තෝරා ගන්නා ලදී.
- දෙමුහුම් කිරීම සහ වැඩිදියුණු කර ඉදිරියට ගෙනයාම - මුහුන් 4ක් සිදුකර එෆ්1 සිට එෆ්5 දක්වා පරම්පරා ඉදිරියට ගෙනයන ලදී.
- තෝරා ගන්නා ලද මුං ආර 6ක් මූලික අස්වනු අත්හදා බැලීම් තුළ ඇගයීමට ලක් කෙරිණි.
- තෝරා ගන්නා ලද මුං ආර 6ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් තුළ ඇගයීමට ලක් කෙරිණි.
- විකෘති ගහනයෙන් (M2) තෝරා ගත් මුං පැළ වැඩිදියුණු කර ඉදිරියට ගෙන යන ලදී.

### කව්පි

- නියඟයට සාපේක්ෂ වශයෙන් ඔරොත්තු දෙන ආර වශයෙන් CP105 සහ CP128 මූලික අස්වනු අත්හදා බැලීම්වලදී අත්හදා බැලීම සඳහා හඳුනා ගන්නා ලදී.
- ප්‍රභේද නිදහස් කිරීම් කමිටුවට නම් කිරීම සඳහා සාපේක්ෂව ඉහළ අස්වනු ලබාදෙන බලාපොරොත්තු තැබිය හැකි කව්පි ආර 2ක් (CVA11 සහ CVA 14) ප්‍රභේද අනුවර්තීයතා අත්හදා බැලීම් මගින් හඳුනා ගන්නා ලදී.

### කොල්ලු

- ANK Black සහ ANK 3 සාපේක්ෂව ඉහළ අස්වනු ලබාදෙන බලාපොරොත්තු තැබිය හැකි කොල්ලු ආර 2ක් වශයෙන් හඳුනා ගන්නා ලදී. මෙම ආර ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුවට නම් කෙරෙනු ඇත.

## එළවළු

### වට්ටක්කා

- වට්ටක්කා ආර කිහිපයක් (ANKP - 0075, ANKP - 0069, ANKP - 0070, ANKP - 0045 සහ ANKP – 0074) බලාපොරොත්තු තැබිය හැකි ආර වශයෙන් තෝරා ගන්නා ලදී.
- 70%ක පවිත්‍රතාවෙන් යුතු නුමුහුම් ආර 8ක් බිහි කෙරිණි.

### බණ්ඩක්කා

- බණ්ඩක්කා ආර කිහිපයක් (ANKO - 00001, ANKO - 00022 සහ ANKO – 00016) ජානික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා හඳුනා ගන්නා ලදී.
- දෙමුහුම් ආර 6ක් වැඩිදුරටත් ඇගයීම සඳහා තෝරා ගන්නා ලදී.

### තුඹ කරවිල

- ඉහළ අස්වනු ගෙන දෙන, කරලෙහි ප්‍රමාණය විශාල ප්‍රභේද බිහි කිරීම සඳහා දෙමුහුම් ප්‍රභේද ජනන වැඩසටහන ආරම්භ කරන ලදී.
- මුහුන් 16ක් වැඩිදුර ඇගයීම් කටයුතු සඳහා ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදී.
- ජනකප්ලාස්ම 64ක් පරිබාහිර සංරක්ෂණ ක්‍රියාමාර්ගයක් වශයෙන් නඩත්තු කෙරෙමින් පවතී.
- රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා විසල් හා කේෂර නමැති තුඹ කරවිල ප්‍රභේදවල මව් වැල් තොග ක්ෂේත්‍රයේ නඩත්තු කෙරෙමින් පවතී.

### ලොකු ලූනු

- ගොවීන්ට බීජ පැළ සැපයීම පිණිස පැළ තවාන් 150ක් ස්ථාපිත කරන ලදී. තවත් පැළ තවාන් 150ක් මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ

සහ සංවර්ධන කටයුතු සඳහා ස්ථාපිත කරන ලදී.

### රුහුණු මිරිස්

- මුල් ගති ලක්ෂණ සහිත රුහුණු මිරිස් ගහන තෝර ගන්නා ලදී.

## උද්‍යාන බෝග වගාව

### දිවුල්

- ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පැවති දිවුල් එකතුන් 64ක් එක්රැස් කර බද්ධ කරන ලදී.

### බෙලි

- ශ්‍රී ලංකාවේ විවධ ප්‍රදේශවල පැවති බෙලි එකතුන් 15ක් එක්රැස් කර බද්ධ කරන ලදී.

### අඹ

- මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ඇති පැරණි අඹ වගාව සම්පූර්ණයෙන්ම කප්පාදු කර පුනරුත්ථාපනය කරන ලදී.

### කෙසෙල්

- බලාපොරොත්තු තැබිය හැකි කෝලිකුට්ටු (2), සීනි කෙසෙල් (4) සහ ඇඹුල් කෙසෙල් (3) එකතුන් 9ක ඇගයීම් කටයුතු ආරම්භ කෙරිණි.
- අග්‍රා සහ නදී නමැති කෙසෙල් ප්‍රභේද සහිත මව් ශාක උද්‍යානය සාර්ථකව නඩත්තු කරන ලදී.

### පැපොල්

- පැපොල් මුදු පුල්ලි වයිරස් රෝගයට ප්‍රතිරෝධීවීම සම්බන්ධයෙන් ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා පැපොල් ආර 12ක් හඳුනා ගන්නා ලදී (3වන පරම්පරාව).

### මිදි

- බීජ රහිත මිදි එකතුන් 4ක් සහ බීජ සහිත මිදි ප්‍රභේද 4ක් යොදා ගනිමින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් ස්ථාපිත කෙරිණි.

## පාංශු විද්‍යාව

- වී වගාවේදී නයිට්‍රජන් තිර කිරීම සහ ෆොස්ෆරස් ද්‍රාව්‍යතාව සම්බන්ධයෙන් දේශීය ජෛව පොහොර වර්ග 2ක් ඇගයීමට ලක් කෙරිණි. නයිට්‍රජන් හා ෆොස්ෆරස් නොයෙදූ අවස්ථාවට වඩා මෙම බැක්ටීරියා දෙකම මනා ක්‍රියාකාරීත්වයක් පෙන්වීය. නමුත් එය 50%ක අකාබනික පොහොර අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමාණවත් නොවීය.
- වී වගාව සඳහා දේශීය ද්‍රාව්‍ය පොහොර වර්ග 2ක් (Golf හා SMC express) ඇගයීමට ලක් කෙරිණි. අත්හදා බලන ලද කන්නයේදී වී අස්වැන්න කෙරෙහි මෙමගින් කිසිදු බලපෑමක් ඇති වූ බවක් සොයා නොගැනිණි.
- දකුණු වියළි කලාපයෙන් පාංශු නියැදි 100ක් එක්රැස් කර මහා සහ ක්ෂුද්‍ර පෝෂක සම්බන්ධයෙන් ඒවා විශ්ලේෂණය කෙරිණි.
- මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ලවණ එක්රැස් වූ ප්‍රදේශ හඳුනා ගන්නා ලද අතර ලවණතාවෙහි බලපෑමට ලක් වූ ප්‍රදේශ සඳහා ඉඩම් ගොඩ කිරීමේ පිළිවෙත් මාලාවක් හඳුන්වා දෙන ලදී.
- පාංශු පරීක්ෂණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

## ජල කළමනාකරණය

- කලාපය සඳහා ජල රැඳවුම් වක්‍රය (Water Retention Curve) නිර්මාණය කරන ලදී. ඒ අනුව දින 6ක කාල පරතරයකින් යුතුව ජල සම්පාදනය කිරීම වඩාත්ම සුදුසු බව සොයා ගැනිණි. පොහොර මිශ්‍රිත ජලය සමග

කාල පරතරවලින් යුතුව පොහොර යෙදීමෙන් මිරිස් අස්වැන්න දෙගුණ කළ හැකි බව මේ සම්බන්ධයෙන් සිදු කරන ලද අධ්‍යයනවලින් අනාවරණය විය.

- 2012/13 මහ කන්නයේ මුං බෝගයේ ජල අවශ්‍යතාව මි.මී. 193.86ක් වූ අතර යල කන්නයේදී මි.මී. 239ක් විය. මැද කන්නය ආරම්භ කිරීම සහ ප්‍රමාද වූ කන්න අදියර සඳහා බෝග සහසංගුණකය 0.5, 1, 1.2 සහ 0.7 අතර වෙනස් විය.
- මිරිස් වගාවට ජලය පිළිබඳ අහිතකර තත්ත්වයක් පවතින විට අනෙකුත් ප්‍රතිකර්ම අතර කළු පොලිතීන් වසුන් යෙදීමෙන් තෙතමනය රැඳීම ඉතා ඉහළින් සිදුවිය.

## ආහාර විද්‍යාව

### මුං

- නිදහස් කරන ලද ප්‍රභේද 4ක හා බලාපොරොත්තු තැබිය හැකි ආර 7ක පෝෂණ තත්ත්වය (දළ මේදය, තෙතමනය හා අළු අන්තර්ගතය) ඇගයීමට ලක් කෙරිණි. ආරි නමැති ප්‍රභේදය සැලකිය යුතු අයුරින් ඉහළ ඛණිජ ද්‍රව්‍ය අන්තර්ගතයක් වාර්තා කළ අතර වඩා ඉහළ මේද අන්තර්ගතයක් ආරි, හර්ෂ සහ MI 06 යන ප්‍රභේදවලින් වාර්තා විය.

### රටකජු

- නිදහස් කරන ලද රටකජු ප්‍රභේද 3ක සහ බලාපොරොත්තු තැබිය හැකි මධ්‍යම ප්‍රමාණයේ ආර 3ක පෝෂණ තත්ත්වය (දළ මේදය, තෙතමනය හා අළු අන්තර්ගතය) ඇගයීමට ලක් කෙරිණි. ICGV 01276 ප්‍රභේදයේ ඛනිජ ද්‍රව්‍ය අන්තර්ගතය සැලකිය යුතු අයුරින් වෙනස් විය. මේද අන්තර්ගතය අනෙක් සියලුම ප්‍රභේදවල සමාන විය.

### කෙසෙල්

- යාන්ත්‍රික ක්‍රම මගින් ඇඹුල් කෙසෙල්වල යුෂ වෙන්කර ගැනීම පිණිස ක්‍රමවේද සාර්ථකව අත්හදා බලන ලදී.

## පැළෑටි ව්‍යාධිවේදය

- මුං එකතුන් 13ක් සමග MI - 5 සහ MI - 6 යන ප්‍රභේද මුං ප්‍රභේද කහ විචිත්‍ර වයිරස් රෝගයට අදාළව ක්ෂේත්‍ර තත්ත්වය යටතේ අත්හදා බලන ලදී. ජාන දර්ශ 12ක් (MB4, MB27, MB28, MB 34, MB35, MB49, MB52, MB55, MB61, MB66 සහ MB71) රෝගයට ප්‍රතිරෝධී බවට හඳුනා ගැනිණි.
- වයිරස් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලද කව්පි එකතුන් සහ කව්පි ප්‍රභේද 80ක් අතරින් ඉතා ඉහළ ප්‍රතිරෝධිතාවෙන් යුතු ආර 50ක් සොයා ගැනිණි. එමෙන්ම ක්ෂේත්‍ර තත්ත්වය තුළ ජාන දර්ශ 27ක් ප්‍රතිරෝධී යැයි ද ජාන දර්ශ 6ක් මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී යැයි ද එක් එකතුවක් වයිරස්වලට මධ්‍යස්ථ වශයෙන් ගොදුරු විය හැකි යැයි ද සොයා ගැනිණි.
- විසුරුම් ජල සම්පාදනය, ආවරණ දැල් සහ පොලිතීන් වසුන් යෙදීමෙන් මිරිස් කොළ කොඩවීමේ රෝග ආසාදිත පැළෑටි ප්‍රතිශතය අඩුවෙන්ම වාර්තා විණි. ඇලි යොදා ගනිමින් සිදු කළ ජල සම්පාදන ප්‍රතිකර්මයේදී රෝගය ඉහළම මට්ටමින් වාර්තා විය.

## කීට විද්‍යාව

- මුං වගා කිරීමට සතියකට පෙර අතුරු බෝගයක් වශයෙන් සති 3ක් වයසැති කුරක්කන් බීජ පැළ ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීම, මුං බීජ සඳහා තයමෙතොක්සම් 70% WS යෙදීම, කහ පැහැති ඇලෙන සුළු උගුල් ස්ථාපිත කිරීම සහ කෘමීන්

පළවා හරින බෝගයක් වශයෙන් දාස්පෙතියා වගා කිරීම මුං වගාවේ කහ විචිත්‍ර වයිරස් ආසාදනය අවම කර ගැනීමේදී ඵලදායී වූ බව සොයා ගැනිණි.

- ජලය ලී. 1කට ග්‍රෑ. 40ක අනුපාතයෙන් කොහොඹ බීජ යුෂ හෝ ජලය ලී. 1කට මි. ලී. 3ක අනුපාතයෙන් කොහොඹ තෙල් යෙදීම කව්පි වගාවේ කව්පි ගුල්ලාගේ (*Callosobruchus maculates*) ක්ෂේත්‍ර ආසාදනයන් වළක්වා ගැනීමේදී ඵලදායී වූ බව සොයා ගැනිණි.
- මයික්‍රෝන සියයේ වැඩි ඝනත්වයෙන් යුතු ස්තර තුනේ පොලිඑතිලීන් මලු සහ සාමාන්‍ය පොලිසැක්, බෑකිඩාවන්ගේ හානි ඇති නොවී රනිල බෝග මාස 6ක් පුරා ගබඩා කර තබා ගත හැකි වාතය ඇතුළු නොවන ප්‍රශස්ත ගබඩා ව්‍යුහ බැව් සොයා ගැනිණි.

## වල් පැළෑටි විද්‍යාව

- රටකජු වගාවේ වල් පැළ පාලනය පිළිබඳ අධ්‍යයනයෙන් අනාවරණය වූයේ රෝපණය කිරීමෙන් පසු ගතවන සති 3 - 8 අතර කාලය රටකජු සඳහා වල් පැළ නොමැති විය යුතු තීරණාත්මක කාල සීමාව වන බවයි.

# කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, වීරවිල ($DL_5$)

## රටකජු

- දින 10ක කාල පරතරයකින් යුතුව ජල සම්පාදනය කිරීම රටකජු සඳහා පිරිවැයට වඩාත්ම සරිලන ජල සම්පාදන කාල පරතරය බැව් සැලකිය හැකිය.

## ලොකු ලූනු සහ රතු ලූනු

- ඇන්ත්‍රැක්නෝස් සහ බල්බ කුණුවීම වැනි දිලීර රෝග හේතුවෙන් බෝගවලට හානි සිදුවන හෙයින් සැප්තැම්බර්, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාස මෙම බෝග රෝපණයට උචිත නොවේ.

## බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

වසර තුළ තුඹ කරවිල පැළ 750ක් නිපදවා බෙදා හරින ලදී.

**වගු අංක 1.1.1.2: 2013 වර්ෂයේ බීජ නිෂ්පාදනය**

| බෝගය | ප්‍රභේදය | බීජ | | | රෝපණ ද්‍රව්‍ය | |
|---|---|---|---|---|---|---|
| | | අභිජනන බීජ (කි.ග්‍රෑ.) | වාණිජමය බීජ (කි.ග්‍රෑ.) | පරිභෝජනය සඳහා ගනු ලබන බීජ (කි.ග්‍රෑ.) | නිපදවන ලද සංඛ්‍යාව | නිකුත් කරන ලද සංඛ්‍යාව |
| රටකජු | ටිකිරි | 60 | | | | |
| | ඉන්දි | 106 | | | | |
| | වලව | 22 | 2,865 | - | | |
| | තිස්ස | 90 | | | | |
| | ANKG 1 | 22 | | | | |
| තල | උමා | 3.5 | 215 | - | | |

| බෝගය | ප්‍රභේදය | බීජ | | | රෝපණ ද්‍රව්‍ය | |
|---|---|---|---|---|---|---|
| | | අභිජනන බීජ (කි.ග්‍රෑ.) | වාණිජමය බීජ (කි.ග්‍රෑ.) | පරිභෝජනය සඳහා ගනු ලබන බීජ (කි.ග්‍රෑ.) | නිපදවන ලද සංඛ්‍යාව | නිකුත් කරන ලද සංඛ්‍යාව |
| තල | මාලි | 1.5 | | | | |
| කව්පි | | - | 70 | - | | |
| මුං | | - | 80 | - | | |
| සෝයා බෝංචි | | - | | 188 | | |
| වී | | - | 16,138 | 7,488 | | |
| කුරක්කන් | | | 214 | 112 | | |
| බඩඉරිඟු | | | | 73 (බීජ) 575 (අලුත් කරල්) | | |
| ජමනාරං | | | | | 10,000 | 1,300 |
| දෙළුම් | | | | | 15,000 | 10,000 |
| පටක රෝපණය මගින් විශාල වශයෙන් ප්‍රචාරණය කිරීම සඳහා කෙසෙල් | | | | | | 2,3000 |

## තාක්ෂණය ලබාදීම සහ පුහුණුව

- පහත සඳහන් මාතෘකා යටතේ ගුවන්විදුලි වැඩසටහන් පවත්වන ලදී.
  - මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ සේවා
  - ආනයනය කරන ලද බඩඉරිඟු දෙමුහුම්වලට වෛකල්පිත ලෙස දේශීය බඩඉරිඟු ප්‍රභේද වගාව - රුහුණු ගෙවත්ත
  - කුරක්කන් වගාවේ තාක්ෂණ ප්‍රචාරණය
  - හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවීන් සඳහා ලූනු වගාව
  - 2013 වර්ෂයේදී කෘෂිකර්ම දෙපර්තමේන්තුව විසින් නිදහස් කරන ලද ප්‍රභේද
  - පළිබෝධනාශක ආරක්ෂිතව පරිහරණය කිරීම

## සේවා සැපයීම

- පාංශු පරීක්ෂණ පදනම් කරගත් පොහොර නිර්දේශ ලබාදීම - පාංශු නියැදි 24ක් විශ්ලේෂණය කරන ලදී.
- ගොවි උපදේශන සේවය
- බෝග සායන

## විදේශ පුහුණු

- සංවර්ධනය වන රටවල් සඳහා මාෂ බෝග හා තෙල් බෝග සහ ජල සම්පාදනය ක්‍රම පුළුල්ව ප්‍රයෝජනයට ගැනීමේ තාක්ෂණය, චීනය
- පාංශු හා ජල කළමනාකරණය, අන්තර්ජාතික පරමාණුක ශක්ති අධිකාරිය, ඔස්ට්‍රියාව
- ආසියානු කලාපය සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණයේ ආහාර සැකසුම් කර්මාන්තවලට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය පිළිබඳව කලාපීය වැඩමුළුව, තායිලන්තය
- බෝග පැළෑටි සම්බන්ධ නව විකෘතිජනන ප්‍රවේශයන්, අන්තර්ජාතික පරමාණුක ශක්ති අධිකාරිය - කලාපීය සහයෝගිතා ගිවිසුම, චීනය

# 2014 වර්ෂය සඳහා සැලැස්ම

## පැළෑටි අභිජනනය

### රටකජු

- සාම්ප්‍රදායික හා විකෘති අභිජනන ක්‍රම මගින් රටකජු ප්‍රභේද වැඩිදියුණු කිරීම
- පළිබෝධ හා රෝග සම්බන්ධයෙන් ප්‍රභේද අත්හදා බැලීම
- දිගු හා මධ්‍ය කාලීන රටකජු ප්‍රභේද පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තතා අත්හදා බැලීම් පැවැත්වීම
- තිස්ස, ඉන්දි, ටිකිරි, වලව හා ANKGI යන රටකජු ප්‍රභේදවල අභිජනන බීජ නිෂ්පාදනය
- බලාපොරොත්තු තැබිය හැකි රටකජු ආරවල බීජ ගුණනය කිරීම

### තල

- අස්වැන්න, පළිබෝධ හා රෝගවලට ඔරොත්තු දීම සම්බන්ධයෙන් ප්‍රභේද අත්හදා බැලීම
- සාම්ප්‍රදායික හා විකෘති අභිජනනය තුළින් ප්‍රභේද වැඩිදියුණු කිරීම
- උමා හා මාලි යන තල ප්‍රභේදවල අභිජනන බීජ නිෂ්පාදනය

### අබ

- බලාපොරොත්තු තැබිය හැකි අබ ආරවල බීජ ගුණනය

### සෝයා බෝංචි

- සෝයා බෝංචි පිළිබඳ දෙමුහුම්කරණ වැඩසටහන

### මුං

- ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන
- ඉහළ අස්වනු ගෙන දෙන සහ කලින් පරිණත වන මුං ප්‍රභේදයක් බිහි කිරීම සඳහා මූලික අස්වනු අත්හදා බැලීම් පැවැත්වීම
- උසස් තත්ත්වයේ බීජ හා අනෙකුත් ශස්‍ය විද්‍යාත්මක ලක්ෂණ සහිත ඉහළ අස්වනු ගෙනදෙන ප්‍රභේද බිහි කිරීම සඳහා ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් පැවැත්වීම
- ප්‍රේරිත විකෘත තාක්ෂණය තුළින් නියඟයට ඔරොත්තු දෙන මුං ප්‍රභේදයක් බිහි කිරීම
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සහ අනෙකුත් පර්යේෂණ කටයුතු සඳහා බලාපොරොත්තු තැබිය හැකි ආරවල බීජ ගුණනය

## කව්පි

- අස්වැන්න, පළිබෝධ හා රෝගවලට ඔරොත්තු දීම සම්බන්ධයෙන් ප්‍රභේද අත්හදා බැලීම
- සාම්ප්‍රදායික පැළෑටි අභිජනන ක්‍රම තුළින් නියඟයට ඔරොත්තු දෙන කව්පි ප්‍රභේද බිහි කිරීම
- ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන
- කෙටි කාලීන කව්පි ආර පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම
- බීජ ගුණනය

## ශස්‍ය විද්‍යාව

- DL $_{1b}$ කෘෂි පාරිසරික කලාපයේ වගා කරන මුං බෝගය කෙරෙහි ආමුකුලනය මඟින් ඇති කරන බලපෑම
- තෙවන කන්න වගාවට අදාළව වෙනත් ක්ෂේත්‍ර බෝග ඇගයීම

## පාංශු විද්‍යාව

- රටකජු සහ ලොකු ළූනු පිළිබඳ පැළෑටි පෝෂක ප්‍රතිචාර අධ්‍යයන
- පසේ සරුබව පිළිබඳ තත්ත්වය තක්සේරු කිරීම

## ජල කළමනාකරණය

- මිරිස් සහ මුං වගාව සඳහා කාර්යක්ෂම ජල කළමනාකරණ තාක්ෂණයන් හඳුනා ගැනීම

## ව්‍යාධිවේදය

- ෆ්‍යුසේරියම් මැලවීමේ රෝගයට (*Fusarium ox sporium* f.sp. *cubense* (Foc) ප්‍රතිරෝධී වීම/ ඔරොත්තු දීම සඳහා නලස්ථ කෙසෙල්වල විකෘති ජනනය
- කව්පි වගාවේ වයිරස් රෝග, මිරිස් වගාවේ කොළ කොඩවීමේ සංකීර්ණය හා ළූනුවල බල්බ කුණුවීම කළමනාකරණය
- කෙසෙල් තුළ ෆ්‍යුසේරියම් මැලවීමේ රෝගයට ඔරොත්තු දීම ඇති කිරීම

## කීට විද්‍යාව

- කව්පි වගාවේ ප්‍රධාන ක්ෂේත්‍ර කෘමි පළිබෝධ කළමනාකරණය
- රනිල සහ ධාන්‍ය වර්ග ගබඩා කිරීම සඳහා වාතය ඇතුළු නොවන සේ නිර්මාණය කළ ගබඩා ක්‍රම හඳුන්වාදීම

## වල් පැළෑටි විද්‍යාව

- රටකජු වගාවේ වල් පැළ කළමනාකරණය

## ආහාර විද්‍යාව හා තාක්ෂණය

- මුං, රටකජු සහ කෙසෙල්වල පෝෂණ තත්ත්වය ඇගයීම
- රටකජු තැම්බීම සඳහා අස්වනු නෙළීමට සුදුසුතම කාලය නිශ්චය කිරීම

## එළවළු

- එළිමහනේ පරාගණය වූ බණ්ඩක්කා ආර පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම
- කහ විචිත්‍ර වයිරස් රෝගයට ප්‍රතිරෝධී බණ්ඩක්කා ආර තෝරා ගැනීම
- දෙමුහුම් බණ්ඩක්කා ආර පිළිබඳ අස්වනු අත්හදා බැලීම් පැවැත්වීම
- තෝරා ගන්නා ලද වට්ටක්කා ආරවල ගහන වැඩිදියුණු කිරීම
- තෝරා ගන්නා ලද දෙමුහුම් ආර ඇගයීම
- පවතින ජනකප්ලාස්ම නඩත්තු කිරීම
- රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- බණ්ඩක්කා, වට්ටක්කා, තුඹ කරවිල සහ රුහුණු මිරිස් ප්‍රභේද වැඩිදියුණු කිරීම

## පලතුරු

- දිවුල් සහ බෙලි ක්ෂේත්‍ර ජාන බැංකු පිළිබඳ ඇගයීම් කටයුතු
- කෙසෙල් එකතූන් ඇගයීම
- DL 1b කලාපීය තත්ත්වය යටතේ තෝරාගත් හීං නාරං එකතූන් ඇගයීම
- දිවුල් සඳහා විවිධ බද්ධ ක්‍රම සහ තවාන් තත්ත්වයන් ඇගයීම
- අඹ ශාකයේ පිටත වියන ගෝලාකාර වන සේ කප්පාදු කිරීම හා වැඩි ඝනත්වයක් ඇතිවන සේ පැළ රෝපණය කිරීම

## කාර්ය මණ්ඩලය

**මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 14 |
| වැඩසටහන් සහකාර | 01 |
| සංවර්ධන නිලධාරි | 03 |
| ගොවිපළ කළමනාකරු | 01 |
| පර්යේෂණ සහකාර | 10 |
| කෘෂිකර්ම උපදේශක | 05 |
| පර්යේෂණ උප සහකාර | 05 |
| පරිපාලන නිලධාරි | 01 |
| කළමනාකරණ සහකාර | 05 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| රියදුරු | 07 |
| මුරකරු | 13 |
| කම්කරු (ස්ථිර) | 40 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 156 |
| **එකතුව** | **269** |

**කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, වීරවිල**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ සහකාර | 02 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| රියදුරු | 01 |
| මුරකරු | 03 |
| කම්කරු (ස්ථිර) | 10 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 08 |
| **එකතුව** | **26** |

# 1.1.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල

මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ පවතින අරලගංවිල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙනත් ක්ෂේත්‍ර බෝග අංශයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නිරත වේ. එයට අමතරව, මෙම මධ්‍යස්ථානය යටතට ගැනෙන මහවැලි බී, සී, ඩී සහ ජී කලාප, නැගෙනහිර පළාත සහ පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශය සඳහා වී, එළවළු සහ පලතුරු බෝග ආවරණය වන පරිදි එම ප්‍රදේශවල කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ අවශ්‍යතා සපුරාලීමේ වගකීමද මෙවෙත පැවරී ඇත. කලාපීය වැඩසටහන් හැරුණු විට, මෙය, ශස්‍ය විද්‍යාව, කීට විද්‍යාව, පැළෑටි ව්‍යාධිවේදය, පැළෑටි අභිජනනය, පාංශු හා ජල කළමනාකරණය සහ උද්‍යාන බෝග වගාව වැනි විවිධ විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරෙන පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්වල නියැළීම මගින් ජාතික වශයෙන් සම්බන්ධීකරණය කෙරෙන පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්ට ද සහයෝගය ලබාදෙයි.

## අයවැය

**වගු අංක 1.1.2.2: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 11,910,000 | 9,983,889 | 84 |
| මූලධන | 7,767,000 | 5,605,138 | 72 |
| **ව්‍යාපෘති** | | | |
| මිලියන 100 බීජ නිෂ්පාදන වැඩසටහන | 7,895,000 | 3,238,450 | 41 |
| පැපොල් අභිජනන බීජ වැඩසටහන | 105,000 | - | 0 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම - කෙසෙල් | 50,000 | 45,000 | 90 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම - ජල කළමනාකරණය | 960,000 | 863,438 | 90 |
| **එකතුව** | **28,687,000** | **19,735,916** | **69** |

## ප්‍රගතිය

### ප්‍රභේද වැඩිදියුණු කිරීම

#### වී

අරලංගවිල පැවති ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහනේදී මාස 4 - 4.5 වයස් කාණ්ඩයේ ආර 7ක්, මාස 3.5 වයස් කාණ්ඩයේ ආර 18ක් හා මාස 3 වයස් කාණ්ඩයේ ආර 5ක් සැසඳුම් ප්‍රභේදවලට වඩා ඉහළ අස්වනු ලබාදිණි.

#### පොකුරු ලූනු

- පොකුරු ලූනු එකතූන් 79ක් ඒවායෙහි රූපවිද්‍යාත්මක සහ තත්ත්වමය ලක්ෂණ

අනුව ඇගයීමට ලක් කෙරිණි. ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් සඳහා කෙටි කාලීන එකතුන් (දින 60ට වඩා අඩු කාලයකින් පරිණත වන) 9ක් සහ මල් හට ගන්නා වර්ග (මල් හට ගැනීම 5%ට වැඩි) 22ක් තෝරා ගන්නා ලදී. ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්වලින් වැඩි අස්වනු (හෙ.1කට ටො. 13ක සාමාන්‍ය අස්වැන්නක්) ගෙනදෙන උසස් තත්ත්වයේ බලාපොරොත්තු තැබිය හැකි පොකුරු ලූනු ආර 2ක් (ACA 16 සහ ACA 66) පෙන්වා දෙනු ලැබිය. මෙම ප්‍රභේද 2 ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සඳහා තෝරා ගන්නා ලදී.

- සියලුම පොකුරු ලූනු ආර ඒවායෙහි පුං වන්ධ්‍යතාව සනාථ කර ගැනීම සඳහා ස්වපරාගණයට ඉඩ හැරිණි. ස්වපරාගණය යටතේ සියලුම ආර වන්ධ්‍යතාවෙන් යුතු බැව් නිරීක්ෂණය කිරීමට ලැබිණි. මෙය තවදුරටත් තහවුරු කර ගැනෙනු ඇත.
- පොකුරු ලූනුවල දෙමුහුම් බීජ ඇති කිරීම සඳහා ජන්මාණුනාශක (Gametocide) වශයෙන් එකිනෙකට වෙනස් ගිබෙරලික් අම්ල සාන්ද්‍රණයන් භාවිත කරන ලදී. අදාළ දත්ත විශ්ලේෂණය කෙරෙමින් පවතී.
- මුහුන් කරන ලද ආර සහ එළිමහනේ පරාගණය වූ ආර 13ක (පොකුරු ලූනු) බීජ එක්රැස් කර ගැනිණි.

## උද්‍යාන බෝග

### අඹ

- බලාපොරොත්තු තැබිය හැකි අඹ එකතුන් 58ක් නඩත්තු කර අගයන ලදී. ඒ පිළිබඳ ප්‍රමාණමය හා තත්වමය අස්වනු දත්ත එක්රැස් කර ගැනිණි. ACC 116 සහ 28 21.0ක් වූ ඉහළම බ්‍රික්ස් අගය පෙන්නුම් කළ අතර ACC 27 ප්‍රමාණයෙන් විශාලතම ඵල (ග්‍රෑ. 330) ලබාදිණි. දත්ත එක්රැස් කෙරෙමින් පවතී.
- කරතකොළොම්බන් සහ වෙල්ලෙයිකොළොම්බන් යන ප්‍රභේදවල මල් හට ගැනීම සහ රිකිලි වර්ධනය වන ආකාරය අධ්‍යයනය කරන ලදී. මල් හට ගැනීම අගෝස්තු මාසයේ 2වන සතියේදී ආරම්භ වූ අතර කරතකොළොම්බන් සහ වෙල්ලිකොළොම්බන් ප්‍රභේදවල පිළිවෙළින් 61%ක සහ 30%ක මල් හට ගැනීමක් නිරීක්ෂණය කෙරිණි.

### කෙසෙල්

ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන යටතේ සීනි කෙසෙල් එකතුන් 7ක් ඇගයීමට ලක් කෙරිණි. HCK 143, PGRC 1 සහ MKS යන එකතුන්වල කැන්වල බර කි.ග්‍රෑ. 8ද ඉක්මවීය. පරීක්ෂණය සිදුකෙරෙමින් පවතී.

### පැපොල්

රත්න ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය සඳහා පැපොල් ක්ෂේත්‍රයක් ස්ථාපිත කරන ලදී. මෙම ක්ෂේත්‍රය බීජ සහතික කිරීමේ සේවය යටතේ ලියාපදිංචි කරන ලදී.

## ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

### බතල

අනෙක් සැසඳුම් ප්‍රභේදවලට සාපේක්ෂව මැලේසියන් ප්‍රභේදය ඉහළ අස්වැන්නක් ලබාදුණි.

### වම්බටු

සැසඳුම් ප්‍රභේදවලට සාපේක්ෂව වම්බටු එකතුන් 4ක් ඉහළ අස්වනු ගෙනදිණි.

### කරවිල

අත්හදා බලන ලද අනෙකුත් එකතූන්වලට සාපේක්ෂව T16 එකතුව හෙ. 1කට මෙ.ටො. 10.5ක ඉහළ අස්වැන්නක් ලබාදිණි.

### පිපිඤ්ඤා

අනෙකුත් එකතූන්වලට සාපේක්ෂව H18 එකතුව හෙ. 1කට ටො. 27.7ක සැලකිය යුතු අස්වැන්නක් ලබාදුණි.

## ඌන භාවිත බෝග

### තිබ්බටු

බිංදු ප්‍රභේදයේ පැළ 60ක් පමණ ක්ෂේත්‍ර ජාන බැංකුව වශයෙන් නඩත්තු කරන ලදී.

### තුඹ කරවිල

එකතූන් 42ක් සහිත දැනට පවතින ජාන බැංකුවට නව එකතූන් 4ක් හඳුන්වා දී ඒවා උෂ්ණත්වයට ඔරොත්තු දෙන ආකාරය සහ ඒවායෙහි තත්ත්වමය ලක්ෂණ ඇගයීමට ලක් කෙරිණි. ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

බංග්ලාදේශයෙන් ලද එකතුව දේශීය මාපිය ආරක් සමග මුහුන් කර එෆ්1 බීජ ලබා ගැනිණි. අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරේ.

## පැළෑටි ව්‍යාධිවේදය

- දිලීරයක් හේතුවෙන් බල්බ කුණුවීම ශ්‍රී ලංකාවේ රතු ලූනු වගාව මුහුණ දෙන බරපතල තර්ජනයකි. පොකුරු ලූනු වගාවේ දිලීරයක් මගින් බල්බ කුණුවීම පාලනය කිරීම සඳහා රෝපණය කිරීමේදී හෙ. 1කට ටො. 15 - 20 අතර ප්‍රමාණයකින් හෝ රෝපණය කිරීමට සති 2කට පෙර හෙ. 1කට ටො.10ක් වශයෙන් ගොම යෙදීම සාර්ථක පාලන ක්‍රම වශයෙන් හඳුනා ගැනිණි.
- රෝගය ඇතිවන ආකාරය අනුව විවිධ කලාප සඳහා සුදුසු ලූනු ප්‍රභේද හඳුනා ගන්නා ලදී. අරලගංවිල සඳහා වේතාලන් සහ ACA 16 යන ප්‍රභේද හා කිලිනොච්චි සඳහා TVS ප්‍රභේදය වඩාත්ම යෝග්‍ය ප්‍රභේද වන බව හඳුනා ගැනිණි.
- පොකුරු ලූනුවල දිලීරයක් මගින් බල්බ කුණුවීමේ රෝගය පාලනය කිරීම පිණිස බල්බ සඳහා ප්‍රතිකාර කෙරෙන කාල සීමාව මගින් ඇතිවන බලපෑම සහ ඵලදායී දිලීරනාශකයක් පිළිබඳ පර්යේෂණ අරලංගවිලදී සහ තිරුනෙල්වේලිහිදී සිදු කෙරෙමින් පවතී.

## පාංශු විද්‍යාව

### රසායනික පොහොර සහ එම ස්ථානයෙන්ම ලබා ගැනෙන කාබනික පොහොර දිගු කාලීනව යෙදීම

කොළ පොහොර යෙදීම මගින් චූර්ණමය නොවන දුඹුරු පසෙහි පාංශු ගුණාංග කෙරෙහි හිතකර බලපෑමක් ඇති කරන බව ප්‍රතිඵල මගින් පෙන්වා දෙන ලදී.

### රසායනික පොහොර සහ බාහිර ස්ථානවලින් ගෙනෙන කාබනික පොහොර දිගු කාලීනව යෙදීම

බෝග අවශේෂ සමග කොළ පොහොර යෙදීම මගින් වී අස්වැන්න කෙරෙහි වැඩි හිතකර බලපෑමක් ඇතිවන බව (හෙ. 1කට ටො. 4.5කට වැඩි අස්වැන්නක්) ප්‍රතිඵල මගින් පෙන්වා දෙන ලදී.

### ජලය සීමිත පරිසරයක වගා කරන මුං බෝගයේ මුල් ව්‍යාප්ත වී ඇති ස්වරූපය මගින් ඉටු වන කාර්යභාරය

මුං වගා ප්‍රභේද 6ක් මුල් කුටීර තුළ වගා කරන ලදී. මෙහිදී මුල් වර්ධනය වෙමින් ව්‍යාප්ති වී ඇති ස්වරූපයේ ඇති වෙනස්කම් නිරීක්ෂණය කරන ලදී. මෙම

වෙනස්කම්වලට පස ගවේෂණය කර ජලය උරා ගැනීම කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය.

### මුං බෝගයේ මූල කෝණයේ ජාන දර්ශීය වෙනස්කම්

මුං බෝගයේ මූල කෝණයේ ඇති ජාන දර්ශමය වෙනස්කම් නිරීක්ෂණය කිරීමට ලැබිණි. මූල කෝණයෙන් පාංශු පැතිකඩ තුළ මුල් පැතිර ගොස් ඇති ආකාරය හා ජලය උරා ගැනීම කෙරෙහි බලපෑමක් ඇති වේ.

### මහවැලි 'බී' කලාපයේ වී වගා කරන පසෙහි මහා සහ ක්ෂුද්‍ර පෝෂක අවකාශමය හා කාලමය වශයෙන් ව්‍යාප්ත වී ඇති ආකාරය

ස්ථාන 100කට අධික සංඛ්‍යාවක මහා පෝෂක (ෆොස්ෆරස් හා පොටෑසියම්) සහ ක්ෂුද්‍ර පෝෂක (මැග්නීසියම්, සින්ක්, මැංගනීස්, කොපර්, යකඩ සහ මොලිබ්ඩිනම්) විශ්ලේෂණය කරන ලදී. මෙහිදී ෆොස්ෆරස්, පොටෑසියම් හා සින්ක් ප්‍රමාණවත් පරිදි නොවූ අතර යකඩ අතිරික්ත මට්ටමින් පැවති බව සොයා ගැනිණි.

### ජල කළමනාකරණය

- පොකුරු ලූනු සඳහා ඵලදායී ජල කළමනාකරණ පිළිවෙතක් සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ මගින් පෙන්නුම් කරන ලද්දේ චූර්ණමය නොවන දුඹුරු පසෙහි වගා කරන පොකුරු ලූනු සඳහා දින 3ක කාල පරතරයක් ඇතිව ජල සම්පාදනය සාර්ථකව යොදා ගත හැකි බවයි.
- රතුලූනු වගාව සඳහා එක් එක් විසුරුම් ජල සම්පාදන පද්ධතිය මගින් අතිපිහිත වීම සුදුසු පරාසය පරීක්ෂා කර බලන ලද අතර එහිදී 60%ක අතිපිහිත පරාසය සුදුසු බව සොයා ගැනිණි. පර්යේෂණය සිදු කෙරෙමින් පවතී.

### බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගු අංක 1.1.2.2: 2013 වර්ෂයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| බෝගය | ප්‍රභේදය | බීජ/රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය |
|---|---|---|
| කව්පි | ධවල | අභිජනන බීජ කි.ග්‍රෑ. 85 |
| බ්‍රැගන් පෘට් | | බද්ධන්ගත පැළ |
| කෙසෙල් | සීනි හා ඇඹුල් | ගොවීන් සඳහා පැළ 100 |
| තුඹ කරවිල | | බද්ධන්ගත වැල් 487ක් බෙදා හරින ලදී. |
| තිබ්බටු | බිංදු | ගොවීන් සඳහා බීජ ග්‍රෑ. 120ක් හා ගොවි සතියේදී බීජ පැකට් (ග්‍රෑ.2) 1,000ක් බෙදා හරින ලදී. |

### ව්‍යාප්ති සහ වෙනත් වැඩසටහන්

- 2013 වර්ෂයේ රතු ලූනු බෝගය පිළිබඳ සම්බන්ධීකරණ වැඩසටහන
- විශ්වවිද්‍යාල සිසුන්ගේ පර්යේෂණ කටයුතු අධීක්ෂණය

රජරට විශ්වවිද්‍යාලයේ සිසුවෙක් තම උපාධි වැඩසටහනට අදාළ පර්යේෂණ සිදු කළේය.

## තාක්ෂණික දැනුම ලබාදීම

### පත්‍රිකා

### ලූනු

- සිංහල හා දමිළ මාධ්‍යයන්ගෙන් රතු ලූනු වගාවේ රෝග පිළිබඳ පත්‍රිකා පිළියෙල කරන ලදී.

### ක්ෂේත්‍ර දින හා පුහුණු

- පුහුණු වැඩසටහන්
  කෘෂිකර්ම නිලධාරීන් (මහවැලි), කෘෂිකර්ම උපදේශකයින්, ක්ෂේත්‍ර සහකාරවරුන් (මහවැලි), ගොවීන් හා පාසැල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- බෝග සායන
  නිලධාරීහු සම්පත්දායකයින් වශයෙන් සහභාගි වී ගොවීන්ගේ ක්ෂේත්‍ර ගැටලු සඳහා තාක්ෂණික විසඳුම් ලබා දුන්හ.
- රතුලූනු වගාව පිළිබඳ ගොවි පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

### සේවා

### පාංශු පරීක්ෂාව

පාංශු නියැදි 820ක් විශ්ලේෂණය කර ඒ අනුව නිර්දේශ ලබා දෙන ලදී.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

## ප්‍රභේද වැඩිදියුණු කිරීම

### ලූනු

- ජනකප්ලාස්ම ලක්ෂණීකරණය හා ප්‍රභේද වැඩිදියුණු කිරීම
- පළිබෝධ සහ රෝගවලට ප්‍රතිරෝධීතාව ඇති කිරීම සඳහා පොකුරු ලූනු ප්‍රභේද වැඩිදියුණු කිරීම
- පොකුරු ලූනුවල CMS ආර බිහි කිරීම

### තුඹ කරවිල

- අත්හදා බැලීම්, දෙමුහුම් කිරීම, ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

### තිබ්බටු

- අභිජනන බීජ නිෂ්පාදනය

## උද්‍යාන බෝග වගාව

### අඹ

- ජනකප්ලාස්ම ඇගයීම
- වර්ධක අදියරෙහි සිට මල් හට ගන්නා අදියර දක්වා පරිවර්තනය වීමේදී පාරිසරික සාධක මගින් ඇතිවන බලපෑම
- අඹ වගාවේ කීඩැවන් පාලනය හා කළමනාකරණය

### පේර

- ශීඝ්‍ර ගුණනය

### ඩ්‍රැගන් ෆෲට්

- වැල් පුහුණු කිරීම හා කප්පාදු කිරීම
- අවාරයේ මල් හට ගැනීම ප්‍රේරණය කිරීම

## පැළෑටි ව්‍යාධිවේදය

### පොකුරු ලූනු

- පොකුරු ලූනුවල රෝග කළමනාකරණය
- කෘෂිකාර්මික ප්‍රදේශවල කෘෂි රසායන භාවිතයේ තාක්ෂණික හා සමාජීය පැතිකඩ
- රතු ලූනු වගාවේ පළිබෝධ හා රෝග සනත්වය ඇගයීම
- විවිධ ගබඩා ක්‍රම ඇගයීම

## ජල කළමනාකරණය

- ගල්වැව පාංශු කාණ්ඩය සඳහා බෝග යෝග්‍යතාව සිතියම් ගත කිරීම (සිද්ධි අධ්‍යයනයක්)
- ශ්‍රී ලංකාවේ වී සහ බඩඉරිඟු නිෂ්පාදනය කෙරෙහි දේශගුණික විපර්යාසය මගින් ඇතිවන බලපෑම්
- චූර්ණමය නොවන දුඹුරු පසෙහි ආර්ථිකමය වශයෙන් වටිනාකමක් සහිත බෝග පාංශු සංරක්ෂණ බැමි වශයෙන් යොදා ගැනීම ඇගයීම

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරි / සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරි | 05 |
| පර්යේෂණ සහකාර | 06 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| පරිපාලන නිලධාරි (වැඩ බලන) | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| ගබඩා භාරකරු (කළමනාකරණ සහකාර) | 01 |
| පර්යේෂණ උප සහකාර | 05 |
| තාක්ෂණික සහකාර | 02 |
| රියදුරු | 06 |
| විදුලි ශිල්පී | 01 |
| මුරකරු | 13 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 03 |
| වඩු කාර්මික | 02 |
| කම්මල්කරු | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| බද්ධකරු | 01 |
| කම්කරු | 30 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 50 |
| **එකතුව** | **132** |

# 1.1.3. කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චිය

කිලිනොච්චියේ පිහිටි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට සහ වවුනියාව, තිරුනෙල්වේලි, සහ මුලතිව්හි (යළි ස්ථාපිත කෙරෙමින් පවතින) පිහිටි එහි උප පර්යේෂණ ස්ථාන වලට පැවරී ඇති වගකීම වන්නේ උතුරු පළාතේ ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලන අතර වෙනත් ක්ෂේත්‍ර බෝග කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන කාර්යන්හි නියැළීමයි. මුලතිව් උපයෝගිතා පර්යේෂණ ඒකකය ඔඩ්ඩුසුඩාන්හි ස්ථානගත කෙරෙමින් පවතී.

කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ පවතී. විවිධ විෂය ක්ෂේත්‍ර සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කිලිනොච්චියේ කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සහ වවුනියාව හා තිරුනෙල්වේලි උප පර්යේෂණ ස්ථානවල සිදු කෙරිණි.

## අයවැය

**විවිධ වැය ශීර්ෂ යටතේ ලද අයවැය ප්‍රතිපාදනය සහ දරන ලද වියදම වගු අංක1.1.3.1 හි දැක්වේ.**

**වගු අංක 1.1.3.1: වාර්ෂික අයවැය**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම්% |
|---|---:|---:|---:|
| මූලධන | 854,498 | 72,238 | 8 |
| පුනරාවර්තන | 2,953.500 | 2,336,487 | 79 |
| **එකතුව** | **4,505,998** | **2,647,184** | **59** |

## ප්‍රගතිය

### බෝග වැඩිදියුණු කිරීම

#### ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්

වර්ෂාපෝෂිත මෙන්ම ජල සම්පාදිත තත්ත්වයන් ද යටතේ පරන්තන්හි හා මුරුක්කන්හි මාස 3, 3 ½ සහ මාස 4 යන වයස් කාණ්ඩ අනුව ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පවත්වන ලදී. මන්නාරම හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක සඳහා සුදුසු ප්‍රභේදයක් හඳුනා ගැනීම සඳහා වී පිළිබඳ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්ද පවත්වන ලදී.

## පැළෑටි සංරක්ෂණය

### මිරිස්

පැළ මැක්කන් ගහනය කළමනාකරණය කිරීම සඳහා මිරිස් සම්බන්ධ පර්යේෂණයක් සිදුකරන ලදී. පැළ මැක්කන්ගේ ගහනය අඩු කර මිරිස් අස්වැන්න වැඩි කිරීම පිණිස වැටට යොදා ගත හැකි ද්‍රව්‍යයක් වශයෙන් තල් පත්‍ර වඩා සුදුසු බැව් නිරීක්ෂණය කරන ලදී. ඒ හා සමානව මිරිස් වගාව තුළ පැළ මැක්කන්ගේ ගහනය අඩු කිරීමේදී අතුරු බෝගයක් වශයෙන් කරවිල ද මනා ක්‍රියාකාරීත්වයක් පෙන්විය.

### මුං

මායිම් බෝගයක් ස්ථාපිත කිරීම මගින් මුං වගාවේ කරල් විදින්නාගේ හානිය කළමනාකරණය කිරීම පිණිස පර්යේෂණයක් සිදු කෙරිණි. මෙම පර්යේෂණයේදී එඬරු, මුං වගාවේ කරල් විදින්නාගේ හානිය අඩු කරමින් මායිම් බෝගයක් වශයෙන් මනා ක්‍රියාකාරීත්වයක් පෙන්විය.

### වම්බටු

රිකිලි සහ කරල් විදින්නා (*Leucinodes obbanalis* ) පාලනයට යොදා ගන්නා කෘමිනාශකවල කාර්යක්ෂමතාව කිලිනොච්චියේ කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී ඇගයීමට ලක් කෙරිණි. ස්පිනොටොරම් මැනවින් ක්‍රියාකාරී වී රිකිලි සහ කරල් විදින්නාගේ හානිය අඩු කිරීමේදී ඵලදායී වන බව පෙන්නුම් කළේය.

### වී

වරා ශාකයේ (*Calotrophis*) පත්‍ර යොදා ගනිමින් වීවල පත්‍ර හකුළුවන්නා පාලනය කිරීම පිණිස නිරීක්ෂණ අධ්‍යනයක් සිදු කෙරිණි. වරා (*Calotrophis*) පත්‍රවල කෘමිනාශකමය ගුණාංග පැවති බව ප්‍රතිඵල මගින් දැක්විණි.

### වල් පැළ කළමනාකරණය

- පූර්ව නිර්ගමන වල් පැළෑටිනාශක පිළිබඳ අධ්‍යයනයක් පවත්වන ලදී. ඔක්සිෆ්ලූරොෆෙන් ග්‍රෑ.240/ලී.1 EC (Goal 2XL ) මහ කන්නයේදී ගොඩට වපුරන ලද වී වගාවේදී මනා ක්‍රියාකාරීත්වයක් පෙන්විය.
- තියොබෙන්කාබ් ග්‍රෑ.400/ලී.1+ ප්‍රොපනිල් ග්‍රෑ.200/ලී. 1 EC (සැටුනිල්) සහ ප්‍රිටිලැක්රෝල් ග්‍රෑ.300/ලී.1 + පයිරිබෙන්සොක්සිම් ග්‍රෑ.20/ලී.1 EC (සොලිටො) බහුලව පැවති පන් වර්ගය (*Cyperus iria*) සැලකිය යුතු මට්ටමින් පාලනය කළ බවත් වී පැළෑටියට විෂ සහිත බවක් ඇති නොකළ බවත් පෙන්විය.
- ජාතික සම්බන්ධීකරණ පැළෑටිනාශක අත්හදා බැලීම් යටතේ ගොඩට වී වැපිරීමේ දී වල් පැළ පාලනය කිරීමේ හැකියාව යළි ඇගයීම සඳහා පැළෑටිනාශක 23ක් අත්හදා බලන ලදී.

## පාංශු සහ ජල කළමනාකරණය

### පාංශු නියැදි පරීක්ෂා කිරීම

උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක 5ක ලවණතාවෙහි බලපෑමට ලක්වූ ප්‍රදේශවලින් එක්රැස් කරගත් පාංශු නියැදි 500ක් පරීක්ෂා කරන ලදී.

### ඉරණමඩු පාලන ප්‍රදේශයේ බෝග විවිධාංගීකරණය සඳහා බෝග තිරසාරත්වය පිළිබඳ අධ්‍යයනය

මෙම අධ්‍යයනය යටතේ පාංශු නියැදි 103ක් එක්රැස් කර විශ්ලේෂණය කරන ලදී.

## පලතුරු ජනකප්ලාස්ම නඩත්තුව

කිලිනොච්චිය කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අඹ, වරකා, දෙළුම්, මිදි සහ කෙසෙල් ජනකප්ලාස්ම නඩත්තු කරන ලදී.

## මූලික බීජ නිෂ්පාදනය

**වගු අංක 1.1.3.2 : 2013 වර්ෂයේ මූලික බීජ නිෂ්පාදනය**

| බෝගය | ප්‍රභේදය | නිෂ්පාදිත ප්‍රමාණය |
|---|---|---|
| කරවිල | තින්නවේලි වයිට් | කි.ග්‍රෑ.06 |
| පතෝල | තින්නවේලි ලෝන් | කි.ග්‍රෑ.02 |
| වම්බටු | තින්නවේලි පර්පල් | කි.ග්‍රෑ.03 |
| මිරිස් | KA-2 | කි.ග්‍රෑ.03 |
| තක්කාලි | KA-1 | ග්‍රෑ.100 |

## තාක්ෂණ ප්‍රචාරණය

කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය කිලිනොච්චිය හා මුලතිව් යන දිස්ත්‍රික්කවල ගොවීන්, විශ්වවිද්‍යාල සිසුන් සහ පාසැල් සිසුන් සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග හා වී පිළිබඳව පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින සහ ආදර්ශන පවත්වන ලදී. පහත සඳහන් කාර්යයන් ද ඉටු කෙරිණි.

- ක්ෂේත්‍ර ආදර්ශන 6 - වී, මිරිස්, ලූනු. මුං සහ රටකජු හා වල් පැළ කළමනාකරණය
- ක්ෂේත්‍ර දින 3
- මුලතිව් දිස්ත්‍රික්කයේ බෝග සායන 64
- ප්‍රදර්ශන 2
- සේවා ලාභීන් 145දෙනෙකු සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම
- බෙදා හරින ලද පත්‍රිකා ගණන - 2,500

## ගුවන්විදුලි /රූපවාහිනි වැඩසටහන්

අනුවර්තන කර ගත හැකි බෝග, පළිබෝධ පාලනය සහ වල් පැළෑටි කළමනාකරණය පිළිබඳව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය (දමිළ) මගින් ගුවන්විදුලි වැඩසටහන් 6ක් විකාශනය කරන ලදී.

## පුවත්පත් ලිපි

වල් පැළෑටිමය වී වර්ග කළමනාකරණය, අඹ ජනකප්ලාස්ම සංරක්ෂණය සහ පරිසර හිතකාමී පළිබෝධනාශක පිළිබඳව පුවත් පත් ලිපි 3ක් පළ කෙරිණි.

## වෙනත් ව්‍යාපෘති සේවා

- බෝග විවිධාංගීකරණය පිළිබඳ ව්‍යාපෘතිය
- දෙමුහුම් මිරිස් පිළිබඳ ව්‍යාපෘතිය
- ගොයින් ග්‍රීන් ව්‍යාපෘතිය - සේවා ලංකා
- වඩා හොඳ පාංශු හා ජල කළමනාකරණයක් මගින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම - ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘතිය

## සංවර්ධන කාර්යයන්

- කිලිනොච්චිය කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සංචාරක බංගලාවක්, ජල ටැංකියක්, IVවන ශ්‍රේණියේ නිල නිවාස 2ක්, ඇතුළත වැටක්, සහ කම්කරු නිල නිවාස 2ක් නැවත ඉදිකර ප්‍රතිසංස්කරණය කරන ලදී.
- පාංශු විද්‍යාගාර ගොඩනැගිල්ල අලුත්වැඩියා කර මූලික උපකරණ සවි කෙරිණි. ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘතිය හරහා ක්ෂේත්‍ර වාහනයක් මිලදී ගන්නා ලදී. පැළෑටි ව්‍යාධිවේද විද්‍යාගාරය සඳහා

උපකරණ සේවාලංකා පදනමෙන් ලැබිණි.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- කුරක්කන් පැළෑටිය කඳ විදින්නාට දක්වන ප්‍රතිරෝධිතාව ඇගයීම
- මිරිස් වගාවේ පැළ මැක්කන් සහ වී වගාවේ පත්‍ර හකුළුවන්නන් පාලනයේ දී උද්භිදාංගමය පළිබෝධනාශක දක්වන කාර්යක්ෂමතාව
- උතුරු කලාපයේ ඇති වල් පැළ ප්‍රජාව පිළිබඳ අධ්‍යයනය
- වී වගාවේ ප්‍රධාන පළිබෝධවල ගහන ගණත්වයන්
- මිරිස් වගාවේ වටපණුවන් කළමනාකරණය කිරීම සඳහා සුදුසු තාක්ෂණයක් බිහි කිරීම
- වෙනත් ක්ෂේත්‍ර බෝග හා එළවළු ප්‍රභේද වැඩිදියුණු කිරීම
- පටක රෝපිත කෙසෙල් පැළ නිෂ්පාදනය
- තක්කාලි බීජ නිෂ්පාදනයේ තත්ත්වය හා ප්‍රමාණය කෙරෙහි පැළ කප්පාදු කිරීම මගින් ඇති කෙරන බලපෑම අධ්‍යයනය කිරීම
- උතුරු කලාපයේ ස්වායු තත්ත්වයන් යටතේ වී ප්‍රභේදවල ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම
- දේශීය වී ප්‍රභේද /සාම්ප්‍රදායික වී ප්‍රභේද සංශුද්ධ කිරීම
- ජනකප්ලාස්ම නඩත්තුව
- තුනැස්ස පැළෑටියෙහි (*Cyperus iria*) ඇති වල් පැළෑටි ප්‍රතිරෝධිතාව
- තක්කාලි (KC1) හා කරවිලවල (TV white සහ TV long) අභිජනන බීජ නිෂ්පාදනය

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරි/ සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරි | 03 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 03 |
| කළමනාකරණ සහකාර | 01 |
| මුරකරු | 05 |
| කම්කරු | 36 |
| රියදුරු | 03 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 03 |
| **එකතුව** | **61** |

# 1.2 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නොරුව

පර්යේෂණ හා සංවර්ධනය මගින් ජාතික වශයෙන් උද්‍යාන බෝග නිෂ්පාදනය පුළුල් කිරීමේ වගකීම උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට පැවරේ. ආයතනය මෙම කාර්යභාරයට අමතරව, එළවළු බෝග, පලතුරු, බිම්මල්, මුල් හා ආකන්ධ බෝග සහ මල් වගාව පිළිබඳව පර්යේෂණ හා සංවර්ධනයන් සම්බන්ධවද කටයුතු කෙරේ. ආයතනය ස්වකීය පර්යේෂණ වැඩසටහන්හිදී උද්‍යාන බෝග ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම, ශාක පෝෂක කළමනාකරණය සහ පළිබෝධ සහ රෝග කළමනාකරණය ඇතුලු වැඩිදියුණු කළ බෝග කළමනාකරණ ක්‍රමෝපායන් පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි. මෙයට අමතරව ආයතනය අවධානය යොමු කරන්නා වූ අනෙකුත් කාර්යයන් වන්නේ පසු අස්වනු තාක්ෂණය, ආහාර සැකසුම් ක්‍රමවේදයන්, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ගෙවතු වගාවයි.

වඩාත් ඵලදායී පාරිසරික හිතකාමී, තිරසාර, ආර්ථිකව සහ සමාජමය වශයෙන් වැදගත් ඉල්ලුමක් පවතින උද්‍යාන බෝග පිළිබඳව පර්යේෂණයන් බාරගනිමින් ඒ සම්බන්ධ වගකීම උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් දරනු ලබයි. පර්යේෂණයන් සම්බන්ධ මෙම වගකීම්වලට බාහිරව, ගොවීන්, විශ්ව විද්‍යාල සිසුන් සහ ඩිප්ලෝමා ශිෂ්‍ය ශිෂ්‍යාවන් පුහුණු කිරීම සම්බන්ධවද කටයුතු කෙරේ. ගොවි ප්‍රජාව සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත නව තාක්ෂණයන් ව්‍යාප්ත කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමද ආයතනයේ වගකීම වේ.

## අයවැය

**වගුව 1.2.1: වාර්ෂික අයවැය - 2012**

| වැයශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 57,015,000 | 26,794,760 | 47 |
| පුනරාවර්තන | 67,401,816 | 61,345,379 | 91 |
| **ව්‍යාපෘති** | | | |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම (ජා. කෘ. ප. ව්‍යා) | 11,466,400 | 10,761,945 | 94 |
| ජා. කෘ. ප. ව්‍යා (පලතුරු සහ එළවළු සඳහා දෙමුහුම් බීජ නිෂ්පාදනය) | 4,103,860 | 3,939,716 | 96 |
| ජනප්‍රිය සාම්ප්‍රදායික එළවළුවල බීජ ලබාගැනීමේ හැකියාව ඉහළ දැමීම | 1,878,463 | 1,527,552 | 81 |
| සහල් අපනයන ව්‍යාපෘතිය | 1,000,000 | 970,384 | 97 |
| අන්තර්ජාතික කෘෂිකර්මාන්තය පිළිබඳ කොරියානු ව්‍යාපෘතිය (එළවළු වගාව) (KOPIA 12) | 3,137,500 | 2,297,282 | 73 |

| වැයශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| අන්තර්ජාතික කෘෂිකර්මාන්තය පිළිබඳ කොරියානු ව්‍යාපෘතිය (පොහොර කළමනාකරණය) FERTILIZER13) | 2,510,000 | 2,796,437 | 111 |
| පැළෑටි ජාන සම්පත් සඳහා ඒකාබද්ධ කළමනාකරණ පද්ධතිය | 1,927,180 | 1,436,045 | 75 |
| පටක රෝපණය | 25,000,000 | 25,000,000 | 100 |
| ජාතික විද්‍යා පදනම | 1,632,500 | 882,208 | 54 |
| **එකතුව** | **177,072,719** | **137,751,708** | **78** |

## ප්‍රගතිය

### ව්‍යාපෘති

#### ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය - එළවළු දෙමුහුම් බීජ නිෂ්පාදනය

මෙම වැඩසටහන යටතේ උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුත් දෙමුහුම් එළවළු හා පලතුරු ප්‍රභේද වැඩිදියුණු කිරීම, නිර්දේශිත ප්‍රභේදයන්හි මව් ආර නඩත්තුව සහ දෙමුහුම් බීජ නිෂ්පාදනය යන ප්‍රධාන කාර්යයන් ඉටු කෙරේ. මෙහිදී තක්කාලි, බටු, වැටකොළු, මාළුමිරිස්, පිපිඤ්ඤා, කරවිල යන එළවළු ඉහත ක්‍රියාවලිය උදෙසා බඳුන් කෙරේ.

#### ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය - ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම

එළවළු, පලතුරු සහ මල් බෝගවල නව ප්‍රභේද වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ. උද්‍යාන බෝගවල ඵලදායීතාවය වැඩිකිරීම උදෙසා, ආර්තාපල් වල දැනට පවතින බීජ නිෂ්පාදන තාක්ෂණයන් ප්‍රවර්ධනයත් පළිබෝධ සහ රෝග කළමනාකරණ පිළිවෙත් මාලාවන් සහ උචිත ශෂ්‍ය විද්‍යාත්මක සහ පෝෂක කළමනාකරණ පිළිවෙත් මාලාවන් වැඩිදියුණු කිරීමත් මෙම ව්‍යාපෘතියෙහි අමතර අරමුණු වේ.

### අන්තර්ජාතික කෘෂිකර්මාන්තය පිළිබඳ කොරියානු ව්‍යාපෘතිය (KOPIA)

#### එළවළු වගා තාක්ෂණය

ප්‍රභේදවලින් ලබාගත හැකි අස්වැන්නත් ගොවීන් විසින් දැනට ලබාගන්නා අස්වැන්නත් අතර පවතින පරතරය අවම කිරීම උදෙසා වෙනත් රටවල පවතින දියුණු තාක්ෂණයන් දේශීය විද්‍යාර්ථයින් සහ ගොවීන් යන කොට්ඨාශ දෙකටම නිදර්ශනය කිරීම ඉතා වැදගත්ය. දේශීය විද්‍යාර්ථවේදීන් සහ ගොවීන් යන කොට්ඨාශ දෙකම දැනුවත් කිරීම මෙම පරතරය අවම කර ගත හැකි ක්‍රමයකි.

මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රධාන වශයෙන් වැඩිදියුණු කළ එළවළු නිෂ්පාදන තාක්ෂණයන් නිදර්ශනය සහ සත්‍යාක්ෂණයත් දේශීය වගාව උදෙසා යෝග්‍ය කොරියානු එළවළු ප්‍රභේදයන් හඳුනාගැනීමත් පිළිබඳව වැඩි අවධානයක් යොමු කෙරේ. මෙයට අමතරව එළවළු නිෂ්පාදනය හා තාක්ෂණය පිළිබඳ මානව සම්පත ප්‍රවර්ධනය සහ එළවළු නිෂ්පාදනයේදී සහ පර්යේෂණයන්හිදී ශ්‍රී ලංකාව හා කොරියාව අතර

සහයෝගීත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියෙහි අමතර අරමුණු වේ.

## පොහොර කළමනාකරණය (අ.කෘ.කො.ව්‍යා) (KOPIA)

මූලික වශයෙන් ගොවීන්හට ආර්ථිකමය, වාසිදායී ආරක්ෂාකාරී සහ පාරිසරික හිතකර පොහොර භාවිතය පිළිබඳව නිදර්ශනයන් සිදු කිරීමේ වගකීම අ.කෘ.කො.ව්‍යා - පොහොර කළමනාකරණ ව්‍යාපෘතිය මගින් දරනු ලබයි. මෙම ව්‍යාපෘති කාලය තුළදී නිවසෙහි බැහැර කරන ද්‍රව්‍ය වලින් නිෂ්පාදනය කරන පොහොර භාවිත කිරීමේ සංකල්පය ඇති කිරීමත් අනවශ්‍ය ආකාරයෙන් පොහොර භාවිතය වැලැක්වීමත් යන ප්‍රධාන කරුණු දෙකට විසඳුම් සෙවීමට අපේක්ෂිතයි. මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රධාන පොහොර පමණක් නොව ක්ෂුද්‍ර පොහොර භාවිතය පිළිබඳවද අවධානය යොමු කෙරේ. මෙයට අමතරව මානව සම්පත් හැකියාවන් ප්‍රවර්ධනය සහ රටවල් 2ක අතර සහයෝගීතාවය වර්ධනය කිරීම පිළිබඳවද අවධානය යොමු කෙරේ.

## පටක රෝපණය

කෙසෙල්, අන්නාසි, බීජ අර්තාපල්, ස්ට්‍රොබෙරි සහ මල්බෝග වැනි උද්‍යාන බෝග වල රෝපණ ද්‍රව්‍ය ඉල්ලුම වැඩිවීම හේතුවෙන් අවශ්‍යතාව සපුරාලීමේ අපේක්ෂාවෙන් 2011 වර්ෂයේදී "පටක රෝපණය තුළින් ආර්ථිකවම වැදගත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය" යන ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබිණි. නිෂ්පාදනය දස ගුණයකින් ඉහළ දැමීම අරමුණු ඇතිව ආරම්භ කරනු ලැබූ මෙම ව්‍යාපෘතිය යටතේ පටක රෝපණ පරීක්ෂණාගාර සඳහා පහසුකම් සපයනු ලැබ ප්‍රතිසංස්කරණයන් සිදු කෙරිණි. දැල් ගෘහ සහ ආරක්ෂිත ගෘහ වැනි යටිතල පහසුකම්ද වැඩි කරනු ලැබිණි.

## එළවළු අංශය

එළවළු පර්යේෂණ අංශය එළවළු ප්‍රභේද වැඩිදියුණු කිරීමේ හා නිෂ්පාදනය සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් පිළිබඳ කටයුතුවල නිරත වේ

සාම්ප්‍රදායික අභිජනන ක්‍රමෝපායන් තුළින් විවෘත පරාගන සහ $F_1$ දෙමුහුම් යන දෙවර්ගයෙහිම උසස් එළවළු ප්‍රභේද වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් මෙම අංශය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරේ. 2012/2013 වර්ෂය තුළදී අත්කර ගත් කැපී පෙනෙන ජයග්‍රහණයන් පහත දැක්වේ.

### බෝංචි ප්‍රභේද වැඩිදියුණු කිරීම

ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව වෙත එක් වැල් බෝංචි ප්‍රභේදයක් ඉදිරිපත් කෙරිණි. එය ගන්නෝරුව BIL ලෙස නම් කොට නිදහස් කෙරිණි. "Cora Pole" සහ "KTB" යන ප්‍රභේද 2ක 2013 වර්ෂයේ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළදී වැඩි අස්වැන්නක් ලබා දුණි.

### කරවිල ප්‍රභේද වැඩිදියුණු කිරීම

ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ප්‍රභේද බවට නව $F_1$ දෙමුහුම් 2ක් හඳුනාගනු ලැබිණි. මෙම ප්‍රභේද සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සිදු කෙරිණි.

### බටු ප්‍රභේද වැඩිදියුණු කිරීම

එල වල යෝග්‍ය ගුණාත්මක ලක්ෂණ සහිත බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධී වැඩි අස්වනු සහිත ප්‍රභේද නිෂ්පාදනය කිරීමේ අරමුණු ඇතිව බටු ප්‍රභේද වැඩිදියුණු කිරීම උදෙසා පරිපූර්ණ වූ අභිජනන වැඩසටහනක් ක්‍රියාත්මකයි. බලාපොරොත්තු තැබිය හැකි මව් ආර 3ක් තෝරා ගනු ලැබ නව $F_1$ මුහුම් 16ක් සිදු කෙරිණි. බටු ප්‍රභේදවල නව $F_1$ දෙමුහුම්

(EGH8 සහ EGH9) ප්‍රභේද, ජාතික සම්බන්ධීකරණ අත්හදා බැලීම් මගින් බලාපොරොත්තු තබාගත හැකි ප්‍රභේද බවට හඳුනා ගනු ලැබිණි.

### පිපිඤ්ඤා ප්‍රභේද වැඩිදියුණු කිරීම

"HORDI White" $F_1$ දෙමුහුම් ප්‍රභේදය 2013 වර්ෂයේදී දිවයින පුරා වගා කිරීම උදෙසා ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව මගින් තෝරා ගනු ලැබිණි. R2, M2 සහ H21 නව අභිජනන ආර ලෙස වැඩිදියුණු කර ස්ථායීතාව අධ්‍යයනය උදෙසා තෝරා ගනු ලැබිණි.

### පලා එළවළු

"*HORDI thampal*" කොළ තම්පලා ප්‍රභේදය 2013 වර්ෂයේදී දිවයින පුරා වගාකිරීම උදෙසා තෝරා ගනු ලැබිණි.

### වැටකොළු ප්‍රභේද වැඩිදියුණු කිරීම

ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව රැස්වීම් හිදී ප්‍රභේද 1ක් සහ $F_1$ දෙමුහුම් ප්‍රභේද 1ක් ඉදිරිපත් කෙරිණි. විවෘත පරාගන ප්‍රභේදයන් වගා කිරීම උදෙසා නිදහස් කෙරිණි. මීළඟ වර්ෂයේදී $F_1$ දෙමුහුම් ප්‍රභේද බීජ සහතික කිරීමේ සේවා වාර්තාවත් සමඟ නිදහස් කරනු ලබයි. "HL F1" සහ "Line TD" වැඩි අස්වැන්නක් ලබා දුණි.

### මෑ ප්‍රභේද වැඩිදියුණු කිරීම

මෙම පර්යේෂණ වැඩසටහන මගින් දිවයින පුරා වගාකිරීම උදෙසා වැඩි අස්වනු, කඳ පාමුල කුණුවීමේ රෝගයට ප්‍රතිරෝධී, ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ඉක්මනින් අස්වැන්න ලබාදෙන්නා වූ ප්‍රභේද වැඩිදියුණු කිරීම අරමුණු කෙරේ. වැඩි අස්වනු කඳ පාමුල කුණුවීමට ප්‍රතිරෝධී සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ 39-9, 39-12 යන බලාපොරොත්තු තැබිය හැකි වඩාත් හොඳ ප්‍රභේද තවදුරටත් පරීක්ෂා කිරීම උදෙසා තෝරා ගනු ලැබිණි. මෙම ප්‍රභේද වලින් එක් ප්‍රභේදයක්වත් 2014 වර්ෂයේදී වගා කිරීම සඳහා නිදහස් කරනු ලැබිය හැක. ස්ථායීතාව අධ්‍යයනය උදෙසා දේශීයව වැඩිදියුණු කළ ආර 4ක් තෝරා ගනු ලැබිණි.

### තක්කාලි ප්‍රභේද වැඩිදියුණු කිරීම

බැක්ටීරියා හිටු මැරීමේ රෝගයට ප්‍රතිරෝධී වඩාත් හොඳ ගුණාත්මක තත්ත්වයෙන් යුත් $F_1$ දෙමුහුම් ප්‍රභේද නිෂ්පාදනය කිරීම උදෙසා මෙම වැඩසටහන දියත් කෙරිණි. 2013 යල කන්නයේදී ජනකප්ලාස්ම 33ක් අගයනු ලැබූ අතර $F_1$ දෙමුහුම් නිෂ්පාදනය කිරීම උදෙසා මුහුම් 89ක් සිදු කෙරිණි. විදේශීය ප්‍රභේද 11ක් පරීක්ෂා කරනු ලැබූ අතර එයින් ප්‍රභේද 2ක් වඩාත් උසස් බව සොයා ගැනිණි.

### දඹල ප්‍රභේද වැඩිදියුණු කිරීම

ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමේදී "WBMP" බලාපොරොත්තු තැබිය හැකි ආරය දෙවන වැඩිම අස්වැන්නක් ලබා දුන් අතර එම ආරයෙහි අස්වැන්න "SLS 44" පරීක්ෂණ ප්‍රභේදයට වඩා සැලකිය යුතු වැඩි අස්වැන්නක් ලැබිණි.

### සාම්ප්‍රදායික එළවළු වර්ගවල බීජ නිෂ්පාදනය

මෙම ව්‍යාපෘතිය යටතේ තිබ්බටු, තලන බටු, කැකිරි, වට්ටක්කා, බණ්ඩක්කා වැනි සාම්ප්‍රදායික එළවළු 800kg ට වැඩි බීජ ප්‍රමාණයක් නිෂ්පාදනය කෙරිණි.

### කොරියානු එළවළු වගා ව්‍යාපෘතිය

දේශීය දේශගුණික තත්ත්වයන් යටතේ සලාද පිපිඤ්ඤා, සුදු රාබු, චීන ගෝවා සහ සලාද වැනි කොරියානු එළවළු වල අනුවර්තීබව අධ්‍යයනය කිරීමට මහා පරිමාණයෙන් අගයනු ලැබීය. "CR yeoreummat" සහ "Woori" යන චීන

ගෝවා ප්‍රභේද 2ක "Gangryoksamchuk" සහ "Jangrok", "heukjinju" යන පිපිඤ්ඤා ප්‍රභේද 2ක,"Yeongdong" "Supergiljo" සහ "Metjinmatdonamu" යන සුදු රාබු ප්‍රභේද 3, "Cheong chima" සහ "Hanbatjeokchima" යන සලාද ප්‍රභේද 2ක මැද රට ප්‍රදේශයන්හිදී අනුවර්තනයක් පෙන්වන බව සොයා ගැනිණි.

## පලතුරු සහ පටක රෝපණ අංශය

බෝග වල ඵලදායීතාවය සහ නිෂ්පාදනය වැඩි කිරීම උදෙසා පලතුරු බෝගවල පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සහ පලතුරු වල නලස්ථ ප්‍රචාරණය සඳහා අවශ්‍ය ක්‍රමවේද වැඩිදියුණු කිරීමේ කාර්යභාරයන් මෙම පලතුරු සහ පටක රෝපණ අංශය යටතේ සිදු කරනු ලබයි. ගුණාත්මක බවෙන් ඉහළ වැඩි අස්වනු සහ පළිබෝධ සහ රෝගයන්ට ප්‍රතිරෝධී පලතුරු ප්‍රභේද වැඩිදියුණු කිරීම අරමුණු කොට පලතුරු බෝග පර්යේෂණයන් සිදු කෙරේ. මෙයට අමතරව පලතුරු බෝග වල ඵලදායීතාවය වැඩිකිරීම උදෙසා ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම පිළිබඳවද නිසි අවධානයක් ලබා දෙයි. සංවර්ධන කාර්යයන් හට රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් පර්යේෂණ ගොවිපලෙහි නිෂ්පාදන හැකියාව වැඩි කිරීමද අයත් වේ. මේ හා සමගාමීව විවිධ මාධ්‍යයන් භාවිතා කරමින් තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ කටයුතුද සිදු කෙරිණි.

## කෙසෙල්

- නලස්ථ පරීක්ෂණ තුළදී කෝලිකුට්ටු ප්‍රභේද විවිධ ජාන දර්ශයන් සඳහා විවිධාකාරයෙන් ප්‍රතිචාර දැක්විය. නලස්ථ ගුණනය සඳහා නිර්දේශිත "අග්‍රා" ප්‍රභේදය හොඳින් ප්‍රතිචාර නොදැක්විණි. "අග්‍රා" ප්‍රභේදයේ ගුණන වේගය වැඩි කිරීම උදෙසා පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.

## මිදි

- "තොම්සන්" බීජ රහිත මිදි ප්‍රභේදය මාස 6ක කාලයක් තුළදී තිබෙන ශාක වලින් සාර්ථක ලෙස ගුණනය කර කුඩා පැළ 300ක් පමණ සැදිය හැක.
- කල්පිටිය සහ මහඉලුප්පල්ලමේදී ක්ෂේත්‍ර ඇගයීම් අඛණ්ඩව සිදු වේ.

## කෙසෙල් සහ අන්නාසි රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගුව 1.2.2: පටක රෝපිත පැළ වල වර්තමාන තත්ත්වය**

| බෝගය | ප්‍රභේදය | පැළ | |
|---|---|---|---|
| | | නලස්ථ | පැළෑටි ගෘහ |
| කෙසෙල් | ඇඹුන් | 15,000 | 2200 |
| | කෝලිකුට්ටු | 10,000 | 1250 |
| අන්නාසි | මුරුසි | 25,000 | 6500 |

## ව්‍යාපෘති

- කෘෂිකර්ම දෙපාර්තමේන්තු අරමුදල් ප්‍රතිපාදන යටතේ පටක රෝපිත රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ව්‍යාපෘතිය නමින් විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කෙරිණි. රෝපණ නල 4000ක් පමණ නඩත්තු කිරීම උදෙසා පරීක්ෂණාගාර පහසුකම් වඩාත් පුළුල් කෙරිණි.

## ව්‍යාප්ති කටයුතු

- එක් දින පුහුණු වැඩසටහන් සහ උපදේශක සේවාවන් (පුද්ගලයින් 35 දෙනෙකු සඳහා)
- දේශන - විශ්ව විද්‍යාල සහ පාසල් සිසුන් සඳහා දේශන 06ක් පැවැත්විණි.
- උපදේශක සේවා - පුද්ගලයින් 58
- අධීක්ෂණ ව්‍යාපෘති - විවෘත විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු සමග ව්‍යාපෘතියක් සම්පූර්ණ කරනු ලැබිණි. කෙසෙල් සහ අන්නාසි

සඳහා නලස්ථව ගුණනයේදී අඩු පිරිවැයති රෝපණ මාධ්‍ය සැකසීම.

- පොළොන්නරුව සහ වාරියපොල පැවති ප්‍රදර්ශන සඳහා සහභාගී වීම සහ ප්‍රදර්ශන ද්‍රව්‍ය සැපයීම.

## කීට විද්‍යා අංශය

### ව්‍යාපෘති 1

**පැඟිරි බෝග වල පළිබෝධ සහ රෝග නියාමනය උදෙසා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරිම (ජා.කෘ.ප.ව්‍යාපෘති)**

මෙම ව්‍යාපෘතිය 2011 දී ආරම්භ කෙරිණි. ප්‍රභේද පරික්ෂාව සහ පැරණි විෂ රසායන ද්‍රව්‍ය වෙනුවට නව පාරිසරික හිතකර ශාක පළිබෝධ නාශක, කෘමි නාශක සහ දිලීරනාශක සහ රසායන ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂා කෙරිණි.

**ජයග්‍රහණයන්**

පැඟිරි ශාකවල උරාබොන පළිබෝධකයින් පාලනය කිරීමේදී කෘමිනාශක 2ක් (ඇබමෙක්ටින් සහ ක්ලොතිනයිඩින්) ඵලදායී බව සොයා ගැනිණි. 2012/13 මහ කන්නයේදී මයිටානාශක 4ක් පරික්ෂා කරනු ලැබිණි.

මෙම සියලුම මයිටානාශක (නිස්සොරන් 10% WP, නිස්සෝරන් 5 % EC, ඇබමෙක්ටින් 3.6EW, ෆෙන්පයිරොසිමේට 5% EC) පැඟිරි මලකඩ මයිටාවන් පාලනය කිරීමේදී වර්තමානයේ නිර්දේශිත සල්ෆර් හා සමානවම ඵලදායී බව හඳුනාගනු ලැබිණි. ප්‍රතිඵල තහවුරු කිරිම උදෙසා 2014 වර්ෂයේදි මෙම අත්හදා බැලීම් නැවත සිදු කරනු ලබයි.

### ව්‍යාපෘති 2

**වෛරස් රෝග සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් වට්ටක්කා වල පළිබෝධ සහ රෝග නියාමනය උදෙසා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම (ජා.කෘ.ප.ව්‍යාපෘති)**

2010 වර්ෂයේ සිට වියළි කලාපයේ වගා කරනු ලබන වට්ටක්කා බෝගයට හානි කරමින් වට්ටක්කා කහ පැහැ ගැන්වීමේ රෝගය වාර්තා විය. එමනිසා වට්ටක්කා බෝගය කහපැහැ ගැන්වීමේ රෝගය නියාමනය කිරීමට විශේෂ අවධානයක් යොමු කරමින් වට්ටක්කා පළිබෝධ සහ රෝග නියාමනයට සමෝධානික පළිබෝධ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම උදෙසා 2011 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කෙරිණි.

**ජයග්‍රහණයන්**

පරාවර්තන පොලිතීන් වසුන් සහ රසායන ද්‍රව්‍ය ඇතුලත්ව ක්‍රමවේද කිහිපයක්ම එක්කරමින් මෙම සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාව වැඩිදියුණු කෙරිණි. මොරගොල්ලාගම සහ පාදෙණිය යන ප්‍රදේශවලදී වියළි කලාපයේ ගොවි ක්ෂේත්‍ර 3නකදී මෙම සමෝධානික පිළිවෙත් මාලාවේ අනුවර්තීබව පරීක්ෂා කෙරිණි.

### ව්‍යාපෘති 3

**බතල ගුල්ලා (*Cylas formicarius*) පාලනය සඳහා කළමනාකරණ පිළිවෙත් මාලාවක් හඳුනාගැනීම**

බතල වල සැලකිය යුතු අස්වනු හානියක් සිදු කරන්නා වූ ප්‍රධාන කෘමියා වන්නේ බතල ගුල්ලාය (*Cylas formicarius*). මෙම පළිබෝධකයා පාලනය උදෙසා කෘමිනාශක පරික්ෂා කෙරිණි.

### ජයග්‍රහණයන්

2012/2013 මහ කන්නය තුළදී තයොමෙතසම්, ක්ලෝරන්ට්‍රනිලිප්‍රොල් සහ තයොමෙත්සම් ක්ලෝරන්ට්‍රනිලිප්‍රොල් පූර්ව මිශ්‍රණය පළිබෝධකයා පාලනයට ඵලදායී විය.

## ව්‍යාපෘතිය 4

### විදේශීය වැටකොළු ප්‍රභේද අස්වැන්න ලබාගැනීමේ හැකියාව සහ පළිබෝධ සහ රෝගයන් හට ප්‍රතිරෝධීතාවය ඇගයීම

වැටකොළුවල විදේශිය හා දේශීය ප්‍රභේද අස්වනු ලබාගැනීමේ හැකියාව සහ පළිබෝධ සහ රෝග ප්‍රතිරෝධීතාවය LA 333 සහ NAGA ප්‍රභේදයන් සමඟ අගයනු ලැබීය.

### ජයග්‍රහණයන්

පහත ප්‍රභේදයන් බීජ නිෂ්පාදනය/ ආනයන උදෙසා නිර්දේශ කෙරිණි. LA 33 XTD, NRGH 22, OPEX *TROPICAL LUFFA, OPEX 3134, SHALANI, OPEX 3144, ORDINARY*

## ව්‍යාපෘති 5

### වම්බටු රිකිලි සහ කරල් විදින්නාට (*Leucinodes orbonalis*) එරෙහිව අඩු විෂ සහිත නව කෘමිනාශක පළිබෝධ මර්ධනයට ඇති හැකියාව පරීක්ෂා කිරීම

වම්බටු බෝගයේ ප්‍රධාන පළිබෝධකයා වන්නේ වම්බටු රිකිලි සහ කරල් විදින්නාය (*Leucinodes orbonalis*) දැනට නිර්දේශිත කෘමිනාශක මෙම පළිබෝධකයා පාලනය කිරීමට නොහැකිවීම හේතුකොට මිනිසාට හා පරිසරයට විෂ සහිත භාවය අඩු වන කෘමිනාශක පරික්ෂා කෙරිණි.

### ජයග්‍රහණයන්

ඒ අනුව, බටු කඳ සහ ඵල විදින්නා පාලනය කිරීමේදී ෆ්ලුබෙන්ඩමයිඩ 20% WG, 1g/L, ස්පිනොටරම් 25% WG, 0.3g/L සහ ෆ්ලුබෙන්ඩමයිඩ 24% WG, 0.5g/L වඩාත් ඵලදායී බව හඳුනාගනු ලැබූ අතර රසායන ද්‍රව්‍ය නිර්දේශ කිරීමට පෙර නැවත අත්හදා බැලීමට නියමිතය.

## ශාක ව්‍යාධිවේද සහ බිම්මල් පර්යේෂණ අංශයන්

### විදේශීය දෙමුහුම් බැක්ටීරියා හිටුමැරීමේ රෝගයට ප්‍රතිරෝධීතාවය පරීක්ෂා කිරීම

ආසියානු ප්‍රභේද පර්යේෂණ සංවර්ධන ආයතන මගින් වැඩිදියුණු කළ ක්‍රමවේදයක් උපයෝගී කොට *Ralstonia solanacearum* මගින් ඇති කරනා බැක්ටීරියා හිටු මැරීමේ රෝගයට එරෙහිව විවිධ විදේශීය රටවලින් ආනයනය කළ තක්කාලි ප්‍රභේද 27ක්, මාළුමිරිස් දෙමුහුම් 27ක් සහ වම්බටු දෙමුහුම් 7ක් පරීක්ෂා කරනු ලැබිණි. සියලුම ප්‍රභේද බැක්ටීරියා හිටුමැරිමට එරෙහිව සාමාන්‍ය ප්‍රතිරෝධීතාවයක් පෙන් වූ අතර අස්වනු ලබාගැනීමේ හැකියාව සහ අනුවර්තනය පිළිබඳ තවදුරටත් පරීක්ෂණය උදෙසා නම් කෙරිණි.

## ELISA පරීක්ෂාව මගින් විදේශීය දෙමුහුම් බීජ වෛරස් සඳහා බීජ ස්වස්තතාව පරීක්ෂාව

විදේශීය පිපිඤ්ඤා බීජ සාම්පල් 74ක් පිපිඤ්ඤා කොළ පුල්ලි විචිත්‍ර වෛරස් (CGMMV) රෝගය සඳහා පරීක්ෂා කරනු ලැබූ අතර එක් "වැටකොළු" සාම්පලයක් වෛරස් සහිත වූ අතර එම සාම්පලය තවදුරටත් ඇගයීම ප්‍රතික්ෂේප කරනු ලැබීය. තක්කාලි සාම්පල 3ක් තක්කාලි පුල්ලි මැලවීමේ රෝගය (TSWV) සඳහා පරීක්ෂා කරනු ලැබූ අතර අනෙකුත්

සියලුම සාම්පල් වෛරස් වලින් තොර බව හඳුනාගනු ලැබිණි.

## අර්තාපල් බීජ තොග පරීක්ෂා කිරීම සහ රසායනාගාර පරීක්ෂාවන්

නෙදර්ලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය සහ ප්‍රංශය වැනි රටවලින් ආනයනය කළ අර්තාපල් බීජ තොග 73ක් ශාක නිරෝධායන පරාපෝෂිතයන්ගෙන් තොර බවට පරීක්ෂා කරනු ලැබිණි.

බහුල ලෙස අර්තාපල් බීජ ආකන්ධ මත ජාලාකාර කබොලු, කළු පටල (කළු කබොලු) රෝගය, *Geotrichum candidum* මගින් ඇති කරන රබරි රොට්, *Streptomyces* Spp මගින් ඇති සාමාන්‍ය කබොලු යන රෝග එම අර්තාපල් බීජ ආකන්ධ තුළ අනුමත මට්ටමින් සාමාන්‍ය වශයෙන් දක්නට ලැබිණි. කොන්දේසි නියමයන්හි දැක්වෙන පරිදි එම රෝගී තත්ත්වයන් අනුමත සීමාව ඉක්ම නොවීම හේතුවෙන් එම සෑම බීජ තොගයක්ම ගොවි ක්ෂේත්‍රවල වගා කිරීම උදෙසා පිළිගනු ලැබුණි.

## බෝගවල රෝග කළමනාකරණය සඳහා රෝග හඳුනාගැනීම සහ උපදේශක සේවාවන්

2013 වර්ෂයේදී ශාක ව්‍යාධිවේදී අංශය මගින් රෝග කළමනාකරණය සඳහා ලබා දෙන ශාකවල රෝග හඳුනාගැනීමේ සහ උපදේශක සේවාවන් අඛණ්ඩව ලබාදුණි. විවිධ ක්‍රම මගින් ගොවිපල හා පෞද්ගලික ගොවිපල් වලින් ලැබූ පලතුරු, එළවළු, ආකන්ධ බෝග, කුළුබඩු, රසකාරක, මල්බෝග, වෙනත් ක්ෂේත්‍ර බෝග වල රෝග ආසාදිත සාම්පල 900කට වැඩි ප්‍රමාණයක් දිලීර, බැක්ටීරියා, ෆයිටොප්ලාස්මා සහ වෛරස් රෝගද, රෝගකාරක ජීවීන්ද හඳුනා ගැනීම උදෙසා සායනිකව පරීක්ෂා කරනු ලැබූ අතර හඳුනාගත් රෝග කළමනාකරණ සඳහා උපදේශයන් ලබාදුණි. කුකුබිට්සේ සහ මාළුමිරිස් වල නව ෆයිටොප්ලාස්මා රෝග හඳුනාගනු ලැබිණි.

## එළවළුවල පළිබෝධ පාලනය සහ වර්ධනය ප්‍රවර්ධනය සඳහා ස්වභාවික බහුඅවයවීක

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනුබද්ධිත ආයතන, උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සහ ශ්‍රී ලංකා පරමාණු බලශක්ති අධිකාරිය යන ආයතන සියල්ල එක්ව පළිබෝධකයින් පාලනය කිරීමේදී රසායනික පළිබෝධනාශක වලට විකල්පයක් ලෙස උපයෝගී කරගනු ලැබිය හැකි ස්වභාවික බහුඅවයවික සහ එළවළු වල වර්ධනය ප්‍රේරණය කරන්නා වූ ස්වභාවික බහුඅවයවීක නිෂ්පාදනය කරනු ලැබීය. 2013 සැප්තැම්බර් 06 වන දින සේවා සංස්කරණ පුහුණු ආයතනයේදී “කීටො පවර් (Chito Power)” ලෙස වාණිජමය නිෂ්පාදනයක් ලෙසට මෙය හඳුන්වා දෙනු ලැබීය.

## ඇන්ත්‍රැක්නෝස් රෝගයට ප්‍රතිරෝධී (*Phaseolus vulgaris L*) බෝංචි ප්‍රභේද කඩිනමින් හඳුනාගැනීම උදෙසා ප්‍රභේද පරීක්ෂණ ක්‍රමෝපායක් වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලදී ඇන්ත්‍රැක්නෝස් රෝගය බහුල වශයෙන් ව්‍යාප්ත වූ අවස්ථා නිරීක්ෂණය කෙරිණි. එමනිසා බෝග හානිය අවම කිරීම පිණිස ඇන්ත්‍රැක්නෝස් රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද හඳුනාගැනීම උදෙසා විශ්වාසදායී සහ කඩිනම් ලෙස ප්‍රභේද හඳුනාගැනීමේ ක්‍රමයක් වැඩිදියුණු කිරීම ඉතාමත් වැදගත් පර්යේෂණ අවශ්‍යතාවයකි. කරල් මගින් නිකුත් කෙරෙන ස්‍රාවයන් කොනීඩියා වෙනස් වීම ප්‍රවර්ධනය කෙරේ. නලස්ථ පරීක්ෂණයක් ලෙස බෝංචි ජනකප්ලාස්මයන් අතර රෝගයට ප්‍රතිරෝධීබව සැසඳීම උදෙසා C.

*lindermuthianum* හි කරල් මගින් නිකුත් කරන ස්‍රාවීය යුෂවල අනුපාතය, ප්‍රභේදයන් රෝගවලට දක්වන ප්‍රතිරෝධීතාවය සැසැඳීම උදෙසා යොදා ගනු ලැබිය හැකිය.

## පිපිඤ්ඤා වල පිටිපුස් රෝගයට (*Erisiphe* Spp) එරෙහිව නව දිලීරනාශක වල ජෛව කාර්යක්ෂමබව ඇගයීම

විවිධ සංයෝජනයන් මගින් ලබාගත් නව දිලීරනාශක 8ක් අගයනු ලැබූ අතර නිර්දේශිත දිලීරනාශක සමග සසඳා කුකුබිට්සේ ශාකවල පිටිපුස් රෝගය පාලනය උදෙසා ඵලදායී ලෙස යොදා ගනු ලැබිය හැක.

## ලියාපදිංචි කර භාවිතයෙන් ඉවත් කර ඇති දිලීරනාශක කුකුබිට්සේ ශාකවල සහ බණ්ඩක්කාවල යටිපුස් රෝගයට එරෙහිව භාවිතයේදී ජෛව කාර්යක්ෂමතාව නැවත පරීක්ෂාව

දැනටමත් ලියාපදිංචි කරනු ලැබූ දිලීර නාශක 7ක් කුකුබිට්සේ ශාකවල යටිපුස් රෝගයට එරෙහිව භාවිත හැකියාව නැවත පරීක්ෂා කරනු ලැබීය. මන්කොසබ් 64% + මෙතලසිල් 8% WP, මන්කොසබ් 80% WP (ප්‍රභව 3), කැප්ටාන් 50% WP (ප්‍රභව 2) සහ මනෙබ් 80% (w/w) යන පරීක්ෂා කළ දිලීර නාශක තවදුරටත් කුකුබිට්සේ ශාකවල යටිපුස් රෝගය පාලනය සඳහා තවදුරටත් ඵලදායීබව සොයා ගනු ලැබිණි. සල්ෆර් 80% WG සහ කාබෙන්ඩසිම් 50% WP (ප්‍රභව 2) ඇතුලුව යටිපුස් රෝගය පාලනය සඳහා පෙර ලියාංපදිංචි කළ දිලීරනාශක 8ක් නැවත පරික්ෂා කරනු ලැබීය. බණ්ඩක්කා වල යටිපුස් රෝගය පාලනය සඳහා මෙම සියලුම පරීක්ෂා කළ දිලීරනාශක ඵලදායීබව හඳුනා ගැනිණි.

## *Phomopsis asparagi* මගින් ඇතිකරන හාතාවාරිය කඳ කුණුවීමේ රෝගය පළමුවරට වාර්තාවීම සහ දිලීරනාශක මගින් කළමනාකරණය

2012/2013 මහ කන්නය තුළදී ශ්‍රී ලංකාවේ වයඹ පළාතෙහි හාතාවාරිය කඳ කුණුවීමේ රෝගය (*Asparagus officinalis*) ශීඝ්‍ර ලෙස ව්‍යාප්ත විණි. ව්‍යුහ විද්‍යාත්මක ලක්ෂණ පදනම් කොට හාතාවාරිය කඳ කුණුවීමේ රෝගය ඇතිකරන දිලීර ව්‍යාධිජනකයා *Phomopsis asparagi* ලෙස හඳුනා ගැනිණි.

## *Rhinocladium corticolum* මගින් අඹ වලට ඇති කරන කළු පටි රෝගය (Black banded disease) පළමුවරට වාර්තාවීම සහ රෝග කළමනාකරණය

ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ වාරියපොල ප්‍රදේශයේ අඹ ශාකවල පොත්තෙහි කුඩා අතුරිකිලිවල විශාල, තද කළු, අක්‍රමවත්, පටි ආකාර මතුපිට ආසාදිත පැල්ලම් නිරීක්ෂණය කළ හැකි විය. මෙම රෝගය ඇස්කොමයිසිට් වර්ගයේ (Ascomycetes) *Rhinocladium corticolum* (Perfect state ; *Peziotrichum corticolum*) මගින් ඇති කරන කළු පටි රෝගය (කළු කඳ රෝගය) ලෙස හඳුනාගනු ලැබිණි. කඳෙහි ආසාදිත ප්‍රදේශය තෙත හණ ගෝනියකින් තදින් පිරිමැදීමෙන් මතුපිට දිලීරය ඉවත් කර කඳෙහි ආසාදිත ප්‍රදේශය කොපර් ඔක්සික්ලොරයිඩ් ද්‍රාවණය (20-30 g/1ℓ ජලය) ප්‍රතිකර්මය කිරීමෙන් ඵලදායී ලෙස රෝගය පාලනය කළ හැක.

## ශ්‍රී ලංකාවේ කුකුබිට්සේ ශාක හා සම්බන්ධ බෙගමො වෛරස් අනුක හඳුනාගැනීම සහ ලක්ෂණීකරණය

කුකුබිට්සේ යනු ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාපවල ප්‍රචලිතව වගාකරන එළවළු වේ. අස්වැන්න අඩුවීමට සහ එලයේ ගුණාත්මකබව අඩුවීමට ප්‍රධාන හේතුව වෛරස් රෝග වේ. ශ්‍රී ලංකාවේ කුකුබිට්සේ බෝග වගාවේ ELISA පරීක්ෂාව මගින් මෙයට පෙර බොහෝ වෛරස් හඳුනාගනු ලැබිණි. කරවිල වැඩි වශයෙන් පත්‍ර කොඩවීමේ රෝග ලක්ෂණ පෙන්නුම් කරමින් ඇතිවන රෝගී තත්ත්වය සුදු මැස්සන් මගින් ව්‍යාප්ත වනබව සොයා ගැනිණි. බෙගමො වෛරස්වලට විශේෂිත වූ පොදු ප්‍රයිමස් උපයෝගී කර ගනිමින් පොලිමරේස් දාම ප්‍රතික්‍රියා පරීක්ෂණය මගින් බෙගමොවෛරස් ආසාදිත කරවිල, වැටකොළු, වට්ටක්කා, පිපිඤ්ඤා සහ පතෝල ශාකවල වෛරස් වැනි ලක්ෂණ පෙන්නුම් කෙරිණි. ශ්‍රී ලංකාව තුළ කුකුබිට්සේ ශාකවල බෙගමො වෛරස් ආසාදනය වීම පිළිබඳව පළමු වාර්තාවීමයි. ශ්‍රී ලංකාවේ කරවිල වල බෙගමො වෛරස් වල ප්‍රෝටීන් කොපු ජානයෙහි ජාන අනුපිළිවෙල සැසඳීම සහ වංශ ප්‍රවේණිය විශ්ලේෂණය මගින් නියුක්ලියෝටයිඩ 97%ක් නවදිල්ලි තක්කාලි පත්‍ර කොඩවීමේ වෛරසය, Bitter – gourd (TOLCNDV – BG) වෛරසය හා සමානතාවයක් පෙන්නුම් කරනු ලැබූ අතර එමගින් ශ්‍රී ලංකාවේ කරවිල බෙගමො වෛරසය (Begamo – Bitter – Gourd SL virus) යනු නවදිල්ලි තක්කාලි පත්‍ර කොඩවීමේ වෛරසයෙහි (TOLCNDV) තවත් එක් ආකාරයක් බව හඳුනා ගැනිණි.

## ශ්‍රී ලංකාවේ උද්‍යාන බෝග වගාව හා සම්බන්ධ ෆයිටොප්ලාස්ම රෝගයෙහි රෝග ලක්ෂණ සහ අනුක හඳුනාගැනීම

උද්‍යාන බෝග ක්ෂේත්‍ර සමීක්ෂණයන්හිදී වම්බටු, පැපොල්, මාළුමිරිස් සහ මිරිස් බෝගවල ෆයිටොප්ලාස්මා රෝගයට හා සමාන කළ හැකි රෝග ලක්ෂණ නිරීක්ෂණය කළ හැකිවිය. ෆයිටොප්ලාස්මා ප්‍රයිමර්ස් සමඟ විස්තාරණයේදී වම්බටු හා සම්බන්ධ පත්‍ර කුඩාවීමේ රෝගය, පැපොල් හා සම්බන්ධ ප්‍රතිමාර රෝගය, මිරිස් / මාළුමිරිස් හා සම්බන්ධ පත්‍ර සෙච්වන්දි ආකාරවීමේ රෝගය ෆයිටොප්ලාස්මා මගින් ඇති කරවන බව අනුමාන කෙරේ. ශ්‍රී ලංකාව තුළ මිරිස් වල ෆයිටොප්ලාස්මා හා සම්බන්ධ පත්‍ර සෙච්වන්දි ආකාර වීමේ රෝගය වාර්තා වූ පළමු අවස්ථාව වේ.

## අර්තාපල්වල පිටි කොබලු රෝගය ඇති කරවන *Spongospora subterranea fsp.* අනුක හඳුනාගැනීම සහ අර්තාපල්වල බීජ ස්වච්ඡතාව ශීඝ්‍ර අනුක හඳුනාගැනීම සඳහා වූ ක්‍රමවේදය හඳුනාගැනීම

දිලීර ව්‍යාධිජනකයන් මගින් බීජ අර්තාපල් වල ඇති කරන පිටි කබොළු රෝගය ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් නිරෝධායන රෝගයකි. මෙම රෝගය අර්තාපල් වගා කරන බොහෝ ප්‍රදේශ වලින් වාර්තා වේ. රෝගය කළමනාකරණයේදී ස්වච්ඡතාවයෙන් යුත් රෝපණ ද්‍රව්‍ය ව්‍යාධිජනකයින්ගෙන් තොර උපස්ථරය/පස ඉතා වැදගත් පූර්ව අවශ්‍යතාවයකි. මෙම ව්‍යාධිජනකය හඳුනාගැනිම උදෙසා දෘෂ්‍ය නිරීක්ෂණ, අන්වීක්ෂ නිරීක්ෂණය සහ මස්තු විද්‍යාත්මක ක්‍රමෝපායන් හැමවිටම සංවේදි සහ ප්‍රමාණවත් නොවන නිසා ශීඝ්‍ර, විශ්වාසදායී බීජ ස්වච්ඡතා පරීක්ෂණ

ක්‍රමවේදයක් අවශ්‍ය වනු ලැබේ. මෙම අධ්‍යයනයන් තුළින් හඳුනාගත් අනුක හඳුනාගැනීම් ක්‍රමවේදය, බීජ අර්තාපල් වල පිටි කබොළු රෝගය ඇති කරන *Spongospora subterranea* fsp. *subterranea* ශීඝ්‍ර හා විශ්වාසදායී ලෙස හඳුනා ගනිමින් බීජ ස්වස්තතාව හඳුනාගැනීම උදෙසා දෛනිකව යොදා ගනු ලැබිය හැක. ආසාදිත ආකන්ධ, මූල ගඩු සහ ආසාදිත උපස්තරයන් 434 bp අඛණ්ඩව විස්තාරණයක් පෙන්නුම් කරන අතර ව්‍යාධිජනකයා රහිත විට විස්තාරණයක් ඇති නොවේ.

### දේශීය බිම්මල් ප්‍රභේද වගාකිරීම සඳහා වූ තාක්ෂණය

මහනුවර සහ කලියල්පිටිය ප්‍රදේශවල පස් සහ ලී කුඩු මිශ්‍රණයකින් හඳුනාගත් දේශීය බිම්මල් ප්‍රභේදය *Boletus* sp බව හඳුනාගත් අතර එහි බීජාණුකරය ආහාරයට ගත හැක. දින 13ක් ඇතුලත බිත්තර වී වල, මව් සහ වාණිජ බීජ ලබා ගත හැකි විය. දේශීය බිම්මල් වල දිලීර ජාලය 26-28 $C^0$ උෂ්ණත්වයක් යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත කොම්පෝස්ට් මලු වල දින 35කින් සාර්ථකව වගා කළ හැකි විය. වගා කර දින 10කින් මලු විවෘත කළ විට කුඩා ඇල්පෙනෙත්ති හිස මෙන් ප්‍රමාණයක බීජාණුකර දැක ගත හැකි විය.

### වගාමලු බීජෞෂණය සඳහා වගා ගෘහය භාවිතය

බිම්මල් වගාකිරීම උදෙසා භූමි භාවිතය අවම කිරීමටත් මයිටා ආක්‍රමනය පාලනය කරමින් අඛණ්ඩව අස්වැන්න ලබා ගැනීම උදෙසා පද්ධති දෙකක් උපයෝගී කර ගත හැක. මෙම ක්‍රමය මගින් මිනිස් බලය අවම වශයෙන් අවශ්‍ය වන අතර අස්වැන්න අඛණ්ඩව ලබා ගත හැකි අතරම මයිටා ආක්‍රමනය පහසුවෙන් පාලනය කළ හැක.

## කෘෂිකර්ම රසායන විද්‍යා අංශය

කෘෂිකර්ම රසායන විද්‍යා අංශයෙහි ප්‍රධාන කාර්යභාරය වන්නේ පාංශු සාරවත්බව, පැළෑටි පෝෂක කළමනාකරණය සහ කාබනික ගොවිතැන පිළිබඳ පර්යේෂණ පැවැත්වීමයි. මෙයට අමතරව ගොවීන්හට පාංශු පරීක්ෂණ පදනම් පොහොර භාවිතය පිළිබඳ උපදෙස් ලබාදීමත් පස, පැළෑටි, ජලය, අකාබනික පොහොර සහ කාබනික පොහොර පිළිබඳ විශ්ලේෂණයන්හිද නිරත වේ. මෙම අංශය මගින් පස, පොහොර සහ පොහොර කළමනාකරණය සහ කාබනික ගොවිතැන පිළිබඳ පුහුණු වැඩසටහන්ද පවත්වනු ලබයි.

### කාබනික එළවළු බෝගවල පෝෂක කළමනාකරණය

කාබනික ගොවිතැන යටතේ එළවළු බෝගවල වර්ධනයට සහ අස්වැන්නට කාබනික පෝෂක ප්‍රභවයන් කොටස් වශයෙන් යෙදීමේ බලපෑම පිළිබඳව පරීක්ෂණයන්හිදී පොහොර කොටස් වශයෙන් යෙදීම හා සැසදීමේදී පොහොර එක් වරම යෙදීම මගින් ඒ හා සමාන අස්වැන්නක් ලබාගත හැකිබව හෙළිදරවු විය. එමනිසා පොහොර කොටස් වශයෙන් යෙදීම අවම කළ හැක.

### කොම්පෝස්ට් පොහොර අඛණ්ඩව යෙදීම

කොම්පෝස්ට් + NPK පොහොර දෙකෙහිම මිශ්‍රණය යෙදීම මගින් බෝංචි සහ ගෝවාවල හෙ.28.5ක අස්වැන්නක් ලබා ගත හැකි නමුත් කොම්පෝස්ට් පමණක් යෙදීම මගින් අස්වැන්න හෙ.16ක් පමණක් ලබාගත හැක. අඛණ්ඩව වසර 13ක් අකාබනික පොහොර පමණක් යෙදීමෙන් හෙ.ටො 8.4ක පමණ අවම අස්වැන්නක් ලැබිණි. කාබනික පොහොර සමඟ අකාබනික පොහොර දෙකම යෙදීමේ සමෝධානික ක්‍රමය මගින්

පෝෂක සැපයුම පමණක් නොව පසේ තත්ත්වයද වැඩිදියුණු වේ.

## එළවළු නිෂ්පාදනය සඳහා ජීව අඟුරු යෙදීම

කාබනික ගොවිතැන යටතේ කාබනික පොහොර සමග ජෛව දහනයන් දෙකම සමෝධානිකව යෙදීමේ බලපෑම අධ්‍යයනය කරනු ලැබීය. ගොම පොහොර සමග පිලිස්සූ දහයියා යෙදීම හා සැසඳීමේදී කුකුල් පොහොර පිලිස්සූ දහයියා සමග යෙදීමෙන් අස්වැන්න 14%ක වැඩි අස්වැන්නක් ලබාගත හැකි විය. කාබනික පොහොර පිලිස්සූ දහයියා සමග යෙදීම මගින් පිලිස්සූ පොල් කොහු සමග යොදනවාට වඩා වැඩි අස්වැන්නක් ලබාගත හැක. කන්න කිහිපයක්ම මෙම පරීක්ෂණ අඛණ්ඩව සිදු කරනු ලබයි.

තක්කාලි වගාවේදී නිර්දේශිත අකාබනික පොහොර පිලිස්සූ දහයියා සමග යෙදීමට වඩා 30%ක වැඩි අස්වැන්නක් පිලිස්සූ ග්ලිරිසීඩියා යෙදීම මගින් ලබාගත හැක. මෙයට අමතරව අකාබනික පොහොර, ගොම පොහොර සහ පිලිස්සූ දහයියා සම්මිශ්‍රව යෙදීම මගින් අකාබනික පොහොර පිලිස්සූ දහයියා සමග යෙදීමට වඩා 41%ක ඉහළ අස්වැන්නක් ලබාගත හැකිය.

## තෙත් කලාපයේ වාර්ෂික පැළ කිරීමේ ක්‍රමය යටතේ කෙසෙල්වල පොටෑසියම් සහ පොටෑසියම් කළමනාකරණය

කෙසෙල් වගාව සඳහා යෝග්‍යතම පොටෑසියම් භාවිතයේ අනුපාතය නිර්ණය කිරීමත්, කෙසෙල් වල ගුණාත්මක තත්ත්වයට බලපෑමත්, පසෙහි K ප්‍රමාණය පරීක්ෂා කිරීම උදෙසාත් පොටෑසියම් පොහොර භාවිතය පරීක්ෂා කරනු ලැබිණි. මූලික අධ්‍යයනයන්හි ප්‍රතිඵලයක් මගින් තෙත් කලාපයේ කෙසෙල් ඵලදායීතාවය පොටෑසියම් යෙදීමේ අනුපාතය වැඩකිරීම මගින් වැඩි කළ හැක. අධ්‍යානයන් අඛණ්ඩව සිදුවේ.

## එළවළු නිෂ්පාදනය කෙරෙහි නැනෝ - නයිට්‍රජන් පොහොර බලපෑම

තක්කාලි වගාව සඳහා නැනෝ - නයිට්‍රජන් පොහොර ඵලදායීතාවය පරික්ෂාවේදී100% අකාබනික පොහොර භාවිතය හා සමානවම 75% නැනෝ - නයිට්‍රජන් (වාර 3කදී) යෙදීම මගින් සමාන අස්වැන්නක් ලබා ගත හැකි බව හෙළිදරවු විය. කෙසේ වුවද නැනෝ - නයිට්‍රජන් 50%ක නිර්දේශීය අනුපාතයට අඩුකිරීම මගින් පැහැදිලිව අස්වැන්න අඩුවීමක් පෙනිණි. අධ්‍යයනය තවදුරටත් අඛණ්ඩව සිදු කරනු ලබයි.

## එළවළු කෙරෙහි ක්ෂුද්‍ර පෝෂක බලපෑම අධ්‍යයනය

කෘෂි කාලගුණික කලාප 3කදී මාළුමිරිස්, අර්තාපල් සහ වට්ටක්කා සඳහා ක්ෂුද්‍ර පෝෂක සැපයීම, එළවළු අස්වැන්න කෙරෙහි ඉහළ අකාබනික පොහොර අනුපාතයක් යෙදීමේ බලපෑම සහ පැළවලට පෝෂක ලබාගැනීම පරීක්ෂා කරනු ලැබිණි. මාළුමිරිස් සහ අර්තාපල් වලට කාබනික පොහොර යෙදීම හේතුකොට ගෙන අස්වැන්නෙහි පැහැදිලි කැපී පෙනෙන වෙනසක් ඇති නොවිණි. කෙසේ වුවද කාබනික පොහොර යෙදීම මගින් වට්ටක්කා පැහැදිලි ලෙසම වැඩි අස්වැන්නක් ප්‍රතිඵල කෙරිණි. මාළුමිරිස් සහ වට්ටක්කා සඳහා ක්ෂුද්‍ර සහ ද්වීතීයක පෝෂක යෙදීම හේතුවෙන් පැහැදිලි අස්වැන්න වැඩිවීමක් නිරීක්ෂණය කළ නොහැකි විය. කෙසේ වුවද මෙම බෝග තුනෙහිම පත්‍රවල පෝෂක ප්‍රමාණය ප්‍රමාණවත් අනුපාතයෙන් තිබුණද අර්තාපල් ද්වීතියික පෝෂක හට ප්‍රතිචාරයක් දැක්විණි.

## එළවළුවල විවිධ පොහොරවල බලපෑම වෙනස්වීම

අන්තර්ජාතික කෘෂිකර්මාන්තය පිළිබඳ වූ කොරියානු ව්‍යාපෘතිය යටතේ වූ ව්‍යාපෘතිය මගින් එළවළු කෙරෙහි විවිධ පොහොර යෙදීමේ පිළිවෙත් මාලාවන්හි ඵලදායිතාවය පරීක්ෂා කෙරිණි. තක්කාලි සඳහා කොරියානු පොහොර නිර්දේශයන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශයන් ගොවි ක්ෂේත්‍රයන්හිදී ගොවි පිළිවෙත් මාලාවන් සමඟ පරීක්ෂා කරනු ලැබිණි. කොරියානු ඉහළ නිර්දේශිත පොහොර භාවිතයක් තිබුණද අස්වැන්නෙහි වැඩිවීමක් ප්‍රතිඵල නොවිණි. ගොවීන් ඉහළ පොහොර අනුපාතයන් යෙදුවද දෙපාර්තමේන්තු නිර්දේශයන් යටතේ (හෙ. ටො 20.7) හා ගොවි පිළිවෙත් මාලාවන් (හෙ. ටො 21.2) යටතේ එක හා සමාන අස්වැන්නක් ලබාගත හැකි විය.

## එළවළු බෝග මගින් පෝෂක බැහැර කිරීම

එළවළුවල පෝෂක අවශ්‍යතා ඇගයීම උදෙසා මෙම අධ්‍යයනය සිදු කෙරිණි. වම්බටු ප්‍රභේද 6ක, තක්කාලි ප්‍රභේද 6ක, කරවිල ප්‍රභේද 15ක, පිපිඤ්ඤා ප්‍රභේද 8ක සහ මාළුමිරිස් ප්‍රභේද 5ක පෝෂක බැහැර කිරීම නිර්ණය කෙරිණි. තක්කාලි සහ වම්බටුවල පොටෑසියම් බැහැර කිරීම ඉහළ අගයක් පෙන් වූ අතර එයට පසුව N බැහැර කිරීම පෙන්නුම් කෙරිණි. වම්බටු වල Ca බැහැර කිරීම P බැහැර කිරීම හා සාපේක්ෂව අඩු අගයක් පෙන්නුම් කෙරිණි. තක්කාලි වල Ca බැහැර කිරීම වැඩි අගයක් පෙන්නුම් කෙරිණි. පරීක්ෂණ අඛණ්ඩව සිදු කෙරේ.

## ශ්‍රී ලංකාවේ භාවිත කරන ට්‍රිපල් සුපර් ෆොස්පේට් සහ MOP පොහොර වල ලෝහමය තත්ත්වය අධ්‍යයනය

විවිධ රටවලින් ආනයනය කරන ෆොස්පේට් සහ පොටෑසියම් පොහොරවල ලෝහ ප්‍රමාණය (Fe, Cu, Mn, Zn, Cd, Cr, Pb සහ As) නිර්ණය කෙරිණි. මෙහි ප්‍රතිඵල මගින් ෆොස්පේට් පොහොරවල Fe, Cu, Mn, Zn, Cd, Pb, As සහ Cr ශේෂ ලෝහ සැලකිය යුතු ප්‍රමාණවලින් පවතිනබව සොයා ගැනිණි. ට්‍රිපල් සුපර්, ෆොස්පේට්වල අහිතකර මූලද්‍රව්‍ය වන Pb, Cd, Cr, As ප්‍රමාණය පිළිවෙලින් 16.4 - 98.6 ppm, 1.6 - 18.1ppm, 31 - 406.2 ppm සහ 0.28-10.2 ppm විය. කෙසේ වුවද ට්‍රිපල්පොස්පේට් හා සැසඳීමේදී MOP මෙම අහිතකර මූලද්‍රව්‍ය ප්‍රමාණය සාපේක්ෂව අඩු විය. (Pb - 18.8 - 41.6 ppm, Cd 0.14 - 1.68 ppm, Cr 2.2 - 20.8 ppm, As 0.028- 0.105 ppm) අධ්‍යනයන් තවදුරටත් සිදු කරනු ලැබේ.

## ශ්‍රී ලංකාවේ විවිධ වගා ක්‍රමවල පාංශු සාරවත්බව ඇගයීමේ වැඩසටහන

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෝරාගත් ගොවිජන සේවා කොට්ඨාශයන්හි විවිධ බෝග වගා ක්‍රම හා සම්බන්ධ පාංශු සාරවත්බව පරාමිතීන් ඇගයීම උදෙසා අධ්‍යනයක් පවත්වනු ලැබිණි. සාම්පල එකතු කිරීම සහ ප්‍රධාන පෝෂක විශ්ලේෂණය සම්පූර්ණ කෙරිණි. මාතලේ, කෑගල්ල සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි ද්විතියික සහ ක්ෂුද්‍ර පෝෂක විශ්ලේෂණය සම්පූර්ණ කෙරිණි. අනෙකුත් දිස්ත්‍රික්කයන්හි සාම්පල විශ්ලේෂණය සිදු කෙරෙමින් පවතී.

## පාංශු ක්ෂුද්‍ර ජීවී විද්‍යාව

### එළවළු බෝග හා සම්බන්ධ නයිට්‍රජන් තිර කිරීමේ ක්ෂුද්‍ර ජීවී ගහනයන් වෙන් කිරිම

නයිට්‍රජන් තිරකරන්නා වු බැක්ටීරියා වෙන් කිරිම උදෙසා මෙම අධ්‍යයනයන් සිදු කෙරිණි. නයිට්‍රජන් තිර කිරීමේ කාර්යක්ෂමතාවයද පරීක්ෂා කරනු ලැබිණි.

විවිධ බැක්ටීරියා ගහන 5ක් වෙන් කරගනු ලැබු අතර මාළුමිරිස් සමග මෙම බැක්ටීරියා පරීක්ෂා කෙරිණි. මාළුමිරිස් වල වර්ධනය සම්බන්ධයෙන් මෙම බැක්ටීරියා ධනාත්මක බලපෑමක් ඇති කළ බව පරීක්ෂණයන්ගෙන් පෙන්නුම් කෙරිණි. අනෙකුත් එළවළු සමග මෙම පරීක්ෂණ අඛණ්ඩව සිදු කරනු ලබයි.

### මාළුමිරිස් මුල් පද්ධතිය ආශ්‍රිත පාංශු කලාපයේ ක්ෂුද්‍රජීවී විවිධත්වය සහ පාංශු කළමනාකරණ තත්ත්වය

රසායනික හා කාබනික පොහොර යෙදීම මගින් ක්ෂුද්‍ර ජීවී විවිධත්වය අගයනු ලැබීය. නිර්දේශිත කොම්පෝස්ට් ප්‍රතිකර්ම සමග පොහොර නොයෙදූ තත්ත්වයන් යටතේ ශාක වර්ධනය සාපේක්ෂව දුර්වල විය. කෙසේ වුවද පොහොර නොයොදා කොම්පෝස්ට් පමණක් යෙදූ විට ක්ෂුද්‍ර ජීවී විවිධත්වය ඉහළ මට්ටමක විය. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.

## මුල්, ආකන්ධ බෝග, මල් බෝග සහ ගෙවතු වගා අංශය

### මුල් හා ආකන්ධ බෝග

#### බතල

- තෝරාගත් මලයාසියානු ප්‍රභේදය කෙටි කාලීන ඉහළ ගුණාත්මක බවකින් යුත්, සිත්ගන්නා සුළු රතු පැහැති පොත්තකින් යුතු, සුදු පැහැති අලය සහිත ප්‍රභේදයකි.
- ලවණතාවය ඔරොත්තු දෙන CIP ආර 11 අතුරෙන් 199076 – 1, 199062 – 1, 440262 – 1 සහ 440183 යන ආර, ප්‍රභේද පරීක්ෂා කිරීම සඳහා අත්හදා බැලීම්හිදී ඉහළ අස්වැන්නක් ලබාදුණි. ලවණතාවයන් සහිත ප්‍රදේශ සඳහා යෝග්‍ය බලාපොරොත්තු තැබිය හැකි ආර තෝරා ගැනිම උදෙසා ලවණ සහිත ප්‍රදේශයන්හිදී අනුක්‍රමික (නැවත නැවතත්) අස්වනු අත්හදා ලැබීම් යටතේ මෙම ආර අගයනු ලැබිණි.

#### මඤ්ඤොක්කා

“පොල්පිතිගම” නව ප්‍රභේදය මගින් ඉහළ ගුණාත්මක බවකින් යුත් (අලයේ මැද කහපැහැති) වැඩි අස්වැන්නක් ලැබිණි.

### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ බෙදාහැරීම

රට පුරා ඉල්ලුම පරිදි විවිධ ඉලක්කගත ප්‍රතිලාභීන් අතර මුල් හා ආකන්ධ බෝගවල සියලුම නිර්දේශිත ප්‍රභේදයන්හි මූලික රෝපණ ද්‍රව්‍ය 45,000කට වැඩි ප්‍රමාණයක් බෙදා හරිනු ලැබිණි. අනාගත භාවිතය සඳහා සියලුම මුල් හා ආකන්ධ බෝගවල ජනක ප්ලාස්ම නඩත්තු කරනු ලැබීය.

### ගෙවතුවගා සහ මල්වගා

- වටිනාකමින් ඉහළ අගයක් පවතින ආවේනික සහ දේශීය මල් රැස් කිරිම, නඩත්තුව සහ ප්‍රවර්ධනය සිදු කෙරිණි. මෙම එකතුවට නව කැලෑවෙහි වැවෙන අලංකාර විසිතුරු පැළ 12ක් සහ විදේශීය ජර්බෙරා දෙමුහුම් 4ක් එකතු කෙරිණි.
- **ගෙවතු වගා සඳහා අනුවර්තනය විය හැකි ඌන උපයෝජිත බෝග ප්‍රභේද රැස්කිරීම, නඩත්තුව සහ ඇගයීම.**

- මිරිස්, බණ්ඩක්කා, දඹල, පලා, එළවළු, ටියුබ් ලීක්ස්, වම්බටු, බතල, අල සහ වෙනත් පලතුරු බෝග කිහිපයක්, වැනි ගෙවතු වගා තත්ත්වයන් යටතේ හොඳින්ම අනුවර්තනය වන ඌන උපයෝජිත බෝග ප්‍රභේද නඩත්තු කරනු ලැබූ අතර කන්නය තුළදී ගෙවතු වගා තත්ත්වයන් යටතේ පරීක්ෂා කෙරිණි. ගෙවතු වගා බෝග එකතුවට නව බෝග 6ක් හඳුන්වා දුණි. එනම් මිරිස් ප්‍රභේද 3ක්, කටු රහිත තලන බටු ප්‍රභේද 1, තුල්සි ප්‍රභේද 1, දඹල ප්‍රභේද 1
- ගොවි ගැටළු විසඳීම උදෙසා ආරක්ෂිත ගෘහ තුළදී සලාද, පිපිඤ්ඤා සාම්පල් 2ක් ඇගයීම උදෙසා පර්යේෂණයක් සිදු කෙරිණි.

## මුල් හා ආකන්ධ බෝග, ගෙවතු වගා සහ මල්වගා ව්‍යාපෘති

### පැළෑටි ජාන සම්පත් ව්‍යාපෘතියෙහි සමෝධානික කළමනාකරණ පද්ධතිය

රටේ ප්‍රදේශ කිහිපයකම සිදුකල ගවේෂණයන්හිදී පැළෑටි ජාන සම්පත් ව්‍යාපාතිය යටතේ වූ සමෝධානික කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ඩයස්කොරියා එකතුන් 40ක් (*Dioscorea alata, Dioscorea esculenta, Dioscorea bulbifera, Dioscorea rotundata, Dioscorea oppositifolia*ට අයත්) රැස් කර ගැනිණි. රැස්කරගත් මෙම සියලුම එකතුන් ගුණනය සහ සංරක්ෂණයඋදෙසා ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය තෙලිජ්ජවිල හි ගබඩා කර ඇත. තවද ගුණනය සහ සංරක්ෂණය උදෙසා ගොවි ක්ෂේත්‍රවලද වගා කරනු ලැබිණි. මෙම ව්‍යාපෘතිය යටතේ එකතුන් හඳුනාගැනීම සහ මෙම එකතුන්හි ද්විත්වකරණය වැලක්වීම පිණිස මෙම වර්ෂයේ සිට ව්‍යුහාත්මක ලක්ෂණ ලක්ෂණීකරණය සිදු කරනු ලබයි.

වැඩි අස්වනු, පස මතුපිට තිබෙන ආහාරයට ලබාගත හැකි ලක්ෂණ සහිත බව හඳුනාගැනීමත් සමග මෙම අල වර්ග ප්‍රචලිත විය හැක.

එමනිසා අස්වැන්න ලබා ගැනීමේ හැකියාව, ගුණාත්මකබව, යෝග්‍ය ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සහ ආහාරයට ලබාගත හැකි ලක්ෂණ සහිත ඩයස්කොරියා එකතුන් ඇගයීම සිදු කරනු ලැබිණි.

### පැළෑටි ජාන සම්පත් සඳහා සමෝධානික කළමනාකරණ පද්ධති

මෙම ව්‍යාපෘතිය යටතේ ගෙවතු සඳහා යෝග්‍ය බෝග ප්‍රභේද 10ක් රැස් කරනු ලැබිණි. ගුණනය සහ සංරක්ෂණය උදෙසා මෙම එකතුන් ගෙවතුවල වගා කෙරිණි. මෙම වර්ෂය තුළදී රැස් කරගත් එකතුන්හි ලක්ෂණීකරණ අඛණ්ඩ සිදු කෙරේ. ක්ෂේත්‍ර තත්ත්වය යටතේ වගා කළ පාලකයට වඩා $CO_2$ වලින් සපිරි වූ බෝගය වැඩි අස්වැන්නක් ලබාදුණි.

## $CO_2$ සුපෝෂණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘයෙහිදී "Ceres" දෙමුහුම් තක්කාලි ප්‍රභේද පරීක්ෂා කෙරිණි. $CO_2$ සපිරි තත්ත්වයට පත් කළ බෝගයේ අස්වැන්න සාමාන්‍ය වායුගෝලීය $CO_2$ ප්‍රමාණය ලැබූ පාලකයට වඩා වැඩි අස්වැන්නක් ලබාදුණි.

## ශ්‍රී ලංකාවේ නලස්ථ තත්ත්වයන් යටතේ ජෑම් තක්කාලි ප්‍රභේද ඇගයීම

උද්‍යාන බෝග පර්යේෂණ සංවර්ධන ආයතනයේදී නලස්ථ තත්ත්වයන් යටතේ ජෑම් තක්කාලි ප්‍රභේද 4ක් අගයනු ලැබිණි. 2014 වර්ෂයේදී අඛණ්ඩව පරීක්ෂණ සිදු කරනු ලැබේ.

## සාම්ප්‍රදායික එළවළු ප්‍රභේද ව්‍යාපෘතියෙහි බීජ ලබාගත හැකිබව ඉහළ දැමීම

ඇත්දල බණ්ඩක්කා, ගෙවතු බණ්ඩක්කා, මාළුමිරිස් ප්‍රභේද, හාල්මැස්සන් දඹල, රතු තම්පලා, අලංග වැනි සාම්ප්‍රදායික එළවළු ප්‍රභේද 7ක් ගුණනය හා ලක්ෂණීකරණය කරනු ලැබිණි.

## ව්‍යාප්ති ආර්ථික හා දත්ත කළමනාකරණය අංශය

මෙම අංශය උද්‍යාන බෝග සම්බන්ධ තාක්ෂණයන් ලබාදීමේදී ව්‍යාප්ත කටයුතු/ සම්බන්ධීකරණය, ව්‍යාපෘති වාර්තා සැකසීම සඳහා සහාය ලබාදීම, මූල්‍යමය කටයුතු සහ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දත්ත කළමනාකරණ කටයුතු පිළිබඳව අදාල වගකීම පැවරේ.

## පුහුණු වැඩසටහන්

මෙම කාලය තුළදි අංශය විසින් විශ්වවිද්‍යාල, ආයතන, පාසැල්, ගොවීන් සහ ගොවි සංවිධාන උදෙසා දැනුවත්වීම් සහ තාක්ෂණ ව්‍යාප්ති වැඩසටහන් පවත්වනු ලැබිණි.

**වගුව 1.2.3: 2013 වර්ෂයේදී පැවැත් වූ දැනුවත් වීමේ සහ තාක්ෂණ හුවමාරු වැඩසටහන්**

| අංශය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| **විශ්වවිද්‍යාල** | |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 36 |
| යාපනය විශ්වවිද්‍යාලය | 47 |
| විවෘත විශ්වවිද්‍යාලය - උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව | 46 |
| ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 37 |
| රජරට විශ්වවිද්‍යාල - ව්‍යවහාරික විද්‍යා පීඨය | 40 |
| වයඹ විශ්වවිද්‍යාලය | 41 |
| කොළඹ විශ්වවිද්‍යාලය - භූ විද්‍යා දෙපාර්තමේන්තුව | 34 |
| කොළඹ විශ්වවිද්‍යාල දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | 150 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය - උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව | 36 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමාජ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව | 30 |
| කෘෂිකර්ම විද්‍යාලය - පැල්වෙහෙර සහ වවුනියා | 73 |
| උසස් තාක්ෂණ ආයතනය නයිවල | 42 |
| **අන්තර්ජාතික සංවිධාන සහ සමාජ අන්තර්ජාතික වැඩසටහන** | |
| කෘෂි සත්ව - 2013 - සමුළු මධ්‍යස්ථානය ශ්‍රී.ල.ප.ආ. කොළඹ | 11 |
| විසිට් ලංකා පෞද්ගලික සමාගම - ප්‍රංශය ශ්‍රී ලංකා ජාතික දෘශ්‍යා බාධිත සම්මේලන - මහනුවර | 42 |
| පුහුණුකරුවන් පුහුණු කිරීම ශ්‍රී ලංකා හඳුබිම අධිකාරිය | 30 |
| කිලිනොච්චි කෘෂි කඳවුර - දින 3 වැඩසටහන | 05 |
| ගොවීන් සහ ව්‍යවසායකයින් පුහුණුව | 200 |

| අංශය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| පාසල් ගුරුවරුන් පුහුණුව | 349 |
| ගොවීන් සහ ව්‍යවසායකින් පුහුණුව | 166 |
| සහභාගි වූ පාසල් සංඛ්‍යාව | 149 |
| සහභාගි වූ පාසල් ශිෂ්‍යයින් සංඛ්‍යාව | 7250 |

- පුහුණු වැඩසටහන් තුළදී පහත දැක්වෙන මාතෘකා අදාළ සම්පත් දායකයින් විසින් ආවරණය කරනු ලැබිණි
    - ක්ෂේත්‍ර පරීක්ෂණ සැලසුම් කිරීම, පැළ තවාන් සැකසීම, සාමාන්‍ය පළිබෝධකයින් සහ උද්‍යාන බෝග රෝග, ගෙවතු කළමනාකරණය, රෝග හඳුනාගැනීම, පටක රෝපණ තාක්ෂණය, බිම්මල් වගාව, පසු අස්වනු සහ ආහාර තාක්ෂණය, කාබනික ගොවිතැන
- 2013/06/17 සිට 2013/06/26 දක්වා සහ 2013/07/08 සිට 2013/07/19 දක්වා උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී අලුතෙන් බඳවාගත් පර්යේෂණ සහකාරවරුන් සඳහා උද්‍යාන බෝග පිළිබඳ සති 2ක සේවා සංස්කරණ පුහුණු වැඩසටහන් 2ක් පැවැත්විණි. එක් කණ්ඩායමකට පර්යේෂණ සහකාරවරුන් 40 දෙනෙකු ඇතුලත් විය.
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් අනුයුක්ත කළ ශිෂ්‍යයින් දෙදෙනකු සඳහා මාස 6ක කාලයක් තුළදී තාක්ෂණය ව්‍යාප්තිය සහ තාක්ෂණික තොරතුරු ප්‍රකාශන සැකසීම පිළිබඳව ප්‍රායෝගික පුහුණුව ලබාදීම

## තාක්ෂණික ව්‍යාප්ති කාර්යයන්

- උද්‍යාන බෝග පිළිබඳ ගැටළු සඳහා ලිඛිත පිළිතුරු 55ක් ලබාදුණි
- දුරකථන විමසීම් 62ක් සඳහා තාක්ෂණික උපදෙස් ලබාදුණි
- ව්‍යාප්ති අංශය නැරඹීම පිණිස පැමිණි 138 දෙනෙකු සඳහා තාක්ෂණික තොරතුරු ලබාදීම
- පෝස්ටර් සහ තාක්ෂණික තොරතුරු ලබාදීම මගින් විවිධ සංවිධාන දිවයින පුරා පැවැත් වූ ප්‍රදර්ශන සඳහා සහාය ලබාදීම

## තාක්ෂණික තොරතුරු ප්‍රකාශන

- තාක්ෂණික ප්‍රකාශන 4ක් සැකසීම මිටිමුරුංගා (*Moringa oleifera*), මී මැසි පාලනය, පැපොල් බීජ නිෂ්පාදනය සහ එළවළු පරිභෝජන ප්‍රවර්ධන මාර්ග සහ ක්‍රමවේද
- තාක්ෂණික තොරතුරු ප්‍රකාශන 4337ක් සහ තාක්ෂණික ප්‍රකාශන මිටි 07ක් (පත්‍රිකා සංඛ්‍යාව 1 -131) අලෙවි කරනු ලැබිණි.

## මාධ්‍ය වැඩසටහන්

- ආචාර්ය පබිලිස් සිල්වා මහතා ගල්කිස්ස හෝටලයේ ගෙවත්තේ සිට " එළවළු පරිභෝජනය ප්‍රවර්ධනය" පිළිබඳ වීඩියෝ වැඩසටහනක් පවත්වනු ලැබිණි. මෙම වැඩසටහන ඉදිරියේදී විකාශය වීමට නියමිතය
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - ගුවන් විදුලි වැඩසටහන් - 02
    - ගෙවත්තෙහි වගාකරන පලතුරු හා එළවළු භාවිතය සහ වටිනාකම වැඩිකිරීම
    - ගෙවතුවල කුඩා නලස්ථ හඳුන්වාදෙමින් ගෙවතු වගා නිෂ්පාදනයන් වැඩිකිරීම

## දත්ත වගු කළමනාකරණ අංශය

- පහත ක්ෂේත්‍රයන් පිළිබඳව දත්ත තොරතුරු සැකසීම සහ ලබාදීම උදෙසා සහාය ලබාදීම
- නිවැරදි සහ කාලීන ආකාරයට මුල්‍යමය ගනුදෙනු වාර්තා කිරීම
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ වාර්ෂික මුල්‍ය ප්‍රකාශනයෙහි අවශ්‍ය සියලුම කොටස් සැකසීම
- වෙනත් සියලුම බාහිර සහ අභ්‍යන්තර ගිණුම් වාර්තා සැකසීම සහ නිකුත් කිරිම
- නීතිමය සහ කළමනාකරණ සීමාවන් යටතේ අරමුණු අපේක්ෂිත පරිදි අරමුදල් සහ සම්පත් බෙදාහැරීම සහ පාලනය
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අයවැය ඇස්තමේන්තු සැකසීම උදෙසා සහාය දීම.
- ව්‍යාපෘති සහ සාමාන්‍ය වැයශීර්ෂ යටතේ මාසික සහ වාර්ෂික සාරාංශ සැකසීම (NARP, Hybrid, KOPIA, NSF etc)
- උද්භිද විද්‍යා පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ දත්ත වගු මෙහෙයවීම
    - NASTEC
    - COSTI
    - INFORM
    - Revenue Reports
    - මානව සම්පත් දත්ත වගුව

## කෘෂිකර්ම කෞතුකාගාරය

- සෑම කාර්යාල දිනයකම සහ ඉල්ලීම පරිදි රජයේ නිවාඩු දිනවල පෙ.ව 8.30 සිට ප.ව 4.15 දක්වා කෘෂිකර්ම කෞතුකාගාරය විවෘතව පවතී. මෙහි සාම්ප්‍රදායික කෘෂිකර්ම උපකරණ සහ මෙවලම් සහ සාම්ප්‍රදායික ගබඩා ව්‍යුහයන්හි ආදර්ශ ප්‍රදර්ශනය කෙරේ.
- 2013 වර්ෂය තුළදී පාසල් සිසුන් 34786, ගුරුවරු 2521, ගොවීන් 2860, රාජ්‍ය සේවකයින් 913, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් 673, විදේශකයින් 19 වෙනත් උනන්දුවක් දක්වන පුද්ගලයින් 3188ක් කෞතුකාගාරය නැරඹීමට පැමිණියහ.
- “කමත් භාෂාව” පිළිබඳ පත්‍රිකා 2145ක් අලෙවි කෙරිණි.
- දුරකථන ඇමතුම් 208කට පිළිතුරු ලබාදෙමින් තාක්ෂණ උපදෙස් ලබාදුණි.

## මධ්‍යම පුස්තකාලය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කෘෂි පුස්තකාලය වේ. දේශීය හා විදේශීය ජර්නල් සහ පොත්වල පැරණි හා නව ප්‍රකාශන එකතුන් පුස්තකාලය සතු වේ. CD ROM සහ CAB සඳහා පැරණි ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගැනීමේ හැකියාව.

- පරිත්‍යාග ලෙස සහ හුවමාරු පදනම යටතේ වසර පුරාම විදේශීය සඟරා 251කට වැඩි සංඛ්‍යාවක් කෞතුකාගාරය වෙත ලැබිණි. මෙයට අමතරව අන්තර්ජාතික පොදුරාජ්‍ය කෘෂිකර්ම කාර්යාංශය වෙත වාර්ෂික දායක මුදල් වශයෙන් ස්ටර්ලින් පවුම් 5750ක් ගෙවනු ලැබිණි.
- තොරතුරු ලබාගැනීම උදෙසා පුස්තකාලය භාවිතකරන්නන් 1000කට වැඩි සංඛ්‍යාවක් පුස්තකාලය වෙත පැමිණියහ. එදිනෙදා පුස්තකාල කියවීමේ සේවාව සහ අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රමවේදය යටතේ පොත් 850ක් පමණ පුස්තකාල සාමාජිකයින් අතර හුවමාරු වනු ලැබිණි.
- පර්යේෂණ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි පසුගිය තොරතුරු සොයා

බලන්නා වූ පුද්ගලයින් 60කට වැඩි සංඛ්‍යාවක් පුස්තකාලයේ සේවාවන් ලබා ගත්හ. CARP සහයෝගය ඇතිව සෙවුම් 42ක් පමණ සිදු කෙරිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරීන්හට පුස්තකාලය භාවිත කිරීම පිළිබඳ දේශන පැවැත්විණි.

- අන්තර්ජාල පහසුකම් උපයෝගී කොට පර්යේෂණ නිලධාරීහු 200ක් පමණ තොරතුරු ලබාගත්හ. කාලීන තොරතුරු ලබා ගැනීම උදෙසා AGRIS CD – ROM පද්ධතිය ආධාර විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සඟරා සහ "Tropical Agriculturist" සඟරාවෙහි ලිපි සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සඟරා උපයෝගී කොට කෘෂිකර්මාන්තය පිළිබඳ නවීනතම තොරතුරු මගින් WEBAGRIS දත්ත වගුව යාවත්කාලීන කිරීමට හැකි විය. මෙයට අමතරව 2012 ජාතික කෘෂිකර්මාන්ත ග්‍රන්ථ නාමාවලිය සඳහා කෘෂිකාර්මික දත්ත ලබාදීමට හැකි විය.
- AGRINET පටුන පිටු සේවාව (SDCP) අඛණ්ඩව සිදු කරනු ලැබූ අතර දෙපාර්තමේන්තුවෙහි අවශ්‍ය සේවකයින්හට පටුන පිටු 150කට වැඩි සංඛ්‍යාවක් බෙදා හැරිණි.

2012 වර්ෂය තුළදී "Tropical Agriculturist" සඟරාව (Vol. 160) දේශීය සහ විදේශීය ආයතන හට බෙදා හරිනු ලැබූ අතර PURNA වෙත ලිපි 1000කට වැඩි සංඛ්‍යාවක් සහ පොත් 3200ක් ලබාදුණි.

## සංවර්ධන සහ තාක්ෂණ හුවමාරු ක්‍රියාවලීන්

### එළවළු අංශය

### අභිජනන බීජ නිෂ්පාදනය

**වගුව 1.2.4: 2013 වර්ෂයේ අභිජනන බීජ නිෂ්පාදනය**

| බෝගය | ප්‍රභේදය | ප්‍රමාණය (Kg) | වගකීම් නිලධාරි |
|---|---|---|---|
| එළවළු කව්පි | සේන | 28.4 | පී. මාලතී |
| මෑ | හවරි මෑ | 18 | පී. මාලතී |
| | පඳුරු පොලොං | 5.6 | |
| රාබු | බීරළු | 2.2 | පී. මාලතී |
| බටු | පාදගොඩ | 3.5 | ආචාර්ය හේමාල් ෆොන්සේකා |
| | HS2 (මව) | 670g | ආචාර්ය හේමාල් ෆොන්සේකා |
| | 5132 (මව) | 250g | ආචාර්ය හේමාල් ෆොන්සේකා |
| | 8104 (මව) | 13 | ආචාර්ය හේමාල් ෆොන්සේකා |
| මාළුමිරිස් | Bullnose (මාතලේ PADA ඉල්ලීම පරිදි) | 750 g | ආචාර්ය හේමාල් ෆොන්සේකා |
| තක්කාලි | තිළිණ | 736g | ආචාර්ය හේමාල් ෆොන්සේකා |
| | HT2123 | 557g | ආචාර්ය හේමාල් ෆොන්සේකා |
| පිපිඤ්ඤා | Champion | 980g | නිර්මලා පරරාජයසිංහම් |
| | කල්පිටිය White | 1.3 | නිර්මලා පරරාජයසිංහම් |
| කරවිල | මාතලේ Green | 7 | නිර්මලා පරරාජයසිංහම් |

| බෝගය | ප්‍රභේදය | ප්‍රමාණය (Kg) | වගකීම් නිලධාරි |
|---|---|---|---|
| වැටකොළු | LA 33 | 2.8 kg | ආචාර්ය එච්. ආරියරත්න |
| බෝංචි | ගන්නෝරුව Green | 40.85 kg | ආචාර්ය එච්. ආරියරත්න |
| දඹල | ක්‍රිෂ්ණ<br>SLS 44 | 32 kg<br>4.25 kg | ආචාර්ය එච්. ආරියරත්න |
| පලා එළවළු | ගොටුකොල, මුකුණුවැන්න, කංකුන්, මිංචි සහ කොරියානු ගොටුකොළ | රෝපණ ද්‍රව්‍ය 1058 kg | |

## පලතුරු හා පටක රෝපණ අංශය

- එක්දින පුහුණු වැඩසටහන් සහ උපදේශක සේවා (පුද්ගලයින් 35 දෙනෙකු සඳහා)
- දේශන - විශ්වවිද්‍යාල සහ පාසල් සිසුන් සඳහා දේශන 06
- උපදේශන සේවා - පුද්ගලයින් 58
- අධීක්ෂණ ව්‍යාපෘති - 01 සම්පූර්ණ කරනු ලැබිණි (විවෘත විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු සමග නලස්ථ කෙසෙල් සහ අන්නාසි ගුණනය සඳහා අඩු පිරිවැයති වගා මාධ්‍ය)
- ප්‍රදර්ශන භාණ්ඩ සැපයීම සහ පොළොන්නරුව සහ වාරියපොල පැවති ප්‍රදර්ශනවලට සහභාගි වීම

## කීට විද්‍යා අංශය

### උපදේශන කාර්යයන්

- ගොවීන්ගේ ලැබූ සාම්පල 110ක් රසායනාගාරයේ පරීක්ෂා කෙරිණි. දුරකථන මාර්ගයෙන් පළිබෝධ ගැටළු, පළිබෝධ හානි පිළිබඳ ඇමතුම් 50කට පමණ පාලන ක්‍රමවේද සඳහා උපදෙස් ලබාදුණි.
- පුද්ගපයින් 86 දෙනෙක් මී මැසි ගෙවත්ත නැරඹූ අතර මී මැසි පාලනය පිළිබඳ උපදෙස් ලබාදුණි.
- ගොවීන්ගේ ක්ෂේත්‍ර ගැටළු පිළිබඳව පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර චාරිකා 20ක් සිදු කළ අතර පාලන ක්‍රමවේද පිළිබඳ උපදෙස් ලබා දුණි.
- සම්පත් දායකයින් ලෙස පුහුණු වැඩසටහන් 34කට සහභාගී විය.
- විදේශීය ප්‍රභේද ඇගයීම් කටයුතු සඳහා ක්ෂේත්‍ර චාරිකා 50කට සහභාගි විය.

## ශාක ව්‍යාධිවේදය සහ බිම්මල් අංශය

### පුහුණු කාර්යයන්

- මුතුබෙල් බිම්මල් වගාව පිළිබඳ පුද්ගලයින් 1324ක් පුහුණු කරනු ලැබූ අතර කුඩා පරිමාණ බිම්මල් නිෂ්පාදකයින් ලෙස ලියාපදිංචිවීමට සහතික 113ක් නිකුත් කෙරිණි.
- පිදුරු බිම්මල් වගාව පිළිබඳව පුද්ගලයින් 23 දෙනෙකු පුහුණු කරනු ලැබූ අතර බිම්මල් බීජානු නිෂ්පාදනය පිළිබඳ පුද්ගලයින් 88 දෙනකු පුහුණු කරනු ලැබිණි.
- තැපැල් මාර්ගයෙන් ගොවීන් 71 දෙනෙකු සහ දුරකථන මාර්ගයෙන් 612 දෙනෙකු සඳහා උපදෙස් ලබාදුණි. ගොවීන් 443 දෙනෙක් උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය නැරඹීමට පැමිණියහ.
- උසස් පෙළ ශිෂ්‍යයින් 24 දෙනෙකු හට ස්වකීය කේවල ව්‍යාපෘතිය සඳහා බිම්මල් වගාව පිළිබඳ තාක්ෂණයන් ලබාදුණි.

- යාපනය විශ්වවිද්‍යාලයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් 03 දෙනකු බිම්මල් වගාව සහ බීජානු නිපදවීම පිළිබඳ පුහුණු කෙරිණි.
- විවෘත විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා ශිෂ්‍යයෙකු සහ අම්පාර කෘෂිකර්ම විද්‍යාලයේ ඩිප්ලෝමා ශිෂ්‍යයෙකු හට ස්වකීය ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සහාය ලබාදුණි.
- බිම්මල් වගාව සහ බීජානු නිෂ්පාදනය පිළිබඳව රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රායෝගික පුහුණු වැඩමුළු පැවැත්විණි. මේ යටතේ AGIDIS ආයතනයෙන් 43 දෙනෙකු, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි 309 දෙනෙකු, IFAD ආයතනයෙන් 95 දෙනෙකු (ගම්පොල සහ කෑගල්ල), බණ්ඩාරගම "වේදෑත" මධ්‍යස්ථානයෙන් 56 දෙනෙකු, පානදුර "වේදෑත" මධ්‍යස්ථානයෙන් 58 දෙනෙකු, MASL ආයතනයෙන් 24 දෙනෙකු, දිවිනැගුම වැඩසටහන යටතේ 199 දෙනකු පුහුණු කරනු ලැබීය.

### රෝපණ ද්‍රව්‍ය බෙදාහැරීම

මව් බීජානු පැකට් 72, පඳුරු බිම්මල් වාණිජ බීජානු පැකට් 46ක් සහ මුතුබෙලි බිම්මල් බීජානු පැකට් 07ක් ගොවීන්හට ස්වකීය පඳුරු බිම්මල් සහ මුතුබෙලි බිම්මල් වගාව ශක්තිමත් කිරීම උදෙසා බෙදා හරිනු ලැබිණි.

### වෙනත් කාර්යයන්

2013 වර්ෂයේ සහභාගී වු විදේශීය පුහුණු/ වැඩමුළු

- ඩබ්ලිව්. ඒ. ජී. වීරරත්න මයා / පර්යේෂණ නිලධාරී "JICA" වැඩසටහන් යටතේ "ජපානයේ පැළෑටි රෝග" පිළිබඳ පුහුණු වැඩසටහන් 2013 සැප්තැම්බර් 29 සිට 2013 ඔක්තෝබර් 12 දක්වා
- ආචාර්ය ඩබ්ලිව්. ඒ. ආර්. ටී. වික්‍රමාරච්චි / පර්යේෂණ නිලධාරි "*Fusarium oxysporum*" *f.sp. cubense* ප්‍රතිරෝධී සමක්ලෝනීය ප්‍රභේද වරණය සඳහා ප්‍රමිතිකරණ ක්‍රමවේදය පිළිබඳ පුහුණුව, තායිවානය කෙසෙල් පර්යේෂණ ආයතනය, තායිවානය, 2013 ඔක්තෝබර් 20 සිට 2013 ඔක්තෝබර් 25 දක්වා
- ඒ. එම්. කේ. අයි. ඊරියගම මෙය/ පර්යේෂණ නිලධාරී, අන්තර්ජාතික කෘෂිකර්මාන්තය පිළිබඳ කොරියානු ව්‍යාපෘතියේ ග්‍රාමීය පරිපාලන අංශය විසින් සංවිධානය කළ, බිම්මල් අභිජනන සහ වගා ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව, කොරියානු ජනරජය 2013 අගෝස්තු 26 සිට 2013 සැප්තැම්බර් 13 දක්වා

## කෘෂිකර්ම රසායන විද්‍යා අංශය

### විශ්ලේෂණ සේවාවන්

2013 වර්ෂය තුළදී පාංශු පරීක්ෂණ වැඩසටහන යටතේ පස් සාම්පල් 87ක්ද විවිධ සේවාදායක කණ්ඩායම්හි ජල සම්පල 24ක්ද විවිධ ගොවීන්ගෙන් ලැබුණු පැළ සාම්පල 28ක්ද කොම්පොස්ට් සාම්පල 84ක්ද විශ්ලේෂණය කර වාර්තා ලබාදුණි.

පැළෑටි සාම්පල බොහෝ සංඛ්‍යාවක ක්ෂුද්‍ර පෝෂක සම්බන්ධ ගැටළු පැවතුණි, පසුගිය වසරට වඩා 2013 වර්ෂයේදී අනෙකුත් ගැටළු සම්බන්ධ විශ්ලේෂණයන් සම්බන්ධ ඉහළ යාමක් පෙන්නුම් කෙරිණි. මෙම පාංශු සහ කොම්පෝස් විශ්ලේෂණ සේවාවන් තුළින් ලද ආදායම රුපියල් 73,905 විය.

### ශිෂ්‍ය ව්‍යාපෘති

රජරට විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් දෙදෙනෙක් සහ විවෘත විශ්වවිද්‍යාලයේ උපාධිය හදාරන ශිෂ්‍යයෙක් ස්වකීය

අවසන් වසරේ වාර්තා සම්පූර්ණ කරනු ලැබුණි.

## මල් සහ ආකන්ධ බෝග පර්යේෂණ අංශය

- විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධ පුහුණු වැඩසටහන් 4ක් පැවැත්වුණි. මහඉලුප්පල්ලම සේවා සංස්කරණ පුහුණු ආයතනයේ කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා 2013.04.23 වන දින "මුල් සහ ආකන්ධ බෝග වගාව" පිළිබඳ පුහුණු වැඩසටහන, 2013.06.28 සහ 2013.07.19 යන දිනවල අලුතෙන් බඳවාගත් පර්යේෂණ සහකාරවරුන් සඳහා උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේදී පැවති පුහුණු වැඩසටහන්, 2013.11.12 වන දින මාතලේ දිස්ත්‍රික් කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා ගන්නෝරුව සේවා සංස්කරණ පුහුණු ආයතනයේදී පැවති පුහුණු වැඩසටහන, 2013.09.24 දින ගම්පොල උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ගොවීන් උදෙසා පැවති " අපනයන වෙළඳපොල සඳහා කිරි අල වගාව" පිළිබඳ පුහුණු වැඩසටහන, 2013.10.11 වන දින ගන්නෝරුව, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී නිකවැරටිය අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සඳහා "මුල් හා ආකන්ධ බෝග සඳහා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය" පිළිබඳ පුහුණු වැඩසටහන, සහභාගී වූ සියලුම දෙනා සඳහා තාක්ෂණික ප්‍රකාශන බෙදා හැරිණි. (සියලුම වැඩසටහන්හිදී 200ක් පමණ) ජාතික තරුණ සේවා සභාවේ ශිෂ්‍යයින් 4 දෙනෙකු මුල් හා ආකන්ධ බෝග වගාව පිළිබඳව පුහුණු කරනු ලැබීය.

### ගෙවතු වගාව

- ගෙවතු සැලසුම් කිරීම සහ සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන් 40 පැවැත්විණි. විවිධ සංවිධානයන්හි සාමාජිකයින් සහ වෙනත් ඉල්ලීම් පරිදි 944 දෙනෙකු පුහුණු කරනු ලැබූ අතර ගෙවතු වගා පිළිබඳ තාක්ෂණික ප්‍රකාශන ඔවුන් හට ලබාදුණි. ප්‍රභේද 7ක බීජ පැකට් 448ක් සහ පැළ 217ක් බෙදා හරිනු ලැබිණි. 18 දෙනෙකු සඳහා නලස්ථ එළවළු වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් 2ක් පවත්වනු ලැබිණි.
- 2013 වර්ෂය ගෙවතු වගාව පිළිබඳ රූපවාහිනී වැඩසටහන් 1ක් සහ පැළ තවාන් කළමනාකරණය පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 1ක් පවත්වනු ලැබිණි.
- ගොවි ක්ෂේත්‍ර පරීක්ෂාව සහ උචිත රෝපණ මාධ්‍ය පිළිබඳ පිළිවෙත් මාලාවන්, ගොවි විමසීම්වලට ලිපි මාර්ගයෙන් හෝ දුරකථන මාර්ගයෙන් පිළිතුරු සැපයීම ඇතුලු සන්නිවේදන සම්බන්ධ ක්‍රියාවලීන් සිදු කරනු ලැබීය. (ප්‍රතිලාභීන් සංඛ්‍යාව 250)

### මාධ්‍ය වැඩසටහන්

### ගුවන්විදුලි වැඩසටහන්

- නිවැරදි පොහොර භාවිතය - කඳුරට සේවය

# 2014 සැලසුම

## එළවළු අංශය

- වම්බටු, තක්කාලි, මාළුමිරිස්, කරවිල සහ වැටකොළුවල දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම
- බෝංචි, මෑ, දඹල වැනි විවෘත පරාගන ප්‍රභේද වැඩිදියුණු කිරීම
- සාම්ප්‍රදායික එළවළු බීජ නිෂ්පාදනය
- තක්කාලි, බටු, මෑ, වැටකොළු, කරවිල සහ දඹල අභිජනන බීජ නිෂ්පාදනය.
- දැනටමත් නිදහස් කළ F1 දෙමුහුම් ප්‍රභේදවල මව් ආරවල බීජ නිෂ්පාදනය
- දෙමුහුම් බීජ නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩිකිරීමට සහ උචිත කළමනාකරණ පිළිවෙත් මාලාවන් වැඩිදියුණු කිරීමට ක්‍රමෝපායික සහ මූලික පර්යේෂණ

## කීට විද්‍යා අංශය

- කෙසෙල් ගුල්ලාට එරෙහිව කෘමිනාශක පරීක්ෂාව
- කෘෂිකාර්මික යෙදවුම්, (පළිබෝධනාශක, පොහොර යනාදිය), පානීය ජලය, ආහාර ගුණාත්මක බව සහ තවමත් හේතුකාරකය හඳුනා නොගත් වකුගඩු රෝග අතර සම්බන්ධතාව පරීක්ෂාව
- මෑත කාලීනව කාලගුණික තත්ත්වයන් හා සම්බන්ධිතව කුකුබිට්සේ ශාකවල වෛරස් වාහක ගහනවල ගති විද්‍යාව අධ්‍යයනය කුඩිත්තා, සුදු මැස්සන්, ශාක කීඩෑවා සහ වැටකොළු, පතෝල,කරවිල වල පැළ මැක්කන්
- එළවළුවල මූල ගැටිති නෙමටෝඩාවන් හඳුනාගැනීම සහ කළමනාකරණය පිළිබඳ නිරීක්ෂණාත්මක අධ්‍යයනය
- වම්බටු රිකිලි සහ ඵල විදින්නා කළමනාකරණය උදෙසා *Trathala flavoobitalis* පරපෝෂිතයා ස්වභාවික තත්ත්වයන් යටතේ ගහනය වර්ධනය ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම.
- කුකුබිට්සේ ශාකවල ගොක් මැස්සා, *Lasioptera falcate* සහ paddle legged bug, *Leptoglossus* spp. පාලනය උදෙසා කාබරයිල් වෙනුවට යොදාගත හැකි විකල්ප කෘමිනාශක පරීක්ෂාව
- කුකුබිට්ස් බෝගවල Aulacophora කුරුමිණියා පාලනය කිරීම උදෙසා කාබ්රයිල් වෙනුවට විකල්ප කෘමිනාශක පරීක්ෂාව
- කාබනික ගොවිපල ක්ෂේත්‍රවල සහ ගෙවතුවල ගෝවා පළිබෝධකයන්ට එරෙහිව ක්ෂේත්‍රයේ ශාක පළිබෝධනාශක ඇගයීම
- පැපොල් පිටි මකුණා පාලනයේදී *Acerophagus papayae* පරපෝෂිතයාගේ ගහනය පැතිරීම සහ පශ්වාද් වර්ධන කාර්යක්ෂමතාව සමීක්ෂණය.
- කෙසෙල් ගුල්ලාට එරෙහිව කෘමිනාශක පරීක්ෂාව
- එළවළු පළිබෝධකයින්, එම පළිබෝධකයින්ගේ ස්වභාවික සතුරන් සහ පරාගකයින් හට සතුන්ට තෝරාගත් කෘමිනාශකවල විෂ මට්ටම බලපෑම, ශ්‍රී ලංකාවේ ප්‍රධාන එළවළු පළිබෝධකයින් කළමනාකරණය උදෙසා කාර්යක්ෂම සහ පාරිසරික හිතකර ක්‍රමෝපායන් සැලසුම් කිරීම
- පැපොල් පිටි මකුණා පරපෝෂිකයා *Acerophagus papayae* පශ්වාද් වර්ධන කාර්යක්ෂමතාව සමීක්ෂණය

## කෘෂිකාර්මික රසායන විද්‍යා අංශය

- කාබනික ගොවිතැනෙහිදී පෝෂක කළමනාකරණය
- කෙසෙල්වල පොටෑසියම් කළමනාකරණය
- අන්නාසි වල පොහොර කළමනාකරණය
- ශ්‍රී ලංකාවේ විවිධ බෝග වගා ක්‍රමයන්හිදී පාංශු සාරවත්බව ඇගයීමේ වැඩසටහන
- එළවළු අස්වැන්න කෙරෙහි නැනෝ පොහොරවල බලපෑම
- එළවළු බෝගවල පෝෂක බෑහැරලීම
- එළවළු බෝග සඳහා ක්ෂුද්‍ර පෝෂක ප්‍රතිචාර අධ්‍යයනය
- පාංශු පරීක්ෂණ පදනම් පොහොර නිර්දේශ නිදර්ශනයන්
- විවිධ පස් වර්ගවල පොස්රස් අවශේෂයන්ගේ බලපෑම
- ශ්‍රී ලංකාවේ සහල් වගාවේ cd ප්‍රමාණය අධ්‍යයනය
- පොහොර මගින් ලැබෙන cd එළවළු වල පැවතීම අධ්‍යයනය
- ශ්‍රී ලංකාවේ මැදරට අතරමැදි කලාපයේ එකතු කරගත් පසෙහි සහ එළවළුවල ශේෂ ලෝහ ප්‍රමාණය
- විවිධ පොහොර ද්‍රව්‍යවල ශේෂ ලෝහ ප්‍රමාණය

- තක්කාලි සඳහා PGRC හඳුනාගැනිම සහ වෙන් කිරීම
- එළවළු සඳහා N සැපයුම් ප්‍රභවයක් ලෙස N තිරකරන ක්ෂුද්‍රජීවීන් ගහනය වෙන්කිරීම සහ N සැපයුමේ කාර්යක්ෂමතාව
- Bacillus megatherium උපයෝගී කරගනිමින් P සපිරි කොම්පෝස්ට් සැකසීම
- මාළුමිරිස් මූලධරයෙහි ප්‍රයෝජනවත් ක්ෂුද්‍ර ජීවීන් ගහන හඳුනා ගැනීම

## ශාක ව්‍යාධිවේදය සහ බිම්මල් අංශය

- බැක්ටීරියා හිටුමැරීම සඳහා විදේශීය එළවළුවල දෙමුහුම් අභිජනන ආර පරීක්ෂාව
- බීජ මගින් පැතිරෙන වෛරස් සඳහා විදේශීය දෙමුහුම් එළවළු පරීක්ෂාව
- ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ වු ප්‍රධාන රෝග සඳහා එළවළු වල විදේශීය දෙමුහුම් පරීක්ෂාව
- කාබනික කෘෂිකර්මාන්තය යටතේ මාළුමිරිස් සහ මුකුණුවැන්න සඳහා *Trichoderma* සැකැස්ම සහ කොහොඹ බීජ ජල නිස්සාරකයේ යෙදීම මගින් සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත්මාලාවක් වැඩිදියුණු කිරීම
- නලස්ථව ගර්කින් සහ බෙල් පෙපර් සඳහා *Trichoderma* ක්ෂුද්‍ර ජීවීයාගෙන් සපිරි කොම්පෝස්ට්, ස්වභාවික බහුඅවයවීක සහ කොහොඹ බීජ ජල නිස්සාරක භාවිතය මගින් සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම
- ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ තක්කාලි සහ මිරිස් සඳහා *Trichoderma* ක්ෂුද්‍ර ජීවීයාගෙන් සපිරි කොම්පෝස්ට්, ස්වභාවික බහුඅවයවීක සහ කොහොඹ බීජ ජල නිස්සාරක භාවිතය මගින් සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම
- තක්කාලි සහ කොමඩුවල බීජ මගින් පැතිරෙන බැක්ටීරියා රෝග හඳුනා ගැනීම
- *Erwinia* sp මගින් මාළුමිරිස්වල කඳෙහි තුවාල ඇතිවීම පිළිබඳ අධ්‍යයනය
- රෝග හඳුනාගැනීම සහ උපදේශක සේවා
- මිදිවල පළිබෝධකයින් සහ රෝග කළමනාකරණය සහ බීජ රහිත මිදි ප්‍රභේදයේ ගෙඩියේ ප්‍රමාණය වැඩිකිරීම
- පැඟිරි බෝගවල පළිබෝධ සහ රෝග කළමනාකරණය උදෙසා සමෝධානික පළිබෝධ කළමනාකරණ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම
- වට්ටක්කාවල වෛරස් රෝග පාලනය උදෙසා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම
- පූර්ව හා පශ්චිම අංගමාරයට එරෙහිව දිලීරනාශක සැකසීම පිළිබඳ ඇගයීම
- කුකුබිට්සේ ශාකවල යටිපුස් රෝගයට එරෙහිව දිලීරනාශක සැකසීම පිළිබඳ ඇගයීම
- ලියාපදිංචි කර දැනට භාවිතයෙන් ඉවත්කර ඇති දිලීරනාශක නැවත පරීක්ෂා කිරීම
- ප්‍රධාන තක්කාලි වෛරස් අනුක හඳුනාගැනීම, ලක්ෂණීකරණය සහ කළමනාකරණය
- මාළුමිරිස් වල ඇතිවන ප්‍රධාන වෛරස් රෝග අනුක හඳුනාගැනීම, ලක්ෂණීකරණය සහ කළමනාකරණය
- ප්‍රතිරෝධී ප්‍රභේද තුළින් උද්‍යාන බෝගවල ෆයිටොප්ලාස්ම රෝග අනුක හඳුනාගැනීම සහ ලක්ෂණීකරණය සහ ප්‍රතිරෝධී ප්‍රභේද මගින් එහි කළමනාකරණය
- එළවළුවල රෝගයන්ට ප්‍රතිරෝධී ලක්ෂණ හා සෘජුවම සම්බන්ධ අනුක සලකුණු හඳුනා ගැනීම
- කෙසෙල් වල පැනමා රෝගයට ඇතිකරන *Fusarium oxysporum cubense* මගින් ආසාදනය නොවු

කෙසෙල් මොරොයියන් හඳුනාගැනීම සඳහා සංවේදී අනුක හඳුනාගැනීම් ක්‍රමයක් වැඩිදියුණු කිරීම
- මාළුමිරිස් හා මිරිස්වල ඇන්ත්‍රැක්නොස් රෝගය ඇති කරන *Colletotrichum* spp විවිධත්වය හඳුනාගැනීම සහ බෝග එකිනෙකින් ආසාදනය
- අස්වැන්න වැඩිකිරීම උදෙසා *Pleurotus ostreatus* මගින් උපස්ථරය ප්‍රවර්ධනය
- කොරියානු තාක්ෂණය
  - ගැනෝඩර්මා බිම්මල්
  - ෂිටේක් බිම්මල්
- වගාකිරීම උදෙසා උචිත බිම්මල් අභිජනන තාක්ෂණයන් උපයෝගීකොට වැඩි අස්වනු, හොඳ ගුණාත්මත තත්ත්වයෙන් යුත් නව බිම්මල් ප්‍රභේද වැඩිදියුණු කිරීම
- දේශීය කැළෑ බිම්මල් ප්‍රභේද පිළිබඳ සමීක්ෂණයන් සහ රැස් කිරීම
- සුකිරි බිම්මල් වගාව සඳහා ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම

## මුල් හා ආකන්ධ බෝග පර්යේෂණ අංශය

- බතල සහ මඤ්ඤොක්කාවල ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන් අඛණ්ඩලව පවත්වාගෙන යාම
- ස්ථාන 5කදී තෝරාගත් මඤ්ඤොක්කා ප්‍රභේද වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන්
- ස්ථාන 4කදී තෝරාගත් බතල ප්‍රභේදවල ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්
- බතල වල ඉහළ වියලි බර ප්‍රමාණයට සහ ඉහළ ලවණතාවවන්ට ඔරොත්තු දෙන CIP ආර වල ප්‍රභේද ඇගයීම
- තෝරා ගත් බතල ප්‍රභේදවල නියම කාලයට අස්වැන්න නෙලීම පිළිබඳ අත්හදා බැලීම
- නිර්දේශිත බතල, මඤ්ඤොක්කා, කිරි අල, කොලෝකේසියා, ඩයස්කොරියා සහ ඉන්නල ප්‍රභේද විවිධ සේවායෝජකයින් අතර බෙදාහැරීම උදෙසා මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- සියලුම මුල් සහ ආකන්ධ බෝගවල ජනකප්ලාස්ම නඩත්තුව
- නිදර්ශන භූමි, කේන්ද්‍රීය ඒකක, පුහුණු වැඩසටහන් යනාදිය මගින් මුල් හා ආකන්ධ බෝගවල නව වැඩිදියුණු කළ ප්‍රභේද ව්‍යාප්තිය සහ නිෂ්පාදන පිළිවෙත් මාලාවන් වැඩිදියුණුව
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය ආදර්ශ ගෙවත්ත නඩත්තුව
- ගෙවතු වගා සඳහා යෝග්‍ය/ උපයෝගී කරගත හැකි ඌන උපයෝජිත බෝග ප්‍රභේද රැස් කිරීම සහ නඩත්තුව
- ගෙවතු සැලසුම හා වැඩිදියුණුව පිළිබඳ පුහුණු වැඩමුළු
- නව නිෂ්පාදන ලෙස විසිතුරු මල් ආකාරයට උපයෝගීකර ගත හැකි වටිනාකමක් සහිත ආවේණික සහ දේශීය ශාක ප්‍රවර්ධනය
- තක්කාලි දෙමුහුම් ප්‍රභේද $CO_2$ වලින් සංතෘප්ත කිරීමේ ව්‍යාපෘති
- තක්කාලි ප්‍රභේද 2ක් සමග ටියුබලීක්ස් සමග අතුරු බෝග වගාව
- ශ්‍රී ලංකාවේ නලස්ථ තත්ත්වයන් යටතේ දී ජෑම් තක්කාලි ප්‍රභේද ඇගයීම
- සැල්සිලික් අම්ලය උපයෝගී කරගනිමින් තක්කාලි වල වර්ධනය වේගවත් කිරීම ඇගයීම
- තිබ්බටුවල මුල් ඇදුණු කඳ කැපුම් සංසන්දනය
- තිබ්බටුවල බීජ පැළ හා කඳ කැපුම් සංසන්දනය
- "ඉසුරු" කිරිඅල ප්‍රභේදයේ ගුණනය අධ්‍යයනය
- "පැළෑටි ජාන සම්පත් ඒකාබද්ධ කළමනාකරණ පද්ධති" ව්‍යාපෘතිය යටතේ ඩයස්කොරියා එකතුන් රැස් කිරීම, සංරක්ෂණය, ලක්ෂණීකරණය සහ ඇගයීම
- "පැළෑටි ජාන සම්පත් ඒකාබද්ධ කළමනාකරණ පද්ධති" ව්‍යාපෘතිය යටතේ ගෙවතු වගාව සඳහා උපයෝගී

කර ගත හැකි යෝග්‍ය ඌන උපයෝජිත බෝග ප්‍රභේදයන් රැස්කිරීම, සංරක්ෂණය, ලක්ෂණීකරණය සහ ඇගයීම

## ව්‍යාප්ති, ආර්ථික සහ දත්ත කළමනාකරණ අංශය

- ඉල්ලුම පරිදි තාක්ෂණික ප්‍රකාශ සැකසීමට සහාය වීම
- තාක්ෂණික ප්‍රකාශන ඉංග්‍රීසියට පරිවර්තනය
- බීජ නිෂ්පාදන වැඩසටහනට ආධාර වීම
- ඵලදායීතාව වැඩි කිරීම උදෙසා ගෙවතු වල කුඩා ප්‍රමාණයෙන් නළස්ථව වගා කිරීම
- අලුතෙන් බඳවාගත් පර්යේෂණ නිලධාරීන් සඳහා උද්‍යාන බෝග පිළිබඳව සේවා සංස්කරණ පුහුණු වැඩසටහන් (සති 2) සංවිධානය කෙරිණි. (3වන කණ්ඩායම)
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සම්පත් දායකයන්ගේ උපදෙස් මත තනි පුද්ගලයින්, උසස් අධ්‍යාපන ආයතන හට තාක්ෂණික සහය ලබා දීම.
- දත්ත කළමනාකරණය පිළිබඳ වගකීම අඛණ්ඩව දරනු ලබයි.

## කාර්ය මණ්ඩල ලයිස්තුව

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ(වැ.බ) | 1 |
| අතිරේක අධ්‍යක්ෂ(වැ.බ) | 2 |
| පර්යේෂණ නිලධාරී | 19 |
| කෘෂිකර්ම නිලධාරී | 1 |
| පරිපාලන නිලධාරී | 2 |
| ජ්‍යෙෂ්ඨ පුස්තකාලාධිපති | 2 |
| වැඩසටහන් සහකාර (කෘෂි) | 8 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 13 |
| ගොවිපල් ලිපිකරු | 3 |
| කෘෂිකර්ම උපදේශක | 30 |
| පර්යේෂණ සහකාර | 21 |
| පර්යේෂණ උපසහකාර | 10 |
| සංවර්ධන නිලධාරී | 05 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 08 |
| ගබඩාකරු | 01 |
| යාන්ත්‍රික ශිල්පී | 01 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| වඩුකරු | 01 |
| වැල්ඩින්කරු | 01 |
| විදුලි ශිල්පී | 01 |
| තණකොළ කපන්නා | 02 |
| ට්‍රැක්ටර්කරු | 02 |
| ජල පොම්ප ක්‍රියාකරු | 02 |
| මී මැසි නිදර්ශක | 01 |
| බද්ධකරු | 03 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| මුරකරු | 24 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| නුපුහුණු කම්කරු | 85 |
| **එකතුව** | **252** |

## 1.2.1 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නොරුව

උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන ආහාර පර්යේෂණ ඒකකයේ ප්‍රධාන කාර්යයන් අතරට පසු අස්වනු තාක්ෂණය පිළිබඳ පර්යේෂණ, නිෂ්පාදන බිහි කිරීම, බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන් වලින් ලද නියැදි වල ගුණාත්මය ඇගයීම සහ තාක්ෂණය පතුරුවාලීමේ කටයුතු අයත් වේ. එමෙන්ම, මෙම ඒකකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනෙකුත් බෝග පර්යේෂණ ආයතන, පළාත් කෘෂිකාර්මික ක්‍රමය, අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය සමඟ එක්ව තාක්ෂණය ජනනය කර බෙදා හැරීම සහ ආහාර නිෂ්පාදනය සඳහා වූ යන්ත්‍ර සූත්‍ර භාවිතය සම්බන්ධයෙන් වැඩසටහන් සිදු කරයි. මීට අමතරව, උපාධි අපේක්ෂකයින්ට සහ පශ්චාත් උපාධිය හදාරණ සිසුන්ට පසු අස්වනු හා සැකසුම් තාක්ෂණයේ විවිධ අංශ පිළිබඳව සිය පර්යේෂණ කටයුතු කිරීම හා පසු අස්වනු හා සැකසුම් තාක්ෂණයේ විවිධ අංශ පිළිබඳ පර්යේෂණ කටයුතු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා මග පෙන්වීම ලබා දේ.

### අයවැය

වාර්ෂික ප්‍රතිපාදන සහ විවිධ වැය ශීර්ෂ යටතේ දරන ලද වියදම් වගු අංක 1.2.1.1 හි දැක්වේ.

**වගු අංක 1.2.1.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 850,000 | 380,017 | 45 |
| පුනරාවර්තන | 2,183,000 | 2,083,105 | 95 |
| ව්‍යාපෘති 1 - තක්කාලි සඳහා පසු අස්වනු තාක්ෂණය හැසිරවීම පිළිබඳ අත්පොත සකස් කිරීම | 955,000 | 374,693 | 39 |
| ව්‍යාපෘති 2 - ආහාර සැකසුම් කිරීමේ පුහුණුව ලබාදීමෙන් ග්‍රාමීය ගොවි ජනතාවගේ අදායම ඉහළ නැංවීම | 7,459,800 | 1,478,686 | 20 |
| **එකතුව** | **11,448,400** | **4,316,501** | **38** |

### ප්‍රගතිය

#### කාර්යඵලය

- පාංශු ප්‍රතිකර්ම ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත පොටෑසියම් ප්‍රමාණයෙහි දෙගුණයක් යෙදූ විට අඹ වල ඇන්ත්‍රැක්නෝස් සහ නටු අග කුණු වීම සහ ඇඹුල් කෙසෙල් වලට ඇන්ත්‍රැක්නෝස් රෝගය වැළදීම අඩු විය. මෙම ප්‍රතිකර්මය මගින්ම

පැපොල්වල පසු අස්වනු රෝග අවම කරන බව අනාවරණය විය.

- පාංශු ප්‍රතිකර්මයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත පොටෑසියම් ප්‍රමාණයෙහි දෙගුණයක් යෙදූ විට ද්‍රාව්‍ය ද්‍රව්‍ය අන්තර්ගතය/ බ්‍රික්ස් අගය සහ ආම්ලිකතාව අඩු කරමින් වැල් දොඩම් වල ගුණාත්මය ඉහළ නැංවිය.
- පාංශු ප්‍රතිකර්මයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත පොටෑසියම් ප්‍රමාණයෙහි දෙගුණයක් යෙදූ විට සෙල්සියස් $12^0$ යටතේ නැවෙන් අන්නාසි ප්‍රවාහනය කිරීමේදී අභ්‍යන්තරය දුඹුරු පැහැවීම අවම විය.
- කාමරංගා අවම සැකසුම් කිරීම සඳහා ගෙඩිය කොළ පාටට හුරු කහ පැහැ අවස්ථාවේදී පූර්ව ප්‍රතිකර්මයක් ලෙස ඇසිටික් ඇසිඩ් 0.5%ක් සහ සිට්‍රික් ඇසිඩ් 1%ක් යෙදීම යෝග්‍යය. පලතුරු සහ එළවළු අවම සැකසුම් කිරීම සඳහා "නැවුම් බව උපරිම වශයෙන් රඳවා ගත හැකි" ඇසුරුම් ද්‍රව්‍ය හඳුන්වා දිය හැකි විය.

## සොයා ගැනීම් සහ නිෂ්පාදන බිහි කිරීම

- බඩඉරිඟු, කුරක්කන් සහ සෝයා පිටි මිශ්‍රණ මගින් පෝෂණ ගුණයෙන් ඉහළ රොටී සහ පිට්ටු වැනි දේශීය ආහාර නිපදවිය. මෙම නිෂ්පාදනය විටමින් A , කැල්සියම්, යකඩ සහ ප්‍රෝටීන් වලින් පොහොසත්ය.
- බේකරි සහ කේක් නිෂ්පාදන සඳහා යොදා ගන්නා ඇප්‍රිකොට් ජෙල් හා සමාන ජෙල් එකක් කැකිරි වලින් නිපදවිය.
- ටොම් EJC අඹ යොදාගෙන නිෂ්පාදනයක් බිහි කරන ලදි.
- දිය ලබු යොදා ගනිමින් ටොෆී, ක්ෂණික ආහාර පාන, චට්නි, ජෑම්, පිට්ටු, රොටී, කොන්ජි නිපදවිය.
- ඩ්‍රැගන් ෆෘට් වලින් ජෑම්, ක්ෂණික ආහාර පාන සහ කෝඩියල් නිපදවිය.
- බෙලි වලින් ටොෆී සහ චට්නි නිපදවිය.

## සංවර්ධන කටයුතු

- කොරියානු රජයෙන් අරමුදල් සම්පාදිතව "පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම" යන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. ආහාර පර්යේෂණ ඒකක පරිශ්‍රයෙහි සුළු පරිමාණයේ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කෙරිණි. සුළු සහ මධ්‍යම පරිමාණයේ සැකසුම්කරුවන් සහ ගොවීන් සඳහා ආහාර සැකසුම් කිරීම පිළිබඳ පුහුණු කිරීම් පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත් විය.
- 50%ක සහනාධාරයක් ලබා දෙමින් සැකසුම්කරුවන් අතරේ විශාල ප්ලාස්ටික් පෙට්ටි (339ක්), කාඩ්බෝඩ් පෙට්ටි (600ක්), වර්තනාංකමාන (05ක්), ජූස් ඩිස්පෙන්සර් (01ක්) බෙදා දෙන ලදි.
- පලතුරු සහ එළවළුවල පසු අස්වනු හානිය අවම කිරීම සම්බන්ධයෙන් තොග වෙළඳුන්, ප්‍රවාහනකරුවන්, එකතු කරන්නන්, සිල්ලර වෙළඳුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විය.
- "තක්කාලි සඳහා පසු අස්වනු තාක්ෂණය පිළිබඳ අත්පොත සකස් කිරීම" යන ව්‍යාපෘතිය යටතේ එකී අත්පොත මුද්‍රණය කර බෙදා හරින ලදි.
- ආහාර සැකසුම් කිරීම සහ පසු අස්වනු තාක්ෂණය හඳුන්වාදීම සඳහා මල්ටි මීඩියා මගින් සහ ප්‍රායෝගික පුහුණු සැසි මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ අතර පෝස්ටර් සහ අත්පත්‍රිකා බෙදා හරින ලදි.
- ශ්‍රවණාගාරයේ වහළය සකස් කිරීමේ සහ රසායනාගාරයේ බිම ටයිල් කිරීමේ කටයුතු සාර්ථකව නිම කෙරිණි.

- ආහාර පර්යේෂණ ඒකකයේදී රුහුණු, පේරාදෙණිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල සිසුන් 7 දෙනෙක් පුහුණු කළ අතර විද්‍යාපති සිසුන් දෙදෙනෙක් සිය මාස 3 - 4 පර්යේෂණ ව්‍යාපෘති සම්පූර්ණ කරන ලදි.
- ඩිප්ලෝමා සිසුන් හත් දෙනෙක්, හාඩි තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ සිසුන් තිදෙනෙක්, මහනුවර තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සිසුන් හය දෙනෙක් සිය මාස 03 -06 කාර්මික පුහුණුව සාර්ථකව සම්පූර්ණ කරන ලදි.
- යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලැබූ ‘දැයට කිරුළ’, ‘ගොවි සතිය’, ‘පලතුරු දැක්ම’,‘ව්‍යාපාර සායනය’ සඳහා සක්‍රියව දායක වූ අතර කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් මෙහෙය වන ලද තරුණ කෘෂිකර්ම ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ වැඩමුළුවට සහභාගී විය. මහවැලි අධිකාරිය සඳහා වඩාත් යෝග්‍ය කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳවත් පාසැල් සහ වෙනත් රජයේ ආයතන වලදී ප්‍රදර්ශන ඉදිරිපත් කිරීම් සිදු කළ අතර පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසුම් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමක් සිදු කෙරිණි.

## තාක්ෂණය පතුරුවාලීම

- ආහාර පර්යේෂණ ඒකකය රසායනාගාර විශ්ලේෂණ පහසුකම් අඛණ්ඩවම ලබා දුන් අතර වසර තුළදී නිෂ්පාදන වල ගුණාත්මක බව තහවුරු කර ගැනීම සඳහා පෞද්ගලික අංශයෙන් ලද ක්ෂණික බීම, චට්නි, කෝඩියල්, ජෑම්, විජලනය කළ එළවළු, පේස්ට්, බයිට්, ෆ්‍රෙන්ච් ෆ්‍රයි, කිරි නිෂ්පාදන සහ සෝයා නිෂ්පාදන වල නියැදි කීපයක විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදි.
- එළවළු නියැදි 330ක, පලතුරු නියැදි 39ක සහ බතල නියැදි 18ක වාර්තා අභිජනනකරුවන් වෙත නිකුත් කෙරිණි. කුළු බඩු නියැදි 70ක, පිටි නියැදි 70ක, සැකසුම් කළ පලතුරු සහ එළවළු නියැදි 75ක, කිරි නිෂ්පාදන 07ක, බයිට් නියැදි 07ක, සෝයා නිෂ්පාදන 07ක, කිතුල් පැණි සහ මී පැණි නියැදි 06ක වාර්තා නිකුත් කළ අතර ආහාර සැකසුම් කිරීමේ වැඩසටහන් 32ක් සඳහා පුහුණු සහතික නිකුත් කරන ලදි.
- කෘෂි ව්‍යවසාය සංවර්ධන සහ තොරතුරු සේවයේ අනුග්‍රහය ලද පුහුණු - පලතුරු සහ එළවළු සැකසුම් කිරීම සහ සහල් පාදක නිෂ්පාදන පිළිබඳව පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් යුතුව පුහුණු වැඩසටහන් 02ක් සිදු කරන ලදි.
- පෞද්ගලික අංශයේ සංවිධාන, විදාතා මධ්‍යස්ථාන, කෘෂිකර්ම අමාත්‍යාංශය, වාණිජ මණ්ඩලය, කර්මාන්ත දෙපාර්තමේන්තු, ගුරු පුහුණු ආයතන, පාසැල්, කෘෂිකර්ම උපදේශකවරුන්, ඩිප්ලෝමා සිසුන් සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා පලතුරු සහ එළවළු පිළිබඳ පසු අස්වනු තාක්ෂණය සහ සැකසුම් කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්විය.
- පූර්ව සහ පසු අස්වනු තාක්ෂණය පිළිබඳ වැඩසටහන් 10ක් (පුද්ගලයින් 310ක්), ඇසුරුම් කිරීම පිළිබඳ වැඩසටහන් 14ක් ( පුද්ගලයින් 375ක්) සහල් පාදක නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන් 11ක් (පුද්ගලයින් 25ක්) පලතුරු සහ එළවළු සැකසුම් කිරීම පිළිබඳ වැඩසටහන් 131ක් (පුද්ගලයින් 1125ක්), කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ වැඩසටහන් 37ක්, රස කැවිලි පිළිබඳ වැඩසටහන් 1ක්, බයිට් සහ පේස්ට් පිළිබඳ වැඩසටහන් 25ක්, බේකරි නිෂ්පාදන පිළිබඳ වැඩසටහන් 03ක් ආහාර පර්යේෂණ ඒකක පරිශ්‍රයේ සහ

වෙනත් ආයතන වලදී සිදු කරන ලදි. පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසුම් කිරීම පිළිබඳ කෘෂිකර්ම විද්‍යාල සිසුන් 125ක්ද පසු අස්වනු තාක්ෂණය, තත්ත්වය විශ්ලේෂණය කිරීම සහ ආහාර සැකසුම් කිරීමේ ක්‍රම පිළිබඳව විශ්වවිද්‍යාල සිසු කණ්ඩායම් 04ක්ද (39 දෙනෙක්) පුහුණු කළ අතර ආහාර සැකසුම් කිරීම පිළිබඳව විද්‍යා වැඩසටහන් 03ක්ද පැවැත් විය. එමෙන්ම, පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසුම් කිරීම පිළිබඳව පාසැල් ගුරුවරුන් සහ උපදේශකවරු කණ්ඩායම් 14ක්ද (445 දෙනෙක්) පුහුණු කරන ලදි.

## 2014 වසර සඳහා සැලැස්ම

- ටොම් EJC ප්‍රභේද යොදා ගනිමින් කල්තබා ගත හැකි අඹ නිෂ්පාදන බිහි කිරීම.
- ඩ්‍රැගන් ෆෘට් නිෂ්පාදන බිහි කිරීම
- දේශීය ආහාර සකස් කිරීම සඳහා බඩඉරිඟු, කුරක්කන් සහ සෝයා පිටි මිශ්‍රණයක් සකස් කිරීම
- දිය ලබු ආශ්‍රිත නිෂ්පාදන බිහි කිරීම
- අමු මිරිස් නිෂ්පාදන බිහි කිරීම (කැන් කිරීම, අමු මිරිස් පේස්ට්, සෝස්, මිරිස් කුඩු,'කිම්චි' මුහුන් එකතු කරන ලද නිෂ්පාදනයක්)
- ආහාර සැකසුම් කිරීමේදී බඩඉරිඟු පිටි වෙනුවට මඤ්ඤොක්කා පිටි හඳුන්වා දීම.
- බිස්කට් නිෂ්පාදන සඳහා සුදුසු මඤ්ඤොක්කා ප්‍රභේදයක් හඳුන්වා දීම
- වට්ටක්කා පාදක පෝෂ්‍ය ගුණයෙන් පිරි බීම සහ කුකීස් නිෂ්පාදනය
- සෝයා පාදක ආහාර නිෂ්පාදන බිහි කිරීම
- එළකිරි සහ සෝයා එක් කර නිෂ්පාදනයක් බිහි කිරීම

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධානි | 01 |
| පර්යේෂණ නිලධාරි | 02 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 02 |
| වැඩසටහන් සහකාර | 01 |
| සංවර්ධන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 02 |
| රසායනාගාර උප සහකාර | 03 |
| රියදුරු | 02 |
| විදුලි ශිල්පී | 01 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| කම්කරු | 03 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 09 |
| මුරකරු | 02 |
| **එකතුව** | **33** |

## 1.2.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල

මධ්‍යනාය මුහුදු මට්ටමින් මීටර් 1400ක් උසින් පිහිටා ඇති උඩරට අතරමැදි කලාපයේ පිහිටා ඇති බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය ඌව ප්‍රදේශයේ සහ සබරගමුව පළාතේ බලංගොඩ ප්‍රදේශයේ වගා කෙරෙන කෘෂිකාර්මික බෝග වල අස්වැන්න සහ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා යෝග්‍ය තාක්ෂණික ක්‍රම බිහි කිරීමේ වගකීම දරන ප්‍රධාන මධ්‍යස්ථානය වන අතර එයට පැවරී ඇති ප්‍රදේශ වන $IU_2$ ,$IM_2$, $IM_3$, $WM_3$, $IL_2$ සහ $WM_3$ යන කෘෂි කාලගුණික කලාප ආවරණය කරයි. මෙම මධ්‍යස්ථානය ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය යටතේ ක්‍රියාත්මක වන අතර එහි උප මධ්‍යස්ථානයක් රහංගල පිහිටා ඇත. පර්යේෂණ කටයුතු වලට අමතරව අර්තාපල්, පලතුරු සහ මල් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ බෙදා හැරීම ඇතුළු තාක්ෂණය පතුරුවාලීමේ වැඩසටහන් සහ කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් ගණනාවක්ම මෙම මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබයි.

### අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන සහ දරන ලද වියදම් පහත දැක්වේ.

**වගු අංක 1.2.2.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශිර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| පුනරාවර්තන | 11,743,573 | 11,250,053 | 96 |
| මූලධන | 28,183,000 | 2,557,849 | 09 |
| **ව්‍යාපෘති - කලාපීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල** | | | |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - බෝංචි | 400,000 | 393,639 | 98 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - අර්තාපල් | 533,900 | 464,541 | 87 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - පැඟිරි | 175,000 | 149,187 | 85 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - කෙසෙල් | 50,000 | 51,912 | 104 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - පැඟිරි සමෝධානික පළිබෝධ කළමනාකරණය | 50,000 | 49,645 | 99 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| දෙමුහුම් තක්කාලි | 150,000 | 149,356 | 100 |
| එළවළු - KOPIA | 200,000 | 194,181 | 97 |
| පස - KOPIA | 446,800 | 293,033 | 66 |
| පලතුරු ගම්මාන සංවර්ධනය | 500,000 | 431,746 | 86 |
| පටක රෝපණය | 9,500,000 | 3,560,341 | 37 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - මල්වගාව | 1,227,100 | 1,214,855 | 99 |
| **ව්‍යාපෘති - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, රහංගල** | | | |
| පලතුරු ගම්මාන සංවර්ධනය | 500,000 | 498,532 | 99 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - පැඟිරි | 100,000 | 92,614 | 93 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - බෝංචි | 200,000 | 195,658 | 98 |
| **එකතුව** | **53,959,373** | **21,547,142** | **40** |

## ප්‍රගතිය

### බෝග වැඩිදියුණු කිරීම

- බලාපොරොත්තු තැබිය හැකි මෑ ආර 15ක් උසස් අස්වනු අත්හදා බැලීම් මගින් ඇගයීමට ලක් කළ අතර උසස් ආර 05ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා වරණය කර ගන්නා ලදි.
- කොරියානු සම්භවයක් සහිත හොඳින් ක්‍රියාකාරි වූ රාබු ප්‍රභේද දෙකක් (Supergiljo, Meotjinmatdongum) ගෝවා ප්‍රභේද දෙකක් (Woori, Yeroeummat) සහ සලාද කොළ ප්‍රභේද දෙකක් (Cheongchima, Hanbatjeokchima) ගොවි ක්ෂේත්‍ර වලදී මහා පරිමාණයෙන් ආදර්ශනය කිරීම සඳහා වරණය කර ගන්නා ලදි.
- වම්බටු ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා දේශීය වම්බටු එකතුන් 93ක් එක්රැස් කර ගන්නා ලදි.
- වෙරිමෝයා, වැලි අනෝදා, සැපදිල්ලා, මසන්, නෙල්ලි, ජම්බු, ගල්සියඹලා, කරඹ ආදී ඌන භාවිත පලතුරු වගා ප්‍රභේද 31කින් සමන්විත පලතුරු උයනක් ස්ථාපිත කරන ලදී.
- රහංගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී 'නිව් කුරෝඩා' නැමැති විදේශීය කැරට් ප්‍රභේදය සමඟ අස්වනු අත්හදා බැලීම සඳහා FGB 1301 නව කැරට් ආර බීජ ගුණනය කිරීමට යොදා ගන්නා බිම් කට්ටිවල ස්ථාපිත කරන ලදි.

### ශෂ්‍ය විද්‍යාව

- වගාව ආරම්භ කර දින 65-70ක් ගත වූ පසු ලංකා කැරට්වල අස්වනු නෙලීම වඩාත් යෝග්‍ය බැව් සිදු කළ අත්හදා බැලීම් ප්‍රතිඵල මගින් අනාවරණය විය.

- විවෘත ක්ෂේත්‍රයේදී සහ ආරක්ෂිත ගෘහ තුළදී බීජ නිෂ්පාදනය කිරීම සඳහා 5 -20 mm (විෂ්කම්භය) ප්‍රමාණයේ කුඩා අර්තාපල් ආකන්ද වඩාත් යෝග්‍ය බැව් අනාවරණය විය. රෝපණය කිරීමට පෙර කුඩා ආකන්ද ශ්‍රේණිගත කිරීම සහ ඒකාකාරී වගාවක් ලබා ගැනීමට සහ වගා පිළිවෙත් පහසුවීම සඳහා වැලිතවාන් කළමනාකරණය කිරීම නිර්දේශ කළහැක.
- කබානික වගාව යටතේ ගෝවා වගා කිරීම සඳහා පත්‍ර මතට ඉසීමට යෝග්‍ය කාබනික පොහොරක් හඳුනා ගැනිණි.

## පැළෑටි ආරක්ෂණය

- අර්තාපල් සහ තක්කාලිවල පසු අංගමාරය පාලනය කිරීම සඳහා ආනයනය කෙරෙන ෆ්ලුඅසිනම් (500 g/L Sc) දිලීරනාශකය නිර්දේශ කරන ලදි.
- වර්ෂාව ආරම්භ වීමට සති 2 - 3කට පෙර ටෙබුකොනොසෝල් (250 g/L Ec) ඉසීමෙන් (ස්ප්‍රේ කිරීමෙන්) පැඟිරි ශාකවලට වැළදෙන කඳ රෝස පැහැවීමේ රෝගය පරීක්ෂා කිරීම.
- සැන්තමොනාස් කැම්පෙස්ට්‍රිස් ((xanthomonas campestris) (ගෝවාවල කළු කුණුවීමේ ව්‍යාධිජනකය)) බැක්ටීරියාව වර්ධනය වීම යටපත් කිරීමේ හැකියාව කසුගමයිසින් (Kasugamycin) (20 g/L Ec) සතු බැව් රසායනාගාර පරීක්ෂණ මගින් අනාවරණය විය.
- ගෝවාවලට ගඳා මූල රෝගය වැළඳීම යටපත් කිරීම සඳහා ෆ්ලුඅසිනම් (500 g/L Sc) යොදා ගත හැකිය. (මූලික පරීක්ෂණ)
- බෝංචිවලට වැළදෙන රෝග දුරු කිරීම සඳහා පයිරක්ලොස්ට්‍රොබින් හෝ ටෙබුකොනොසෝල් යෙදීමෙන් අනතුරුව වරින්වර ක්ලෝරො තැලොනිල් යෙදීම යෝග්‍ය වූ අතර එමගින් දිලීර වලට ප්‍රතිරෝධිතාව වර්ධනය වීමද අඩු කෙරේ.
- වැල් බෝංචිවලට වැළදෙන ඇන්ත්‍රැක්නෝස්, කෝණාකාර පත්‍ර පුල්ලි රෝගය සහ මලකඩ රෝගය ෆ්ලුට්‍රිෆොල් (0.5 ml / L) දිලීර නාශකය මගින් කාර්යක්ෂමව පාලනය කෙරේ.
- ලියාපදිංචි කිරීම කල් ඉකුත් වූ දිලීර නාශක (ක්ලෝරොතැලොනිල්, මැන්කොසෙබ් සහ ප්‍රොපිනෙබ්) නැවත පරීක්ෂාවට ලක් කළ අතර මෙම දිලීර නාශක තක්කාලි වල පසු අංගමාරයට එරෙහිව මනාව ක්‍රියාකාරී වන බව අනාවරණය විය.
- පෙබරවාරි මාසයේ ස්ථාපිත කරන ලද වැල් බෝංචි වගාවන්ගේ සුදු මැස්සා ගහනය ඉතා අඩු මට්ටමක විය. අගෝස්තු මාසයේදී සාමාන්‍ය ක්ෂේත්‍ර ගහනය ඉහළම මට්ටමක පැවති බැව් වාර්තා විය.
- බොහොමයක් ලියාපදිංචි මයිටා නාශක වලට ප්‍රතිරෝධී මයිටා ගහන පහළවීමේ හැකියාවක් පවතින බව මූලික අධ්‍යයන මගින් අනාවරණය විය.
- පරාවර්තනය කරන වසුන් මගින් තක්කාලි වගාවේ කුඩිත්තන්ගේ ගහනය සාර්ථකව පහළ දැමූ අතර ඉහළ අස්වැන්නක්, වැඩි මල් ප්‍රමාණයක් සහ ඵලවලු ඉහළ ද්‍රාව්‍ය ද්‍රව්‍ය අන්තර්ගතයක් ලබා දෙන ලදි.
- ගෝවා වල දියමන්ති කළු සලඹයා සහ වැල් බෝංචි වල සුදු මැස්සා සහ පැළ මැක්කා පාලනය කිරීමට පිළිවෙළින් ලූෆෙනුරොන් 5%EC සහ ඇසිටැමිප්‍රිඩ් 200 SP නිර්දේශ කරන ලදි.

## උද්‍යාන බෝග වගාව

- බිබිලේ පැණි දොඩම්වල බද්ධ කළ පැළ බිහි කිරීම සඳහා හීන් නාරං දඬු කැබලි යොදා ගත හැකි බව අත්හදා බැලීම් ප්‍රතිඵල මගින් අනාවරණය විය.

- වාණිජ වගාව සඳහා ජපන් ජමනාරං ප්‍රභේද තුනක් 2013 වසරේදී නිකුත් කරන ලදි.

## පටක රෝපණය

- පෙයාර්ස් නලස්ථව මුල් ඇද්දීම සහ රෝපිත ස්ථාපිත කිරීම සාර්ථකව සම්පූර්ණ කළ අතර මුල් ඇද්දවීම සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයන සිදු කෙරේ.
- විවිධ පූර්ව ශාක කොටස් යොදා ගනිමින් ජර්බෙරා නලස්ථව ප්‍රචාරණය කිරීම සඳහා ප්‍රශස්ත තත්ත්වයක් හඳුන්වා දීම සඳහා අත්හදා බැලීමක් සිදු කළ අතර රිකිලි අග්‍රස්ථ යොදා ගනිමින් රෝපිත සාර්ථකව ස්ථාපිත කෙරිණි.
- BAP මිලියනයකට කොටස් 6ක් යෙදීමෙන් ජර්බෙරා වල අන්තර්ජීව මොරෙයි නිෂ්පාදනය වැඩි විය.

## මල් වගාව

- තත්ත්වයෙන් උසස් කැපූ රෝස නිෂ්පාදනය සඳහා පැළ ඝනත්වය වර්ග මීටරයකට පැළ 11කින් (30 x 30 cm) යුතුව රෝපණය කිරීම යෝග්‍ය වේ.
- ජර්බෙරා වගාවේ මල් නිෂ්පාදනය සහ ගුණාත්මක බව කෙරෙහි පත්‍ර ඉවත් කිරීමෙන් සැලකිය යුතු බලපෑමක් ඇති නොකෙරේ.
- දිවා කාලයේ දීර්ඝතාව හැසිරවීම මගින් කපුරු වල මල් පිපීම විධිමත් කළ හැකි අතර කෘත්‍රිමව ආලෝකය ලබාදීම සඳහා යෝග්‍ය කාල සීමාව පිළිබඳව සොයා බැලීම සඳහා අත්හදා බැලීම් සිදු කෙරේ.
- කපුරු මල් නිෂ්පාදනය සඳහා ගිබරලික් ඇසිඩ් සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති කරයි.

## පාංශු විද්‍යාව

- අර්තාපල් බීජ නිෂ්පාදනයේදී නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් යෙදූ විට පැළයකට ආකන්ද ගණන, ආකන්ද බර, ආකන්දයේ ගුණාත්මය සහ අනෙකුත් බීජ ගුණාත්මක පරාමිතීන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.
- ආරක්ෂිත තත්ත්වයන් තුළ පස් සහිත සහ පස් රහිත මාධ්‍ය වල $G_0$ බීජ අර්තාපල් නිපදවීම සඳහා යෝග්‍ය පොහොර කළමනාකරණ ක්‍රමෝපායන් හඳුනා ගැනිණි.
- හරිතාගාර බෝග සඳහා නිෂ්පාදන පිරිවැය අවම කිරීමට නව පොහොර කළමනාකරණ ක්‍රමෝපායන් (ඇල්බර්ට් ද්‍රාවණයට විකල්පයක් ලෙස) බිහි කෙරිණි.
- අර්තාපල් පූර්ව මූලික බීජ නිෂ්පාදනය කිරීම සඳහා සරල ආකෘතියක් හඳුන්වා දුණි.

## සේවා

### අභිජනක බීජ නිෂ්පාදනය

- "බණ්ඩාරවෙල ග්‍රීන්" වැල් බෝංචි ප්‍රභේදයෙන් කි.ග්‍රෑ. 52.5ක්, බලංගොඩ නිල් (කි.ග්‍රෑ. 150ක්) සහ 'වෙඩ්' පඳුරු බෝංචි ප්‍රභේදයෙන් කි.ග්‍රෑ. 3.7ක් වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය මගින් සහතික කරන ලද අභිජනක බීජ සහ හාතිය තක්කාලි ප්‍රභේදයෙන් (P3 - HT 2121:1007g සහ P4 තිළිණ : 508gක්) මාපිය බීජ රෝපණ ද්‍රව්‍ය නිපදවන ලදි.

### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- පැණි දොඩම් පැළ (බිබිල ස්වීට්, ආරෝග්‍යා සහ සිසිල) 4400ක්, රහංගල ජමනාරං පැළ 500ක්, ජැපනීස් ඔරේන්ජ් පැළ 300ක්,

කාමරංගා සහ පේර පැළ 100 බැගින්, අලිපේර පැළ 80ක්, දෙළුම් පැළ 50ක්, ස්ට්‍රෝබෙරි පැළ 1897ක්, ජර්බෙරා පැළ 935ක්, ඇන්තූරියම් පැළ 99ක් සහ කපුරු පැළ 21ක් බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී නිපදවිය.

- බිබිල ස්වීට් බද්ධ පැළ 6000ක් සහ රහංගල ජමනාරං බද්ධ පැළ 1100ක් රහංගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී නිපද විය.

## පාංශු පරීක්ෂණ පාදක පොහොර

### නිර්දේශ කිරීමේ වැඩසටහන

ගොවිපළ නියැදි 197ක් සහ පර්යේෂණ ක්ෂේත්‍ර නියැදි 502ක් සඳහා පාංශු පරීක්ෂණ පාදක පොහොර නිර්දේශ ලබා දෙන ලදි.

## තාක්ෂණය පතුරුවාලීමේ කටයුතු

- ඌව සහ සබරගමුව පළාත්වල පවත්වන ලද පළාත් තාක්ෂණික වැඩ කාණ්ඩායම් රැස්වීම් 4කට සහ තාක්ෂණික පුහුණු කිරීම් (පූර්ව - කන්නමය) කීපයකට කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීන් සහභාගී විය.
- විවිධ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ සහ ආරක්ෂිතව පළිබෝධ නාශක භාවිතා කිරීම, නිවැරදි පොහොර භාවිතය සහ අනිසි පොහොර භාවිතයෙන් සෞඛ්‍යයට සහ පරිසරයට ඇති වන අවදානම පිළිබඳව ගොවීන්, විශ්වවිද්‍යාල, පාසැල් සහ අනෙකුත් රජයේ සංවිධානවල පුද්ගලයන් 3000කට වැඩි පිරිසකට පුහුණු වැඩසටහන් පැවැත්විය.
- එළවළු, පලතුරු, මල් බෝග සහ අර්තාපල් වගා කරන ගොවීන්ට පළිබෝධ සහ රෝග කළමනාකරණය කිරීම පිළිබඳ උපදෙස් ලබා දෙන ලදි.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

### එළවළු

- නව එළවළු ප්‍රභේද (වැල් සහ පඳුරු බෝංචි, වම්බටු, මාළුමිරිස්, කැරට් සහ අර්තාපල්) වැඩිදියුණු කිරීම.
- විදේශීය එළවළු ප්‍රභේද (රාබු, චීන ගෝවා, සලාද කොළ, තක්කාලි සහ බෙල් පෙපර්) ඇගයීම.
- අභිජනක බීජ නිෂ්පාදනය (වැල් බෝංචි - බණ්ඩාරවෙල ග්‍රීන්, කැප්පෙටිපොල නිල්, බලංගොඩ නිල්; පඳුරු බෝංචි - වේඩ් සහ ලංකා කැරට්)
- හාතිය තක්කාලි ප්‍රභේදයේ මාපිය බීජ නිෂ්පාදනය.
- බෙල් පෙපර් සහ තක්කාලි පසු අස්වනු හානිය අවම කිරීම සඳහා තාක්ෂණික ක්‍රම
- RGC 1301 යන නව කැරට් ආර සම්බන්ධයෙන් පොහොර යෙදීම් සහ පරතර තැබීමේ අත්හදා බැලීම්.

### අර්තාපල්

- බීජ අර්තාපල් සඳහා නව ගබඩාකරණ ක්‍රම සහ සුප්තතාව බිඳලීමේ තාක්ෂණික ක්‍රම බිහි කිරීම.
- නව රොපණ ද්‍රව්‍ය නිෂ්පාදන ක්‍රම හඳුනා ගැනීම (NFT තාක්ෂණය)

### උද්‍යාන බෝග

- ඇපල් වගාවේ අස්වැන්න සහ එලයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ඇපල් ශාක පුහුණු කිරීමේ ක්‍රම ඇගයීම.
- පැෂිරි වගාවන්හි එල වල ගුණාත්මක බව කෙරෙහි ග්‍රාහකය මගින් ඇති වන බලපෑම ඇගයීම.
- උඩරට අතරමැදි කලාපය සඳහා පොයාර්ස්, ඇපල් සහ නෙක්ටරින් ඇගයීම.

## පැළෑටි ආරක්ෂණය

- එළවළු, පලතුරු, අර්තාපල් සහ මල් බෝග වලට වැළදෙන රෝග සහ කෘමි පළිබෝධ සඳහා දිලීර නාශක සහ කෘමි නාශක පරීක්ෂා කර බැලීම.
- බෝංචි වගාවට වැළදෙන මුල් කුණුවීමේ රෝගය කළමනාකරණය කිරීම.
- මාළුමිරිස් වගාවට වැළදෙන මුල් කුණුවීමේ රෝගය කළමනාකරණය කිරීම.
- මාළුමිරිස් වගාවට වැළදෙන රෝග වල තීව්‍රතාවය සහ අස්වැන්න කෙරෙහි පැළ අතර පරතර තැබීමෙන් ඇතිවන බලපෑම.
- සුදු මලකඩ රෝගය (puccinia horiana) සම්බන්ධයෙන් කපුරු වගා ප්‍රභේදය ඇගයීම.
- පසු අංගමාර රෝගය පිළිබඳ පුරෝකථන ආදර්ශන කීපයක මූලික සප්‍රමාණකරණය.
- බෝංචි වගාවේ පත්‍ර රෝග සඳහා දිලීර නාශක ස්ප්‍රේ කිරීමේ කාල සටහනක් සකස් කිරීම.
- ගෝවා වගාවේ ක්ෂුද්‍ර ශාක ප්‍රජාව සහ පත්‍ර රෝග කෙරෙහි කාබනික නිස්සාරණ යෙදීමෙන් ඇතිවන බලපෑම තක්සේරු කිරීම.
- සුළු පරිමාණයේ ගබඩාවල අර්තාපල් ආකන්ද සලඹයාට (phthorimaea operculella) එරෙහිව ස්වාභාවික විකර්ශන ඇගයීම.
- බදුල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් කෘෂිකර්ම උපදේශක කලාපවල වී වගාවට වැළදෙන මූල ගැටිති නෙමටෝඩා (Meloidogune graminicola) ආසාදනය සම්බන්ධයෙන් සමීක්ෂණය කිරීම.
- ජේර වල මූල ගැටිති නෙමටෝඩාවන් (*Meloidogyne* spp.) පාලනය කිරීම සඳහා පසට සිදු කරන වෙනස්කම් මගින් ඇතිවන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම.
- විවෘත ක්ෂේත්‍ර තත්ත්වයන් සහ ආරක්ෂිත පරිසර තත්ත්වයන් යටතේ වගා කරන එළවළු වගාවන් සඳහා මයිටානාශක මගින් ඇතිවන සාර්ථකත්වය පිළිබඳව ඇගයීම.
- වැල් බෝංචි වගාවේ සුදු මැස්සාගේ (Bemisia tabaci) ගහන ගතිකත්වය අධ්‍යයනය කිරීම.
- පැඟිරි වගාවට හානිකරන පළිබෝධ සහ රෝග සම්බන්ධයෙන් සමෝධානික පළිබෝධ කළමනාකරණ ආදර්ශනය.
- මයිටාවන් සම්බන්ධයෙන් (Tetranyches urticae) විවෘත ක්ෂේත්‍රයේ වගා කෙරෙන රෝස වගා ප්‍රභේද පරීක්ෂා කර බැලීම.
- රෝසවල පොතු කෘමීන් පාලනය කිරීම සඳහා කෘමිනාශක යෙදීමේ ක්‍රම ඇගයීම.
- රහංගල කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ ආරක්ෂිත ගෘහ තුළ වගා කරන අර්තාපල් සහ බෙල් පෙපර් වලට වැළදෙන බැක්ටීරියා මැලවීම පාලනය කිරීම.

## මල් වගාව

- රෝස සඳහා යෝග්‍ය කප්පාදු කිරීමේ සහ පුහුණු කිරීමේ ක්‍රම, සහ කාර්යක්ෂම වසුන් ද්‍රව්‍ය හඳුනා ගැනීම.
- පෝච්චි තුළ රෝස, ජර්බෙරා සහ කපුරු මල් ප්‍රාණවත්ව තබා ගත හැකි කාලය වැඩි කර ගැනීම සඳහා විවිධ ද්‍රාවණවල ඔබා ගැනීමෙන් සිදුකරන ප්‍රතිකර්ම ඇගයීම.

## පටක රෝපණය

- බීජ රෝපණය කිරීම සහ බහුගුණකතා විකෘතිකරණය මගින් නව ජර්බෙරා ආර බිහි කිරීම.

- ලිසිඇන්තස් වල සමක්ලෝනීය විචල්‍යතාව පිළිබඳ අධ්‍යයනය.
- නලස්ථව අර්තාපල් රෝපණය කිරීමේදී MS මාධ්‍ය සඳහා පිරිවැය හිතකර විකල්ප පිළිබඳව අධ්‍යයනය කිරීම.

## පාංශු විද්‍යාව

- පැඟිරි ශාකවල රෝපණ ද්‍රව්‍ය නිපදවීම සඳහා පොහොර අවශ්‍යතාවයන් හඳුනා ගැනීම.
- බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් නිර්දේශ සකස් කිරීම.
- ආරක්ෂිත ගෘහ තුළ $G_0$ අර්තාපල් නිපදවීම සඳහා පෝෂක කළමනාකරණ පිළවෙත් බිහි කිරීම.
- ජල රෝපිත සහ භූරෝපිත වගා සඳහා සම්පූර්ණයෙන්ම දිය කළ පෝෂණ මිශ්‍රණ සකස් කිරීම.
- උඩරට එළවළු සඳහා විවිධ පොහොර යෙදීමේ පිළිවෙත් සහ තේ රොඩු මගින් සකස් කළ කොම්පෝස්ට් පොහොර පරීක්ෂා කිරීම.
- උඩරට අතරමැදි කලාපයේ පසේ හුණු අවශ්‍යතාව තක්සේරු කිරීම සඳහා වේගවත් ක්‍රමවේදයක්.
- උඩරට අතරමැදි කලාපයේ ආන්තික ඉඩම්වල පාංශු සාරවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා වඩාත්ම හොඳ කොළ පොහොර වරණය කර ගැනීම.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 13 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 01 |
| වැඩසටහන් සහකාර | 06 |
| සංවර්ධන නිලධාරි | 02 |
| පර්යේෂණ සහකාර | 09 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ උප සහකාර | 02 |
| පරිපාලන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 09 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| රියදුරු | 04 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| පින්තාරුකරු | 00 |
| බද්ධකරු | 01 |
| පෙදරේරු | 01 |
| වඩු බාස් | 01 |
| මුරකරු | 10 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| ස්ථිර කම්කරු | 26 |
| කොන්ත්‍රාත් කම්කරු | 63 |
| **එකතුව** | **158** |

# 1.2.3 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර

මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය පොල් ඉඩම්වල බෝග ඵලදායීතාව තහවුරු කිරීම පිණිස පොල් පාදක බෝග වගා ක්‍රමය සඳහා තාක්ෂණ ක්‍රම බිහි කිරීම සහ ඒකාබද්ධ කිරීම පිණිස ස්ථාපිත කරන ලදි. මෙම ආයතනය, වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මි.මී 1960$^{0}$ක් පමණ වූද උපරිම සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් 31.7$^{0}$ ක් පමණ වූ සහ අවම වාර්ෂික සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් 23$^{0}$ක් පමණ වූ කාලගුණයක් සහිත $IL_{1a}$ කෘෂි පාරිසරික කලාපයට අයත් වන අතර මෙම ප්‍රදේශයේ මතුපිට පස් ස්ථරය ඇලුවියල් පසින් යුත් රතු කහවන් පොඩ්සොලික් පසකි.

මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ තබ්බෝව, ඉහිනිමිටිය, සහ වාරියපොළ පිහිටුවා ඇති උපයෝගිතා පර්යේෂණ ස්ථාන මගින් කුරුණෑගල, පුත්තලම සහ ගම්පහ දිස්ත්‍රික්ක වලට අදාළ පර්යේෂණ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. වගකීම පැවරී තිබෙන පලතුරු, එළවළු, මුල් සහ ආකන්ද බෝග, මල් බෝග, බිම්මල් සහ කොම්පෝස්ට් නිෂ්පාදනය සම්බන්ධයෙන් තාක්ෂණය බිහි කිරීමේ වගකීම මෙම ආයතනය වෙත පැවරී ඇති අතර බෝග ප්‍රභේද වැඩි දියුණු කිරීම, ප්‍රචාරණ ක්‍රම, යෝග්‍ය ශෂ්‍ය විද්‍යාත්මක තාක්ෂණික ක්‍රම බිහි කිරීම, පලතුරු සහ එළවළු සුලභතාවය ඉහළ නැංවීම, පැළෑටි සංරක්ෂණය සහ පස සම්බන්ධ ගැටළු විසඳීම, රසායනික අඩුවෙන් යෙදීමෙන් පැළවල සෞඛ්‍ය තහවුරු කිරීම සහ නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි පර්යේෂණ වැඩසටහන මගින් අවධානය යොමු කරයි.

## අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 1.2.3.1 හි දැක්වේ.

**වගු අංක 1.2.3.1 වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 6,391,320 | 6,042,369 | 95 |
| පුනරාවර්තන | 3,126,400 | 1,574.164 | 50 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - දේශීය වට්ටක්කා වැඩිදියුණු කිරීම | 889,800 | 880,000 | 99 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - ඇන්තූරියම් | 1,300,000 | 1,290,000 | 99 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - කෙසෙල් | 50,000 | 49,960 | 99 |

| වැය ශිර්ෂය | ප්‍රතිපාදනය ( රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - අන්නාසි | 216,500 | 128,377 | 59 |
| පටක රෝපණ ව්‍යාපෘතිය | 1,760,000 | 1,550,000 | 88 |
| පලතුරු ගම්මාන සංවර්ධනය - දෙළුම් | 600,000 | 534,000 | 89 |
| පලතුරු ගම්මාන සංවර්ධනය - අන්නාසි | 3,000,000 | 2,800,000 | 93 |
| දෙමුහුම් එළවළු ප්‍රභේද බිහිකිරීම | 275,000 | 249,981 | 91 |
| ජනප්‍රිය සාම්ප්‍රදායික එළවළු ප්‍රභේදවල සුලභතාව ඉහළ නැංවීම | 131,000 | 130,000 | 100 |
| බිම්මල් - KOPIA ව්‍යාපෘතිය | 1,400,000 | 522,105 | 37 |
| කොම්පෝස්ට් නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම | 4,470,000 | 4,330,058 | 97 |
| **එකතුව** | **23,6120,020** | **20,081,594** | **85** |

## ප්‍රගතිය

- පලතුරු අභිජනනය සහ පටක රෝපණය
- අන්නාසි දෙමුහුම්කරන වැඩසටහන - දෙමුහුම් අන්නාසි ආර මුරිසියස් අන්නාසි සමඟ පිළිමුහුම් කළ අතර තව දුරටත් වැඩි දියුණු කිරීම සිදු කෙරෙනු ඇත.
- අන්නාසි ජනක ප්ලාස්ම එක්රැස් කිරීම සහ ඇගයීම - සිදු කෙරෙමින් පවතී.
- අන්නාසි වගාව සඳහා පේළි 3ට වගා කිරීමේ ක්‍රමයේ කාර්යක්ෂමතාව ඇගයීම - අත්හදා බැලීම ස්ථාපිත කර ඇත.
- අන්නාසි ගෙඩි ලොකු කිරීම කෙරෙහි පැළ වර්ධන නියාමක යොදා ගැනීමෙන් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම - අත්හදා බැලීම ස්ථාපිත කර ඇත.
- පටක රෝපණ තාක්ෂණය මගින් අන්නාසි හා කෙසෙල් වල පටක රෝපණ නිෂ්පාදනය කිරීම - නලස්ථ මුරුසියස් පැළ 40,000ක් නිපද විය.
- නව ඇන්තූරියම් ප්‍රභේද ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම සඳහා සුදුසු ප්‍රශස්ත තත්ත්වය බිහි කිරීම - රෝපිත ගුණනය කිරීමේ අදියරේ පවතී.

## පලතුරු අභිජනනය සහ ශෂ්‍ය විද්‍යාව

- දෙළුම් දෙමුහුම්කරණ වැඩසටහන - $F_1$(A x D සහ C x D) දෙමුහුම්වල අපේක්ෂිත ඵල ලක්ෂණ සොයා ගැනිණි. දත්ත එකරැස් කිරීම සිදු කෙරෙමින් පවතී.
- කල්පිටිය රෙඩ් දෙළුම් වගා ප්‍රභේදය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - පළමු අස්වැන්න නෙලාගත් අතර ඵලවල

ගුණාත්මක ලක්ෂණ ලබා ගැනිණි. පර්යේෂණ අඛණ්ඩවම සිදු කෙරේ.

- කෙසෙල් ජනක ප්ලාස්ම එක්රැස් කිරීම, ඇගයීම හා ලක්ෂණීකරණය - අපේක්ෂිත ලක්ෂණ ඇඹුල් කෙසෙල් වරණයකින් සොයා ගැනිණි. ඇගයීම සහ දත්ත එක්රැස් කිරීම අඛණ්ඩවම සිදුකෙරේ.
- දෙළුම්වල පැළ වර්ධන නියාමක (හෝමෝන) යොදාගෙන මුල් ඇදුණු කඳ කැබලි වැඩි දියුණු කිරීම (නාමලී ප්‍රභේදය) – IBA 500ppm +බෝරැක්ස් 1% සංයෝගය මගින් මුල් ඇද්දවීම ඉහළ මට්ටමක පැවතුණි.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම- සීනි කෙසෙල් - දෙවන අස්වැන්නේ දත්ත එක්රැස් කිරීම සිදු කෙරෙමින් පවතී.

## එළවළු

- දේශීය වට්ටක්කා එක්රැස් කිරීම සහ ඇගයීම - ජනකප්ලාස්ම 20ක් ක්ෂේත්‍රයේදී ඇගයීමට ලක් කෙරිණි. දෙමුහුම්කරණ වැඩසටහන සඳහා මාපිය ආර ලෙස ආර 2ක් වරණය කෙරුණු අතර තවත් ආර 3ක් සංශුද්ධ කිරීම සඳහා වරණය කෙරිණි.
- වට්ටක්කා පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම (NCVT) - B සහ විලච්චි යන ආර රුහුණ ආරට වඩා ක්‍රියාකාරී වූ අතර අර්ජුන හා සැසඳිය හැකිය. ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම 2014 යල කන්නයේ දී සිදු කෙරෙණු ඇත.
- වට්ටක්කා සඳහා වාරියපොළ උපයෝගිතා පර්යේෂණ ඒකකයේදී සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙතක් ඇගයීමට ලක් කෙරිණි. B, විලච්චි සහ මොරගොල්ලාගම යන ආර අර්ජුන (වාණිජ) ආරට වඩා වැඩි අස්වැන්නක් ගෙන දුන් නමුත් HORDI PU1හි ඵල සංඛ්‍යාව ඉහළ ප්‍රමාණයක් වූ අතර පළිබෝධ රෝග අසාදනය වීම අඩු බැව් නිරීක්ෂණය විය.
- මෑ, මාළු මිරිස්, වම්බටු, තක්කාලි, දඹල සහ පිපිඤ්ඤා සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම - දඹල පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීමේ දී WBMW සහ WBMP යන ආර දෙකේ අස්වනු ගෙන දීම SLS 44 ට වඩා දින 5-6කට කලින් සිදුවූ අතර ඉහළ අස්වැන්නක්ද ගෙන දුණි.
- සංශුද්ධ කිරීම මගින් විලච්චි වට්ටක්කා ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය - කි.ග්‍රෑ. 1.25
- මස් මෑ නිෂ්පාදනය- කි.ග්‍රෑ. 8.5
- TA 2 පතෝල ප්‍රභේදයේ අභිජනක බීජ නිෂ්පාදනය කිරීම - කි.ග්‍රෑ. 3.65
- තින්නවෙලි කරවිල ප්‍රභේදයේ අභිජනක බීජ නිෂ්පාදනය - කි.ග්‍රෑ. 2.3

## මල් බෝග

- ඇන්තූරියම් (*Anthurium andraeanum*) පරිබාහිරව සංරක්ෂණය කිරීම සහ ජාන සම්පත් ප්‍රයෝජනයට ගැනීම. 2013 ප්‍රභේද මුදාහැරීමේ කමිටු රැස්වීමේ දී ප්‍රභේද 4ක් (M30, M36, M5, M7) මුදාහරින ලදි.
- ඉද්ද ප්‍රභේද වරණය කිරීමේ වැඩසටහන - 2013 වසරේදී එක් ප්‍රභේදයක් මුදා හරින ලදි.

## පාංශු විද්‍යාව

- අන්නාසි ඵලදායීතාව සම්බන්ධයෙන් කාර්යක්ෂම පෝෂණ කළමනාකරණය අත්හදා බැලීම ස්ථාපිත කළ අතර පාංශු සහ පැළ නියැදි 40ක් එක්රැස් කර විශ්ලේෂණය කරන ලදි.

- කල්පිටියේ එළවළු සහ පලතුරු වගා සඳහා පොහොර යෙදීම පිළිබඳ සමීක්ෂණය - පාංශු සහ ජල නියැදි 22ක් එක්රැස් කර ගත් අතර ප්‍රයෝජ්‍ය ෆොස්ෆරස්, හුවමාරු කළ හැකි පොටෑසියම්, PH, EC, කාබනික ද්‍රව්‍යය සහ බැර ලෝහ ( Cd, Pb) සම්බන්ධයෙන් විශ්ලේෂණය කෙරිණි.

## කොම්පෝස්ට්

- කොම්පෝස්ට් ආශ්‍රිත නියැදි 326ක් ඒවායෙහි ගුණාත්මක ප්‍රමිතිය සම්බන්ධයෙන් ඇගයීම සඳහා විශ්ලේෂණය කෙරිණි.
- කොම්පෝස්ට් නිෂ්පාදනය - මෙ.ටො.273ක් නිපද වූ අතර කි.ග්‍රෑ. 5 බැගින් වූ ආමුකුලණ මලු 33876ක් බෙදා දෙන ලදි.
- ඒකාබද්ධ පැලෑටි පෝෂණ ක්‍රමය පිළිබඳ ආදර්ශන 2ක් ස්ථාපිත කරන ලදි.
- කොළ පොහොර අක්කර ¼ ක වගා කරන ලදි.

## කීට විද්‍යාව

- පේර,දෙළුම්, අනෝදා යන පලතුරු වල පළිබෝධ හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම - හොරණ රෙඩ්, හොරණ රෝසි සහ රෙඩ් ජයන්ට් වඩාත් ආසාදිත ප්‍රභේද ලෙසද හොරණ ස්වීට්, පුබුදු සහ ලංකා ජයන්ට් පළිබෝධ අඩුවෙන් ආසාදනය වූ ප්‍රභේද ලෙසද හඳුනා ගැනිණි.
- වාහක සාධකය - පොත්ත ආහාරයට ගන්නා දළඹුවකු ලෙස අනුමාන කෙරිණි.
- අඹවල පොතු කෑමින්ගේ අවකාශමය සහ කාලික ව්‍යාප්තිය නිරීක්ෂණය කිරීම - මල් පීදෙන අවධියේදී ගහනය වඩාත් ඉහළ මට්ටමක පැවතුණි.

- පොතු කෑමීන් පාලනය කිරීම සඳහා වරණය කරගත් නිස්සාරණ ඇගයීම - ගෙවතුවල පොතු කෑමීන් කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා කොහොඹ බීජ නිස්සාරණය යොදා ගත හැකිය.

## ව්‍යාධිවේදය

- එළවළු වල ස්පර්ශ රෝග සඳහා ට්‍රයිකොඩර්මා සහ කොම්පෝස්ට් දියර භාවිතය සම්බන්ධයෙන් අත්හදා බැලීම ක්ෂේත්‍රයේ ස්ථාපිත කෙරිණි.
- ඔයිස්ටර් බිම්මල් වගා ගෘහය සඳහා නව සෙවිලි ද්‍රව්‍යයක් මිලදී ගන්නා ලදි.
- ගැනොඩර්මා බිම්මල් සඳහා වගා පිළිතෙක් බිහිකිරීම - ද්‍රව්‍යය මිලදී ගැනිණි.
- නව බිම්මල් ප්‍රභේදය හඳුන්වා දීම - බීජ නිෂ්පාදනය ආරම්භ කළ අතර අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගන්නා ලදි.

## මුල් සහ ආකන්ද බෝග

- මුල් ප්‍රේරණය කරන හෝමෝන මගින් ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව මඤ්ඤොක්කා ඵලදායිතාව ඉහළ නැංවීම - අත්හදා බැලීම අවසන් අතර අස්වැන්න 25%කින් වර්ධනය වූ බව වාර්තා විය.
- බතල වගාව සඳහා පෙහොර යෙදීම පිළිබඳ අධ්‍යයනය - අස්වනු ක්‍රියාකාරීත්වය ප්‍රතිස්ථාපනය කිරීම සහ හුණු යෙදූ බතල වගාව හෙ.1කට ටො.23ක සාර්ථක අස්වැන්නක් ගෙන දෙන ලදි.
- මඤ්ඤොක්කා රෝපණ ද්‍රව්‍ය සඳහා පිරිවැය ඵලදායිත්වය ඉහළ නැංවීම සහ වසර පුරාම සුලභව පවත්වා ගැනීමේ හැකියාව - අත්හදා බැලීම ක්ෂේත්‍රයේ සිදු කෙරෙමින් පවතී (මාස 07)

## බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගු අංක 1.2.3.2: බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය -2013**

| පැළයේ නම | අලෙවි කළ පැළ සංඛ්‍යාව |
|---|---|
| ඩ්‍රැගන් ෆෲට් | 1,300 |
| කෙසෙල් | 260 |
| ඇන්තූරියම් | 380 |
| බිම්මල් | 50 |

## තාක්ෂණය පතුරුවාලීම

**වගු අංක 1.2.3.3 : තාක්ෂණය පතුරුවාලීම**

| වැඩසටහන් මාතෘකාව | අත්පත්‍රිකා සංඛ්‍යාව | ක්ෂේත්‍ර දින ගණන | පාංශු පරීක්ෂණ ගණන | ප්‍රදර්ශන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කොම්පෝස්ට් | 135,086 | - | - | 03 |
| පස් | - | - | 326 | - |
| බිම්මල් | 2,000 | - | - | 01 |
| ව්‍යාධිවේදය | - | - | - | - |
| අන්නාසි | 2,500 | - | - | 02 |
| දෙළුම් | 2,200 | - | - | - |
| මල් බෝග වගාව | 2,500 | - | - | 01 |

**වගු අංක 1.2.3.4 : පුහුණු වැඩසටහන්**

| වැඩසටහන් මාතෘකාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| අන්නාසි | 13 | 520 |
| කෙසෙල් | 07 | 400 |
| ඩ්‍රැගන් ෆෲට් | 10 | 200 |
| එළවළු | 30 | 1700 |
| ගෙවතු වගාව | 20 | 2000 |
| මුල් හා ආකන්ද | 06 | 300 |

| වැඩසටහන් මාතෘකාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| මල් බෝග වගාව | 25 | 1200 |
| බිම්මල් | 15 | 300 |
| කොම්පෝස්ට් | 86 | 4623 |

වගු අංක 1.2.3.5: උපදේශාත්මක සේවා

| ක්ෂේත්‍රය | 2013 වසරේ උපදේශාත්මක සේවා සංඛ්‍යාව |
|---|---|
| කොම්පෝස්ට් | 115 |
| බිම්මල් | 210 |
| අන්නාසි | 32 |
| මල් බෝග වගාව | 2 |
| ගෙවතු වගාව | 14 |
| මුල් සහ ආකන්ද | 17 |
| ඩ්‍රැගන් ෆෘට් | 20 |
| කෙසෙල් | 15 |
| ව්‍යාධිවේදය | 42 |
| කීට විද්‍යාව | 20 |
| එළවළු | 25 |

## 2014 වසර සඳහා සැලැස්ම

### පලතුරු අභිජනනය සහ පටක රෝපණය

- අන්නාසි දෙමුහුම්කරණ වැඩසටහන
- අන්නාසි ජනකප්ලාස්ම එක්රැස් කිරීම සහ ඇගයීම
- අන්නාසි වගාව සඳහා පේළි තුනකට වගා කිරීමේ ක්‍රමයේ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම
- අන්නාසි ගෙඩි ලොකුවීම සඳහා පැළ වර්ධන නියාමක (හෝමෝන) යොදා ගැනීමෙන් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම
- පටක රෝපණ තාක්ෂණය මගින් අන්නාසි සහ කෙසෙල් රෝපණ ද්‍රව්‍ය නිපදවීම
- නව ඇන්තුරියම් ප්‍රභේදවල ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා ප්‍රශස්ත තත්ත්වයක් බිහි කිරීම

### පලතුරු අභිජනනය සහ ශෂ්‍ය විද්‍යාව

- දෙළුම් දෙමුහුම්කරණ වැඩසටහන
- කල්පිටිය රෙඩ් දෙළුම් වගා ප්‍රභේදය වැඩිදියුණු කිරීමේ වැඩසටහන්
- පැළ වර්ධන නියාමක යොදා ගනිමින් දෙළුම් මුල් ඇදුණු දඬු කැබලි වැඩිදියුණු කිරීම (නාමලී ප්‍රභේදය)
- ඩ්‍රැගන් ෆෘට් (Hylocereus spp.) අස්වනු නෙලීම හැසිරවීම
- පැක්ලොබියුට්‍රසෝල් මගින් මල් ප්‍රේරණය කිරීම සඳහා අඹ ගස ප්‍රශස්ත කිරීම
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම - පැපොල් දෙමුහුම්
- පුනර්වර්ධනය කිරීම හරහා අඹ ඵලදායිතාවය ඉහළ නැංවීම

### එළවළු

- වරණය කරගත් ජනකප්ලස්ම සංශුද්ධ කිරීම - මල් ස්වපරාගනය කිරීමේ තාක්ෂණය මගින් ජනකප්ලාස්ම 5ක් සංශුද්ධ කරනු ඇත
- සංශුද්ධ කිරීම මගින් විලච්චි සහ B වට්ටක්කා ආරවල බීජ නිෂ්පාදනය කිරීම - විලච්චි - කි.ග්‍රෑ.5, B ආර - කි.ග්‍රෑ.3
- මොරගොල්ලාගම සහ විලච්චි ප්‍රදේශවලදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම (NCVT) සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම
- $TA_2$ පතෝල ප්‍රභේදයේ අභිජනක බීජ නිෂ්පාදනය කිරීම - කි.ග්‍රෑ. 10
- තින්නවේලි කරවිල ප්‍රභේදයේ අභිජනක බීජ නිෂ්පාදනය - කි.ග්‍රෑ. 3
- LY 58 පිපිඤ්ඤා ප්‍රභේදයේ අභිජනක බීජ නිෂ්පාදනය - කි.ග්‍රෑ. 01

- මෑ, මාළුමිරිස්, වම්බටු, තක්කාලි, දඹල සහ පිපිඤ්ඤා සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- මස් මෑ බීජ නිෂ්පාදනය කිරීම සඳහා ඉලක්කයක් දී නැත
- වර්ධන නියාමක අත්හදා බැලීම, COMcat – Row (ආනයනික දෙමුහුම් මාළුමිරිස් ප්‍රභේද ඇගයීම, වැටකොළු)

## ව්‍යාධිවේදය සහ බිම්මල්

- එළවළුවල ස්පර්ශක රෝග සඳහා ට්‍රයිකොඩර්මා සහ කොම්පෝස්ට් දියර භාවිතා කිරීම
- ඔයිස්ටර් බිම්මල් වගා ගෘහය සඳහා සෙවිලි ද්‍රව්‍ය
- ගැනොඩර්මා බිම්මල් සඳහා වගා පිළිවෙතක් බිහි කිරීම
- නව බිම්මල් ප්‍රභේදය හඳුන්වාදීම

## මල්වගාව

- සාම්ප්‍රදායික අභිජනනය මගින් නව ප්‍රභේද බිහි කිරීම (ඇන්තූරියම් සහ ඉද්ද)

## මුල් සහ ආකන්ද බෝග

- පිරිවැය ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය ජනනය කිරීම සහ මඤ්ඤොක්කා රෝපණ ද්‍රව්‍ය වසර පුරාම සුලභ කිරීම.

## කීට විද්‍යාව

- පේර, දෙළුම් සහ අනෝදාවල පළිබෝධ හඳුනා ගැනීම සහ කළමනාකරණය
- අඹවල පොතු කෘමීන් පාලනය කිරීම සඳහා නිර්දේශිත කෘමිනාශක (කෘමි වර්ධන නියාමක සමඟ) ඇගයීම
- අඹ පොතු කෘමීන්ගේ පරපෝෂිතයන් සහ විලෝපිකයන් හඳුනා ගැනීම
- අන්නාසි පිටි මකුණා සඳහා ඇසිටැමිප්‍රිඩ් 200 sp නියමු පරිමාණයෙන් පරීක්ෂා කිරීම.
- අන්නාසි පිටි මකුණාට එරෙහිව පළිබෝධ නාශක පරීක්ෂා කර බැලීම
- කීට ව්‍යාධිජනක දිලීර වෙන්කර ගැනීම

## පාංශු විද්‍යාව

- බෝග ඵලදායිතාව සඳහා පණු පොහොර නිෂ්පාදනය සහ භාවිතා කිරීම
- පොහොර කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ අත් පත්‍රිකාවක් සකස් කිරීම
- අන්නාසි බෝගයේ ඵලදායිතාව සඳහා කාර්යක්ෂමව පොහොර කළමනාකරණය කිරීම.
- කල්පිටියේ එළවළු සහ පලතුරු සඳහා පොහොර භාවිතය පිළිබඳව සමීක්ෂණය කිරීම.

## කොම්පෝස්ට්

- කොම්පෝස්ට් නිෂ්පාදනය - මෙ.ටො. 300
- කි.ග්‍රෑ.5 බැගින් වූ ආමුකුලණ මලු 40,000ක් බෙදා දීම
- ඒකාබද්ධ පැළැටි කළමනාකරණ ක්‍රම ආදර්ශන ස්ථාපිත කිරීම
- ප්‍රදර්ශන 5ක් සිදු කිරීම, අත්පත්‍රිකා 500,000ක් බෙදා හැරීම සහ අභ්‍යාසලාභීන් 10,000ක් පුහුණු කිරීම
- කොම්පෝස්ට්, පස් සහ ජල නියැදි 400ක් විශ්ලේෂණය කිරීම

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරි | 07 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර | 02 |
| සංවර්ධන නිලධාරි | 05 |
| කෘෂිකර්ම උපදේශක | 18 |
| පර්යේෂණ සහකාර | 10 |
| ගොවිපළ ලිපිකරු | 02 |
| පර්යේෂණ උප සහකාර | 01 |
| රියදුරු | 04 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| මුරකරු | 11 |
| තවාන්කරු | 01 |
| ට්‍රැක්ටර් යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| තණ කොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| නුපුහුණු කම්කරු (1 ශ්‍රේණිය) | 33 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 60 |
| **එකතුව** | **163** |

# 1.2.4 කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - සීතා එළිය

ප්‍රධාන වශයෙන්ම මෙම ආයතනය අර්තාපල් සම්බන්ධයෙන් කටයුතු කරන අතර ඊට අමතරව උඩරට එළවළු, සෞම්‍ය කලාපීය පලතුරු, ඇතැම් මල් බෝග කෙරෙහිද සිය අවධානය යොමු කරයි. බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන් වලට ප්‍රභේදීය වැඩිදියුණු කිරීම සහ ඉහළ අස්වනු ගෙන දෙන යෝග්‍ය ප්‍රභේද හඳුන්වා දීම මෙන්ම වරණය කිරීම ඇතුළත් වේ. වැඩිදියුණු කරන ලද ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් බිහි කිරීම, පළිබෝධ, රෝග සහ පෝෂක කළමනාකරණය සඳහා යෝග්‍ය කෘෂිකාර්මික ක්‍රියාමාර්ග හරහා බෝග ඵලදායීතාවය ඉහළ නැංවීම මෙන්ම බීජ අර්තාපල්, ස්ට්‍රෝබෙරි සහ ඇතැම් විසිතුරු පැළ රෝපණ ද්‍රව්‍යයන්හි ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද බීජ අර්තාපල් නිෂ්පාදනය සහ ඇතැම් විදේශීය එළවළු සම්බන්ධයෙන් දේශීයව බිහිකළ තාක්ෂණය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වූ පර්යේෂණ කටයුතු මෙම ආයතනය මගින් සිදු කරනු ලබයි.

## අයවැය

**වගු අංක 1.2.4.1: වාර්ෂික අයවැය -2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 2,006,300 | 1,649,845 | 82 |
| පුනරාවර්තන | 7,329,859 | 6,466,881 | 88 |
| ව්‍යාපෘති | | | |
| • බීජ අර්තාපල් නිෂ්පාදන තාක්ෂණය වැඩිදියුණු කිරීම (ජාතික කාෂිකර්ම පර්යේෂණ සැලැස්ම) | 1,183,500 | 992,869 | 89 |
| • දේශීය තත්ත්වයන් සඳහා යෝග්‍ය නව අර්තාපල් ප්‍රභේද බිහි කිරීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම) | 197,500 | 197,452 | 100 |
| • පැඟිරි ප්‍රභේද ඇගයීම | 100,000 | 99,758 | 100 |
| • පටක රෝපණය | 9,500,000 | 7,132,304 | 99 |
| • IFAD | 212,550 | 212,296 | 100 |
| • එළවළු වගා කිරීමේ තාක්ෂණය (KOPIA) | 100,000 | 99,796 | 100 |
| • පාංශු සාරවත්භාවය කළමනාකරණය කිරීම (KOPIA) | 236,000 | 158,313 | 67 |
| • බිම්මල් (KOPIA) | 1,228,095 | 45,388 | 4 |
| • අර්තාපල් (KOPIA) | 2,450,751 | 2,450,751 | 100 |
| **එකතුව** | **24,544,555** | **17,847,287** | **79** |

## ප්‍රගතිය

### පර්යේෂණ

#### ශෂ්‍ය විද්‍යාව

- 2013 යල කන්නයේ දී නුවරඑළිය දිස්ත්‍රික්කයේ දී වාණිජ අර්තාපල් ප්‍රභේද 10ක් ඇගයීමට ලක් කළ අතර උඩරට තෙත් කළාප තත්ත්වයන් යටතේ යල කන්නයේ දී “ලාපර්ලා” සහ ඩෙස්ට්නි යන ප්‍රභේද මනාව ක්‍රියාකාරී විය.
- විවිධ අර්තාපල් රෝපණ ද්‍රව්‍යයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව ජල රෝපිත ක්‍රමය මගින් අධ්‍යයනය කෙරුණු අතර කුඩා ආකන්ද මගින් ඉහළ අස්වැන්නක් ගෙන දුණි.
- ගොවිපළ කළමනාකරණ තත්ත්වයන් යටතේ අර්තාපල්වල බීජ අස්වැන්න කෙරෙහි පේලි පරතරය මගින් ඇතිවන බලපෑම සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කළ අතර අත්හදා බැලීම නැවතත් සිදු කරනු ඇත.
- රෝපණ ද්‍රව්‍ය ලෙස බීජ අර්තාපල් ආකන්ද කැබලි වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සිදු කළ ඇගයීමේ දී ග්‍රෑ.60ක් පමණ වූ අර්තාපල් ආකන්ද කැබලි මගින් සම්පූර්ණ ආකන්දයකින් (60g) (බීජ විශාලත්වය 28mm-55mm) ලබා දෙන අස්වැන්නට සමාන අස්වැන්නක් උඩරට තෙත් කලාප තත්ත්වයන් යටතේ ගෙන දෙන ලදි.

### පැළෑටි අභිජනනය

- පර්යේෂණ තත්ත්වයන් යටතේ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම මගින් දේශීයව බිහි කළ අර්තාපල් ආර 4ක් (M -18,19,01,- 12,-10 සහ 01-09-05) ඇගයීමට ලක් කළ අතර ආර 3ක් 19,01-12-10 සහ 01-09 -05) සැලකිය යුතු මට්ටමක ඉහළ අස්වනු ගෙන දුණි. ප්‍රතිඵල තහවුරු කර ගැනීම සඳහා මෙම අත්හදා බැලීම නැවත වරක් පර්යේෂණ හා බීජ අර්තාපල් ගොවිපල වල දී සිදු කෙරිණි.
- 2013/14 මහ කන්නයේ දී පර්යේෂණ තත්ත්වයන් යටතේ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා දේශීයව බිහි කළ අර්තාපල් ආර 5ක්(01-11-01,99-25-10-01,01-08-15 සහ A-17) ස්ථාපිත කරන ලදි.
- සම්ප්‍රදායික නොවන ප්‍රදේශ සඳහා (කල්පිටිය සහ යාපනය ) අස්වැන්න සහ ආකන්ද ලක්ෂණ පාදකව උෂ්ණත්වයට ඔරොත්තු දෙන ප්‍රභේද බිහි කිරීම සඳහා දේශීයව බිහිකරන ලද අර්තාපල් ආර 107න් ආර 32ක් හඳුනා ගැනිණි.
- දේශීයව බිහිකරන ලද ආර 78කින් ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රභේද බිහි කිරීම සඳහා ආර 35ක් හඳුනා ගැනිණි.
- වැඩිදියුණු කළ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම යටතේ දේශීයව බිහිකරන ලද ආර 9ක් ඇගයීමට ලක් කෙරිණි.
- උෂ්ණත්වයට ඔරොත්තු දෙන ප්‍රභේද හඳුනා ගැනීම සඳහා දේශීයව බිහි කරන ලද අර්තාපල් ආර 32ක් කල්පිටිය හා තිරුනෙල්වේලි පර්යේෂණ ස්ථානවල ස්ථාපිත කරන ලදි.
- ආනයනික අර්තාපල් ආර 15න් ආර 7ක් වැඩිදුර ඇගයීම සඳහා ප්‍රශස්ත තත්ත්වයක් බිහි කෙරිණි.

### පටක රෝපණය

- පෙයාර්ස් නලස්ථව ස්ථාපිත කිරීම සහ ගුණනය කිරීම සඳහා ප්‍රශස්ත තත්ත්වයක් බිහි කෙරිණි.
- ශ්‍රී ලංකාවේ උඩරට කලාපයේ විවිධ ප්‍රදේශ වලින් එක් රැස් කරගත් ග්‍රැනෝලා වලින් විවිධ ගහන හඳුනා ගැනිණි.
- කපුරු සහ ස්ටැටිස් ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම සඳහා ප්‍රශස්ත තත්ත්වයක් බිහි කරන ලදි.

## කීට විද්‍යාව

- කළු කියත් පණුවා කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා ජෛව විද්‍යාත්මක පාලන කාරකයක් ලෙස වෛරසයක් ආසාදනය වූ කළු කියත් පණු කීටයාගෙන් ලබා ගන්නා සාන්ද්‍රණය (ලීටරයකට ග්‍රෑ.8ක්) යොදා ගත හැකි බැව් අනාවරණය විය. මියයාමේ අනුපාතය 48.5%ක් බැව් වාර්තා විය.
- 2013 වසරේදී පත්‍ර කනින්නාගේ (*Liriomyza huidobrensis*) ස්වභාවික ජෛව පාලන කාරක ජීවියාගෙන් (*diglyphus iseae*) 5631ක් ක්ෂේත්‍රයට සහ ආරක්ෂිත ගෘහවලට මුදා හරින ලදි.
- කියත් පණුවා, අර්තාපල් ආකන්ද සලඹයා, කුඩිත්තා සහ පැළ මැක්කා (අර්තාපල් පළිබෝධ සංකීර්ණය) පාලනය කිරීම සඳහා පාරිසරික වශයෙන් හිතකර කෘමිනාශකයක් ලෙස වර්ටැකෝ 40WG තයෝමෙතොක්සම් 20% + ක්ලෝරන්ට්‍රිනිලිප්‍රොල් 20%) නිර්දේශ කෙරිණි.
- වෙන් කර ගන්නා ලද බැසිලස් තුරින්ජින්සිස් 2 (Bacillus thuringiensis) කම්බිලි පණුවා පාලනය කිරීමෙහිදී ක්ලෝපයිරිෆෝස් හා සමානවම කාර්යක්ෂම විය.

## ව්‍යාධිවේදය

- අර්තාපල් පසු අංගමාරයට එරෙහිව නව දිලීරනාශක වන ඇමිස්ටාර් ලීටරයකට මි.ලි. 1.00 බැගින් බලයිකොසෙබ් ලීටරයකට මි.ලී.2.5 බැගින් පරීක්ෂා කර බලන ලදුව ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ (2012/2013 මහ) ඇමිස්ටාර් ලීටරයකට මි.ලී.1.00 වඩාත් කාර්යක්ෂම ප්‍රතිඵල පෙන්විය.
- ගොවි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ ඇසොක්සිස්ට්‍රෝබින් 25% sc වල සාර්ථකත්වය පරීක්ෂා කර බලන ලදුව අර්තාපල් පසු අංගමාරය පාලනයෙහි කාර්යක්ෂම බැව් අනාවරණය විය. ( 2013 යල)
- පසු අංගමාරයට ඔරොත්තු දීම සහ අස්වැන්න පාදකව පරීක්ෂාවට ලක් කරන ලද නව වාණිජ අර්තාපල් ප්‍රභේද 15න් සර්වේන්, බෙලනෝවා , yp-04-80 සහ yp-04-88 යන ප්‍රභේද වැඩිදුර ඇගයීම සඳහා (2013 යල ) වරණය කර ගත හැකිය.
- නව අර්තාපල් අභිජනක ආර වන 19 සහ 99-99 පසු අංගමාරයට ඔරොත්තු දීමේ හැකිවෙන් යුත් බැව් අනාවරණය වූ අතර දිලීරනාශක ස්ප්‍රේ කළ තත්ත්වය යටතේ ඉහළ අස්වනු ගෙන දුණි.මෙම ආර වැඩිදුර ඇගයීම සඳහා වරණය කර ගන්නා ලදි.
- සුකිනිවලට වැළදෙන පිටි පුස් රෝගයට එරෙහිව නව දිලීරනාශකයක් වන කැලිග්‍රීන් ලීටරයකට ග්‍රෑ.2.5ක් යොදා පරීක්ෂා කර බලන ලද අතර මෙම රෝගය කළමනාකරණය කිරීම සඳහා නිර්දේශ කළ හැකිය. (2013 යල)
- උණු වතුර ප්‍රතිකර්මය මගින් ගෝවා වල කළු කුණුවීම කළමනාකරණය කිරීම පිළිබඳව අධ්‍යනය කරන ලදි.
- අර්තාපල් වලට වැළදෙන පිටි කබොළු රෝගයට එරෙහිව අර්තාපල් ආර 26ක් පරීක්ෂා කර බලන ලදුව එක ආරක්වත් එම රෝගයට ප්‍රතිරෝධී නොවන බැව් අනාවරණය විය.

## පාංශු විද්‍යාව

- කුඩා ආකන්ද නිපදවීම සඳහා වාණිජව ලබා ගත හැකි ඇල්බට් ද්‍රාවණ සමඟ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පෝෂක ද්‍රාවණ

සංයෝග හතර සසඳා බැලීම සඳහා කළ අත්හදා බැලීමේ දී ජල රෝපිත ක්‍රමය යටතේ දේශීයව සකස්කරන ලද පෝෂක සංයෝගය මනාව ක්‍රියාකාරී වූ බව අනාවරණය විය.

## එළවළු

- විදේශීය කැරට් ප්‍රභේද දෙකක්, ගෝවා ප්‍රභේද 2ක් සහ මල්ගෝවා ප්‍රභේද 2ක් උඩරට තෙත් කලාප තත්ත්වය යටතේ ඉහළ අස්වනු ගෙන දෙන බවත් ගුණාත්මක බවින් මෙන්ම පළිබෝධ සහ රෝග වලට ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු/ ප්‍රතිරෝධී බවින් යුතු බවත් හඳුනා ගැනිණි.

## සංවර්ධන කටයුතු

### ශෂ්‍ය විද්‍යාව

- අර්තාපල් කුඩා ආකන්ද නිපදවීම - ජලරෝපණ, වායු රෝපණ සහ භූ රෝපණ ක්‍රමයන් යටතේ පූර්ව මූලික බීජ ($G_0$) මිලියන 0.67ක් නිපදවිය. ආරක්ෂිත ගෘහයට හානි වී ඇති බැවින් ජුනි 14 වැනි දින සිට වායුරෝපණ ක්‍රමයට බීජ නිෂ්පාදනය කිරීම අත්හිටුවා ඇත.
- ජලරෝපණ ඒකකය ඉදිකළ අතර $G_0$ බීජ නිෂ්පාදනය කිරීම සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදි.
- $G_1$ බීජ ආකන්ද නිපදවීම සඳහා පූර්ව මූලික බීජ ($G_0$) 453,700ක් ගොවීන් වෙත ලබා දුණි.
- අවාරයේ බීජ නිෂ්පාදනය කිරීම සඳහා සුළු පරිමාණයේ ගොවීන් 100කට පූර්ව මූලික බීජ 50,000ක් නිකුත් කරන ලදි. සාර්ථකත්වය 30%කි. තවද පර්යේෂණ අත්හදා බැලීම් සඳහා 50,000ක් නිකුත් කරන ලදි.
- පූර්ව මූලික බිජ ($G_0$) යොදා ගනිමින් බීජ නිෂ්පාදනය කිරීම සඳහා නුවරඑළිය සහ බදුල්ල පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, IFAD ව්‍යාපෘති ප්‍රධානීන් සහ නුවරඑළිය දිස්ත්‍රික්ක අධ්‍යක්ෂ වරයාගේ සහයෝගයෙන් කුඩා ගොවි සමිති කීපයක් සහ සමුපකාරයක් පිහිටු විය. මෙම වැඩසටහන අඛණ්ඩවම සිදු කෙරේ.
- ජලරෝපණ සහ වායු රෝපණ ක්‍රම යටතේ $G_0$ බීජ නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණය බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශයට ලබාදීම.

### අභිජනනය

- ලංකා බෝල රාබු අභිජනක බීජ නිෂ්පාදනය කිරීම සඳහා 2500ft² නව ආරක්ෂිත ගෘහයක් ඉදි කරන ලදි.
- අර්තාපල් ප්‍රභේදීය ප්‍රවර්ධන වැඩසටහන - ගෝල්ඩන් ස්ටාර් මහා පරිමාණ ආදර්ශනයේ පළමු කන්නයේ නිෂ්පාදනය සතුටුදායක වූ නමුත් දෙවැනි ගුණනය අසාර්ථක විය. මේ පිළිබඳව විමර්ශනය කෙරෙනු ඇත.

### පටක රෝපණය

- විධිමත් බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා ග්‍රැනෝලා ප්‍රභේදයේ නලස්ථ පැළ 19,560ක් නිකුත් කෙරිණි. තවද, ග්‍රැනෝලා නලස්ථ පැළ 2,310ක්, ගෝල්ඩන් ස්ටාර් නලස්ථ පැළ 130ක් රාජා නලස්ථ පැළ 107ක් සහ ඩිසයිරි නලස්ථ පැළ 107ක් අවිධිමත් බිජ නිෂ්පාදන වැඩසටහන සඳහා නිකුත් කෙරිණි.
- ග්‍රැනෝලා නලස්ථ පැළ 522ක්, ඩිසයිරි නලස්ථ පැළ 12ක් සහ රාජා නලස්ථ පැළ 12ක් අත්හදා බැලීමේ කටයුතු සඳහා නිකුත් කෙරිණි.
- ග්‍රැනෝලා නලස්ථ පැළ 12ක් බීජ අර්තාපල් නිෂ්පාදනය කරන

පෞද්ගලික ආයතනයකට ලබා දෙන ලදි.

- නලස්ථ ස්ට්‍රෝබෙරි පැළ 3388ක් සහ නලස්ථ රෝපණ ද්‍රව්‍ය 2634ක් පෞද්ගලික ගොවීන් සඳහා ලබා දෙන ලදි.
- පර්යේෂණ ස්ථානවල ධාවක නිෂ්පාදනය කිරීම සඳහා නලස්ථ ස්ට්‍රෝබෙරි පැළ 306ක් යොදා ගැනිණි.
- වගාකරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා බේබීස් බ්‍රෙත් නලස්ථ පැළ 2473ක්, මැඩෝනා ලිලී නලස්ථ පැළ 637ක්, ජර්බෙරා නලස්ථ පැළ 370ක්, ලිමෝනියම් නලස්ථ පැළ 506ක් සහ කපුරු නලස්ථ පැළ 78ක් නිපදවිය.

## කීට විද්‍යාව

- රජයේ බීජ අර්තාපල් ගොවිපළ වලින් ලද පාංශු නියැදි 656ක් අර්තාපල් කෝෂ්ඨ වටපණුවා සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කෙරිණි.

## ව්‍යාධිවේදය

- බැක්ටීරියා මැලවීම සම්බන්ධයෙන් පාංශු නියැදි 650ක් පරීක්ෂාවට ලක් කෙරිණි.
- රෝග විනිශ්වය කිරීම සඳහා පැළ නියැදි 39ක් ලද අතර නිර්දේශ ලබා දෙන ලදි.
- බීජ අර්තාපල් නිෂ්පාදනයේදී විවිධ අදියර වලින් එනම් නලස්ථ, මුල් ඇදුණු කඳ කැබලි, පූර්ව මූලික, මූලික බීජ අර්තාපල් සහ ගොවි ක්ෂේත්‍ර ගහන වලින් එක්රැස් කර ගන්නා ලද අර්තාපල් පැළ නියැදි 30ක් PLRV, PVX, PVS, PVM සහ PVA සම්බන්ධයෙන් සුවිගත කෙරිණි.

## පාංශු විද්‍යාව

- පාංශු නියැදි පරීක්ෂා කිරීම (Ph -345, EC - 106, ෆොස්ෆරස් (P) - 60 සහ පොටෑෂ් (K) - 58)

## පුහුණු

- සුළු පරිමාණ ව්‍යාපෘති සකස් කිරීම, සමීක්ෂණය කිරීම සහ ඇගයීම පිළිබඳව DZLiSPP නිලධාරීන් සඳහා තායිලන්තයේ පැවති "වෘත්තීය සංවර්ධන පුහුණු සහ අධ්‍යයන සමීක්ෂණ වැඩසටහන සඳහා එක් නිලධාරියෙක් සහභාගී විය.
- එක් නිලධාරියෙක් කොරියාවේ පැවති බීජ අර්තාපල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී විය.
- ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ සහ ශ්‍රී ලංකා සංවර්ධන සහ පරිපාලන ආයතනයේ පැවති හුරු පුහුණුව සඳහා අළුතින් බඳවා ගන්නා ලද පර්යේෂණ නිලධාරීන් තිදෙනෙක් සහභාගී විය.
- පටක රෝපණය, කීට විද්‍යාව සහ ශෂ්‍ය විද්‍යාවට අදාළව විද්‍යාවේදී උපාධි අපේක්ෂක සිසුන් 07 දෙනෙක් සිය අවසන් වසර විශේෂ ව්‍යාපෘති සම්පූර්ණ කරන ලදි.
- විශ්වවිද්‍යාල සිසුන් 277ක්, කෘෂිකර්ම සිසුන් 322ක්, පාසැල් සිසුන් 457ක්, කෘෂිකර්මාන්තයට සම්බන්ධ නිලධාරීන් 70ක් සහ ගොවීන් 50ක් අර්තාපල් වගා කිරීම සහ කළමනාකරණය, බීජ අර්තාපල් නිෂ්පාදනය, පටක රෝපණය, මල් බෝග වගාව, ස්ට්‍රෝබෙරි වගාව, ආරක්ෂිත බෝග වගාව, පළිබෝධ සහ රෝග කළමනාකරණය, උඩරට එළවළු වගාව, ගෙවතු වගාව සහ පස සංරක්ෂණය සම්බන්ධයෙන් පුහුණු කරන ලදි.

## 2014 වසර සඳහා සැලැස්ම

- අනුවර්තනය වීමේ හැකියාව සහ අස්වැන්න සම්බන්ධයෙන් වාණිජ අර්තාපල් ප්‍රභේද ඇගයීම
- අර්තාපල් පූර්ව මූලික බීජවල අංකුර හට ගැනීම කෙරෙහි විවිධ රසායනික වලින් ඇති වන බලපෑම ඇගයීම.
- අර්තාපල් වල බීජ මතුවීම, වැඩීම සහ බීජ අස්වැන්න කෙරෙහි $G_0$ බීජ අර්තාපල්වල කුඩා ආකන්දවල බර මගින් ඇති කරන බලපෑම ඇගයීම.

### පැළෑටි අභිජනනය

- නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක වලදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම යටතේ දේශීයව බිහි කළ අර්තාපල් ආර 4ක් ඇගයීම.
- රජයේ බීජ අර්තාපල් ගොවිපළ වලදී මෙන්ම සීතාඑළිය සහ බණ්ඩාරවෙල පර්යේෂණ ස්ථානවලදි ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම යටතේ දේශීයව බිහිකළ අර්තාපල් ආර 5ක් ඇගයීම.
- තාපයට ඔරොත්තු දෙන ප්‍රභේද හඳුනා ගැනීම සඳහා බණ්ඩාරවෙල කල්පිටිය සහ තිරුනෙල්වේලි පර්යේෂණ ස්ථාන වලදී දේශීයව බිහි කළ අර්තාපල් ආර 32ක් ඇගයීම.
- වැඩිදියුණු කළ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම යටතේ දේශීයව බිහි කළ අර්තාපල් ආර 12ක් ඇගයීම
- අපේක්ෂිත ලක්ෂණ සහ මාපිය ආර වරණය කර ගැනීම සඳහා අන්තර්ජාතික අර්තාපල් මධ්‍යස්ථානයෙන් ලද ජනකප්ලාස්ම ඇගයීම.
- නිරීක්ෂණාත්මක අස්වනු අත්හදා බැලීම යටතේ දේශීයව බිහිකළ අර්තාපල් ආර 35ක් ඇගයීම
- ශ්‍රී ලංකාවේ පරිසර තත්ත්වයන් යටතේ වරණය කරගත් ආනයනික අර්තාපල් ප්‍රභේදවල ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම සඳහා ඇගයීම
- ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ ග්‍රැනෝලා ගහන 10ක් ඇගයීම
- ලංකා බෝල රාබු අභිජනක බීජ නිෂ්පාදනය
- බීට් බීජ නිෂ්පාදනය සඳහා තාක්ෂණය වැඩිදියුණු කිරීම

### පටක රෝපණය

- නලස්ථ පැළ දැඩි කිරීම සඳහා කොරියානු තාක්ෂණය උපයෝගී කර ගැනීම
- ප්‍රේරිත විකෘතිකරණය හරහා මල් බෝග වල නව ප්‍රභේද බිහි කිරීම
- පෙයාර්ස් කඳ කැබලි මුල් ඇද්දවීම සහ පරිසරයට හුරු කිරීම.

### කීට විද්‍යාව

- නුවරඑළිය රජයේ බීජ අර්තාපල් ගොවිපළ වල අර්තාපල් කෝෂ්ඨ වටපණුවා ගහනය නිරීක්ෂණය කිරීම
- කළු කියත් පණුවා ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම
- පත්‍ර කනින්නාගේ ස්වභාවික ජෛව පාලන කාරකයේ (Diglyphus iseae) පරපෝෂිතයන් සමූහව බෝ කිරීම
- ගබඩාවේ සහ ක්ෂේත්‍රයේ සිටින අර්තාපල් ආකන්ද සලඹයා කළමනාකරණය කිරීම සඳහා පෙරමෝන පාදක තාක්ෂණික ක්‍රමවල සාර්ථකත්වය පිළිබඳ අධ්‍යයනය
- ගබඩාවල සිටින අර්තාපල් ආකන්ද සලඹයා සඳහා පයිරිමිෆොස්මෙතිල් 2% සංයෝගය ඇගයීම.
- අර්තාපල් යුෂ උරා බොන පළිබෝධවලට එරෙහිව නව පළිබෝධනාශක ඇගයීම

- ගෝවා දළඹු සංකීර්ණයට එරෙහිව නව පළිබෝධනාශක ඇගයීම

## ව්‍යාධිවේදය

- අර්තාපල් පසු අංගමාරයට එරෙහිව දිලීරනාශක පරීක්ෂා කර බැලීම
- පසු අංගමාරයට එරෙහිව වාණිජ අර්තාපල් ප්‍රභේද සහ නව අර්තාපල් අභිජනන ආර පරීක්ෂා කර බැලීම
- අර්තාපල් වල පිටි කබොළු රෝගයට එරෙහිව අර්තාපල් ප්‍රභේද පරීක්ෂා කර බැලීම
- පිටි කබොළු රෝගයට එරෙහිව වසංගත විද්‍යා අධ්‍යයනය
- නුවරඑළියේ රජයේ බීජ අර්තාපල් ගොවිපළවල බැක්ටීරියා මැලවීම නිරීක්ෂණය කිරීම

## පාංශු විද්‍යාව

- ජල රෝපණය සඳහා විවිධ පෝෂක සංයෝග පරීක්ෂා කර බැලීම
- ගෝල්ඩන් ස්ටාර් ප්‍රභේදයේ ආකන්ද අස්වැන්න කෙරෙහි දියර පොහොර ද්‍රාවණවල විවිධ සාන්ද්‍රණ පරීක්ෂා කිරීම
- බීට් රූට් සඳහා විවිධ පොහොර සංයෝග පරීක්ෂා කර බැලීම
- අර්තාපල්වල ආකන්ද අස්වැන්න කෙරෙහි විවිධ පොහොර සංයෝග පරීක්ෂා කිරීම
- භූමිය වැඩිදියුණු කිරීම සහ පස සංරක්ෂණය කිරීම

## එළවළු

- හඳුන්වා දෙන ලද විදේශීය කැරට්, ගෝවා, ලීක්ස් සහ මල් ගෝවා ප්‍රභේද අනුවර්තන හැකියාව සම්බන්ධයෙන් ඇගයීමට ලක් කරන ලදි.
- ආරක්ෂිත කෘෂිකර්මය යටතේ බෙල් පෙපර්, අයිස් බර්ග් සලාද කොළ, මල් ගෝවා, සලාද පිපිඤ්ඤා පිළිබඳව අධ්‍යයනය කිරීම

## බිම්මල්

- බිම්මල් ඒකකය සහ බිම්මල් බීජ නිෂ්පාදන විද්‍යාගාරය ස්ථාපිත කිරීම
- ඉහළ අස්වනු ලබා ගැනීම සඳහා වැඩිදියුණු කරන ලද වගා මාධ්‍ය සහ බිම්මල් බීජ උපස්ථර සකස් කිරීම
- ඔයිස්ටර් සහ ෂිටාකේ යනාදියෙහි නව ප්‍රභේද හඳුන්වා දීම

## පලතුරු

- පොයාර්ස්, ස්ට්‍රෝබෙරි සහ පැෂන් වල ප්‍රභේදීය ඇගයීම

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරි | 06 |
| පරිපාලන නිලධාරි | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 01 |
| වැඩසටහන් සහකාර | 01 |
| පර්යේෂණ සහකාර | 06 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 04 |
| ගොවිපළ ලිපිකරු | 01 |
| රියදුරු | 03 |
| පර්යේෂණ උප සහකාර | 02 |
| ක්ෂේත්‍ර යන්ත්‍ර (පස්) ක්‍රියාකාරු | 01 |
| තවාන්කරු | 01 |
| මුරකරු | 06 |
| කම්කරු | 14 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 34 |
| **එකතුව** | **83** |

## 1.2.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල

උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු මගින් ප්‍රධාන වශයෙන්ම එළවළු, පලතුරු, මුල් සහ ආකන්ද බෝග, බිම්මල් සහ මල්වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස තාක්ෂණය ජනනය කිරීම සහ පතුරුවා හැරීම සිදු කරයි. ඊට අමතරව, රෝපණ ද්‍රව්‍ය නිපදවීම සහ බෙදා හැරීම සහ විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දකුණු කලාපයේ බෝග නිෂ්පාදනයෙහි තිරසාර බව සහතික කිරීම පිණිස ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ ගොවීන් පුහුණු කිරීමත් දැනුම ලබාදීමත් කෙරෙහිද සිය අවධානය යොමු කරයි.

### අයවැය

**වගු අංක 1.2.5.1: වාර්ෂික අයවැය - 2013 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| පුනරාවර්තන | 5,754,600 | 5,488,554 | 95 |
| මූලධන | 1,755,640 | 1,068,842 | 61 |
| ව්‍යාපෘති | | | |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - ෆ්‍යුසාරියම් මැලවීම සම්බන්ධයෙන් කෙසෙල් නලස්ථව විකෘති ජනනය කිරීම | 479,910 | 472,004 | 98 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම (බිම්මල්) වැඩසටහන | 417,300 | 402,007 | 96 |
| KOPIA බිම්මල් වැඩසටහන | 1,432,778 | 39,131 | 0 |
| පටක රෝපණ තාක්ෂණය මගින් වැදගත්කමකින් යුත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම | 1,500,000 | 1,493,847 | 99 |
| දෙමුහුම් එළවළු බිහිකිරීමේ ව්‍යාපෘතිය | 375,000 | 332,000 | 89 |
| **එකතුව** | **11,715,228** | **9,296,385** | **79** |

# ප්‍රගතිය

## පර්යේෂණ

### ප්‍රවේණිය සහ පැළෑටි අභිජනනය

#### මෑ

- හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් එළවළු කව්පි එකතුන් 06ක් එක්රැස් කර ගන්නා ලදි.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ නිර්දේශිත මෑ (*Vigna sesquipedalis*) ප්‍රභේදයක් සමඟ ආර 05ක් ඇගයීමට ලක් කෙරිණි.
- මෑ/ එළවළු කව්පි ලෙස යෝග්‍ය ආර හඳුනා ගැනීම සඳහා ජනකප්ලාස්ම පරික්ෂා කර බලන ලදුව වැඩිදුර ඇගයීම සඳහා එකතුන් 06ක් (මෑ/ එළවළු කව්පි) වරණය කර ගන්නා ලදි.

#### වම්බටු

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ වම්බටු ප්‍රභේද 02ක් සමඟ ආර 03ක් අගයන ලදි.
- හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වම්බටු එකතුන් 06ක් එක්රැස් කර ගන්නා ලදි.

#### මිරිස්

දකුණු පළාතෙන් එක්රැස් කරගත් සාම්ප්‍රදායික මිරිස් එකතුන් 40ක් ඇගයීමට ලක් කළ අතර වැඩිදුර ඇගයීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි ආර 05ක් වරණය කරන ගන්නා ලදි.

#### බතල

වඩාත්ම හොඳ බතල ආරක් තෝරා ගැනීම සඳහා නිල්වලා ප්‍රදේශයේ ගොවි ක්ෂේත්‍ර දෙකකදී බතල ආරවල අනුවර්තන හැකියාව පිළිබඳව පරික්ෂාවට ලක් කෙරිණි.

### උද්‍යාන බෝග

#### කෙසෙල්

බෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වාර්ෂික රෝපණ ක්‍රමය යටතේ කෙසෙල් වගාව සඳහා වූ පොටෑසියම් ප්‍රමාණය පිළිබඳව සහ එහි කළමනාකරණය පිළිබඳව තක්සේරු කෙරිණි.

### ව්‍යාධිවේදය සහ ක්ෂුද්‍ර ජීවි ජෛව තාක්ෂණය

#### බිම්මල්

- මුතුබෙලි බිම්මල් වල (*Pleurotus mushroom*) වර්ධනය සහ අස්වැන්න කෙරෙහි අඟුරු, ග්ලිරිසීඩියා සහ කොහොඹ කොළ පවුඩර් ලෙස සකස් කර යෙදූ විට ඇති වන බලපෑම හඳුනා ගන්නා ලදි.
- මුතු බෙලි බිම්මල් වල (*Pleurotus mushroom*) අඩංගු ප්‍රෝටීන්, මේදය, ලවණ සහ වියළි ද්‍රව්‍ය පිළිබඳව මූලික වශයෙන් විශ්ලේෂණය කරන ලදි.

### පටක රෝපණය

#### ෆ්‍යුසාරියම් මැලවීමට ප්‍රතිරෝධී වීම / ඔරොත්තු දීම සඳහා කෙසෙල් නලස්ථව විකෘතිජනනය කිරීම.(ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම)

- BAP ලීටරයකට මි.ග්‍රෑ.4ක් සහ IAA ලීටරයකට මි.ග්‍රෑ.2ක් සමඟ විකරණය කරන ලද මුරෂිග් ස්කූග් මාධ්‍යයෙහි ප්‍රරෝහ (cv.Agra) ගුණනය කිරීම නලස්ථව සිදු කරන ලදි.
- අග්‍රා (cv.Agra) කෙසෙල් ප්‍රභේදයේ ප්‍රරෝහ අග්‍රස්ථ කෙසෙල් රෝපිත විකෘති කිරීම සඳහා එතිල් මීතෙන් සල්ෆනේට් රසායනික විකෘතිකාරකයේ යෝග්‍ය මාත්‍රාව හඳුනා ගැනීම සඳහා අත්හදා බැලීම් තුනක් සිදු කරන ලදි.

- මල් ගෝවා හැඩැති ව්‍යුහයක් සහිත විභාජක ලබා ගැනීම සඳහා 22.3mg/ l BAP + 0.175mg/l IAA + 3% සුක්රෝස් + 0.3% ජෙල්රයිට් + 10mg/l ඇස්කොබික් ඇසිඩ් යෙදු විකරණය කරන ලද MS මාධ්‍යයෙහි සීග්‍රයෙන් විභාජක ප්‍රගුණය කිරීම ප්‍රේරණය කරන ලදි.

## ව්‍යාපෘති

### පටක රෝපණ තාක්ෂණය හරහා වැදගත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම

- මෙම වසරේදී පටක රෝපණය පාදකව රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ආරම්භ කළ අතර සියළුම නිර්දේශිත කෙසෙල් ප්‍රභේදවල නලස්ථ රෝපිත ගුණනය කෙරෙමින් පවතී.
- මුරුසියස් අන්නාසි ප්‍රභේදයේ නලස්ථ ගුණනය ආරම්භ කෙරිණි.
- වරණය කර ගන්නා ලද මල් බෝගවල (ඕකිඩ්,ජිප්සොෆිලා විශේෂ සහ කපුරු) රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම භාර ගන්නා ලදි.
- පටක රෝපිත පැළ නඩත්තු කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ආරක්ෂිත කරන ලද ආරක්ෂිත ගෘහයක් ($46m^2$) ඉදි කෙරිණි.
- පටක රෝපිත පැළ දැඩි කිරීම සඳහා පැළ ප්‍රචාරකයක් ($14m^2$) ස්ථාපිත කරන ලදි.
- ඇන්තූරියම් පිළිබඳ පර්යේෂණ සහ වැඩිදියුණු කිරීමේ කටයුතු පහසු කිරීම සඳහා සෙවන ගෘහයක් ($54m^2$) අළුත් වැඩියා කරන ලදි.
- ඕකිඩ් වගා කිරීම සඳහා සෙවන ගෘහ($72m^2$) පහසුකම් වැඩිදියුණු කරන ලදි.
- පටක රෝපණ රසායනාගාර පහසුකම් වැඩිදියුණු කෙරිණි.

### දෙමුහුම් එළවළු ප්‍රභේද බිහි කිරීම

පළමු කන්නයේදී කරවිල (ග්‍රෑම් 150ක්) සහ පිපිඤ්ඤා මාපිය ආර වල බීජ (ග්‍රෑ. 250) නිපද වූ අතර දෙවන කන්නය සඳහා වැඩ කටයුතු ආරම්භ කෙරිණි.

### ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - බිම්මල්

ඔයිස්ටර් බිම්මල් වගාව සඳහා පිරිවැය හිතකර කොම්පෝස්ට් මිශ්‍රණ හඳුනා ගැනිණි.

## KOPIA අරමුදල් සම්පාදිත බිම්මල් ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ තෝරා ගත් ඔයිස්ටර් බිම්මල් වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට ක්‍රමෝපායන් සැලසුම් කෙරිණි.

### එළවළු බීජ නිෂ්පාදන වැඩසටහන (විවෘතව පරාගනය වන ප්‍රභේද)

හෙ. 0.5ක වපසරියක එළවළු බීජ (විවෘතව පරාගනය වන) නිෂ්පාදනය කෙරිණි.

### වෙනත් කටයුතු

- අක්කර 1.5ක් වූ පර්යේෂණ ක්ෂේත්‍රයේ මූලික සංවර්ධන කටයුතු ආරම්භ කෙරිණි.
- එළවළු ආදර්ශන බිම් කට්ටි ස්ථාපිත කිරීම
- මාතර, ගාල්ල, හම්බන්තොට, රත්නපුර සහ ගම්පහ දිස්ත්‍රික්ක වලදී පුද්ගලයින් 1000ක සහභාගීත්වයෙන් බිම්මල් පිළිබඳ පුහුණු වැඩසටහන් 18ක් පැවැත්විය.
- පුද්ගලයන් තිදෙනෙකු සඳහා සුළු පරිමාණයේ පටක රෝපණ විද්‍යාගාර ස්ථාපිත කිරීම සඳහා පුහුණුව ලබාදුන් අතර කෙසෙල් පටක රෝපණය කිරීම

සඳහා මේ වන විට එක් විද්‍යාගාරයක් ස්ථාපිත කර ඇත.

- අභ්‍යාසලාභීන් 100කට සහ 25කට පුහුණුව ලබාදීම සඳහා පිළිවෙළින් කෙසෙල් පිළිබඳ පුහුණු වැඩසටහන් 05ක් සහ අන්නාසි පිළිබඳ පුහුණු වැඩසටහන් 03ක්ද සිදු කෙරිණි.
- බිම්මල් නිෂ්පාදනය සඳහා ඒකකයක් ඉදි කෙරිණි.
- ඖෂධ පැළෑටි උයන ස්ථාපිත කෙරිණි.
- රෝපණ ද්‍රව්‍ය සහ කොම්පෝස්ට් නිපදවීම

| | |
|---|---|
| අන්නාසි | - 5840 |
| කෙසෙල් | - 3500 |
| කොම්පෝස්ට් | - ටොන් 8 |
| බිම්මල් බීජ | - පැ. 185 |
| නලස්ථ කෙසෙල් රෝපිත | - 35 |

## සහභාගී වූ සම්මේලන සහ සම්මන්ත්‍රණ

සාක් රටවල් වල බෝග ඵලදායිතාව සහ ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට නව්‍ය බෝග වගා ක්‍රම ප්‍රචලිත කිරීම පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ සහ සාක් කෘෂිකර්ම මධ්‍යස්ථාන වල පැවති සම්මන්ත්‍රණ වලට සහභාගි විය.

# 2014 වසර සඳහා සැලැස්ම

## පැළෑටි අභිජනනය

- අස්වැන්න සහ අනෙකුත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් ඵලවළු කව්පි එකතුන් ඇගයීමට ලක් කෙරිණි.
- වසර පුරා නිෂ්පාදනය කිරීම සඳහා ඵලවළු කව්පි සහ මෑ ජනකප්ලාස්ම වල අස්වැන්න පිළිබඳව ඇගයීම.
- පහතරට වම්බටු වල ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ලක්ෂණීකරණය, කළමනාකරණය, ඇගයීම සහ වරණය කිරීම.
- පහතරට දේශීය සාම්ප්‍රදායික ඵලවළු වල ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ලක්ෂණීකරණය, ඇගයීම සහ වරණය.
- නෙමටෝඩාවන්ට ප්‍රතිරෝධී ඉහළ අස්වනු ගෙන දෙන ඉන්නල ප්‍රභේද සම්බන්ධයෙන් ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ලක්ෂණීකරණය, ඇගයීම සහ වරණය කිරීම.
- නිල්වලා ප්‍රදේශයේ ස්ථාන 4කදී ලවණතාවයට ඔරොත්තු දෙන බතල ආර වල අනුවර්තන හැකියාව පිළිබඳව පරීක්ෂා කර බැලීම.

## උද්‍යාන බෝග

- බෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වාර්ෂික රෝපණ ක්‍රමය යටතේ කෙසෙල් සඳහා වූ පොටෑසියම් ප්‍රමාණය සහ එහි කළමනකරණය අඛණ්ඩවම සිදු කිරීම. (උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ සහභාගීත්වයෙන්)
- අන්නාසි වගාවට ආසාදනය වන පිටි මකුණා සමෝධානිකව කළමනාකරණය කිරීම.

## ව්‍යාධිවේදය සහ ක්ෂුද්‍ර ජීවී ජෛව තාක්ෂණය

- වරණය කරගත් මුතුබෙලි බිම්මල් වල පෝෂණීය පැතිකඩ සහ ප්‍රතිඔක්සිකාරක ගුණය පිළිබඳ හඳුනා ගැනීම.
- බිම්මල් වලින් සාදාගන්නා නිෂ්පාදන බිහි කිරීම.
- පිළිවෙළින් බැක්ටීරියා මැලවීම, මිරිස් කොළ කොඩවීම සහ ප්‍රධාන පළිබෝධ සහ රෝග සම්බන්ධයෙන් වම්බටු, මිරිස් සහ ඉන්නල ජනකප්ලාස්ම ඇගයීම.

## ජෛව තාක්ෂණය සහ පටක රෝපණය

### ෆ්‍යුසාරියම් මැලවීමට ප්‍රතිරෝධීවීම/ ඔරොත්තු දීම සඳහා නලස්ථව කෙසෙල් විකෘති ජනනය කිරීම

- රිකිලි අග්‍රස්ථ ගුණනය කිරීම සහ රිකිලි අග්‍රස්ථ රෝපිත සමූහව ප්‍රවිකිරණය කිරිම.
- ප්‍රවිකිරණය කළ ප්‍රරෝහ අග්‍රස්ථ නලස්ථව ගුණනය කිරිම.
- මල් ගෝචා හැඩැති ව්‍යුහයක් සහිත විභාජක වල (CLMs) මතුපිට කොටසේ පටක මගින් ලබා ගන්නා රෝපිත (Scalp cultures) ස්ථාපිත කිරිම.
- කලලජනන සෛල අවලම්බන රෝපිත (ECS) ස්ථාපිත කිරීම.
- පටක රෝපණ තාක්ෂණය මගින් වැදගත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම.
- කෙසෙල්, අන්නාසි සහ තෝරාගත් මල් බෝග කීපයක් සම්බන්ධයෙන් අඩු පිරිවැයති ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රමවේද හඳුනා ගැනීම.
- පෞද්ගලික අංශයේ විද්‍යාගාර සඳහා මූලික රෝපණ ද්‍රව්‍ය ලෙස කෙසෙල් සහ ඕකිඩ් වල නලස්ථ රෝපිත සැපයීම.
- පටක රෝපණය සඳහා අවශ්‍ය පහසුකම් ඉහළ නැංවීම.
- රෝපණ ද්‍රව්‍ය සහ කොම්පෝට් නිපදවීම

| | |
|---|---|
| අන්නාසි | - 5000 |
| කෙසෙල් | - 3500 |
| කොම්පෝස්ට් | - ටොන් 8 |
| බිම්මල් බීජ | - පැකට් 300 |

## වෙනත්

- KOPIA බිම්මල් ව්‍යාපෘතිය
- හෙ.1ක වපසරියක එළවළු බීජ (විවෘතව පරාගනය වන ප්‍රභේද) නිපදවීම.
- පර්යේෂණ ක්ෂේත්‍රය සංවර්ධන කිරිම සහ ජලසම්පාදන පහසුකම් සැපයීම.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 02 |
| කෘෂිකර්ම නිලධාරි | 01 |
| වැඩසටහන් සහකාර | 03 |
| සංවර්ධන නිලධාරි | 01 |
| පර්යේෂණ සහකාර | 02 |
| කෘෂිකර්ම උපදේශක | 06 |
| පර්යේෂණ උප සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| ගොවිපළ ලිපිකරු | 02 |
| කාර්යාල සහායක | 01 |
| ගබඩාකරු | 01 |
| රියදුරු | 02 |
| මුරකරු | 05 |
| කම්කරු | 05 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| කොන්ත්‍රාත් කම්කරු | 31 |
| **එකතුව** | **67** |

# 1.2.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ

ගිරාඳුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය 1980දී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ස්ථාපිත කරන ලදි. 1984දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරන ලද මෙම ආයතනය කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් මෙන්ම විශේෂයෙන්ම $IL_2$ දේශගුණික කලාපයට අයත් මහවැලි “ C ” කලාපයේ ගොවි ජනතාවගේ බෝග නිෂ්පාදනයට අදාළ ක්ෂේත්‍ර ගැටළු නිරාකරණය කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. 2000 වර්ෂය දක්වා බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වූ මෙම ආයතනය අනතුරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අනුබද්ධ කරන ලදි.

එළවළු, පලතුරු සහ මුල් සහ ආකන්ද බෝගවල ඵලදායිතාව ඉහළ නැංවීමෙහිලා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු කෙරෙහි සිය අවධානය යොමු කරන මෙම ආයතනය පර්යේෂණ සහ නිෂ්පාදන වැඩසටහනට අමතරව නිළධාරීන්, ගොවීන්, පාසැල් සිසුන් සහ අනෙකුත් සංවිධානවල පුද්ගලයන් සඳහා අඛණ්ඩවම පුහුණු වැඩසටහන් පවත්වමින් මහවැලි “ C ” කලාපයේ ගොවි ප්‍රජාව වෙත සිය සේවය ලබාදේ.

## අයවැය

2013 වසරේ විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 1.2.6.1 හි දැක්වේ.

**වගු අංක 1.2.6.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශිර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 2,165,000 | 674,945 | 31 |
| පුනරාවර්තන | 4,996,525 | 4,987,055 | 100 |
| • එළවළු දෙමුහුම් බීජ නිෂ්පාදන වැඩසටහන | 350,000 | 349,259 | 100 |
| • පැහිරි ඇගයීමේ වැඩසටහන (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම ව්‍යාපෘතිය) | 100,000 | 97,962 | 98 |
| • සාම්ප්‍රදායික එළවළු බීජ නිෂ්පාදන වැඩසටහන | 220,000 | 207,465 | 94 |
| • පලතුරු ගම්මාන සංවර්ධන වැඩසටහන | 400,000 | 386,429 | 97 |
| • කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම ව්‍යාපෘතිය) | 50,000 | 50,000 | 100 |
| • ගොවි භාර අරමුදල (බිත්තර වී නිෂ්පාදන වැඩසටහන) | 680,000 | 611,380 | 90 |
| **එකතුව** | **8,961,525** | **7,364,497** | **82** |

# ප්‍රගතිය

## පර්යේෂණ

### පලතුරු

- දේශීය සහ හඳුන්වා දෙන ලද පැඟිරි ප්‍රභේද සම්බන්ධයෙන් ප්‍රභේදීය ඇගයීම අඛණ්ඩවම සිදු කිරීම.

### ප්‍රභේද

දේශීය - ප්‍රභේද 07ක් (ආරෝග්‍යා, බිබිල ස්වීට්, MKD, රහංගල වර්ණය, HOCR 23, HOCR 25 සහ HOCR 29)

හඳුන්වා දෙන ලද - ජපානයෙන් ප්‍රභේද 08ක් (NCN, MYG, OTA, NAN, OUT, YSD, SRD, KYM)

- කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.

  ප්‍රභේද ගණන - 07ක් (HOSE 21, PGRC 2, PGRC 1, පැරකුම්, HOSE 13, HCK 143, MKS)

- විදේශීය පැපොල් සහ කොමඩු ප්‍රභේද ඇගයීම.
- ඉදිරි පර්යේෂණ කටයුතු සඳහා හෙ. 4ක මිශ්‍ර පලතුරු උයනක් ස්ථාපිත කරන ලදි.

### එළවළු

- පහත දැක්වෙන එළවළු සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදි.

**වගු අංක 1.2.6.2: එළවළු සම්බන්ධයෙන් සිදු කරන ලද ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්**

| බෝගය | 2012/13 මහ | 2013 යල |
|---|---|---|
| වම්බටු | ප්‍රභේද 05 | ප්‍රභේද 06 |
| මෑ | ප්‍රභේද 07 | ප්‍රභේද 05 |
| මාළුමිරිස් | ප්‍රභේද 05 | - |
| තක්කාලි | ප්‍රභේද 06 | - |
| දඹල | - | ප්‍රභේද 04 |

- SAARC වට්ටක්කා ප්‍රභේද ඇගයීම - වැඩසටහන 2013 යල කන්නයේදී සිදු කරන ලදි.

### වී (ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම)

- 2012/13 මහ සහ 2013 යල කන්න වලදී මාස 2 ½, මාස 03, මාස 3 ½, මාස 04 සහ මාස 4 ½ යන වයස් කාණ්ඩ වලට අයත් වී සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සිදු කරන ලදි.
- 2013 යල කන්නයේදී වී ප්‍රභේද 16ක් සම්බන්ධයෙන් මූලික අස්වනු අත්හදා බැලීම සිදු කෙරිණි.

### වෙනත් ක්ෂේත්‍ර බෝග/ මුල් සහ ආකන්ද බෝග

- වෙනත් ක්ෂේත්‍ර බෝග, මුල් සහ ආකන්ද බෝග සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කෙරිණි.
- බතල සම්බන්ධයෙන් 2012/13 මහ කන්නයේදී අත්හදා බැලීම් හයක් සහ 2013 යල කන්නයේදී අත්හදා බැලීම් 06ක් සිදු කරන ලදි.

## බීජ නිෂ්පාදන වැඩසටහන

### අභිජනක බීජ නිෂ්පාදන වැඩසටහන - වම්බටු

අමන්දා ජායාංගි මාපියන් 2013 වසරේදී හෙ. 0.04ක ස්ථාපිත කළ අතර අභිජනන බීජ කි.ග්‍රෑ. 13ක් නිපදවිය.

## බිත්තර වී නිෂ්පාදන වැඩසටහන

2012/13 මහ කන්නයේදී නිෂ්පාදන තොගයක් ලෙස Bg 360හි කි.ග්‍රෑ. 18,291ක්, සුවඳැල් වී කි.ග්‍රෑ. 4,275ක්, පච්චපෙරුමාල් වී කි.ග්‍රෑ. 1,990ක් නිපදවූ අතර 2013 යල කන්නයේදී සහල් බිස්කට් නිෂ්පාදන වැඩසටහන වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ AT 306හි බිත්තර වී කි.ග්‍රෑ. 19,560ක් නිපදවිය.

## ලියාපදිංචි කළ සෝයා බෝංචි බීජ නිෂ්පාදන වැඩසටහන (Pb1)

2012/13 මහ කන්නයේදී සෝයා බෝංචි බීජ ( Pb1) කි.ග්‍රෑ.1409ක් නිපදවන ලදි.

## රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගුඅංක 1.2.6.3 : 2013 වසර තුළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| බෝගය | ප්‍රභේදය | 2013 වසරේ නිෂ්පාදිතය |
|---|---|---|
| කෙසෙල් | ඇඹුල් කෙසෙල්, කණ්ඩුල සහ අනෙකුත් ප්‍රභේද | මොරෙයියන් 95ක් |
| මඤ්ඤොක්කා | කිරිකවඩි සහ ජැෆ්නා වරණය | කඳ කැබලි මීටර් 110ක් |
| බතල | ගන්නෝරුව සුදු, රණබිම, අමා සහ ධවල | කැබලි කි.ග්‍රෑ 17ක් |
| පැපොල් | රත්න | බද්දුන් පැළ 228ක් |
| ඇඹරැල්ලා | | පැළ 13ක් |

## තාක්ෂණය පතුරුවාලීම

2013 වසරේදී ගිරාඳුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් සිදු කරන ලදි. මෙම වසරේදී තොරතුරු ලබා ගැනීම සහ වෙනත් සේවාවන් ලබා ගැනීම සඳහා පාසැල් සිසුන්, ගොවීන් සහ රජයේ සේවකයන් 328කට වැඩි සංඛ්‍යාවක් මෙම ආයතනයට පැමිණි අතර ජාතික තරුණ සභාවේ එක් සිසුවෙක් මාස 03ක හුරු පුහුණුව ආරම්භ කරන ලදි.

## 2014 සැලැස්ම

- වරණය කරගත් එළවළු සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම.
- වී පිළිබඳ මූලික අස්වනු අත්හදා බැලීම.
- වරණය කරගත් ආකන්ද බෝග සහ වෙනත් ක්ෂේත්‍ර බෝග සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- වරණය කරගත් ආකන්ද බෝග, පලතුරු, එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර

බෝග වල බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය.

- කෙසෙල් පිළිබඳව ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- පැළෑටි නාශක සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ පරීක්ෂා කිරීම.
- විදේශීය පැඟිරි එකතුන් ප්‍රචාරණය කිරීම.
- හිතකර ලක්ෂණ සම්බන්ධයෙන් විදේශිය අඹ ජනක ප්ලාස්ම ඇගයීම.
- ඌන භාවිත පලතුරු බෝග උයන පුනරුත්තාපනය කිරීම.
- වම්බටු අභිජනක බීජ නිෂ්පාදන වැඩසටහන.
- දේශීයව රැස්කර ගත් "එළබටු" ආර එක්රැස් කිරීම, ලක්ෂණීකරණය සහ ඇගයීම.
- මාළු මිරිස් සංශුද්ධ කිරීම. (ලංකා යෙලෝ වැක්ස්)
- "රතු බණ්ඩක්කා" සහ "මහවැලි මෑ" යන සාම්ප්‍රදායික ප්‍රභේද වල බීජ සුලභතාවය ඉහළ නැංවීම.
- විවෘතව පරාගනය කරන ලද නිර්දේශිත "නිවිති, දඹල, වැටකොළු" ප්‍රභේදවල එළවළු බීජ නිෂ්පාදන වැඩසටහන.
- බිත්තර වී නිෂ්පාදන වැඩසටහන.
- පාසැල් සිසුන් සහ ගොවීන් සඳහා ව්‍යාප්ති සහ පුහුණු වැඩසටහන්.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරී | 02 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| පර්යේෂණ සහකාර | 03 |
| තාක්ෂණික සහයක | 01 |
| පර්යේෂණ උප සහකාර | 02 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර (III) | 01 |
| ගොවිපළ ලිපිකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| කාර්මික ශිල්පී (III) | 01 |
| ගබඩාකරු | 01 |
| වඩු බාස් | 01 |
| සංචාරක බංගලා බාරකරු | 01 |
| මුරකරු | 07 |
| රියදුරු | 01 |
| කම්කරු (III ශ්‍රේණිය) | 22 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 25 |
| **එකතුව** | **72** |

# 1.3 පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය - හොරණ

ශ්‍රී ලංකාව තුළ පලතුරු බෝගවල නිෂ්පාදනයන්හි ඵලදායීතාවයත් පලතුරු වල ගුණාත්මක බවත් ඉහළ නැංවීම උදෙසා උචිත තාක්ෂණයන් වැඩිදියුණු කිරීම හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත පවරන ලද වගකීම වේ.

සැටලයිට් පර්යේෂණ ස්ථානයන්, මධ්‍යස්ථාන, ඒකක සහ ගොවිපලවල් හට නායකත්වය ලබාදෙන අතර ආයතනය පහතරට තෙත් කලාපීය අනුවර්තිත උචිත පලතුරු බෝග සඳහා විශේෂ අවධානයක් ලබා දෙයි. වර්තමාන පර්යේෂණ වැඩසටහන් විශේෂයෙන්ම ඉහළ අස්වැන්න හා ගුණාත්මකබවින් යුතු පලතුරු ප්‍රභේද වැඩිදියුණු කිරීම, වැඩිදියුණු කළ බෝග කළමනාකරණය පිළිවෙත්, බෝග සංරක්ෂණය, පැළෑටි පෝෂක, කාබනික පලතුරු රෝපණය සහ පැළෑටි ප්‍රචාරණ ක්‍රමෝපායන්, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය යන අරමුණු සාක්ෂාත් කරගැනීම කේන්ද්‍ර කරගනු ලැබේ. ආයතනය පහතරට තෙත් කලාපයේ ගොවි අවශ්‍යතා සාක්ෂාත් කරලීමේදී එම දේශගුණ තත්ත්වයන්ට උචිත අනුවර්තිත ඵලවළු පිළිබඳව වූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලීන්හිද නිරත වේ.

## අයවැය

**වගුව 1.3.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂ | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 12,131,840 | 2,005,302 | 17 |
| පුනරාවර්තන | 22,434,450 | 14,990,899 | 67 |
| කෙසෙල්වල පොටෑසියම් කළමනාකරණය (ජා.වි.ප.ව්‍යා) | 100,000 | 93,949 | 94 |
| පලතුරු ශාකවල මල්හට ගැනීම ප්‍රේරණය මගින් ඵලදායීතාව ඉහළ දැමීම | 1,000,000 | 989,085 | 99 |
| පලතුරු ගම්මාන සංවර්ධනය | 30,000,000 | 28,815,298 | 96 |
| දෙමුහුම් බීජ සංවර්ධනය (ඵලවළු - බණ්ඩක්කා) | 200,000 | 187,815 | 94 |
| විවිධ කෘෂි පාරිසරික කලාපවල බලාපොරොත්තු තැබිය හැකි කෙසෙල් එකතුන් ඇගයීම (ජා.කෘ.ප.ව්‍යා) | 100,000 | 88,966 | 89 |
| වැඩි අස්වනු ඉහළ ගුණාත්මක පැඟිරි ප්‍රභේද සංවර්ධනය (දොඩම් සහ ජමනාරං) (ජා.කෘ.ප.ව්‍යා) | 1,555,200 | 1,401,738 | 90 |
| වාණිජ වගාව සඳහා බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද සංවර්ධනය (ජා.කෘ.ප.ව්‍යා) | 270,000 | 267,363 | 99 |

| වැය ශීර්ෂ | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ ප්‍රධාන පේර (*Psidium guajava*)වගා ප්‍රදේශවල මූල ගඩු නෙමටෝඩා (*Meloidogyne* .spp) වන්ගේ ජෛව විද්‍යාව හා කළමනාකරණය අධ්‍යයනය (ජා.කෘ.ප.ව්‍යා) | 1,180,500 | 841,679 | 71 |
| පවතින ජනකප්ලාස්මයන්ගෙන් ගුණාත්මක වැඩි අස්වනු අඹ ප්‍රභේද සංවර්ධනය (ජා.කෘ.ප.ව්‍යා) | 889,800 | 737,883 | 83 |
| වැඩි අස්වනු ඉහළ ගුණාත්මක පැපොල් ප්‍රභේද සංවර්ධනය | 350,000 | 344,586 | 98 |
| අන්නාසි ඵලදායීතාවය වැඩිකිරීම උදෙසා කාර්යක්ෂම පෝෂක කළමනාකරණ පිළිවෙත් මාලාවක් සංවර්ධනය | 181,500 | 134,230 | 74 |
| පලතුරු ගස් කප්පාදුව සහ නැවත සැකසීම | 3,000,000 | 2,555,344 | 85 |
| පටක රෝපණ තාක්ෂණය මගින් වැදගත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | 2,270,000 | 2,130,837 | 94 |
| **එකතුව** | **75,663,290** | **55,584,974** | **73** |

## ප්‍රගතිය

### බෝග ප්‍රවර්ධනය

#### මුල් රහිත හෝ දුර්වල මූල පද්ධති බෝගවල කාර්යක්ෂම අතු බැදීමේ ක්‍රමෝපායන් සංවර්ධනය

පලතුරු බෝග අතුරෙන් අනෝදා(*Anona muricata*), මැංගුස් (*Garcinia mangostana)* ජැම් පේර (*Psidium cattlelanum*) වැනි පලතුරු බෝග පෝච්චි වල වගා කිරීම නගරබද උද්‍යාන බෝග වගාවේ නවතම ප්‍රවනතාවයක් බවට පත්ව ඇත. අතු බැදීම සිදු කළ ශාකවල ආගන්තුක මූල පද්ධතිය හේතු කොට එම ශාක මුදුන් මූල පද්ධතිය සහිත බද්ධ පැළවලට වඩා පෝච්චි සහිත ගෙවතු වගාව උදෙසා යෝග්‍ය වේ. කෙසේ වුවද මෙම පලතුරු වායව අතු බැදීමට හොඳින් ප්‍රතිචාර නොදක්වයි. එමනිසා මූල පද්ධති ඇතිවීමේ කාර්යක්ෂමතාව වැඩිකිරීමේ අරමුණු ඇතිව පසට කාවද්දන ලද මූල පද්ධතිය සමඟ වායව අතු බැදීමද සිදු කරනු ලැබිය. පරීක්ෂා කළ බෝග 3 අතුරෙන් අනෝදා 42%ක සාර්ථකත්ව ප්‍රතිශතයක් සහිතව මූල පද්ධතිය වැඩුණු අතර අනෙකුත් බෝග මෙම ක්‍රමවේදයට ප්‍රතිචාරයක් නොදැක්විණි. මෙම අධ්‍යයන ක්‍රමවේදය නැවත සැකසීම මගින් පරීක්ෂණ නැවත සිදු කරනු ලබයි.

#### අස්වැන්න සහ ගුණාත්මක ලක්ෂණ උදෙසා ගොවි ක්ෂේත්‍රවල බලාපොරොත්තු තැබිය හැකි අනෝදා *(A.muricata)* එකතුන් ඇගයීම

තවදුරටත් ඇගයීම උදෙසා ගොවි ක්ෂේත්‍ර ස්ථාන 2ක ඉහළ ගුණාත්මක ලක්ෂණ සහිත තෝරාගත් අනෝදා ඵල එකතුන් ස්ථාපිත කෙරිණි.

### පැපොල් දෙමුහුම් ඇගයීම (දෙමුහුම් බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය මගින් අරමුදල් ප්‍රතිපාදිත)

ඉතාමත් ඉක්මනින් මේරීම ප්‍රතිඵල කොට ගෙන අඩු කාලයකදී ආදායම ලබාගත හැකිවීම හේතුවෙන් වාණිජ උද්‍යාන බෝග වගාවේදී පැපොල් වැදගත් ස්ථානයක් ලබාගනී. වර්තමානයේදී බහුල වශයෙන් වාණිජ පැපොල් බෝග වගාව විදේශීය ප්‍රභේදයන්ගෙන් සමන්විත වේ. සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරමින් බීජ අවශ්‍යතාව සම්පූර්ණයෙන්ම ආනයනය කරනු ලබයි. දේශීය පැපොල් ප්‍රභේද හෝ දෙමුහුම් ප්‍රවර්ධනය උදෙසා වසර ගණනාවක කාල පරාසයක් ගත වනු ලැබුවද පැපොල් ප්‍රවර්ධන වැඩසටහන් කාලීන අවශ්‍යතාවයකි. පලතුරු පර්යේෂණ සංවර්ධන ආයතනයෙහි දෙමුහුම් වැඩසටහනෙහි ප්‍රතිඵලයක් ලෙස ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ වැඩි අස්වනු (වසරකදී ගසකින් 50 Kg කට වැඩි) බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් 2ක් නිෂ්පාදනය කෙරිණි. මෙම දෙමුහුම් ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාප 6ක අගයනු ලබමින් තිබේ. මෙම තෝරාගත් දෙමුහුම් 2014 වර්ෂයේදී වගාව සඳහා ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

### පැපොල් ප්‍රභේද සංවර්ධන (ජාතික කෘෂි පර්යේෂණ ව්‍යාපෘතියේ පැපොල් ව්‍යාපෘතිය මගින් අරමුදල් ප්‍රතිපාදිත)

දැනට පවතින ප්‍රභේද වෙනුවට වගා කිරීම උදෙසා නව පැපොල් ප්‍රභේදවල අඛණ්ඩ සංවර්ධනය සිදු කෙරේ. එක්රැස් කරගත් ඉහළ දේශීය එකතුන් 3වන පරම්පරාව දක්වා උසස් කරනු ලබමින් තිබෙන අතර මීළඟ පරම්පරාව දක්වා උසස් කරනු ලැබීම උදෙසා පැළ 8ක් තෝරා ගනු ලැබිණි.

### පැෂන් ෆෲට් (වැල් දොඩම්) ප්‍රභේද සංවර්ධනය (දෙමුහුම් බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය මගින් අරමුදල් ප්‍රතිපාදිත)

බීජ මගින් වැල් දොඩම් ප්‍රභේද ව්‍යාප්ත කරලීම, සමුච්චිත බීජ සහිත වැල් දොඩම් ප්‍රභේද වැඩිදියුණු කිරීම ඉතාමත් උචිත ක්‍රමවේදයකි. මෙමගින් වාණිජ ප්‍රභේදයන්හිදී වෛරස් ආසාදනය අවම කරමින් එම ප්‍රභේදයන්හට වඩාත් යෝග්‍ය ලක්ෂණ සංයෝජනය උදෙසා ආධාර වේ. එම නිසා පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ වැල්දොඩම් සංවර්ධන වැඩසටහනෙහිදී උචිත ලක්ෂණ සහිත සමුච්චිත බීජ ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම උදෙසා වැඩි පරිශ්‍රමයක් යොදනු ලැබේ. 2013 වර්ෂය තුළදී 3වන සමුච්චිත බීජ පරම්පරාවේ බීජ නිෂ්පාදනය සම්පූර්ණ කරනු ලැබිණි. මෙම බීජ කි.ග්‍රෑ 4ක් නිෂ්පාදනය කරනු ලැබූ අතර එම ප්‍රභේද විවිධ කෘෂි පාරිසරික කලාපවල අගයමින් තිබේ.

### අඹ දෙමුහුම් ඇගයීම (උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය ගන්නෝරුව, දෙමුහුම් බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය මගින් අරමුදල් ප්‍රතිපාදිත)

වර්තමාන ප්‍රභේදයන්හට යෝග්‍ය ගුණාත්මක ලක්ෂණ සංයෝජනය කිරීමේ අරමුණු ඇතිව 2007 වර්ෂය තුළදී දෙමුහුම් අඹ වැඩිදියුණු කිරීම ආරම්භ කරනු ලැබීය. කරත්තකොලම්බන්, වෙල්ලිකොලම්බන්, විලාඩ් සහ නම්ඩොක්මයි යන ප්‍රභේදයන් උපයෝගී කරගනිමින් නිපද වූ දෙමුහුම් 7ක් විවෘත ක්ෂේත්‍ර තුළ අගයනු ලබමින් තිබේ.මෙම බීජ පැළ වල දෙමුහුම්බව තහවුරු කරනු ලැබීමට අවශ්‍ය වන අතර එසේ නොමැති නම් වසර කිහිපයක් මෙම ශාක ක්ෂේත්‍රය තුළ නඩත්තු කරනු ලැබිය යුතුය.එම නිසා පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය හා සහයෝගීත්වය ඇතුව දෙමුහුම්බව තහවුරු කිරීම උදෙසා DNA ජාන විශ්ලේෂණය ආරම්භ කරනු ලැබිණි.

DNA නිස්සාරණ ක්‍රමවේද ඉතාමත් සාර්ථක විය.

## ශාක පරපෝෂිත නෙමටෝඩාවන් හට ප්‍රතිරෝධී පේර ප්‍රභේද වැඩිදියුණු කිරීම

වගා භූමි 6කදී පරම්පරා උසස් කරලීම මගින් ලබා ගත් පේර පැල 119ක් අගයනු ලැබිණි. දෘශ්‍ය නිරීක්ෂණ පදනම්කොට පැල 10ක් තෝරා ගැනිණි. වායව අතුබැඳීම මගින් එම පැළ ප්‍රචාරණය කරනු ලැබ ප්‍රතිඵල තහවුරු කරලීම උදෙසා කීට විද්‍යා අංශයට බාර දුණි.

## බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද වරණය

නිර්දේශිත ප්‍රභේදයන් සමඟ සම්පූර්ණ දූරියන් එකතුන් 68ක් (පෙර රැස් කළ එකතුන් 24, නව එකතුන් 3, උද්‍යාන බෝග ආයතනයේ බලාපොරොත්තු තැබිය හැකි ආර 3ක් බීජ පැල 36ක්) අගයනු ලැබිණි. මෙම ගහනය තුළින් බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද 12ක් තෝරා ගැනිණි. මෙයින් ප්‍රභේද 4ක් 2012 වර්ෂයේ ප්‍රභේද නිදහස් කිරීමේ කමිටු රැස්වීම හට යෝජනා කෙරිණි. ගොවීන් හට ක්ෂේත්‍රයේ වගා කිරීම උදෙසා මෙයින් ප්‍රභේද 2ක් කොන්දේසි සහිතව නිදහස් කෙරිණි. නිර්දේශිත ප්‍රභේද වලින් බද්ධ පැළ වගා කිරීම උදෙසා ලබා ගත හැක.

## දූරියන් F1 දෙමුහුම් වැඩිදියුණු කිරීම

ක්ෂේත්‍ර පාරිසරික තත්ත්වයන් යටතේ දී දූරියන් දෙමුහුම් පැළ 800ක් අගයනු ලබමින් තිබේ. තවත් F1පරම්පරාවේ පැළ 50ක් ඇගයීම උදෙසා ක්ෂේත්‍රයේ වගා කරනු ලැබීමට නියමිතය. මුහුම්කරණය සඳහා මල් සැදීම ප්‍රේරණය කරනු ලැබිණි. බලාපොරොත්තු තැබිය හැකි ආර සමඟ මුහුම්කරණ වැඩසටහන අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

## පැඟිරි විශේෂ ප්‍රභේද වැඩිදියුණු කිරීම

හීන් නාරං (*Citrus crenatifolia*) ප්‍රභේද 14ක්, ජමනාරං (*Citrus reticulata*) ප්‍රභේද 32ක්, පැණි දොඩම් (*Citrus sinensis*) ප්‍රභේද 8ක්, ජම්බෝල(*Citrus maxima*)ප්‍රභේද 16ක්, දෙහි (*Citrus aurantifolia*)ප්‍රභේද 7ක්, අගයනු ලබමින් තිබේ. බලාපොරාත්තු තැබිය හැකි ජමනාරං ප්‍රභේද 3ක් තෝරා ගනු ලැබූ විවිධ කෘෂි පාරිසරික කලාප 8ක අගයනු ලැබීය. බලාපොරොත්තු තැබිය හැකි ජම්බෝල එකතුන් 1ක් තෝරා ගනු ලැබිණි. දෙඩම් එකතුන් ආර 4ක්, ජමනාරං ආර 1ක්, දේශීය ප්‍රභේද 3ක් ක්ෂේත්‍රයේ වගා කරනු ලැබිණි. හඳුන්වා දුන් දේශීය ජපන් පැණි දොඩම් සහ ජමනාරං ප්‍රභේද 8ක් විවිධ කෘෂි පාරිසරික කලාප 8ක අගයමින් පවතී. බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද 3ක් ගොවීන් සඳහා නිදහස් කිරීමට යෝජනා කෙරිණි. 2007 වර්ෂයේදී විකෘති අභිජනන වැඩසටහන ආරම්භ කෙරිණි. වර්තමානයේදී විකෘතිහි (නස්නාරං සහ HOCR 24) ඵලයේ ගුණාත්මක බව පිළිබඳ දත්ත, වර්ධන පරාමිතීන් රැස් කරමින් තිබේ. ඇගයීම උදෙසා දෙමුහුම් 50ක් බද්ධ කරන අතරම මුහුම්කරණ වැඩසටහන අඛණ්ඩව සිදු කෙරේ.

## තෙත් කලාපයේ හමුවන දැනට පවතින ජනක පලාස්මයන්ගේ ගුණාත්මක තත්ත්වයන්ගෙන් ඉහළ වැඩි අස්වනු අඹ ප්‍රභේද වැඩි දියුණු කිරීම (ජාතික කෘෂි පර්යේෂණ වැඩසටහනේ අරමුදල් ප්‍රතිපාදිත)

2011 වර්ෂයේදී හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී බලාපොරොත්තු තැබිය හැකි අඹ එකතුන් රැස් කිරීම හා වරණය ආරම්භ කරනු ලැබිණි. ගොවි ක්ෂේත්‍ර වලින් සහ වෙනත් රජයේ ගොවිපල වලින් විවිධ අඹ එකතුන් 79ක් එකතු කර අඹ ක්ෂේත්‍ර ජාන බැංකුවෙහි ගබඩා කරනු ලැබ ඇත.

හෙක්ටයාර 2/12 ක භූමි ප්‍රමාණයක් මෙම එකතුන් ස්ථාපිත කිරීම උදෙසා අහඹු ලෙස ප්‍රතිවලිත කරන කොටුසැලසුම (RCBD) උපයෝගී කරගනු ලැබිණි. මෙම එකතුන් තෙත් කලාපයේ හොඳින් වර්ධනය වූ ප්‍රභේදයන්ගෙන් සහ විවිධ ව්‍යාපෘති යටතේ විවිධ රටවලින් ලංකාවට ගෙනා ප්‍රභේදයන්ගෙන් සමන්විත වේ. වර්ධන පරාමිතීන් මිනුම්ගත කරනු ලබමින් තිබෙන අතර ජාන බැංකුවෙහි විස්තර වශයෙන් දක්වා අනුරූපණය කෙරෙමින් පවතී. කලින් රැස්කරගත් ජනක ප්ලාස්මයන්ගෙන් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් 1ක් හඳුනාගනු ලැබිණි. මෙම එකතුවෙහි ඵලයේ ගුණාත්මක බව අනුව එහි බ්‍රික්ස් $17^0$, ආසන්න වශයෙන් ගෙඩියේ බර 450g, මාංසල/බීජ අනුපාතය 4:3 සහ ඇන්ත්‍රැක්නෝස් රෝගයට සමාන්‍ය ප්‍රතිරෝධීතාවයක් පෙන්වයි. වල්පිටදී තවත් එකතුන් 5ක් තෝරාගනු ලැබිණි. මෙම තෝරාගත් එකතුන් ගුණනය සිදු කෙරෙමින් පවතී.

### කෙසෙල් ජනක ප්ලාස්ම ඇගයීම

සීනි කෙසෙල් (1වන කණ්ඩායම), පුවාලු, සුවඳැල්, කෝලිකුට්ටු, (2වන කණ්ඩායම) ඇඹුන් සහ බින් කෙසෙල් (3වන කණ්ඩායම) හි ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කෙරෙමින් පවතී. 90% හා 70%ක් පැළවල පිළිවෙලින් පළමු හා දෙවන අස්වැන්න ලබාදුණි. පරීක්ෂණ අඛණ්ඩව සිදුවේ.

### අස්වැන්න හා ගුණාත්මක බව උදෙසා අලිපේර එකතුන් ඇගයීම

හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය තුළ අලිපේර එකතුන් 24ක් අතුරෙන් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් 4ක් හඳුනා ගනු ලැබිණි. කෙසේ වුවද හඳුනා නොගත් රෝග මගින් ශාක ආසාදනය වුණි. හෝමාගම පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානයේදී රෝග හඳුනාගැනීම උදෙසා පරීක්ෂණ සිදු කරනු ලබයි.

### ඌන උපයෝජිත පලතුරු බෝග ජනකප්ලාස්ම රැස්කිරීම, සංරක්ෂණය, ලක්ෂණීකරණය සහ ඇගයීම

2002 වර්ෂයේ අවසන් භාගයේදී මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබිණි. හෙක්ටයාර 3.7ක භූමි ප්‍රදේශයක වූ ක්ෂේත්‍ර ජාන බැංකුව තුළ විවිධ පලතුරු එකතුන් 200ක් ස්ථාපිත කරනු ලැබිණි. මෙම ජාන බැංකුව පහත පලතුරු එකතුන්ගෙන් සමන්විත වේ. බෙලි (24), පැඟිරි (47), ලාවුළු (05), ලොවි (04), කොස් (32), වෙරළු (17), උගුරැස්ස (22), ගොරක (33), ගඩුගුඩා (13), දූරියන් (35), සැපදිල්ලා (17), ජම්බු (26), අනෝදා(14), ජෑම් පේර (07), පේර (07) වගාව සඳහා බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද හඳුනා ගැනීම උදෙසා ලක්ෂණීකරණය හා ඇගයීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. 2012 වර්ෂයේදී කොස් 13ක් සහ ගඩුගුඩා 08ක් ජාන බැංකුව තුළට ඇතුලත් කරනු ලැබිණි.

### සැපදිල්ලා එකතුන් ඇගයීම (*Manilkara zapota*) එකතුන් ඇගයීම

2007 වර්ෂයේ කලාපීය බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් එකතුකරන ලද එකතුන් 17ක් උපයෝගී කොට පරීක්ෂණ ආරම්භ කෙරිණි. මෙම එකතුන් සියල්ලගේම වර්ධන හැකියාව, අස්වැන්න, පලතුරු ගුණාත්මක බව, පලතුරු ප්‍රමාණය, සහ හැඩය අගයනු ලැබීය. වඩාත් බලාපොරොත්තු තැබිය හැකි HoS 2, HoS 12, සහ HoS 13 යන ආර නිල වශයෙන් නිකුත්කිරීම උදෙසා නම්කරනු ලැබූ අතර HoS 12, සහ HoS 13, 2012 වර්ෂයේදී වගාව සඳහා නිදහස් කෙරිණි.

## වෙරළු (*Elaeocarpus serratus*) වල මල් ජෛව විද්‍යාව, මල් සහ ගෙඩි සෑදීමේ හැසිරීම අධ්‍යයනය

හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී ක්ෂේත්‍ර ජාන බැංකුවෙහිදී වෙරළු අධ්‍යනය සිදුකරනු ලැබීය. අධ්‍යනය උදෙසා විවිධ එකතුන් 8ක් තෝරා ගනු ලැබිණි. වර්ධනය වූ පත්‍ර ආක්ෂීය වන අතර මල් ඒකාක්ෂයකි. විවිධ ප්‍රභේදවල ඒකාක්ෂ මලෙහි විවිධ කොටස්වල ප්‍රමාණය, හැඩය, සංඛ්‍යාව සහ පැහැයෙහි වෙනස්කම් නිරීක්ෂණය කළ හැකි විය. පුෂ්පිකාවක් සම්පූර්ණ මලක කොටස්වලින් සමන්විත වේ. පිටත වලය තුළ නිදහස්ව සැකසුණු ලා කොළ පැහැති මනිපත්‍ර 4-5 අතර සංඛ්‍යාවක් ඇත. දෙවන වලය තුළ ලා සුදු පැහැති ඛණ්ඩික දාර තුළ නිදහස්ව සැකසුනු සුදු පැහැති දලපත්‍ර 4-5 අතර සංඛ්‍යාවක් ඇත. තුන්වන වලය තුල ලා සුදු පැහැති නිදහස්ව සැකසුණු රේණු 25-30 අතර සංඛ්‍යාවක් ඇත. උත්තර ඩිම්බ කෝෂය තුළ එක් ඩිම්බයක් හමු වේ. තෙත් කලාපයෙහි වෙරළු මල් වර්ෂයකට දෙවරක් පිපේ. එනම් ජනවාරි සිට මාර්තු සහ ජූලි සිට ඔක්තෝම්බර් දක්වා එම කාලයයි. මල් සැදෙන එක් කන්නයකදී මල් අදියර 3කදී සෑදේ. මෙම මල් විවිධ අදියර බවට පත්වීමට ගතවන කාලය සහ එලය නිරීක්ෂණය කරනු ලැබිණි.

## උගුරැස්ස ගවේෂණය, රැස්කිරීම, සංරක්ෂණය සහ ලක්ෂණීකරණය

උගුරැස්ස එකතුන් 22ක් එකතු කරනු ලැබූ අතර පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ක්ෂේත්‍ර ජාන බැංකු තුළ ස්ථාපිත කරනු ලැබිණි. නිර්දේශය සඳහා ඉහළ අස්වැන්නක්, උසස් ගුණාත්මකබවක් සහිත ප්රභේද හඳුනාගැනීම උදෙසා ලක්ෂණීකරණය සහ ඇගයීම අඛණ්ඩව සිදු කරනු ලබමින් ඇත. එකතුන්ගෙන් 9වන එකතුව ගෙඩිය පැළීමට භාජනය වූ අතර එම නිසා බෝරෝන් ප්‍රතිකර්මයට භාජනය කරනු ලැබිණි. 7වන එකතුවෙහි වසර පුරාම එල දැරීම දක්නට ලැබිණි. හොඳ ගුණාත්මක තත්ත්වයෙන් යුත් එකතුවකි.

## ලාවුළු ඇගයීම

මෙම බෝගයෙහි සැලකිය යුතු ජාන විවිධත්වයක් දක්නට ලැබුණද ඌන උපයෝජිත එතරම් භාවිතයට නොගන්නා පලතුරක් බව පැහැදිලිය. එම නිසා 2004 වර්ෂයේදී පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී SL/USA ශ්‍රී ලංකා /ඇමෙරිකා එක්සත් ජනපද ව්‍යාපෘතිය යටතේ ලාවුළු ජනකප්ලාස්ම රැස්කිරිම, ඇගයීම සහ සංරක්ෂණ වැඩසටහන ආරම්භ කරනු ලැබිණි. ලාවුළු එකතුන් 5ක් රුස්කර ස්ථාපිත කරනු ලැබිණි. මෙම ඇගයීම් වල ප්‍රතිඵලයක් වශයෙන් වැඩි අස්වනු සහිත ලාවුළු එකතුන් 3ක් හඳුනාගනු ලැබිණි. මෙම ඇගයීම් කළ එකතුන් 5 අතුරෙන් HOLav4 , HOLav5 යන ප්‍රභේද 2 වැඩි අස්වනු ලබාදුණි. HOLavI අඩු ඵල සංඛ්‍යාවක් සහිත වුවද ගෙඩියේ ප්‍රමාණය විශාල වීමෙන් වැඩි අස්වැන්නක් ලබා දුණි. HOLavI යනු සපේක්ෂව විශාල තරමක් දිගු අඩුබීජ බර සහිත ඵලයකි. HOLav 4 සහ HOLav 5 යනු මධ්‍යම ප්‍රමාණයේ ඵල සහිත පලතුරකි. ඇගයීම අඛණ්ඩව සිදුවනු ලැබේ.

## දැනට පවතින ජනකප්ලාස්මයන්ගෙන් බලාපොරොත්තු තැබිය හැකි කොස් එකතුන් වරණය (*Artocarpus heterophillus*)

හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය රැස්කරගත් ප්‍රභේද උපයෝගී කරගනිමින් පරීක්ෂණ ආරම්භ කෙරිණි. අහඹු ලෙස ප්‍රතිවලිත කරන කොටු සැලසුම (RCBD සැලසුම) අනුව හෙක්ටයාර 1.8 භූමි ප්‍රමාණයක පිහිටි නිර්දේශිත ප්‍රභේද 4ක් ඇතුලුව විවිධ ප්‍රභේද 36ක එකතුවකින් මෙම ජාන බැංකුව සමන්විත වේ. වර්ධන පරාමිතීන් ඇගයීම සම්පූර්ණ කරනු ලැබූ

අතර ඵලයේ ගුණාත්මක පරාමිතීන් ඇගයීම සිදුකෙරෙමින් පවතී.

## Chempadak (*Artocarpus integer*) ලක්ෂණීකරණය හා ඇගයීම

2013 වර්ෂයේ දී අහඹු ලෙස ප්‍රතිවලිත කළ කොටු සැලැස්ම (RCBD) අනුව හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ කොස් ක්ෂේත්‍ර ජාන බැංකුවෙහි බද්ධ පැළ ස්ථාපිත කරනු ලැබිණි. අනාගතයේ පර්යේෂණයන් තුළින් සංරක්ෂණය සහ භාවිතය අරමුණු කර කොස් සඳහා වූ අන්තර්ජාතික පැළෑටි ජාන සම්පත් ආයතනයේ තොරතුරුවලට අනුකූලව වර්ධක සහ පැළ සැදෙන අවධි ලක්ෂණීකරණය කරනු ලැබිණි. පත්‍ර, ඵලය හා ඵලයේ ගුණාත්මක බව හැරෙන්නට කොස්වලට සමාන ලක්ෂණ පෙන්නුම් කෙරිණි. ඉදුණු ඵලය අතුරුපසක් ලෙස මෙන් ඉහළ ද්‍රාව්‍ය අගයක් සහ හොඳ සුවඳක් සහිත ඉහළ ගුණාත්මක ලක්ෂණ පෙන්නුම් කෙරිණි. වෙනත් කාලගුණික කලාපවල ඇගයීම උදෙසා පැළ බද්ධ කිරීම සිදු කෙරෙමින් පවතී.

## බණ්ඩක්කා දෙමුහුම් ( OK-$H_1$) වල මව් ආර නඩත්තුව

OK-$H_1$, $OK_2$ (ජායාංගී), OK -is (පුමාංගී) මව් ආර නඩත්තු කරනු ලැබිය. $OK_2$ – (1150g) සහ OK-is (1750g) යන මව් ආරවල බීජ නිෂ්පාදනය කරනු ලැබ ගන්නෝරුව බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශය වෙත ඉදිරිපත් කරනු ලැබිණි.

## වැරනියා කොළ මිරිස් ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය සහ මාපිය ආර නුමුහුම් බව පවත්වාගෙන යාම

අනවශ්‍ය ආර ඉවත්කර හොරණ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය සහ වල්පිට දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී ප්‍රභේදය නුමුහුම් බවට පත්කරනු ලැබිය. ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් අඛණ්ඩව සිදු කරනු ලැබේ.

## බතල සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම

හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී අත්හදාබැලීම් සිදු කෙරිණි. 2013 යල කන්නයේදී දත්ත එකතුකරගනු ලැබූ අතර ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම් සිදු කෙරිණි. මෙම දත්ත උද්‍යාන බෝග පර්යේෂණ හා ආයතනය වෙත ඉදිරිපත් කරනු ලැබිණි.

## වට්ටක්කා සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම්

අත්හදා බැලීම් හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සිදු කරනු ලැබිය. 2012/2013 මහ කන්නය තුළ දත්ත එකතුකරගනු ලැබූ අතර ජාතික සම්බන්ධීකරන ප්‍රභේද අත්හදා බැලීම අවසන් කරනු ලැබිණි. දත්ත මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත ලබා දුණි.

## බෝග සංරක්ෂණය

### දිලීර නාශක සහ කාබනික සහ අකාබනික සංයෝග භාවිතයෙන් පේරවල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය

පරීක්ෂා කළ විවිධ රසායන ද්‍රව්‍ය සාන්ද්‍රණ අතුරෙන් පේරවල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනයට ඇමෝනියම් බයිකාබනේට් (10,000 ppm) හොඳම ප්‍රතිකර්මය විය. (සෝඩියම් බෙන්සොයේට්, සෝඩියම් මෙටා බයිසල්ෆයිට්, ඇසිටල්ඩිහයිඩ්, බෙන්සැල්ඩිහයිඩ් සහ සිනමැල්ඩිහයිඩ් )

## කාබනික සහ අකාබනික සංයෝග භාවිතයෙන් පැපොල්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය

නලස්ථ පරීක්ෂණයන්හිදී පැපොල්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය උදෙසා සෝඩියම් මෙටා බයිසල්ෆේට් (1500 ppm) වඩාත් ඵලදායී විය.

## කාබනික සහ අකාබනික සංයෝග මගින් අඹවල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය

නලස්ථ පරීක්ෂණයන්හිදී *Colletotrichum gloeosporioides* මගින් ඇතිකරන ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය උදෙසා පරීක්ෂා කළ විවිධ රසායන ද්‍රව්‍යය සාන්ද්‍රනයන් අතුරෙන් සිනමැල්ඩිහයිඩ් (5 ppm) වඩා හොඳ ප්‍රතිපල ලබා දුණි. (සෝඩියම් බයිකාබනේට්, පොටෑසියම් සෝබේට්, සෝඩියම් ප්‍රොපියොනේට්, සහ වැනිලයින්)

## ශ්‍රී ලංකාවේ පේරවගාවේදී පේරවල මූල ගැටිති නෙමටෝඩාවන්ගේ ජෛව විද්‍යාව සහ කළමනාකරණය

පේර (*Psidium guajava*) යනු ශ්‍රී ලංකාවේ වාණිජ පලතුරු බෝගයක් බවට පත් වූ නිවර්තන කලාපීය පලතුරකි. පේර වගාවේදී මූල ගඩු නෙමටෝඩාවන් (*Meloidogyne* spp) ප්‍රධාන ගැටළු වලින් එකකි. පේර වගාවේදී මූල ගඩු නෙමටෝඩාවන්ගේ ව්‍යාප්තිය, හානියේ තීව්‍රතාවය විශේෂ හඳුනා ගැනීම, හඳුනාගත් විශේෂවල ජෛව විද්‍යාව සහ කළමනාකරණ පිළිවෙත් මාලාවන් පිළිබඳ පරීක්ෂා කිරීමට සහ ප්‍රතිරෝධී ප්‍රභේද සොයාබැලීම පිණිස පරීක්ෂණ සිදුකිරීමට මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබිණි.

තෝරාගත් දිස්ත්‍රික්කවල මෙම රෝගය ආසාදිත ප්‍රදේශයන්හි පැතිරීම සහ හානියේ තීව්‍රතාවය සිතියම් ගත කිරීම උදෙසා සමීක්ෂණයක් සැලසුම් කරනු ලැබිණි. මෙම සමීක්ෂණයට අනුව පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රදේශයේ සියලුම වාණිජ පේර වගාවන් මෙම මූල ගඩු රෝගයෙන් ආසාදනය වී ඇති බව නිරීක්ෂණ කෙරිණි. මෙම මූල ගඩු නෙමටෝඩාවන් හේතුවෙන් මියගිය ශාකවල ප්‍රතිශතය 5% - 22% ක් වූ අතර පස් 100gක දක්නට ලැබූ වැඩුණු නෙමටෝඩා ප්‍රමණය 192 සිට 361 අතර ප්‍රමාණයක් විය. මුල් සාම්පලද නෙමටෝඩාවන්ගෙන් දැඩි ලෙස ආසාදන වී තිබුණි.

පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පේර පර්යේෂණ ක්ෂේත්‍රය තුළ 100g පස් ප්‍රමාණයක දක්නට ලැබූ වැඩුණු නෙමටෝඩා 4 – 133 දක්වා අතර ප්‍රමාණයක විය. විශේෂයෙන් හඳුනා ගැනීම උදෙසා තක්කාලි පැළ වල ශුද්ධ නෙමටෝඩා ගහන රෝපණයක් නඩත්තු කෙරිණි. ජෛව විද්‍යාව හඳුනාගැනීම උදෙසා වූ අධ්‍යනයන් හට පේර පැළ නෙමටෝඩාවන්ගෙන් ආසාදිත කර තිබුණි. ව්‍යාපෘතිය අඛණ්ඩව සිදු කරනු ලබයි.

## නෙමටෝඩා පරපෝෂිතයාට ප්‍රතිරෝධී පේර මුල් ග්‍රාහක අධ්‍යනය

තෝරාගත් වායව අතුබැඳි ශාක *Meloidogyne* spp යන්ගෙන් ආමුකුලනය කරනු ලැබිණි. ආමුකුලනයෙන් සති 8 – 10 අතර කාලය තුළදී මූල ගඩු අගයනු ලැබිණි. සියලුම ශාක මූල ගඩු රෝගයෙන් අධික ලෙස ආසාදනය වී තිබූ අතර මෙමගින් සියලුම ශාක මූල ගඩු නෙමටෝඩා රෝගයට ගොදුරු වන බව පෙනිණි.

### පේරවල ශාක පරපෝෂිත නෙමටෝඩාවන්ට එරෙහිව පසෙහි පෝෂක සහ ගුණාත්මක ස්වභාවය වෙනස්කිරීම මගින් ඇගයීම

ජීවාණුහරණය කළ පස් සමඟ කුකුල් පොහොර, එළු පොහොර සහ පිලිස්සු දහයියා (පිළිවෙලින් එක් වර්ගයකින් 1, 2, 3&4% w/w) වෙන් වෙන්ව මිශ්‍රකර පෝච්චිවල පේර බීජ පැළ සිටුවන ලදී. ප්‍රතිකර්ම නොකළ පාලකය සමඟ සැසැඳීමේදී බාහිර මුල ගඩු නෙමටෝඩා ලක්ෂණ සැලකීමේදී කුකුල් පොහොර පැළවල මූල ගඩු නෙමටෝඩා රෝග ලක්ෂණ සුළු වශයෙන් පෙන්වූ අතර එළු පොහොර (3&4%) රෝග ලක්ෂණ සාපේක්ෂව ඉහළ ප්‍රමාණයකින් දක්නට ලැබිණි. ආමූකුලනය කර මාස 5කට පසු සියලුම පැළ වල මූල ගඩු දර්ශකය ඉහළ අගයක් පෙන්නුම් කෙරිණි.

### කෙසෙල් මුල්/ කඳ ගුල්ලාට එරෙහිව කැට කෘමිනාශක ඇගයීම

අගයනු ලැබූ කැට කෘමිනාශක අතර තයෝසයික්ලම් හයිඩ්‍රජන් ඔක්සලේට් 4G (Thiocyclam hydrogen oxalate) (Evisect 5) , වර්ටාකෝ 40 WG සහ ඩයසිනන් 50GR කෙසෙල් ගුල්ලා පාලනයට වඩාත් ඵලදායී විය. කාබොෆියුරාන් වලට විකල්පයක් ලෙස මෙම කෘමිනාශක භාවිතා කිරීම උදෙසා නිර්දේශයන් ලබාදීමට පරීක්ෂණ අඛණ්ඩව සිදු කෙරේ.

### ගොරක සුදු ඉටිසහිත කොරපොතු කෘමීන් (White waxy scale : *Gascardia brevicauda*) එරෙහිව පාරිසරික හිතකර රසායන ද්‍රව්‍ය ඇගයීම

සුදු ඉටි සහිත කොරපොතු කෘමියා (*Gascardia brevicauda*) යනු වැල් දොඩම් සහ ගොරකාවල හමුවන දැඩි හානියක් ඇතිකරන පරපෝෂිතයෙකි. වැඩුණු ජීවියා ඉතා දැඩි ආවරණයක් සාදා බිත්තර සහ වැඩුණු සුහුඹුලන් මෙම ආවරණය තුළ සිටීම හේතුවෙන් රසායන ද්‍රව්‍ය පමණක් යොදා පරපෝෂිතයා පාලනය අපහසු වේ. එමනිසා මෙම වැඩුණු ජීවියා රසායන ද්‍රව්‍ය යෙදීමට පෙර යාන්ත්‍රිකව ඉවත් කළ යුතුය. පරීක්ෂණ කළ රසායනික ද්‍රව්‍ය අතර තයෝමෙතසම් 25 Wg (Actara) දින 10 කාල පරතරයක් තබා දෙවරක් යෙදීම මගින් සැලකිය යුතු ලෙස ගහනය අඩු විය. කෙසේ වුවද මෙය තවදුරටත් පරීක්ෂා කළ යුතුය.

## පාංශු පෝෂක කළමනාකරණය

### මැංගුස්වල මැලියම් වැස්සීමේ සහ ජලය වැනි මාංශල මදය ඇතිවීමේ රෝගය

මැංගුස් වල ගුණාත්මක බවට බලපාන ගැටළු වන්නේ මැලියම් වැස්සීමේ සහ ජලය වැනි මාංශල මද ඇති වීමයි. මැලියම් වැස්සීමේ රෝගයේදී ඵලයේ ඇතුලත සහ පිටත කහපැහැති රෙසීන ඇති වේ. මෙම කහ පැහැති කිරි වැනි ද්‍රව්‍ය සුදු පැහැති මාංශල මදය අභ්‍යන්තරයට කාන්දු වීමේදී තිත්ත රසයක් ඇති කරයි. සමහර අවස්ථාවලදී මාංශල මද කොටස් දැඩි සහ විනිවිද ස්වභාවයට පත් වේ. මෙම රෝගී තත්ත්වයන් අවම කිරීම උදෙසා කැල්සියම් සහ බොරෝන් පෝෂක යෙදීමේ විවිධ ක්‍රම පිළිබඳව තවදුරටත් පරීක්ෂා කිරීමට පරීක්ෂණ අඛණ්ඩව සිදු කරනු ලැබීය. මෙම පරීක්ෂණයන්හිදී 1% කැල්සියම් නයිට්‍රේට් පත්‍ර වලට යෙදීමෙන් සහ 0.2% බෝරැක්ස්, ඵල ඇති වීමේදී 3 වරක් ඉසීම සමඟ පසෙහි PH අගය 5.5 – 6.0 පවත්වා ගැනීම උදෙසා ඩොලමයිට් පසට යෙදීමෙන් මෙම රෝග තත්ත්වයන් දෙකම උග්‍ර වශයෙන් ඇතිවීම සැලකිය යුතු ලෙස අඩු විය.

## ඩ්‍රැගන් ෆෲට් සඳහා කාබනික පොහොර

කාබනික නිෂ්පාදන සඳහා අධික ඉල්ලුමක් පවතී. කෙසේ වුවද අලුතෙන්ම වගා කරන්නාවූ ඩ්‍රැගන් ෆෲට් සඳහා විධිමත් පොහොර කළමනාකරණ පිළිවෙත් මාලාවක් දක්නට නොමැත. පණු පොහොර හා පණු දියර ඇතුලත්ව විවිධ කාබනික පොහොර භාවිතා කරමින් කාර්යක්ෂම පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම උදෙසා පරීක්ෂණ සිදු කරනු ලැබිණි. අනෙකුත් ප්‍රතිකර්මයට වඩා කුකුල් පොහොර වර්/හෙ/ටො 20ක් පලමු වසරේදී ද වර්/හෙ/ටො 30ක් දෙවන වර්ෂයේදී ද යෙදීමෙන් සැලකිය යුතු ඉහළ අස්වැන්නක් ලැබිණි. එම ප්‍රතිකර්මය මගින් වර්ෂයේ එල ඇති කරන කාල සීමාවද දීර්ඝ විය. වෙනත් පොහොරවලට පණු දියර එකතු කිරීම මගින් අස්වැන්න සැලකිය යුතු ලෙස වැඩි නොවිණි.

## බෝග කළමනාකරණය

### මැංගුස්වල ද්විත්ව මුල් ග්‍රාහක බද්ධය මගින් ශාක වර්ධනය හා අස්වැන්න ඵලදායීතාවය ඇගයීම

මැංගුස් (*Garcinia mangostana*) යනු ශ්‍රී ලංකාවේ ඉහළ ඉල්ලුමක් පවතින පලතුරුවලින් එකකි. කෙසේ වුවද, මෙම ශාකය තෙත් කලාපයේ පහත රට හා මැදරට ප්‍රදේශයේ සුළු පරිමාණව සීමා සහිත ලෙස වගා කෙරේ. මෙම බෝගය හට අනුවර්තනයවීම උදෙසා විශේෂිත පාරිසරික අවශ්‍යතාවන් සහ රෝපණ පිළිවෙත් මාලාවන් අවශ්‍ය වීම මෙයට හේතුවයි. මෙයට අමතරව ස්වභාවික වශයෙන්ම පවතින ලක්ෂණයක් වන අඩු වර්ධන වේගයද තවත් සාධකයකි. මෙම රසවත් පලතුරු ශාකය ඉතා පුළුල් ප්‍රදේශයක පැතිරේ. අඩු වර්ධන වේගය සමග වසර 8-10වන වර්ධක කාලය මෙයට මූලික වශයෙන් හේතු වේ. මෙසේ එල සැදීමේ කාලය වසර 3-4 දක්වා කෙටිකර ගැනීමේදී සාම්ප්‍රදායික කුඤ්ඤ බද්ධය ඵලදායී වුවද වියන සෑදීම දුර්වල වීම සහ එල සෑදීම අඩුවීම ප්‍රධානම අවාසි ලෙස හඳුනාගනු ලැබිණි.

එම නිසා අඩු වර්ධන වේගයට සහ ඵලදායිතාව ඉහල නැංවීමේ අරමුණු ඇතිව 2004 වර්ෂයේදී බද්ධයට අමතර මුල් පද්ධතියක් ලබා දීමේ පරීක්ෂණයක් ලෙසට ආරම්භ කරනු ලැබිණි.

පැළ සිටුවා 9වන වර්ෂයේදී ද්විත්ව මුල් ග්‍රාහක බද්ධය, අධික තෘතීක අතු පද්ධති. වර්ධනයත් සමඟ ඝනව වැඩුණු වියනක් සහ තැනින් තැන වැඩුණු අතු පද්ධතියක් සහිත විය. 2013 වර්ෂයේ බද්ධ පැළ අඛණ්ඩව 6වන වරටත් බද්ධයක එල 118ක් වැනි සාමාන්‍යය අස්වැන්නක් ලබා දුන් අතර පෙර එල දැරූ කන්නය හා සැසඳීමේදී සාපේක්ෂව මෙය ඉහළ අස්වැන්නකි. පශ්චාත් බද්ධ එලදායීතාව ඇගයීමේ දී බද්ධ පැල ආනතියක් සහිතව ශාක වර්ධනය වන බව නිරීක්ෂණය කෙරිණි. සාමාන්‍යයෙන් බද්ධ පැළවල මෙම තත්ත්වය බහුලව දක්නට ලැබේ. මැංගුස් ශාක වලට ආවේණික තිරස් අතු විහිදුම් තත්ත්වයක් දක්නට ලැබේ. අනුජය මෙම අතුවලින් ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම බද්ධ පැළ ආනතියක් සහිත වර්ධන රටාවක් පෙන්නුම්කරමින් තිරස්ව වැඩේ. මෙම ද්විත්ව මුල් ග්‍රාහක ශාක තිරස්ව වර්ධනය වීම අතුවලට කතිරයක් ආකාරයට වසර 3-4 යන තුරු ආධාරක 2ක් තැබීමෙන් වලක්වා ගත හැක. එවිට වසර 3-4කට පසු මෙම ශාක ඍජුව වර්ධනය වේ.

### ද්විත්ව මූල පද්ධතියක් සහිත මැංගුස් බීජ පැළ ශාකවල වර්ධනය සහ අස්වැන්න

මැංගුස් ශාකවල අඩුවර්ධන වේගය සහ එල සෑදීම උදෙසා වසර 8-10 අතර දිගු කාලයක් ගතවීම මැංගුස් ශාකයේ ව්‍යාප්තිය අවම වීමට ප්‍රධාන හේතු වේ.

මෙවැනි අවාසි මගහරවමින් ඵලදායීතාවය වැඩි කිරීම උදෙසා ආරුක්කු බද්ධය ක්‍රමවේදය මගින් මැංගුස් ශාකයට අමතරව මූල පද්ධතියක් හඳුන්වා දීමේ උත්සහයක නිරත විණි.

පාලකයක් ලෙස සාමාන්‍යය බීජ පැල ශාක සමග ද්විත්ව මූල පද්ධතියක් සහිත ශාක වල වර්ධනය සහ අස්වැන්න වැනි ලක්ෂණ ඇගයීමේදී  මෙම අමතර මූල පද්ධතියක් සහිත මැංගුස් ශාකයේ ඵල දැරීමේ දෙවන වසරේදී වියන වර්ධනයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබූ අතරම ප්‍රාථමික හා ද්විතියික කඳවල් වර්ධනය සාමාන්‍ය බීජ පැළවලට වඩා ද්විත්ව මූල පද්ධතියක් සහිත බීජ පැළ වල නිරීක්ෂණය කළ හැකි විය.

මෙසේ අමතර මූල පද්ධතිය සහිත ශාකවල ක්ෂේත්‍රයේ වගාකර 6වන වසරේදී අඛණ්ඩව 2වන වරටත් ඵල සැදිණි. මෙම ද්විත්ව මූල පද්ධතියක් සහිත ශාකවල ඵල සැදුණු 2වන වසරේදී ඵල 56ක සාමාන්‍යය අස්වැන්නක් ප්‍රතිඵල කෙරිණි. එක සමාන වයස් සහිත තනි මූල පද්ධතියක් සහිත ශාකවල ඵල නොසැදුණි. එම නිසා මෙම ද්විත්ව මූල පද්ධතියක් ලබාදීමේ ක්‍රමවේදය මගින් වියන වර්ධනය වේගවත් කරමින් ඉක්මනින් ඵල හට ගැනිම සහ ඉහළ ඵලදායීතාව ප්‍රතිඵල කෙරිණි. බීජ පැල අවශ්‍ය වනු ලබන වගාවන් සඳහා මෙම තාක්ෂණය උපයෝගී කර ගත හැක.

## අනෝදා ගම්මාන පිහිටුවීම

අනෝදා යනු අධික පෝෂණ ගුණයකින් සමන්විත පලතුරු වලින් එකකි. මෙම පලතුරු බොහෝ විට ගෙවතු වලින් හමුවේ. කුඩා හා මධ්‍යම පරිමාණ වගාවන් ඉතාමත් සුළු වශයෙන් හමුවේ. මෙම පලතුර ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව රත්නපුර දිස්ත්‍රික්කයේ ගම්මාන 4ක් සහ මාතර දිස්ත්‍රික්කයේ ගම්මාන 2ක් අනෝදා ගම්මාන ලෙස ස්ථාපිත කෙරිණි.

## ඩ්‍රැගන් ෆෘට්වල (*Hylocerus undatus*) වැල වර්ධනයට, අස්වැන්න සහ පැළයේ ගුණාත්මක බවට පුහුණු කණුවක කළ කැපීමේ දිග සහ කැපුම් සංඛ්‍යාවේ බලපෑම

වර්ධනය මාන ගත කිරීම උදෙසා සංඛ්‍යාත්මක වශයෙන් වැදගත් මානයක් ගනු ලැබිණි. (කඳෙහි වර්ධනය සහ අතු සංඛ්‍යාව) පිළිවෙලින් කණුවකදී කඳ කැපුම් දිග සහ කැපුම් ප්‍රමාණය වැඩි කිරීමේදී කඳෙහි වර්ධනය සහ අතු සංඛ්‍යාවෙහි වර්ධනයක් නිරීක්ෂණය කෙරිණි. කෙසේ වුවද මෙම සියලුම ප්‍රතිකර්මයන්හිදී වුවද අඩු පැළ සංඛ්‍යාවක් ප්‍රතිඵල කෙරිණි. පිළිවෙලින් 2010, 2011, 2012 සහ 2013 යන වසර වල පිළිවෙලින් වාර්තා වූ වැඩිම අස්වනු ප්‍රමාණය 620g, 1.9Kg, 1.5 Kg, 3.3 Kg විය. සැලකිය යුතු අස්වැන්නක් මෙම කුමන ප්‍රතිකර්මයකදී වුවද ලබා නොදෙන බව මෙයින් අවධාරණය කළ හැක. එම නිසා පරීක්ෂණ අඛණ්ඩව සිදු කරනු ලැබිණි.

## අලුතෙන් නිර්දේශිත ගොරක ප්‍රභේදයන්හි අනුවර්තන පරීක්ෂණ

2012 වර්ෂයේදී පහත රට තෙත් කලාපය සඳහා බලාපොරොත්තු තැබිය හැකි ගොරක එකතුන් 3ක් (HOG-3, HOG 8 සහ HOG 11) නිර්දේශ කෙරිණි. එමනිසා අනෙකුත් කෘෂි පාරසරික කලාප 2ක හිදී DL1a (අගුණකොළපැලැස්ස) සහ ILIC (මොණරාගල) යන ප්‍රභේදවල අනුවර්තී බව පරීක්ෂා කිරීම උදෙසා මෙම අධ්‍යයනය ආරම්භ කෙරිණි.

## රඹුටන්වල වර්ධනය සහ අස්වැන්න සඳහා ශාක ගහන ඝනත්වය සහ කප්පාදු උසෙහි බලපෑම

"මල්වාන ස්පෙෂල්" පැල 36ක් විවිධ ශාක පරතර 3ක් යටතේ {(10m x 10m) (නිර්දේශිත), (10m x 7.7m), (10m x

5.0m)} විවිධ අතු උස 2ක් {90cm(නිර්දේශිත), 30cm}වශා කරනු ලැබිණි. වර්ධන ලක්ෂණ, පත්‍රවල ලක්ෂණ, මලෙහි ලක්ෂණ සහ ඵලෙහි ලක්ෂණ වාර්තා කරනු ලැබිණි. ශාක උස පැතිරුණු වියන සහ අස්වැන්නෙහි මේ දක්වා සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි. අධ්‍යනයන් අඛණ්ඩව සිදු කරනු ලබයි.

## ගොවි ක්ෂේත්‍රවල දැනට පවතින බීජ පැල ගහනයන්ගෙන් රඹුටන් ප්‍රභේද වරණය

ගෙඩියෙහි ගුණාත්මක ලක්ෂණ පදනම්ව එකතුන් 8ක් තෝරාගනු ලැබ හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයනයෙහි පැළ කරනු ලැබිණි. සියලුම එකතුන් අස්වැන්න ලබා දුන් අතර එකතුන් අංක 8, 9, සහ 10 ශාකයට 34 Kgකට වැඩි අස්වැන්නක් ලබා දුණි. එකතුන් අංක 8 සහ "මල්වාන ස්පෙෂල්" හි ඵලයේ ගුණාත්මක ලක්ෂණ විශ්ලේෂණය කරනු ලැබූ අතර මෙම ප්‍රභේද 2 අතර පැහැදිලි වෙනස්කම් දක්නට නොලැබුණි.

## හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දක්නට ලැබෙන රඹුටන් ගහනයන්හි ලක්ෂණීකරණය

ප්‍රභේද වැඩිදියුණුකිරිමේ වැඩසටහන යටතේ විධිමත් ලක්ෂණීකරණය තුළින් පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දැනට පවතින රඹුටන් ගහනයන්, වැඩි අස්වනු ඉහළ ගුණාත්මක තත්ත්වයන්ගෙන් යුත් ප්‍රභේද වරණය උදෙසා උපයෝගී කරගනු ලැබිය හැක. පැළ 56ක ගෙඩියේ හැඩය, ගෙඩියේ පැහැය, මාංශල කොටසෙහි පැහැය, මාංශල කොටසෙහි ඝනකම, මාංශල කොටසෙහි රසවත් බව, මාංශල කොටසේ යුෂ, මාංශල කොටස බීජයට සවිවීම, පොත්තෙහි කෙඳිවල දිග, පොත්තේ කෙඳිවල ඝණත්වය ඝනකම වාර්තා කරනු ලැබිණි. මෙම වෙනස්කම් පැහැදිලිව හඳුනාගැනිම උදෙසා මෙම රඹුටන් එකතුන්වල ඡායාරූප පෙළක් සකස් කරනු ලැබිණි.

## ඩ්‍රැගන් ෆෲට්වල මල් පිපීම සහ ගෙඩි සෑදීම සඳහා ශාක වර්ධක හෝමෝනයනගේ බලපෑම

ඩ්‍රැගන් ෆෲට්වල මල පිපීම, අස්වැන්න සහ ඵලයේ ගුණාත්මක බවට ශාක වර්ධක හෝමෝනයන්ගේ බලපෑම පරීක්ෂා කෙරිණි.ශාක වර්ධක හෝමෝන යෙදීම මගින් ඵලයේ ගුණාත්මක බව සහ අස්වැන්න ප්‍රවර්ධනය කල හැක. නමුත් දේශීය පාරිසරික තත්ත්වයන් යටතේ ගැලපෙන ඵලදායී ශාක වර්ධක හෝමෝන පරීක්ෂණාත්මක ලෙස තවමත් තීරණය කර නැත. එම නිසා ඩ්‍රැගන් ෆෲට් ගුණාත්මක බව සහ අස්වැන්න වැඩි කිරීම උදෙසා සමහර ශාක වර්ධන හෝමෝනයන්හි හැකියාව පිළිබඳ අධ්‍යයනය කිරීමට මෙම පරීක්ෂණය සිදු කෙරිණි. වර්ධක හා අසවනු පරාමිතීන්හි පැහැදිලි වෙනස්කම් ඇති නොවිණි.

## පලතුරු සංවර්ධන ක්‍රියාවලීන්

### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ වෙනත් කාර්යයන් මගින් ආදායම් ඉපැයීම

2013 වර්ෂය තුළදී, රඹුටං, අඹ, දූරියන්, කොස්, අලිපේර, කාමරංකා, සැපදිල්ලා, ගොරක, දෙහි, මැංගුස්, ජම්බු, ලොවි, අනෝදා, පේර, දොඩම්, බෙලි, වෙරළු, ජම නාරං, වැල් දොඩම්, ජැම් පේර වැනි පලතුරුවල අංකුර බද්ධ පැළ 23560 සහ රිකිලි බද්ධ පැළ 1,808ක් අලෙවි කෙරිණි. මෙමගින් රු.4,270,020.00ක් ශුද්ධ ලාභයක් ලෙස ඉපයූ අතර වෙනත් කටයුතුවලින් ඉපයූ ආදායම රු.2,507,180.90කි.

## "පටක රෝපණය තුළින් වැදගත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍යය වැඩිදියුණු කිරීම"ව්‍යාපෘතිය මගින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන්

### කෙසෙල් ක්ෂුද්‍ර ප්‍රචාරණය

පැළෑටි පටක රෝපණය යනු කෙසෙල් සහ අන්නාසි වැනි පලතුරුවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය උදෙසා උපයෝගී කරගනු ලබන ලෝකය පුරා පිළිගත් ක්‍රමවේදයකි. එමනිසා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ක්ෂුද්‍ර ප්‍රචාරණය පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම උදෙසා ආයතනය තුළ පටක රෝපණ පරීක්ෂණාගාරයක් ස්ථාපිත කෙරිණි. "පටක රෝපණය තුළින් වැදගත් බෝග වල ගුණාත්මක රෝපණ ද්‍රව්‍යය වැඩිදියුණු කිරීම" ව්‍යාපෘතිය යටතේ පරීක්ෂණාගාර පහසුකම් වැඩිදියුණු කරනු ලැබූ අතර රෝපණ කාමරයේ ධාරිතාව රෝපණ 1500 සිට 4500 දක්වා වැඩි කෙරිණි. මෙම වර්ෂය තුළදී කෙසෙල් පැල 7500කට වැඩි සංඛ්‍යාවක් නිෂ්පාදනය කරනු ලැබිණි. ඇගයීම උදෙසා පර්යේෂණ හා ගොවි ක්ෂේත්‍ර වල විවිධ ප්‍රභේදවල කෙසෙල් පැළ 1000කට ආසන්න සංඛ්‍යාවක් ස්ථාපිත කෙරිණි. සමක්ලෝනීය ප්‍රභේද නිරීක්ෂණය කරනු ලැබීමට නොහැකි විය.

ඇඹුල්, සීනි, නේත්‍රපලම් යන කෙසෙල් ප්‍රභේද ක්ෂුද්‍ර ප්‍රචාරණය උපරිම කරනු ලැබූ අතර එම ගුණනය උදෙසා සාර්ථකව යොදා ගතහැක. අන්නාසි පැළ 30,000කට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කර පැළ 3000ක් පමණ ක්ෂේත්‍රයේ පැළ කෙරිණි.

### අඹ කලල ආරක්ෂණය

ගෙඩි වැටීම අඹ වගාවේ බහුලව දක්නට ලැබෙන ගැටළුවකි. එමගින් අඹ අභිජනනයේ බොහෝ සීමාවන් ඇතිවේ. ජීවානුහරිත සහ පාලිත පාරිසරික තත්ත්වයන් යටතේ පෝෂක මාධ්‍යවල නොමේරූ කලල නලස්ථව වගාකිරීම උදෙසා වූ ක්‍රමවේදය කලල ආරක්ෂණය නමින් හැඳින්වේ. වැටුණු හෝ අස්වැන්න නෙලන ලද නොවැඩුණු ගෙඩිවල කලල ආරක්ෂාව උදෙසා මෙම දෙමුහුම් කලල ආරක්ෂණ ක්‍රමවේදය සාර්ථකව උපයෝගී කරගනු ලැබේ. එම නිසා දේශීය අඹ ප්‍රභේදවල කලල ආරක්ෂාව උදෙසා වූ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීමට මෙම පර්යේෂණ වැඩසටහන ආරම්භ කෙරිණි. වර්තමානයේ ජීවානුහරණ ක්‍රමවේදය උපරිම කරන වැඩසටහන අඛණ්ඩව සිදු කෙරේ.

### ඌන උපයෝජිත පලතුරුවලින් (සැපදිල්ලා, ලාවුළු සහ වෙරළු) වැඩි අගයක් සහිත නිෂ්පාදන වැඩිදියුණු කිරීම

පහත දැක්වෙන ආහාර වර්ග නිෂ්පාදනය උදෙසා දැනට පවතින වට්ටෝරුව වෙනස්කම් සිදු කෙරෙමින් පලතුරු පරිභෝජනය වැඩි කිරීමේ අරමුණු ඇතිව පහත නිෂ්පාදනයන් සිදු කෙරිණි. සැපදිල්ලා මගින් වට්නි, ජෑම් සහ මිල්ක් ෂේක්, නිෂ්පාදනය කරනු ලැබූ අතර වෙරළු වට්නියක්ද නිෂ්පාදනය කෙරිණි. එම නිෂ්පාදන සැකසීමේදී සීනි සහ සිට්‍රික් අම්ල මට්ටම අවශ්‍ය පරිදි වෙනස් කරනු ලැබිණි. ඉදුණු ලාවුළු සහල් පිටි සමග මිශ්‍රකර මුරුක්කු වැනි සැහැල්ලු ආහාරයක් සැකසිණි. හොඳින් වැඩුණු ලාවුළු වලින් සැහැල්ලු ආහාර (රස ගැන්වූ බයිට්ස්), රොටී, පිට්ටු සහ වඩේ (උළුඳු වඩේ සහ මසල වඩේ) සකස් කරනු ලැබිණි. පිට්ටු, රොටී සහ මසල වඩේ සැකසීමේදී ගාන ලද ලාවුළු සහල් පිටි 1:1 අනුපාතයෙන් මිශ්‍ර කළ අතර උළුඳු වඩේ සෑදීමේදී උඳු පිටි:ලාවුළු:සහල් 2:1:1: අනුපාතයෙන් මිශ්‍ර කරනු ලැබිණි.

## ගෙවතු වැඩි දියුණු කිරීම සහ ගෙවතු වගාව පිළිබඳව ගොවීන් පුහුණු කිරීම සහ පාසැල් සිසුන් දැනුවත් කිරීම

ගෙවතු වගාවේ ප්‍රයෝජනවත් බව නිදර්ශනය කිරීමට සහ පාසැල් සිසුන් දැනුවත් කිරීම උදෙසා 2005 වර්ෂයේදී පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී ගෙවත්තක් ස්ථාපිත කරනු ලැබිණි. 2013 වර්ෂයේදී පාසැල් සිසුන් 2790ක්, ගුරුවරුන් 234ක් සහ වෙනත් පුද්ගලයින් 206ක් මෙම ගෙවත්ත නැරඹූ අතර ගෙවතු වගාව පිළිබඳව ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කරගනු ලැබිණි.

### පුහුණු වැඩසටහන්

2013 වර්ෂයේදී පහත පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

- පාසල් 14කින් පැමිණි පාසැල් සිසුහු 760ක් සහ ගුරුවරු 16ක් ආයතනය නැරඹූහ.
- විශ්වවිද්‍යාල සිසුන් 16 සහ කථිකාචාර්යවරුන් සඳහා පුහුණු වැඩසටහන් 2ක් පවත්වනු ලැබිණි.
- පලතුරු වගාව, ගෙවතු වගාව සහ පටක රෝපණය සහ පැළ තවාන් කළමනාකරණය පිළිබඳව පුහුණුවන්නන් 517ක් සඳහා පුහුණු වැඩසටහන් 16ක් පවත්වනු ලැබිණි.

### ජනමාධ්‍යය

පලතුරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීහු පලතුරු බෝග වගාව, පළිබෝධ සහ ගෙවතු වගාව පිළිබඳව රූපවාහිනි වැඩසටහන් 03, සහ ගුවන්විදුලි වැඩසටහන් 04කට සහභාගී වූහ.

## 2014 සැලසුම

### බෝග ප්‍රවර්ධනය

- දැනට පවතින ජනක ප්ලාස්මයන්ගෙන් බලාපොරොත්තු තැබිය හැකි කොස් *(Artocarpus heterophillus)* වරණය
- තෙත් කලාපයේ දැනට හමුවූ ජනක ප්ලාස්මයන්ගෙන් ඉහළ ගුණාත්මක වැඩි අස්වනු අඹ ප්‍රභේද වැඩි දියුණු කිරීම (ජාතික කෘෂි පර්යේෂණ ව්‍යාපෘතිය)
- කෙසෙල්වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්
- ශාක වර්ධන හෝමෝන හරහා ඩ්‍රැගන් ෆෘට්වල අවාරයට මල් හට ගැනීම ප්‍රේරණය අධ්‍යනය
- මිල්ලව, සුවඳැල් යන කෙසෙල් ප්‍රභේදවල ගුණාත්මකබව සහ ආයු කාලයට කෙසෙල් කැනෙහි වයස බලපෑම
- ලාවුළු සඳහා විවිධ වර්ධක ප්‍රචාරණ ක්‍රම අධ්‍යනය
- රඹුටන් එකතුකිරීම සහ ඇගයීම
- රඹුටන්වල වර්ධනයට සහ අස්වැන්නට ශාක සනත්වය සහ කප්පාදු උස බලපෑම
- රසායන ද්‍රව්‍යය භාවිතයෙන් මල් සහ ගෙඩි වැටීම වලක්වාලීම තුළින් රඹුටන් ඵලදායිතාව ප්‍රවර්ධනය
- රසායන ද්‍රව්‍ය භාවිතයෙන් රඹුටන්වල පලතුරු ඉදීම පමා කිරීම
- රඹුටන් පවතින කාලය පිළිබඳව දිනදර්ශනයක් සැකසීම.
- උසස් එකතුන් සඳහා පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දැනට පවතින රඹුටන් ගහනයේ ලක්ෂණීකරණය
- නවතම නිර්දේශිත ගොරක ප්‍රභේද *(Garcinia quaesita)* වල අනුවර්තන පරික්ෂාව

- උගුරැස්ස (*Flacourtia indica*) බලාපොරොත්තු තැබිය හැකි එකතුන් වරණය
- අනාගත භාවිතය උදෙසා ගොරක හා උගුරුස්ස එකතුන් නඩත්තුව
- දිවයින පුරා මැංගුස් පවතින කාලය පිළිබඳව දින දර්ශනයක් සැකසීම
- වරින් වර කප්පාදු කිරීම මගින් පේර ගෙඩි සෑදීම උත්තේජනය
- ජම්බු (*Syzygium samarangense*) ගෙඩි වර්ධනයට අස්වනු පරාමිතීන් සඳහා ගිබරලික් ඇසිඩ් වල බලපෑම ඇගයීම.
- යෝග්‍ය පුහුණු ක්‍රමයක් වැඩිදියුණු කිරීමත් සමග අනෝදා ඉහළ ගහනයකින් යුක්තව පැලකිරීමට ඇති හැකියාව අධ්‍යනය
- ජම්බු සඳහා යෝග්‍ය වියන කළමනාකරණ ක්‍රමයක් වැඩි දියුණු කිරීම
- මසං (*Ziziphus jujuba*) සඳහා යෝග්‍ය ප්‍රචාරණ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම
- වාණිජ වගාව සඳහා වැඩි අස්වනු සහ ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුත් දූරියන් ප්‍රභේද වැඩිදියුණු කිරීම
  - දේශිය එකතුන් රැස් කිරීම, ඇගයීම, වරණය සහ ලක්ෂණීකරණය
  - වාණිජ වගාව සඳහා දූරියන් දෙමුහුම් වැඩිදියුණු කිරීම
  - ඵල දැරීමේ හැකියාව ඉහළ දැමීම උදෙසා මල් සෑදීමේ චර්යාව සහ සක්‍රීයව පරාගනය වීම පිළිබඳව අධ්‍යයනය
  - දූරියන් සඳහා කෘත්‍රිමව පරාගන තාක්ෂණයන් වැඩිදියුණු කිරීම
- වැඩි අස්වනු සහ ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුත් පැඟිරි ප්‍රභේද වැඩිදියුණු කිරීම (ජමනාරං, දොඩම්, ජම්බෝල සහ දෙහි)
  - දේශිය පැඟිරි එකතුන් රැස්කිරීම, ඇගයීම, වරණය සහ ලක්ෂණීකරණය (ජමනාරං, දොඩම්, ජම්බෝල සහ දෙහි)
  - ජමනාරං සහ පැණි දොඩම් දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම
  - තෝරාගත් පැඟිරි එකතුන්වල වැඩි අස්වනු සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ විකෘති වැඩිදියුණු කිරීම (නස්නාරං, HOCR 24)
  - නව ජමනාරං සහ විදේශීය දෙඩම් ප්‍රභේද ඇගයීම
  - පැණි දොඩම් සහ ජමනාරං අවාරයට ගෙඩි සෑදීම සඳහා නව කෘෂි කාලගුණික කලාප හඳුනාගැනීම
- වැඩි අස්වනු සහ ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් බෙලි ප්‍රභේද වැඩි දියුණු කිරීම.
  - බෙලි ජනකප්ලාස්ම රැස්කිරීම, ඇගයීම සහ වරණය
  - බෙලිවල මල් සෑදීමේදී ජෛව විද්‍යාව සහ මල් සෑදීමේ චර්යාව අධ්‍යනය

## බෝග කළමනාකරණය

- බද්ධ දූරියන් සඳහා ශාක කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම
- අවාරයේදී කෘත්‍රිමව මල් සෑදීම ප්‍රේරණය
- රඹුටන් සඳහා ලාභදායී බෝග කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩි දියුණු කිරීම
- අනාගත භාවිතය උදෙසා ගොරක සහ උගුරැස්ස එකතුන් නඩත්තුව
- නව නිර්දේශිත ගොරක ප්‍රභේදවල (*Garcinia quaesita*) අනුවර්තන පරීක්ෂාව
- බ්‍රැගන් ෆෘට්වල කණුවක පුහුණුවකදී වැල වර්ධනය, අස්වැන්න සහ ගුණාත්මක බව සඳහා කැපුමේ ප්‍රමාණය සහ කැපුම් සංඛ්‍යාවේ බලපෑම

- වර්ධනය සහ අස්වැන්න සඳහා ද්විත්ව මුල් ග්‍රාහක බද්ධ ඇගයීම
- අනෝදා බීජ පැළ අස්වැන්න කෙරෙහි ශාක පුහුණුවෙහි බලපෑම
- පැෂන්ෆෲට් වල විවිධ පන්දලම් පද්ධතීන්හි ඇගයීම
- කලාපය සඳහා නිර්දේශිත අඹ ප්‍රභේදවල මල් සෑදීමේ ප්‍රේරණය උදෙසා පැක්ලොබියුටසෝල් භාවිතය
- වෙරළුවල බීජ ප්‍රරෝහණ අධ්‍යනය

## පාංශු විද්‍යාව සහ ශාක පෝෂණය

- වාර්ෂික වගා ක්‍රමය යටතේ කෙසෙල්වල ඵලදායීතාවය වැඩිකිරීම උදෙසා කෙසෙල් වගා පසෙහි පොටෑසියම් ලබා ගතහැකි බව ඇගයීම සහ පොටෑසියම් කළමනාකරණය (සම්බන්ධීකරණය)
- අන්නාසි වල ඵලදායීතාවය වැඩිකිරීම උදෙසා කාර්යක්ෂම පෝෂක කළමනාකරන පිළිවෙත් මලාවක් වැඩිදියුණු කිරීම (සම්බන්ධීකරණය)
- කෙසෙල්වල පොටෑසියම් සහ කැල්සියම් පූර්ව අස්වනු ප්‍රතිකර්මය
- පැෂන් ෆෲට් (වැල් දොඩම්) සඳහා විවිධ පොහොර නිෂ්පාදන ක්ෂේත්‍ර පරීක්ෂාව

## ශාක ව්‍යාධිවේදය

- ජෛව හා රසායනික ක්‍රමවේද තුළින් විනාශකාරී මූල පද්ධති රෝග කළමනාකරණය
- පැපොල් වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම උදෙසා ප්‍රතිවිරුද්ධව ක්‍රියාකරන්නා වූ ක්ෂුද්‍ර ජීවීන් වෙන් කිරීම සහ හඳුනාගැනීම
- රසායනික නොවන ක්‍රමවේද මගින් මෘදු කුණුවීම සහ නටුවට විරුද්ධ පස කුණුවීම පාලනය

## කීට විද්‍යාව

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් පේර වගා කරන ප්‍රදේශවල මූල ගඩු නොමටෝඩාවන් (*Meloidogyne* spp) ජීව විද්‍යාව හා පාලනය පිළිබඳ අධ්‍යයනය (ජා.කෘ.ප.ව්‍යා අරමුදල් ප්‍රතිපාදිත)
- කෙසෙල් මුල්/කඳ ගුල්ලාට එරෙහිව කෑට කෘමිනාශක භාවිතය
- කෘමිනාශක භාවිතයෙන් ගොරකවල සුදු ඉටි සහිත කොරපොතු කෘමීන් (*Gascardia brevicauda*) පාලනය
- පලතුරු බෝගවල පලතුරු මැස්සා පාලනය කිරීමට විවිධ පෙරමෝන් උගුල් පරීක්ෂාව
- පලතුරු බෝගවල පිටිමකුණා (*Pseudococcus* spp) එරෙහිව ශාක පළිබෝධනාශක වල ක්ෂේත්‍ර ඇගයීම
- පලතුරු බෝගවල කඳ විදින්නා (trunk borer) පාලනය (රඹුටන්, දූරියන්, අඹ, කොස්)
- පලතුරු බෝග වල සුදු ඉටි සහිත කොරපොතු කෘමියාගේ ස්වාභාවික සතුරු ආකාර ජීවීන් හඳුනාගැනීම
- සූර්යශක්ති ආලෝක උගුල් භාවිතය මගින් පළිබෝධ පාලනය
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සමඟ සහයෝගීත්වය ඇතුව දිවයින පුරා පලතුරු මැස්සා පාලන වැඩසටහන
- කොස් කඳ පණුවා පිළිබඳ පරීක්ෂාව

## පටක රෝපණය

- අඹවල කලල ආරක්ෂණය
- ක්ෂුද්‍ර ප්‍රචාරණ කෙසෙල් බාහිර පරිසරයේ වෙනස්වීම් වලට මහා පරිමාණ අනුවර්තීබව පරීක්ෂාව සහ ඇගයීම
- ක්ෂුද්‍ර ප්‍රචාරණ අන්නාසි බාහිර පරිසරයේ වෙනස්වීම්වලට මහා

- පරිමාණ අනුවර්ති බව පරීක්ෂාව සහ ඇගයීම.
- වැල් දොඩම් වල දෛහික කලල ජනනය මගින් පැළ පුනර්වර්ධනය (පටක රෝපණය සහ විකෘති අභිජනනය යන දෙකෙහිම එකතුවකි)

## පසු අස්වනු සහ ආහාර තාක්ෂණය

- ඌන උපයෝජිත පලතුරු බෝගවල අගය වැඩි නිෂ්පාදන වැඩිදියුණු කිරීම (ලොවි, ජම්බු, කාමරංගා)
- ගුණාත්මකබව ප්‍රවර්ධනය උදෙසා පේර ශාකයේ ගෙඩි ආවරණය කිරීම පිණිස උචිත ද්‍රව්‍ය තෝරා ගැනීම.
- වෙරළු පල්පය ශීත ගබඩාවල ගබඩාකර තබාගැනීමේ උෂ්ණත්වය හඳුනාගැනීම

## පැළෑටි ප්‍රචාරණ ක්‍රමවේද

- ඌන උපයෝජිත පලතුරු බෝග වල බීජ ප්‍රරෝහණ ආකාර වැඩිදියුණු කිරීම පිළිබඳ අධ්‍යනය (වෙරළු, ලොවි, උගුරැස්ස)
- මැංගුස් සඳහා සීඝ්‍ර වර්ධන ක්‍රමෝපායක් පිළිබඳ අධ්‍යනය
- දූරියන් ඇට ප්‍රරෝහණ ආකාරය සහ දූරියන් බීජ ගබඩාකිරීම පිළිබඳ අධ්‍යයනය
- දූරියන්වල ඵලදා අනුපාතය ප්‍රවර්ධනය උදෙසා බද්ධ කිරීමේ තාක්ෂණය වැඩිදියුණු කිරීම
- අංකුර බද්ධ/වර්ධක ප්‍රචාරණ පලතුරු පැළ පෝච්චිවල සිටුවීමේදී අඩු බරති වගා මාධ්‍යයක් පිළිබඳ අධ්‍යයනය (පස් අඩුවෙන්/අඩු බරති වගා මාධ්‍ය වැඩියෙන්)
- වැඩුණු අඹ බීජපැල සඳහා මුල් පොදි ගැසීමේ ක්‍රමෝපාය වැඩි දියුණු කිරීම
- වැඩුණු අඹ බීජ පැළ සඳහා මුල් පොදි ගැසීමේ ක්‍රමෝපාය වැඩිදියුණු කිරීම
- වැඩුණු අඹ බීජ පැල සඳහා බහු බද්ධ ක්‍රමෝපායන් ප්‍රවර්ධනය
- මුරුසි අන්නාසිවල ඵලයේ ගුණාත්මක බව සහ ආයු කාලයට පූර්ව අස්වනු ප්‍රතිකර්මයන්හි බලපෑම අධ්‍යයනය
- අන්නාසි සඳහා වැඩි ඝනත්ව වගා ක්‍රමය උපයෝගී කර ගැනීමට ඇති හැකියාව අධ්‍යයනය (පේළි 3 වගා ක්‍රමය)

## සමාජ ආර්ථික

- පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සඳහා 2013 INFORM වාර්තාව සැකසීම
- පලතුරු බෝගවල සමාජ ආර්ථික තොරතුරු පිළිබඳ දත්ත වගුව වැඩිදියුණු කිරීම

## සංවර්ධන වැඩසටහන

- පිහිටුවා ඇති ආදර්ශ ගෙවත්ත වැඩිදියුණු කිරීම හා නඩත්තුව
- හොරණ නිවර්තන පලතුරුවල ජෛව විවිධත්ව ගෙවත්තක් ස්ථාපිත කිරීම
- පලතුරු ගම්මාන වැඩසටහන

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරී | 13 |
| ආර්ථික සහකාර | 01 |
| වැඩසටහන් සහකාර | 10 |
| පර්යේෂණ සහකාර | 09 |
| කෘෂිකර්ම උපදේශක | 12 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 04 |
| රියදුරු | 05 |
| ගබඩාකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| මුරකරු | 07 |
| බද්ධකරු | 03 |
| කම්කරු(ස්ථිර) | 29 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 104 |
| **එකතුව** | **203** |

# 1.3.1 පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - ගන්නොරුව

පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය යනු විශේෂයෙන්ම පලතුරු බෝග වල නිෂ්පාදනය සහ ඵලදායීතාවය වැඩි කිරීම උදෙසා වූ ප්‍රභේද වැඩි දියුණු කිරීම, ප්‍රචාරණ ක්‍රමෝපායන්, පැළ තවාන් කළමනාකරණය සහ බෝග කළමනාකරණය පිළිබඳව පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් වගකීම පවරන ලද ආයතනයකි. තවද රඹුටන්, අලිපේර, අඹ, දූරියන් වැනි ප්‍රධාන පලතුරුද මසං, බෙලි, වෙරළු, මාදං, මොර වැනි ඌන උපයෝජිත පලතුරු පිළිබඳව පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්ද පලතුරු බෝග පර්යේෂණ මධ්‍යස්ථානය මගින් ඉටුකෙරේ. මෙම මධ්‍යස්ථානය තෙත් කලාපීය, මැදරටට වඩාත් උචිත වන්නාවූ බෝග පිළිබඳව වැඩි අවධානයක් යොමු කරයි. මෙයට අමතරව නිලධාරීන්, විශ්ව විද්‍යාල, උසස් ඩිප්ලෝමා පාඨමාලා ශිෂ්‍යයින්, වෙනත් ශිෂ්‍යයින්, ගොවීන් සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන්නාවූ පුද්ගලයින් සඳහා ස්වකීය සේවය ලබා දේ.

විශේෂයෙන් ඌන උපයෝජිත පලතුරු බෝග ඇතුලත්ව රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ විශාල ගොවිපලක් ද මෙම මධ්‍යස්ථානය සතු වේ.

## අයවැය

**වගු අංක 1.3.1.1 : වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| පුනරාවර්තන | 4,484,050 | 3,896,365 | 87 |
| මූලධන | 1,820,000 | 1,819,237 | 100 |
| ව්‍යාපෘති - ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩසටහන් | | | |
| 1. පැපොල් | 703,000 | 671,985 | 96 |
| 2. දූරියන් | 570,000 | 561,503 | 99 |
| 3. කෙසෙල් | 650,000 | 608,442 | 94 |
| **එකතුව** | **28,687,000** | **19,735,916** | **69** |

## ප්‍රගතිය

### පර්යේෂණ

#### පලතුරු අභිජනනය

මෙම වර්ෂය තුළ දී ප්‍රධාන පලතුරු බෝග මෙන්ම ඌන උපයෝජිත පලතුරු බෝග වල ද වැඩි අස්වනු, ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ සහ පලිබෝධකයින්ට සහ රෝග වලට ඔරොත්තු දෙන්නා වූ නව ප්‍රභේදයන් හඳුනා ගැනීම, වරණය සහ වැඩි දියුණු කිරීම සිදු කෙරිණි.

## කෙසෙල්

“ඇම්බන්” කෙසෙල් වල කෘත්‍රිමව ප්‍රේරිත විකෘති පැල *Fusarium oxysporum* sp cubense මගින් ඇති කරන පැනමා රෝගයට එරෙහිව පරීක්ෂා කරනු ලැබිණි. එක් ශාකයක් රෝගයට එරෙහිව ප්‍රතිරෝධීතාවයක් පෙන් වූ අතර ආමුකුලනයෙන් පසු ක්ෂේත්‍රයේ ස්ථාපිත කර පටක රෝපණයෙන් මෙම ආරය, ගුණනය ආරම්භ කරනු ලැබුණි. රෝගයට ප්‍රතිරෝධීතාවයක් පෙන්වූ කෙසෙල් එකතුන් 12ක් අගයනු ලැබිණි. ඉහළ අස්වැන්නක් සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ සීනි කෙසෙල් එකතුන් තුනක්, ඇම්බන් සහ කෝලිකුට්ටු එකතුන් එක බැගින් තවදුරටත් ඇගයීම උදෙසා තෝරා ගනු ලැබිණි.

විවිධ ස්ථාන වලින් එකතු කළ ඇම්බන් එකතුන් 17ක් අතුරෙන් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් එකක් තෝරා තවදුරටත් ඇගයීම උදෙසා ගුණනය කෙරිණි. මෙම තෝරා ගත් කෙසෙල් එකතුන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් උදෙසා ක්ෂේත්‍රයේ ස්ථාන හතකදී ස්ථාපිත කරනු ලැබූ අතර දත්ත එකතු කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

## පැපොල්

උචිත ලක්ෂණ සහිත වැඩි අස්වනු ලබා දෙන සහ පැපොල් මුදු පුල්ලි රෝගයට ප්‍රතිරෝධී පැපොල් එකතුන් පසුගිය වසර 5 තුළදී එක්රැස් කෙරිණි. ස්වපරාගනය මඟින් ආර අටක් තෝරා ගනු ලැබූ අතර නුමුහුම් ආර වැඩිදියුණු කිරීම උදෙසා තවදුරටත් වරණය මඟින් චක්‍ර හතරකින් වරණයන් සිදු කෙරිණි.

## ජමනාරං/ දොඩම්

පසුගිය වසර 4 තුළදී විදේශීය හා දේශිය ප්‍රභේද 15ක් අගයනු ලැබිණි. තෙත් කලාපීය මැදරට පාරිසරික තත්ත්වයන් යටතේ විදේශීය ජමනාරං ප්‍රභේද තුනක් හොඳින් වර්ධනය වූ අතර වගාව සඳහා නිදහස් කිරීමට නිර්දේශ කෙරිණි. වැඩි අස්වනු ලබා දෙන සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ දේශීය දොඩම් ප්‍රභේදයක් තවදුරටත් ඇගයීම උදෙසා තෝරා ගනු ලැබූ අතර එම ප්‍රභේදයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කෙරෙමින් පවතී.

## දූරියන්

අස්වැන්න සහ ගුණාත්මක ලක්ෂණ උදෙසා විදේශීය සහ දේශිය ප්‍රභේද ඇගයිණි. එකතුන් 5ක ලක්ෂණීකරණය සම්පූර්ණ කෙරිණි. එක් විදේශීය ප්‍රභේදයක් මනා පැහැයකින් සහ රසවත් බවකින් යුක්ත වූ අතර ඵලය මනා පෙනුමකින් යුක්ත විය. පරීක්ෂණ අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

## අඹ

විවිධ විදේශීය සහ දේශිය ප්‍රභේද ඇගයීම් සිදු කෙරිණි TOM EJC ශාඛ ප්‍රභේදය වඩාත් හොඳ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ඵල නිෂ්පාදනය කෙරිණි.කෙසේ වුවද අනෙකුත් එකතුන් වල මල් හට නොගැණිනි.

## ඌන උපයෝජිත පලතුරු බෝග

පහත බෝග වල බලාපොරොත්තු තැබිය හැකි එකතුන් හඳුනා ගනු ලැබිණි. එම බෝග වල ඵලදායිතාවය ඇගයීම උදෙසා ස්ථාන 5කදී විවිධ ස්ථානයන්හි පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී.

- බෙලි (*Aegle marmelos )* (L) Corr
- මසං (*Ziziphus mauritiana* & *Ziziphus jujuba*)
- මාදං (*Syzygium cumini* (L) Skeels)
- ලොවි (*Flacourtia inermis*)

- මොර (*Euphoria longana* lam)
- ජම්බු (*Syzygium samarangense* merr & Perry)
- කරවල කැබිල්ල (*Antidesm bunius (L)* Spreng*)*
- ගඩුගුඩා ( *Bsccaurea motleyana*)

පහත දැක්වෙන පලතුරු ප්‍රභේද වල නව සුවිශේෂී ප්‍රභේද හඳුනාගනු ලැබිණි.

නෙල්ලි (*Phyllanthus emblica)* - විශාල ඵලය සහ වැඩි අස්වැන්න

ජම්බෝල (*Citrus maxima* ) (Burm) - මනා පෙනුමකින් යුත් තින්ත අඩු රතු පැහැති මාංශල ස්වභාවය

නිල් වෙරළු (*Elaeocarpus spheericus* L) - මනා පෙනුමැති නිල් පැහැති ඵලයකි

දේශීය පළතුරු බෝග 3ක් එනම් පට බඹර, හිඹුටු (*Salacia chinensis*) සහ කිරි කෝන් (*Scheleichera oleosa*) සහ ශ්‍රී ලංකාව තුළ දක්නට නොලැබෙන විදේශීය පලතුරු බෝග 2ක් ජැබොටිකාබා (*Myrciaria cauliflora*) සහ ඇබු (*Pouteria calmito)* ශ්‍රී ලංකාව තුළ වගා කිරීමේ හැකියාව හඳුනා ගැනීම උදෙසා වගා කරනු ලැබිණි. ඇගයීම් අඛණ්ඩව සිදු වේ.

## ශෂ්‍ය විද්‍යාව

### අඹ

විවිධ මුල් ග්‍රාහක සහ අන්තර් ග්‍රාහක ප්‍රභේද සංයෝජනයන් අගයනු ලබමින් තිබේ. මල්වාන සහ කරත්තකොලොම්බ වල ශාකයේ උසට අන්තර් ග්‍රාහක වල බලපෑමක් දක්නට නොලැබිණි. කෙසේ වුවද වෙල්ලිකොලොම්බන් ප්‍රභේදය මුල් ග්‍රාහකයක් ලෙස උපයෝගී කර ගත් විට මල්වාන ප්‍රභේදයේ ශාක උසට සහ වියන් ස්වභාවය වෙනස් විය. ඵලයන් එකතු කිරීම සහ අනෙකුත් ලක්ෂණ සොයා ගැනීම උදෙසා ඇගයීම අඛණ්ඩව සිදු විය.

### ඩ්‍රැගන් පෘට්

එක් කණුවකට ශාක විවිධ සංඛ්‍යාවක් යැවීමේ හැකියාව පරීක්ෂා කෙරිණි. වසර දෙකක් තුළ අස්වැන්න සහ ශෂ්‍ය විද්‍යාත්මක දත්ත එකතු කරනු ලැබූ අතර අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.

### කොස්

"ෆාදර් ලෝන්" ප්‍රභේදයේ බද්ධ කිරීමේ සාර්ථකත්වය ඉහළ දැමීම උදෙසා පරීක්ෂණ සිදු කෙරිණි. මිනිත්තු 30ක බීජ ප්‍රතිකර්ම කර මුල් ග්‍රාහකයට 20 $mgl^{-1}$ ක සාන්ද්‍රණයකින් යුත් කයිටොසාන් සති දෙකෙන් දෙකක කාල පරාසයකදී වැඩෙමින් පවතින බීජ පැල වලට ඉසීම මගින් 80%ක බද්ධ කිරීමේ සාර්ථකත්වයක් ලැබිණි.

## සංවර්ධනය

### පුහුණු වැඩසටහන්

පලතුරු වගාව, කප්පාදු කිරීම, පලතුරු බෝග පුහුණු කිරීම, මල්හට ගැනීම ප්‍රේරණය, බඳුන්වල පලතුරු බෝග වගා කිරීම සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

ගොවි පුහුණු වැඩසටහන් පන්ති - 20 ගොවින් සංඛ්‍යාව = 2400

නිලධාරී පුහුණු වැඩසටහන් පන්ති - 12 නිලධාරීන් සංඛ්‍යාව = 750

විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් සඳහා වූ වැඩසටහන් - 3 ශිෂ්‍යයින් සංඛ්‍යාව = 210

## ප්‍රදර්ශන

දැයට කිරුළ සහ ගොවි සතිය ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අතර මෙම භූමිවල ඌන උපයෝජිත පලතුරු බෝග ගෙවත්තත් ස්ථාපිත කරනු ලැබිණි.

## ව්‍යාප්ති කටයුතු

මෙම වර්ෂය තුළදී ආයතනයේ නිලධාරින් පලතුරු වගාව පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 6කට සහභාගී වූ අතර පත්‍රිකා 6ක් සැකසීම මෙන්ම පුවත් පත් ලිපි 5ක් ප්‍රකාශයට පත් කිරීමත් පලතුරු වගාව පිළිබඳ කුඩා පොත් යාවත්කාලීන කිරීමේ කටයුතු වලත් නියැලිණි. ආයතනයට පැමිණි පලතුරු වගාකරුවන් 400ක් සඳහා සහ දුරකථන මාර්ගයෙන් පලතුරු වගාව සහ පලිබෝධ සහ රෝග කළමකරණය පිළිබඳ උපදෙස් ලබාදුණි.

## රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

ප්‍රධාන සහ ඌන උපයෝජිත පලතුරු වල නිර්දේශිත සහ තෝරාගත් ප්‍රභේදවල ශාක විශාල ප්‍රමාණයක් ආයතනයේ පැළ තවානෙහි නිෂ්පාදනය කරනු ලැබ වගාකිරීම සඳහා නිකුත් කෙරිණි.

**වගු අංක 1.3.1.2: 2013 වර්ෂයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| පැළ වර්ගය | නිෂ්පාදනය කළ පැළ සංඛ්‍යාව | නිකුත් කළ පැළ සංඛ්‍යාව |
|---|---|---|
| බද්ධ පැළ | 10,510 | 6,782 |
| බීජ පැළ | 4,099 | 1,360 |
| මුල් කැපුම් | 1,700 | 984 |

**වගුව 1.3.1.3: 2013 වර්ෂයේ ස්ථාපිත කළ ඌන උපයෝජිත පලතුරු ගෙවතු/ ක්ෂේත්‍ර ජාන බැංකු**

| | පලතුරු ගෙවත්ත / ක්ෂේත්‍ර ජාන බැංකු | සිටුවන ලද පැළ සංඛ්‍යාව | එකතුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් අධ්‍යක්ෂ පොළොන්නරුව | 60 | 29 |
| 2 | ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම | 50 | 165 |
| 3 | කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර | 18 | 18 |
| 4 | ගුරුවැල්ල ආදර්ශ ගොවිපළ - ගුරුවැල්ල | 07 | 20 |
| 5 | තෙලිජ්ජවිල පර්යේෂණ ස්ථානය | 20 | 20 |
| 6 | ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය - ගන්නෝරුව | 12 | 12 |
| 7 | සේවා සංස්කරණ පුහුණු ආයතනය - අඟුණකොළපැලැස්ස | 17 | 49 |
| 8 | පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම | 07 | 14 |

| | පලතුරු ගෙවත්ත / ක්ෂේත්‍ර ජාන බැංකු | සිටුවන ලද පැළ සංඛ්‍යාව | එකතුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 9 | සේවා සංස්කරණ පුහුණු ආයතනය - මහඉලුප්පල්ලම | 20 | 32 |
| 10 | කෘෂි උද්‍යානය - බට අත | 26 | 52 |
| 11 | කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය- ගිරාඳුරුකෝට්ටේ | 02 | 06 |
| 12 | ශ්‍රී ලංකා නාවික කඳවුරු - තලාතුඔය | 13 | 17 |
| 13 | වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 20 | 20 |
| 14 | කෘෂිකර්ම විද්‍යාල - කුණ්ඩසාලය | 27 | 39 |
| 15 | වාරියපොළ රජයේ ගොවිපල | 28 | 46 |

## 2014 සැලසුම

### පලතුරු අභිජනනය

- වැඩි අස්වනු ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ පැපොල් ප්‍රභේද වැඩිදියුණු කිරීම.
- ප්‍රේරිත විකෘති මගින් පැනමා රෝගයට ප්‍රතිරෝධී වැඩි අස්වනු ලබාදෙන ඉහළ ගුණාත්මක තත්ත්වයකින් යුත් කෙසෙල් ප්‍රභේද වැඩිදියුණු කිරීම.
- පැනමා රෝගයට ප්‍රතිරෝධී ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ කෙසෙල් ප්‍රභේද වරණය.
- තෙත් කලාපීය මැදරට සඳහා වැඩි අස්වනු ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ පැඟිරි ප්‍රභේද වරණය.
- තෙත් කලාපීය මැදරට සඳහා අලිපේර ප්‍රභේද වරණය.
- ජනකප්ලාස්මීය ඇගයීම තුළින් බලාපොරොත්තු තැබිය හැකි ඇම්බන් කෙසෙල් එකතුන්වල මූලික අස්වනු ඇගයීම.
- කලාපය සඳහා වැඩි අස්වනු සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බලාපොරොත්තු තැබිය හැකි කෙසෙල් එකතුන්හි හොඳම ප්‍රභේදය තෝරා ගැනීම උදෙසා වූ ඇගයීම.
- දේශීය හා විදේශීය අඹ ප්‍රභේද ඇගයීම සහ බලාපොරොත්තු තැබිය හැකි එකතුන් තෝරාගැනීම.
- වගාව සඳහා නිකුත් කිරීමට වඩාත් උචිත එකතුන් තෝරාගැනීම උදෙසා දූරියන් ජනකප්ලාස්ම ඇගයීම.
- ඌන උපයෝජිත පලතුරු විශේෂයන් පරිබාහිර සංරක්ෂණය
- බෙලි, මසං, මොර, මාදං වැනි ඉතා උසස් ඌන උපයෝජිත පලතුරු බෝග එකතුන් ඇගයීම.
- භාවිතයට ගතහැකි දේශීය හඳුනා නොගත් පලතුරු එකතු කිරීම සහ ඇගයීම.

### ශෂ්‍ය විද්‍යාව සහ වෙනත්

- ජම්බු, ගඩුගුඩා, වෙරළු වැනි ඌන උපයෝජිත පලතුරු විශේෂ වර්ධක ප්‍රචාරණ ක්‍රම මගින් ඇගයීම.
- වෙරළු බීජ ප්‍රරෝහණය සඳහා බීජ ප්‍රරෝහණ මාධ්‍ය ඇගයීම.
- විශාල බඳුන්වල දේශීය පලතුරු විශේෂ ඇගයීම.
- ඌන උපයෝජිත පලතුරු විශේෂයන්හි පළිබෝධ සහ රෝග ඇතිවීම අධ්‍යයනය
- දේශීය පලතුරු බෝගවල මූල ගඩු හේතුවෙන් ඇතිවන බලපෑම අධ්‍යයනය
- මසං ශාකයේ බෝග ජීව සෘතු විද්‍යාව අධ්‍යයනය
- මසං සහ අනෝදා වල බීජ ප්‍රරෝහණය, බීජ පැල වර්ධනය සාර්ථකව බද්ධ කිරීමේ ක්‍රම පිළිබඳ අධ්‍යයනය.
- කටු අනෝදා සහ මසං ගම්මාන පිහිටුවීම.
- රඹුටං වැටීම සහ අස්වැන්න සඳහා රසායන ද්‍රව්‍යයන්හි බලපෑම.
- අලිපේර එල දැරීම, ගෙඩි නොවැටීම සහ අස්වැන්නට රසායන ද්‍රව්‍යයන්හි බලපෑම.
- තොම්සන් බීජ රහිත මිදිවල එලයේ ප්‍රමාණයට ගිබරලීන්හි බලපෑම.
- අඹ ගුණාත්මකබව ප්‍රවර්ධනය සඳහා පලතුරු ආවරණය කිරීම සඳහා විවිධ ද්‍රව්‍ය ඇගයීම.
- දූරියන්වල එල දැරීම ඉහළ දැමීම සහ නොමේරූ ගෙඩි වැටීම වැලැක්වීම උදෙසා විවිධ කොළ පොහොර යෙදීම පරීක්ෂා කිරීම.
- ඩ්‍රැගන් පෘටවල එල හට ගැනීම සහ එලදායීතාවයට එක් කණුවක වූ පැල වල ප්‍රභේදය සහ පැල සංඛ්‍යාව පිළිබඳ ඇගයීම.

### සංවර්ධනය

- රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය - බද්ධ පැල 15,000

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ආයතන ප්‍රධානී/ කාර්යභාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 02 |
| ගොවි කළමනාකරු | 01 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| වැඩසටහන් සහකාර | 01 |
| පර්යේෂණ සහකාර | 01 |
| ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහාකර | 01 |
| ගොවිපල් ලිපිකරු | 02 |
| සංවර්ධන නිලධාරි | 02 |
| පර්යේෂණ උපසහකාර | 01 |
| රියදුරු | 02 |
| වැල්ඩින්කරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකාරු | 01 |
| බද්ධකරු | 02 |
| මුරකරු | 09 |
| කම්කරු | 11 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 25 |
| **එකතුව** | **65** |

## 1.3.2 පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම

හෝමාගම පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය, හොරණ පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතන අධ්‍යක්ෂ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වේ. පැළෑටි වෛරස් සහ වෛරස් හා සමාන ජීවීන් හඳුනා ගැනීම උදෙසා වර්තමානයේ උපයෝගී කරගන්නා උසස් තාක්ෂණයන් යොදා ගැනීම මෙම මධ්‍යස්ථානයේ වගකීම වේ. මෙයට අමතර නිරෝධායනය උදෙසා පරීක්ෂණාගාරයන් හි සහ ක්ෂේත්‍රයේදී වෛරස් හා වෛරස් සමාන ජීවීන් හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ උපකරණ කට්ටල නිෂ්පාදනය, වසංගත විද්‍යාත්මක විමර්ශනය, උපයෝගී කර ගත හැකි වෙනත් පාලන ක්‍රම ඇගයීම, වෛරස් වලින් තොර මූලික වගා මාධ්‍ය පිරවීම් නිෂ්පාදනය, වෛරසයේ ප්‍රෝටීන කොපුවෙහි ප්‍රතිරෝධීතාවය පරීක්ෂා කිරීම, වෙනත් ව්‍යාධි ජනක ජීවීන් (දිලීර, බැක්ටීරියා, නෙමටෝඩා, වෛරොයිඩ් සහ ෆයිටොප්ලාස්ම) හඳුනා ගැනීම සහ දියගම (හෝමාගම) කෘෂි ඒකකය හා සම්බන්ධ හා තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ කටයුතු මෙම ආයතනය සතු අනෙකුත් වගකීම් වේ.

### අයවැය

**වගුව 1.3.2: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම% |
|---|---|---|---|
| පුනරාවර්තන | 3,483,300 | 2,883,820 | 83 |
| ප්‍රාග්ධන | 3,600,000 | 3,051,244 | 85 |
| **ව්‍යාපෘති** | | | |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘති - පැපොල් | 800,000 | 694,329 | 87 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘති - බැක්ටීරියා | 1,477,300 | 1,451,831 | 98 |
| පලතුරු ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය | 900,000 | 689,993 | 77 |
| පටක රෝපණ ව්‍යාපෘතිය | 2,370,000 | 2,343,869 | 99 |
| මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය (කෘෂිකර්ම ඒකකය) | 10,000,000 | 6,228,628 | 62 |
| **එකතුව** | **22,630,600** | **17,343,714** | **77** |

## ප්‍රගතිය

### සම්ප්‍රදායික ශාක වෛරස් විද්‍යා අංශය

- දේශීය වැඩිදියුණු කළ පැපොල් ශාක ප්ලාස්ම ප්‍රතිමස්තු සඳහා වූ ක්‍රමවේදය උපරිම කෙරිණි. මිශ්‍ර ප්‍රතිමස්තු වලට වඩා නිරෝගී ශාක යුෂ, දෙමුහුම් ලබාගත් ප්‍රතිමස්තු 1:1 අනුපාතය මගින් රෝගී නිරෝගී අනුපාතයට බලපෑමක් ඇති කරමින් රෝගයන්ට ලක්වීම වැඩිවීමක් දක්නට ලැබිණි. උපරිම ප්‍රතිමස්තු තනුකරණය 1:200, උපරිම ප්‍රතිබද්ධ තනුකරණය 1:500 ප්‍රතිදේහ ජනකය එකතු කිරීමෙන් පසු 1% මේද සහිත කිරි ද්‍රාවණය ශාක නිස්සාරක ස්වාරක්ෂණක ද්‍රාවණයේ දියකර දමා කාමර උෂ්ණත්වයේ පැයක් තබා ඉන්පසු ප්‍රතිමස්තු 1:200 අනුපාතයට එකතු කිරීම. (දෛනික හඳුනා ගැනීම් උදෙසා දේශීය නිෂ්පාදනය කළ ප්‍රතිමස්තු උපයෝගී කර ගැනිණි.) අන්නාසි මැලවීමේ වෛරසය (PWV) සඳහා බහුක්ලෝන ප්‍රතිමස්තු නිෂ්පාදනය. මෙම අධ්‍යයනය තුළදී වෛරස් සාර්ථකව ඉවත් කර ප්‍රතිමස්තු නිෂ්පාදනය කරනු ලැබීය. මෙම ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි. අනාගත හඳුනා ගැනීම් උදෙසා දේශීයව නිෂ්පාදනය කළ ප්‍රතිමස්තු යොදා ගනු ලැබිණි.
- කෙසෙල් වඳ පීදීමේ රෝගය සඳහා දේශීයව නිෂ්පාදනය කළ බහුක්ලෝන ප්‍රතිමස්තු සඳහා වූ ක්‍රමවේදය උපරිම කිරීම. රෝගයට බඳුන් වූ සහ නිරෝගී ශාක සාම්පල වල පැහැදිලි වෙනසක් දක්නට නොලැබුණි. එමනිසා මෙම ප්‍රතිමස්තු නිෂ්පාදනය අඛණ්ඩව සිදු කරනු ලබයි.
- ශාක වර්ධනය වැඩිදියුණු කරන රයිසොබැක්ටීරියා උපයෝගී කරගනිමින් ප්‍රේරිත සංස්ථානික ප්‍රතිරෝධීතාව හරහා පැපොල් මුදු පුල්ලි වෛරසය යටපත් කිරීම පිළිබඳ අධ්‍යයනය. *Pseudomonas fluorescent* ක්ෂුද්‍ර ජීවී විශේෂ 3ක් වෙන් කරගනු ලැබිණි. වෛරස් යටපත් කිරීමේ වැඩසටහන අඛණ්ඩව සිදු කරනු ලබයි.
- ශීඝ්‍ර ප්‍රතිශක්ති පෙරහන් පරීක්ෂණ තුළින් පැපොල් මුදු පුල්ලි වෛරස් රෝගය ස්ථානීය හඳුනා ගැනීම. අවශ්‍ය ද්‍රව්‍යයන්හි පිරිවිතරයන් පිළිබඳ පැහැදිලි කර ගැනීම සිදු කෙරෙමින් පවතී.
- පැපොල් වෛරස් සහ වෛරස් හා සමාන රෝග හඳුනා ගැනීම. මේ පිළිබඳ සමීක්ෂණ මීගහකිවුල, හල්දුම්මුල්ල, දඹුල්ල, සීගිරිය, පන්නල, වාරියපොල ගොවිජන සේවා මධ්‍යස්ථාන සහ පුත්තලම් දිස්ත්‍රික්කයෙහි සමීක්ෂණයන් සිදු කරනු ලැබිණි. පන්නල ප්‍රදේශයේ පැපොල් ෆයිටොප්ලාස්ම ආසාදනයන් වාර්තා විය. සියලුම ස්ථානවල පැපොල් මුදු පුල්ලි වෛරසය දක්නට ලැබිණි. පැපොල් විචිත්‍ර වෛරසය සහ තක්කාලි පුල්ලි මැලවීමේ රෝගය වාර්තා නොවිණි. රට තුළ අලුත් රෝගයක් ලෙස මෙම පැපොල් ෆයිටොප්ලාස්ම ආක්‍රමනය පැතිරෙමින් පවතී. දැනුවත්වීමේ වැඩසටහන් පවත්වනු ලැබිණි.
- දෛනිකව වෛරස් හඳුනා ගැනීම සම්පල 970ක් හඳුනා ගනු ලැබිණි.

උපයෝගීතාව : රෝගවලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය සහ වෛරස් රෝග තවදුරටත් පැතිරීම පාලනය කිරීම උදෙසා ව්‍යාධිජනකයින් නිවැරදිව හඳුනා ගැනීම සහ කෘෂි රසායනික වැඩිපුර භාවිතය අවම කිරීම

### අණුක වෛරස් විද්‍යා අංශය

- පැපොල්වල වෛරස් රෝග සහ වෛරස් රෝගය හා සමාන වෙනත් රෝග හඳුනා ගැනීම සහ ක්ෂේත්‍ර මට්ටමේදී මෙම රෝගවලට සංවේදී හඳුනා ගැනීමේ මෙවලම් කට්ටලයක්

වැඩිදියුණු කිරීම. මේ පිළිබඳ සමීක්ෂණ මීගහකිවුල, හල්දුම්මුල්ල, බදුල්ල, සීගිරිය, පන්නල සහ වාරියපොල යන ප්‍රදේශයන්හි ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හිදී සිදු කරනු ලැබිණි. පන්නල ප්‍රදේශයේ පැපොල් ෆයිටොප්ලාස්ම ආසාදනය වාර්තා විය.

- පිපිඤ්ඤා කොළ පුල්ලි විචිත්‍ර වෛරසය හඳුනා ගැනීමේ ක්‍රමෝපායන්. මෙම වෛරසය හඳුනා ගැනීම උදෙසා පොලිමරේස් දාම ප්‍රතික්‍රියා පදනම් ක්‍රමවේදයක් වැඩිදියුණු කරනු ලැබිණි.
- කෙසෙල් නිපත්‍ර විචිත්‍ර වෛරස් රෝගය සහ පිපිඤ්ඤා විචිත්‍ර වෛරස් රෝගය හඳුනා ගැනීම උදෙසා ද්විධ ක්‍රමවේදය පරීක්ෂණ අඛණ්ඩව සිදුවෙමින් පවතී.
- විශේෂිත දාම සමඟ RT - පොලිමරේස් දාම ප්‍රතික්‍රියා උපයෝගී කරගනිමින් අර්තාපල් වගා කරන ප්‍රදේශවල එක්ස් අර්තාපල් වෛරසය සහ අර්තාපල් පත්‍ර රෝල් වීමේ වෛරසය හඳුනා ගැනීම. මෙම අධ්‍යයනයන් උපරිම වශයෙන් සිදුකෙරෙමින් පවතී.
- පොලිමරේස් දාම ප්‍රතික්‍රියා මගින් දැනටමත් හඳුනා ගත් වෛරස් පරීක්ෂා කිරීම සහ ජාන අනුපිළිවෙල ගත කිරීම මඟින් තහවුරු කරගැනීම.
- හඳුනාගත් සාම්පල් සම්පූර්ණ සංඛ්‍යාව 356 කි.

  උපයෝගීතාවය : දෛනිකව වෛරස් හඳුනා ගැනීම සහ විශේෂයෙන් පෞද්ගලික අංශයට සහ ශාක නිරෝධායන කටයුතු වලදී වෛරස් වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය.

## වෛරස් වසංගත විද්‍යා අංශය

- දේශීය පාරිසරික තත්ත්වයන් යටතේ බහුවාර්ෂික පලතුරු බෝගවල කෘමි පළිබෝධකයින් පාලනය උදෙසා පළිබෝධනාශක ශාකවලට නික්ශේපනය කිරීමේ පරීක්ෂණය. කොස්, අඹ සහ දූරියන් ශාක "කඳ විදීමේ කෘමින්" සහ " පත්‍ර කීඩෑවන්" පාලනය උදෙසා ෆිප්‍රොනිල් 50g/l SC, තයෝමෙතොසම් 25% WG පරීක්ෂා කරන ලැබිය. ෆිප්‍රොනිල් යෙදීම මගින් කඳ විදින්නාගේ හානිය පාලනය විය. අධ්‍යයනයන් අඛණ්ඩව සිදුවේ.
- ක්ෂෙත්‍රයේ කඳවල් පරීක්ෂා කිරීම මගින් මඤ්ඤොක්කා විචිත්‍ර වෛරසය පාලනය සඳහා පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කෙරිණි. ක්ෂේත්‍රයෙන් එකතු කරගත් මඤ්ඤොක්කා දඬු පරීක්ෂා කිරීම මගින් මඤ්ඤොක්කා විචිත්‍ර වෛරසය පාලනය කිරීම උදෙසා මූලික අධ්‍යයනයන් සිදු කෙරිණි. මෙම වෛරසය සුළු වශයෙන් ආක්‍රමනය කල මඤ්ඤොක්කා ශාකයේ මැද ප්‍රදේශයේ දඬු කැබලි මගින් නිරෝගී ශාක වර්ධනය විය. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.
- පැපොල්වල පැපොල් මුදු පුල්ලි රෝගය පාලනය කිරීම උදෙසා විවිධ ක්ෂුද්‍ර පෝෂණ අඩංගු ශාක පොහොරවල බලපෑම අධ්‍යයනය කෙරිණි. මුල් අවස්ථාවේදී කොපර් (තඹ) ඉසීමේ ප්‍රතිකර්මයේදී පැපොල් මුදු පුල්ලි වෛරස් රෝග ලක්ෂණ ඇතිවීම පමා වූ බව මෙම අධ්‍යයනයේදී දක්නට ලැබිණි. නමුත් පසු අවස්ථාවේදී මෙම ප්‍රතිකර්ම සිදුකිරීමේදී වෙනසක් ඇති නොවුණි. හොඳින් වැඩුණු ශාක වලට මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.
- MS 100 පැපොල් ප්‍රභේදය පැපොල් මුදුපුල්ලි රෝගයට දක්වන ප්‍රතිරෝධීතාවය ක්ෂෙත්‍රයේ ඇගයිණි. මෙම අධ්‍යයනයට ලබාගත් සියලුම පැපොල් ප්‍රභේද පැපොල් මුදු පුල්ලි රෝගයට වැලදී තිබිණි. නමුත් "රත්න" සහ "සින්ටා" ප්‍රභේදයන් හා සාපේක්ෂව සැසදීමේදී MS 100 ප්‍රභේදයේ රෝග ලක්ෂණ පෙන්වීම සාපේක්ෂව අඩු මට්ටමක පැවතිණි. (විශේෂයෙන් මුදු

පුල්ලි රෝග ලක්ෂණ) අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.

- සුළු හා මධ්‍ය පරිමාණ බෝග වගාකරුවන් හට උපදේශක සේවාවන් ලබාදීම. මෙම වෛරස් රෝග ආක්‍රමනයවීම වැලක්වීම, කළමනාකරණය සහ තවදුරටත් පැතිරීම වැලක්වීම උදෙසා ක්ෂේත්‍ර චාරිකා 15ක්ද දැනුවත්වීමේ වැඩසටහන් 5ක්ද පවත්වනු ලැබිණි.

## වෙනත් ව්‍යාධිජනක ජීවී අංශය

- විවිධ රනිලමය ශාකවලින් වෙන්කර ගත් විවිධ ශාක වර්ධනය වැඩිදියුණු කරන රයිසොබැක්ටීරියා ලක්ෂණීකරණය. මෙම අධ්‍යයනය තුළදී පාරිසරික හිතවත් ආකාරයට රෝග පාලනය කිරීම උදෙසා ශාක වර්ධනය හැකියාවක් සහිත රයිසො බැක්ටීරියාවන් වෙන් කරනු ලැබිණි. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.
- දේශීය තත්ත්වයන් යටතේ බහුවාර්ෂික පලතුරු බෝගවල [ සුදු මුල් රෝග (White root disease) ඇන්ත්‍රැක්නෝස්, මුල් කුණු වීම] වැනි දිලීර රෝග පාලනය උදෙසා දිලීරනාශක ශාකවල එන්නත් කිරීමේ පරීක්ෂණ ක්ෂේත්‍ර පරීක්ෂණයන්හිදී අඹ සහ කොස්වලට තයෝෆිනේට් මෙතිල් 1 සහ ප්‍රොපිකනසෝල් විවිධ සාන්ද්‍රණයන් එන්නත් කිරීම ඵලදායි විය.
- තෝරාගත් පලතුරු බෝගවල රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය විවිධ කෘෂි පාරිසරික කලාපවලින් පැපොල්වලට විවිධ රෝග ඇති කරන්නා වූ කාරක ජීවීන් හඳුනා ගනු ලැබිණි. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.
- දිලීර බැක්ටීරියා වැනි දෛනික සාමාන්‍ය රෝග හඳුනා ගැනීමේ වැඩසටහන මෙහිදි සාම්පල 200කට වැඩි සංඛ්‍යාවක් රෝග නිධානය හඳුනාගනු ලැබූ අතර මෙම රෝගයන් සඳහා යෙදීමට සමෝධානික පළිබෝධ කළමනාකරණ පද්නම් ද්‍රාවණයන් බෙදා හැරිණි.

උපයෝගීතාවය - රෝග හඳුනා ගැනීම සහ නියාමන සහ කළමනාකරණ ක්‍රම ලබාදීම

## පටක රෝපණ අංශය

- පටක රෝපණ තුළින් පැපොල් ශාක නිෂ්පාදනය කිරීම උදෙසා ක්‍රමවේද වැඩිදියුණු කෙරිණි. ගුණනය උදෙසා වූ යොදා ගත් නලස්ථ බෝතල් සංඛ්‍යාව 300කි. මුල් පද්ධති පරිසරයට අනුකූලනය සඳහා වූ නලස්ථ බෝතල් සංඛ්‍යාව 50ක් වන අතර එම කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. මෙම කාර්යයන් අඛණ්ඩව සිදු කරනු ලබයි.
- චක්‍ර අංගජනනය තුළින් වෛරස් වලට ප්‍රතිරෝධී පැපොල් ප්‍රභේදයන් නිෂ්පාදනය කෙරිණි. පැපොල් නලස්ථ බෝතල් 200ක වගා කළ අතර කඳෙහි ව්‍යාප්තිය ආරම්භ කෙරිණි. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.
- විවිධ කෙසෙල් ප්‍රභේදයන්හි වෙනස් උප රෝපණ මට්ටම් ක්ෂේත්‍රයේ ඇගයිණි. විවිධත්වය සහ උචිත උපරෝපණ මට්ටම් හඳුනා ගැනීම උදෙසා වූ පරීක්ෂණයේදී විවිධ උප රෝපණ මට්ටම් වලින් කෙසෙල් පටක රෝපිත ශාක 50ක් ක්ෂේත්‍රයේ වගා කෙරිණි. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු කරනු ලබයි.
- රෝගවලින් තොර මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ක්ෂේත්‍ර ඇගයීම අන්නාසි පැළ 22,000ක් සහ රෝගවලින් තොර කෙසෙල් පටක රෝපණ පැළ 12,000ක් නිෂ්පාදනය කෙරිණි. විවිධ ගොවි ක්ෂේත්‍ර සහ රජයේ ගොවිපළවල පැළ වගා කෙරිණි.
- පත්‍ර රෝපණය මගින් MG3 අන්නාසි වේගවත් ප්‍රරෝහණ ක්‍රමවේදය. පත්‍ර රෝපිත MG3 අන්නාසි පටක රෝපිත පැළ 1000ක් විචලතාවය සහ පැරණි

ශාකවල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම උදෙසා වල්පිට ගොවිපළෙහි වගා කෙරිණි.

- පත්‍ර රෝපණය මගින් තෝරාගත් ඇන්තුරියම් ප්‍රභේද ක්ෂුද්‍ර ප්‍රචාරණය. ගුණනය උදෙසා නලස්ථ බෝතල් 646ක් සහ "කිරිමැටිය වරණය" සහ "ස්ප්‍රිට්" මුල් ඇදීම උදෙසා වගා කර අනුකූලනය/ පරිසරයට හුරු කිරීම ආරම්භ කෙරිණි.
- "අර්ධ අණුක බද්ධ කිරීම" තුළින් දොඩම් සහ ජමනාරං උදෙසා නව ක්‍රමය. ක්ෂේත්‍ර නිරීක්ෂණය උදෙසා බද්ධ පැල 20ක් වගා කෙරිණි. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.

## ශාක අභිජනන ක්‍රියාවලීන්

- ක්ෂේත්‍ර මට්ටමේදී සහ මිරිස් (*Capsicum annuum* L) සහ අනෙකුත් මාළු මිරිස් (*Capsicum* spp) වල වෛරස් සහ වෛරස් හා සමාන අනෙකුත් රෝග හඳුනා ගැනීම. මෙම අධ්‍යයනයේදී පිපිඤ්ඤා විචිත්‍ර වෛරසය (CMV) සහ මිරිස් නාරටි විචිත්‍ර වෛරසය (CVMV) වැනි වෛරසයන් මස්තු විද්‍යාත්මකව හඳුනා ගන්නා ලදී. තක්කාලි විචිත්‍ර වෛරසය සහ තක්කාලි පුල්ලි මැලවීමේ රෝගය මස්තු විද්‍යාත්මකව තවමත් හඳුනා නොගැනිණි. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.
- වෛරස් සහ රෝගයන්ට ප්‍රතිරෝධී වර්ග වරණය උදෙසා ජනකප්ලාස්ම (මාළුමිරිස් විශේෂ) / ප්‍රභේදයන් සහ වෙනත් වර්ග පරීක්ෂා කෙරිණි. භූමි දර්ශ 102ක් පරීක්ෂා කෙරිණි. (පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථාන, දේශීය සහ විදේශීය) ද්විගුණික සහ එක හා සමාන එකතූන් සොයා ගැනිණි. තවදුරටත් පරීක්ෂා කිරීම උදෙසා පිපිඤ්ඤා විචිත්‍ර වෛරසය (CMV) සහ මිරිස් නාරටි විචිත්‍ර වෛරසය (CVMV) යන වෛරස්වලට ප්‍රතිරෝධී වගා දර්ශ හඳුනා ගනු ලැබිණි. තහවුරු කිරීම උදෙසා කෘත්‍රිම ආමුකූලනය අවශ්‍ය වනු ලැබේ. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු වේ.
- වගාකරන ප්‍රභේදයන් / භූමිදර්ශවලට වෛරස් වලට ප්‍රතිරෝධී වන්නා වූ ලක්ෂණ සම්බන්ධ කිරීම උදෙසා මාළු මිරිස් විශේෂයන් අතර (*Capsicum spp.* අතර එනම් *Capsicum annuum, Capsicum chinense* සහ *Capsicum frutescens)* අන්තර් විශේෂිත මුහුම්කරණය පිළිබඳ අධ්‍යයනය. අන්තර් විශේෂිත දෙමුහුම්කරණය ආරම්භ කරනු ලැබූ අතර සාර්ථකත්වය ඉතාම අවම විය. අධ්‍යයනයන් අඛණ්ඩව සිදු කෙරේ.
- අලුතෙන් වැඩිදියුණු කළ බලාපොරොත්තු තැබිය හැකි මිරිස් දෙමුහුම්වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීය. 2013/2014 මහ කන්නය තුළ මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය හා එක්ව ඒකාබද්ධ වැඩසටහනක් පවත්වනු ලබයි.
- දේශීය හා විදේශීය වෙළඳපොල සඳහා වඩාත් හොඳ ගුණාත්මක තත්ත්වයෙන් යුත් හොඳින් වැඩෙන වැඩි අස්වනු මාළුමිරිස් ප්‍රභේදයන් (*Capsicum chinense* හෝ *Capsicum frutescens)* වැඩිදියුණු කිරීම. ගොවි කණ්ඩායම් හඳුනා ගැනීම දැන් කෙරෙමින් පවතින අතර පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.
- අන්නාසි බෝග ප්‍රවර්ධන වැඩසටහන අන්නාසි මුහුම්කරණය සහ වරණය මුහුම්කරණ කිහිපයක් සිදු කරනු ලැබිණි. පටක රෝපිත මාධ්‍ය වල බීජ රෝපණය කෙරිණි. බීජ පැළ කිහිපයක් නිෂ්පාදනය කෙරිණි. පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.
- MS 100 උපයෝගී කරගනිමින් පැපොල් මුදු පුල්ලි වෛරසයට ප්‍රතිරෝධී මෙන්ම පාරිභෝගික පිළිගැනීම සඳහා පැපොල් ප්‍රභේද ඇගයිණි. පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.

### තාක්ෂණික භූවමාරු අංශය

- ගුවන් විදුලි වැඩසටහන් 05, පත්‍රිකා 01, පටක රෝපණ ක්ෂේත්‍ර නිරීක්ෂණ 05, ක්ෂේත්‍ර චාරිකා 02ක්, බෝග සායන 15ක් පවත්වනු ලැබිණි.
- මධ්‍යස්ථානයට පැමිණි ගොවීන්/ වගාකරුවන් 110 දෙනෙකු සඳහා උපදෙස් ලබාදුණි. මෙයට අමතරව දුරකථනයෙන් සම්බන්ධ වූ ගොවීන්/ වගාකරුවන් 500කට වැඩි ප්‍රමාණයකට දුරකථනය මාර්ගයෙන් උපදෙස් ලබාදුණි.
- මධ්‍යස්ථානයේ නාගරික කෘෂිකර්ම ආදර්ශ එකක් සහ ගෙවතු වගා ආදර්ශ එකක් නඩත්තු කරනු ලැබිණි.
- දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ පාරිසරික හිතකර කෘෂිකර්ම වැඩසටහන සඳහා ව්‍යාප්ති කාර්යයන් කිහිපයක්ම පවත්වනු ලැබිණි. පාසල් ශිෂ්‍ය කණ්ඩායම් 16ක් මෙම නැරඹූ අතර දේශීය හා විදේශීය පුහුණු ලබා ගැනිණි.

## 2014 සැලසුම

### සාම්ප්‍රදායික ශාක වෛරස් විද්‍යා අංශය

- ශ්‍රී ලංකාවට ආවේනික පිපිඤ්ඤා විචිත්‍ර වෛරසයෙහි ජෛවීය ලක්ෂණීකරණය
- දේශීයව නිෂ්පාදනය කළ ප්‍රතිමස්තු උපයෝගී කරගනිමින් මස්තු විද්‍යාත්මකව අන්නාසි මැලවීමේ වෛරස් රෝගය හඳුනාගැනීමේ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය
- *Pseudomonas fluorescence* උපයෝගී කරගනිමින් ප්‍රේරිත සංස්ථානික ප්‍රතිරෝධීතාවය තුළින් පැපොල් වල පැපොල් මුදු පුල්ලි වෛරස් පාලනය
- ශ්‍රී ලංකාවට ආවේනික පැපොල් මුදු පුල්ලි වෛරසයෙහි ජෛව විද්‍යාත්මක ලක්ෂණීකරණය.
- පැපොල් වල වෛරස් රෝග සහ වෛරස් හා සමාන රෝග හඳුනා ගැනීම සහ ක්ෂේත්‍ර මට්ටමේදී මෙම රෝගයන්ට සංවේදී මෙවලම් කට්ටල වැඩිදියුණු කිරීම.
- පිපිඤ්ඤා කොළ පුල්ලි වෛරස් සහ කෙසෙල් වඳපීදීමේ වෛරස් සඳහා බහුක්ලෝන ප්‍රතිමස්තු නිෂ්පාදනය.
- මිදිවල වෛරස් සහ වෛරස් හා සමාන රෝග හඳුනා ගැනීම.
- දෛනික වශයෙන් වෛරස් රෝග හඳුනාගැනීමේ වැඩසටහන සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම.

### අණුක වෛරස් විද්‍යා අංශය

- පැපොල් වල වෛරස් සහ වෛරස් හා සමාන රෝග හඳුනා ගැනීම සහ හඳුනා ගැනීමේ ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම.
- පැපොල් මුදු පුල්ලි වෛරසයට ප්‍රතිරෝධීතාවය සඳහා ප්‍රොටීන් කොපුව හා සම්බන්ධ ජාන අධ්‍යයනය.
- වෛරස් හඳුනා ගැනීමේ කටයුතු සඳහා DNA පදනම් හඳුනාගැනීමේ ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම
- ද්විගුණ ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් කෙසෙල් වෛරස් (BBrMV & CMV) හඳුනා ගැනීම
- මිදි වල වෛරස් සහ වෛරස් හා සමාන රෝග
- අර්තාපල් වගා ප්‍රදේශවල එක්ස් අර්තාපල් වෛරසය රිවර්ස් ට්‍රාන්ස්ක්‍රිප්ටේස් පොලිමරේස් දාම ප්‍රතික්‍රියා (RT – PCR) සමඟ විශේෂිත දාමද උපයෝගී කරගනිමින් හඳුනා ගැනීම
- පොලිමරෙස් දාම ප්‍රතික්‍රියා මගින් දැනටමත් හඳුනාගත් වෛරස් ජාන පෙළගැස්වීම් මගින් හඳුනා ගැනීම
- පොලිමරේස් දාම ප්‍රතික්‍රියා මගින් දෛනික වශයෙන් වෛරස් හඳුනා ගැනීම සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම

## වෛරස් වසංගත විද්‍යා අංශය

- ක්ෂේත්‍රයේදී දඬු පරීක්ෂා කිරීම මගින් මඤ්ඤොක්කා විචිත්‍ර වෛරසය කළමනාකරණය සඳහා පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම.
- අඹ සහ කොස් වල කෘමි පළිබෝධකයින් පාලනය උදෙසා ශාක නික්ෂේපණය ක්‍රමෝපායන් යොදා ගැනීමට ඇති හැකියාව අධ්‍යයනය
- අන්නාසි පත්‍ර කක්ෂයෙහි එකතුවන ජලයෙහි මදුරුවන් අභිජනනය වීම පරීක්ෂා කිරීම සහ කළමනාකරණය
- පලතුරු බෝගවල රෝගකාරක පළිබෝධ කෘමීන් නෙරපා හැරීම උදෙසා තෝරාගත් සෙමින් නිදහස් වන ස්වභාවික සහ කෘත්‍රිම වාෂ්පීකරණ සංයෝග පිළිබඳ පරීක්ෂා කිරීම

## වෙනත් ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවී අංශය

- විවිධ රෛසෝමීය ශාකවලින් (රනිල කුලයේ ශාක වලින්) වෙන් කරගත් විවිධ ශාක වර්ධනය වැඩිදියුණු කරන රෛසොබැක්ටීරියාවන් ලක්ෂණී කරණය.
- දේශීය තත්ත්වයන් යටතේ තෝරාගත් බහුවාර්ෂික පලතුරු බෝගවල දිලීර රෝග පාලනයට ශාක දිලීර රෝග පාලනයට ශාක නික්ෂේපණ උපයෝගී කර ගැනීමේ හැකියාව අධ්‍යයනය
- ඩ්‍රැගන් ෆෘට් ශාක වල බැක්ටීරියා රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය
- දෛනිකව රෝග හඳුනා ගැනීමේ වැඩසටහන සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම

## පටක රොපණ අංශය

- කඳ අග්‍ර රෝපණය මගින් පැපොල් ශාක නිෂ්පාදනය උදෙසා ක්‍රමවේදයක් හඳුනා ගැනීම
- පටක රෝපණය සහ ජාන භුවමාරුව මගින් වෛරස් වලට ප්‍රතිරෝධී පැපොල් ප්‍රභේද නිෂ්පාදනය සඳහා වූ ක්‍රමවේදයක් සැකසීම
- පටක රෝපිත කෙසෙල් සහ අන්නාසි සඳහා විවිධ උපරෝපණ මට්ටම් පිළිබඳ ක්ෂේත්‍ර ඇගයීම
- වාණිජමය වගාව උදෙසා පටක රෝපිත අන්නාසි සහ කෙසෙල් රෝපණ ද්‍රව්‍ය වල යෝග්‍යතාව
- පත්‍ර රෝපණය මගින් ඇන්තුරියම් වල සමූහ පැළ සෑදීමේ කාර්යක්ෂමතාව ඉහළ දැමීම
- කෙසෙල් සහ අන්නාසි වල රෝග වලින් තොර රෝපණ ද්‍රව්‍ය සහ මව් ශාක නිෂ්පාදනය
- කුඩා පරිමාණ පටක රෝපණ නිෂ්පාදකයින් හට පටක රෝපණය පිළිබඳ පුහුණුව සහ ඇගයීම් වැඩසටහන

## ශාක අභිජනන ක්‍රියාවලීන්

- ප්‍රධාන වෛරස් රෝගවලට එරෙහිව මිරිස් (*Capsicum annum* L) වල ජාන ප්‍රවර්ධනය
- ක්ෂේත්‍ර මට්ටමේදී සහ පර්යේෂණාගාර තත්ත්වයන් යටතේ මිරිස් (*Capsicum annum* L) සහ වෙනත් මාළු මිරිස් විශේෂ වල ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන වෛරස් සහ වෛරස් හා සමාන රෝග හඳුනාගැනීම
- බහුල වශයෙන් දක්නට ලැබෙන ජනක ප්ලාස්ම (*Capsicum* spp.) ප්‍රභේද වෛරස් සඳහා පරීක්ෂා කිරීම සහ වෛරස් වලට ප්‍රතිරෝධී ප්‍රභේද වරණය
- වගා කරන ප්‍රභේදයන් / භූමි දර්ශ සඳහා රෝගයන්ට ප්‍රතිරෝධීවන්නා වූ ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සම්බන්ධ කිරීම උදෙසා මාළු මිරිස් විශේෂයන් අතර (*Capsicum* spp අතර, එනම් *Capsicum annuum*, *Capsicum chinense*, *Capsicum frutescens*) අන්තර් විශේෂ මුහුම්කරණ පිළිබඳ අධ්‍යයනය

- අලුතෙන් වැඩිදියුණු කළ බලාපොරොත්තු තැබිය හැකි මිරිස් දෙමුහුම් සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- දේශීය හා විදේශීය වෙළඳපොළ සඳහා වඩාත් හොඳ ගුණාත්මක තත්ත්වයෙන් යුතු හොඳින් වැඩෙන වැඩි අස්වනු මාළු මිරිස් ප්‍රභේදයන් *(Capsicum chinense,* හෝ *Capsicum frutescens)* වැඩිදියුණු කිරීම
- මුහුම්කරණය සහ වරණය තුළින් ඉතා උසස් අන්නාසි ප්‍රභේද වැඩිදියුණු කිරීම
- කුඩා පරිමාණ වගාවන් ප්‍රවර්ධනය උදෙසා මිරිස් බීජ පැල පෝච්චි 1000ක් සකසා බස්නාහිර පළාතේ ගොවීන් අතර බෙදා හැරිණි
- වගා මලු වල (මලු 500) වල මිරිස් වගාව නිදර්ශනය

### තාක්ෂණ හුවමාරු අංශය

- කෘෂිකර්ම උපදේශක, ගොවීන්, නිලධාරීන්, ගුරුවරු, ශිෂ්‍යයින් සඳහා දැනුවත්වීමේ වැඩසටහන් 19ක් සහ නව තාක්ෂණ හුවමාරු පවත්වනු ලබයි.
- ශාක සායන වැඩසටහන් 04, ක්ෂේත්‍ර පරීක්ෂණ සහ ක්ෂේත්‍ර දින 15
- කාබනික ගෙවතු 103 සහ සීමිත ඉඩ ප්‍රමාණයක් සහිත ප්‍රදේශයක ගෙවතු සංවර්ධන 150
- දැනට පවතින පලතුරු බෝගවල ඵලදායීතාව වැඩි කිරීම උදෙසා පුහුණු සැසි 12
- මධ්‍යස්ථානයට පැමිණි ගොවීන්ගේ පළිබෝධ සහ රෝග ගැටළු 250ක් හා සම්බන්ධ කටයුතු ඉටුකිරීම සහ ගොවීන්හට දුරකථනයෙන් අදාල උපදේශක සේවා ලබාදීම
- පටක රෝපිත කෙසෙල් සහ අන්නාසි ක්ෂේත්‍ර චාරිකා
- පුවත්පත් ලිපි 12ක් ප්‍රකාශනයට පත් කිරීම. ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩසටහන් 2
- නගරබද කෘෂිකර්මාන්ත සහ ගෙවතු වගා ආදර්ශන 01, පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථාන භූමියේදී ඵලවළු වගා ප්‍රවර්ධනය (අක්කර 1.5)
- දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ කෘෂිකර්ම වැඩසටහන

### කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරීන් | 05 |
| වැඩසටහන් සහකාර | 04 |
| කෘෂිකර්ම උපදේශක | 09 |
| පර්යේෂණ සහකාර | 06 |
| උප පර්යේෂණාගාර සහකාර | 01 |
| කළමනාකරණ සහකාර | 04 |
| ගබඩාකරු | 01 |
| රියදුරු | 03 |
| කම්කරු (ස්ථිර) | 02 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 12 |
| කම්කරු (ව්‍යාපෘති) | 06 |
| මුරකරු | 02 |
| **එකතුව** | **56** |

## 1.4 වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - බතලගොඩ

වත්මන්හි සහල් නිෂ්පාදනය ස්වයංපෝෂිත මට්ටමට පත් වී ඇති අතර ආහාර සුරක්ෂිතතාව තහවුරු කර ගැනීම සඳහා වාර්ෂික ඵලදායිතා ස්ථායිතාව පවත්වා ගෙන යාම අතිශයන්ම වැදගත් කරුණකි. එහෙත් පවතින අහිතකර කාළගුණික තත්ත්වයන් සහ ගෝලීය උෂ්ණත්වය හේතුවෙන් නිරන්තරයෙන්ම වෙනස්වන වර්ෂාපතන රටාව වී ඵලදායිතා ස්ථායිතාව පවත්වාගෙන යාම කෙරෙහි බලපාන ප්‍රධාන බාධාවන් වී ඇත. එබැවින්, වී වගා කරන විවිධ පරිසර පද්ධති වලට අනුවර්තනය විය හැකි ඉහළ අස්වනු ගෙන දෙන වී ප්‍රභේද බිහි කිරීම, එම වී ප්‍රභේද සඳහා යෝග්‍ය තාක්ෂණික ක්‍රම බිහි කිරීම මෙන්ම වී ප්‍රභේද සහ තාක්ෂණික ක්‍රම ව්‍යාප්ත කිරීම කෙරෙහි වී පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් මගින් ඉලක්ක කෙරේ.

### අයවැය

**වගු අංක 1.4.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 42,198,808 | 25,727,569 | 61 |
| පුනරාවර්තන | 36,726,070 | 35,583,753 | 97 |
| යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය | 6,855,315 | 6,855,315 | 100 |
| <u>විදේශ ව්‍යාපෘතිය</u> | | | |
| වල් පැළෑටි කළමනාකරණය | 1,250,000 | 684,708 | 55 |
| ග්‍රීන් සුපර් රයිස් | 2,150,000 | 641,168 | 30 |
| විවිධ අහිතකර පාරිසරික තත්ත්වයන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම | 1,023,670 | 313,195 | 31 |
| වී අස්වනු පරතරය ඉවත් කිරීම | 1,500,000 | 529,428 | 35 |
| සාර්ක් ඕස්ට්‍රේලියා | 254,170 | 254,777 | 100 |
| AFACI | 1,300,000 | 408,795 | 31 |
| <u>දේශීය ව්‍යාපෘති</u> | | | |
| LCWZ | 2,000,000 | 2,000,000 | 100 |
| දෙමුහුම් බීජ | 1,500,000 | 1,464,581 | 98 |
| අහිතකර පාරිසරික තත්ත්ව | 2,766,500 | 2,354,105 | 85 |
| පොහොර භාවිතය | 2,400,000 | 2,124,225 | 85 |
| වල් වී | 1,584,800 | 1,457,073 | 92 |
| ජල භාවිතය | 2,386,100 | 2,383,583 | 100 |
| දියර පොහොර | 212,00 | 92,650 | 44 |
| **එකතුව** | **106,101,433** | **82,874,928** | **78** |

## ප්‍රගතිය

### පර්යේෂණ

### වී ප්‍රභේද වැඩිදියුණු කිරීම

වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන මගින් ඉහළ අස්වනු විභවයක් සහිත එමෙන්ම නිෂ්පාදන යෙදවුම් සහ පරිසර දූෂණය අවම කිරීම සඳහා පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී ඉහළ ජාන ප්‍රතිරෝධීතාවයකින් යුත් ප්‍රභේද බිහි කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. ලවණතාවයට, යකඩ විෂමතාවයට සහ ජලයෙන් යටවීමට ඔරොත්තු දෙන ප්‍රභේද බිහි කිරීමද අපේක්ෂිතය. 2013 වසරේදී පුළුල් ජාන පදනමකින් යුත් ජෛව සාධක බොහොමයකට ප්‍රතිරෝධී ගුණාත්මක ධාන්‍ය වලින් සමන්විත නව උසස් ආර බිහි කිරීම මගින් සැලකිය යුතු සාර්ථකත්වයක් අත්පත් කර ගැනිණි.

### නව වී ප්‍රභේද

**Bg 370** - 2012 කොන්දේසි සහිතව මුදාහරින ලද Bg 3R නැමැති ආර Bg 370 නමින් මුදා හරින ලදි. මෙම ප්‍රභේද සුදු, කෙටි රවුම් හැඩයෙන් යුත් හෙ.1ට ටොන් 07ක් පමණ අස්වනු ගෙන දෙන, දින 95න් පරිණත වන ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට මෙන්ම ඇද වැටීමට ප්‍රතිරෝධී ප්‍රභේදයකි.

**Bg 96 – 741 -** මාස 4 ½ රතු ඵලාවරණයක් සහිත මෙම ප්‍රභේදය ගංවතුරට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බවක් පෙන්නුම් කරයි. මෙය මාතර, ගාල්ල, රත්නපුරය සහ කළුතර යන දිස්ත්‍රික්ක වල ස්ථාන 28කදී පරික්ෂා කර බැලූ අතර ගංවතුර තත්ත්වයන් යටතේ හෙ. 1ට ටොන් 5.4ක් පමණ වූ අස්වැන්නක් ගෙන දෙන ලදි. මෙම ආර විශේෂත්වය, ඒකාත්මිකතාව, ස්ථායිතාව සම්බන්ධයෙන් පරික්ෂා කර බැලීම සඳහා බීජ සහතික කිරීමේ සේවය වෙත ඉදිරිපත් කරන ලදි.

**Bg 4 – 91** මෙය මාස 03න් පරිණත වන සුදු ඵලාවරණයක් සහිත ලවණතාවයට ඔරොත්තු දෙන ආරක් වන අතර විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා බීජ සහතික කිරීමේ සේවයට යොමු කෙරිණි.

### මාස 4 ½ වයස් පංතිය

ශ්‍රී ලංකාවේ සමස්ථ වාර්ෂික වී බෝග වපසරියෙන් 8%ක පමණ ප්‍රමාණයක් මෙම වයස් පංතියේ වී ප්‍රභේද වලින් සමන්විත වේ. අස්වනු අත්හදා බැලීම මගින් උසස් ආර 18ක් ප්‍රධාන පළිබෝධ සහ රෝග, ධාන්‍ය අස්වැන්න සහ ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් ඇගයීමට ලක් කළ අතර 09 - 606 සහ 08 - 301 යන ආර දෙක කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බව හඳුනා ගැනිණි.

### මාස 3 ½ වයස් පංතිය

ශ්‍රී ලංකාවේ සමස්ථ වී වගා වපසරියෙන් 66%ක් මෙම වයස් පංතියේ වී ප්‍රභේද වලින් ආවරණය වේ.

අස්වනු අත්හදා බැලීම් වලින් උසස් ආර 16ක් වරණය කර ගත් අතර ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සඳහා Bg 10 - 1399 (Ld 12 - 38 - 1/Bg 358), Bg 08- 1258 (At 307/IR 64) Bg 10- 1407 (Bg 1420/ IR 64) යන ආර වරණය කර ගැනිණි.

### මාස 03 වයස් පංතිය

වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමස්ත වී වගා වපසරියෙන් 26%කට වැඩි ප්‍රමාණයක් මෙම වයස් පංතියේ වී ප්‍රභේද වලින් ආවරණය වේ.

මූලික අස්වනු අත්හදා බැලීමෙන් Bg 11 - 2366, Bg 11 - 2370 සහ 11 - 2364 උසස් ආර ලෙස වරණය කෙරුණු අතර ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් වලදී Bg 11- 1051 කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බැව් හඳුනා ගැනිණි.

2013 යල කන්නයේ සිට ඉදිරි කන්න වලදී ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමෙන් පරීක්ෂා කර බැලීම සඳහා Bg 10 - 3375, Bg 10 - 1083, Bg 10 - 1166, Bg 09 - 1851 සහ Bg 09 - 1888) වරණය කර ගන්නා ලදි.

## මාස 2.5 වයස් පංතිය

දින 80කින් පරිණත වන ඉතා කෙටි වයස් වී ප්‍රභේද වර්ෂාපෝෂිත පරිසර පද්ධති සඳහා විශේෂයෙන්ම ජල හිඟය හේතුවෙන් මාස තුනේ ප්‍රභේද වගා කළ නොහැකි කෙටි වගා කන්නයකින් යුත් යල කන්නය සඳහා යෝග්‍ය බැවින් ඉතා වැදගත් බවට පත්වෙමින් පවතී.

මූලික අස්වනු අත්හදා බැලීමෙන් 12 - 1666, 12 - 1643, 12 -1697, 1279 සහ 12 - 1676 ඇගයීමට ලක් කළ අතර ප්‍රධාන අස්වනු අත්හදා බැලීමෙන් 11 - 2508, 11 -2537, 10 - 2881, 10 - 2884 සහ 10 - 2891 අගයන ලදි. සංශුද්ධ බීජ සැපයීම සඳහා Bg 10 – 2907 (රතු ඵලාවරණයක් සහිත කෙටි රවුම් හැඩැති) ගුණනය කෙරිණි.

## සාම්ප්‍රදායික වී

සාම්ප්‍රදායික වී වගා ප්‍රභේදවල මනා රසයක්, පෝෂණීය අගයක් සහ ඖෂධීය ගුණයන් සමන්විත වන නමුත් ගෙන දෙන අස්වනු ප්‍රමාණය අඩු වන අතර පළිබෝධ, රෝග සහ ඇද වැටීමටද පාත්‍ර වේ. එබැවින්, සාම්ප්‍රදායික වගා ප්‍රභේද වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පවතී.

සාම්ප්‍රදායික වගා ප්‍රභේදයක් වන සුදුරු සම්බා ගැමා ප්‍රරවිකරණයට ලක් කිරීමෙන් ලබා ගත් විකෘති වලින් වරණය කර ගත් sw 25 ගුණනය කර මූලික අස්වනු අත්හදා බැලීමෙන් පරීක්ෂාවට ලක් කෙරිණි.

දුරස්ථ ඥාතීත්වයක් සහිත ඔරයිසා නිවාරා සහ ඔරයිසා සැටයිවා (Bg 380) අතර දෙමුහුම්කරණයෙන් ලබා ගත් ඉහළ අස්වනු විභවයකින් යුත් සහ දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී ලක්ෂණ වලින් සමන්විත ආර 2ක් (WH 20 සහ WH 48) ගුණනය කරන ලදි.

සාම්ප්‍රදායික වගා ප්‍රභේද 11ක් සංශුද්ධ කර ගුණනය කෙරිණි.

## ගුණාත්මක වී

සහලින් ස්වයං පෝෂිත වූ පසු ධාන්‍ය ගුණාත්මය ඉහළ නැංවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇත. සුවඳ ඇමයිලෝස් අන්තර්ගතය, මෘදු/මධ්‍යස්ථ ජෙල් අන්තර්ගතය, නොකැඩි සහල් ඉහළ ප්‍රතිශතයක්, සුදු බණ්ඩි, අතරමැදි ජෙලටීනකරණ උෂ්ණත්වය, මනා රසය, මනා පෙනුම යනාදිය ධාන්‍ය ගුණාත්මය පිළිබඳ නිර්ණායකයන් වේ.

අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් ලද ප්‍රවේශ 43ක් පරීක්ෂාවට ලක් කළ අතර සුගන්ධවත් උසස් ආර 24ක් වරණය කර ගන්නා ලදි. මෙම සියළුම ආර මාස 3 ½ - 4 ½ වයස් පංතියට අයත් වේ. ආර 07ක් (IR 71146 - 97 - 1 - 2 - 1 -3, IR 03A477, IR 03A568, IR 04A212, IR 04A381, IR 07A167 සහ IR 04A395) හෙ.1ට ටොන් 05කට වැඩි ඉහළ අස්වනු ගෙන දෙන බලාපොරොත්තු තැබිය හැකි ආර බවට අනාවරණය විය.

## දෙමුහුම් වී

අස්වනු පරතරය ඉවත් කිරීම සහ අස්වනු විභවය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රධාන තාක්ෂණ ක්‍රමයක් ලෙස වීවල දෙමුහුම් දිරිය යොදා ගනු ලැබේ.

මුහුම් පරීක්ෂණ තවානේදී නව $F_1$ සංයෝග 180ක් පරික්ෂාවට ලක් කෙරිණි. එයින් මුහුම් 87ක් නව සෛල ප්ලාස්මීය පුං වන්ද්‍යා ආර සහ නඩත්තු ආර බිහිකිරීමට පිළිමුහුම් කිරීම සඳහා වරණය කර ගන්නා ලදි. මුහුම් පරීක්ෂණ තවානෙන් වැඩිදුර පරික්ෂා කිරීම සඳහා නව මාපිය ආර ලෙස සංයෝග 16ක් වරණය කර ගත් අතර මූලික අස්වනු අත්හදා බැලීමෙන් පරික්ෂාවට ලක් කිරීම සඳහා සුළු පරිමාණ මට්ටමින් $F_1$ බීජ නිෂ්පාදනය කිරීම සඳහා සරුබවින් ඉහළ සංයෝග යොදා ගන්නා ලදි.

සෛල ප්ලාස්මීය පුං වන්ද්‍යා ආර 50ක් සහ ප්‍රතිස්ථාපිත ආර 186ක් නඩත්තු කළ අතර වරණය කර ගත් මාපිය ආර යොදා ගනිමින් නව මුහුම් සිදු කිරීම මෙන්ම දෙමුහුම් සංයෝග 27ක් මූලික අස්වනු අත්හදා බැලීමෙන් පරික්ෂාවට ලක් කිරීම සිදු කෙරිණි. 2012/2013 මහ කන්නයේදී IR 68897 A/R160, Bg CMS4A/ R 147 සහ Bg 407H පිළිවෙළින් හෙ.1කට ටොන් 6.78, 6.65 සහ 5.49ක ඉහළ අස්වනු වාර්තා කරන ලදි.

Bg CMS 1A/B, Bg CMS 4A/B Bg CMS සහ 4A/SN50 යන බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් සංයෝග වල මූලික බීජ නිපද විය.

Bg 407 H සහ මෑතකදී බිහි කරන ලද Bg CMS 4A/R147 දෙමුහුම් $F_1$ බීජ නිපද වූ අතර Bg CMS 4A/R147 හි $F_1$ බීජ ගිරාදුරුකෝට්ටේ (කි.ග්‍රෑ.3ක්), පොළොන්නරුව (කි.ග්‍රෑ.2ක්) සහ අම්බලන්තොට (ග්‍රෑම් 600ක්) ගොවිපළ වලට ලබා දෙන ලදි.

## ජෛව තාක්ෂණය

බැක්ටීරියා පත්‍ර අංගමාරයට (BLB) ප්‍රතිරෝධී වීම ඉහළ නැංවීම සඳහා BLB දායකය වන IRBB60 සමඟ Bg 352, Bg 359 සහ Bg 250 මුහුම් සිදු කරන ලදි. Bg 250/IRBB60 හි පිළිමුහුම් ගහන මෙම වසරේදී බිහි කෙරිණි.

පිළිමුහුම් අභිජනන තාක්ෂණය මගින් පොකුරු සම්බා සහ Bg 94 – 1ට කොළ පාළුව සහ බැක්ටීරියා පත්‍ර අංගමාරය කෙරෙහි ප්‍රතිරෝධීතාව එක් කිරීම සඳහා දායක මාපියන් ලෙස පිළිවෙළින් Tetep සහ IRBB60 සමඟ පොකුරු සම්බා සහ Bg 94 - 1 මුහුම් සිදු කළ අතර $F_1$ බීජ නිපදවිය.

$F_1$ ඔරයිසා සැටයිවා/ඔරයිසා රයිසොමැටිස් යන උසස් ආරවලට වන වී සතුව පවතින ආර්ථික වශයෙන් වැදගත් ලක්ෂණ එක් කිරීම සඳහා පිළිමුහුම් සිදු කිරීම සහ කලල වර්ධනය කර ගැනීම සිදු කෙරිණි. වැඩිදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා එක් පැළයක් ලබා ගැනිණි.

Bg 250 ප්‍රභේදයේ සමක්ලෝනීය විචලා වලින් නලස්ථව විකෘති බිහි කර ගැනීම සඳහා එම ප්‍රභේදයේ බීජ කල්ලි වල උපරෝපිත බිහි කෙරිණි. මාස 2 ½ ස්ථායි ආර වරණය කර ගැනීම සඳහා පුනර්වර්ධනය කර ගත් විචලා ක්ෂේත්‍ර පරික්ෂාවට ලක් කෙරුණු අතර $G_4$ පරම්පරාවෙන් ආර 15ක් ලබා ගන්නා ලදි.

Bg 300 බීජ කල්ලිවල විකෘති ප්‍රේරණය කළ අතර පුනර්වර්ධනය කර ගත් පැළවල වයස දින 90ක් සහ ලවණතාවයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් පරික්ෂා කර බලන ලදි. එම පැළ $G_1$ පරම්පරාවේ පවතී. සුවඳ ඇල්, කුරුළු තුඩ, ගෝනබරු, රත් ඇල්, සුවඳ සම්බා සහ සුදු හීනටි යන සාම්ප්‍රදායික ප්‍රභේද වල බීජ කල්ලි මිටිබව ඇති කිරීම සඳහා විකෘති කරන ලදි. මෙම පැළ පරිසරයට හුරු කිරීමේ අදියරේ පවතී.

සලකුණු සහායක අභිජනනය සඳහා ජාන ස්ථානගත කිරීම සහ අණුක සලකුණු හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. ජලයෙන් යටවීමට ඔරොත්තු දෙන සහ පැළ මැක්කාට ප්‍රතිරෝධී ලක්ෂණ සහිත දහනල/ සුදුරු සම්බා සහ Bg 300 / ගොඩ

හීනටි මුහුම් ඇති කිරීම සඳහා SSD ක්‍රමය (Single Seed descent method) යොදා ගත් අතර ජාන ස්ථානගත කිරීමට අණුක සලකුණු හඳුනා ගැනීම සඳහා $F_2$ සහ $F_3$ පරම්පරා බිහි කරන ලදි.

## ධාන්‍ය ගුණාත්මය

### ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමට අයත් කැකුළු හාල් සහ තැම්බු හාල් ප්‍රවේශ වල සහ වැඩිදියුණු කරන ලද අභිජනක ද්‍රව්‍යවල ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ

මූලික අස්වනු අත්හදා බැලීම, ප්‍රධාන අස්වනු අත්හදා බැලීම සහ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම යටතේ පවතින සියළුම ආරවල කැකුළු සහ තැම්බු සහල්වල ධාන්‍ය ගුණාත්මය සම්බන්ධයෙන් අගයන ලදි. අභිජනක ආර ප්‍රවේශ වල නියැදි 156ක් පරීක්ෂාවට ලක් කෙරිණි.

### සාම්ප්‍රදායික වී ප්‍රභේද වල අනුභව කිරීමේ සහ පිසීමේ ගුණයන් සහ පෝෂණීය වශයෙන් වැදගත් පිෂ්ඨය

ධාන්‍යවල භෞතික ගුණයන් සහ භෞත රසායනික ගුණයන් සම්බන්ධයෙන් වරණය කරගත් සාම්ප්‍රදායික වී ප්‍රභේද 21ක් විශ්ලේෂණය කරන ලදි. දුඹුරු සහල් ප්‍රතිශතය සහ දහයියා ප්‍රතිශතය පිළිවෙළින් 77 – 80%ක් සහ 20 -23 %ක් විය. කැකුළු හාල් කෙටීමේදී කුරුළු තුඩ ප්‍රභේදය හැරෙන්නට නොකැඩී සහල් අස්වැන්න 55 -73 %ත් අතර විය. කුරුළු තුඩ සහ මසුරන් හැරෙන්නට අනෙක් සියළුම ප්‍රභේදවල පිසීමේදී පරිමා ප්‍රසාරණය 2.6 ගුණයකට වඩා වැඩි විය. අගයන ලද ප්‍රභේද වලින් බොහොමයකම ජෙලටීන බවට පත්වීමේ උෂ්ණත්වය (GT) අතරමැදි උෂ්ණත්වයක් (සෙ. 70 -74$^{o}$) විය. මඩතවාළු, පොක්කලි, මා වී, ගෝනබරු, ඉඟිනි මිටිය සහ දුලාර් යන ප්‍රභේද වල GT අගයන් අඩු මට්ටමක (සෙ. 55 - 69$^{o}$) විය. අඩුම ඇමයිලෝස් අන්තර්ගතය අතරමැදි මට්ටමක පවතින බව නිරීක්ෂණ වූ අතර හේරත් බණ්ඩා සහ කළු හීනටි වල ඉහළ ප්‍රමාණයක් අන්තර්ගත විය. වරණය කරගත් ප්‍රභේද අතර ජෙල් අන්තර්ගතය විශාල වශයෙන් වෙනස් වූ අතර හේරත් බණ්ඩා, වන්නි, දහනල, රත් ඇල්, හොඩරවාලු, කුරුළුතුඩ, දේවරැද්දිරි, සුලායි සහ මසුරන් මෘදු ජෙල් අන්තර්ගතයකින් යුත් ප්‍රභේද බවත් හඳුනා ගැනිණි.

## රෝග කළමනාකරණය

### බැක්ටීරියා පත්‍ර අංගමාරය සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම

කන්න දෙකේදීම බැක්ටීරියා පත්‍ර අංගමාරයට එරෙහිව ආර 403ක් පරීක්ෂා කර බලන ලදුව ඉන් ආර 03ක් මහ කන්නයේදී සහ ආර 31ක් යල කන්නයේදී ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බැව් පෙන්නුම් කරන ලදි.

### වී කොළ පාළුව සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම

වී කොළ පාළුවට එරෙහිව ආර 3899ක් පරීක්ෂා කර බලන ලදුව මහ කන්නයේදී ආර 1309ක් සහ යල කන්නයේදී ආර 1433ක් ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බැව් හඳුනා ගන්නා ලදි.

දැනටමත් මුදා හැර තිබෙන ප්‍රභේද 14ක් වී කොළ පාළුව සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කළ අතර එම ප්‍රභේද වල වත්මන් ප්‍රතිරෝධීතා මට්ටම ප්‍රථමයෙන් මුදාහරින අවස්ථාවේදී පැවති මට්ටමට සමාන බැව් අනාවරණය කරගන්නා ලදි.

### කොපු අංගමාරය සඳහා නිර්දේශිත දිලීරනාශක නැවත ඇගයීම

පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලද නිර්දේශිත දිලීර නාශක 05ක් කොපු අංගමාරය

සම්බන්ධයෙන් නැවත පරික්ෂා කරන ලදුව එම දිලීරනාශක පහම එක සමානවම කාර්යක්ෂම බැව් අනාවරණය කර ගන්නා ලදි.

### නලස්ථ තත්ත්වයන් යටතේ වී රෝග කෙරෙහි කාබනික දියර නිස්සාරණ මගින් ඇතිවල බලපෑම

වී වගාවේ කොළ පාළුව සහ කොපු අංගමාරය පාලනය කිරීම සඳහා කාබනික දියර නිස්සාරණ මගින් ඇතිවන බලපෑම පිළිබඳව අධ්‍යයනය කරන ලදි. කොම්පෝස්ට් වලට ජලය එක් කර දින කීපයක් තබා සකස් කර ගන්නා නිස්සාරණය (Compost tea) කැප්පෙටිය නිස්සාරණය (Croton lacciter), ග්ලිරිසීඩියා (Gliricidia sepium), පාවට්ටා කොළ (Ardathoda Vasica), කොහොඹ බීජ (Azadirachta indica) නිස්සාරණය සහ ටෙබුකොනොසෝල් දිලීර නාශක නලස්ථව සහ හරිතාගාරය තුළදී පරික්ෂාවට ලක් කෙරිණි. ටෙබුකොනොසෝල් දිලීරනාශකය මගින් මයිසීලියා වර්ධනය නිශේධනය කිරීම ඉහළ මට්ටමක පැවති අතර අනෙකුත් කාබනික නිස්සාරණ මගින්ද දිලීර දෙකේම මයිසීලියා වර්ධනය සැලකිය යුතු අයුරින් පහළ දමන ලදි.

## පළිබෝධ කළමනාකරණය

### පළිබෝධ ප්‍රතිරෝධිතාව පිළිබඳ පරික්ෂා කර බැලීම

ගොක් මැස්සා සහ දුඹුරු පැළ කීඩෑවාට දක්වන ප්‍රතිරෝධිතාව නිරීක්ෂණය කිරීම සඳහා හරිතාගාර සහ ක්ෂේත්‍ර පරික්ෂාවන් සිදු කෙරිණි. ප්‍රවේශ 4124ක් පරික්ෂාවට ලක් කළ අතර ඉන් ප්‍රවේශ 841ක් සහ ප්‍රවේශ 1761ක් ගොක් මැස්සාට සහ දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි.

### එළිය විහිදුවන උගුලට ආකර්ෂණය වන වී පළිබෝධවල ගහන ගතිකත්වය

එළිය විහිදුවන උගුල් යොදා ගනිමින් වී වගාවේ කෘමි පළිබෝධවල කාලික විචල්‍යතාව පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදි. උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාව හේතුවෙන් දුඹුරු පැළ කීඩෑවා සහ තණකොළ පෙත්තාගේ ගහන ඉහළ ගිය බව ප්‍රතිඵල මගින් අනාවරණය වූ අතර උෂ්ණත්වය ඉහළ ගිය විට කඳ විදින්නා, කළු මකුණා සහ ගොයම් මකුණා ගහනය අඩු විය.

### නව කෘමිනාශක ඇගයීම

බ්‍යුප්‍රොෆෙසින් 25% SC යනු III පන්තියේ නව කෘමිනාශකයකි. ජලය ලීටර් 1කට මි.ලී 1.5ක් යොදා භාවිතා කිරීමෙන් දුඹුරු පැළ කීඩෑවා කාර්යක්ෂමව පාලනය කරන බැව් අනාවරණය විය.

### කාබනික සහ සාම්ප්‍රදායික වී වගා ක්‍රමවලදී ආත්‍රෝපෝඩාවන්ගේ විවිධත්වය

කාබනික සහ සාම්ප්‍රදායික වී වගා ක්‍රමවලදී ආත්‍රෝපෝඩාවන්ගේ විවිධත්වය පිළිබඳව අධ්‍යයනය කරන ලදි. සාම්ප්‍රදායික වී වගා ක්‍රමය හා සංසදනාත්මකව කාබනික වී වගාවේදී ආත්‍රෝපෝඩා විශේෂ වල විවිධත්වය, විශේෂවල බහුලත්වය සැලකිය යුතු අයුරින් ඉහළ මට්ටමක පැවති බැව් ප්‍රතිඵල මගින් අනාවරණය විය.

## වල් පැළෑටි කළමනාකරණය

### වල් වී ගහන වල කෘෂි - රූපවිද්‍යාත්මක විචල්‍යතාවයන් (Oryza Sativa Spontanea)

මෙරට තිබෙන වල් වී ජෛව දර්ශ වල රූපවිද්‍යාත්මක විචල්‍යතාවයන් පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදි. වල් වී බෝවී ඇති ක්ෂේත්‍ර වලින් කරල් නියැදි එක්රැස් කර ගන්නා ලදුව වර්ගීකරණය කරන ලදි.

ඒ අනුව, කාණ්ඩ 251ක් හඳුනා ගැනිණි. එක්රැස් කරගත් වල් වී රූප මාදිලි සතුව ධාන්‍ය ලක්ෂණවල සියළුම සංයෝග පවතින බව නිරීක්ෂණ වලින් ගම්‍ය වේ. ඒකාකාරි තත්ත්වය යටතේ රූප මාදිලි 251ක් රෝපණය කළ පසු විවිධත්වය ඉහළ මට්ටමක පැවති බැව් නිරීක්ෂණය විය. වල් වී රූප මාදිලි බොහොමයකම ධාන්‍ය ඇට දාහක බර සහ පිරුණු ධාන්‍ය ප්‍රතිශතය පිළිවෙළින් ග්‍රෑ. 20ට වඩා සහ ග්‍රෑ. 70ට වඩා අඩු විය. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වල් වී සමහර ප්‍රදේශවල වන වී විශේෂ සහ ඇතැම් ප්‍රදේශ වල සාම්ප්‍රදායික වී ප්‍රභේද වලින් සම්භවය ලැබ සහ මුලාශ්‍රය වී හට ගෙන ඇති බවට සාක්ෂි වලින් ගම්‍ය වේ.

## වී වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි බටදැල්ල මගින් ඇති වන බලපෑම

බටදැල්ල වල විවිධ ඝනත්වයන් මගින් වී වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳව සොයා බැලීම සඳහා බඳුන් වල අත්හදා බැලීමක් සිදු කරන ලදුව වී වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි බටදැල්ල (I. globosa) මගින් සැලකිය යුතු බලපෑමක් ඇති කරන බවට අනාවරණය කර ගන්නා ලදි.

## ඍජුව වගා කෙරෙන වී වගාවේදී ගිරා තණ සඳහා සයිහැලෆොප්බ්‍යුටිල් 10EC වල ජෛව සාර්ථකත්වය

ඍජුව වගා කරන වී වගාවේ තෘණ පාලනයෙහි, විශේෂයෙන්ම ගිරා තණ පාලනය කිරීමෙහිලා සයිහැලෆොප් - බ්‍යුටිල් යෙදීමේදී එහි වඩාත් යෝග්‍ය අනුපාතය සහ කාලය පිළිබඳව නිර්ණය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි. වී වගාව වර්ධනය වන මුල් අවදියේදී (1 සහ 3WAS) සයිහැලෆොප් - බ්‍යුටිල් හෙ.1ට ක්‍රියාකාරි ද්‍රව්‍ය 200 - 250g යෙදීමෙන් ගිරාතණ කාර්යක්ෂමව පාලනය විය.

## ගිරාපලා පාලනය කිරීම සඳහා නිර්දේශිත පැළෑටිනාශක පරීක්ෂා කර බැලීම

ගිරාපලා පාලනය කිරීමෙහිලා කාර්යක්ෂම පැළෑටිනාශක වරණය කර ගැනීම සඳහා බඳුන් අත්හදා බැලීමක් සිදු කෙරිණි. ඕතොසල්ෆ්‍යුරොන් + ප්‍රොපනිල්, ඒසිම්සල්ෆ්‍යුරොන්, MCPA, ඕතොසල් ෆ්‍යුරොන් යෙදූ විට පාලන කාර්යක්ෂමතාව 80%කට වඩා වැඩි වූ අතර එතොක්සිසල්ෆ්‍යුරොන්, සයික්ලොසල්ෆැම්‍යුරොන්, ෆෙනක් සප්‍රොප් - පී - එතිල් + මෙට්සල්ෆ්‍යුරොන් මෙතිල්, ප්‍රෙටිලැක්ලෝර් + පයිරිබෙන්සොක්ස්, බිස්පයිරිබැක් සෝඩියම් යෙදූ විට පාලන කාර්යක්ෂමතාව 50-80%ක් පමණ වූ අතර පයිරොසල්ෆැම්‍යුරොන් - එතිල් වල පාලන කාර්යක්ෂතාව 50%ට වඩා අඩු විය.

## පංශු සාරවත් භාවය කළමනාකරණය කිරීම

වී වගාවේ පොටෑසියම් කළමනාකරණය කිරීම පිළිබඳව දිගු කාලීනව අධ්‍යයනය කරන ලදි. මෙම දිගු කාලීන අධ්‍යයනයේ අවසන් කන්න හයේදී පොටෑසියම් පොහොර යෙදූ විට වී වගාවෙන් ප්‍රතිචාරයක් නොලැබුණි. පසෙහි හුවමාරු කළ නොහැකි පොටෑසියම් අන්තර්ගතය සහ ධාන්‍ය අස්වැන්න අතර ඉහළ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පැවතුණි.

පාංශු සාරවත්භාවය සහ බෝග ඵලදායිතාව කෙරෙහි දිගු කාලීනව කාබනික පොහොර සහ රසායනික පොහොර යෙදීමෙන් ඇතිවන බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදි. කාබනික පොහොර සහ රසායනික පොහොර වෙන වෙනම යොදනවාට වඩා එම පොහොර වර්ග දෙක එකට එක්කර

යෙදීම වඩාත් ඵලදායී බව සිදු කළ ඇගයීමෙන් අනාවරණය විය. පසෙහි කාබනික ද්‍රව්‍ය, ෆොස්ෆරස් සහ පොටෑසියම් මට්ටම් නඩත්තු කිරීම සඳහා කාබනික පොහොර උපකාරී වේ. සෑම කන්නයකදීම කුඹුරු ඉඩම් වලට රසායනික පොහොර හෝ කාබනික පොහොර වෙන වෙනම යෙදීමෙන් පාංශු සාරවත් භාවයෙහි වර්ධනයක් සිදු නොවිණි. එබැවින්, ප්‍රශස්ත පාංශු සාරවත් භාවය සහ ප්‍රශස්ත බෝග අස්වනු ලබා ගැනීම සඳහා කාබනික පොහොර සහ රසායනික පොහාර යන දෙකම යෙදීම අවශ්‍ය වේ. කාබනික පොහොර යෙදු විට වී පැළෑටිය මගින් බැර ලෝහ උරා ගැනීම අඩු විය.

ෆොස්ෆරස් පොහොර යෙදු විට ඇති වන දිගු කාලීන බලපෑම නිරීක්ෂණය කිරීම සඳහා දිගු කාලීන ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදු කරන ලදි. ෆොස්ෆරස් පොහොර නොයෙදු විට පසෙහි ප්‍රයෝජ්‍ය ෆොස්ෆරස් මට්ටම් අඩු වූ බව 2013 වසරේදි සිදු කරන ලද අත්හදා බැලීමෙන් අනාවරණය විය. කෙසේ වුවද, කන්නයක් හැර කන්නයකදී සහ කන්නමය වශයෙන් ෆොස්ෆරස් යෙදීමෙන් සැලකිය යුතු අස්වනු වෙනසක් ඇති නොවිණි.

නැනෝ පොහොර මගින් පොහොර නාස්තිය අවම වන අතර පසට පොහොර මුදා හැරීම සෙමින් සිදු වේ. නැනෝ තාක්ෂණ ආයතනය මගින් නිපදවනු ලැබූ නයිට්‍රජන් සහ පොටෑසියම් නැනෝ සංයෝග කීපයක් පරීක්ෂාවට ලක් කරන ලදි. නැනෝ පොටෑසියම් පොහොර යෙදු විට සැලකිය යුතු අස්වනු වර්ධනයක් නොවූ අතර නැනෝ නයිට්‍රජන් පොහොර යෙදු විට යූරියා යොදන අනුපාතය 25%කින් අඩු කළ හැකි බවද නිරීක්ෂණය විය.

යෝග්‍ය කාබනික පොහොර යෙදීමේ තාක්ෂණ නිර්දේශයක් සකස් කිරීම සඳහා සිදු කළ අධ්‍යයනකදී කොම්පෝස්ට් පමණක් යොදනවාට වඩා කොම්පෝස්ට් කොටස් දෙකකින් මූලික සහ මතුපිට පොහොරක් ලෙස යෙදීම වඩාත් ඵලදායී බව අනාවරණය විය.

වී වගාව සඳහා කාබනික ගොවිතැන සහ සමෝධානික පැළෑටි පෝෂණ කළමනාකරණ ක්‍රමය යටතේ දියර කාබනික සංයෝග කීපයක් පරීක්ෂාවට ලක් කෙරිණි. පරීක්ෂා කර බලන ලද සංයෝග අතරින් ජීවමූර්ත, පංචගොව්‍යා සහ කොම්පෝස්ට්වලට ජලය යොදා දින කිපයකට පසු ලබා ගන්නා නිස්සාරණය මගින් හෙ.1ට ටොන් 7.1ක්, 5.8ක් සහ 5.3ක් වූ අස්වනු ගෙන දෙමින් මනාව ක්‍රියාකාරී විය. වී වගාවේ පත්‍ර පෝෂක ප්‍රභවයක්, පළිබෝධ විකර්ශකයක් සහ ප්‍රතිජීවකයක් ලෙස කොම්පෝස්ට් වලින් සකස් කර ගන්නා නිස්සාරණය යොදා ගත හැකිය.

## ජල කළමනාකරණය සහ ගෝලීය තොරතුරු ක්‍රමය

### වර්ෂාපෝෂිත සහ ජලසම්පාදන තත්ත්ව යටතේ වී ප්‍රභේද ඇගයීම

වර්ෂාපෝෂිත සහ ජලසම්පාදිත තත්ත්ව යටතේ වී ප්‍රභේද 26ක් පරීක්ෂා කර බලන ලදි. සියළුම ප්‍රභේද ජල සම්පාදිත තත්ත්වය යටතේද Bg 250 සහ Bg 2907 වර්ෂාපෝෂිත තත්ත්වය යටතේ මනාව ක්‍රියාකාරී විය.

## වර්ෂාපෝෂිත ගොවිතැනේදී වී වැපිරීමේ කාලය

යල කන්නයේදී වී වැපිරීම සඳහා සුදුසුම දිනය සොයා බැලීම පිණිස APSIM ඔරයිසා පරිගණක මොඩලය සහ ක්ෂේත්‍ර අත්හදා බැලීම මගින් ඇගයීම සිදු කෙරුණු අතර මොඩලය ක්‍රමාංකනය කිරීම සඳහා පස, දේශගුණය සහ බෝග දත්ත උපයෝගී කර ගැනීමත් වී වැපිරීම සඳහා විවිධ දිනයන් සම්බන්ධයෙන් සිද්ධි

සමුදාය විශ්ලේෂණය කිරීමත් සිදු කෙරිණි. යල කන්නය සඳහා වී වැපිරීමට සුදුසුම කාල පරිච්ඡේදය අප්‍රේල් මාසය පුරාවටම පවතින බව ප්‍රතිඵල මගින් අනාවරණය විය.

ශ්‍රී ලංකාවේ අතරමැදි කලාපයේ මහ කන්නයේදී Bg 366 වැපිරීම සඳහා ඔක්තෝම්බර් මස පළමු සතියත් Bg 300 සඳහා ඔක්තෝම්බර් මාසයේ දෙවන සතිය සහ Bg 250 සඳහා ඔක්තෝම්බර් මාසයේ තුන්වන සතිය වඩාත් යෝග්‍යතම කාලය බැව් ආදර්ශ සමාකරණ ප්‍රතිඵල මගින් අනාවරණය විය.

## පහතරට වර්ෂා පෝෂිත වී වගාව යටතේ පොහොර යෙදීම පිළිබඳව ඇගයීම

Bg 300 යොදා ගනිමින් පහතරට වර්ෂාපෝෂිත වී වගාව සඳහා පොහොර යෙදීමේ යෝග්‍යතම ක්‍රමය පිළිබඳව සොයා බැලීම සඳහා සිදු කරන ලද අත්හදා බැලීමේදී වර්ෂාපතනය සමඟ පොහොර යෙදීමෙන් අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් ඇති වන බවක් නිරීක්ෂණය නොවීය. පත්‍ර වර්ණ සටහන් පාදකව පොහොර යෙදීමෙන්ද ගෙන දෙන ලද්දේ සමාන අස්වැන්නකි. වගා කන්නය තුළදී සාමාන්‍ය වර්ෂාපතනයක් ලද අතර මනාව ව්‍යාප්තව පැවතුණි.

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ෂා පෝෂිත කුඹුරුවල ජලය පැවැතීම පිළිබඳ තක්සේරු කිරීම

යෝග්‍ය වී ප්‍රභේද හඳුන්වාදීමට සහ යෝග්‍ය කළමනාකරණ පිළිවෙත් හඳුන්වාදීම සඳහා වර්ෂා පෝෂිත කුඹුරු වල ජල පැවැත්ම පිළිබඳව තක්සේරු කිරීම වැදගත් වේ. වියළි, අතරමැදි සහ තෙත් කාලාපය නියෝජනය වන අයුරින් පසෙහි පවතින ජලය සම්බන්ධයෙන් ස්ථාන තුනකදී මාසිකව සහ සතිපතා දේශගුණික ජල පැවැත්ම පිළිබඳව ප්‍රමාණනය කෙරිණි. යල සහ මහ කන්නය තුළදී වර්ෂාපෝෂිත වී වගාව සඳහා වඩාත් යෝග්‍ය වගා කාලය සහ ස්ථාන හඳුනා ගැනිණි. යෝග්‍ය වයස් කාණ්ඩ හඳුනා ගත් අතර අහිතකර කාල පරිච්ඡේදයන් පිළිබඳවත් ස්ථානීය විශේෂිත පොහොර සම්බන්ධ ගැටළු හඳුනා ගැනීමත් සිදු කෙරිණි. මෙම සොයා ගැනීම් ඉදිරි කන්න දෙකේදී ගොවි තත්ත්ව යටතේ ඇගයීමට ලක් කෙරේණු ඇත.

## ශෂ්‍ය විද්‍යා

### ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම

සම්මත පරීක්ෂණ ප්‍රභේද සමඟ නව වී ආර 09ක් ස්ථාන 12කදී ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමෙන් පරීක්ෂාවට ලක් කෙරුණු අතර පහත දැක්වෙන ආර VATT වැඩසටහන මගින් ගොවි ක්ෂේත්‍ර වලදී වැඩිදුරටත් පරීක්ෂා කර බැලීම සඳහා වරණය කර ගන්නා ලදි.

Bg 08 - 1258, මාස 3 ½ සුදු, නාඩු ආර Bg 357 සහ Bg 359ට වඩා අස්වනු ගෙන දේ.

Bg 08 – 1407 - මාස 3 ½ සුදු සම්බා, Bg 358 වඩා වැඩි අස්වැන්නක් ගෙන දේ.

Bg 08 – 1909 - මාස 04 සුදු නාඩු ආර - Bg 403 වඩා වැඩි අස්වැන්නක් සහ නොකැඩි සහල් අස්වැන්නක් ගෙන දේ.

යල කන්නයේදී මාස 2 ½, 3 සහ 3 ½ න් පරිණත වන පන්ති යටතේ නව වී ආර 14ක් පරීක්ෂාවට ලක් කෙරිණි.

## ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම (VATT)

2012/13 මහ කන්නයේදී At 09 -861, At 08 - 593, Ld 8 - 6 -7 , At 08 -1078, Bg 08 - 2398, At 08- 617, Bg 05 - 110 සහ

Bg 11 - 139 යන නව උසස් ආර වල අනුවර්ත්‍යතාව පිළිබඳ පරීක්ෂණ සිදු කෙරුණු අතර එසේ පරීක්ෂාවට ලක් කළ ආර අතරින් At 7 – 800 (මාස 03 ආර), Bg 07 – 997 (මාස 4½ ) Bg 07 – 1350 (මාස 4½ ආර) ඉහළ අස්වනු ගෙන දුන් අතර සම්මත පරීක්ෂණ ප්‍රභේද වලට වඩා අනුවර්තන හැකියාවකින් යුත් බැව් අනාවරණය වූ අතර මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා වරණය කෙරිණි.

## මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම (LSVATT)

නව උසස් ආර තුනක්, At 07 - 800 (මාස 03 සුදු නාඩු), At 06 - 631 (මාස 3 ½ සුදු සම්බා කුඩා ධාන්‍ය ආකාර), සහ BW – 1621 (මාස 3½ රතු නාඩු) ගොවි ක්ෂේත්‍ර වලදී පරීක්ෂාවට ලක් කෙරිණි. විවිධ ලක්ෂණ පිළිබඳව ගොවීන්ගේ ප්‍රතිචාර මත මෙම වී ආර තුනම අනුවර්තනය වීමේ හැකියාවෙන් යුත් ඒවා බවට තහවුරු කෙරිණි.

## ජලය හිඟවීමෙන් ඇතිවන අහිතකර තත්ත්වය අදාළ කර ගනිමින් වරණය කරගත් වී ප්‍රභේදවල ප්‍රරෝහ සහ මුල් වල රූප විද්‍යාත්මක ලක්ෂණ

නියඟයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් වී ප්‍රභේද 11ක ප්‍රරෝහ සහ මුල්වල රූපවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කෙරිණි.

වර්ධක වර්ධන අවධියේ මැද සහ පසු අවස්ථා දෙකේදී පැළ ජල හිඟයට ලක් කෙරිණි. පත්‍ර බුව වැඩීම ප්‍රමාණය, ප්‍රරෝහයේ අඩංගු වැඩීම වියළි ද්‍රව්‍ය ප්‍රමාණය සහ ජල හිඟ තත්ත්වය යටතේ මුලේ වැඩීම දිග සහ ප්‍රමාණය අනුව DSN 22 ලක්ෂණීකරණය කළ අතර වඩාත්ම ඔරොත්තු දෙන ආර ලෙස හඳුනා ගත් අතර පරීක්ෂාවට ලක් කළ ප්‍රභේද අතරින් Bg 357 වඩාත්ම පාත්‍රී ප්‍රභේදය ලෙස හඳුනා ගැනිණි.

## සීතලට ඔරොත්තු දෙන ආර සහ ප්‍රභේද ගුණනය කිරීම

සීතලට ඔරොත්තු දීම සම්බන්ධයෙන් ඉදිරියේදී පරීක්ෂා කර බැලීමට යොදා ගැනීම සඳහා අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් ලද සීතලට ඔරොත්තු දෙන වී ආර 40ක්, උඩරට වගා කෙරෙන සාම්ප්‍රදායික ප්‍රභේද තුනක් (හැතිඇල්, මුදු කිරිඇල් සහ සුදු වී) සහ PL – 16,2013 යල කන්නයේදී ගුණනය කරන ලදි.

## බීජ නිෂ්පාදනය

ජාතික බිත්තර වී වැඩසටහන සඳහා නිර්දේශිත වී ප්‍රභේදවල අභිජනක බීජ පහත දැක්වෙන ප්‍රමාණ වලින් නිපදවිය.

වගු අංක 1.4.2: 2013 වසරේදී නිපදවන ලද අභිජනක බීජ ප්‍රමාණය

| වයස් පන්තිය සහ ප්‍රභේදය | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|
| | මහ 2012/ 13 | යල 2013 | එකතුව |
| **දින 150 - 180** | | | |
| Bg 3 – 5 | 10.0 | | 10.0 |
| Bg 745 | 20.5 | | 20.5 |
| Bg 38 | 10.0 | | 10.0 |
| Bg 407 | 10.0 | | 10.0 |
| **මාස 04** | | | |
| Bg 379 -2 | 193.5 | 53.5 | 247.0 |
| Bg 450 | 86.0 | 43.0 | 129.0 |
| Bg 403 | 150.5 | 21.5 | 172.0 |
| Bg 454 | 21.5 | | 21.5 |
| Bg 406 | 21.5 | | 21.5 |

| වයස් පන්තිය සහ ප්‍රභේදය | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|
| | මහ 2012/13 | යල 2013 | එකතුව |
| **මාස 3 ½** | | | |
| Bg 94 - 1 | 164.0 | 143.5 | 307.5 |
| Bg 352 | 164.0 | 184.5 | 348.5 |
| Bg 357 | 123.0 | 102.5 | 225.5 |
| Bg 358 | 184.5 | 215.0 | 399.5 |
| Bg 359 | 164.0 | 122.5 | 286.5 |
| Bg 360 | 143.5 | 123.0 | 266.5 |
| Bg 366 | 220.0 | 240.0 | 460.0 |
| Bg 369 | | 100 | 100 |
| **මාස 03** | | | |
| Bg 300 | 120.0 | 18.0 | 300.0 |
| **දින 80** | | | |
| Bg 250 | 61.5 | 61.5 | 123 |
| **එකතුව** | **1868.0** | **1590.5** | **3458.5** |

- Bg 304 සහ Bg 305 ප්‍රභේද ගුණනය කර කි.ග්‍රෑ. 80 බැගින් බීජ නිපදවිය.
- Bg 1165 – 6 ප්‍රභේදයේ බීජ කි.ග්‍රෑ. 1435ක් නිපදවා බිත්තර වී නිපදවීම සඳහා ගොවීන්ට සහ අළුත්තරම බීජ ගොවිපළට ලබා දෙන ලදි. මෙම වී ආර අපනයනය කිරීමට හැකි ගුණාත්මයෙන් යුත් වී නිපදවන බවට හඳුනා ගෙන ඇත.
- ‘MA2’ වී වගා ප්‍රභේදය බිස්කට් නිෂ්පාදනය සඳහා යෝග්‍ය වන අතර බිත්තර වී කි.ග්‍රෑ. 45,960ක් නිපදවිය.
- ජනප්‍රිය ප්‍රභේද වලින් බිත්තර වී (අත්තිවාරම්, ලියාපදිංචි සහ සහතික කළ) කි.ග්‍රෑ. 7851.5ක් නිපදවා ගොවීන්ට අළෙවි කරන ලදි.

## විශේෂ ව්‍යාපෘති

පහත දැක්වෙන සුළු පරිමාණයේ විශේෂ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

- විවිධ අහිතකර පාරිසරික තත්ත්වයන් සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීම (අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් අරමුදල් සැපයේ) - මෙම ව්‍යාපෘතිය අභිජනක ආර නම් කිරීම, වැඩිදියුණු කිරීම සහ ඉවත් කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් බිහි කිරීම සහ සහභාගීත්ව රටවල් අතර ජනකප්ලාස්ම හුවමාරු කර ගැනීමේ පහසුව කෙරෙහි අරමුණු කරගත්තකි.
- වියළි බිමට බීජ වපුරා පසුව ජලය සැපයීමෙන් සිදු කරන වී වගාව සඳහා තාක්ෂණ පිළිවෙත ප්‍රශස්ත කිරීම (අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් අරමුදල් සැපයේ). වියළි බිමට බීජ වපුරා ජලය සැපයීමෙන් සිදු කරන වී වගාව සහ සෘජුවම වී වපුරා සිදු කරන ගොවිතැන (IDS) සඳහා යෝග්‍ය තාක්ෂණික පිළිවෙත් බිහි කිරීම මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වේ.
- ග්‍රීන් සුපර් රයිස් (අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් අරමුදල් සැපයේ) - පෝෂ්‍යදායී බවින් ඉහළ සහ අහිතකර තත්ත්වයන්ට ප්‍රතිරෝධී බවින් යුත් වී වගා ප්‍රභේද බිහි කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.
- ආසියාවේ අස්වනු පරතරය අවම කිරීම (අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් අරමුදල් සැපයේ)
- APSIM ORYZA ඇසුරින් බෝග සමාකරණය සහ ආදර්ශනය (SAC මගින් අරමුදල් සම්පාදිතය) ආසියාවේ ආහාර සුරක්ෂිතතාව සහ තිරසාරව ජලය භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා බෝග වගා ක්‍රමවල උපරිම නිෂ්පාදන හැකියාව අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය ස්වයං පෝෂිත බවින් ඉහළ නැංවීම සඳහා ගොවිතැන් තාක්ෂණ ක්‍රම බිහි කිරීම (කොරියාවේ AFACT මගින් අරමුදල් සැපයේ) - ශ්‍රී ලංකාවේ ලවණතාවය සහිත ප්‍රදේශ වල ගොවිතැන වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණ ක්‍රම බිහි කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.
- පහතරට තෙත් කලාපයේ සිදු කරන ගොවිතැනේ ඵලදායිතාව ඉහළ නැංවීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම මගින් අරමුදල් සම්පාදිතයි) - ලවණතාවය, යකඩ විෂමතාව, ජලයෙන් යටවීම සහ වගුරු පස වැනි අහිතකර ජෛව සහ අජෛව තත්ත්වයන්ගේ බාධාවන්ට ලක්වන ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ වී ගොවිතැනේ ඵලදායිතාව ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.
- අහිතකර අජෛව තත්ත්වයන් සඳහා වී ප්‍රභේද බිහි කිරීම; ජලයෙන් යටවීම, ලවණතාව, නියඟයට සහ යකඩ විෂමතාව කෙරෙහි ඔරොත්තු දීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්මෙන් අරමුදල් සැපයේ) මෙරට වගා කෙරෙන ජනප්‍රිය වී ප්‍රභේද වලට එක් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.
- කාර්යක්ෂමව පොහොර භාවිතා කිරීම සඳහා වූ තාක්ෂණික ක්‍රම ගොවි ක්ෂේත්‍ර වලදී පරික්ෂා කර බැලීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලස්ම මගින් අරමුදල් සම්පාදනය කෙරේ). මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගින් බිහි කළ පොහොර භාවිතය පිළිබඳ තාක්ෂණික ක්‍රම වල අනුවර්තතාව පිළිබඳව ගොවි ක්ෂේත්‍ර යටතේ පරික්ෂා කර බැලීමයි.
- ශ්‍රී ලංකාවේ මඩට වපුරන වී වගාවේ වල් වී කළමනාකරණය (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්මෙන් අරමුදල් සම්පාදනය කෙරේ) - ක්ෂේත්‍ර අත්හදා බැලීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා තාක්ෂණික පිළිවෙත් මාලාවේ සමෝධානික ප්‍රවේශය ගොවීන් අතර ප්‍රචලිත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.
- වී වගාව සඳහා ජලය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම පිණිස කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ෂාපෝෂිත කුඹුරු වල පවතින ජලය පිළිබඳව තක්සේරු කිරීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම මගින් අරමුදල් සම්පාදනය කෙරේ) - මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ෂා පෝෂිත කුඹුරුවල පවතින ජලය පිළිබඳව ඇගයීමයි.

## තාක්ෂණය පතුරුවාලීම

- ගොවිතැන සඳහා පොහොර නිර්දේශය සංශෝධනය කිරීම සහ විධිමත්ව සකස් කිරීම සිදු කෙරිණි.
- තෙත් සහ වියළි කලාප තත්ත්ව සඳහා පත්‍ර වර්ණ සටහන් සිංහලෙන් සකස් කෙරිණි. කොළඹ, මාතර, ගාල්ල, කෑගල්ල සහ කළුතර දිස්ත්‍රික්ක වල ව්‍යාප්ති නිලධාරීන් අතර පත්‍රවර්ණ සටහන් අත්පත්‍රිකා 700ක් සහ වියළි සහ අතරමැදි කලාපවල ව්‍යාප්ති නිලධාරීන් අතර අත්පත්‍රිකා 100ක් බෙදා දෙන ලදි.
- ලවණතාවයට ඔරොත්තු දෙන ආර වල අනුවර්තන හැකියාව පිළිබඳව තහවුරු කර දැන ගැනීම සඳහා ආදර්ශන බිම් කට්ටි 26ක් පුත්තලම දිස්ත්‍රික්කයේ ස්ථාපිත කරන ලදි. Bg 369 සමඟ ලවණතාවයට ඔරොත්තු දෙන වී ආර 02ක් (Bg 5 -110 සහ Bg 4 -91) යොදා ගන්නා ලදි. Bg 4- 91 ලවණතාවයට ඔරොත්තු දෙන බැවින් සහ මාස 3.5 පන්තියට අයත් වන බැවින් ගොවීන් වඩාත් කැමැත්තක් දක්වන බැව් එක්රැස් කර ගන්නා ලද තොරතුරු වලින් අනාවරණය විය.
- කොළඹ, ගම්පහ, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව, කළුතර, නුවරඑළිය,

බදුල්ල, ගාල්ල, මාතර සහ වවුනියාව යන දිස්ත්‍රික්ක වල ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් සඳහා බීජ පැළ විසිරුවා හැරීමෙන් තවානේ සහ ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීම පිළිබඳව ආදර්ශන 24ක් පවත්වන ලදි.

- කොළඹ, කළුතර, රත්නපුර, ගාල්ල, මාතර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ව්‍යාප්ති නිලධාරීන් සඳහා පත්‍ර වර්ණ සටහන් යොදා ගනිමින් නයිට්‍රජන් පොහොර කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 6ක් මෙහෙය විය.
- මාතර සහ බදුල්ල දිස්ත්‍රික්කවල ගොවීන් සහ ව්‍යාප්ති නිලධාරීන් සඳහා වී වගාව සඳහා නිර්දේශිත නව පොහොර නිර්දේශ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් සහ ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා එක් වැඩසටහනක් මෙහෙය විය.
- ගොවි ක්ෂේත්‍ර වල පාංශු ලවණතාවය වර්ධනය වීම සහ පාංශු ලවණතාවය තුරන් කිරීම සඳහා ප්‍රතිකර්ම පිළිබඳව ආනමඩුව කෘෂිකර්ම කොට්ඨාශ වල ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙය විය.
- වල් වී සහ වල් පැළ පාලනය කිරීම පිළිබඳව ගොවීන් සහ ව්‍යාප්ති නිලධාරීන් 564 දෙනෙකු සඳහා එක් දින ක්ෂේත්‍ර දැනුවත් කිරීමේ වැඩසටහන් 18ක් පවත්වන ලදි.
- දෙමුහුම් බීජ නිෂ්පාදනය පිළිබඳව ගොවීන්, ව්‍යාප්ති නිලධාරීන්, සරසවි සිසුන් මෙන්ම කෘෂිකර්ම විද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩසටහන් 10ක් මෙහෙය විය.
- වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ වී නිෂ්පාදන තාක්ෂණ මධ්‍යස්ථානය මගින් පහත 1.4.3 වගුවෙහි දැක්වෙන පරිදි පුහුණු වැඩසටහන් මෙහෙය විය.

**වගු අංක 1.4.3: වී නිෂ්පාදන තාක්ෂණ මධ්‍යස්ථාන මගින් 2013 වසරේදී මෙහෙය වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය**

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| ගොවි පුහුණු (එක්දින) | 21 | 344 |
| ගොවි පුහුණු (දින 2 හෝ 3) | 03 | 114 |
| කෘෂිකර්ම තාක්ෂණ නිලධාරි පුහුණුව (එක් දින) | 16 | 547 |
| විෂයානු බද්ධ විශේෂඥ පුහුණු (කන්නමය) | 03 | 90 |
| පෞද්ගලික අංශය සඳහා පුහුණු කිරීම් | 03 | 130 |
| ඩිප්ලෝමා සිසුන් සහ විශ්වවිද්‍යාල සිසුන්ගේ පැමිණීම් | 10 | 357 |
| පාසැල් සිසුන්ගේ පැමිණීම | 09 | 1159 |
| **එකතුව** | **65** | **2741** |

- ගොවීන් විසින් ගෙනෙන ලද නියැදි 21ක් පරික්ෂා කරන ලදුව පළිබෝධ සහ රෝග පාලනය කිරීම සඳහා නිසි උපදෙස් ලබා දෙන ලදි.
- ගොවි ක්ෂේත්‍ර 08ක් පරික්ෂා කරන ලදුව පළිබෝධ සහ රෝග පාලනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙනත් ඒකක මගින් සංවිධානය කරන ලද පුහුණු කිරීම් 03ක් සඳහා සම්පත්

පුද්ගලයන් ලෙස නිලධාරීන් සහභාගී විය.

- වී පර්යේෂණ සහ සංවර්ධන ආයතන පරිශ්‍රයෙහි ගොවිතැන පිළිබඳ ආදර්ශන ක්ෂේත්‍රයක් ස්ථාපිත කරන ලදි.
- ගුවන් විදුලි වැඩසටහන් 09ක් මෙහෙය විය. (වත්මන්හි වී වගාවට වැළඳෙන රෝග පිළිබඳව වැඩසටහන් 02ක්, වී වගාව සඳහා නව පොහොර නිර්දේශ පිළිබඳ වැඩසටහන් 04ක්, වී වගාවට වැළඳෙන පළිබෝධ සහ රෝග පිළිබඳ වැඩසටහන් 02ක්, වල් වී සහ වල් පැළෑටි පාලනය පිළිබඳ වැඩසටහන් 02ක් සහ මහ කන්නයේදී වී වගා කිරීම පිළිබඳව වැඩසටහන් 02ක්)
- වීඩියෝ වැඩසටහන් 03ක් නිපදවා "රූපවාහිනී" නාලිකාව ඔස්සේ විකාශය කරන ලදි. (වී වගාව සඳහා නව පොහොර නිර්දේශ පිළිබඳ වැඩසටහන් 02ක් සහ වී වගාවේදී එක්රුස් වන කැඩ්මියම් පිළිබඳව එක් වීඩියෝ වැඩසටහනක්)

## සහභාගි වූ පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ නිලධාරීන් පහත දැක්වෙන පුහුණු, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී විය.

- නව පර්යේෂණ නිලධාරීන් සඳහා පවත්වන ලද පැළෑටි ව්‍යාධිජනක පිළිබඳ පුහුණු වැඩසටහන්. 2013 ජනවාරි 07 - 08, උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ගන්නෝරුව.
- ජේටන්ට් ඩ්‍රාෆ්ටින්" වැඩමුළුව. 2013 ජනවාරි 28 - පෙබ . 01 දින දක්වා, ජාතික විද්‍යා පදනම සහ කර්මාන්ත තාක්ෂණ ආයතනය, කොළඹ
- තිරසාර පොහොර භාවිතය පිළිබඳ පුහුණුව. 2013 පෙබ. 18 - මාර්තු 01 දින දක්වා, PTC, නෙදර්ලන්තය.
- සාක් - ඕස්ට්‍රේලියා ව්‍යාපෘතිය පිළිබඳ තෙවැනි පුහුණු වැඩමුළුව සහ අවසන් සමාලෝචන රුස්වීම. 2013 මාර්තු 10 - 14, සාක් කෘෂිකර්ම මධ්‍යස්ථානය (SAC), බංගලාදේශය.
- අප්‍රිකාවේ සහ ආසියාවේ සම්පත් හීන රටවල් සඳහා ග්‍රීන් සුපර් රයිස් II අදියර ව්‍යාපෘතියේ සමාරම්භක රුස්වීම. 2013 මාර්තු 12 - 13, සාන්යා, චීනය : කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ චීන අධ්‍යයන ආයතනය.
- සහභාගීත්ව පැළෑටි අභිජනනය පිළිබඳව කලාපීය නිපුණතා සංවර්ධන පුහුණු ව්‍යාපෘතියේ සැලසුම් කිරීමේ වැඩමුළුව. 2013 මැයි 09 -11, ISTI, ගන්නොරුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- "STICS" බෝග ආදර්ශනය පිළිබඳ පුහුණුව. 2013 මැයි 13 -17,බෝග විද්‍යා අධ්‍යයන අංශය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරදෙණිය.
- අණුක ජීව විද්‍යාව පිළිබඳ වැඩමුළුව. 2013 ජුලි 10 -12, කර්මාන්ත තාක්ෂණ ආයතනය, කොළඹ
- ස්ථිර බෝග සායන පිළිබඳ තෝරාගත් ජාතික පුහුණුකරුවන් සඳහා පුහුණු වැඩමුළු - 1 සහ 2 මොඩ්‍යුල, 2013 ජුනි 3 - 8, පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය, ගන්නෝරුව
- ස්ථිර බෝග සායන පිළිබඳව තෝරාගත් ජාතික පුහුණුකරුවන් සඳහා පුහුණු වැඩමුළුව - 4වැනි මොඩ්‍යුලය, 2013 ජුලි 23 - 26, පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය, ගන්නොරුව.
- උපකරණ භාවිතය පිළිබඳ පුහුණුව, කර්මාන්ත තාක්ෂණ ආයතනය, කොළඹ ITI
- ප්‍රරෝහණය වන අවධියේදී නිර්වායු තත්ත්වයන් සඳහා ඔරොත්තු දීමට ජාන එක් කිරීම මගින් සෘජුවම බීජ වපුරන වී වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම පිළිබඳ ව්‍යාපෘතියේ සමාරම්භක සහ සැලසුම් කිරීමේ රුස්වීම. 2013 අගෝ.

13 – 17 අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය, පිලිපීනය : IRRI

- නව පැන් - ඒෂියා සහ ආසියානු ආහාර සහ කෘෂිකර්ම සහයෝගිතා සමාරම්භක කලාපීය ව්‍යාපෘතිවල ප්‍රධාන විමර්ශක රුස්වීම. 2013 සැප් 09-13, බැංකොක්, තායිලන්තය. APO
- ජීවනෝපාය, ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතිය සේවාවන් පිළිබඳ ජාතික සමන්ත්‍රණය. 2013 සැප්. 26-27. ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ.
- ස්ථිර බෝග සායන පිළිබඳව තෝරාගත් ජාතික පුහුණුකරුවන් සඳහා පුහුණු වැඩමුළුව - 3වැනි මොඩියුලය. 2013 ඔක්. 28 - නොවැ. 02, පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය, ගන්නෝරුව
- ජෛව විවිධත්වය සංරක්ෂණය ප්‍රචලිත කිරීම සහ ජීවනෝපාය සඳහා ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික පද්ධති වලට එමගින් ඇති ප්‍රයෝජනය සහ දේශගුණික විපර්යාසයට අනුවර්තනය වීම පිළිබඳ UNEP/GEF ව්‍යාපෘතියේ සමාරම්භක සහ පුහුණු වැඩමුළුව. පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, 2013 ඔක්. 22-23, මහනුවර
- 24 වැනි ආසියා පැසිෆික් වල් පැළෑටි විද්‍යා සංගමයේ සම්මන්ත්‍රණය 2013 ඔක්. 22 -25. බැන්ඩුන්, ඉන්දුනීසියාව
- අණුක ජීව විද්‍යා ශිල්ප ක්‍රම පිළිබඳ පුහුණුව. 2013 නොවැ. 4-7. කෘෂිකර්ම ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, පේරාදෙණිය
- UPOV සම්මුතියට අනුව පැළෑටි විවිධත්වය ආරක්ෂා කිරීමේ ක්‍රම වලින් ලැබෙන ප්‍රයෝජන. 2013 නොවැ. 25-26. පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය, පේරාදෙණිය
- වී ජාන විද්‍යාව පිළිබඳ හත් වැනි අන්තර්ජාතික සමුළුව 2013 නොවැ. 5-8. මැනිලා , පිලිපීනය : IRRI
- ජෛව තාක්ෂණ පාර්ශ්වකරුවන් සඳහා සම්බන්ධීකරණ වැඩමුළුව. ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නවමු ප්‍රවේශ. 2013 නොවැ. 21, කොළඹ විද්‍යා තාක්ෂණ සහ නව්‍යකරණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය.
- සාක් කලාපයේ ලවණතාව සහිත පස පිළි සැකසීමේ ක්‍රමයන්හි වඩා හොඳ පිළිවෙත් සහ ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රවීණ උපදේශ ලබාදීමේ කලාපීය රුස්වීම. 2013 නොවැ. 27 – 29. හර්යානා, ඉන්දියාව
- ඇග්‍රිනෙට් යූසර් AGRINET User සම්මන්ත්‍රණය. 2013 දෙසැ. 06, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, කොළඹ
- ස්ථිර බෝග සායන වැඩසටහන පිළිබඳ වැඩමුළුව (PCCP). 2013 දෙසැ. 19-20, මහනුවර

## වෙනත් කාර්යයන්

- සාම්ප්‍රදායික වගා ප්‍රභේද, හඳුන්වාදීම් සහ වැඩිදියුණු කරන ලද ආර ඇතුළත්ව වී එකතුන් 950ක් ස්ථාපිත කළ අතර බීජ නියැදි වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ කෙටි කාලීන ජනක ප්ලාස්ම සංරක්ෂණ ඒකකයේ සංරක්ෂණය කෙරිණි. බීජ නියැදි අනෙකුත් පර්යේෂණ ස්ථාන, ගොවීන්, පාසැල් සිසුන්, විශ්වවිද්‍යාල, රජයේ නොවන ආයතන සහ මේ සම්බන්ධයෙන් කැමැත්තක් දක්වන කණ්ඩායම් අතර බෙදා දෙන ලදි.
- කෘෂිකර්ම විද්‍යාලීය සිසුන් 12දෙනෙකුට ඔවුන්ගේ සේවාරම්භක පුහුණුව සඳහා සහ උපාධි අපේක්ෂක සිසුන් 05 දෙනෙකු සහ පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් 04 දෙනෙකුට ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදි.
- රු. 104446.00ක් වටිනා කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශන සහ සංයුක්ත තැටි වී නිෂ්පාදන තාක්ෂණ මධ්‍යස්ථානයේ අලෙවි කුටියෙන් අලෙවි කරන ලදි.

- ගොවීන් විසින් වී වගාවට යොදා ගන්නා කොළ පොහොර ස්ථානීයව සකස් කර ගැනීම සඳහා සෙස්බනියා රොස්ට්‍රාටා සහ සන්හෙම්ප් බීජ බෙදා දෙන ලදි.

## 2014 වසර සඳහා සැලැස්ම

### පර්යේෂණ

- මාස 2 ½, 3, 3 ½, 4 - 4 ½ සහ 5 - 6 කාණ්ඩ වල ප්‍රභේදීය වැඩිදියුණු කිරීම සහ ගුණනය කිරීම.
- මාස 2 ½, 3, 3 ½, 4 - 4 ½ සහ 5 - 6 වයස් කාණ්ඩ වල වී ආර දෙමුහුම් කිරීම සහ වරණය කිරීම.
- මූලික අස්වනු අත්හදා බැලීමෙන් සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීමෙන් මාස 2 ½, 3, 3 ½, 4 – 4 ½ සහ 5 – 6 වයස් කාණ්ඩ වලට අයත් උසස් වී ආර ඇගයීම.
- අහිතකර ජෛව සහ අජෛව තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාවැති තත්ත්වයෙන් උසස් වී ප්‍රභේද බිහි කිරීම සඳහා පිළිමුහුම් කිරීම, සලකුණු සහායක වරණය සහ බීජ රෝපණය.
- දෙමුහුම් දිරිය අභිජනනය මගින් නව දෙමුහුම් බිහි කිරීම.
- වරණය කර ගන්නා ලද දෙමුහුම් ආරවල මූලික බීජ නිෂ්පාදනය කිරීම.
- වරණය කරගත් සාම්ප්‍රදායික වී වගා ප්‍රභේද ගුණනය කිරීම සහ සංශුද්ධ කිරීම.
- ගුණනය කිරීම මගින් ජනකප්ලාස්ම සංරක්ෂණය කිරීම.
- විවිධ ලක්ෂණ සම්බන්ධයෙන් නිර්දේශිත සහ සාම්ප්‍රදායික වී ප්‍රභේද පරික්ෂා කර බැලීම.
- පළිබෝධනාශකවල කාර්යක්ෂමතාවය සහ ප්‍රධාන වී පළිබෝධ වල පළිබෝධ ගතිකය පිළිබඳව ඇගයීම.
- වී වගාවේ රෝග පාලනය කිරීමේ ක්‍රම පිළිබඳව විමර්ශනය කිරීම
- වී වගාවේ වල් පැළෑටි කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය ක්‍රම ඇගයීම.
- වල් වී පිළිබඳ විමර්ශනය (Oryga sativa spontaneae)
- පහතරට වර්ෂාපෝෂිත වී වගාව යටතේ පොහොර යොදන කාල පරිච්ඡේදය පිළිබඳව ඇගයීම.
- වර්ෂාපෝෂිත වී වගාවේදී පවත්නා ජලය සහ ආශ්‍රිත තාක්ෂණ ක්‍රම පිළිබඳ විමර්ශනය කිරීම.
- වර්ෂාපෝෂිත වී වගාව සඳහා බෝග සමාකරණය සහ ආදර්ශනය කිරීම.

### බීජ නිෂ්පාදනය

- නිර්දේශිත වී ප්‍රභේද වල අභිජනක බීජ නිෂ්පාදනය.
- අපනයන කළ හැකි උසස් තත්ත්වයෙන් යුත් වී ප්‍රභේදයක් වන Bg 1165-6හි මූලික බීජ නිෂ්පාදනය කිරීම.
- ජනප්‍රිය වී ප්‍රභේද වල වාණිජ බීජ නිෂ්පාදනය කිරීම.

### විශේෂ ව්‍යාපෘති

අන්තර්ජාතික නියෝජිතායතන සහ ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්මෙන් අරමුදල් සම්පාදිතව පහත දැක්වෙන සුළු පරිමාණයේ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ඇත.

- විවිධ අහිතකර පාරිසරික තත්ත්වයන් ගණනාවක් සම්බන්ධයෙන් පරික්ෂා කිරීම.
- වියළි පොළවට බීජ වපුරා අනතුරුව ජලය සම්පාදනය කර සිදු කරන වී වගාව සඳහා තාක්ෂණික පිළිවෙත් මාලාව ප්‍රශස්ත කිරීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය ස්වයංපෝෂිත බවින් ඉහළ නැංවීම සඳහා වී නිෂ්පාදන තාක්ෂණික ක්‍රම බිහි කිරීම.
- ග්‍රීන් සුපර් රයිස්.
- ආසියාවේ වී අස්වනු පරතරය අවම කිරීම.

- ප්‍රරෝහණය වන අවදියේදී නිර්වායු තත්ත්වයන්ට ඔරොත්තු දෙන ජාන එක් කිරීම මගින් සෘජුවම වී වපුරා සිදු කරන වී වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම.
- පහතරට තෙත් කලාපයේ සිදු කරන වී වගාවේ ඵලදායීතාව ඉහළ නැංවීම.
- අහිතකර අජෛව තත්ත්වයන් ; ජලයෙන් යටවීම, ලවණතාව, නියඟය සහ යකඩ විෂමතාවය සඳහා ඔරොත්තු දෙන වී ප්‍රභේද බිහි කිරීම.
- ශ්‍රී ලංකාවේ මඩට වපුරන වී වගාවේ වල් පැළෑටි කළමනාකරණය.
- වී වගාවේ ජලය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ෂාපෝෂිතව ගොවිතැන් සිදු කරන කුඹුරුවල පවත්නා ජලය පිළිබඳව තක්සේරු කිරීම.

### තාක්ෂණය පතුරුවාලීම

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන්, විශ්වවිද්‍යාල සිසුන්, කෘෂිකර්ම විද්‍යාලීය සිසුන්, ගොවීන් සහ පාසැල් සිසුන් සඳහා වී අභිජනනය, වී ප්‍රභේද සහ බිත්තර වී නිෂ්පාදනය පිළිබඳ පුහුණු කිරීම.

## වී පර්යේෂණ ස්ථානය, අම්බලන්තොට

මෙම පර්යේෂණ ස්ථානයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ වැඩිදියුණු කළ ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ වලින් යුතුව රතු ඵලාවරණයක් සහිත, ලවණතාවයට ඔරොත්තු දෙන, කෙටි කාලයකින් පරිණත වන ඉහළ අස්වනු ගෙන දෙන වී ප්‍රභේද බිහි කිරීමයි. මීට අමතරව නිර්දේශිත “At” ප්‍රභේද වල අභිජනක බීජ නිෂ්පාදනය කිරීම මෙම ආයතනයට පැවරී ඇත.

## ප්‍රගතිය

### පර්යේෂණ

### වී ප්‍රභේදීය වැඩිදියුණු කිරීම

#### නව වී ප්‍රභේද

**At 309** - මාස 03 සුදු ඵලවරණයක් සහිත සුගන්ධවත් දිගැටි සහල් ප්‍රභේදයක් වන At 309 සාමාන්‍ය වගාව සඳහා මුදා හරින ලදි. මෙම ප්‍රභේදය බිස්කට් නිෂ්පාදනය කිරීම සහ සහල් පාදක නිෂ්පාදන සඳහා යෝග්‍ය වේ. හෙ.1ට ටොන් 7.1ක අස්වැන්නක් ගෙන දෙන මෙම ප්‍රභේද ඇද වැටීමට ප්‍රතිරෝධී වන අතර ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී වේ.

**At 06 - 631** - මාස 3 ½ සුදු, නාඩු ප්‍රභේදයක් වන මෙය ඉහළ අස්වනු ගෙන දෙන අතර ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී වේ. මෙම ආර අතර විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් පරික්ෂා කර බැලීම සඳහා බීජ සහතික කිරීමේ සේවය වෙත යොමු කරන ලදි.

At 676 - මාස 03 සුදු, නාඩු ආකාරයේ ප්‍රභේදයක් වන මෙය ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී ආරකි. මෙහි විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා බීජ සහතික කිරීමේ සේවයට යොමු කරන ලදි.

### මාස 03 පන්තිය

නව මුහුම් 48ක් සිදු කෙරිණි. කලින් වියුක්ත වන පරම්පරා 31ක් වරණය කර ගත් අතර වෙන වෙනම නඩත්තු කරන ලදි. මූලික අස්වනු අත්හදා බැලීම සඳහා උසස් ප්‍රජනිත ආර 29ක් වරණය කෙරුණු අතර ප්‍රධාන අස්වනු අත්හදා බැලීම සඳහා උසස් අභිජනක ආර 04ක් වරණය කර ගන්නා ලදි. At 10-1350, At 08 - 1283, At 09 - 1024, At 09 - 1024 සහ At09 - 898 බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස වරණය කර ගත් අතර ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමෙන් ඇගයීම සඳහා නම් කරන ලදි.

### මාස 3 ½ වයස් පන්තිය

මුහුම් 80ක් සිදු කරන ලදි. මූලික අස්වනු අත්හදා බැලීමෙන් අස්වනු විභවය පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි ආර 13ක් වරණය කර ගත් අතර ප්‍රධාන අස්වනු අත්හදා බැලීමෙන් ඇගයීම සඳහා මූලික අස්වනු අත්හදා බැලීමෙන් ආර 12ක් වරණය කර ගැනිණි.

## ශෂ්‍ය විද්‍යාව

### මා වී ස්ථාපිත කරන කාල වකවානුව

වැඩිදියුණු කරන ලද මා වී (ප්‍රභා අවධි සංවේදී කාලය දිගු) වගාව ස්ථාපිත කිරීම සඳහා වඩාත් හොඳම කාල වකවානු පිළිබඳව සිදු කරන ලද විමර්ශනයෙන් Bg 38 සහ Bg 745 යන මා වී ප්‍රභේද ස්ථාපිත කිරීම සඳහා අගෝස්තු මාසයේ සිට සැප්තැම්බර් අග දක්වා යෝග්‍ය බැව් අනාවරණය විය.

### නයිට්‍රජන් පොහොර සඳහා At 05 – 1382 හි ප්‍රතිචාර

අළුතින් බිහි කළ At 05 -1382 මගින් නයිට්‍රජන් කෙරෙහි දක්වන ලද ප්‍රතිචාරයට අනුව හෙ.1ට නයිට්‍රජන් කි.ග්‍රෑ. 150ක් දක්වා යෙදූ මුත් At 306 පරීක්ෂණ ප්‍රභේදයට සාපේක්ෂව ගෙන දෙන අස්වැන්නෙහි සැලකිය වෙනසක් නොවීය.

### ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම (NCVRT)

අත්හදා බැලීම් තුනක් සිදු කරන ලදි. සම්මත පරීක්ෂණ ප්‍රභේද සමඟ නව වී ආර 15ක් පරීක්ෂා කරන ලදුව Bg 08 – 1258 (මාස 3 ½ සුදු නාඩු ආකාරයේ ආර), At 08 – 1024 (මාස 3 ½ සුදු නාඩු ආරක්), Bg 08-1407 (මාස 3 ½ සුදු සම්බා ආරක්) සහ Bg 08- 1909 (මාස 4 සුදු නාඩු ආරක්) කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බැව් අනාවරණය විය.

### ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම (VATT)

At 09-861, At 08- 593, Ld 8 - 6 -7, At 08- 1078, Bg 08-2398, At 08-617, Bg 05-110 සහ Bg 11-139 යන නව උසස් ආර 08හි අනුවර්තන හැකියාව සම්බන්ධයෙන් මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වලදී අත්හදා බැලීම් 16ක් සිදු කෙරිණි. පරීක්ෂාවට ලක් කළ ආර අතරින් At – 7- 800 (මාස 4 ½ ආර), Bg 07 -997 (මාස 4 ½ ආර) සහ Bg 07 – 1350 (මාස 4 ½ ආර) ඉහළ අස්වනු ගෙන දුන් අතර සම්මත පරීක්ෂණ ප්‍රභේද වලට වඩා අනුවර්තනය වීමේ හැකියාවෙන් යුත් බවට අනාවරණය විය.

### ධාන්‍ය ගුණාත්මය සහ පසු අස්වැන්න

රතු සහල් ප්‍රභේද 2ක් යොදා ගනිමින් පැළ වුණු සහල් පාදක ක්ෂණික සුප් මිශ්‍රණයක් අත්හදා බලන ලදි. එක් එක් ප්‍රභේද වලින් සුප් මිශ්‍රණ දෙකක් පිළිගත හැකි බවත් එම සුප් මිශ්‍රණ වල සැලකිය යුතු ප්‍රමාණයකින් ප්‍රෝටීන්, මේදය, තන්තු සහ ලවණ අඩංගු බවත් හඳුනා ගැනිණි. මෙම නිෂ්පාදන ඇලුමිනියම් පත්‍ර වල හෝ අඩු

සනත්වයකින් යුත් පොලිතින් මලුවල මාස 03ක පමණ කාලයක් තබා ගත හැකිය.

දුඹුරු සහල් පැළ වීම සඳහා පැය 48ක් වැනි දිගු කාලයක් ගන්නා අතර දුඹුරු සහල් ප්ලාස්ටික් පෙට්ටිවල පොඟවා තැබීමෙන් පැය 12කට අඩු කාලයකදී ප්‍රශස්ත මට්ටමේ දිගු අංකුර ලබා ගත හැකිය.

වී ධාන්‍ය සමූහය සහ ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ කෙරෙහි පත්‍ර වර්ණ සටහන පාදකව නයිට්‍රජන් පොහොර යෙදීමෙන් ඇති වන බලපෑම පිළිබඳව නිර්ණය කිරීම සඳහා සිදු කළ අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි පත්‍ර වර්ණ සටහන පාදක පොහොර නිර්දේශ මගින් ගෙන දෙන ප්‍රතිඵල වලට සමාන ප්‍රතිඵල පත්‍ර වර්ණ සටහන පාදකව නයිට්‍රජන් යෙදීමෙන්ද ගෙන දේ.

## තාක්ෂණය පතුරුවාලීම

- උපාධි අපේක්ෂක සිසුන් දෙදෙනෙකුගේ අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කෙරිණි.
- කෘෂිකර්ම විද්‍යාලීය සිසුන් පුහුණු කිරීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් විසින් සැලසුම් කරන ලද මාසික බෝග සායන සඳහා සම්පත් පුද්ගලයන් ලෙස සහභාගී වීම.
- විශ්ව විද්‍යාල සිසුන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලය, පාසැල් සිසුන් සහ ගොවීන් වෙත තොරතුරු ලබා දීම.

## අභිජනක බීජ නිෂ්පාදනය

පහත දැක්වෙන ප්‍රමාණ වලින් අභිජනක බීජ නිපදවන ලදි.

**වගු අංක 1.4.4: 2013 වසරේ අභිජනක බීජ නිෂ්පාදනය**

| ප්‍රභේදය | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | එකතුව |
|---|---|---|---|
| | 2011/12 මහ | 2012 යල | |
| **මාස 03** | | | |
| At 306 | 40 | - | 40 |
| At 307 | 100 | 80 | 180 |
| At 308 | 60 | 80 | 140 |
| **මාස 3½** | | | |
| At 353 | 20 | 20 | 4 |
| At362 | 320 | 220 | 540 |

## සහභාගී වූ පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

- 7 වැනි අන්තර්ජාතික වී ජාන විද්‍යා සමුළුව. 2013 නොවැ. 5-8, මැනිලා, පිලිපීනය : IRRI

## 2014 වසර සඳහා සැලැස්ම

- මාස 3 සහ 3 ½ වයස් පන්ති වල ආර දෙමුහුම් කිරීම සහ වරණය.
- මූලික අස්වනු අත්හදා බැලීමෙන් සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීමෙන් මාස 3 සහ 3 ½ වයස් පංතිවල උසස් ආර ඇගයීම.
- මාස 3 සහ 3 ½ වයස් පංතිවල උසස් ආර (ඉදිරියට ගෙන ආ පරම්පරා) ගුණනය කිරීම.
- නිර්දේශිත වී ප්‍රභේද වල අභිජනක බීජ නිෂ්පාදනය කිරීම.
- ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සිදු කිරීම.

## වී පර්යේෂණ ස්ථානය - සමන්තුරේ

මෙම ආයතනයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ නැගෙනහිර පළාතේ විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් සතුව වී වගාව පිළිබඳව පවත්නා දැනුම් පරතරය හඳුනා ගැනීම සහ වී වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණික ශිල්ප ක්‍රම ඔවුන් වෙත හඳුන්වා දීමයි. මූලික බීජ නිෂ්පාදනය සහ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමද මෙම ආයතනයෙන් සිදු කෙරේ.

## ප්‍රගතිය

### පර්යේෂණ

#### ප්‍රභේද වැඩිදියුණු කිරීම

#### ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම

සම්මත පරීක්ෂණ ප්‍රභේද සමඟ නව වී ආර 15ක් පරීක්ෂා කර බලන ලදුව Bg 08 - 1258, At 08-1024, Bg 08-1407 සහ Bg 08-1909 කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බැව් අනාවරණය විය.

#### ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම (VATT)

ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා At 09 – 861, At 08 – 593, Ld 8-6-7, At 08-1078, Bg08-2378, At-617, Bg05-110 සහ Bg 11-139 යන නව උසස් ආර යෙදා ගන්නා ලද අතර පරීක්ෂාවට ලක් කළ ප්‍රභේද අතරින් At 7 – 800 (මාස 3 ආර), Bg 07 – 997 (මාස 4 ½ ආර) සහ Bg 07-1350 (මාස 4 ½ ආර) ඉහළ අස්වනු ගෙන දුන් අතර සම්මත පරීක්ෂණ ප්‍රභේද වලට වඩා අනුවර්තන හැකියාවෙන් යුත් බැව් අනාවරණය විය.

#### මූලික බීජ නිෂ්පාදනය

Bg 357න් කි.ග්‍රෑ. 328ක් සහ Bg 94-1න් කි.ග්‍රෑ. 307.5ක් නිපද වූ අතර මල්වත්ත බීජ ගොවිපළට නිකුත් කරන ලදි.

#### තාක්ෂණය පතුරුවාලීම

- ගොවීන් 1245 දෙනෙකු සඳහා ගොවි පුහුණු වැඩසටහන් 13ක් මෙහෙය විය.
- අත්පත්‍රිකා 2500ක් ගොවීන් අතර බෙදා දෙන ලදි.
- බීජ පැළ වැපිරීම, පැළ උදුරා සිටුවීම, පූර්ව නිර්ගමන වල් පැළෑටි නාශක භාවිතය සහ පෙළට සිටුවීම පිළිබඳව ගොවි ක්ෂේත්‍ර වලදී ආදර්ශන 29ක් සිදු කරන ලදි.
- ගුවන් විදුලි වැඩසටහන් 03කට සහභාගී විය.
    - අම්පාර දිස්ත්‍රික්කයේ වල් පැළෑටි කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.
    - වී පසු අස්වනු හානිය අවම කිරීම.
    - කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සහ භාවිතය.

## 2014 වසර සඳහා සැලැස්ම

- බලාපොරොත්තු තැබිය හැකි ආර හඳුනා ගැනීම සඳහා බල්ක් ගහන වරණය කිරීම.
- ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් මෙහෙය වීම.
- මූලික බීජ නිෂ්පාදනය

## වී පර්යේෂණ ස්ථානය - පරන්තන්

මෙම පර්යේෂණ ස්ථානයට පැවරී තිබෙන වගකීම වනුයේ උතුරු ප්‍රදේශයේ විශේෂයෙන්ම, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සිදු කෙරෙන වී වගාව සම්බන්ධයෙන් පර්යේෂණ අවශ්‍යතා සපුරාලීම සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නව

තාක්ෂණික ක්‍රම හඳුන්වා දීමයි. ජාතික සම්බන්ධීකරණ අත්හදා බැලීම් සිදු කිරීම සහ කලාපයේ ගොවීන් විසින් මුහුණ පාන ක්ෂේත්‍ර ගැටළු සඳහා විසඳුම් ලබාදීමද මෙම ආයතනය සතු අනෙකුත් වගකීම් වේ.

## ප්‍රගතිය

### පර්යේෂණ

#### ප්‍රභේද වැඩිදියුණු කිරීම

#### ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම (NCRVT)

සම්මත පරීක්ෂණ ප්‍රභේද සමඟ නව වී ආර 15ක් පරීක්ෂා කරන ලදුව Bg 08-1399, Bw 03-1198 සහ Bg 08-1909 කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බැව් අනාවරණය විය.

#### වල් පැළෑටි විද්‍යාව

**උතුරු පළාතේ පැතිරී තිබෙන ‘වැල් හිරි’ (Cyperus iria) වල් පැළෑටිය කෙරෙහි විවිධ පැළෑටිනාශක වලින් ඇති වන බලපෑම**

මෙම වල් පැළෑටිය මලාවි ප්‍රදේශයේ කුඹුරු වල පැතිර පවතින පාලනය කිරීමට දුෂ්කර වල් පැළෑටියක් වන අතර මෙය පාලනය කිරීම සඳහා පරීක්ෂා කරන ලද වල් පැළෑටි නාශක 07 අතරින් තයෝබෙන්කාබ් 40% + ප්‍රොපනිල් 20% වඩාත් කාර්යක්ෂම විය.

#### වී වගාව සඳහා භාවිතා කරන පැළෑටි නාශක නැවත ඇගයීම

පරීක්ෂා කර බලන පැළෑටිනාශක 15න් පයිරසොසල් ෆ්‍යුරොන් එතිල් (SIRIUS) පත් වර්ග පාලනයේදී කාර්යක්ෂම වූ අතර පුළුල් පත්‍ර පාලනය කිරීමෙහිලා ගලිවර් සහ ප්‍රොෆිට් මනාව ක්‍රියාකාරි විය. පයිරොක්සසල්ෆෝන්, ඔක්සඩයිසෝන් + ප්‍රොපනිල්, ඔක්සිෆ්ලුඔෆෙන් මගින් වී වගාවේ අස්වනු හානිය සැලකිය යුතු මට්ටමකින් අවම කරන ලදි.

#### මූලික බීජ නිෂ්පාදනය

Bg 300හි මූලික බීජ කි.ග්‍රෑ. 6150ක් නිපදවිය.

#### සහභාගී වූ පුහුණු සම්මන්ත්‍රණ සහ වැඩමුළු

- ආසියාවේ වී අස්වනු පරතරය අවම කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ සමාරම්භක සහ සැලසුම් කිරීමේ වැඩමුළුව. 2013 මාර්තු 12 -13, අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය, පිලිපීනය

## 2014 වසර සඳහා සැලැස්ම

- උතුරු පළාතේ අපවිත්‍රභාවයට පත් වගා ප්‍රභේද සහ දේශීය ප්‍රභේද එක්රැස් කර සංශුද්ධ කිරීම.
- උතුරු ප්‍රදේශයේ අපවිත්‍රභාවයට පත් වගා ප්‍රභේද සහ දේශිය ප්‍රභේද වලින් පවිත්‍ර ආර වරණය කිරීම.
- සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂා කිරීම සහ අනුවර්තන පරීක්ෂණ අත්හදා බැලීම.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

### වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, බතලගොඩ

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 20 |
| කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 03 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 01 |

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| වැඩසටහන් සහකාර | 07 |
| කෘෂිකර්ම උපදේශක | 16 |
| පර්යේෂණ සහකාර | 16 |
| පර්යේෂණ උප සහකාර | 05 |
| පරිපාලන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 13 |
| සංවර්ධන නිලධාරි | 07 |
| කාර්යාල සහායක | 01 |
| ට්‍රැක්ටර් යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| ගොවිපළ ලිපිකරු | 01 |
| කාර්මික ශිල්පි | 01 |
| යාන්ත්‍රික ශිල්පි | 01 |
| වඩු කාර්මික | 01 |
| රියදුරු | 09 |
| ලොරි පවිත්‍රකරු | 01 |
| සංචාරක බංගලා භාරකරු | 02 |
| අරක්කැමි | 01 |
| මුරකරු | 11 |
| ස්ථිර කම්කරු | 44 |
| කොන්ත්‍රාත් කම්කරු | 98 |
| **එකතුව** | **267** |

## වී පර්යේෂණ ආයතනය, අම්බලන්තොට

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 04 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| පර්යේෂණ සහකාර | 04 |
| පර්යේෂණ උප සහකාර | 02 |
| සංවර්ධන නිලධාරි | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| රියදුරු | 02 |
| මුරකරු | 03 |
| ට්‍රැක්ටර් යන්ත්‍ර ක්‍රියාකාරු | 01 |
| ස්ථිර කම්කරු | 14 |
| කොන්ත්‍රාත් කම්කරු | 20 |
| **එකතුව** | **56** |

## වී පර්යේෂණ ස්ථානය, සමන්තුරේ

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| පර්යේෂණ සහකාර | 01 |
| සංවර්ධන නිලධාරි | 04 |
| තාක්ෂණික සහකාර | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 01 |
| ට්‍රැක්ටර් යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| මුරකරු | 04 |
| ස්ථිර කම්කරු | 02 |
| කොන්ත්‍රාත් කම්කරු | 07 |
| **එකතුව** | **28** |

## වී පර්යේෂණ ස්ථානය, පරන්තන්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ උප සහකාර | 01 |
| ට්‍රැක්ටර් යන්ත්‍ර ක්‍රියාකාරු | 01 |
| මුරකරු | 01 |
| ස්ථිර කම්කරු | 01 |
| කොන්ත්‍රාත් කම්කරු | 06 |
| **එකතුව** | 12 |

# 1.4.1 කලාපීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල

බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය මෙන්ම ලබුදූවේ සහ බෙන්තොට සහායක පර්යේෂණ මධ්‍යස්ථාන පහතරට තෙත් කලාපයේ පිහිටා ඇති අතර බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත පැවරී තිබෙන වගකීම වනුයේ යකඩ විෂමතාවයට ඔරොත්තු දෙන ඉහළ අස්වනු ලබා දෙන රතු සහ සුදු වී ප්‍රභේද බිහි කිරීමයි. ලබුදූවේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සිය වැඩසටහන් මඟින් රතු ඵලාවරණයක් සහිත කුඩා වී ප්‍රභේද බිහි කරනු ලබන අතර බෙන්තොට කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සිය වැඩසටහන් මඟින් කලාපයේ ජල ගැලීම් වලට සහ ලවණතාව සහිත ප්‍රදේශවලට ඔරොත්තු දෙන වී ප්‍රභේද බිහි කිරීම සහ අදාළ තාක්ෂණික ක්‍රම බිහි කිරීමෙහිලා අවධානය යොමු කරයි.

## අයවැය

**වගු අංක 1.4.1.1 : වාර්ෂික අය වැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම% |
|---|---|---|---|
| මූලධන | 4,574,800 | 4,574,800 | 100 |
| පුනරාවර්ථන | 9,535,000 | 8,043,627 | 93 |
| ව්‍යාපෘති | | | |
| 1. ගොවි ක්ෂේත්‍රවලදී කාර්යක්ෂමව පොහොර යෙදීමේ තාක්ෂණ ක්‍රමය පිළිබඳ අනුවර්තනඅත්හදා බැලීම් | 255,000 | 254,674 | 99 |
| 2. ජලයෙන් යටවීමට ඔරොත්තු දෙන සහ යකඩ විෂමතාවයට ඔරොත්තු දෙන වී ප්‍රභේද බිහි කිරීම | 533,850 | 273,130 | 51 |
| 3. පහතරට තෙත් කලාපයේ වී ඵලදායීතාවය ඉහළ නැංවීම | 2,500,000 | 2,499,963 | 99 |
| 4. වී වගාවේදී යොදා ගන්නා විවිධ දියර පොහොර වර්ග ඇගයීම | 212,000 | 150,000 | 71 |
| **එකතුව** | **17,610,650** | **15,796,194** | **90** |

## ප්‍රගතිය

### පර්යේෂණ

### ප්‍රභේදීය වැඩිදියුණු කිරීම

#### නව නිර්දේශිත වී ප්‍රභේද

තෙත් කලාපයේ වගා කිරීම සඳහා BW 372 නැමැති මාස 3 1/2න් පරිණත වන වයස් කාණ්ඩයට අයත් රතු අතරමැදි ගෝලාකාර හැඩයෙන් යුත් වී ප්‍රභේදයක් නිකුත් කරන ලදි. මෙම ප්‍රභේදයේ සාමාන්‍ය අස්වැන්න හෙ.1ට ටොන් 7.68ක් ලෙස තක්සේරු කෙරිණි.

BW 11 -722 නම් වූ බලාපොරොත්තු තැබිය හැකි නව ආරක් 2013/14 මහ කන්නයේ දී ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහනට නම් කරන ලද අතර මෙම ආර මාස 3 ½ වයස් පංතියට අයත් සුදු කෙටි රවුම් හැඩති වර්ගයකි.

BW 03 -1198 මාස 3 ½ වයස් කාණ්ඩයට අයත් අතරමැදි ගෝලාකාර සුදු ධාන්‍ය සහිත වී ආර 2012/13 ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහනට නම් කරන ලදි.

මාස 4 - 4 ½ න් පරිණත වන කාණ්ඩයේ ආර තුනක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීමට වරණය කර ගැනිණි.

මාස 3 ½න් පරිණත වන කාණ්ඩයෙන් ආර 18ක් මූලික අස්වනු අත්හදා බැලීම සඳහා වරණය කර ගන්නා ලදි.

මාස 3න් සහ දින 85න් පරිණත වන කාණ්ඩ වලින් පිළිවෙළින් ආර තුනක් සහ ආර 5ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම සඳහා වරණය කෙරිණි.

### රෝග කළමනාකරණය

බෝඹුවල, අම්බලන්තොට සහ ලබුදුවේ වී වැඩිදියුණු කිරීමේ වැඩසටහන් මගින් වී ආර 90ක් බිහි කරන ලදි. එම ආර වී කොළ පාළුව සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කළ අතර ඉන් ආර 45ක් ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි.

අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් INGER වැඩසටහන යටතේ ලද වී ආර 70ක් පරීක්ෂා කර බැලූ අතර ඉන් ආර 42ක් වී කොළ පාළුවට ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි.

### පළිබෝධ කළමනාකරණය

හරිතාගාර තත්ත්වයන් යටතේ දුඹුරු පැළ කීඩැවා සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහනින් ප්‍රවේශ 58ක් පරීක්ෂාවට ලක් කළ අතර ඉන් ප්‍රවේශ 15ක් මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බවත් ප්‍රවේශ 4ක් ප්‍රතිරෝධී/මධ්‍යස්ථ ප්‍රතිරෝධී බවත් හඳුනා ගැනිණි.

බෝඹුවල අභිජනක ආර 114ක් සහ INGER වැඩසටහනේ 54ක් දුඹුරු පැළ කීඩැවා සම්බන්ධයෙන් 2013 යල කන්නයේදී හරිතාගාර තත්ත්වයන් යටතේ පරීක්ෂා කර බලන ලදුව ප්‍රතිරෝධී ආර 5ක්, ප්‍රතිරෝධී/ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී ආර 14ක් සහ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී ආර 48ක් හඳුනා ගැනිණි.

2012/13 මහ කන්නයේදී ගොක් මැස්සාගේ ගහනය අවම මට්ටමක පැවති බැවින් බෝඹුවලදී එම පළිබෝධය සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම සාර්ථක නොවීය. කෙසේ වුවද, 2013 යල කන්නයේදී ලද ප්‍රතිඵල මගින් ප්‍රතිරෝධී ප්‍රවේශ 3ක් සහ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී ප්‍රවේශ 18ක් අනාවරණය කර ගැනිණි.

## ශෂ්‍ය විද්‍යාව

වගුරු සහිත පසේ සහ අර්ධ වශයෙන් වගුරු සහිත පසෙහි සිදු කරන ලද ශුන්‍ය බිම් සැකසුම් අධ්‍යයනය මගින් පහත රට තෙත් කලාපයේ අතහැර දැමූ වගුරු පස සහිත කුඹුරු ඉඩම් ශුන්‍ය බිම් සැකසුම මගින් සාර්ථකව නැවත වගා කිරීමට යොදා ගත හැකි බව තහවුරු විය. මෙමගින් බිම සකස් කිරීමට වැය වන ශ්‍රම පිරිවැය අතිශයින්ම අඩුවිය.

පහත රට තෙත් කලාපයේ වගා කෙරෙන වී වගාව කෙරෙහි වාණිජව සකස් කරන ලද දියර ජෛව පොහොර මගින් ඇති කරන බලපෑම පිළිබඳව අධ්‍යනය කරන ලදි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත පොහොර හා සංසන්දනාත්මකව සලකා බැලීමේදී වී අස්වනු වර්ධනය කෙරෙහි ජෛව පොහොර මගින් බලපෑමක් සිදු නොකරන බැව් අනාවරණය විය.

තෙත් කලාපීය ප්‍රදේශ සඳහා ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන් අඛණ්ඩව සිදු කළ අතර ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන යටතේ බලාපොරොත්තු තැබිය හැකි ආර 24ක් ඇගයීමට ලක් කෙරිණි. ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම යටතේ කළුතර, කොළඹ, ගම්පහ සහ රත්නපුර දිස්ත්‍රික්ක වලදී මාස 3 ½ කෙටි රවුම් හැඩති එක් ආරක්, මාස 3 ½ සිහින් දිගටි ආර 2ක් සහ මාස 3 සහ මාස 2 ලවණතාවට ඔරොත්තු දෙන ආර 2ක් අගයන ලදි.

## වල් පැළෑටි කළමනාකරණය

නිර්දේශිත පැළෑටි නාශක ඇගයීමට ලක් කෙරුණු අතර එහිදී සියළුම වල් පැළෑටි පාලනයෙහි තයොබෙන්කාබ් ලීටරයකට ග්‍රෑම් 400ක්, ප්‍රොපනිල් ලීටරයකට ග්‍රෑම් 200ක් EC තවමත් කාර්යක්ෂම බැව් අනාවරණය වූ අතර සයික්ලෝසල්ෆැමියුරෝන් 10% WP සහ බෙන්සල්ෆ්‍යුරොන්මෙතිල් 8.25%+ මෙට්සල්ෆ්‍යුරොන් මෙතිල් 1.75% මගින් පන් වර්ග සහ පුළුල් පත්‍ර සහ ෆෙනොක්සප්‍රොප් - පී - එතිල් + එතොක්සිසල්ෆ්‍යුරොන් 69+20g/L OD සියළුම වල් පැළෑටි කාර්යක්ෂමව පාලනය කරන ලදි.

## පාංශු සාරවත්භාවය කළමනාකරණය කිරීම

පහත රට තෙත් කලාපයේ කුඹුරු ඉඩම්වල ෆොස්ෆරස් ද්‍රාව්‍යතාව ඉහළ නැංවීම සඳහා එප්පාවල රොක් ෆොස්ෆේට් (ERP) සහ ග්ලිරිසීඩියාවල විවිධ සංයෝග පරික්ෂා කර බලන ලදි. වී වගාවේදී ෆොස්ෆරස් පොහොරක් ලෙස ග්ලිරිසීඩියා සමඟ එප්පාවල රොක් ෆොස්ෆේට් යෙදිය හැකි බව ප්‍රතිඵල මගින් අනාවරණය වූ නමුත් ප්‍රතිඵල තහවුරු කර ගැනීම සඳහා තවදුරටත් පරික්ෂා කර බැලිය යුතුය.

පොහොර ඉක්මවා යෙදීම අඩු කිරීමේ පරමාර්ථයෙන් බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී පාංශු පරීක්ෂණ වැඩසටහනක් සිදු කරන ලදි. පහත දැක්වෙන පරිදි පාංශු නියැදි 561ක් ලැබුණි. පර්යේෂණ මධ්‍යස්ථාන වලින් පාංශු නියැදි 527ක් සහ ගොවීන්ගෙන් නියැදි 34ක් ලැබුණි.

## තාක්ෂණය පතුරුවාලීම

- කුඹුරු ඉඩම් වල බිම් සැකසුම සහ පොහොර යෙදීම පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 06ක් සිදු කෙරිණි.
- වී වගාවේ විවිධ අංශ සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් 188ක් සහ තෘතීය මට්ටමේ සිසුන් තුන් දෙනෙක් පුහුණු කරන ලදි.
- මධ්‍යස්ථානයේ පැවැත්වෙන මාසික සම්මන්ත්‍රණ වැඩසටහන යටතේ විවිධ විෂය කරුණු ඔස්සේ කාර්ය මණ්ඩලය

මගින් ඉදිරිපත් කිරීම් 21ක් සිදු කරන ලදි.

## පුහුණු

- G.D.S.N.චන්ද්‍රසේන මහත්මිය ආසියානු කලාපයේ සංක්‍රාමික රෝග සහ කෘමි පළිබෝධ සඳහා වසංගත විද්‍යා තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රමයක් සකස් කිරීම පිළිබඳව 2013 ඔක්.28 - නොවැ.01 දක්වා ලාඕසයේ පැවති AFACI ව්‍යාපෘති රැස්වීමට වූවාය.

## අභිජනක බීජ නිෂ්පාදනය

**වගු අංක 1.4.1.2 : 2013 වසරේදී නිපදවන ලද අභිජනක බීජ ප්‍රමාණය**

| ප්‍රභේදය | නිෂ්පාදිත ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | | | | |
|---|---|---|---|---|---|---|
| | දෛනික වැඩසටහන | | | වී ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන | | |
| | 2012/13 | 2013 යල | එකතුව | 2012/13 | 2013 යල | එකතුව |
| <u>මාස 3.5</u> | | | | | | |
| BW364 | 41.0 | 41.0 | 82.0 | 450.0 | 366.0 | 816.0 |
| BW361 | 20.5 | 20.5 | 41.0 | 389.5 | 611.0 | 1000.0 |
| BW367 | 61.5 | 82.0 | 143.5 | 703.0 | 321.0 | 1024.0 |
| BW363 | 20.5 | 20.5 | 41.0 | 195.0 | 290.0 | 485.0 |
| BW267/3 | 20.5 | 10.0 | 30.5 | 297.0 | 291.0 | 588.0 |
| <u>මාස 3</u> | | | | | | |
| BW272-66 | 20.5 | 20.5 | 41.0 | 307.0 | 210.0 | 517.0 |
| **එකතුව** | **184.5** | **194.5** | **379.0** | **2341.5** | **2089.0** | **4430.5** |

### විශේෂ ව්‍යාපෘති විස්තර - දේශීය

#### ජලයෙන් යටවීම සහ යකඩ විෂමතාවයට ඔරොත්තු දෙන වී ප්‍රභේද බිහි කිරීමේ ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම් ව්‍යාපෘතිය

පිළි මුහුම් අභිජනනය හරහා යකඩ විෂමතාවයට ඔරොත්තු දෙන අභිජනක වී ආර 29ක් නිපදවූ අතර කෘත්‍රිම ඇගයීම සහ ක්ෂේත්‍රයේ දී පරීක්ෂා කර බැලීම සිදු කෙරිණි.

පිළිමහුම් අභිජනන වැඩසටහන යටතේ ජලයෙන් යටවීමට ඔරොත්තු දෙන අභිජනන වී ආර 191ක් නිපදවූ අතර ජලයෙන් යටවීමට ඔරොත්තු දෙන ආකාරය පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා කෘත්‍රිමව පරීක්ෂා කර බලන ලදි.

### ගොවි ක්ෂේත්‍ර යටතේ පොහොර කාර්යක්ෂමව භාවිතා කිරීම සම්බන්ධයෙන් අනුවර්තන අත්හදා බැලීමේ ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම් ව්‍යාපෘතිය

ගොවි කළමනාකරණ තත්ත්වයන් යටතේ ස්ථාන 4කදී විවිධ පස් වර්ග තුනක් සම්බන්ධයෙන් නව පොහොර නිර්දේශය පරීක්ෂාවට ලක් කෙරිණි. පර්යේෂණ තත්ත්වය යටතේද මෙම නිර්දේශය බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී පරික්ෂා කරන ලදි.

## පහතරට තෙත් කලාපය සඳහා වී ඵලදායීතාවය ඉහළ නැංවීම

මෙම ව්‍යාපෘතිය මගින් BW ප්‍රභේද හයක බිත්තර වී නිපදවිය. බිත්තර වී අවශ්‍යතාව පිරිමැසීම සඳහා බිත්තර වී කි.ග්‍රෑ. 4430.5ක් (අත්තිවාරම්, ලියාපදිංචි, සහතික කළ සහ වාණිජ බීජ) නිපද වූ අතර ගුණනය කිරීම සඳහා රජයේ බීජ ගොවිපළ වලට සහ පහතරට තෙත් කලාපයේ පාර්ශවකරුවන් අතර බෙදා දෙන ලදි.

## වී පර්යේෂණ ආයතනය, ලබුදූව

ලබුදූව වී පර්යේෂණ ආයතනය රතු ඵලවරණ වී ප්‍රභේද බිහි කිරීම සහ ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපයේ පසෙහි ඉහළ ප්‍රමාණයකින් බණිජ අඩංගු කුඹුරු ඉඩම් වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අදාළ තාක්ෂණික ක්‍රම බිහි කිරීමේ වගකීම දරයි.

### ප්‍රභේද වැඩි දියුණු කිරීමේ වැඩසටහන

### අලුතෙන් නිර්දේශ කරන ලද වී ප්‍රභේද

මාස 3.5 වයස් කාණ්ඩයේ සුදු සම්බා ප්‍රභේදයක් වන Ld 371, සාමාන්‍ය වගාව සඳහා නිකුත් කරන ලදි. මෙම ප්‍රභේදයේ අස්වනු විභවය හෙ.ට. ටොන් 3-4ක් වන අතර පහතරට වියළි කලාපයේදී සහ අතරමැදි කලාපයේදී අස්වනු විභවය හෙ.ට. 1ට ටොන් 5-7ක් පමණ වේ. මෙම ප්‍රභේදය ගෙල පාළුව සහ බීජ අව පැහැ වීමට ඔරොත්තු දෙන අතර කොළ පාළුව, ගොක් මැස්සා සහ දුඹුරු පැළ කීඩෑවාට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බවක් පෙන්නුම් කරයි.

### අභිජනන වැඩසටහන

මාස 2 ½ රතු ඵලාවරණය සහිත සම්බා ආරක් වන Ld8-15-15 ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහනින් පරීක්ෂාවට ලක් කළ අතර මාස 2 ½ සුදු ඵලාවරණ වී ආර ( Ld8-15-30) ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහනින් සහ මාස 3 ½ රතු ඵලාවරණ සම්බා ආර ( Ld 8-6-7 ) මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් පරීක්ෂාවට ලක්කෙරිණි. වසර තුළදී සාර්ථකව මුහුම් 15ක් සිදු කළ අතර වැඩිදියුණු කරන ලද අභිජනක ආර 236ක් නඩත්තු කිරීමත් ඇගයීමත් සිදු කරන ලදි.

### පැළෑටි ආරක්ෂණය

අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් ලද වී ආර වලින් ආර 6ක් බැක්ටීරියා අංගමාරයට ප්‍රතිරෝධී/මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී ලෙස වරණය කර ගැනිණි. පහතරට තෙත් කලාපය සඳහා ප්‍රධාන වී පළිබෝධ පිළිබඳ පුරෝකතන මොඩලයක් සකස් කිරීම පිණිස ක්ෂේත්‍ර අත්හදා බැලීම් සම්පූර්ණ කෙරිණි.මෙම අත්හදා බැලීම අඛණ්ඩව සිදු කෙරේ.

නිර්දේශිත පැළෑටි නාශක 5ක් නැවත ඇගයීමට ලක් කළ අතර පහතරට තෙත් කලාපයේ කුඹුරුවල පුළුල් පත්‍ර සහ පන් වර්ග පාලනය කිරීමෙහිලා කාර්යක්ෂම පැළෑටි හඳුනා ගැනිණි.

### ශෂ්‍ය විද්‍යාව

ප්‍රධාන පෝෂක මනාව කලමනාකරණය කිරීම මගින් තෙත් කලාපයේ මහ කන්නයේ දී ඇතිවන කහ පැහැ වීම සහ දුඹුරු පුල්ලි හට ගැනීම අඩු කර ගත හැකිය. පොලිතින් ස්ථරයක් මතුපිට බීජ පැළ වර්ධනය කරගත් නව ක්‍රමය පැරණි බන්දේසිවල වර්ධනය කරගත් බීජ පැළ සමඟ සැසඳිය හැකි විය. තවද, පාත්ති සඳහා යොදා ගත හැකි විකල්ප ද්‍රව්‍ය ලෙස කෙසෙල් කොළ සහ අර්ධ වශයෙන් දහනය කළ දහයියා හඳුනා ගැනිණි.

**වගු අංක 1.4.1.3: 2013 වර්ෂයේදී නිපදවන ලද අභිජනක බීජ ප්‍රමාණය**

| ප්‍රභේදය | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|
| | 2012/13 මහ | 2013 යල | එකතුව |
| මාස 3.5 | | | |
| Ld 368 | 82.0 | 82.0 | 164.0 |
| Ld 365 | 41.0 | 41.0 | 82.0 |
| මාස 4 | | | |
| Ld 408 | 41.0 | 41.0 | 82.0 |
| **එකතුව** | **164.0** | **164.0** | **328.0** |

## වී පර්යේෂණ ස්ථානය - බෙන්තොට

බෙන්තොට වී පර්යේෂණ ස්ථානයේ ප්‍රධාන වගකීම වනුයේ ජල ගැල්මට ඔරොත්තු දෙන සහ ලවණතාවය සහිත ප්‍රදේශ වලට යෝග්‍ය වී ප්‍රභේද බිහි කිරීමයි.

### ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන

ජල ගැලීම් වලට ලක් වන ප්‍රදේශ වල ගොවි ජනතාව අතරේ බෙදා දීම සඳහා Bg 96 - 741 ගුණනය කරන ලදි.

ජලයෙන් යටවීමට ඔරොත්තු දීම සම්බන්ධයෙන් ප්‍රජනිත 130ක් පරික්ෂා කර බැලූ මුත් ඉන් එකක්වත් ප්‍රතිරෝධී බැව් නොපෙන්විය.

ලවණතාවය සම්බන්ධයෙන් INGER නියැදි 32ක් ක්ෂේත්‍රයේ පරික්ෂා කර බලන ලදි.

### ශෂ්‍ය විද්‍යාව

ජලයෙන් යටවන තත්ත්වය යටතේ සිදු කරන වී වගාවේදී වී බෝගය ස්ථාපිත කිරීම සඳහා ප්‍රරෝහණ වූ බීජ (කලින් ප්‍රරෝහණය කරන ලද) සාර්ථකව වැපිරිය හැකි බව අනාවරණය විය.

විදේශිය ප්‍රභේද වලට වඩා හොඳින් Bg 96 - 741 ක්‍රියාකාරි වූ බව නිරීක්ෂණය විය.

පහතරට තෙත් කලාපයේ ජල ගැලීමට ලක්වන ප්‍රදේශ වල ලවණතාව සහිත පස සඳහා යෝග්‍ය සාම්ප්‍රදායික වී ප්‍රභේද හඳුනා ගැනීම සඳහා නිරීක්ෂණාත්මක අත්හදා බැලීමක් සිදු කරන ලදි. මෙම අත්හදා බැලීම අඛණ්ඩව සිදු කෙරේ.

මාස 2 ½න් මාස 3න් සහ මාස 3 ½න් පරිණත වන වී ආර යොදා ගනිමින් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදි.

### පාංශු සාරවත්භාවය කළමනාකරණය කිරීම

2013 යල කන්නයේදී ශූන්‍ය බිම් සැකසුම යටතේ වගුරු පසේ වගා කරන වී පැළෑටිය මගින් පාංශු පෝෂක ලබා ගැනීම පිළිබඳව තක්සේරු කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කරන ලදි. වගුරු පස සඳහා ශූන්‍ය බිම් සැකසුම් හිතකර බැව් අනාවරණය වූ අතර ප්‍රතිඵල තවදුරටත් තහවුරු කර ගත යුතුව ඇත.

### කීට විද්‍යාව

පහතරට තෙත් කලාපයේ වී කොපු මයිටාවා සඳහා පුරෝකථන ක්‍රමයක් බිහි කිරීම සඳහා වූ සහයෝගි අත්හදා බැලීමක් අඛණ්ඩවම සිදු කෙරේ.

## 2014 වසර සඳහා සැලැස්ම

### පර්යේෂණ

- ජලයෙන් යටවීම සහ යකඩ විෂමතාව කෙරෙහි විශේෂ අවධාරණයක් සහිතව ප්‍රභේද වැඩිදියුණු කිරීම.
- කොළ පාළුව සම්බන්ධයෙන් ප්‍රභේද පරික්ෂා කර බැලීම.
- ප්‍රධාන වී පළිබෝධ වලට එරෙහිව පළිබෝධ නාශක වල සාර්ථකත්වය ඇගයීම.
- පහතරට තෙත් කලාපය සඳහා වී කොපු මයිටා ආසාදන වීම පිළිබඳ පුරෝකථන ක්‍රමයක් සකස් කිරීම.
- දෛනික වැඩසටහන් ලෙස ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සිදු කරනු ඇත.
- ශූන්‍ය බිම් සැකසුම් ක්‍රමය යටතේ වගුරු පස සඳහා යෝග්‍ය BW ප්‍රභේද හඳුනා ගැනීම සඳහා අධ්‍යයන සිදු කිරීම. කැඩෙන සහල් අනුපාතය ඉහළ BW ප්‍රභේද සඳහා යෝග්‍ය අස්වනු දර්ශක (harvesting indices) හඳුනා ගැනීම.
- වී වගාවේ වල් පැළෑටි කළමනාකරණය සඳහා පැළෑටි නාශක ඇගයීම.
- වී වගාවේ වල් පැළෑටි කළමනාකරණය කිරීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම ඇගයීම.
- පහතරට තෙත් කලාපය සඳහා යෝග්‍ය පොහොර කළමනාකරණ ක්‍රම බිහි කිරීම.
- අභිජනක බීජ නිෂ්පාදනය

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

### කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරි | 07 |
| ගොවිපළ කළමනාකරු (වැ.බ) | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර | 06 |
| සංවර්ධන සහකාර | 01 |
| සංවර්ධන නිලධාරි | 01 |
| පර්යේෂණ සහකාර | 12 |
| කෘෂිකර්ම උපදේශක | 07 |
| පරිපාලන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 |
| ගබඩා භාරකරු | 01 |
| රියදුරු | 03 |
| මුරකරු | 04 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| කම්කරු | 17 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| කම්කරු (කොන්ත්‍රාත් | 31 |
| කම්කරු (ව්‍යාපෘති) | 09 |
| **එකතුව** | **111** |

## වී පර්යේෂණ ස්ථානය, ලබුදුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 02 |
| කෘෂිකර්ම උපදේශක | 04 |
| පර්යේෂණ සහකාර | 05 |
| වැඩසටහන් සහකාර | 01 |
| සංවර්ධන නිලධාරි | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| රියදුරු | 02 |
| මුරකරු | 04 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| කම්කරු | 10 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 09 |
| **එකතුව** | **43** |

## වී පර්යේෂණ ස්ථානය, බෙන්තොට

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| මුරකරු | 01 |
| ගබඩා භාරකරු | 01 |
| කම්කරු | 08 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 06 |
| කම්කරු (ව්‍යාපෘති) | 02 |
| **එකතුව** | **22** |

# 1.5 ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය

චිරස්ථායි ලෙස ජාතික ඵලදායීතාවය ප්‍රවර්ධනය සහ භූමි භාවිතය උපරිම කිරීමෙහිලා ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය මහත් පරිශ්‍රමයක් දරයි. පාංශු සංරක්ෂණය සහ ජලාධාර කළමනාකරණය, ඉඩම් යෝග්‍යතාව පිළිබඳ ඇගයීම, බෝග සමීක්ෂණය සහ පුරෝකථනය, කෘෂිකාලගුණික සහ දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යයනය, ඵලදායීතාවය නංවාලීම, ගොවිපළ වාරිමාර්ග කළමනාකරණය පිළිබඳ පාංශු සහ ජලයේ තත්ත්වය අධ්‍යයනය යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ආයතන පර්යේෂණයන්හි නිරත වේ. රටතුළ කෘෂිකාලගුණික නිරීක්ෂණ ජාලයක් නඩත්තුව, පාංශු පනත ක්‍රියාත්මක කිරීම, තාක්ෂණ ව්‍යාප්තිය, අදාල විෂයයන් පිළිබඳ සේවාදායකයින්ට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම සඳහා වූ විධිවිධාන සැලසීම, විවිධ සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ පාරිසරික බලපෑම අධ්‍යයනය මෙම මධ්‍යස්ථානයට පැවරී ඇති අනෙකුත් වගකීම්ය.

## අයවැය

**වගුව 1.5.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 6,430,000 | 3,323,579 | 52 |
| පුනරාවර්තන | 3,349,970 | 3,157,913 | 94 |
| **ව්‍යාපෘති** | | | |
| පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම | 14,000,000 | 7,017,791 | 50 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය | 2,800,000 | 1,621,291 | 58 |
| CCAFS | 3,620,000 | 2,481,291 | 69 |
| AFACI - ALMSF - 1- 7 | 564,150 | 463,572 | 82 |
| AFACI - AMIS - 8 | 600,975 | 402,769 | 67 |
| පහතරට තෙත් කලාපයේ කුඹුරුවල ඵලදායීතාවය වැඩිකිරීම | 150,000 | 103,325 | 69 |
| කලාපීය මට්ටමේ බෝග යෝග්‍යතාව ඇගයීම සහ සිතියම්ගත කිරීම - ඌව පළාත | 1,183,861 | 1,181,550 | 99 |
| **එකතුව** | **32,698,956** | **19,753,081** | **60** |

## කලාපීය මට්ටමේ බෝග යෝග්‍යතා ඇගයීම සහ සිතියම්ගත කිරීම - ඌව පළාත

දිගු කාලීන විරස්ථායීබව තහවුරු කිරීම උදෙසා යෝග්‍ය භූමි උපයෝගීතාවයන් බෝග නිර්දේශයන් සහ ජල සම්පත් කළමනාකරණ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ සහ කලාපීය සහ ප්‍රදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඇතිව කලාපීය මට්ටමේ අධ්‍යයනය සිදු කරනු ලැබිණි. පාංශු ඛාදන අවදානම් සිතියම් ආදර්ශනය උදෙසා වර්ෂාපතනය, පස, භූමි බෑවුම්, භූමි භාවිතය යන භූ අවකාශමය ආදාන දත්ත උපයෝගී කරගනු බැලූ අතර මෙය Arc Map GIS මෘදුකාංගය භාවිතා කර අගයනු ලැබීය. මෙයට අමතරව ක්ෂේත්‍ර නිදර්ශනයන් සමඟ ක්ෂේත්‍ර සමීක්ෂණයන් මාර්ගයෙන් මෙම ක්ෂේත්‍ර දත්ත එකතු කරගනු ලැබිණි. මෙම තොරතුරු පදනම් කොට පාංශු ඛාදන අවදානම් අවම කිරීම සහ බෝග නිෂ්පාදනය, ඵලදායීතාවය ප්‍රවර්ධනය උදෙසා එක් එක් ගොවිජන සේවා කොට්ඨාශයන්හි බෝග යෝග්‍යතාවය සහ වගා පද්ධති හඳුනාගනු ලැබිණි.

මෙම අධ්‍යයනයන් මගින් ඌව පළාතේ 16%ක (වර්ග කිලෝමීටර් 1389)ක ප්‍රදේශයක් පාංශු ඛාදනයට ලක්වීමේ ඇඩි අවදානමක් පවතින බව හෙළිදරවූ අතර මෙම අවදානම සහිත භූමියෙන් බොහෝ ප්‍රමාණයක් (ආසන්න වශයෙන් වර්ගකිලෝමීටර් 879, 63%) බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇතිබවද පෙන්නුම් කෙරිණි. බහු වාර්ෂික, වාර්ෂික බෝග වගාකිරීමට යෝග්‍ය ප්‍රදේශ හඳුනාගැනීමට සහ ප්‍රදේශයේ පාංශු ඛාදන අවදානම අවම කිරීම පිණිස කලාපීය භූමිභාවිත නිර්දේශ සිතියම් සැකසීමට මෙම පාංශු ඛාදන පාත්‍රතා සිතියම් සහ පළාත සඳහා සකස් කළ වාර්තාව ප්‍රතිපත්ති සකස් කරන්නන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන නියෝජිතායතන වෙත බාර දෙනු ලැබිණි.

## ශ්‍රී ලංකාවේ දරුණු කාලගුණික වෙනස්වීම් සිද්ධීන් ඇතිවීම

ශ්‍රී ලංකාව, නිවර්තන මෝසම් කාලගුණික තත්ත්වයන් සහිත දිවයිනක් වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල විවිධාකාරයෙන් වර්ෂාපතනය සහ උෂ්ණත්වය වෙනස්වීම් වලට බඳුන්වෙමින් සමහර අවස්ථාවන්හිදී දරුණු කාලගුණික උපද්‍රවයන්හට යටත් වේ. වර්ෂාපතනයෙහි සහ උෂ්ණත්වයෙහි දැන් පවත්නා ක්‍රමයෙහි යම් වෙනස්වීමේ ප්‍රවනතාවයක් තිබිය හැකි ද යන්න තහවුරු කර ගැනීම උදෙසා පමණක් මෙම අධ්‍යයන අවධානය යොමු කෙරිණි. කැනඩාවේ කාලගුණික සේවාවේ කාලගුණික පර්යේෂණ අංශය මගින් නිපදවූ *RclimDex* මෘදුකාංගය උපයෝගී කොට ගෙන 1960-2007 කාලපරාසයක දිවයින පුරා විසිරී ඇති කාලගුණික මධ්‍යස්ථාන 14කින් රැස්කරගත් දෛනික වර්ෂාපතන සහ උෂ්ණත්ව දත්ත විශ්ලේෂණය කරනු ලැබිණි. මෙම උෂ්ණත්ව විශ්ලේෂණයේදී දිවා කාලයේ උපරිම උෂ්ණත්වය සහ රාත්‍රියේ අවම උෂ්ණත්වය අවස්ථා කිහිපයකදී හැර වසරකට 0.01C$^{o}$ සිට 0.03C$^{o}$ දක්වා අනුපාතයකින් ඉහළ යනබව හෙළිදරවු විණි. රටේ බොහෝ ප්‍රදේශවල ශීත දිවා කාලයන් සහ ශීත රාත්‍රී කාලයන් යන දෙකෙහිම දින සංඛ්‍යාවන් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවන බව පෙනිණි. මේ අතරම උෂ්ණ දිවා දින සහ උෂ්ණ රාත්‍රී දින සංඛ්‍යාවද වැඩිවන බව නිරීක්ෂණය කරනු ලැබිණි. මෙම සියලුම සාධකයන් මගින් ශ්‍රී ලංකාව තුළ උෂ්ණත්වය ඉහළ යාමේ ප්‍රවනතාවයක් ඇති බවට සංඥාවන් ලබා දේ. කෙසේවුවද වර්ෂාපතනය හඳුනාගැනීම උදෙසා උපයෝගී කර ගන්නා දර්ශකයන් මගින් වර්ෂාපතනය වෙනස්වීමේ ප්‍රවනතාවය උදෙසා වූ පැහැදිලි වෙනසක් නොපෙන්වයි.

## ශ්‍රී ලංකාවේ අනාගත කාලගුණ ප්‍රවනතාවන් : ගෝලීය කාලගුණි විපර්යාස මොඩලයන් {ECHM (GCM)} ගතික අවපරිමාණිකරණය මගින්

සම්පූර්ණ ශ්‍රී ලංකාවම ආවරණය කරමින් ආසන්න වශයෙන් ප්‍රතිදානය 50Km විභේදනයකට අඩු කිරීමට උදෙසා PRECISE කලාපීය කාලගුණික ආදර්ශයට [(Regional Climate Modal (RCM)] ආදානයක් ලෙස $A_2$ සහ $B_2$ සංකල්ප 2ක යටතේ ගෝලීය කාලගුණි විපර්යාස මොඩලය {ECHAM General Circulation Model (GCM)} මගින් කාලගුණික තොරතුරු උත්පාදනය කෙරේ. මෙහි පරිගණක ආකෘතියෙහි මූලික රේඛාව 1961-1990 සහ 2010-2039 (2020 s), 2040-2069 (2050 s) සහ 2070-2099 (2080 s) යන අනාගත කාල 3 සඳහා පවතින දත්තමත පදනම් වූ කල්පිතයන් මගින් සිදු කරනු ලැබිණි. සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සහ වර්ෂාපතනයෙහි ප්‍රක්ශේපිත වෙනස, පාදක රේඛාවේ කාලගුණයට අනුකූලව අනාගත කාල පරාස 3නම සඳහා සංසරණය කරනු ලැබිණි.

මෙම අධ්‍යනය මගින් $A_2$ සංකල්පය යටතේ 2080 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 2.5C$^o$ - 4.5C$^o$ මගින් ඉහළ යන බවත් හෙළිදරවු විය. මෙම ප්‍රක්ශේපන 2කම මෙම ශතවර්ෂය අවසන් වීමත් සමඟ IPCC උෂ්ණත්වය වෙනස්වීම පිළිබඳ ප්‍රක්ශේපනයන් සමඟ සමරූපී වේ. $A_2$ සංකල්පයෙහි ප්‍රක්ශේපනයන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ අනාගත වර්ෂාපතන කාලගුණය සැලකීමේදී වියළි කලාප තවදුරටත් වියළිබවට පත්වන බවත්. තෙත්කලාප තවදුරටත් තෙත්බවට පත්වන බවත් හෙළිදරවු විය. මේ අතර $B_2$ සංකල්පයට අනුකූලව කාලය ගතවීමත් සමඟ ශ්‍රී ලංකාවේ $A_2$ සංකල්පය හා සැසඳීමේදී වියළි කලාපයේ සහ මධ්‍යම කඳුකරයේ වියළි කලාපය තවදුරටත් වියළි බවට පත්වන බවත් තෙත් කලාපයට අඩු අනුපාතයක් යටතේ තවදුරටත් තෙත් ස්වභාවයට පත්වන බවත් හෙළිදරවු විය.

## ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ අධි තීව්‍ර වර්ෂාපතන නැඹුරුව වාසිදායක වේද?

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ඉහළ ධනාත්මක වර්ෂපතන විෂමතාවයන් පවතින බව විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵල මගින් හෙළිදරවු විය. මධ්‍යම කඳුකරයේ ස්ථාන 4ක ස්ථාපිත කර ඇති වර්ෂාමාපක 8ක 1961-2010 දක්වා කාලපරාසය තුළ දෛනික වර්ෂාපතන දත්ත මෙම අධ්‍යනයන් සඳහා උපයෝගී කරගනු ලැබීය. ඉහළ සහ ඉතාමත් ඉහළ වර්ෂතතන මට්ටම තීරණය කිරීමට 1961-1990 දක්වා එක් එක් වර්ෂමාපක ස්ථානයන්හි දෛනික වර්ෂාපතන වේලා ශ්‍රේණියෙහි 95 සහ 99වෙනි ප්‍රතිශත අගයන් පැවතිය යුතු අවම අගය ලෙස භාවිත කරනු ලැබිණි. 1991 සිට 2010 දක්වා වූ පසුගිය දශක 2ක කාලය තුළදී මධ්‍යම කඳුකරයේ තද වැසි සහ ඉතාමත් තද වැසි වල පැහැදිලි වෙනසක් ඇති වී නොමැතිබව මෙම විශ්ලේෂණයන් මගින් පෙන්නුම් කෙරේ. කෙසේවුවද 2006-2010 අතර ඉතා මෑත වසර 5ක කාලය තුළ මෙම වැසි තත්ත්වයන්ගේ පැහැදිලි වැඩිවීමක් පෙන්නුම් කරන බව මෙම විශ්ලේෂණයන්ගෙන් දක්නට ලැබිණි. විශේෂයෙන්ම පළමු අන්තර් මෝසම් වැසි තත්ත්වයන්හිදී මෙය දක්නට ලැබේ. කෙසේවුවද මධ්‍යම කඳුකරයේ වර්ෂාපතන විෂමතාවයන්, පැහැදිලි ලෙසම ඉහළ යාමේ තත්ත්වයක් පෙන්නුම් නොකරන තත්වයක් යටතේ මානව ක්‍රියාවන්, භූමි භාවිත වෙනස්කම් සහ භූමි කළමනාකරණ පිළිවෙත්හි වෙනස්කම් වැනි වෙනත් සාධක හේතුකොට අනාගතයේදී මධ්‍යම

කඳුකරයේ භූමි භායනය උග්‍ර තත්ත්වය පත් නොවනබව තීරණය කිරීම බුද්ධිමත් කාරණයක් නොවේ.

## අධි විභේදන චන්ද්‍රිකා ඡායාරූප පදනම්ව කුඹුරු හා අස්වැන්න පිළිබඳ අනාවැකි පැවසීම

ජාතික කෘෂි පර්යේෂණ වැඩසටහන අරමුදල් ප්‍රතිපාදිත මෙම පර්යේෂණ ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ සහල් වගා භූමි ප්‍රමාණය සහ සහල් නිෂ්පාදනය සඳහා නියමිත කාලවලදී ජාතික අනාවැකි පද්ධතියක් වැඩිදියුණු කිරීමේ අරමුණු ඇතිව ආරම්භ කෙරිණි. මෙහිදී කුඹුරු ඉඩම්හි මායිම් සලකුණු කිරීම උදෙසා භූදර්ශන තොරතුරු පද්ධතිය (GIS) හිදී අධි සහ සාමාන්‍ය විභේදන චන්ද්‍රිකා ඡායාරූප පරීක්ෂා කෙරිණි.

එක් එක් කන්නයේදී සහල් වගා කරන භූමි හඳුනාගැනීම සහ මායිම් සළකුණු කිරීම උදෙසා කඩිනම් ඇගයීම් ප්‍රවේශයක් වැඩිදියුණු කිරීම සහ කුඹුරු ඉඩම් හි ඩිජිටල් සිතියම් සැකසීම, සහල් වගාකරන භූමිහි සහල් මට්ටම ප්‍රමාණාත්මකගත කිරීම උදෙසා ප්‍රවේශයක් වැඩිදියුණු කිරීම. අනාවැකිගත කළ අස්වනු මට්ටම් පෙන්නුම් කරමින් කලාපීය සිතියම් සැකසීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. අධි විභේද චන්ද්‍රිකා ඡායාරූප සමඟ තිර ඩිජිටල්ගත කිරීම උපයෝගී කර ගැනීම මගින් අම්පාර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි සහල් වගා භූමි සිතියම් යාවත්කාලීන කෙරිණි. හම්බන්තොට, අනුරාධපුර, කුරුණෑගල සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි සහල් වගා භූමි යාවත්කාලීන කිරීම සිදු කෙරෙමින් පවතී. පරීක්ෂණ අඛණ්ඩව සිදු කෙරෙන අතර තවදුරටත් ඇගයීම සහ ක්ෂේත්‍ර සත්‍යොක්ෂණය සිදු කෙරෙමින් පවතී.

## ශ්‍රී ලංකාව සඳහා කාලපීය බෝග අස්වනු අනාවැකි සහ කාලගුණික වෙනස්වීම් බලපෑම ඇගයීම් සඳහා මෙවලම් කට්ටලයක් වැඩිදියුණුව ඇගයීම සහ උපයෝගී කරගැනීම

IWML හරහා දකුණු ආසියාවේ කෘෂිකර්මාන්ත කාලගුණ වෙනස්වීම් සහ ආහාර සුරක්ෂිතබව පිළිබඳ වැඩසටහන මගින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලැබේ. ස්වභාවික සහ වෙනස්වන තත්ත්වයන් යටතේ බෝගවල තත්ත්වය සමීක්ෂණය සහ අනාවැකි පැවසීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ. CRAFT යනු සාමාන්‍ය සහ වෙනස්වන කාලගුණික තත්ත්වයන් යන දෙකම යටතේ Sub - Pixel මට්ටමේදී බෝගවල තත්ත්වය සමීක්ෂණ සහ අනාවැකි පැවසීමට හැකියාව ඇති මෘදුකාංගයකි.

බොහෝ පාංශු සහ පැළෑටි දත්ත එකතු කරනු ලැබ භාවිතයට පහසුවන ආකාරයට ඒවා සකස් කරනු ලැබිණි. මූලික අධ්‍යනය දිස්ත්‍රික්කයන් සඳහා (අම්පාර සහ පොළොන්නරුව) කාලගුණික දත්ත පසුගිය වසර 10 සඳහා දෛනික පදනමෙන් සම්පාදනය කරනු ලැබිණි. අම්පාර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි ප්‍රධාන වී වගා කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් පැළ පිළිබඳ දත්ත ලබා ගනු ලැබිණි. මෙම එකතු කරන ලද දත්ත CRAFT මෘදුකාංග ආකෘතියට අනුරූපවන පරිදි වූ ආකෘතියට සැකසීම ආරම්භ කරනු ලැබිණි. පළාත් 9, දිස්ත්‍රික්ක 25, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 325 යන විවිධ පරිපාලන මායිම් සඳහා Shape file ආකෘතියට වැඩිදියුණු කෙරිණි. CRAFT මෙවලම් මෘදුකාංගය (Draft version) පරිගණකයට ලබාදීමේ කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි විය. CRAFT මෘදුකාංගයේ නව සංස්කරණය නිකුත් කර ඇති අතර පරිගණකයට ඇතුල් කිරීම සඳහා වූ මූලික

කාර්යයන් සහ දත්ත පූර්ව සැකසුම ආරම්භ කර ඇත.

## තිරසාර භූමි කළමනාකරණය සඳහා භූමි හායන ඇගයීම

වියළි පරිසර පද්ධති, ජලධාරා සහ ගංගා ද්‍රෝණි හි භූමිහායන ස්වභාවය, ප්‍රමාණය, තීව්‍රතාවය සහ බලපෑම ඇගයීම සහ මානය කිරීම උදෙසා උපකරණ සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීමට 2012 වර්ෂයේදී දකුණු ආසියාවේ තිරසාර භූමි කළමනාකරණ සහ කාලගුණික වෙනස්වීම් අනුවර්තනය පිළිබඳ භූමි හායන ඇගයීම සහ සමීක්ෂණ සම්බන්ධ කලාපීය ව්‍යාපෘතිය ආරම්භ කෙරිණි. මෙම ව්‍යාපෘතිය FAC මගින් අරමුදල් ප්‍රතිපාදන සපයනු ලබන අතර බංගලාදේශය, භූතානය, නේපාලය සහ ශ්‍රී ලංකාව යන ව්‍යාපෘති රටවල් 4හි තාක්ෂණික කණ්ඩායම් වලින් සමන්විත වේ.

සම්මත භූමිහායන ක්‍රමවේදය සහ භූමි භාවිත ක්‍රම (LUS) පදනම් සිතියම් ගත කිරීමේ ප්‍රවේශය සහ විශේෂයෙන් සැලසුම් කළ "LADA-QM" මෘදුකාංගය වඩාත් පුළුල් පරිමාණයෙන් සහ දේශීය වශයෙන් කේන්ද්‍ර වූ ඇලමාර්ග සඳහා සාර්ථකව පරීක්ෂා කරනු ලැබිණි. අදාළ සියලුම ක්ෂේත්‍රයන් ආවරණය කරමින් ජාතික භූමි හායන විශේෂඥ කණ්ඩායම සකස් කරනු ලැබිණි. භූමි හායන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් "LADA/WOCAT ප්‍රශ්ණාවලි සමීක්ෂණ අත්පොත" භාවිතය පිළිබඳ මෙම විශේෂඥ කණ්ඩායම පුහුණු කරනු ලැබිණි.

භූමි භාවිතය පිළිබඳ ජාතික දත්ත වගුව භූමි භාවිත වර්ගකිරීම් 35කින් සමන්විත වේ. (මිනුම්දෝරු දෙපාර්තමේන්තුව) කෙසේවුවද, භූමිහායන ඇගයුම් කටයුතු උදෙසා එම භූමි කළමනාකරණ පිළිවෙත් පදනම් කොට මෙම සමහර භූමි රේඛා එකතු කිරීම මගින් භූමි භාවිත ක්‍රම 18ක් හඳුනා ගනු ලැබිණි. මෙම භූමි භාවිත ක්‍රම පදනම් කොට මුළු ශ්‍රී ලංකාවම සඳහා මෙම සිතියම්ගත කිරීමේ ඒකක 18 උපයෝගීකරමින් සිතියම් සකස් කරනු ලැබූ අතර මෙම සිතියම් පාදක සිතියම් ලෙස උපයෝගී කරගනු ලබයි.

## විවිධ බෝග සඳහා බෝග ජල අවශ්‍යතාවය සහ ජල භාවිත කාර්යක්ෂමතාවය පිළිබඳ තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම

විවිධ කෘෂි පාරිසරික කලාපවල වාරිමාර්ග පද්ධතීන් සහ සීමිත ජල සම්පත් සහිත ප්‍රදේශවල ඵලදායී වාරිමාර්ග සැලසුම් උදෙසා බෝග ජල අවශ්‍යතාව පදනම් කොට සහ ජල භාවිතය මත එම බෝගවල ඵලදායීතාවය ඇගයීම බෝග වරණය සඳහා පූර්ව අවශ්‍යතාවයකි. වී, ක්ෂේත්‍ර බෝග, එළවළු බෝග සහ පලතුරු බෝග වගාව සඳහා බෝග ජල අවශ්‍යතාවය සහ ජල භාවිත කාර්යක්ෂමතාව අගයනු ලැබීය. මෙයට අමතරව, විවිධ බෝග සඳහා බෝග ජල අවශ්‍යතාවය සහ ජල භාවිත කාර්යක්ෂමතාව පිළිබඳ දත්ත වගුවක් වැඩිදියුණු කරනු ලැබිණි.

වී වල ජල අවශ්‍යතාවය විශ්ලේෂණයේදී විවිධ භූමි වර්ගවල කුමන වයසක පැළ පැවතියද යල කන්නයේදී වගාවේදී ඉහළ ජල වාෂ්පීකරණයක් සහ වැස්සුම් ජල හානියක් සිදුවන බව පෙන්නුම් කෙරිණි. යල කන්නයේදී සාමාන්‍ය ජලවාෂ්පීකරණය සැසඳූ විට මහ කන්නයට සාපේක්ෂව 30-40% අතර ප්‍රමාණයකින් ඉහළ බව පෙන්නුම් කෙරිණි. බෝග ජල භාවිත කාර්යක්ෂමතාව විශ්ලේෂණයේදී මාස 2.5 සිට 3.5 අතර කාලපරාසයක සහිත ප්‍රභේදයන්හි ජල භාවිත කාර්යක්ෂමතාවය ඉහළ බව හඳුනා ගැනිණි. මාස 3.5කට වඩා වැඩි වී ප්‍රභේදයන්හි විවිධ භූමි වර්ගයන්හි ජල භාවිත කාර්යක්ෂමතාවය අඩුවීමේ ප්‍රවනතාවයක් පවතින බව දක්නට ලැබිණි. මහ සහ යල කන්නවලදී

වාරිමාර්ග තත්ත්වයන් යටතේ වියලි සහ අතරමැදි කලාපයන්හි ජල බැසයාම දුර්වල පසෙහි වැඩි දියුණු කළ වී ප්‍රභේදයන් අතුරෙන් මාස 3 ප්‍රභේද මහ සහ යල කන්නයේදී $2.06 Kgm^{-3}ha$ සහ$1.48 Kgm^{-3}ha$ ලෙස වැඩිම බෝග ජල භාවිත කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කෙරිණි.

විවිධ වයස් කාණ්ඩයන්හි හි සාමාන්‍ය අස්වැන්න විශ්ලේෂණයේදී මාස 4 දක්වා වයස්වල අස්වැන්න වැඩිවීමේ ප්‍රවනතාවයක් පවතින බව පෙන්නුම් කෙරේ. මෙය මාස 2.5 ප්‍රභේදයන් හා සැසදීමේදී ආසන්න වශයෙන් 40%ක වැඩිවීමකි. මාස 4ට වැඩි වී ප්‍රභේද වගා කිරීමේදී සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණය අඩුවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කෙරේ. මාස 5.0 - 6.0 වයස් ප්‍රභේද මාස 4 දක්වා වූ කාල පරාස හා සැසදීමේදී සාමාන්‍ය අස්වැන්න අඩුවීමේ ප්‍රතිශතය 30-40% අතර ප්‍රමාණයකි.

## පහතරට තෙත් කලාපයේ වී සඳහා භූමි විශේෂිත පොහොර නිර්දේශයන් වැඩිදියුණු කිරීම

විවිධ භූමි වර්ගයන්හි පසෙහි රසායනික ලක්ෂණ ලක්ෂණීකරණය සහ එම රසායනික ලක්ෂණයන් සලකා බලමින් පොහොර නිර්දේශයන් වැඩිදියුණු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. විවිධ භූමිවර්ගවලින් රුස්කරගත් පාංශු සාම්පල ඇතුළුව මූලික සිතියම් සහ භූමි වර්ග පදනම් කොට ගම්පහ, කොළඹ සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි පාංශු සමීක්ෂණ පවත්වනු ලැබිණි. මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ ආරම්භ කරනු ලැබූ අතර 2014 වර්ෂය දක්වා මෙය අඛණ්ඩව සිදු කරනු ලැබේ. මෙම පරීක්ෂණයන් මගින් පළමු පෙළ නිම්නයන්හි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය 5-11.1% දක්වා අතර ප්‍රමාණයන්ගෙන් සමන්විත බව බවත් හුවමාරු කරගත හැකි පොටෑසියම් මට්ටම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙවැනි භූමි වර්ග සඳහා පොටෑසියම් අඩංගු පොහොර වැඩිපුර අවශ්‍ය බවත් පෙන්නුම් කෙරිණි. පිරුණු කළපුවල පස ලවණතාවයන් හේතුවෙන් බලපෑම් ඇතිවන අතර සාමාන්‍ය විද්‍යුත් සන්නායකතාවය 0.9ds/m ප්‍රමාණයක විය. වියලි කලාපයේ යාය ප්‍රවේශය හා සැසඳීමේදී තෙත් කලාපයට භූමි වර්ගය පදනම් බෝග නිර්දේශයන් වඩාත් උචිත බව අධ්‍යනයන් මගින් පෙන්නුම් කෙරිණි.

## සමස්ථානික ක්‍රමවේදය උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය උදෙසා භාවිත කරන භූමිවල පාංශු ඛාදන තත්ත්වය ඇගයීම

මධ්‍යම කඳුකරයේ ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය උදෙසා භාවිත කරන භූමිවල පාංශු ඛාදන ප්‍රමාණය ඇගයීම සහ භූමි භාවිත මට්ටමේදී සංරක්ෂණ මාර්ගෝපදේශයන් ලබාදීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා දොලොස්බාගේ සහ හීල්පන්කඳුර යන තෝරාගත් ස්ථාන දෙකෙහි පාංශු ඛාදන ඇගයීම් සිදුකරනු ලැබිණි. මෙම පරීක්ෂණය 2012 වර්ෂයේ ආරම්භ කරනු ලැබූ අතර 2015 දක්වා අඛණ්ඩව සිදු කරනු ලබයි. මෙම අධ්‍යනයන් මගින් මධ්‍යම කඳුකරයේ තේ වගා පසෙහි පසුගිය වසර 100 තුළ සාමාන්‍ය පාංශු ඛාදන අනුපාතය ට/හෙ/වො 1.12 සිට ට/හෙ/වො 29.29 දක්වා පරාසයක් වන බව පෙනිණි. ප්‍රදේශයේ භූමි ලක්ෂණ සලකා බලමින් පාංශු ඛාදනය වැලක්වීම උදෙසා උචිත ස්ථානීය විශේෂිත පාංශු ඛාදන වැලැක්වීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පැන නැගිණි.

## ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ප්‍රධාන ඇලමාර්ගවල ජලයේ ගුණාත්මකබව සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ බොහෝ ගංගා මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වන අතර මෙම ජලයේ ගුණාත්මකබව ගංගා ආශ්‍රිත ඉහළ භූමිවල භූමි භාවිතය මත බලපායි. උඩරට ප්‍රදේශයෙන් ආරම්භ වන මෙම ඇල මාර්ගවල ජල දූෂණය උදෙසා මධ්‍යම පළාතේ විවිධ භූමි භාවිතයන්ගේ බලපෑම ඇගයීම මෙම පර්යේෂණයෙහි අරමුණ වේ. මේ සඳහා ජලයේ ගුණාත්මකබව පිළිබඳ සමීක්ෂණයක් සිදු කරනු ලැබිණි. මෙම පරීක්ෂණය 2012 වර්ෂයේ ආරම්භ කරනු ලැබූ අතර 2014 වර්ෂය දක්වා අඛණ්ඩව පවත්වනු ලබයි.

මෙම අධ්‍යයනය කළ ඇලමාර්ග 40 අතුරෙන් වැඩිම බොර ස්වභාවයක් (99.99 NTU) උමා ඔයෙන් වාර්තා විණි. වැඩිම විද්‍යුත් සන්නායකතාවය (0.390 ds/m) කිවුල්ලින්ද ඔයෙන් වාර්තා විණි. තලාතුඔය Ca/Na අනුපාතය වැඩිම වූ අතර (1.30) K/Na අනුපාතය වැඩිම අගයක් (0.61) උමා ඔය හි පෙන්නුම් කෙරිණි. මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුමෙහි ආරම්භ වන කැළණි, කළු සහ වළවේ යන ගංගාවල සාපේක්ෂව තරමක ගුණාත්මක බවෙන් ඉහළ තත්ත්වයේ ජලය දක්නට ලැබේ. මෙයට සාපේක්ෂ නැගෙනහිර බෑවුමෙහි පිහිටි ඇල මාර්ග එනම් මාරස්සන ඔය, කිවුල් ලිඳ ඇල, උමා ඔය හි අඩු ගුණාත්මක බවකින් යුත් ජලය දක්නට ලැබේ.

## කෘෂි ළිං පදනම් ගොවිතැන සඳහා භූමි කළමනාකරණ උපදේශක මාලාවක් වැඩිදියුණු කිරීම

උඩරට වර්ෂාපෝෂිත කෘෂි ළිං පදනම් කුඩා පරිමාණ ගොවිපළ පූර්ණ වශයෙන් භූමි කළමනාකරණ තාක්ෂණයන් අනුගමනය නොකෙරේ. එමනිසා වාරි කාර්යක්ෂමබව සහ පාංශු සාරවත්බව වැඩිකිරීම උදෙසා භූමි කළමනාකරණ තාක්ෂණයන් වැඩිදියුණු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. 2013 වර්ෂයේදී මූලික අධ්‍යයනයක් සිදු කරනු ලැබූ අතර මෙම ක්‍රමයේ ගොවිතැනෙහිදී කාබනික පොහොර භාවිතය සතුටුදායක මට්ටමෙන් නොමැතිබව මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරිණි. එමනිසා මෙම කෘෂි ළිං පදනම් කෘෂි කාර්මාන්තය සිදු කරන ප්‍රදේශවල කාබනික පොහොර භාවිතය දිරිමත් කරනු ලැබිය යුතුය. තවද ජල උස්සාන උපකරණ තේරීමේදී විද්‍යාත්මක මාර්ගෝපදේශයක් අනුගමනය නොකරයි. එමනිසා උචිත ජල උස්සාන උපකරණ තෝරාගැනීම සහ හඳුන්වාදීම උදෙසා ක්‍රමවේදයක් වැඩිදියුණු කළ යුතුය.

## වියළි කලාපයේ වර්ෂාපෝෂිත උඩරට සඳහා බහුකාර්ය පාංශු සංරක්ෂණ බැමි වැඩිදියුණු කිරීම

විශේෂයෙන්ම මිරිස් සහ බඩඉරිඟු වැනි මුදල් බෝග වගාව ජනප්‍රියවීමත් සමඟ රටේ වර්ෂාපෝෂිත ගොවිතැනෙහි සැලකිය යුතු වෙනස්කම් සිදු වේ. වර්ෂාපෝෂිත උඩරට ගොවිතැනෙහිදී ගොවිපල යන්ත්‍රෝපකරණ භාවිතය වඩාත් ජනප්‍රිය වූ අතර ප්‍රායෝගික අපහසුතාවයන් හේතුවෙන් පරිසරයත් සමඟ බෙහෙවින් බැඳී පවත්නා වර්තමානයේ නිර්දේශිත සමෝච්ච පාංශු සංරක්ෂණ ව්‍යුහ පාංශු සංරක්ෂණ ක්‍රමවේදයන් සඳහා ගොවීහු අනුගමනය නොකරති. අනෙක් අතට විවිධ හේතූන් නිසා මෙම පස් බැමි වගා භූමියේ තැබීමට ඔවුන් එතරම් කැමැත්තක් නොදක්වයි. සාමාන්‍යයෙන් නිර්දේශිත පංශු බැමි වලට වඩා උසින් වැඩි වඩාත් පුළුල් පරතරයකින් ස්ථිර ශාක සමඟ වූ ස්ථිර පාංශු බැමි පද්ධතීන්හි බලපෑම අධ්‍යයනය කිරීමට අධ්‍යයනයක් සිදු කරනු ලැබිණි. තවද මෙම පුළුල් බැමි ආර්ථික වශයෙන් වාසිදායක තත්ත්වයකින් යුත්

ව්‍යුහයකි. එම නිසා මෙම බැම්මත ආර්ථිකම වැදගත් උචිත බෝග වගා කරනු ලැබිණි. මෙහිදි කතුරු මුරුංගා, මිටි මුරුංගා, කුරුඳු, දෙළුම්, තිබ්බටු, සේර වැනි බෝග වගා කෙරිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස කතුරු මුරුංගා, මිටි මුරුංගා සහ තිබ්බටු ශාක වර්ධනය සහ බෝග අස්වැන්න අතින් වඩාත් හොඳ ප්‍රතිඵල ලැබිණි. එමනිසා ගොවි ක්ෂේත්‍රවල නියමු මට්ටමෙන් බහුකාර්යය පාංශු සංරක්ෂණ බැම් මත වගාව සඳහා ඉහත බෝග උපයෝගී කර ගත හැකි බව පෙන්වා දෙයි.

## වියළි කලාපයේ කුඩා ජලාශ පද්ධතීන්හි වර්තමාන පාංශු ලවණතාවය සහ පාංශු ලවණතාවයට බලපාන හේතු

ශ්‍රී ලංකාවේ වයඹ වියලි කලාපයෙහි කුඩා වාරිමාර්ග පද්ධතීන් ප්‍රධාන වශයෙන් පවත්නා ප්‍රදේශවල පාංශු ලවණතාවය ප්‍රධාන පාරිසරික ගැටළුවකි. අධික පාංශු ලවණතාවය වී අස්වැන්නට රිනාත්මක බලපෑමක් එල්ල කරන අතර මේ හේතුවෙන් කුඩා වාරිමාර්ග තත්ත්වයන් යටතේ ගොවි ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය දුර්වල කරයි. මුල් කලාප ගැඹුරු මට්ටමේදී පාංශු ලවණතාවයෙහි අවකාශමය ව්‍යාප්තිය සොයා බැලීම පිණිස කුරුණෑගල තඹුත්ත ගොවිජන සේවා ප්‍රදේශයේ සියඹලාගම වැව හි මෙම අධ්‍යනය සිදු කරනු ලැබිණි. ලවණතාවය බලපෑ වී වගා පසෙහි සමීක්ෂණය සහ සිතියම් ගත කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ උපයෝගී කරගන්නා EM 38 යොදා ගනිමින් ස්ථානීය විද්‍යුත් සන්නායකතාව මනිනු ලැබිණි. 12.5m x 12.5m කොටු ජාලය උපයෝගී කරගනිමින් පිළිවෙලින් 0 - 37.5cm, 0 - 75cm යන ගැඹුරු 2 හිදී විද්‍යුත් සන්නායකතාවය මනිනු ලැබිණි. වාරිමාර්ග තත්ත්වයන් යටතේ වී වගා කළ ගොවීන්, ඓතිහාසික, සමාජ - ආර්ථික සහ අස්වැන්න පිළිබඳ දත්ත ලබා ගැනීම උදෙසා සම්මුක සාකච්ඡාවන්ට ලක් කෙරිණි.

මෙම අධ්‍යයනයන් මගින් ප්‍රධාන වශයෙන් කුඩා ජලාශ සහිත ප්‍රදේශයන්හි පාංශු විද්‍යුත් සන්නායකතාව අගයන් 1.00 ds/m - 5.46 ds/m දක්වා අතර පරාසයක පවතින බව සොයා ගැනිණි. මෙම ප්‍රදේශයේ මධ්‍ය කොටසෙහි සාපේක්ෂව ඉහළ ලවණතා මට්ටමක් දක්නට ලැබෙන අතර මෙම ප්‍රදේශය ආරම්භ වන අවසන් වන කොටසෙහි ලවණතාවය සාපේක්ෂව අඩු අගයක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුවද මෙම භූමි ප්‍රදේශයෙන් 6% ක ප්‍රමාණයක් පමණක් ලවණතාවය හේතුවෙන් බලපෑම් ඇතිවන බව සොයා ගැනිණි. අනෙකුත් ප්‍රදේශයන්හි පසෙහි විද්‍යුත් සන්නායකතාවය 2 ds/m ට වඩා අඩු අගයක් දක්නට ලැබූ අතර මෙම ප්‍රමාණය වී වගාව සඳහා දරාගත හැකි මට්ටමකි. මෙම ප්‍රදේශයේ ජල ප්‍රවාහන පද්ධතිය ඉතාමත් දුර්වල තත්ත්වයක පවතින අතර බැසයන ජලය, අවසන් කොටසෙහි කුඹුරු ඉඩම් සඳහා ජලය ලබාදීමට නැවත උපයෝගී කරගනු ලබයි. ගොවීන් අස්වැන්න අඩුබවට පැමිණිලි කළද එය පසෙහි ලවණතාවය හේතුවෙන් ඇති වූවක් නොවන අතර වෙනත් සාධක මෙම අස්වැන්න අඩුවීම උදෙසා බලපෑ හැක. එනම් පසෙහි සරුබව අඩුවීම, වාරි ජලය ප්‍රමාණවත් නොවීම මේ සඳහා හේතු විය හැක.

## වවුනියාව දිස්ත්‍රික්කයේ නොගැඹුරු භූ ජලයෙහි ගුණාත්මකබව අධ්‍යයනය

නොගැඹුරු භූ ජලයෙහි ගුණාත්මකබව සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ලැබීමට මෙම අධ්‍යනය සැලසුම් කෙරිණි. විශේෂයෙන් වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පසෙහි ආම්ලිකතාවය පරීක්ෂා කෙරිණි. මෙහි පළමු පියවර වශයෙන් වවුනියාව ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාශයේ නෙලුම්කුලම ග්‍රාම නිලධාරි වසමෙහි භූගත ජලයෙහි ගුණාත්මකබව පරීක්ෂා කෙරිණි. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බොහෝ ගොවීන් සඳහා කෘෂි ළිං වඩාත් අගයැති සම්පතකි. මෙයට හේතුව වන්නේ බෝග අස්වැන්න ස්ථායී කිරීම සහ පෝෂණය කිරීමේ ඉතා හොඳ හැකියාවක් මෙම ජලය සතුවීමයි. මෙම අධ්‍යයනය වවුනියාව දිස්ත්‍රික්කයේ පලමායික්කුල් ග්‍රාමයේ වාරි ජලය සඳහා භූගත ජලයෙහි යෝග්‍යතාව ඇගයීමට සිදු කරනු ලැබිණි. මෙම අධ්‍යනය උදෙසා සම්පූර්ණ වශයෙන් ළිං 71ක් තෝරාගනු ලැබූ අතර මෙම සෑම ළිඳකම ප්‍රධාන ගුණාත්මක පරාමිතීන් වශයෙන් විද්‍යුත් සන්නායකතාවය සහ PH අගය මනිනු ලැබිණි. විශේෂයෙන්ම තෝරාගත් කෘෂි ළිං 15ක සම්පූර්ණ ද්‍රාව්‍යය ඝන අංශු [Total Dissolved Solide (TDS)], භාෂ්මිකතාව, සෝඩියම් ($Na^+$), මැග්නීසියම් ($Mg^{2+}$), කැල්සියම් ($Ca^{2+}$), නයිට්‍රේට් නයිට්‍රජන් ($NO_3$,N), පොටෑසියම් ($K^+$) සහ සම්පූර්ණ දැඩිබව විශ්ලේෂණ කරනු ලැබිණි. මෙම කෘෂි ළිං පිළිවෙළින් 41%ක් ගැඹුරු 4-6 m අතර ප්‍රමාණයක වූ අතර 42%ක් 6-8 m අතර ප්‍රමාණයක විය. අනෙකුත් ළිංවල ගැඹුර 8 m ට වැඩි විය. මෙම ළිං වලින් 31%ක වියළි කාලය අවසානයේදී (සැප්තැම්බර් මස අග) මීටර් 2කට වඩා වැඩි ගැඹුරකට ජලය දක්නට ලැබිණි. එමගින් මෙම ප්‍රදේශය ඉහළ භූගත ජල ප්‍රමාණයක් සහිත බව හඳුනා ගැනිණි. මෙම ප්‍රතිඵල වාරිජල ගුණාත්මකබව සම්බන්ධයෙන් වූ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රමිතීන්ට අනුකූලව සසඳනු ලැබ කෘෂි ළිං ඒ අනුව වර්ගීකරණය කරනු ලැබිණි. මෙම ළිං ජලයෙහි සාමාන්‍ය PH අගය 7.1 – 9.15 අතර පරාසයක වූ අතර මෙම ළිං 75%ක්ම වාරිජලය ලබාගැනීම උදෙසා යෝග්‍ය විය. මෙම ළිං වලින් 8%ක් විද්‍යුත් සන්නායකතාවය 0.7ds/m කට වඩා අඩු අගයක් වූ අතර මෙය වාරිජලය සඳහා යෝග්‍ය වේ. මෙම ළිංවලින් 76%ක ජලයේ විද්‍යුත් සන්නායකතාව 0.7-3ds/m අතර අගයක් වූ අතර මෙය වී වගාව සඳහා සාමාන්‍ය යෝග්‍යතාවයක් පෙන්නුම් කෙරිණි. 16% ක ළිං වී වගාව සඳහා ජලය ලබා ගැනීමට යෝග්‍ය නොවිණි. (විද්‍යුත් සන්නායකතාව 0.4 - 6 ds/m) මෙයින් එක් ළිඳක පමණක් සම්පූර්ණ ද්‍රාව්‍ය ඝන (TDS) ප්‍රමාණය 450 mg/l දක්නට ලැබිණි. අනෙකුත් සියලුම ළිං සම්පූර්ණ ද්‍රාව්‍ය ඝන (TDS) 450-2000 mg/l අතර ප්‍රමාණයක පැවතීම හේතුවෙන් ජලය ලබාගැනීමට සාමාන්‍ය යෝග්‍යතාවයක් පෙන්නුම් කෙරිණි. මෙම ළිං වලින් 80%ක්ම භාෂ්මිකතාව 160-500 mg/l ප්‍රමාණයක වූ අතර මේ හේතුවෙන් බොහෝ ළිං වාරි ජලය ලබා ගැනීමට යෝග්‍ය වූ අතර අනුමත මට්ටමෙන් පැවතිණි. ($NO_3^-$,N) සහ සෝඩියම් අනුව සියලුම ළිං වාරි ජලය ලබා ගැනීමට යෝග්‍ය වූ අතර එක් ළිඳක හැරෙන්නට අනෙක් ළිංවල කිවුල් වාරි ජලය දක්නට ලැබිණි.

## තාක්ෂණ ව්‍යාප්තිය

### පාංශු හා ජල සංරක්ෂණය, භූමි සංවර්ධනය සහ ඒ හා සම්බන්ධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුව

- දින 5 වැඩසටහන
  - සලකුණු කරන ලද පාංශු සංරක්ෂණ ප්‍රදේශයේ නිලධාරීන් 39දෙනකු පාංශු සංරක්ෂණය, භූමි සංවර්ධනය සහ පාංශු සංරක්ෂණ පනත පිළිබඳව පුහුණු කරනු ලැබිණි.
- දින 3 වැඩසටහන
  - උතුරු පළාතේ, රත්නපුර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි නිලධාරීන් සඳහා වැඩසටහන් 7ක් පවත්වනු ලැබිණි. පාංශු සංරක්ෂණය, භූමි සංවර්ධනය සහ පාංශු සංරක්ෂණ

පනත පිළිබඳ නිලධාරීන් 250 දෙනෙකු පුහුණු කරනු ලැබිණි.

- දින 2 වැඩසටහන
    - පාංශු සමීක්ෂණ, පාංශු සාරවත්බව කළමනාකරණය සහ ගොවිපල කළමනාකරණය පිළිබඳව පුහුණු වැඩසටහනක් SGS ලංකා (පෞද්) සමාගමේ නිලධාරීන් හට පවත්වනු ලැබිණි. සහභාගී වූ සංඛ්‍යාව - 07
    - නවයාලතැන්න දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේදී ජාතික වෘත්තීය පුහුණු ශිෂ්‍යයින් සඳහා "පාංශු සහ ජල සංරක්ෂණ සැලසුම් සැකසීම" පිළිබඳ එක් වැඩසටහනක් පවත්වනු ලැබිණි.
- එක් දින වැඩසටහන්
    - දිස්ත්‍රික් ලේකම්වරුන් සහ මහනුවර, නුවරඑළිය, බදුල්ල, රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරීන් උදෙසා පාංශු සංරක්ෂණය සහ පාංශු සංරක්ෂණ පනත පිළිබඳ දැනුවත් කිරීම උදෙසා වැඩසටහනක් පවත්වනු ලැබිණි. සහභාගී වූ සංඛ්‍යාව- 65
    - ලංකා දුම්කොළ සමාගම් නිලධාරීන් උදෙසා පාංශු සංරක්ෂණය සහ පාංශු සංරක්ෂණ පනත පිළිබඳව දැනුවත්වීමේ වැඩසටහන් 4ක් පැවැත්විණි. සහභාගී වූ සංඛ්‍යාව 240
    - ගලහ මොරහේන විද්‍යාලය, පිළිමතලාව මහ විද්‍යාලය, පොල්ගස්වත්ත මහා විද්‍යාලය, දොළුව මහා විද්‍යාලය සහ හෙම්මාතගම නගරගිරි මහා විද්‍යාලය යන පාසල් වල ගුරුවරුන් සහ ශිෂ්‍යයින් සඳහා පාංශු සහ ජල සංරක්ෂණය පිළිබඳ වැඩසටහන් 5ක් පවත්වනු ලැබිණි. සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව 43 ශිෂ්‍යයින් 253
    - ඉහළ කොත්මලේ ජලාධාර ප්‍රදේශයේ තෝරාගත් ඉදිරිපෙළ නායකයින් උදෙසා පාංශු සහ ජල සංරක්ෂණය පිළිබඳ වැඩසටහන් 2ක් පවත්වනු ලැබිණි. සහභාගී වූ සංඛ්‍යාව - 54
    - බිබිල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේදී අලුතෙන් බඳවාගත් කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා පාංශු සහ ජල සංරක්ෂණය සහ ගොවිපළ සැලසුම් සැකසීම පිළිබඳව වැඩසටහන - සහභාගී වූ සංඛ්‍යාව - 34
    - "ඖෂධ පැළෑටි වගාව සඳහා පාංශු සහ ජල සංරක්ෂණය" පිළිබඳ එක් වැඩසටහනක් සහභාගී වූ සංඛ්‍යාව - 22

## පාංශු සහ ජල සංරක්ෂණ නිදර්ශනය

### ගන්නෝරුව පාංශු සංරක්ෂණ නිදර්ශන භූමිය

- නැරඹීමට පැමිණි සම්පූර්ණ ගොවි කණ්ඩායම් සංඛ්‍යාව - 145 (ගොවීන් 5839, නිලධාරීන් 632, ළමුන් 461)
- නැරඹීමට පැමිණි වෙනත් කණ්ඩායම් - 922 (වැඩිහිටි 9370, ළමුන් 2777)
- පාසල් කණ්ඩායම් 837 (ගුරුවරුන් 6428, ශිෂ්‍යයින් 57749)
- විශේෂ කණ්ඩායම් - 582
- විදේශිකයින් (වැඩිහිටි 118, ළමුන් 07)

පාංශු සංරක්ෂණ නිදර්ශන භූමිය - කෘෂි පර්යේෂණ නිදර්ශන ස්ථානය - සීතාඑළිය

- නැරඹීමට පැමිණි ශිෂ්‍යයින් සහ ගුරුවරුන් සංඛ්‍යාව - 1140

- ○ නැරඹීමට පැමිණි ගොවීන් සංඛ්‍යාව - 125
- ○ නැරඹීමට පැමිණි නිලධාරීන් සංඛ්‍යාව - 67

## වැඩමුළු

- ගන්නෝරුව සේවා සංස්කරණ පුහුණු ආයතනයේ පැවති "ජල සහ ජල සහයෝගීතාව" යන මාතෘකාව යටතේ ලෝක ජල දින වැඩමුළුව. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සහ මධ්‍යම පළාතේ ගුරුවරුන් ඇතුළු 90දෙනක් මෙයට සහභාගී වූහ.
- "දකුණු ආසියාවේ භූමි හායන ඇගයීම් සහ චිරස්ථායී භූමි කළමනාකරණය සහ කාලගුණික වෙනස්වීම් අනුවර්තනය සඳහා වූ සමීක්ෂණ" පිළිබඳ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය යටතේ දින 5 කලාපීය වැඩමුළු 2ක් පවත්වනු ලැබිණි. භූතානය, බංගලාදේශය, නේපාලයෙන් 3දෙනෙක්, බැංකොක් ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ කලාපීය කාර්යාලයේ නිලධාරීහු, චීනයේ භූමි හායන ඇගයීම් කණ්ඩායම සහ ශ්‍රී ලංකාවෙන් 28දෙනක් මෙම වැඩසටහන් 2ක සඳහා සහභාගී වූහ.
- "LADA – QM මෘදුකාංගය" පිළිබඳ එම ව්‍යාපෘතියම යටතේ දින 20ක වැඩසටහන් ජාතික වැඩමුළුව. මෙම වැඩසටහන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, තේ පර්යේෂණ ආයතනය, කෘෂිකර්ම අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය සහ කුඩා වතු සංවර්ධන අධිකාරිය සහභාගී විය. මෙයින් 28දෙනෙකු "LADA – QM මෘදුකාංගය" ක්‍රමවේදය පිළිබඳව පුහුණු කරනු ලැබිණි.

## ප්‍රදර්ශන

පහත ප්‍රදර්ශනයන්හිදී ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් තාක්ෂණික ව්‍යාප්තිය සිදු කරනු ලැබිණි.

- ජාතික ගොවි සතිය ප්‍රදර්ශනය වාරියපොළ
- තාක්ෂණික ප්‍රදර්ශනය, තිස්සපුර මහා විද්‍යාලය
- තාක්ෂණික සහ වෙළඳ ප්‍රදර්ශනය, රිවිසඳ විද්‍යාලය මාවනැල්ල

## මුද්‍රිත ප්‍රකාශන

- පාංශු සංරක්ෂණ දැනුවත් කිරීමේ පෝස්ටර්
  - සිංහල (10,000 x 10)
  - දෙමළ (2500 x 7)
- පාංශු සංරක්ෂණ පනත දැනුවත් කිරීමේ පත්‍රිකා
  - සිංහල (10,000)
  - දෙමළ (2500)

## ගුවන් විදුලි වැඩසටහන්

පාංශු ඛාදනය සහ අස්වැන්න අඩුවීම උදෙසා එහි බලපෑම පිළිබඳව ජාතික ගුවන්විදුලි සේවයේ (සාරභූමි), කඳුරට සේවය සහ වයඹ සේවයේ ගුවන් විදුලි වැඩසටහන් 3ක් පවත්වනු ලැබිණි. පාංශු ඛාදනය, පාංශු සංරක්ෂණය සහ පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම යන තේමාවන් මේ යටතේ ආවරණය කරනු ලැබිණි.

## තාක්ෂණික සහාය

විවිධ සංවර්ධන කාර්යයන් උදෙසා අවශ්‍ය තාක්ෂණික සහයෝගය සහ විශේෂඥ දැනුම ලබාදීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යය වලින් එකකි. 2013 වර්ෂයේදී පහත තාක්ෂණික ආධාරයන් ලබාදුණි.

- විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් 3දෙනෙකු සඳහා ඔවුන්ගේ පර්යේෂණයන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් ලබාදීම
- හොරණ කෘෂිකර්ම පර්යේෂණ ගොවිපළවල් සඳහා බෝග යෝග්‍යතා සිතියමක් සැකසීම
- දියගම මහින්ද රාජපක්ෂ අන්තර්ජාතික ක්‍රීඩා සංකීර්ණය සඳහා පාංශු සංරක්ෂණ සහ පිටාර ජල කළමනාකරණ සැලසුමක් සැකසීම
- මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ක්ෂේත්‍ර ජාන බැංකුව සඳහා මූලික සිතියම, සමෝච්ච සිතියමක්, පාංශු සංරක්ෂණ සහ පිටාර ජල කළමනාකරණ සැලසුමක් සැකසීම.
- අඹේපුස්ස ගොවිපළෙහි හෙක්ටයාර 10ක් සඳහා (තලගොල්ල අංශය) ජලාප්‍රවාහන පැතිකඩ සැලසුමක් සැකසීම
- අඹේපුස්ස ගොවිපල සඳහා කුඩා ටැංකියක් ස්ථාපිත කිරීම උදෙසා මූලික සිතියමක් සැකසීම සහ ඉදිකිරීම සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම.
- පහත අන්තර් පළාත් ප්‍රදේශ සඳහා අන්තර් පළාත් සිතියම් සැකසීම
    - අනුරාධපුර
    - මොණරාගල
    - මහනුවර
    - පොළොන්නරුව
- බලගොල්ල පල්ලෙකැලේ පිහිටි විවෘත සිර කඳවුර සඳහා සංමෝච්ච සිතියමක් සැකසීම
- මධ්‍යම පරිසර අධිකාරිය සඳහා පාංශු සංරක්ෂණ සහ පිටාර ජල කළමනාකරණ සැලසුමක් සැකසීම
- තෙලිජ්ජවිල පර්යේෂණ ස්ථානයේ යෝජිත බීජ නිෂ්පාදන ප්‍රදේශය සඳහා සමෝච්ච, ජලාප්‍රවාහ සහ පාංශු සංරක්ෂණ සැලසුමක් සැකසීම
- සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ ගෝනපොළ ගොවිපළ සඳහා භූමි යෝග්‍යතා සමීක්ෂණය සම්පූර්ණ කරනු ලැබ වාර්තාව ඉදිරිපත් කරනු ලැබිණි.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කෘෂිකර්ම ආයතන සහ මධ්‍යස්ථාන ඇතුලත් කරමින් සිතියමක් සැකසීම
- පාංශු සංරක්ෂණ (මහනුවර, නුවරඑළිය, මාතලේ, රත්නපුර සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි) ආදර්ශන ස්ථාන 100ක් ස්ථාපිත කිරීම
- බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානයේ බාදනය වන ප්‍රදේශය සංරක්ෂණය සඳහා පාංශු හා ජල සංරක්ෂණ සැලසුමක් සැකසීම.
- නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේ පාංශු හා ජල සංරක්ෂණ ආදර්ශ භූමියක් ස්ථාපිත කිරීම
- කෙන්ගල්ල, කෙන්ගල්ල මහා විද්‍යාලයේ පාංශු හා ජල සංරක්ෂණ භූමියක් ස්ථාපිත කිරීම
- මාවනැල්ල රිවිසඳ විද්‍යාලයේ පාංශු සහ ජල සංරක්ෂණ ආදර්ශන භූමියක් ඉදිකිරීම
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර පාංශු හා ජල සංරක්ෂණ මිනුම්වල මායිම් ලකුණු කිරීම සහ ස්ථාපිත කිරීම
- තෙලිජ්ජවිල කෘෂි පර්යේෂණ ස්ථානයේ පර්යේෂණ ක්ෂේත්‍ර සඳහා භූමි සංවර්ධන
- රහංගල බීජ නිෂ්පාදන ගොවිපලෙහි වාරික්‍රමය උදෙසා භූමි අභ්‍යන්තර ජලය ලබාගැනීමේ ශක්‍යතාවය පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර වාර්තාව ඉදිරිපත් කරනු ලැබිණි.

## තාක්ෂණික කම්ටු නියෝජනය

- විවිධ ජාතික සහ කලාපීය සංවර්ධන ව්‍යාපෘති උදෙසා පරිසරය එළිකිරීම සඳහා පාංශු සංරක්ෂණ සහ පිටාර ජල කළමනාකරණ සැලසුම සැකසීම. එනම් ඉඩම් කට්ටි කිරීම සහ හෝටල්

ඉදිකිරීම (40), ගල්වලවල් (40), කුඩා ජල විදුලි ව්‍යාපෘති (42) සහ ගස් කපා හෙලීමේ ව්‍යාපෘති (100)

- යෝජිත උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියෙහි තාක්ෂණික ඇගයීම
- බදුල්ල දිස්ත්‍රික්කයේ යෝජිත මොරණ ජලාශ ව්‍යාපෘතිය තාක්ෂණික ඇගයීම උදෙසා වූ කමිටුව
- යෝජිත "යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය" සඳහා තාක්ෂණ ඇගයීම
- යෝජිත මොරගහකන්ද ව්‍යාපෘතියෙහි තාක්ෂණ ඇගයීම
- යෝජිත ගැටඹේ කුඩා ජල ව්‍යාපෘතියෙහි තාක්ෂණික ඇගයීම
- යෝජිත බිබිල උක් වගා ව්‍යාපෘතියෙහි තාක්ෂණික ඇගයීම

## භූමි භාවිත සැලසුම් ප්‍රතිපත්ති අංශය Land use Planning Policy Division

- LUPPD යෝජිත භූමි භාවිත සැලසුමෙහි තාක්ෂණික ඇගයීම.

## පාංශු සංරක්ෂණ පනත

මෙම වර්ෂයේදී පෙර වර්ෂය හා සාපේක්ෂව අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදන වෙන්කිරීම් හේතුවෙන් පාංශු සංරක්ෂණ පනත පිළිබඳ කාර්යයන් වඩාත් කඩිනම් කෙරිණි. මෙම කාර්යයන් පුළුල් වශයෙන් නීතිමය කටයුතු හා එම නීතිමය කටයුතු වල ප්‍රවර්ධනයන් සහ තාක්ෂණ භුවමාරු සහ එහි දැනුවත්බව ඇතිකිරීම ලෙස ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදනු ලබයි.

## නීතිමය කටයුතු සහ එම කටයුතුවල ප්‍රවර්ධනයන්

වර්තමානයේ පාංශු ඛාදනය සහ භූමි හායනය පිළිබඳ ගැටළු වලට විසඳුම් සෙවීමේදී පාංශු සංරක්ෂණ පනත (1951) සහ එම පනතෙහි සංශෝධනයන් (1996 අංක 24 දරන) යටතේ වූ විධිවිධානයන් ප්‍රමාණවත් නොවේ. එමනිසා භූමි හායන වැලැක්වීම උදෙසා වූ කාර්යයන්හි වඩාත් පුළුල් පරාසයක් ආවරණය කරනු ලබන නීතිමය ආවරණ කටයුතු කාලීන අවශ්‍යතාවයකි. මේ හේතුවෙන් අමාත්‍ය මණ්ඩලයට "පාංශු සංරක්ෂණ සහ භූමි හායන වැලක්වීමේ පනත" ලෙස නව කෙටුම්පත් පනතක් ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ අතර එම යෝජිත පනතෙහි නීතිමය කටයුතු පිළිබඳ ඉදිරි කටයුතු කරගෙන යාම උදෙසා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

## තාක්ෂණ හුවමාරු සහ දැනුවත් කිරීම් ඇතිකිරීම

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව මෙම විෂය විමධ්‍යගත කර ඇති විෂයක් හේතුවෙන් පාංශු සංරක්ෂණය හා සම්බන්ධ කටයුතු පිළිබඳව තාක්ෂණ හුවමාරු සහ දැනුවත් කිරීමේ ඇතිකිරීම මූලිකවම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරනු ලබයි. එමනිසා මෙම මධ්‍යස්ථානය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාත්මක ව්‍යුහයක් සැකසීම සහ යාවත්කාලීන කිරීම උදෙසා වැඩි අවධානයක් යොමු කර තිබේ. මධ්‍යම, ඌව, සබරගමුව යන පළාත් වල කෘෂිකර්ම දෙපාර්තමේන්තුහට පරිගණක, GPS උපකරණ, මාර්ග සිතියම්, ඩම්පි ලෙවලය ආදිය ලබාදෙමින් ආධාර කරනු ලබයි. මෙම කාර්යයන්හි ඵලදායීතාවය වැඩිකිරීම උදෙසා මෙම උපකරණ ලබාදෙමින් කාර්යයන් ඉටුකිරීමේ ධාරිතාවය ප්‍රවර්ධනය කරන අතරතුර ප්‍රබල මානව සම්පත් සංවර්ධන කාර්යයන් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරනු ලබයි. මෙම වැඩසටහන යටතේ සෑම දිස්ත්‍රික්කයක් සඳහාම පාංශු සහ ජල කළමනාකරණය පිළිබඳව විෂය සම්බන්ධ

නිලධාරීන් [Subject Matter Officer's (SMO)] දෙදෙනෙකු හඳුනාගෙන ප්‍රායෝගික සැසි ඇතුලත්ව නීති සහ තාක්ෂණික යන දෙකම පිළිබඳව සීමාවාසික පුහුණුවක් දෙනු ලැබිය. මේ සම්බන්ධ විෂය සම්බන්ධ නිලධාරීන් 25 දෙනෙකු පුහුණු කරනු ලැබීය. මෙයට අමතරව ඉහත සඳහන් පළාත්වල මෙම සංරක්ෂණ ප්‍රදේශයන් (300ක්) යටතට වැටෙන්නා වූ සියලුම කෘෂිකර්ම උපදේශකවරුන් පාංශු සංරක්ෂණ පනතෙහි පාංශු සහ ජල සංරක්ෂණය සහ නීතිමය කටයුතු පිළිබඳ පුහුණු කරනු ලැබිණි.

- මෙම පාංශු සංරක්ෂණ පනත පිළිබඳව අදාල නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීමට පෙර සියලුම අදාල කෘෂිකර්ම උපදේශක කලාපවල යෝග්‍ය සංරක්ෂණ ක්‍රමෝපායන් නිදර්ශනය කිරීම උදෙසා ගොවි ක්ෂේත්‍ර වල පාංශු සහ ජල නිදර්ශන භූමි ස්ථාපිත කිරීමට තීරණය කරනු ලැබිණි. මෙම කාර්යයන් මධ්‍යම, ඌව සහ සබරගමුව යන පළාත්වල පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු හා ඒකාබද්ධව පවත්වනු ලැබිණි. මධ්‍යම, ඌව සහ සබරගමුව යන පළාත් හා ඒකාබද්ධව මධ්‍යම කඳුකරය තුළ තෝරාගත් ගොවි ක්ෂේත්‍රයන්හිදී නිදර්ශන භූමි 100ක් ස්ථාපිත කරනු ලැබිණි. මෙයට අමතරව අදාල ප්‍රදේශයන්හි දක්වන නියෝජිතායතන සමඟ එකතු වී ආසන්න වශයෙන් ක්ෂේත්‍ර දින 25ක් පවත්වනු ලැබිණි.
- උලපනේ, රොසෙල්ල, දුන්හිඳ සහ උනුවින්න යන ප්‍රදේශවලදී පාංශු සංරක්ෂණ පනත පිළිබඳව සාමාන්‍ය මහජනතාව දැනුවත් කිරීම උදෙසා විශාල දැන්වීම් පුවරු 4ක් ස්ථාපිත කරනු ලැබිණි.
- පෙර ස්ථාපිත කරනු ලැබූ පාංශු සංරක්ෂණ පනත පිළිබඳව දැනුවත් කිරීමේ පුවරු 6ක් නඩත්තු කිරීම
- දුම්රිය ස්ථානයන්හි සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමින්හි ප්‍රදර්ශනය කිරීම සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය පාංශු සංරක්ෂණ පනත දැනුවත් කිරීමේ පුවරු (අඩි 6 x අඩි 3) 40ක් බෙදා හරිනු ලැබිණි.

### කෘෂි - කාලගුණික නිරීක්ෂණ ජාලය

WMO ප්‍රමිතීන්ට අනුකූලව කෘෂි කාලගුණික නිරීක්ෂණ ස්ථාන 28කින් සහ වර්ෂාමාපන ස්ථාන 70කින් සමන්විත වන්නා වූ කෘෂි - කාලගුණික නිරීක්ෂණ ජාලය නඩත්තු කරනු ලැබිණි.

### දත්ත වගුව නඩත්තුව

විවිධ සේවා යෝජකයින්ට සැපයීම උදෙසා කෘෂි කාලගුණය, භූමි සහ ජලය සම්පත් පිළිබඳ දත්ත රැස්කර, පරිගණක ගතකර දත්ත වගුව නඩත්තු කරනු ලැබිණි.

## 2014 සැලසුම

### පර්යේෂණ

- කෘෂි ඵලාදයීතාවය වැඩිකිරීම උදෙසා කෘෂි - පාරිසරික විවිධත්වය ස්වභාවික සම්පත් උපයෝගී කරගනිමින් ඇති කිරීම
- පහතරට තෙත් කලාපට උදෙසා භූමි විශේෂිත පොහොර නිර්දේශයන් වැඩිදියුණු කිරීම
- ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ප්‍රධාන ගංගාවල ජලයේ ගුණාත්මක බව සමීක්ෂණය
- පාරිසරික රේඩියෝනියුක්ලියෝටයිඩ් උපයෝගී කරගනිමින් මධ්‍යම කඳුකරයේ පාංශු ඛාදන / අවසාදන දත්ත වගුවක් සැකසීම
- කෘෂි ළිං පදනම් ගොවිපළ සඳහා භූමි කළමනාකරණ මාර්ගෝපදේශයක් වැඩිදියුණු කිරීම
- අම්පාර, පොළොන්නරුව, හම්බන්තොට සහ කුරුණෑගල

දිස්ත්‍රික්කයන්හි චන්ද්‍රිකා ඡායාරූප පදනම්ව කුඹුරු ඉඩම් සහ අස්වැන්න පිළිබඳ අනාවැකි පැවසීම.

- තිරසාර භූමි කළමනාකරණයක් සඳහා භූමි හායන ඇගයීම
- කලාපීය බෝග අස්වනු අනාවැකි සහ කාලගුණික වෙනස්කම් බලපෑම් ඇගයීම උදෙසා මෘදුකාංගයක් වැඩිදියුණු කිරීම, ඇගයීම සහ උපයෝගී කර ගැනීම
- ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ සඳහා බෝග නිර්දේශයන්හි ඩිජිටල් සම්පාදනය
- ශ්‍රී ලංකාවේ උඩරට වර්ෂාපෝෂිත වියලි කලාපය සඳහා බහුකාර්ය පාංශු සංරක්ෂණ බැමි පද්ධතියක් වැඩිදියුණු කිරීම
- කාලගුණික වෙනස්වීම්වල අනුවර්තනය උදෙසා කෘෂි කාලගුණික මධ්‍යස්ථානවල කෘෂි කාලගුණික තොරතුරු සහ සේවාවන් ඇතිකිරීම
- වවුනියා දිස්ත්‍රික්කයේ නොගැඹුරු භූ ජලයේ ගුණාත්මකබව ඇගයීම
- පාංශු තෙතමන පැවැත්මට සහ භූ ජලය පුනර්ජනන සඳහා වර්ෂා ජල අස්වනු ක්‍රමයන්හි බලපෑම අධ්‍යයනය

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ (CUD) | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 08 |
| කෘෂිකර්ම නිලධාරි | 03 |
| විෂය සම්බන්ධ විශේෂඥ | 01 |
| පර්යේෂණ සහකාර | 03 |
| කෘෂිකර්ම උපදේශක | 10 |
| පාංශු සමීක්ෂක | 04 |
| වැඩසටහන් සහකාර | 02 |
| සංවර්ධන නිලධාරි | 03 |
| පර්යේෂණ උපසහකාර | 02 |
| පරිපාලන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 05 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 07 |
| මුරකරු | 02 |
| කම්කරු | 02 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 02 |
| **එකතුව** | **59** |

# 2.1 බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව

බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයට පැවරී ඇති වගකීම වන්නේ බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්ත්වය සනාථ කිරීම, ගොවි ක්ෂේත්‍ර තත්ත්වය යටතේ පාරිසරික වශයෙන් හිතකර, ආර්ථික තත්ත්වයට සරිලන හා ප්‍රායෝගික වශයෙන් භාවිත කිරීමට සුදුසු පළිබෝධ පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම මගින් ගොවීන්ට අත්‍යවශ්‍ය වන සේවා සැපයීම, තත්ත්වයෙන් උසස් පළිබෝධනාශක සඳහා පමණක් ප්‍රවේශය සීමා කිරීම සහ එම පළිබෝධනාශක ආරක්ෂාකාරීව පරිහරණය සහතික කිරීම හා මෙරට ආහාර බෝගවල පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහ උපයෝජනය ප්‍රවර්ධනය කිරීමයි. මෙම මධ්‍යස්ථානය බීජ සහතික කිරීමේ සේවය, පැළෑටි සංරක්ෂණ සේවය, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය වෙනුවෙන් ප්‍රධාන කළමනාකරණ ආයතනය වශයෙන් ක්‍රියා කරයි. මෙය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වගකීම පැවරී ඇති පහත සඳහන් පනත්වලට අදාළ නියාමන කාර්යයන්හි ද නියැළෙයි.

- දේශීය කෘෂිකර්මය ආරක්ෂා කිරීම හා පරිසරයට අවම හානියක් සහිත ඵලදායී පළිබෝධ කළමනාකරණ ක්‍රමෝපාය ප්‍රවර්ධනය කිරීම සඳහා 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත
- මිනිස් සෞඛ්‍යයට හා පරිසරයට අවම හානියක් සහිත උසස් තත්ත්වයේ පළිබෝධනාශක භාවිතය සහතික කිරීම පිණිස 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත
- බීජ කර්මාන්තයට හානිකර අයථා කටයුතුවලින් ගොවීන් මෙන්ම බීජ හසුරුවන්නන් ආරක්ෂා කිරීම පිණිස 2003 අංක 22 දරන බීජ පනත

## නියාමන කාර්යයන්

වැලිගම පොල් පත්‍ර මැලවීමේ රෝගය පාලනය කිරීම සහ තවදුරටත් ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස මග පෙන්වන ලදී.

පසුගිය වසරේදී පැළෑටි සංරක්ෂණ පනතේ නව විධිවිධාන කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර එම විධිවිධානවල දක්වා ඇති යම් යම් නීතිමය හා තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් නීති කෙටුම්පත් නිලධාරීන් සමග සාකච්ඡා වට ගණනාවක් පවත්වන ලදී.

බීජ අංශයේ පාර්ශ්වකරුවන් සියල්ල සමග වැඩමුළු ගණනාවක් පැවැත්වීමෙන් පසු 2003 අංක 22 දරන බීජ පනත පරිච්ඡින්න කිරීම පිණිස යෝජනාවක් සකස් කර ඇත. සංකීර්ණ නීතිමය ගැටලුවලට තුඩුදෙන අර්බුද වළක්වා ගැනීම හා ගොවීන්, බීජ හසුරුවන්නන් ආදී පාර්ශ්වයන් මුහුණු දෙන වත්මන් ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් ලබාදීම පිණිස මෙම සංශෝධන සිදු කෙරිණි. මෙරට වත්මන් කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වලට සහාය විය හැකි නව පනතක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව මතුව ඇත. මෙහි අවසන් කෙටුම්පත් යෝජනාව සිංහල, දමිළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පිළියෙළ කර කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් 2013 සැප්තැම්බර් මාසයේදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

## අයවැය

**වගු අංක 2.1.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 4,582,000 | 3,620,024 | 21 |
| පුනරාවර්තන | 3,709,472 | 2,957,320 | 20 |
| එකතුව | 8,291,472 | 6,577,344 | 79 |

## ප්‍රගතිය

- පසුගිය වසර කිහිපය පුරා ආනයනය කළ එළවළු හා පලතුරු බීජ පිළිබඳ තොරතුරු සොයා ගැනීමට හැකි දත්ත මූලයක් සකස් කරන ලදී.
- දිවි නැගුම වැඩසටහන සඳහා බීජ සැපයීම සඳහා වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු බීජ සම්බන්ධයෙන් බීජ පරීක්ෂණ දත්ත විශ්ලේෂණය කරන ලදී.

මෙම තොරතුරු ඉදිරි සැලසුම් කටයුතු සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ව්‍යාප්ති සේවකයින්ට සහ පර්යේෂකයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

### ආනයනය කරන ලද එළවළු හා පලතුරු බීජ පිළිබඳ දත්ත මූලය

ආනයනය කරන එළවළු බීජ පිළිබඳ වැදගත් තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා ජාතික මට්ටමේ දත්ත මූලයක් සකස් කෙරෙමින් පවතී. මෙය නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ සියලුම තොරතුරු සහ පසුගිය පස් වසර තුළ වරායෙහි හා ගුවන් තොටුපළෙහි පැළෑටි නිරෝධායන ඒකක හරහා සිදු කරන ලද සත්‍ය බීජ ආනයන පිළිබඳ තොරතුරු ලබා ගැනීම පහසු කරනු ඇත.

ජාතික පැළෑටි නිරෝධායන සේවය විසින් 2013 වර්ෂයේදී එළවළු බීජ ආනයන බලපත්‍ර 820ක් නිකුත් කර ඇත. 2013 වර්ෂයේදී ආනයනය කරන ලද එළවළු හා පලතුරු බීජ ප්‍රමාණයන් පහත වගුවෙන් දැක්වේ.

**වගු අංක 2.1.2: 2013 වර්ෂයේදී වරාය හා ගුවන් තොටුපළ හරහා ආනයනය කරන ලද එළවළු බීජ ප්‍රමාණයන්**

| බෝගය | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | |
|---|---|---|---|
| | වරාය | ගුවන් තොටුපළ | එකතුව |
| බෝංචි | 130,690.00 | 4.50 | 130,694.50 |
| බීට්රූට් | 26,693.20 | 2,905.80 | 29,599.00 |
| කරවිල | 2,267.60 | 215.03 | 2,482.63 |
| බ්‍රොකොලි | 10.00 | 0.02 | 10.02 |
| ගෝවා | 1,060.24 | 724.93 | 1,785.17 |

| බෝගය | ප්‍රමාණය (කි.ගු) | | |
|---|---|---|---|
| | වරාය | ගුවන් තොටුපළ | එකතුව |
| කැරට් | 37,617.40 | 103.00 | 37,720.40 |
| ගෝවා මල් | 148.98 | 76.07 | 225.05 |
| චයිනීස් කැබේජ් | 20.00 | 15.00 | 35.00 |
| චයිනීස් කලේ | 172.00 | - | 172.00 |
| පිපිඤ්ඤා | 1,812.09 | 435.25 | 2,247.34 |
| වම්බටු | 385.32 | 76.95 | 462.27 |
| පෙපර් / ස්වීට් පෙපර්/ බෙල් පෙපර් ආදිය | 6,016.80 | 3.12 | 6,019.92 |
| හොට් පෙපර්/මිරිස් | 1,637.46 | 1216.86 | 2,854.32 |
| නෝකෝල් (කෝල්රාබි) | 5938.50 | 1185.00 | 7123.50 |
| ලීක්ස් | 7,290.90 | 699.75 | 7990.65 |
| සළාද කොළ | 135.00 | - | 135.00 |
| වැටකොළු | 4,689.19 | 452.20 | 5,141.39 |
| මුරුංගා | | 305.00 | 305.00 |
| බණ්ඩක්කා | 27.00 | 6,471.06 | 6,498.06 |
| ලූනු | 75,00.00 | 500.00 | 8,000.00 |
| රතු ලූනු | 600 | - | 600 |
| පැකෝයි | 25.00 | - | 25.00 |
| වට්ටක්කා | 10,666.11 | 1,110.44 | 11,776.55 |
| රාබු (චයිනීස් රැඩිෂ්) | 21,238.94 | 515.02 | 21,753.96 |
| පතෝල | - | 100.00 | 100.00 |
| ස්කොෂ් | 10,323.72 | 350.00 | 11,673.72 |
| තක්කාලි | 1,108.94 | 191.89 | 1300.82 |
| කන්කුන් | 905.59 | - | 905.59 |
| මෑ | 5,310.00 | 250.30 | 5560.30 |
| සුකිනි | - | 0.50 | 0.50 |
| ලබු | 0.12 | - | 0.12 |
| **එකතුව** | **285,352.10** | **17,961.69** | **303,313.77** |

**වගු අංක 2.1.3: වරාය සහ ගුවන් තොටුපළ හරහා ආනයනය කරන ලද පලතුරු හා අනෙකුත් බීජ ප්‍රමාණයන්**

| බෝගය | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | එකතුව |
|---|---|---|---|
| | වරාය | ගුවන් තොටුපළ | |
| පැපොල් | - | 12.98 | 12.98 |
| කොමඩු | 9,470.03 | 245.21 | 9,715.24 |
| බීජ අර්තාපල් | 1,450,421.00 | - | 1,450,421.00 |
| බඩඉරිඟු (දෙමුහුන් ඉරිඟු/ ඉරිඟු) | 1,654,155.85 | 6.03 | 1,654,161.88 |
| විළඳ ඉරිඟු | 62.00 | 54.00 | 116.00 |
| ලිලියම් බල්බ | 25,926.00 | - | 25,926.00 |
| තෘණ බීජ | 8,475.00 | - | 8,475.00 |
| මල් බීජ | - | 87.90 | 87.90 |
| **එකතුව** | **3,148,509.88** | **406.12** | **3,148,916.00** |

## බීජ පිළිබඳ නව මංගත දත්ත මූලය

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ නිෂ්පාදන වැඩසටහනෙහි සියලුම වැදගත් අංශ සහ ආනයන ආවරණය වන පරිදි නව දත්ත මූලයක් සකස් කෙරෙමින් පවතී. මේ සඳහා මූල්‍යමය සහාය ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියේ එළවළු බීජ ව්‍යාපෘතිය මගින් ලැබෙනු ඇත. අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් 2013 වර්ෂයේදී වැඩමුළු ගණනාවක් පවත්වන ලදී. මෙම දත්ත මූලය සකස් කිරීම පිළිබඳ ප්‍රධාන වගකීම තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වෙත පවරන ලදී.

### 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත සඳහා නව විධිවිධාන

1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත සඳහා වන නව විධිවිධාන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර එය දැන් අවසන් අදියරෙහි පවතී.

## වෙනත් කාර්යයන්

### බීජ පනත

බීජ ආනයනය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කරන ලද අතර යෝජිත බීජ විද්‍යාගාර සඳහා වන ප්‍රමිති කෙටුම්පත සකස් කෙරෙමින් පවතී. අදාළ බීජ සහතික කිරීම් සේවා නිලධාරීන්, පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථාන නිලධාරීන් සමග කණ්ඩායම් සාකච්ඡා 2ක් පවත්වන ලද අතර අදාළ ක්ෂේත්‍රවල සිටින සම්පත්දායකයින්ගේ සහාය ඇතිව බීජ හා රෝපණ ද්‍රව්‍ය පනතේ යෝජිත විධිවිධාන විධිමත් කිරීම පිණිස දෙදින වැඩමුළු 2ක් සංවිධානය කරන ලදී.

### කාර්ය මණ්ඩලය පිළිබඳ දත්ත මූලය සකස් කිරීම

බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා එම තොරතුරු ගබඩා කළ හැකි දත්ත මූලයක් සකස් කෙරිණි.

### සම්මන්ත්‍රණ/ දැනුවත් කිරීමේ වැඩසටහන්/ පුහුණු

- ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී 2013 අප්‍රේල් 8 - 9 දක්වා බීජ සහතික කිරීමේ සේවයේ, පැළෑටි සංරක්ෂණ සේවයේ, පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ නිලධාරීන් 18 දෙනෙකු සඳහා MS Excel පිළිබඳ පරිගණක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- පොලිස් නිලධාරීන්, පළිබෝධනාශක අලෙවිකරුවන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතනවලට අදාළ නිලධාරීන්, බීජ හසුරුවන්නන්, බීජ අලෙවිකරුවන්, කොන්ත්‍රාත් බීජ වගාකරුවන්, පාසැල් සිසුන් හා විශ්ව විද්‍යාල සිසුන් සඳහා විවිධ ස්ථානවලදී වැඩමුළු, පුහුණු, කණ්ඩායම් සාකච්ඡා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් සංවිධානය කර පවත්වන ලදී. ස්ථාන 16කදී, බීජ පනත හා වත්මන් ගැටලු, පැළෑටි සංරක්ෂණය, බීජ සහතික කිරීමේ සේවයේ කාර්යභාරය, බීජ පිරිසිදු කිරීම හා ගබඩා කිරීම ආදිය සම්බන්ධයෙන් 1,000කට ආසන්න පිරිසක් සඳහා පුහුණුව ලබාදිණි.
- බීජ පනත සහ පැළෑටි සංරක්ෂණ පනතේ පවතින විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා ගොවීන් විසින් මුහුණ දෙන වත්මන් ගැටලු සම්බන්ධයෙන් කඳුරට සේවයේ සහ වයඹ සේවයේ සජීවී ගුවන්විදුලි වැඩසටහන් 3ක් (පැය 1 බැගින්) පවත්වන ලදී.

### ස්ථිර භෝග සායන වැඩසටහන

පැළෑටි සංරක්ෂණ සේවය විසින් සම්බන්ධීකරණය කරන ඉහත දක්වන ලද වැඩසටහන සඳහා ක්‍රියාකාරී අයුරින් දායක විණි. බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ සේවයේ ප්‍රධාන පුහුණුකරුවෙක් දිවයිනේ විවිධ ස්ථානවල පවත්වන ලද පැළෑටි සායන ගණනාවක් සඳහා සහභාගි විය.

### සම්මාන

- කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි දැක්වූ කැපී පෙනෙන දායකත්වය උදෙසා 2013 කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සමුළුවේදී ආචාර්ය ජී. එම්. ඩබ්. චිත්‍රාල් මහතාට 'හොඳම ශස්‍ය විද්‍යාඥයා' සම්මානය පිරිනැමිණි.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- බීජ, පැළෑටි, රෝපණ ද්‍රව්‍ය හා කෘෂි රසායන ආරක්ෂිතව හා ඵලදායී අයුරින් භාවිත කිරීම පහසු කෙරෙන විධිවිධාන ක්‍රියාත්මක කිරීම මගින් දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මයේ දායකත්වය ඉහළ යනු ඇත.
- යෝජිත බීජ පනත සඳහා විධිවිධාන කෙටුම්පත සකස් කිරීම
- උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් සුදුසු සැලසුම් හා ප්‍රතිපත්තිමය තීරණ පිළියෙළ කිරීම
  - මෙරට බීජ ව්‍යාපාර වැඩිදියුණු කිරීම
  - මෙරට උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩිදියුණු කිරීම
  - ජාතික පැළෑටි ස්වස්ථතා ක්‍රමය ශක්තිමත් කිරීම
  - නියාමන ක්‍රියාමාර්ග ඒකාබද්ධ කිරීම
  - කෘෂිකර්මය තුළ වඩාත්ම ඵලදායී හා ආරක්ෂිත පළිබෝධ පාලන ක්‍රමෝපාය ප්‍රවර්ධනය කිරීම

## කාර්ය මණ්ඩය

| තනතුර | නිලධාරි/ සේවක සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| පරියේෂණ නිලධාරි | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 01 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| පරිපාලන නිලධාරි | 01 |
| සංවර්ධන නිලධාරි | 03 |
| කළමනාකරණ සහකාර | 07 |
| ගබඩාකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| රියදුරු | 04 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| කම්කරු | 02 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 06 |
| **එකතුව** | **33** |

# 2.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නොරුව

බීජ සහතික කිරීමේ සේවය ගොවීන්ට ලබා දෙන බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්වය සහතික කිරීමට අදාළ නියාමන කාර්යයන් ඉටු කරයි.

## වගකීම්

- බීජ පනත ක්‍රියාත්මක කිරීම
- ගුණනය කිරීමට පෙර මූලික බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්වය සහතික කිරීම
- වී, එළවළු, වෙනත් ක්ෂේත්‍ර බෝග හා අර්තාපල්වල වාණිජමය බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්වය සහතික කිරීම
- පලතුරු පැළ සහතික කිරීම සහ පලතුරු පැළ තවාන් ලියාපදිංචි කිරීම
- දිවයින පුරාම ඇති සුදුසු මව් පැළ තෝරා ගෙන ලියාපදිංචි කිරීම
- දේශීය හා ආනයනය කළ බීජවල ප්‍රරෝහණය, ජීව්‍යතාව, පවිත්‍රතාව සහ තෙතමනය විද්‍යාගාරයේදී පරීක්ෂා කර බැලීම
- ආනයනය කරන ලද සහ දේශීය වශයෙන් නිපදවන ලද බීජවල තත්වය පරීක්ෂා කර බැලීම සඳහා පශ්චාත් පාලන ක්ෂේත්‍ර වගා අත්හදා බැලීම් පැවැත්වීම
- නව බෝග ප්‍රභේද නිදහස් කිරීමට පෙර විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳ පරීක්ෂා සිදු කිරීම
- බීජවල ස්වස්ථතාව පරීක්ෂා කර බැලීම
- බීජ පනතට අදාළව උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් බීජ වගාකරුවන්, පැළ තවාන්කරුවන්, බීජකරුවන් හා නිලධාරීන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම
- ව්‍යවහාරික බීජ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම මගින් උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් පවතින ක්ෂේත්‍ර ගැටළු ජය ගැනීම සඳහා විසඳුම් සොයා ගැනීම
- ආනයනය කළ එළවළු බීජවල තත්වය සහතික කිරීම
- බීජ සංවර්ධනය කිරීම සහ තත්වය ප්‍රවර්ධනය කිරීම පිළිද කටයුතු
- දත්ත මූල කළමනාකරණය සහ මෙහෙයවීම
- වාර්ෂිකව පලතුරු තවාන්කරුවන්ගේ නාමාවලිය ද කන්නමය වශයෙන් බීජ නිෂ්පාදකයින්ගේ නාමාවලිය ද ප්‍රකාශයට පත් කිරීම

## අයවැය

විවිධ වැය ශීර්ෂ හා ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන හා දරන ලද වියදම වගු අංක 2.1.1.1හි දැක්වේ.

**වගු අංක 2.1.1.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 10.23 | 7.93 | 78 |
| පුනරාවර්තන | 23.42 | 15.44* | 66 |
| **ව්‍යාපෘති** | | | |
| බීජ පිළිබඳ කටයුතු ශක්තිමත් කිරීම සහ බීජ කර්මාන්තය සංවර්ධනය කිරීම | 100.00 | 91.00 | 91 |
| බීජ පනත | 2.00 | 19.20 | 96 |
| **එකතුව** | **153.65** | **133.57** | **87** |

* රු. මිලියන 0.76ක් ගෙවීමට තිබේ.
* මුදල් අංශයේ වැටුප් II මගින් රු. මිලියන 7.2ක් වියදම් කරන ලදී.

## ප්‍රගතිය

- බීජ නිෂ්පාදනය සඳහා වී වගා ක්ෂේත්‍ර හෙ. 4907ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග වගා ක්ෂේත්‍ර හෙ. 1088ක්, එළවළු හා පලතුරු වගා ක්ෂේත්‍ර හෙ. 315ක් සහ අර්තාපල් වගා ක්ෂේත්‍ර හෙ. 88ක් පරීක්ෂා කිරීම
- බිත්තර වී මෙ.ටො. 120,391ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙ.ටො. 446ක්, එළවළු බීජ මෙ.ටො. 69ක් සහ බීජ අර්තාපල් මෙ.ටො. 729ක් පරීක්ෂා කිරීම
- 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී වෙනත් ක්ෂේත්‍ර බෝගවල හා එළවළුවල ලියාපදිංචි වගා බිම් ප්‍රමාණය පිළිවෙළින් 30%කින් හා 35%කින් වර්ධනය විය. කොන්ත්‍රාත් බීජ වැඩසටහන නවතාලීම හේතුවෙන් ලියාපදිංචි වී වගා බිම් ප්‍රමාණය අඩුවිය. උතුරු ප්‍රදේශවල රතු ලූනු සහ ලොකු ලූනු වගාකරුවෝ ප්‍රධාන වශයෙන්ම බීජ නිෂ්පාදන වැඩසටහනෙහි ඇතුළත් කරන ලදහ. වසර තුළ ලියාපදිංචි එළවළු වගා බිම් ප්‍රමාණය ශීඝ්‍රව ඉහළ නැගිණි.
- 2012 වසරට සාපේක්ෂව ලියාපදිංචි වී වගා කළ බිම් ප්‍රමාණය සැලකිය යුතු අයුරින් පහත වැටි නමුත් වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ අර්තාපල් වගා බිම් ප්‍රමාණයන් වැඩිවීමත් සමගම නිෂ්පාදනයද පිළිවෙළින් 35%කින්, 59කින්% සහ 14%කින් ඉහළ නැගිණි. ශ්‍රී ලංකාවේ ජාතික බිත්තර වී අවශ්‍යතාවෙන් 15.2%ක් ආවරණය කරමින් බීජ නිෂ්පාදනය 51%කින් ඉහළ නැගිණි.
- සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිපදවන උද්‍යාන බෝග පැළ තවාන් 335ක් ලියාපදිංචි කර පරීක්ෂා කරන ලදී. බද්ධ පලතුරු පැළ 8,72,472ක් ලේබල් කර ඒවායෙහි තත්ත්වය සහතික කරන ලදී. 2012 වර්ෂය සමග සසඳා බලන විට, පලතුරු පැළ සහතික කිරීම 40%කින් වර්ධනය විණි.
- විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කරන වැඩසටහන් යටතේ වී ප්‍රභේද 21ක් ද වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 40ක් ද එළවළු ප්‍රභේද 12ක් ද මුල් හා ආකන්ද බෝග ප්‍රභේද 1ක් ද ඇගයීමට ලක් කරන ලදී.
- ගන්නොරුව, සීතා එළිය සහ මහ ඉලුප්පල්ලම පිහිටි පසු පාලන ක්ෂේත්‍රවලදී වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ අර්තාපල් පසු පාලන නියැදි 1268ක් පරීක්ෂා කරන ලදී.
- බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 1141දෙනෙකු ලියාපදිංචි කරන ලද අතර 858දෙනෙකුගේ ලියාපදිංචිය අලුත් කරන ලදී.
- විවිධ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයින් විසින් භාවිතා කරන ලේබල් 572ක් සඳහා බීජ පනත යටතේ අනුමැතිය ලබා දෙන ලදී.
- රජයේ සහ පෞද්ගලික අංශයේ නිලධාරින්, පැළ තවාන්කරුවන්, බීජ ගොවීන් සහ බීජ හසුරුවන්නන් 2325දෙනකුට බීජ පනතේ කාර්යයන් සම්බන්ධයෙන් පුහුණුව ලබාදිණි.
- 2012 මැයි මාසයේ සිට 'සහතික කළ එළවළු බීජ නිෂ්පාදන ක්‍රමය පුළුල් කිරීම' පිළිබඳ පස් අවුරුදු ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සි ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. බීජ සහතික කිරීමේ සේවා කලාපීය කාර්යාල 4 සහ බීජ පරීක්ෂණ විද්‍යාගාර 3 ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වන ආයතන වේ.
- ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයට අලුතින් පත් කරන ලද නිලධාරීහු 5දෙනෙක් 2013 වර්ෂයේදී බීජ සහතික කිරීමේ සේවයට අනුයුක්ත කරන ලදහ.
- 2013 වර්ෂයේදී බීජ සහතික කිරීමේ සේවය ශක්තිමත් කිරීමේ සහ බීජ කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යටතේ කරදියන් ආරු සහ ලබුදූව ප්‍රාදේශීය කාර්යාලවල, බටඅත පසු පාලන ක්ෂේත්‍ර කාර්යාලයේ,

අළුත්තරම බීජ පරීක්ෂණ විද්‍යාගාරයේ ප්‍රරෝහණ කුටියේ හා ගන්නොරුව නිල නිවාස 2ක ඉදි කිරීම් කටයුතු නිම කර ඇත.

- බීජ සහතික කිරීමේ සේවයේ සියලුම ඒකකවලට අයත් වාහන හා ගොඩනැගිලිවල අත්‍යවශ්‍ය අලුත්වැඩියා කටයුතු නිම කරන ලදී.
- බීජ පරීක්ෂණ විද්‍යාගාරවලට එවන ලද නියැදිවල තත්ත්වය දැන ගැනීමට බීජ සහතික කිරීමේ සේවා නිලධාරීන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි වෙබ් වැඩසටහනක් (Web application) නිර්මාණය කෙරිණි.

## බිත්තර වී සහතික කිරීම

2013 වර්ෂයේදී සහතික කළ බිත්තර වී නිෂ්පාදන වැඩසටහන් සඳහා එක් එක් ගොවීන් මෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ, සමූපකාර සමිති, පළාත් සභා, ගොවිජන කේන්ද්‍ර, මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන, පෞද්ගලික සමාගම්, රාජ්‍ය නොවන සංවිධාන වැනි රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතන රැසක් ලියාපදිංචි කරන ලදී.

බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද මුළු වගා බිම් ප්‍රමාණය හෙ. 4907ක් වූ අතර ඒ සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය 76%ක් විය. විවිධ මූලාශ්‍ර සහ බීජ පංති යටතේ සහතික කළ බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණය වගු අංක 2.1.1.2හි දැක්වේ. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත් බිත්තර වී වැඩසටහන නවතා දැමීම හේතුවෙන් 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කළ බිම් ප්‍රමාණයේ විශාල පහත වැටීමක් නිරීක්ෂණය කිරීමට ලැබිණි.

**වගු අංක 2.1.1.2: 2012 සහ 2013 වර්ෂවල බිත්තර වී නිෂ්පාදනය යටතේ පැවති වගා බිම් ප්‍රමාණයන්**

| මූලාශ්‍රය | බීජ පංතිය | 2012 | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | අභිජනන | 2.5 | 2.5 | 4.5 | 4.1 | 91 |
| රජයේ ගොවිපළ | අත්තිවාරම් I | 67 | 62 | 55.2 | 40.51 | 73 |
| | අත්තිවාරම් II | | | 0.65 | 0.57 | 88 |
| | ලියාපදිංචි I | 770 | 653 | 697.47 | 609.41 | 87 |
| | ලියාපදිංචි II | | | 11.05 | 11.05 | 100 |
| | සහතික කළ I | 145 | 63 | 174.39 | 104.96 | 60 |
| | සහතික කළ II | 7 | 6 | 38.97 | 26.42 | 68 |

| මූලාශ්‍රය | බීජ පංතිය | 2012 | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | පිළි ගත් % |
| කොන්ත්‍රාත් වගාකරුවන් | අත්තිවාරම් I | 4.6 | 3.5 | 9.11 | 9.11 | 100 |
| | ලියාපදිංචි I | 81 | 52 | 9.92 | 3.64 | 37 |
| | සහතික කළ I | 736.6 | 548 | 159.09 | 80.77 | 51 |
| | සහතික කළ II | 22 | 20 | 3.64 | 0.81 | 23 |
| පෞද්ගලික වගාකරුවන් | ලියාපදිංචි I | 137 | 75 | 132.29 | 101.72 | 77 |
| | ලියාපදිංචි II | 13 | 8 | | | |
| | සහතික කළ I | 3734 | 3156 | 3265.79 | 2420.51 | 74 |
| | සහතික කළ II | 397 | 297 | 323.08 | 232.49 | 72 |
| | වාණිජමය | | | 22.06 | 4.25 | 19 |
| **එකතුව** | | **6116.7** | **4946** | **4907.21** | **3650.32** | |

2013 වර්ෂයේදී බිත්තර වී මෙ.ටො. 20,391ක නියැදි ගන්නා ලද අතර ඒවායින් බිත්තර වී මෙ.ටො. 13,700ක තත්ත්වමය ප්‍රමිති විද්‍යාගාර පරීක්ෂණ මගින් පිළි ගන්නා ලදී (වගු අංක 2.1.1.3). කොන්ත්‍රාත් වගා වැඩසටහන සමග කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ බිත්තර වී මෙ.ටො. 10,959ක් ද නිෂ්පාදනය කරන ලදී.

**වගු අංක 2.1.1.3: 2012 සහ 2013 වර්ෂවලදී පරීක්ෂා කර බලන ලද බිත්තර වී ප්‍රමාණයන් සහ පිළිගත් ප්‍රතිශතයන්**

| මූලාශ්‍රය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො.) | පිළිගත් % | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො.) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | 6.2 | 95 | 4.295 | 100 |
| රජයේ ගොවිපළ | 2,792 | 90 | 2,665.0 | 94 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 1,105 | 87 | 402.9 | 58 |
| පෞද්ගලික වගාකරුවන් | 7,443 | 75 | 17,319.1 | 63 |
| **එකතුව** | **11,346.2** | | **20,391.3** | |

## වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ සහතික කිරීම

වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද මුළු වගා බිම් ප්‍රමාණය හෙ. 1,088ක් වූ අතර එයින් 89%ක් සඳහා කොන්ත්‍රාත් වගාකරුවෝ දායක වූහ. බඩඉරිඟු, මුං, රටකජු, තල, කව්පි, කුරක්කන්, උඳු සහ සෝයා බෝංචි වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදන වැඩසටහනට ඇතුළත් කරන ලදී. විවිධ මූලාශ්‍ර සහ බීජ පංති යටතේ බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද වගා බිම් ප්‍රමාණයන් වගු අංක 2.1.1.4හි දැක්වේ. 2012 වර්ෂයට සාපේක්ෂව මෙවර වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද වගා බිම් ප්‍රමාණයේ 30%ක වර්ධනයක් පැවතිණි.

**වගු අංක 2.1.1.4: 2012 සහ 2013 වර්ෂවල වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය යටතේ පැවති වගා බිම් ප්‍රමාණයන්**

| මූලාශ්‍රය | බීජ පංතිය | 2012 | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | අභිජනන | 3.9 | 3.9 | 3.47 | 3.05 | 88 |
| රජයේ ගොවිපළ | අත්තිවාරම් I | 26 | 19 | 14.53 | 7.63 | 53 |
| | ලියාපදිංචි I | 58 | 24 | 32.7 | 20.66 | 63 |
| | ලියාපදිංචි II | 3 | 3 | | | |
| | සහතික කළ I | 12 | 9.5 | 3.04 | 3.04 | 100 |
| | සහතික කළ II | 1 | 0.8 | 2.91 | 2.73 | 94 |
| | දෙමුහුම් | 3.03 | 0.2 | 1.42 | 1.01 | 71 |
| | වාණිජමය | | | 1.82 | 1.82 | 100 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | අත්තිවාරම් | 5.3 | 3.5 | 3.4 | 1.98 | 58 |
| | ලියාපදිංචි I | 97.2 | 74.7 | 128.59 | 87.43 | 68 |
| | ලියාපදිංචි II | 6.2 | 6.2 | | | |
| | සහතික කළ I | 463 | 358 | 706.25 | 459.53 | 65 |
| | සහතික කළ II | 77.6 | 71.4 | 117.31 | 82.59 | 70 |
| | දෙමුහුම් | | | 1.42 | 1.42 | 100 |
| | වාණිජමය I | | | 16.92 | 8.62 | 51 |
| | වාණිජමය II | | | 3.64 | 2.63 | 72 |

| මූලාශ්‍රය | බීජ පංතිය | 2012 | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් % |
| පෞද්ගලික වගාකරුවන් | අත්තිවාරම් | 2.1 | 1.2 | | | |
| | ලියාපදිංචි I | 35.3 | 9 | | | |
| | සහතික කළ I | 38.2 | 24.8 | 38.87 | 38.5 | 99 |
| | සහතික කළ II | 2 | 1.4 | 0.4 | - | - |
| | වාණිජමය I | | | 11.48 | 5.71 | 50 |
| **එකතුව** | | **833.8** | **610.6** | **1088.17** | **728.35** | |

2013 වර්ෂයේ සමස්ත වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය මෙ.ටො. 446ක් වූ අතර නිෂ්පාදනයෙන් 77%ක් සහතික කරන ලදී. විවිධ මූලාශ්‍රවලින් පරීක්ෂා කර බලන ප්‍රමාණයන් සහ පිළිගත් ප්‍රතිශතයන් වගු අංක 2.1.1.5හි දැක්වේ.

**වගු අංක 2.1.1.5: 2012 සහ 2013 වර්ෂ තුළ පරීක්ෂා කර බලන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ප්‍රමාණයන්**

| මූලාශ්‍රය | 2012 | | 2012 | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් % | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | 0.2 | 100 | 0.9 | 100 |
| රජයේ ගොවිපළ | 35.5 | 88 | 27.0 | 85 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 289.6 | 95 | 408.2 | 76 |
| පෞද්ගලික වගාකරුවන් | 4.8 | 77 | 11.5 | 100 |
| **එකතුව** | **330.1** | | **446.7** | |

## එළවළු බීජ නිෂ්පාදනය සහතික කිරීම

එළවළු බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කළ වගාබිම් ප්‍රමාණය හෙ. 315ක් වූ අතර එයින් 69.5%ක් සඳහා පෞද්ගලික හා කොන්ත්‍රාත් වගාකරුවෝ දායක වූහ. විවිධ මූලාශ්‍ර හා බීජ පංති යටතේ ලියාපදිංචි කරන ලද වගා බිම් ප්‍රමාණයන් වගු අංක 2.1.1.6හි දැක්වේ.

තක්කාලි, බණ්ඩක්කා, මිරිස්, රතු ලූනු, ලොකු ලූනු, පතෝල, බෝංචි, වම්බටු,

කරවිල, රාබු, වැටකොළු, මාළුමිරිස්, මෑ, පිපිඤ්ඤා, වට්ටක්කා, තම්පලා, එළවළු කව්පි, දඹල, කොමඩු සහ පැපොල් බීජ නිෂ්පාදනය වැඩසටහනට ඇතුළත් කරන ලදී.

**වගු අංක 2.1.1.6: මූලාශ්‍රය හා බීජ පංතිය අනුව 2012 සහ 2013 වර්ෂවල එළවළු බීජ නිෂ්පාදන වගා බිම් ප්‍රමාණය පිළිබඳ සාරාංශය**

| මූලාශ්‍රය | බීජ පංතිය | 2012 | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | අභිජනන | 1.5 | 1.5 | 1.34 | 1.14 | 85 |
| රජයේ ගොවිපළ | මූලික | 17 | 12 | 26.32 | 26.28 | 99 |
| | සම්මත I | 26.7 | 20.5 | 34.42 | 30.35 | 88 |
| | දෙමුහුම් | 1.5 | 1.5 | 0.61 | 0.4 | 67 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | මූලික | 3.8 | 2.7 | 1.14 | 1 | 87 |
| | සම්මත I | 43.7 | 35.4 | 142.82 | 112.16 | 79 |
| | සම්මත II | 1.6 | 0.9 | 12.98 | 9.74 | 75 |
| පෞද්ගලික වගාකරුවන් | සම්මත I | | | 92.89 | 58.82 | 64 |
| | සම්මත II | 40.3 | 33.8 | 2.53 | 1.92 | 76 |
| | වාණිජමය | | | 0.65 | 0.65 | 100 |
| **එකතුව** | | **136.1** | **108.3** | **315.7** | **242.5** | |

වසර තුළ එළවළු මෙ.ටො. 69ක් සහතික කරන ලදී. විවිධ මූලාශ්‍ර යටතේ පරීක්ෂා කරන ලද ප්‍රමාණයන් සහ පිළිගත් ප්‍රමාණයන් වගු අංක 2.1.1.7හි දැක්වේ.

**වගු අංක 2.1.1.7: 2012 සහ 2013 වර්ෂවල එළවළු බීජ නිෂ්පාදන ප්‍රමාණයන්**

| මූලාශ්‍රය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් % | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | 00.2 | 99 | 0.5 | 100 |
| රජයේ ගොවිපළ | 8.4 | 92 | 6.0 | 95 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 26.4 | 98 | 32.4 | 94 |
| පෞද්ගලික වගාකරුවන් | 8.7 | 84 | 30.1 | 80 |
| **එකතුව** | **43.52** | | **69.0** | |

## බීජ අර්තාපල් සහතික කිරීම

විවිධ බීජ අර්තාපල් පංති යටතේ වගා කරන ලද බිම් ප්‍රමාණයන් වගු අංක 2.1.18හි දැක්වේ. බීජ අර්තාපල් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙ. 88ක් වූ අතර එක් ප්‍රචලිත අර්තාපල් ප්‍රභේදයක (ග්‍රැනෝල්ලා) බීජ අර්තාපල් මෙ.ටො. 730ක් සහතික කරන ලදී. වසර තුළ හේලීස් සමාගම සහ ගල්පාලම ගොවිපළ විසින් පූර්ව මූලික පංතිය යටතේ පෞද්ගලික බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම විශේෂිත බීජ අර්තාපල් වැඩසටහන යටතේ ආරක්ෂිත ගෘහ තුළ නිපදවන ලද කුඩා ආකන්ද 319,500ක් ද සහතික කරන ලදී.

**වගු අංක 2.1.1.8: 2012 සහ 2013 වර්ෂවල බීජ අර්තාපල් නිෂ්පාදනය යටතේ පැවති වගා බිම් ප්‍රමාණයන්**

| මූලාශ්‍රය | බීජ පංතිය | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් බිම් ප්‍රමාණය (හෙ.) |
| රජයේ ගොවිපළ | පූර්ව මූලික | 0.25 | 0.21 | 0.05 | 0.05 |
| | මූලික | 52.46 | 48.0 | 36.1 | 36.1 |
| | සහතික කළ | 11.51 | 11.42 | 29.6 | 29.0 |
| පෞද්ගලික වගාකරුවන් | පූර්ව මූලික | | | 0.04 | 0.04 |
| | මූලික | | | 0.2 | 0.2 |
| | සහතික කළ | 22.06 | 22.06 | 22.9 | 22.9 |
| **එකතුව** | | **86.28** | **81.69** | **88.89** | **88.29** |

## බීජ පරීක්ෂාව

තත්ත්වය සහතික කිරීම සඳහා බීජ නියැදි 13,003ක් පේරාදෙණිය, මහ ඉලුප්පල්ලම, අලුත්තරම සහ බටඅත පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තු බීජ පරීක්ෂණ විද්‍යාගාරවලදී පරීක්ෂාවට ලක් කෙරිණි.

## බීජ ස්වස්ථතා පරීක්ෂණ ඒකකය

### කැපී පෙනෙන සිදුවීම්

- බීජ මගින් පැතිරෙන ව්‍යාධිජනකයෙකු (*Colletotrichum lindemuthianum*) හේතුවෙන් වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් රෝගය බෝංචි බීජවල ඇතිදැයි සොයා ගැනීම සඳහා තාක්ෂණයක් (Paper towel technique) ජනනය කරන ලදී.
- ඕල්ටර්නේරියා පැඩ්විකි (*Alternaria padwickii*), හෙල්මින්තොස්පොරියම් ඔරයිසේ (*Helminthosporium oryzae*) සහ පයිරිකියුලේරියා ඔරයිසේ (*Pyricularia oryzae*) වීවල බීජ මගින් පැතිරෙන ව්‍යාධිජනක වේ. මෙම දිලීර වර්ග 3 වැඩි වශයෙන්ම බීජාවරණයේ සහ ඵලවරණයේ පවතින බව නිරීක්ෂණය කිරීමට ලැබී ඇත.

- අනුරාධපුර ප්‍රදේශයෙන් වාර්තා වූ සෝයා බෝංචි බීජවල දම් පැහැ පැල්ලම් ඇතිවීම බීජ මගින් පැතිරෙන දිලීරයක් (*Cercospora kikuchii*) හේතුවෙන් වැළදෙන ‘බීජවල දම් පැහැ පැල්ලම් ඇතිවීමේ රෝගය’ වශයෙන් හඳුනා ගැනිණි.

## පර්යේෂණ වැඩසටහන්

- වීවල බීජ අවපැහැ ගැන්වීම බීජ ප්‍රරෝහණය, බීජ පැළවල ශක්තිමත්බව සහ බීජ ස්වස්ථතාව කෙරෙහි බලපාන ආකාරය තක්සේරු කිරීම
- ගබඩා කළ එළවළු බීජවල ස්වස්ථතාව කෙරෙහි බීජ මගින් පැතිරෙන ව්‍යාධිජනක විසින් ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයන
- වීවල බීජ මගින් පැතිරෙන ව්‍යාධිජනක සම්බන්ධයෙන් බීජ ස්වස්ථතාව සොයා ගැනීමේ ක්‍රම බිහි කිරීම
- වීවල බීජ මගින් පැතිරෙන ව්‍යාධිජනක තුරන් කර දැමීමේ ප්‍රතිකර්මවල සාර්ථකත්වය පිළිබඳ අධ්‍යයන
- ප්‍රධාන බෝගවල බීජ මගින් පැතිරෙන දිලීරමය ව්‍යාධිජනක හඳුනා ගැනීම

## විශේෂ ව්‍යාපෘති

- ආසියානු කලාපයේ සංක්‍රමණික රෝග හා කෘමි පළිබෝධවලට අදාළ වසංගත විද්‍යා තොරතුරු හුවමාරු ක්‍රමයක් නිර්මාණය කිරීම පිණිස සහයෝගයෙන් කටයුතු කිරීම, ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා වැඩසටහන, කොරියාව

## රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම

රජයේ සහ පෞද්ගලික පැළ තවාන්වල නිපදවන ලද පලතුරු පැළ 872,472ක් සහතික කර ලේබල් කරන ලද අතර (වගු අංක 2.1.1.9) එය 2012 වර්ෂයට සාපේක්ෂව 40%ක වර්ධනයකි.

**වගු අංක 2.1.1.9: 2012 සහ 2013 වර්ෂවල සහතික කරන ලද බද්ධ පලතුරු පැළ සංඛ්‍යාව**

| විශේෂය | සහතික කරන ලද පැළ සංඛ්‍යාව | |
|---|---|---|
| | **2012** | **2013** |
| අඹ - බද්ධ කරන ලද | 263,745 | 414,950 |
| රඹුටන් - බද්ධ කරන ලද | 105,640 | 135,698 |
| දොඩම් - බද්ධ කරන ලද | 236,014 | 312,075 |
| අලිපේර | 7,233 | 950 |
| දූරියන් | 1,716 | 1,271 |
| වරකා | 7,513 | 5,368 |
| පෙයාර්ස් | | 2,160 |
| **එකතුව** | **621,861** | **872,472** |

## පැළ තවාන් ලියාපදිංචි කිරීම

2013 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද පැළ තවාන් සංඛ්‍යාව 350කි.

## මව් ශාක සහතික කිරීම

2013 වර්ෂයේදී අඹ, රඹුටන්, පැඟිරි සහ කොස් මව් ශාක 346ක් තෝරාගෙන ලියාපදිංචි කරන ලදී.

**වගු අංක 2.1.1.10: 2012 සහ 2013 වර්ෂවල ලියාපදිංචි කරන මව් ශාක සංඛ්‍යාව**

| ශාක විශේෂය | ලියාපදිංචි කරන ලද ශාක සංඛ්‍යාව | |
|---|---|---|
| | **2012** | **2013** |
| අඹ - බද්ධ කරන ලද | 242 | 08 |
| රඹුටන් - බද්ධ කරන ලද | 43 | 269 |
| පැඟිරි | 75 | 66 |
| වරකා | 26 | 03 |
| **එකතුව** | **386** | **346** |

## පසු පාලන පරීක්ෂාව

බීජ නියැදි 1,268ක් ඇගයීම සඳහා පසු පාලන පරීක්ෂා සිදු කෙරිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික කරන ලද බීජ නියැදි ද විවිධ බෝග ප්‍රභේදවලට අයත් ආනයනය කළ බීජ ද බීජ අර්තාපල් ද මෙතුළ අන්තර්ගත විය. විවිධ බෝග කාණ්ඩ යටතේ සිදු කරන ලද පසු පාලන පරීක්ෂාවන් සංඛ්‍යාව වගු අංක 2.1.1.11හි දැක්වේ.

**වගු අංක 2.1.1.11: පරීක්ෂා කර බලන ලද පසු පාලන නියැදි සංඛ්‍යාව**

| බෝග කාණ්ඩය | පරීක්ෂා කරන ලද බීජ නියැදි සංඛ්‍යාව |
|---|---|
| වී | 109 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 317 |
| එළවළු | 523 |
| අර්තාපල් | 318 |
| පලතුරු | 1 |
| **එකතුව** | **1,268** |

## විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කිරීම

ගන්නොරුව පසු පාලන ක්ෂේත්‍රයේදී විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා වී ප්‍රභේද 21ක් (At 676, Ld 3-6-12, Bg 3R, At 06-631, පොකුරු සම්බා, Ld 1-5-15, CIC 3-1, Bg 5-15-31, Bg 4-2236, Bg 11-139, Bg 5-110, At 4-186, At 5-1382, Bw 5-1621, Bg 465, Ld 8-6-7, Bg 4-91, සුදුරු, Bg 96-741, Bw 452, At 7-800) අත්හදා බලන ලද අතර එළවළු ප්‍රභේද 12ක් ද වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 40ක් ද මුල් හා ආකන්ද බෝග 1ක්ද අත්හදා බලන ලදී. අදාළ වර්ෂය තුළ වී ප්‍රභේද 15ක, එළවළු ප්‍රභේද 8ක සහ වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 11ක විශේෂත්ව, ඒකාත්මිකතා සහ ස්ථායිතා පරීක්ෂාව නිම කෙරිණි.

**වගු අංක 2.1.1.12: පවත්වන ලද විශේෂත්ව, ඒකාත්මිකතා සහ ස්ථායිතා පරීක්ෂණ සංඛ්‍යාව**

| බෝග කාණ්ඩය | පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව | නිම කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|
| වී | 21 | 15 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 40 | 11 |
| එළවළු | 12 | 8 |
| මුල් හා ආකන්ද බෝග | 1 | 1 |
| **එකතුව** | **74** | **36** |

## බීජ පනත ක්‍රියාත්මක කිරීම

මෙරට කෘෂිකර්මාන්තයේ වැදගත් අංශයක් වන බීජ කර්මාන්තයට හානි කරන අයථා කටයුතුවලින් ගොවියා මෙන්ම බීජ හසුරුවන්නා ද ආරක්ෂා කර ගැනීමේ අරමුණෙන් 2008 වර්ෂයේ මුල සිට 2003 අංක 22 දරන බීජ පනත ක්‍රියාත්මක කර ලදී. 2008 වර්ෂයේ සිට බීජ පනත යටතේ බීජ හසුරුවන්නෝ 5,700ක් පමණ ලියාපදිංචි කරන ලදහ. වසර තුළ බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 1,141දෙනෙකු ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචිය අලුත් කිරීම් 858ක්ද සිදු කර ඇත. ලියාපදිංචි කිරීම් සහ ලියාපදිංචිය අලුත් කිරීම් තුළින් එක්රැස් කර ගන්නා ලද ආදායම රු. මිලියන 1.127කි.

මෙම අංශය සම්බන්ධයෙන් පැමිණිලි 12ක් ලැබුණු අතර ඒවා සම්බන්ධ විමර්ශන කටයුතු සිදු කර ගොවීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

වත්මන් තත්ත්වය පිළිබඳ තක්සේරු කිරීම සහ අලෙවියට පෙර බීජ හා රෝපණ ද්‍රව්‍ය කටයුතු නිසි ලෙස හැසිරවීම පිළිබඳව ඔවුන්ට උපදෙස් ලබාදීම පිණිස බීජ හසුරුවන්ගේ පරිශ්‍ර සම්බන්ධයෙන් අහඹු ලෙස විමර්ශන 773ක් සිදු කරන ලදී. බීජ පනත පරිච්ඡින්න කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සහ නව පනතක් සඳහා විධිවිධාන සකස් කිරීම පිණිස බීජ කර්මාන්තයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පවත්වන ලදී. අවසානයේදී නව යෝජනාව අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කිරීම සඳහා භාෂා 3න්ම කෘෂිකර්ම අමාත්‍යාංශයට යවන ලදී. නව යෝජනාව සම්බන්ධ මහජන ප්‍රතිචාර සලකා බැලීම සඳහා එය කෘෂිකර්ම දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කර ඇත. යෝජිත බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත සඳහා විධිවිධාන කෙටුම්පත සකස් කිරීම පිණිස වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

බීජ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කඳුරට සේවයේ සහ වයඹ සේවයේ මාධ්‍ය වැඩසටහන් විකාශනය කෙරිණි. බීජ පනත ක්‍රියාත්මක කිරීම සඳහා නිපුණතාව සහිත නිලධාරීහු 68දෙනෙක් බලය ලත් නිලධාරීන් වශයෙන් පත් කරන ලදහ.

## සහතික කළ එළවළු බීජ නිෂ්පාදන ක්‍රමය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය මගින් එළවළු නිෂ්පාදනය සම්බන්ධයෙන් පුහුණුව ලබාදීම - 2013, ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය

ප්‍රධාන වශයෙන්ම ක්ෂේත්‍රයේදී කාර්යස්ථ පුහුණුව ලබාදීම මගින් තත්ත්වමය අංශවලට අදාළව නිසි දැනුම බෙදාදීම සහ එළවළු බීජ නිෂ්පාදනය හා සහතික කිරීම පිළිබඳ තාක්ෂණික ක්‍රම ඉගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී (වගු අංක 2.1.1.13).

**වගු අංක 2.1.1.13: එළවළු බීජ ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීම**

| පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | රාජ්‍ය අංශය | පෞද්ගලික අංශය | එකතුව |
| බීජ පරීක්ෂණ පටිපාටි | 134 | - | 134 |
| ක්ෂේත්‍ර පරීක්ෂා හා නියැදි ගැනීම | | | |
| 2013 යල කන්නය | 176 | 111 | 287 |
| 2013/14 මහ කන්නය | 179 | 63 | 142 |
| බීජ ස්වස්ථතා පරීක්ෂාව | 01 (විදේශීය) | - | 01 |

2013 වර්ෂයේදී (2013 යල කන්නය) ප්‍රධාන වශයෙන්ම කුණ්ඩසාලේ හා අලුත්තරමහිදී ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සි එළවළු බීජ ව්‍යාපෘතිය මගින් ක්ෂේත්‍ර ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පවත්වන ලදී. නිකවැරටිය ප්‍රදේශය 2013/14 මහ කන්නයේදී මෙම වැඩසටහන්වලට සම්බන්ධ විය. එහි ප්‍රතිඵලයක් ලෙස එළවළු බීජ සහතිකකරණ ක්‍රියාවලිය වැඩිදියුණු විය.

2013 අගෝස්තු මාසයේදී 69දෙනකුගේ සහභාගිත්වයෙන් බීජ නිෂ්පාදනය සහ සහතිකකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

2013 වර්ෂයේදී පේරාදෙණිය, අලුත්තරම හා මහ ඉලුප්පල්ලම බීජ පරීක්ෂණ විද්‍යාගාර සඳහා ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය විසින් රු. මිලියන 6ක වටිනාකමැති විද්‍යාගාර උපකරණ සහ විද්‍යාගාර රසායන ද්‍රව්‍ය ලබාදිණි.

### පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්

පහත දැක්වෙන අංශ සම්බන්ධයෙන් පර්යේෂණ අධ්‍යයන පැවැත්විණි.

- පලතුරු පැළ සහතික කිරීමේ වැඩසටහන සම්බන්ධ එදිනෙදා ගැටලු සඳහා විද්‍යාත්මක විසඳුම් සොයා ගැනීම
- බණ්ඩක්කා බීජ නිෂ්පාදනය සඳහා කරල් නෙළීමට සුදුසුම කාල පරාසය නිශ්චය කිරීම
- රාබුවල බීජ අස්වැන්න සහ බීජවල තත්ත්වය කෙරෙහි මුල්වල ප්‍රමාණය (Steckling Size) සහ වපුරන කාලය බලපාන අන්දම

### පුහුණු වැඩසටහන්

උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ නිලධාරීන්ගේ හා බීජ හසුරුවන්නන්ගේ දැනුම පුළුල් කිරීම සඳහා බීජ සහතික කිරීමේ සේවය අඛණ්ඩව පුහුණු වැඩසටහන් පැවැත්වීය. බීජ ගොවීන්/ තවාන්කරුවන්, රාජ්‍ය අංශයේ නිලධාරීන්, පෞද්ගලික අංශයේ නිලධාරීන් සහ බීජ හසුරුවන්නන් සඳහා පුහුණු වැඩසටහන් 1,867ක් පවත්වන ලදී.

### විදේශීය පුහුණුව

ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියේ සහයෝගිතාව මත එක් නිලධාරියෙක් බීජ ස්වස්ථතා පරීක්ෂාව සම්බන්ධයෙන් ජපානයේදී පුහුණුව ලැබීය.

### බීජ සහතික කිරීමේ සේවයේ දත්ත මූල කළමනාකරණ ක්‍රමය

බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රාදේශීය කාර්යාලවල මාසික වැඩ කොටස විශ්ලේෂණය කිරීම සඳහා ජාවා මෘදුකාංගය (Java system) යොදා ගනිමින් MySQL දත්ත මූල කළමනාකරණ ක්‍රමය මගින් පෞද්ගලික පරිගණකය පදනම් කරගත් නව දත්ත මූලයක් නිර්මාණය කෙරිණි.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- සහතික කළ බීජ පිළිබඳ ජාතික බිත්තර වී අවශ්‍යතාවෙන් 30%ක් සපුරාලීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බීජ සහතික කිරීමේ සේවය බල ගැන්වීම
- විශේෂයෙන්ම බීජ ඇසුරුම් කිරීම, ගබඩා කිරීම සහ කල් ඉකුත්වීමේ දින පිළිබඳව බීජ හසුරුවන්නන්ට මතු වන පසු අස්වනු ගැටලු සම්බන්ධයෙන් බීජ පර්යේෂණ සිදු කිරීම පිණිස බීජ පර්යේෂණ ඒකකය ස්ථාපිත කිරීම
- මහජනයා දැනුවත් කිරීම, බීජ සහතික කිරීමේ වැඩසටහන පිළිබඳ තොරතුරු බෙදා හැරීම වැඩිදියුණු කිරීම සහ මෙම සේවයට කඩිනමින් හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි අන්දමට බීජ සහතික කිරීමේ සේවා තොරතුරු අඩවිය සැලසුම් කිරීම

- බීජ කර්මාන්තයේ පවතින අයථා කටයුතු වළක්වා ලද අතරම මෙරට උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බීජ හසුරුවන්නන් අතර බීජ නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා බීජ පනත ක්‍රියාත්මක කිරීම
- සියලුම බීජ හසුරුවන්නන් අතර බෙදා හැරීම සඳහා උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ බෝග මාර්ගෝපදේශ සකස් කර ප්‍රකාශයට පත් කිරීම
- ඒ ඒ කන්නය තුළ බීජ නිෂ්පාදකයින්ගේ නාමවලියක් සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයින්ගේ නාමාවලියක් පිළියෙල කර බෙදා හැරීම
- අලුතින්ම සංශෝධනය කරන ලද බීජ පනත සහ විධිවිධාන පිළිබඳ කටයුතු අවසන් කර ඒවා ප්‍රසිද්ධ කිරීම
- කුණ්ඩසාලේ බීජ සහතික කිරීමේ සේවා ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි ඉදිකර අවසන් කිරීම
- පරන්තන්හි පිහිටි නව බීජ පරීක්ෂණ විද්‍යාගාරය සහ කාර්යාල සංකීර්ණය ද මාතර සහ යාපනයේ පිහිටි බීජ සහතික කිරීමේ සේවා ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි ද ඉදි කිරීම
- අභිජනන බීජ තොගවල සිට සහතික කළ බීජ තොග දක්වා වන බීජ තොග හඳුනා ගැනීම සඳහා නව දත්ත මූල ක්‍රමයක් නිර්මාණය කිරීම
- කාර්ය මණ්ඩල සහ උපකරණ ලබාදී සියලුම බීජ සහතික කිරීම් සේවා ඒකක ශක්තිමත් කිරීම
- බීජ පර්යේෂණ හා බීජ ස්වස්ථතා පරීක්ෂණ ඒකකය සඳහා ජෛව තාක්ෂණික ඒකකයක් ස්ථාපිත කිරීම
- බීජ සහතික කිරීමේ සේවය දිවයින පුරා විසිරී ඇති ප්‍රාදේශීය කාර්යාල 23කින් බීජ පරීක්ෂණ විද්‍යාගාර 4කින් සහ පසු පාලන ක්ෂේත්‍ර 4කින් සමන්විත සංකීර්ණ පරිපාලන ව්‍යුහයක් වන අතර බීජ සහතික කිරීම, පලතුරු පැළ සහතික කිරීම සහ බීජ පනත වශයෙන් ප්‍රධාන වැඩසටහන් 3ක් දියත් කරයි. මෙම ආයතනය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂවරයෙකු / අතිරේක අධ්‍යක්ෂවරයෙකු විසින් පාලනය කරනු ලැබීම පිණිස ප්‍රතිව්‍යුහගත කළ යුතුය.

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී/ සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ නිලධාරි) | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 03 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 14 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 06 |
| වැඩසටහන් සහකාර | 02 |
| උපාධිධාරී අභ්‍යාසලාභී | 03 |
| කෘෂිකර්ම උපදේශක | 112 |
| පර්යේෂණ සහකාර | 01 |
| පර්යේෂණ උප සහකාර | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 09 |
| රියදුරු | 19 |
| විදුලි ශිල්පි | 01 |
| මුරකරු | 37 |
| කම්කරු | 48 |
| බීජ කාර්මික | 10 |
| බීජකරු | 30 |
| ගබඩාකරු | 03 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 03 |
| තාක්ෂණ ශිල්පි | 03 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| **එකතුව** | **312** |

## 2.1.2 පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නොරුව

පැළෑටි සංරක්ෂණ සේවය පළමුවෙන්ම ස්ථාපිත කරන ලද්දේ 1991 වර්ෂයේදී වන අතර මෙහි ප්‍රධාන අරමුණ වනුයේ කෘෂිකාර්මික වැදගත්කමක් සහිත පැළෑටිවල ස්වස්ථතාව සහතික කිරීම පිණිස පරිසර හිතකාමී, ආර්ථිකමය වශයෙන් වාසිදායක සහ ප්‍රායෝගිකව භාවිත කළ හැකි පළිබෝධ කළමනාකරණ ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමයි.

දැනට ඇති පළිබෝධ කළමණාකරණ ක්‍රම වැඩිදියුණු කිරීම, ස්ථිර බෝග සායන වැඩසටහන, විදේශීය ආක්‍රමණික ජලජ පැළෑටි පාලනය කිරීම පිණිස ජෛව පාලන කාරකයන් බෝකර මුදා හැරීම, පළිබෝධ/රෝග පැතිරීම පාලනය, ධූමකරණය තුළින් බීජ තොග ගබඩාවල සිටින පළිබෝධ කළමණාකරණය සහ පළිබෝධනාශක පිළිබඳ පර්යේෂණ කරන අතරම ක්ෂේත්‍ර මට්ටමේ සමෝධානික පළිබෝධ කළමණාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම සහ ඇගයීම මගින් මෙම ආයතනයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් සපුරාලනු ලැබේ. එමෙන්ම, ජලජ වල් පැළෑටි හා අනෙකුත් ආක්‍රමණශීලී ශාක ඇතුළු අනවශ්‍ය වෘක්ෂලතාදිය මගින් කෘෂිකාර්මික පරිසරයන් කෙරෙහි ඇති කරන බලපෑම අවම කිරීම, නිලධාරින් හා ගොවීන් පුහුණු කිරීම, නියමු මට්ටමින් නව පළිබෝධනාශක ඇගයීම සහ පැළෑටි ස්වස්ථතාව සහතික කිරීම සඳහා නිර්දේශිත පළිබෝධනාශකවල අනුරූපී කාර්යක්ෂමතාව තක්සේරු කිරීම පැළෑටි සංරක්ෂණ සේවයට වගකීම පැවරී ඇති මූලික කාර්යයන් වේ.

යථෝක්ත කාර්යයන් තුළ, 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත මගින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි මෙරට පැළෑටි සංරක්ෂණය හා සම්බන්ධ සියලුම නියාමන ක්‍රියාමාර්ග ඇතුළත් වන අතර එම කාර්යයන් ගොවි ක්ෂේත්‍රවල නව පැළෑටිනාශක නියමු මට්ටමින් ඇගයීම මගින් 1981 පළිබෝධනාශක පනතෙහි ඇති යම් යම් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සහායක් වේ.

### අයවැය

**වගු අංක 2.1.2.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 2,039,840 | 1,902,172 | 93 |
| මූලධන | 2,150,000 | 1,524,140 | 71 |
| ස්ථිර බෝග සායන වැඩසටහන | 500,000 | 471,103 | 94 |
| **එකතුව** | **4,689,840** | **3,897,415** | **83** |

## ප්‍රගතිය

### 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම

පෙර වසරවලදී පත් කරන ලදුව දැනට විශ්‍රාම ගොස් හා ස්ථාන මාරු වී ගොස් සිටින බලයලත් නිලධාරීන් වෙනුවට නිලධාරීන් 65ක් අලුතින් පත් කරන ලදී. මෙම නව බලයලත් නිලධාරීන් 65 අතරින් නිලධාරීහු 36දෙනෙක් වැලිගම පොල් පත්‍ර මැලවීමේ රෝගය පාලනය කිරීම සඳහා සෘජුව පත් කරන ලදහ. නිලධාරින් 65 දෙනාටම පහත සඳහන් අංශ පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.

- 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ නීතිමය පසුබිම
- ක්ෂේත්‍ර මට්ටමෙන් පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාවේ නිරෝධායන වැදගත්කමක් සහිත නව පළිබෝධ

### ස්ථිර බෝග සායන වැඩසටහන

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් 2013 මාර්තු මාසයේ සිට ස්ථිර බෝග සායන වැඩසටහන පැළෑටි සංරක්ෂණ සේවයට පවරන ලදී. එය එක්සත් රාජධානියේ කෘෂි ජෛව විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික මධ්‍යස්ථානය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අතර සහයෝගිතා වැඩසටහනකි.

ස්ථිර බෝග සායන වැඩසටහන ස්ථාපිත කර කළමනාකරණය කිරීම සඳහා හැකියා වර්ධනය කිරීම මගින් ජාතික පැළෑටි ස්වස්ථතා ක්‍රමය ශක්තිමත් කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. කෘෂි ජෛව විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික මධ්‍යස්ථානය සමග ඇති මෙම හවුල තුළින් ඵලදායිතාව වර්ධනය කෙරෙන තිරසාර කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය ද සුළු ගොවීන්ගේ ජීවන තත්වය වැඩිදියුණුවීම ද ජෛව විවිධත්වය ආරක්ෂාවීම ද සිදුවනු ඇත.

බෝග සායන කළමනාකරණය කිරීමේදී ජාතික හවුල්කරුවන් සමග කටයුතු කිරීමේ වගකීම, වගකිව යුතු ජාතික ආයතනය වශයෙන් පැළෑටි සංරක්ෂණ සේවයට පැවරී ඇත. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පැළෑටි සංරක්ෂණ) ස්ථිර බෝග සායන වැඩසටහනෙහි සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් ක්‍රියා කරයි.

ස්ථිර බෝග සායන වැඩසටහනෙහි විශේෂ සිදුවීම් සමහරක් පහත දැක්වේ.

පර්යේෂණ හා ව්‍යාප්ති අංශවලින් තෝරා ගන්නා ලද ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීහු 20දෙනෙක් පහත සඳහන් අංශ සම්බන්ධයෙන් මොඩියුල 1, 2, 3 හා 4ට අදාළව ප්‍රධාන පුහුණුකරුවන් වශයෙන් පුහුණු කරන ලදහ.

- ශාක වෛද්‍යවරයෙකු වන්නේ කෙසේද?
- පැළෑටි ස්වස්ථතා ගැටලු කළමනාකරණය
- තාක්ෂණික ලේඛකයෙකු වන්නේ කෙසේද? සහ විෂ කාණ්ඩය අනුව පළිබෝධනාශක ලැයිස්තු ගත කරන්නේ කෙසේද? (Preparation of green & yellow lists)
- බෝග සායන මෙහෙයවීම හා ඇගයීම

පැළෑටි වෛද්‍යවරුන් ලෙස 229දෙනෙකු පුහුණු කර දිස්ත්‍රික්ක 10ක (මහනුවර, අනුරාධපුරය, හම්බන්තොට, රත්නපුරය, පොළොන්නරුව, කිලිනොච්චිය, මන්නාරම, යාපනය, මුලතිව් සහ වව්නියාව) ස්ථිර බෝග සායන 254ක් ස්ථාපිත කරන ලදී. අතිරේක ලේකම්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ මණ්ඩලය, කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රමයේ පළාත් අධ්‍යක්ෂවරුන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් මෙම ස්ථිර බෝග සායන වැඩසටහනෙහි

සමාලෝචනය හා ඉදිරි ගමන පිළිබඳ වැඩමුළුවක් මහනුවර ටොපැස් හෝටලයේදී පවත්වන ලදී.

### සමෝධානික පළිබෝධ කළමනාකරණය හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම

පළිබෝධනාශක භාවිතය අවම කිරීම හා රසායනික නොවන පළිබෝධ කළමනාකරණ ක්‍රමෝපාය ප්‍රවර්ධනය කිරිම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සමෝධානික පළිබෝධ කළමනාකරණය හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සම්බන්ධයෙන් ව්‍යාප්ති නිලධාරීන්ගේ සහ ගොවි ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම පිණිස මෙය ක්‍රියාවට නැංවිණි. මේ සඳහා වී, එළවළු හා කොළ එළවළු යන ප්‍රධාන බෝග කාණ්ඩ 3 තෝරා ගන්නා ලදී.

- **වී වගාවේ සමෝධානික පළිබෝධ කළමනාකරණය/ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ වැඩසටහන**

  විවිධ ස්ථානවලදී ව්‍යාප්ති නිලධාරී පුහුණු වැඩසටහන් 21ක් පවත්වන ලද අතර ඒ තුළින් නිලධාරිහු 680දෙනෙකු පුහුණු කරන ලදහ. අනුරාධපුරය සහ මුලතිව් යන දිස්ත්‍රික්ක තුළ ගොවි ක්ෂේත්‍ර පාසල් 2ක් ද ස්ථාපිත තරන ලදී. මෙම ගොවි ක්ෂේත්‍ර පාසැල් ප්‍රධාන වශයෙන්ම කන්නය පුරා දින 14ක කාලයක් තුළ ලබාදුන් පුහුණුව මත පදනම් විය. මෙමගින් අරමුණු කරන ලද්දේ ගොවි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ ඒ ඒ වර්ධන අදියරෙහි ඇතිවන පළිබෝධ හඳුනා ගැනීම සහ විවිධ වූ පරිසර හිතකාමී ප්‍රායෝගික ක්‍රමෝපාය මගින් පළිබෝධ ගහනය කළමනාකරණය කිරීමයි. කෘෂි පරිසර පද්ධතීන්හි හිඳින පළිබෝධයින්ගේ ස්වභාවික සතුරන් සංරක්ෂණ කිරීම සහ ආර්ථිකමය වශයෙන් හානිදායක මට්ටමට ළඟා වීමට පෙර පළිබෝධ ගහනය කළමනාකරණය කිරීම ද මෙහිදී ඉලක්ක කෙරිණි.

- **එළවළු වගාවේ සමෝධානික පළිබෝධ කළමනාකරණය/ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ වැඩසටහන**

  එළවළු වගාව සඳහා අඩු පිරිවැයැති, පරිසර හිතකාමී එමෙන්ම ප්‍රායෝගික සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලා බිහිකර ඒවා ව්‍යාප්ති නිලධාරීන් හා ගොවීන් අතර ප්‍රවර්ධනය කිරීම පිණිස මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. විවිධ ස්ථානවලදී ව්‍යාප්ති නිලධාරී පුහුණු 11ක් පවත්වන ලද අතර එහිදී නිලධාරීන් 518දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී. ගොවි පුහුණු වැඩසටහන් 8ක් සංවිධානය කර ගොවීන් 658දෙනෙකුට ද පුහුණුව ලබා දිණි. මෙම තාක්ෂණය ප්‍රවර්ධන කිරීම පිණිස ගුවන් විදුලි වැඩසටහන් 2ක් ද විකාශනය කෙරිණි.

- **කොළ එළවළු වගාවේ සමෝධානික පළිබෝධ කළමනාකරණය/ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ වැඩසටහන**

  මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන්ම බස්නාහිර පළාතට සංකේන්ද්‍රණය කරන ලද අතර පැළෑටි සංරක්ෂණ සේවයේ බෝඹුවල අංශය මගින් සංවිධානය කෙරිණි. මෙමගින් අදාළ ගොවීන් 245දෙනකුට පුහුණුව ලබා දෙන ලදී.

### වල් පැළෑටිනාශක නියමු මට්ටමින් අත්හදා බැලීම

නව වල් පැළෑටිනාශක 6ක් ඒවායෙහි ජෛව කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ගොවි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ ඇගයීමට ලක් කරන ලද අතර ඉලක්ක

කළ විශේෂිතත්වය හා වඩා අඩු ප්‍රමාණයන්ගෙන් යෙදීම සම්බන්ධයෙන් එම වල් පැළෑටිනාශක දැනට නිර්දේශිත වල් පැළෑටිනාශකවලට වඩා හොඳින් ක්‍රියාකාරී විය. නිර්දේශිත වල් පැළෑටිනාශක 4ක් ඒවායෙහි කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් යළි අත්හදා බලන ලදී.

## ජලජ වල් පැළෑටි ජෛව විද්‍යාත්මකව පාලනය කිරීමේ වැඩසටහන

සැල්වීනියා (*Salvinia molesta*) සඳහා සර්ටොබැගස් සැල්වීනියේ (*Cyrtobagous salviniae*) සහ ජපන් ජබර (*Eichhornia crassipes*) සඳහා නියොකෙටිනා බ්‍රැයිචි (Neochetina bruichi) සහ නියොකෙටිනා අයිච්හෝනියේ (*Neochetina eichhorniae*) යන ජෛව පාලන කාරකයින්ගේ වර්ධිතයන් පැළෑටි සංරක්ෂණ සේවය විසින් නඩත්තු කෙරෙමින් පවතී. රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතන විසින් කරන ලද ඉල්ලීම් අනුව, මෙම ජෛව පාලන කාරකයින් ජලාශවලට හඳුන්වා දෙන ලදී. මෙම එක් එක් අවස්ථාවේදී මුදා හරින ලද ජෛව පාලන කාරකයින්ගේ ජීවන චක්‍රය සහ ඉලක්ක ගත වල් පැළෑටිය සම්බන්ධයෙන් ක්‍රියාකාරී වන ආකාරය පිළිබඳව අදාළ ස්ථානයේදී පාර්ශ්වකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන යටතේ, අම්පාර, අනුරාධපුරය, රත්නපුරය, පොළොන්නරුව, කුරුණෑගල සහ මාතලේ යන දිස්ත්‍රික්කවල වල් පැළෑටි ආසාදිත ජලාශ 14කට ජෛව පාලන කාරකයින් හඳුන්වා දෙන ලදී.

යථෝක්ත වල් පැළෑටි ජෛව විද්‍යාත්මකව පාලන කිරීම පිළිබඳව පත්‍රිකා 10,000ක් පමණ අම්පාර ‘දැයට කිරුළ’ ප්‍රදර්ශනයේදී සහ වාරියපොළ ‘ගොවි සතිය’ ප්‍රදර්ශනයේදී බෙදා හරින ලදී.

### කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළවල බීජ ගබඩා ධූමකරණය කිරීමට තාක්ෂණික සහාය ලබාදීම

අම්බලන්තොට, පැල්වෙහෙර, පොළොන්නරුව, කන්තලේ, මුරුන්කන්, කිලිනොච්චිය, මහ ඉලුප්පල්ලම, නිකවැරටිය හා අලුත්තරම පිහිටි රජයේ ගොවිපළවල ගබඩා පළිබෝධ පාලනය කිරීම පිණිස මෙ. ටො. 898.4ක බීජ තොග ධූමකරණයට ලක් කෙරිණි. ධූමකරණයේ ඵලදායකත්වය ඉහළ නැංවීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ ගොවිපළවලට අනුයුක්ත නිලධාරීන් 140කට ගබඩා පළිබෝධ කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබාදිණි. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ගෘහස්ථ පළිබෝධ පාලන වැඩසටහනක් ද පවත්වන ලදී.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයන්හි වේයන් කළමනාකරණය කිරීම සඳහා තාක්ෂණික මග පෙන්වීම

වේයන් කළමනාකරණය පිළිබඳ වැඩසටහන් 3ක් ගන්නොරුව, මහ ඉලුප්පල්ලම සහ අඟුණකොළපැලැස්ස යන ස්ථානවලදී පවත්වන ලද අතර ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලින් නිලධාරීහු 140දෙනෙක් සහභාගි වූහ.

## වී වගාවේ ක්ෂේත්‍ර මීයන් කළමනාකරණය සඳහා තාක්ෂණික මග පෙන්වීම

මහනුවර දිස්ත්‍රික්කයේ වී වගාවේ ක්ෂේත්‍ර මීයන් කළමනාකරණය කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්

20දෙනෙකුට සහ ගොවීන් 303දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී.

### ආක්‍රමණශීලී වල් පැළෑටි පාලනය සඳහා තාක්ෂණික සහාය ලබාදීම

ප්‍රදේශ රැසක පාතීනියම් (*Parthenium hysterophorus*), ඇලිගේටර් (*Alternanthera philoxeroides*), යෝධ නිදිකුම්බා (*Mimosa pigra*), ගඳපාන (*Lantana camara*) සහ අරුණෝදේවි වැනි ආක්‍රමණශීලී වල් පැළෑටි පාලන කිරීමේ වැඩසටහන් සඳහා තාක්ෂණික වශයෙන් සහාය දෙන ලදී. උතුරු පළාතේ හෙ. 75ක පාතීනියම් වල් පැළෑටිය පාලනය කිරීම 2013 වර්ෂයේ වඩාත්ම කැපී පෙනෙන සිදුවීම විය. ප්‍රදර්ශනවලදී පෝස්ටර් 300ක් ද පත්‍රිකා 1000ක් ද බෙදා හරින ලදී.

### අනතුරුදායක කෘෂිකාර්මික පළිබෝධ ගැටලු කළමනාකරණය කිරීම සඳහා තාක්ෂණික මග පෙන්වීම

කෑගල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කවල තිත් පතංගයා (*Aularches miliaris*) පාලනය කිරීමේ වැඩසටහන් 3ක් සඳහා තාක්ෂණික වශයෙන් මග පෙන්වන ලදී. පේර වගාවේ මූල ගැටිති වටපණුවා සහ පැපොල් වගාවේ පිටි මකුණා කළමනාකරණය කිරීම පිණිස වයඹ පළාතේ ගොවීන් 150දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී.

### පළිබෝධ නිරීක්ෂණ වැඩසටහන්

සියලුම දිස්ත්‍රික්කවල ව්‍යාප්ති නිලධාරීන්ගෙන් වීවල පළිබෝධ ආසාදනය පිළිබඳ දත්ත එක්රැස් කර ප්‍රස්තාර ගත කිරීමෙන් පසු සංක්ෂිප්ත වාර්තාවක් පිළියෙල කිරීමට භාවිත කෙරිණි. එය එම නිලධාරීන් අතර බෙදා හරින ලදී. එයට අමතරව, වත්මන් පළිබෝධ ගැටලු සම්බන්ධයෙන් ගොවීන්ට අනතුරු හැඟවීම පිණිස දැනට පළිබෝධ පැතිරී ඇති ආකාරය පිළිබඳ කෙටි පණිවිඩ නිතර ගුවන්විදුලියෙන් විකාශනය කෙරිණි.

### ශාකමය පළිබෝධනාශක ප්‍රවර්ධනය

කෘත්‍රිම පළිබෝධනාශක අධිකව භාවිත කිරීමට විකල්පයක් වශයෙන් ශාකමය පළිබෝධනාශක භාවිතය ප්‍රවර්ධන කිරීම පිණිස විවිධ දිස්ත්‍රික්කවල ගොවීන් 1600කට පුහුණුව ලබාදිණි.

### පූජනීය බෝධීන්හි පළිබෝධ / රෝග පාලනය

වෙයන්, දිලීර රෝග වැනි යම් යම් පළිබෝධ/ රෝග ආසාදනවලින් ආරක්ෂා කිරීම පිණිස ඓතිහාසික පන්සල් ගණනාවකට අයත් පූජනීය බෝධි වෘක්ෂ 9ක් සඳහා ප්‍රතිකර්ම යොදන ලදී.

### ප්‍රදර්ශන

අම්පාර දැයට කිරුළ ප්‍රදර්ශනයේදී සහ වාරියපොළ ගොවි සතිය ප්‍රදර්ශනයේදී පරිසර හිතකාමී පළිබෝධ කළමනාකරණ තාක්ෂණයන් මෙන්ම පැළෑටි සංරක්ෂණ සේවයේ අනෙකුත් කාර්යයන්ද මහජනයා සඳහා ආදර්ශනය කරන ලදී.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම
- ස්ථිර බෝග සායන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම
- වී, එළවළු සහ කොළ එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම
- නියමු මට්ටමින් වල් පැළෑටිනාශක අත්හදා බැලීම

- ජලජ වල් පැළෑටි සඳහා ජෛව විද්‍යාත්මක පාලන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළවල ඇති බීජ ගබඩා ධූමකරණය කිරීමට තාක්ෂණික සහාය ලබාදීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයන්හි වෙියන් කළමනාකරණය කිරීම සඳහා තාක්ෂණික මග පෙන්වීම
- වී වගා කරන ක්ෂේත්‍රයන්හි මීයන් පාලනය කිරීමට තාක්ෂණික මග පෙන්වීම
- ආක්‍රමණශීලී වල් පැළෑටි පාලනය කිරීම සඳහා තාක්ෂණික මග පෙන්වීම
- අනතුරුදායක කෘෂිකාර්මික පළිබෝධ ගැටලු කළමනාකරණය කිරීම පිණිස තාක්ෂණික මග පෙන්වීම
- පළිබෝධ නිරීක්ෂණ වැඩසටහන් ප්‍රවර්ධනය
- ශාකමය පළිබෝධනාශක භාවිතය ප්‍රවර්ධනය
- පූජනීය බෝධිවල පළිබෝධ/ රෝග පාලනය
- කෘෂිකාර්මික ප්‍රදර්ශන සඳහා සජීවී අයුරින් දායකවීම

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරි/ සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 02 |
| කෘෂිකර්ම නිලධාරි | 04 |
| වැඩසටහන් සහකාර | 03 |
| කෘෂිකර්ම උපදේශක | 08 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 04 |
| රියදුරු | 04 |
| කම්කරු | 05 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| ලොරි රථ සහායක | 01 |
| **එකතුව** | **33** |

## 2.1.3 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත යටතේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයට පැවරි ඇති නෛතික වගකීම වන්නේ පළිබෝධනාශක ලියාපදිංචියයි. මානව සෞඛ්‍යය හා පරිසරය ආරක්ෂා කිරීමේ සාමූහික ඉලක්ක ජය ගැනීම සඳහා සැලකිය යුතු පරිදි ලියාපදිංචි සහ පශ්චාත් ලියාපදිංචි කාර්යයන් විවිධාකාරයෙන් ඒකාබද්ධ කරන ලදී. ලියාපදිංචිය පිළිබඳ නෛතික අංශ ශක්තිමත් කිරීම සඳහා පළිබෝධනාශක නිපැයුමෙහි හා අදාළ ලියාපදිංචිකරුගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම මගින් ලියාපදිංචි අංක ලබාදීමේ නව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. පනත යටතේ පළිබෝධනාශක පිළිබඳ නෛතික පාලන ක්‍රමය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කර තිබුණද නීතිවිරෝධී පළිබෝධනාශක නිපැයුම් තවමත් සැලකිය යුතු අයුරින් වෙළඳපොළෙහි පවතී. එය වෙළඳපොළ කටයුතු සම්බන්ධයෙන් බෙහෙවින් පරීක්ෂාකාරී වීමේ අවශ්‍යතාව මතු කළේය. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පසුගිය වසර කිහිපය පුරා අන්තර්ජාතික සම්මුතීන්ට අනුව වඩාත්ම විෂ සහිත පළිබෝධනාශක භාවිතය සීමා කරමින් සිටී. මේ අනුව රේඛීය බලධාරීන්ගේ සහාය ඇතිව, පළිබෝධනාශක දැඩි ලෙස නියාමනය කිරීම සඳහා පාලන පියවර රැසක් ගෙන ඇත. විශේෂයෙන්ම, අධික භාවිතය සහ අනිසි භාවිත පිළිවෙත් මගින් ගොවි ප්‍රජාවට ඉහළ අවදානමක් ඇති කිරීමේ හැකියාව පවතින පළිබෝධනාශක නිපැයුම් 4ක් ආනයනය කිරීම තාවකාලිකව නවතා දැමිණි. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විද්‍යාගාරය පළිබෝධනාශක ලියාපදිංචියෙන් පසු අදාළ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට හා තත්ත්ව පාලනය ඇතුළු මෙහෙයුම් කාර්යයන්ට සහාය වන ඒකකය වශයෙන් ක්‍රියා කරයි. වසර තුළ මෙම විද්‍යාගාරය සැලකිය යුතු අයුරින් ශක්තිමත් කර ඇති අතර එයට පළිබෝධනාශකවල තත්ත්ව පාලනයට අවශ්‍ය මූලික විශ්ලේෂණාත්මක උපකරණ හා සහායක උපකරණ ලබාදී ඇත. එයට අමතරව, අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ උපදෙස් පරිදි ISO 17025:2005 විද්‍යාගාර ප්‍රතීතන ප්‍රකාරව සමස්ත විද්‍යාගාර කාර්යයන් අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුකූලව වැඩිදියුණු කරමින් පවතී. යල් පැනගිය පළිබෝධනාශක තොග සැලකිය යුතු වැදගත්කමකින් යුක්ත වන හෙයින් ඒවා බැහැර කිරීම පාරිසරික වශයෙන් තිරසාර වන විසඳුමක් සොයා ගැනීමට දැඩි ප්‍රයත්නයක් දැරීම අවශ්‍ය වන බරපතල ගැටලුවකි.

### අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම පහත වගුවේ දැක්වේ.

**වගු අංක 2.1.3.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % | ආදායම |
|---|---|---|---|---|
| මූලධන | 2,020,000 | 1,978,989 | 98 | |
| පුනරාවර්තන | 2,960,000 | 2,703,493 | 91 | |
| ලියාපදිංචි කිරීමේ සහ නැවත ලියාපදිංචි කිරීමේ ගාස්තු | | | | 3,565,900 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % | ආදායම |
|---|---|---|---|---|
| අලෙවිකරු සහතිකකරණ ගාස්තු | | | | 719,400 |
| පසු පාලන සේවා ලියාපදිංචි කිරීම් ගාස්තු | | | | 140,000 |
| පසු පාලන සේවා අලුත් කිරීම් ගාස්තු | | | | 105,000 |
| **එකතුව** | **4,980,000** | **4,682,482** | **94** | **4,530,300** |

## ප්‍රගතිය

| අයත -මය | අනු කාර්යය | මුළු වාර්ෂික භෞතික ඉලක්කය | වසර අවසනට ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| 01 | පරීක්ෂා කිරීමෙන් පසු ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍ර පිළිගැනීම සහ අයදුම් පත්‍ර අංක වෙන්කර දීම | 150 | 99 | 66 |
| 02 | මුල් ලියාපදිංචි කිරීම් අයදුම් පත්‍ර ඇගයීම | 30 | 68 | 227 |
| 03 | තෙවන පාර්ශ්ව ලියාපදිංචි කිරීම් අයදුම් පත්‍ර ඇගයීම | 140 | 149 | 106 |
| 04 | නැවත ලියාපදිංචි කිරීම් අයදුම් පත්‍ර ඇගයීම | 140 | 116 | 83 |
| 05 | දේශීය අත්හදා බැලීම්වලට අදාළ දත්ත ඇගයීම | 30 | 49 | 163 |
| 06 | ආනයන අනුමැති නිකුත් කිරීම | 1,400 | 1,069 | 76 |
| 07 | පළිබෝධනාශක තත්ත්ව සහතික ඇගයීම | 1,400 | 402 | 29 |
| 08 | අනුමැතිය සඳහා ලේබල් පරීක්ෂා කර බැලීම | 750 | 327 | 124 |
| 09 | අනුමැතිය සඳහා ප්‍රචාරණ ද්‍රව්‍ය ආදිය පරීක්ෂා කර බැලීම | 250 | 226 | 90 |
| 10 | කම්හල් පරීක්ෂාව | 12 | 4 | 33 |
| 11 | අනුමත යළි ඇසුරුම් කම්හල් හා ගබඩා පරීක්ෂා කිරීම | 02 | 0 | 0 |
| 12 | ධූමකරණ පරිශ්‍ර පරීක්ෂා කර බලා සහතික කිරීම සහ ගෘහස්ථ පළිබෝධ පාලන කටයුතුවල නියැළෙන්නන් සහතික කිරීම | 30 | 13 | 43 |

| අයත -මය | අනු කාර්යය | මුළු වාර්ෂික භෞතික ඉලක්කය | වසර අවසනට ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| 13 | පළිබෝධ පාලන සේවා ලියාපදිංචිය | 30 | 30 | 100 |
| 14 | නිරෝධායන හා පූර්ව නැව්ගත කිරීම් ප්‍රතිකර්ම සඳහා වගකිය යුතු පදනමක් මත මීතයිල් බ්‍රෝමයිඩ් ලබා ගැනීමට අනුමැතිය ලබාදීම | 60 | 126 | 210 |
| 15 | අයදුම්පත්‍ර පිළිගැනීම සඳහා ඒවා සතු යෝග්‍යතාව සනාථ කර ගැනීම සඳහා පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට වෛද්‍ය පර්යේෂණ ආයතනයට සහ කාර්මික තාක්ෂණ ආයතනයට නියැදි යැවීම | 25 | 17 | 68 |
| 16 | තොග පදනම මත සිදු කරන නියැදිවල තත්ත්ව විශ්ලේෂණය අනුව නිපැයුම් ඇසුරුම් කිරීම සඳහා අනුමැතිය ලබාදීම | 800 | 330 | 41 |
| 17 | අලෙවිසැල් පරීක්ෂාව | 140 | 138 | 99 |
| 18 | පළිබෝධනාශක / ජෛවනාශක ලියාපදිංචිය සඳහා සංශෝධිත මාර්ගෝපදේශ සහ නව පළිබෝධනාශක ආනයනකරුවන් සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම | 02 | 02 | 100 |
| 19 | මාධ්‍ය වැඩසටහන් (රූපවාහිනී/ ගුවන්විදුලි/ මුද්‍රිත මාධ්‍ය) | 12 | 08 | 67 |
| 20 | පුහුණුව/ කෘෂි රසායන අලෙවිය සහතික කිරීම සහ තාක්ෂණික සහාය | 750 | 565 | 75 |
| 21 | දැනුවත් කිරීමේ ප්‍රදර්ශන | 3 | 07 | 233 |
| 22 | අලෙවිකරු පුහුණු පංති | 15 | 23 | 153 |
| 23 | අලෙවිකරු පුහුණු සහතික නිකුත් කිරීම | 450 | 624 | 139 |
| 24 | අලෙවිකරු සහතික නිකුත් කිරීම | 2,000 | 1,308 | 65 |
| 25 | ක්ෂේත්‍ර පැමිණිලි | 06 | 15 | 250 |
| 26 | නීතිමය පියවර ගැනීම් | 04 | 01 | 25 |
| 27 | තාක්ෂණික උපදේශන කමිටු රැස්වීම් | 06 | 06 | 100 |

| අයතමය | අනු කාර්යය | මුළු වාර්ෂික භෞතික ඉලක්කය | වසර අවසනට ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| 28 | පළිබෝධනාශක තාක්ෂණික උපදේශන කමිටු තීරණ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා කර්මාන්ත නියෝජිතයින් සමග රැස්වීම් පැවැත්වීම | 06 | 02 | 33 |
| 29 | පළිබෝධනාශක උප කමිටු 3හි කමිටු රැස්වීම් | 18 | 11 | 61 |
| 30 | සම්මිශ්‍රණ විශ්ලේෂණය | 800 | 914 | 114 |
| 31 | පළිබෝධනාශක අපවිත්‍රකාරක පිළිබඳ අහඹු පරීක්ෂාව | 12 | 05 | 42 |
| 32 | හිස් පළිබෝධනාශක බඳුන් බැහැර කිරීමේ වැඩසටහන් පිළියෙල කර ක්‍රියාත්මක කිරීම | 02 | 02 | 100 |
| 33 | දෙපාර්තමේන්තුව තුළ සහ දෙපාර්තමේන්තු අතර පවත්වන රැස්වීම් සඳහා තාක්ෂණික විශේෂඥයින්/ සාමාජිකයින්/සම්පත් දායකයින් වශයෙන් සේවය ලබාදීම හෝ සහභාගි වීම | 33 | 41 | 124 |
| 34 | වෙනත් ආයතනවල ආරාධනය මත සම්පත් දායකයින් වශයෙන් සහභාගි වීම | 10 | 25 | 250 |
| 35 | ආනයන පිළිබඳ සංඛ්‍යා දත්ත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ බෙදා හැරීම (මහ බැංකුව, විශ්වවිද්‍යාල, පර්යේෂකයින් හා රාජ්‍ය ආයතන ආදිය සඳහා) | 40 | 12 | 30 |
| 36 | ක්ෂේත්‍ර සමීක්ෂණ වැනි වෙනත් කටයුතු | 04 | 01 | 25 |

## පළිබෝධනාශක ලියාපදිංචිය

### ලියාපදිංචි කිරීම පිළිබඳ තත්ත්වය

2013 වර්ෂයේදී නව ලියාපදිංචිය සඳහා ලද අයදුම් පත්‍ර 68ක් පිළිබඳ කටයුතු අවසන් කෙරිණි. මෙම ක්‍රියාවලියේදී ලියාපදිංචිකරු විසින් ඉදිරිපත් කළ විට අදාළ තොරතුරු සහ ලිපි ලේඛන ඇගයීමට ලක් කෙරේ. මෙමගින් 2013 වර්ෂයේදී එක්රැස් කර ගන්නා ලද මුළු ආදායම රු. 3,565,900.00කි.

පළිබෝධනාශක ලියාපදිංචියට අදාළ ගාස්තු ව්‍යුහය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යෝජනා ඉදිරිපත් කර ඇත. පළිබෝධනාශක නිපැයුමෙහි ස්වභාවය සහ / හෝ සංයුතිය පිළිබඳව නොසලකා පළිබෝධනාශක ක්‍රියාකාරී ද්‍රව්‍ය ඇතුළත් පළිබෝධනාශක සියල්ල පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කළ යුතුය. වර්තමානයේ ලියාපදිංචි කර ඇති නිපැයුම්වලට සමාන හෝ සැලකිය යුතු අයුරින් සමාන වූ පළිබෝධනාශක සම්මිශ්‍රණ සඳහා ඉදිරිපත් කළ අයදුම්පත්‍ර මේ දක්වා මුල් ලියාපදිංචිකරුගේ එකඟතාව ඇතිව වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි කරන ලදී. මෙලෙස ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය 'තෙවන - පාර්ශ්ව ලියාපදිංචිය' වශයෙන් හැඳින් විණි. මෙම ක්‍රියාවලියේ පැවති නෛතික ව්‍යාකූලත්වය හේතුවෙන් තෙවන - පාර්ශ්ව ලියාපදිංචිය සඳහා ලැබෙන අයදුම්පත් පිළිගැනීම 2013 අප්‍රේල් මස සිට නවතා දමා සියලුම අයදුම්පත්‍ර නිපැයුම් සඳහා ඉදිරිපත් කරන මුල් අයදුම්පත්‍ර වශයෙන් සැලකිය යුතු බව අවධාරණය කෙරිණි. හිමිකාරත්ව දත්ත ඉදිරිපත් කරන්නා විසින් ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම මත අයදුම්පත මුල් අයදුම්පත වශයෙන් සැලකීමේ හැකියාව අඛණ්ඩව පවත්වා ගැනිණි. ඒ අනුව, නිපැයුමෙහි අනන්‍යතාව දැනගත හැකිවනු පිණිස 2013 ජූනි මාසයේ සිට නව ලියාපදිංචි අංක ලබා දීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේදී නිපැයුමෙහි ක්‍රියාකාරිත්වය සහ පාරිභෝගික සුරක්ෂිතතාව සඳහා ඒවායෙහි සුරක්ෂිතතාව, තත්ත්වය, කාර්යක්ෂමතාව සහ අනන්‍යතාව සනාථ කරන වාර්තා ඇගයීමට ලක් කෙරේ. යථෝක්ත පනත යටතේ නිපැයුමෙහි ලේබලය පැහැදිලිව හා සාරාංශගතව භාෂා 3න්ම සකස් කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි. පළිබෝධනාශක පාලන පනතෙහි දක්වා ඇති අවශ්‍යතාව නොසලකා ආනයනය කරන ලද පළිබෝධනාශක තොග සහ/හෝ නිපැයුම් සියල්ල තුළම මෙකී වැදගත් තොරතුරු නොමැති අතර බොහෝ අවස්ථාවන්හිදී නිපැයුම්වල කාර්යක්ෂමතාව සහ සුරක්ෂිතතාව සම්බන්ධයෙන් පාරිභෝගිකයා නොමග යැවේ. එමනිසා, කූට වෙළෙඳුන්ගේ කටයුතු හේතුවෙන් මහජනතාව දැඩි අනතුරක වැටේ. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පළිබෝධනාශක ලියාපදිංචිය හැකි තරම් ආරක්ෂිතව සිදු කිරීමට අවශ්‍ය යම් යම් නියාමන තීරණයන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

පළිබෝධනාශක ලියාපදිංචි කිරීමට පෙර ලියාපදිංචි කිරීමේ අංශ වඩා විධිමත් කිරීම හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට වැඩි සහභාගිත්වයක් ලබාදීම පිණිස සුපුරුදු ලෙස පළිබෝධ සම්බන්ධයෙන් කටයුතු කරන අදාළ අමාත්‍යාංශ හා ආයතනවල සිටින විශේෂඥයින්ගේ උපදෙස් ලබාගනු ලැබේ. නිදසුනක් වශයෙන් චර්ම ආලේපනවල ඇති පළිබෝධනාශක, විලවුන් උපකරණ හා ඖෂධ පාලන අධිකාරියට යොමු කරන ලද අතර ආහාර ද්‍රව්‍ය සඳහා භාවිත කරන සහ/හෝ ආහාර සැකසුම් ඒකක ස්ථාපිත කිරීමේදී භාවිත කරන පළිබෝධනාශක සහ පශු පාලන කටයුතුවලදී යොදා ගන්නා පළිබෝධනාශක පිළිවෙළින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර නියාමන කමිටුව වෙත සහ සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පශු ඖෂධ පාලන අධිකාරිය වෙත යොමු කෙරිණි.

නීතිමය අවශ්‍යතාව ප්‍රකාරව චර්මයෙහි ආලේපනයට යොදා ගන්නා සමහර පළිබෝධනාශක සංයෝග විලවුන් උපකරණ හා ඖෂධ පාලන අධිකාරිය යටතේ ලියාපදිංචි කර සහතිකයක් ලබාදීමට නියමිතය. එමෙන්ම පශු පාලන ක්ෂේත්‍රයේ භාවිත කරන පළිබෝධනාශක

පශු ඖෂධ පාලන අධිකාරිය යටතේ වෙනම ලියාපදිංචි කර සහතිකයක් නිකුත් කරනු ලැබේ. එවැනි අතිරේක ලියාපදිංචි කිරීම් ක්‍රම 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතේ අවශ්‍යතා අභිභවා යැමක් ලෙස නොසැලකෙන නමුත් පළිබෝධනාශක පාලන පනතෙහි නීතිමය අවශ්‍යතාවලින් බැහැර වූ අවස්ථා අතීතයේ තිබී ඇත. එම අවශ්‍යතාවන්ට තදින්ම අනුකූල වීම සඳහා 2013 මැයි මාසයේදී මෙම කරුණ ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ ආනයන හා අපනයන පාලක සහ අදාළ බලධාරීන් වෙත යොමු කරන ලදී.

## නව පළිබෝධනාශක නිපැයුම් තක්සේරු කිරීම සහ ලියාපදිංචි කිරීම

දේශීය අත්හදා බැලීම් සඳහා නිපැයුම් පූර්ව ඇගයීමට ලක් කිරීමේදී සුරක්ෂිත හා පරිසර හිතකාමී පළිබෝධනාශක හඳුනා ගෙන ප්‍රවර්ධනය කරන ලද අතර එය අනතුරුදායක නිපැයුම් වෙළඳපළෙන් ඉවත් කර දැමීමට ඉවහල් වන්නකි. වසර තුළ කෘෂි පළිබෝධනාශක සම්මිශ්‍රණ 4ක් ඇගයීමට ලක්කර පහත සඳහන් බෝග/පළිබෝධ කාණ්ඩ යටතේ එක් නිපැයුමක් ලියාපදිංචි කරන ලදී.

ෆෲටේරියාෆොල් , 25% SC - කෙසෙල් සිගාටොකා පත්‍ර පුල්ලි රෝගය සහ සුකිනි පිටිපුස් රෝගය සඳහා වන දිලීරනාශකය

## දැඩි අවදානමක් සහිත පළිබෝධනාශක ඉවත් කිරීම

2013 පෙබරවාරි මාසයේදී පළිබෝධනාශක තාක්ෂණික සහ උපදේශන කමිටුවෙහි උපදෙස් මත මිනිස් සෞඛ්‍යයට දැඩි අවදානමක් ඇති කළ හැකි සාම්ප්‍රදායිකව භාවිතා කළ පළිබෝධනාශක වර්ග 4ක් වන ක්ලෝරොපයිරිෆොස්, කාබරිල්, කබොෆියුරාන් සහ ප්‍රොපනිල් ආනයනය තාවකාලිකව අත්හිටුවීමට නියාමන තීරණයක් ගන්නා ලදී. එම පළිබෝධනාශකවලට නිරාවරණය වන තත්ත්වයන් යටතේ විෂවීමේ හැකියාව සහ ඒවා ක්ෂේත්‍රය තුළ භාවිත කරන අධික ප්‍රමාණය මෙම තීරණය ගැනීමේදී කමිටුවේ සැලකිල්ලට යොමු විණි.

## පළිබෝධනාශක නීති විරෝධීව ආනයනය කිරීම සම්බන්ධයෙන් වඩාත් පරීක්ෂාකාරී වීම

ආනයන ඉල්ලීම් සියල්ල තොග පදනම මත පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතියට යටත් විය යුතුයි. පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේදී එම නිපැයුම්වල ක්‍රියාකාරීත්වය සහ පාරිභෝගික සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ඒවායෙහි ආරක්ෂාකාරීබව, තත්ත්වය, කාර්යක්ෂමතාව සහ අනන්‍යතාව සනාථ කළ වාර්තා ඇගයීමට ලක් කෙරේ. එයට අමතරව, නිපැයුම භාවිත කරන ආකාරය සහ එහි සුරක්ෂිතතාව සම්බන්ධයෙන් පාරිභෝගිකයාට අවබෝධයන් ලබා ගැනීම පිණිස අලෙවි කිරීමට පෙර සෑම පළිබෝධනාශකයකම භාෂා 3න්ම පැහැදිලි හා සංක්ෂිප්ත ලේබලයක් පැවතීම සහතික කෙරේ. 2013 ජූනි මාසයේදී ආනයනයේදී හා අපනයනයේදී පළිබෝධනාශක පරීක්ෂා කිරීම හා රේගුවෙහි ලියාපදිංචි කිරීම පහසු කිරීම පිණිස පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් කාණ්ඩ 3ක් යටතේ (එනම් ලියාපදිංචි පළිබෝධනාශක, තහනම් කර ඇති පළිබෝධනාශක සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර තිබූ නමුත් 2013 ජූනි මස වනවිට ක්‍රියාකාරී ලියාපදිංචි තත්ත්වයක නොපැවති පළිබෝධනාශක - ප්‍රවීක්ෂණ ලැයිස්තුව ලෙසින් හඳුන්වන) වර්ගීකරණය කරන ලද පළිබෝධනාශක පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට නිකුත් කරන ලදී.

## පළිබෝධනාශක නැවත ලියාපදිංචිය

නිපැයුමක ලියාපදිංචිය වලංගු වන්නේ වසර 3කට පමණි. ඉන්පසු නව ප්‍රමිති,

සොයා ගැනීම් සහ සුරක්ෂිතතා ගැටලු මත පදනම්ව නිපැයුමෙහි තත්ත්වය යළි තක්සේරු කෙරේ. වසර තුළ, මෙයට අදාළව අයදුම්පත්‍ර 116ක් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. මෙම කාණ්ඩය යටතේ ලබා ගන්නා ලද ආදායම රු.580,000.00කි. මෙම ක්‍රමය යටතේ, නිපැයුමෙහි විෂ සහිත බව සහ තත්ත්වය සම්බන්ධයෙන් අලුතෙන්ම සිදුකරන පරීක්ෂණ මගින් ඒවායෙහි සුරක්ෂිතතාව, තත්ත්වය සහ ක්‍රියාකාරීත්වය තක්සේරු කෙරෙනු ඇත.

**වගු අංක 2.1.3.2: 2013 වර්ෂයේ ලියාපදිංචිය සඳහා පළිබෝධනාශක ඇගයීම පිළිබඳ සමස්ත තත්ත්වය**

| කාණ්ඩය | ලියාපදිංචිය පිළිබඳ තත්ත්වය | සංඛ්‍යාව |
|---|---|---|
| නව පළිබෝධනාශක | ඇගයීම් කටයුතු සම්පූර්ණ කළ | 10 |
| | ලියාපදිංචිය ප්‍රදානය කළ | 07 |
| සාම්ප්‍රදායික පළිබෝධනාශක | ඇගයීම් කටයුතු සම්පූර්ණ කළ | 64 |
| | ලියාපදිංචි කළ විකල්ප ප්‍රභව | 46 |
| | ලියාපදිංචි කළ නව සම්මිශ්‍රණ | 02 |
| | ලේබල්වල වැඩි විස්තර ඇතුළත් කිරීමට අදාළව ලියාපදිංචිය | 07 |

## විශ්ලේෂණ විද්‍යාගාර කාර්යයන්

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විශ්ලේෂණ විද්‍යාගාරය ශ්‍රී ලංකාවේ පළිබෝධ කළමනාකරණයේ අනුකූලතා නිරීක්ෂණ කාර්යයන් සම්බන්ධ වගකීම් ඉටුකරයි. එය නෛතික කටයුතු සම්බන්ධයෙන් 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත මගින් බලලත් (අංක 1293/21 හා 2003.06.19 දින දරන රජයේ අති විශේෂ ගැසට් නිවේදනය හා සබැඳේ) විද්‍යාගාරයකි. ඒ හැරුණු විට, එය ඉල්ලීම පරිදි විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන වැනි බාහිර ආයතනවලට ද තම සේවය ලබා දෙයි.

අන්තර්ජාතික විද්‍යාගාර ප්‍රමිතීන් මත පදනම්ව මෙයට පිළිගැනීමක් ලබා ගැනීම සඳහා විද්‍යාගාර කළමනාකරණය ශක්තිමත් කරන ලදී. 2013 ඔක්තෝම්බර් මාසයේදී ISO 17025:2005 විද්‍යාගාර ප්‍රතීතන ලබා ගැනීම සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලදී.

- පහත දැක්වෙන අංශයන්ට අදාළව අවශ්‍ය ක්‍රියාපටිපාටි සකස් කරන ලදී.
  - විශේෂිත විශ්ලේෂණාත්මක ක්‍රම (GC හා HPLC) මගින් ප්‍රධාන පළිබෝධනාශක සම්මිශ්‍රණ පරීක්ෂා කිරීමේ ක්‍රමයක් බිහිකර තහවුරු කර ගැනීම
  - විශේෂිත විශ්ලේෂණාත්මක ක්‍රම (GC හා GC-MC) මගින් ජලයේ ඇති ක්ලෝරොපයිරිෆොස්, ඩයසිනන් සහ ප්‍රොෆෙනොෆොස් නමැති පළිබෝධනාශකවල අවශේෂ පරීක්ෂා කර බැලීම
  - විශේෂිත විශ්ලේෂණාත්මක ක්‍රම මගින් (QuChERS ක්‍රමය සහ GC හා HPLC) පලතුරු හා එළවළුවල ඇති පළිබෝධනාශක අවශේෂ මට්ටම පරීක්ෂා කර බැලීම
  - විශේෂිත විශ්ලේෂණාත්මක උපකරණ (ICP – MS) මගින් පළිබෝධනාශක සම්මිශ්‍රණ සහ පරිසර නියැදිවල බැර ලෝහ

හේතුවෙන් දූෂණයවීම පරීක්ෂා කර බැලීම

- වසර තුළ වැඩසටහනෙහි සාර්ථක වූ ප්‍රධාන අංග

  – විද්‍යාගාර උපකරණ ලබා ගැනීම

  (අ) බැර ලෝහ විශ්ලේෂණය සඳහා යොදා ගැනෙන උපකරණය (ICP – MS)

  (ආ) කේන්ද්‍රාපසාරකය (Centrifuge)

  (ඉ) ස්පෙක්ට්‍රොෆොටෝමීටරය

  (ඊ) සයනයිඩ් විශ්ලේෂණය සඳහා ඉලෙක්ට්‍රෝඩ සහිත සන්නායකතා මානය

  (උ) ආර්ද්‍රතාමාන

  (ඌ) අවම/ උපරිම උෂ්ණත්වමාන

  – විශේෂිත විශ්ලේෂණාත්මක ක්‍රම (GC සහ HPLC) මගින් පහත දැක්වෙන පළිබෝධනාශක සම්බන්ධයෙන් පළිබෝධනාශක සම්මිශ්‍රණ විශ්ලේෂණය

  (අ) ක්ලෝපයිරිෆොස්

  (ආ) කාබොෆ්‍යුරාන්

  (ඉ) ග්ලයිෆොසේට්

  (ඊ) බිස්පයිරිබැක් සෝඩියම්

  (උ) ක්ලෝරොතැලනිල්

  (ඌ) කාබොසල්ෆන්

  – භෞත රසායනික ලක්ෂණ සම්බන්ධයෙන් පළිබෝධනාශක සම්මිශ්‍රණ විශ්ලේෂණය

  (අ) තෛලෝද ස්ථායිතාව
  (ආ) පරිසරයේ නොනැසී පැවතීමේ හැකියාව ඇතිවීම

  (ඉ) තෙත්විය හැකිබව

  (ඊ) පීඑච් අගය

  (උ) ඝනත්වය/ විශේෂිත ගුරුත්වය

## ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීම

පළිබෝධනාශක අලෙවිකරු සහතිකකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පළාත්, අන්තර් පළාත් සහ මහවැලි අධිකාරියේ ක්ෂේත්‍ර බලාත්මක කිරීම් කාර්ය මණ්ඩලය සමග අඛණ්ඩව සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය. මෙම කාණ්ඩය යටතේ ලබා ගන්නා ලද ආදායම රු. 719,400.00කි. වසර තුළ පළිබෝධනාශක අලෙවිකරු පුහුණු පංති 23ක් පවත්වන ලද අතර ඒ සඳහා සහභාගී වූ 624ක පිරිසක් සහතික කරන ලදහ.

## ආනයන අනුමැතිය

මෙරටට පළිබෝධනාශක ආනයනය කිරීම 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතට යටත්ව සිදු වේ. පළිබෝධනාශක අතිරික්ත පරිමාවන්ගෙන් ආනයනය කිරීම වළක්වන අතරම නියමිත තත්ත්ව ප්‍රමිතිවලට අනුකූලව නිවැරදි සැපයුම් මූලාශ්‍රයන්ගෙන් ආනයනය සහතික කිරීම පිණිස සමාගම් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් අනුව තොග පදනම මත පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් විසින් මාස 3ක කාලයක් සඳහා වලංගු ආනයන අනුමැති නිකුත් කෙරේ. වසර තුළ ආනයන අනුමැති නිකුත් කිරීමට පෙර ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරන ලද තත්ත්ව සහතික 402ක් ඇගයීමට ලක් කරන ලදී.

## ලේබල් සහ ප්‍රචාරණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම

ලේබල් අනුමත කිරීම් ක්‍රියාවලිය පළිබෝධනාශක අවසානයේ පරිහරණය කරන්නා වෙත නිසි තොරතුරු ලබාදීමට

ඉවහල් වේ. මෙම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා ලේබල් අන්තර්ගතයන්හි තත්ත්වය වැඩිදියුණු කිරීමට කෘෂිකාර්මික පළිබෝධනාශක කාණ්ඩ සියල්ලම වෙනුවෙන් ලේබල් සැලසුම් සකස් කරන ලදී. වසර තුළ ලේබල් 325කට අධික සංඛ්‍යාවක් සහ ප්‍රචාරණ ද්‍රව්‍ය 225කට අධික සංඛ්‍යාවක් පරීක්ෂා කර බලා ඇත. ශ්‍රී ලංකාව තුළ අලෙවි කෙරෙන පළිබෝධනාශකවල වෙළඳනාම/ සන්නම් නාම සම්බන්ධයෙන් හඳුන්වා දෙන ලද නව ප්‍රතිපත්ති හේතුවෙන් ලේබල් සඳහා අනුමැතිය ලබාදීමේදී සිදු කළ යුතු නිවැරදි කිරීම් පියවර සංඛ්‍යාව සැලකිය යුතු අයුරින් ශක්තිමත් කෙරිණි.

## පුහුණු සහ දැනුවත් කිරීම් වැඩසටහන්

විශේෂයෙන්ම පළිබෝධනාශක අලෙවි සැල් සඳහා පිරිස් බඳවා ගැනීමේ නව ක්‍රමය ඇතුළු පළිබෝධනාශක ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් ගුවන්විදුලි හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් හරහා මහජනයා දැනුවත් කිරීම අවස්ථා ගණනාවකදී සිදු කෙරිණි.

## කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහායකයින් පුහුණු කිරීමේ වැඩසටහන

2013 වර්ෂයේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග සහයෝගයෙන් අවශ්‍ය පුහුණු වැඩසටහන් දිවයින පුරා අඛණ්ඩව කරගෙන යාම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු. මිලියන 2.13ක මුදලක් ප්‍රදානය කරන ලදී. 2013 වර්ෂයේදී ගම්පහ, කළුතර, මොණරාගල, බදුල්ල, මාතලේ, නුවරඑළිය, ගාල්ල, කෑගල්ල, රත්නපුරය, අනුරාධපුරය, කුරුණෑගල, පුත්තලම සහ යාපනය යන දිස්ත්‍රික්ක ආවරණය කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ ප්‍රාදේශීය නිලධාරීන් විසින් සම්මුඛ පරීක්ෂණ හරහා නව අයදුම්කරුවෝ 815ක් තෝරා ගන්නා ලදහ. වසර තුළ නව අයදුම්කරුවන් 565 දෙනෙකු පුහුණුව ආරම්භ කරන ලද අතර පෙර බඳවා ගන්නා ලද 250 දෙනෙක් සාර්ථකව පුහුණු වැඩසටහන් නිම කළහ.

## විශේෂ කාර්යයන්

### මීනාශක සම්බන්ධයෙන් පවතින අවදානම අඩු කිරීම

මීනාශකවල භාවිත කරන රසායන ද්‍රව්‍ය ස්වභාවයෙන්ම මිනිසුන් ඇතුළු ඉලක්ක නොකරන විවිධ සතුන්ට අනතුරුදායකවීමේ ඉඩකඩක් පවතී. මීනාශක අලෙවි කිරීමේදී සහ භාවිතයේදී ප්‍රමාණවත් පරිදි අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනයෙන් ඒ සඳහා නොදැනුවත්වම නිරාවරණය වීම වළක්වා ගත හැකිය. 2වන පරම්පරාවේ රුධිරය කැටි ගැසීම වළක්වන රසායන ද්‍රව්‍ය (Anticoagulants) හා බැඳි අවදානම් හඳුනා ගෙන පහත සඳහන් පිළිපැදිය යුතු අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග 2013 වසර අවසානයේදී හඳුන්වා දෙන ලදී.

- අලෙවිය හා බෙදාහැරීම බලපත්‍ර සහිත පළිබෝධනාශක අලෙවිසැල් සඳහා සීමා කිරීම
- නිවෙස්වල සහ නිවෙස් ආසන්නයේ මී උගුල් භාවිත කිරීමේ අවශ්‍යතාව
- තෙරපුමට ඔරොත්තු දෙන පරිදි ඇසුරුම් කිරීම
- අම්හිරි රසකාරක ඇතුළත් කිරීම අනිවාර්ය කිරීම

### පළිබෝධනාශක ප්‍රවාහනය නියාමනය කිරීමේ ක්‍රියාමාර්ග

1994 අංක 06 දරන පනතින් සංශෝධනය කරන ලද 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත යටතේ පළිබෝධනාශක ප්‍රවාහනය තේමාත්මක වගකීමක් වශයෙන් හඳුනා ගෙන ඇත. පළිබෝධනාශක ප්‍රවාහනය ආශ්‍රිතව සිදුවිය

හැකි අනතුරු පිළිබඳ සාක්ෂි බොහෝ සෙයින් ඇති අතර අනෙක් රටවලට සාපේක්ෂව අවශ්‍ය නීති පැවතීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අංශ සම්බන්ධයෙන් මෙරට සැලකිය යුතු අයුරින් පිටුපසින් සිටී. පළිබෝධනාශක ප්‍රවාහනය සම්බන්ධයෙන් පවතින අවදානම සැලකිල්ලට ගැනීමෙන් පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික හා උපදේශන කමිටුවෙහි නියමයන් යටතේ නීති, විධිවිධාන සහ/හෝ සුදුසු මාර්ගෝපදේශ යෝජනා කිරීම සඳහා 2013 දෙසැම්බර් මාසයේදී උප කමිටුවක් පත් කරන ලදී.

## පාරිසරික බලාත්මක කිරීම් වැඩසටහන් ඒකාබද්ධ කිරීම

පළිබෝධනාශක අලෙවිය සහ භාවිතය හරහා පරිසර දූෂණය අඩු කිරීමට ඉවහල් වනු පිණිස 2013 අගෝස්තු මාසයේදී අනුරාධපුරය, පොළොන්නරුව, මාතලේ යන දිස්ත්‍රික්ක 3 ආවරණ වන පරිදි පොලිස් දෙපාර්තමේන්තුවේ පාරිසරික අංශය භාර නිලධාරීන් 55දෙනකු සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කරන ලදී. පළිබෝධනාශක පාලන පනත අනුව වැරදිකරුවන් සොයා ගැනීම සඳහා මෙම කාර්යාලයේ වත්මන් මානව සම්පත ප්‍රමාණවත් නොවන අතර මෙරට පළිබෝධනාශක හේතුවෙන් සිදුවන පරිසර දූෂණය බහුල බවට චෝදනා පවතී. මෙම කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ප්‍රබල ප්‍රාදේශීය බලාත්මක කිරීම් වැඩසටහන බලාත්මක කරන කණ්ඩායම ප්‍රාදේශීය වශයෙන් ඒකාබද්ධ කිරීම මගින් ශක්තිමත් කෙරේ. පරීක්ෂණ හා විමර්ශන සිදු කිරීම, ප්‍රාදේශීය බලාත්මක කිරීම් කාර්ය මණ්ඩලය (බලයලත් නිලධාරීන්) සඳහා වඩා හොඳ සම්බන්ධීකරණයක් ලබාදීම සහ පනත යටතේ බලාත්මක කිරීම් කරුණු සම්බන්ධයෙන් වඩා ඵලදායී අයුරින් සහයෝගීව කටයුතු කිරීම උපායමාර්ගිකව ඉලක්ක කිරීම පිණිස විමර්ශකයින් වඩා සුදුසු පරිදි ස්ථානගත කිරීමට අපේක්ෂා කෙරේ. පරිසර සහ පුනර්ජනන බලශක්ති අමාත්‍යාංශය වැඩමුළුව පැවැත්වීම සඳහා අවශ්‍ය අරමුදල් ලබා දීම මගින් එයට පහසුකම් සැපයීය.

## ප්‍රාදේශීය අලෙවි සැල් පරීක්ෂාව තුළින් අනාවරණය වූ නීතිවිරෝධී පළිබෝධනාශක අලෙවිය

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත මගින් ලියාපදිංචි වී වලංගු බලපත්‍රයක් ලබාගෙන නොමැතිව මෙරට නිෂ්පාදනය කරන, සම්මිශ්‍රණය කරන, විකුණන සහ භාවිත කරන පළිබෝධනාශක සියල්ල තහනම් කෙරේ. මෑතකදී සිදු කළ ක්ෂේත්‍ර විමර්ශනයන්හිදී පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිලධාරීන් විසින් වෙළඳපොළෙහි තිබූ නීති විරෝධී පළිබෝධනාශක රැසක් සොයා ගන්නා ලදී. වෙළඳපොළ තොරතුරු හරහා නීති විරෝධී පළිබෝධනාශක නිෂ්පාදකයින් සමහරක් අල්ලා ගැනීමට මෑතකදී දරන ලද උත්සාහයන් ව්‍යර්ථ විය. නීත්‍යානුකූලව ලියාපදිංචි කරන ලද පළිබෝධනාශක නිපැයුම් සේ දිස්වන අන්දමට සකස් කරන ලද ව්‍යාජ පළිබෝධනාශක සම්බන්ධයෙන් ද පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයට තොරතුරු ලැබී ඇත.

පසුගිය වසරේ ගන්නා ලද වැදගත් බලාත්මක කිරීම් පියවර පිළිබඳ නිදසුන් පහත දැක්වේ.

- 2013 සැප්තැම්බර් මාසයේදී වැල්ලවාය ප්‍රදේශයේ පළිබෝධනාශක අලෙවිකරුවෙකු මොස්පිලන් (ඇසිටැමිප්‍රිඩ්) නැමැති නීත්‍යානුකූල නිපැයුමට සමාන ව්‍යාජ නිපැයුමක් අලෙවි කරමින් සිටි බව සොයා ගැනිණි. මේ සම්බන්ධ වැඩිදුර විමර්ශන සිදු කෙරෙමින් පවතී.
- 2013 ඔක්තෝබර් මාසයේදී නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේදී රවුන්ඩ්අප් නමැති (ග්ලයිෆොසේට්)

නීත්‍යානුකූල පළිබෝධනාශකයට සමාන ව්‍යාජ පළිබෝධනාශකයක් බෙදා හැරියෙකු වරදකරුවෙකු කොට රු. 50,000ක දඩයකට යටත් කෙරිණි. මෙම විමර්ශනය දිඹුල්පතන පොලීසිය සමග සහයෝගයෙන් සිදු කෙරිණි.

- 2013 දෙසැම්බර් මාසයේදී කුලියාපිටිය ප්‍රදේශයේ පළිබෝධනාශක අලෙවිකරුවෙකුට නීතිවිරෝධී පළිබෝධනාශක අලෙවිය වෙනුවෙන් කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේදී රු. 100,000.00ක දඩයක් ගෙවීමට සිදු විය.

## අලෙවිය පිණිස ඇති නීතිවිරෝධී පළිබෝධනාශක පිළිබඳව පරීක්ෂාකාරී වීම

නීතිවිරෝධී පළිබෝධනාශක බොහොමයකින් ඉලක්ක කරනුයේ මීයන්, කැරපොත්තන්, කුහුඹුවන්, ගෙමැස්සන්, හුනන් ආදී පළිබෝධයින් සඳහා ගෘහස්ථ මට්ටමින් යෙදීම වන අතර කෘෂිකාර්මික වැදගත්කමක් සහිත පළිබෝධ සමහරක් ද මෙමගින් ආවරණය වේ. මෙම නීති විරෝධී නිෂ්පාදකයින් බොහොමයකට පොදු වන දෙයක් නම් මේ සම්බන්ධයෙන් නිසි විමර්ශන කටයුතු කිරීමට බාධාවක් වන පරිදි ඔවුන්ගේ සැබෑ අනන්‍යතාව, ලිපිනය හා ඔවුන් සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමෙන් වැළකී සිටීමයි. මෙම කාර්යාලයේ නිලධාරීන් විසින් දිවයිනේ සමහර ප්‍රදේශවල පිහිටි අලෙවිසැල්වල මෑතකදී සිදු කරන ලද විමර්ශන මගින් මෙම ජාවාරමේ සැබෑ පරිමාණය අනාවරණය වී ඇත. මෙවැනි නිපැයුම් ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම හෝ බෙදා හැරීම නීති විරෝධී වනවා පමණක් නොව විශේෂයෙන්ම ළමුන් ඇතුළු මහජනයා විෂ ශරීරගත වීමේ අවදානමටද ලක් කරනු ඇත. අන්තර්ගත ක්‍රියාකාරී ද්‍රව්‍යය පිළිබඳ තොරතුරු නොමැති වීම, කාන්දුවීම් ඇති නොවන නිසි ඇසුරුමක් නොමැතිවීම, පූර්වාරක්ෂක වගන්ති සහ වෛද්‍ය උපදෙස් නොමැතිවීම හේතුවෙන් මෙම නීති විරෝධී නිපැයුම් පාරිභෝගිකයාට අවදානමක් ඇති කරයි. එමෙන්ම ලේබලයේ දක්වා ඇති තොරතුරුවලට වඩා වෙනස් දෙයක් අන්තර්ගත වීමෙන් පළිබෝධනාශකය ද වෙනෙකක් වීමේ හැකියාව පවතී. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය නීති විරෝධී පළිබෝධනාශක අලෙවි කරන සිල්ලර අලෙවි සැල් නිතිපතා පරීක්ෂා කර අවශ්‍ය පරිදි සුදුසු පියවර ගනී. 2013 මැයි මාසයේදී නීති විරෝධී ව්‍යාජ පළිබෝධනාශක සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් ලබා දීම පිණිස පළිබෝධනාශක අලෙවි කරන පිරිස සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

## යල් පිනූ පළිබෝධනාශක තොග නිසි පරිදි බැහැර කිරීමේ ක්‍රියාමාර්ග

2012 මාර්තු මාසයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කලාපීය කෘෂිකර්ම ස්ථාන සමහරක එකතු වූ යල් පිනූ පළිබෝධනාශක තොග සහ විද්‍යාගාර උපකරණ බැහැර කිරීමේ විකල්ප සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයට ඉල්ලීම් ලැබී තිබිණි. අදාළ ඉල්ලීම් අතර තක්සේරු කරන ලද කි.ග්‍රෑ. 1,083ක ඝන හා ලී. 508ක ද්‍රව පළිබෝධනාශක/රසායන ද්‍රව්‍ය විය. 2013 ජූලි මාසයේ දී, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය අනුරාධපුරය නාච්චදූවේ පිහිටි ප්‍රාදේශීය සෞඛ්‍ය දෙපාර්තමේන්තු ගබඩාවේ තිබූ යල් පැනගිය තාක්ෂණික මැලතියන් තොගය පරිසරයට සහ මිරිස් සෞඛ්‍යයට පැවති අවදානම අඩු කරමින් ආරක්ෂිතව බැහැර කිරීමේ කාර්යයට සහභාගි විය. නිසි ක්‍රම මගින් බැහැර කරන තුරු එම තොග තවදුරටත් නරක් වීමට පෙර එක්රැස් කර ආරක්ෂා කිරීමට ජ්ලාන්ට්කෙම් (පෞද්ගලික) සමාගමේ පුහුණුව ලත් කණ්ඩායමක උපකාරය ලැබිණි. පරිසර හිතකාමී අයුරින් යල් පැන ගිය පළිබෝධනාශක තොග බැහැර කිරීම

පිණිස හෝල්සිම් ජියෝ සයිකල් සමාගම සමග පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය අඛණ්ඩව කටයුතු කරයි.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- අයදුම්පත්‍ර පරීක්ෂා කර බලා අංක වෙන් කර දීමෙන් පසු අයදුම්පත්‍ර 150ක් පිළි ගැනීම
- මුල් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර 30ක් ඇගයීම
- තෙවන පාර්ශ්ව ලියාපදිංචි කිරීම් අයදුම්පත්‍ර 140ක් ඇගයීම
- නැවත ලියාපදිංචි කිරීම් අයදුම්පත්‍ර 140ක් ඇගයීම
- අනුමැතිය සඳහා ලියාපදිංචි කිරීම් සහතික 280ක් සකස් කිරීම
- අනු කමිටු සඳහා ඉදිරිපත් කෙරෙන දත්ත 30ක් ඇගයීම සහ පිළියෙල කිරීම
- පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය සඳහා ආනයන බලපත්‍ර 1,400ක් පිළියෙල කිරීම
- ආනයන අනුමැති 1400ක් නිකුත් කිරීම
- පළිබෝධනාශක තත්ත්ව සහතික 1400ක් ඇගයීම
- අනුමැතිය ලබාදීම සඳහා ලේබල් 750ක් පරීක්ෂා කර බැලීම
- අනුමැතිය සඳහා ප්‍රචාරණ ද්‍රව්‍ය 250ක් පරීක්ෂා කිරීම
- කම්හල් 12ක් පරීක්ෂා කිරීම
- අනුමත යළි ඇසුරුම් කම්හල් හා ගබඩා 12ක් පරීක්ෂා කිරීම
- ධූමකරණ පරිශ්‍ර 30ක් සහ ගෘහස්ථ පළිබෝධ පාලනයෙහි නියැළෙන්නන් පරීක්ෂා කර සහතික කිරීම
- පළිබෝධ පාලන සේවා 30ක් ලියාපදිංචිය
- නිරෝධායන සහ පූර්ව නැව්ගත කිරීම් ප්‍රතිකර්ම 30ක් සඳහා වගකිව යුතු පදනමක් මත මීතයිල් බ්‍රෝමයිඩ් ($CH_3Br$) ලබා ගැනීමට අනුමැතිය ලබා දීම
- අලෙවිසැල් 140ක් පරීක්ෂා කිරීම
- අයදුම්පත්‍ර පිළිගැනීමට ඒවායෙහි යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා නියැදි 25ක් වෛද්‍ය පරීක්ෂණ ආයතනය සහ කාර්මික තාක්ෂණ ආයතනය වෙත යැවීම
- නියැදිවල තත්ත්ව විශ්ලේෂණය අනුව, තොග පදනම මත නිපැයුම් ඇසුරුම් කිරීමට නිදහස් කිරීමේ අනුමැති 800ක් ලබා දීම
- මාධ්‍ය වැඩසටහන
  - රූපවාහිනී - 02
  - ගුවන්විදුලි - 06
  - මුද්‍රිත මාධ්‍ය - 04
- කෘෂි රසායන අලෙවි හා තාක්ෂණ සහකාරවරුන් 25දෙනෙකු සඳහා පුහුණුව/සහතික කිරීම
- දැනුවත් කිරීමේ ප්‍රදර්ශන 04ක් පැවැත්වීම
- බලයලත් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් පැවැත්වීම
- අලෙවිකරු සහතික 2000ක් නිකුත් කිරීම
- ක්ෂේත්‍ර පැමිණිලි 06ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම
- නීතිමය පියවර ගැනීම් 04ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම
- තාක්ෂණික උපදේශන කමිටු රැස්වීම් 04ක් පැවැත්වීම
- පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශන කමිටුවේ තීරණ දැනුම් දීම සඳහා කර්මාන්තය නියෝජනය කරන්නන් සමග රැස්වීම් 06ක් පැවැත්වීම
- පළිබෝධනාශක අනුකමිටු 3ට අදාළව අනු රැස්වීම් කමිටු 18ක් පැවැත්වීම
- සම්මිශ්‍රණ විශ්ලේෂණ 800ක් පැවැත්වීම
- පළිබෝධනාශක අපවිත්‍රකාරක පිළිබඳ අහඹු පරීක්ෂා 12ක් පැවැත්වීම

- බැර ලෝහ ඇතුළු පළිබෝධනාශක අපවිත්‍රකාරක පිළිබඳ අවදානම් තක්සේරුව
- පළිබෝධනාශක මගින් පරිසරයේ සිටින ඉලක්ක නොකරන ජීවීන් කෙරෙහි ඇති කෙරෙන බලපෑම
- පළිබෝධනාශක සඳහා ප්‍රතිරෝධිතාව ඇතිවීම නිරීක්ෂණය කෙරෙන වැඩසටහන
- එළවළු හා පලතුරුවල ඇති පළිබෝධනාශක අවශේෂ මට්ටම් සනාථ කර ගැනීම සඳහා නියාමන ක්‍රමයක් ස්ථාපිත කිරීම
- ගෘහස්ථ පළිබෝධනාශකවල ඵලදායිබව සොයා ගැනීම සඳහා ඒවා ඇගයීම
- හිස් බඳුන් බැහැර කිරීම සඳහා වැඩසටහන් 2ක් සකස් කර ක්‍රියාත්මක කිරීම
- දෙපාර්තමේන්තුව තුළ සහ දෙපාර්තමේන්තු අතර පැවැත්වෙන රැස්වීම 27ක් සඳහා තාක්ෂණික විශේෂඥයින්/ සාමාජිකයින්/ සම්පත්දායකයින් වශයෙන් සහභාගී වී සේවය ලබාදීම
- අනෙකුත් ආයතනවල ඇරයුම් 10ක් සඳහා සම්පත්දායකයින් වශයෙන් සහභාගි වීම
- ආනයන පිළිබඳ සංඛ්‍යා දත්ත 40ක් එක්රැස් කිරීම, සම්පාදනය සහ බෙදා හැරීම (මහ බැංකුව, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන හා රාජ්‍ය ආයතන ආදිය සඳහා)
- පළිබෝධනාශක/ ජෛවනාශක 2ක් ලියාපදිංචි කිරීම සඳහා සංශෝධිත මාර්ගෝපදේශ සහ පළිබෝධනාශක ආනයනය කිරීමට අවශ්‍ය එම ක්ෂේත්‍රයට අලුතින් ප්‍රවිෂ්ටවන්නන් සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම
- වෙනත් කාර්යයන් (ක්ෂේත්‍ර සමීක්ෂණ වැනි) – 04

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී/ සේවක සංඛ්‍යාව |
|---|---|
| පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් | 01 |
| පර්යේෂණ නිලධාරි | 05 |
| කෘෂිකර්ම නිලධාරි | 04 |
| කෘෂිකර්ම උපදේශක | 06 |
| පර්යේෂණ සහකාර | 05 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 02 |
| පර්යේෂණ උප සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 05 |
| රියදුරු | 03 |
| මුරකරු | 02 |
| කොන්ත්‍රාත් කම්කරු | 02 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| කම්කරු | 02 |
| එකතුව | 35 |

# 2.1.4 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නොරුව

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය වත්මන් හා අනාගත පරම්පරාවන්ගේ යහපත උදෙසා මෙරට ආහාර බෝගවල පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම සහ එම ජාන සම්පත් උපයෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් හා කාර්යයන් රැසක් ක්‍රියාත්මක කිරීමට කැපවී සිටී. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය ආහාර බෝගවල හා ඒ ආශ්‍රිත විශේෂවල ජාන විවිධත්වය එක්රැස් කිරීම, හඳුන්වා දීම, සංරක්ෂණය කිරීම, ඇගයීම සහ ලේඛනගත කිරීම අඛණ්ඩව සිදු කරයි. මෙම මධ්‍යස්ථානයේ ගවේශණ කටයුතු තුළින් දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කවලින් සහ මහවැලි ව්‍යාපෘතියේ බලපෑමට ලක්වන ප්‍රදේශ වලින් ජනකප්ලාස්ම එක්රැස් කරගැනීම මගින් වසර තුළ කැපී පෙනෙන ජයග්‍රහණයක් ලබා ගැනීමට සමත් විය. ක්ෂේත්‍ර ගවේෂණ තුළින් ජනකප්ලාස්ම නියැදි 760ක් එක්රැස් කර ගැනිණි. සංරක්ෂිත ද්‍රව්‍ය වශයෙන් පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථාන ජාන බැංකුවේ ජනකප්ලාස්ම එකතුන් 13,188ක් පවතී. පර්යේෂණ ආයතනවල, විශ්වවිද්‍යාලවල, රාජ්‍ය නොවන සංවිධානවල සහ ගොවීන්ගේ ජනකප්ලාස්ම උපයෝජනය ඉහළ ගොස් ඇත.

## අයවැය

**වගු අංක 2.1.4.1 : වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 13,321,134 | 12,322,005 | 92 |
| මූලධන | 3,345,000 | 3,070,197 | 92 |
| **ව්‍යාපෘති** | | | |
| • ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා වැඩසටහන | 1,300,000 | 822,739 | 63 |
| • ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම | 586,900 | 586,900 | 100 |
| **එකතුව** | **18,553,033** | **16,801,840** | **91** |

## ප්‍රගතිය

### ජනකප්ලාස්ම ගවේෂණය සහ එක් රැස් කිරීම

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ගවේෂණ ඒකකය විවිධ දිස්ත්‍රික්කවලින් (විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කවලින්) පැළෑටි ජාන සම්පත් එක්රැස් කිරීමේදී කැපී පෙනෙන ජයග්‍රහණයක් ලබා ගෙන ඇත. මෙය 2013 වර්ෂයේදී කළුතර, වව්නියාව, මඩකලපුව හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල ගවේෂණ චාරිකා 5ක නිරත විය (වගු අංක 2.1.4.2).

වගු අංක **2.1.4.2 :** කළුතර, වව්නියාව, මඩකලපුව සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවලින් එක්රැස් කර ගන්නා ලද නියැදි සංඛ්‍යාව

| බෝග කාණ්ඩය | දිස්ත්‍රික්කවලින් එක්රැස් කරගත් නියැදි සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | කළුතර | වව්නියාව | මඩකලපුව | කිලිනොච්චිය |
| වී | 5 | 06 | 12 | 11 |
| රළු ධාන්‍ය | 2 | 20 | 03 | 16 |
| එළවළු | 44 | 35 | 61 | 60 |
| මාෂ බෝග | - | 15 | - | 06 |
| තෙල් බෝග | - | 06 | 01 | 08 |
| කුළු බඩු | 14 | 04 | 06 | 16 |
| මුල් හා ආකන්ද බෝග | 09 | 02 | 07 | 07 |
| පලතුරු | 01 | - | 08 | 08 |
| **එකතුව** | **75** | **88** | **98** | **132** |

එයට අමතරව, මහවැලි අධිකාරිය විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙන් විශේෂ ජනකප්ලාස්ම එක්රැස් කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. මොරගහකන්ද හා කළු ගඟ ව්‍යාපෘතිවල බලපෑමට ලක්වන ප්‍රදේශයෙන් මොරගහකන්ද හා කළු ගඟ ව්‍යාපෘතිවල බලපෑමට ලක්වන ප්‍රදේශයෙන් විවිධ බෝග වර්ගවල ජනකප්ලාස්ම එක්රැස් කර ගන්නා ලදී. 2013 වර්ෂයේදී ගවේෂණ චාරිකා 3ක් සිදු කෙරිණි (වගු අංක 2.1.4.3).

වගු අංක **2.1.4.3 :** මහවැලි ‘සී’ කලාපයේ ප්‍රදේශවලින් මොරගහකන්ද සහ කළුගඟ ව්‍යාපෘති ප්‍රදේශවලින් එක්රැස් කරගත් නියැදි සංඛ්‍යාව

| බෝග කාණ්ඩය | මහවැලි ව්‍යාපෘති ප්‍රදේශවලින් එක්රැස් කරගත් නියැදි සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | මහවැලි ‘සී’ කලාපය | මොරගහකන්ද | කළු ගඟ |
| වී | 11 | 01 | 09 |
| රළු ධාන්‍ය | 47 | 08 | 25 |
| එළවළු | 84 | 26 | 72 |
| මාෂ බෝග | 15 | 04 | 10 |
| තෙල් බෝග | 10 | 11 | 04 |
| කුළු බඩු | 05 | - | 06 |
| මුල් හා ආකන්ද බෝග | 05 | - | 03 |
| පලතුරු | - | - | 02 |
| වෙනත් | - | 06 | 10 |
| එකතුව | 177 | 56 | 141 |

### පර්යේෂණ ස්ථානවලින් ලද බෝග ජනකප්ලාස්ම

2013 වර්ෂයේ දී වී සහ බණ්ඩක්කා බීජ නියැදි 28ක් බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් සහ මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් ලැබිණි. ඇගයීම් ඒකකය විසින් සිදුකළ බණ්ඩක්කා මුහුන්වල බීජ නියැදි 55ක් ද 2013 වර්ෂයේදී ලබා ගන්නා ලදී.

### බීජ ආදී ද්‍රව්‍ය සංරක්ෂණය

2013 වර්ෂයේ බීජ ආදී ද්‍රව්‍ය නව එකතුන් 208ක් ජාන බැංකුවේ සංරක්ෂණය කිරීමට සමත් විය. 2013 වර්ෂය අවසානයට ජාන බැංකුවේ පැවති මුළු ජාන සම්පත් එකතුන් සංඛ්‍යාව 13,188ක් විය (වගු අංක 2.1.4.4).

**වගු අංක 2.1.4.4 : ජාන බැංකුවේ ඇති සංරක්ෂිත ජාන සම්පත් එකතුන් පිළිබඳ විස්තර**

| බෝග කාණ්ඩය | ජාන සම්පත් එකතුන් සංඛ්‍යාව |
|---|---|
| වී සහ ආශ්‍රිත බෝග විශේෂ | 4,560 |
| වෙනත් ධාන්‍ය හා ආශ්‍රිත විශේෂ | 1,670 |
| මාෂ බෝග | 2,088 |
| එළවළු රනිල | 1,408 |
| සොලනේසියේ කුලයේ එළවළු සහ කුළුබඩු හා ආශ්‍රිත විශේෂ | 1,245 |
| කුකුර්බිට් කුලයේ එළවළු | 795 |
| බ්‍රැසිකේසියේ කුලයේ එළවළු | 31 |
| ලූනු | 20 |
| වෙනත් එළවළු | 378 |
| කොළ එළවළු | 170 |
| මුල් සහ ආකන්ද බෝග | 09 |
| අබ සහ ආශ්‍රිත විශේෂ | 124 |
| තෙල් බෝග | 434 |
| තන්තුමය බෝග | 66 |
| ඖෂධීය පැළෑටි | 27 |
| පලතුරු | 163 |
| **එකතුව** | **13,188** |

### ජනකප්ලාස්ම බෙදා හැරීම

වසර තුළ ඉල්ලීම පරිදි, විවිධ බෝග ප්‍රභේදවල ජාන සම්පත් එකතුන් 1,160ක් දේශීය පර්යේෂණ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ විශ්වවිද්‍යාල අතර බෙදා හරින ලදී.

### බීජ ක්‍රියාකාරීත්වය පිළිබඳ පර්යේෂණ

1989 -2007 අතර කාලයේ දී ජාන බැංකුවෙහි ක්‍රියාකාරී එකතුවෙහි සංරක්ෂණය කරන ලද බණ්ඩක්කා සහ බඩඉරිඟු එකතුන්වල ජීව්‍යතාව නිරීක්ෂණය කිරීම පිණිස පරීක්ෂණ මාලාවක් පවත්වන ලදී. බණ්ඩක්කා නියැදි 375ක් සහ බඩඉරිඟු නියැදි 530ක් පරීක්ෂා කර බලන ලදී. සජීවී එකතුව පරීක්ෂා කිරීමේ ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ බණ්ඩක්කා හා බඩඉරිඟු එකතුන්වල ජීව්‍යතාවයෙහි පහත වැටීමක් සිදුව නොමැති බවයි.

### ජනකප්ලාස්ම ගුණනය

පහත සඳහන් බෝගවල ජනකප්ලාස්ම සංරක්ෂණය සඳහා ගුණනය කරන ලදී. වී (එකතුන් 33), බඩඉරිඟු (එකතුන් 03), කුරක්කන් (එකතුන් 02), ඉඳල් ඉරිඟු (එකතුන් 02), හීන් මෙනේරි (එකතුන් 02), තණ හාල් (එකතුන් 02), බෝංචි

(එකතුන් 07), මැ (එකතුන් 07), දඹල (එකතුන් 02), කොස් දඹල (එකතුන් 01), අවර (එකතුන් 01), තක්කාලි (එකතුන් 28), වම්බටු (එකතුන් 112), වැටකොළු (එකතුන් 21), ලබු (එකතුන් 05), පතෝල (එකතුන් 01), බණ්ඩක්කා (එකතුන් 105), තම්පලා (එකතුන් 22), ආලංගා (එකතුන් 03).

### ලක්ෂණීකරණය සහ ඇගයීම

බණ්ඩක්කා එකතුන් 99ක්, මිරිස් එකතුන් 18ක් සහ කොල්ලු එකතුන් 61ක් ලක්ෂණීකරණ කිරීමෙන් පසු බලාපොරොත්තු තැබිය හැකි බණ්ඩක්කා සහ මිරිස් එකතුන් කිහිපයක් හඳුනා ගැනිණි. විවිධ රතුලූනු එකතුන් 23ක් ගුණනය කර ඇගයීම සඳහා අරලගංවිල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට බාර දෙන ලදී. ගොවි ක්ෂේත්‍රවලින් එක් රැස් කරගන්නා ලද කෙසෙල් එකතුන් 25ක් ලක්ෂණීකරණය කර බලාපොරොත්තු තැබිය හැකි සීනි කෙසෙල් එකතුවක් හඳුනා ගන්නා ලදී.

### ජෛව තාක්ෂණය

#### නියඟයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් වී ජනකප්ලාස්මවල රූපාණුදර්ශීය හා අණුක ලක්ෂණීකරණය

පැළැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ සංරක්ෂණය කර ඇති වී ජනකප්ලාස්ම එකතුන් අතරින් තෝරාගත් එකතුන් යොදා ගනිමින් නියඟයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් රූපාණුදර්ශීය හා අණුක ලක්ෂණීකරණයන් සිදු කරන ලදී. තෝරා ගත් එකතුන් 48ක් රූපාණුදර්ශීය වශයෙන් ලක්ෂණීකරණය කරන ලද අතර සමහර එකතුන්වල පොළොව මතුපිට හා පොළව යට දක්නට ලැබෙන නියඟ තත්ත්වය සමග බැඳුණු ඉතා හොඳ ලක්ෂණ හඳුනා ගැනිණි. නියඟ තත්ත්වය සමඟ බැඳි අණුක සලකුණු හඳුනා ගැනීම සඳහා SSR සලකුණු යොදා ගනිමින් අණුක ලක්ෂණීකරණය සිදු කෙරෙමින් පවතී.

#### ග්‍රැනෝලා ප්‍රභේදයේ විවිධ බීජ අර්තාපල් තොගවල ජානමය ප්‍රභේදනය හඳුනා ගැනීම

RAPD පූර්වක යොදා ගනිමින් ග්‍රැනෝලා ප්‍රභේදයේ විවිධ බීජ අර්තාපල් තොගවල DNA මට්ටම් ප්‍රභේදනය හඳුනා ගැනිණි. ග්‍රැනෝලා පරිසර ගහන වර්ග අතර ඉහළ මට්ටමේ බහුරූපීතාවක් නිරීක්ෂණය කරන ලදී. එම විශ්ලේෂණය මත පදනම්ව මෙම පරිසර ගහන වර්ග කාණ්ඩ 4කට වෙන් කිරීමට හැකි විය. මෙමගින් මෙරට වගා කරන ග්‍රැනෝලා ගහනයන් අතර ජානමය ප්‍රභේදනය පෙන්නුම් කෙරේ.

#### දෙමුහුම් එළවළු තක්කාලි ප්‍රභේදවල ජානමය නුමුහුන්බව පරීක්ෂා කර බැලීම

දෙමුහුම් එළවළු තක්කාලි ප්‍රභේදයේ ජානමය නුමුහුන් බව හඳුනා ගැනීම සඳහා SSR සලකුණු 2ක් බිහි කරන ලදී.

#### විදේශීය හා දේශීය වශයෙන් බිහිකරන ලද නුමුහුම් බඩඉරිඟු ආර අතර ජානමය සබඳතාව අධ්‍යයනය කිරීම

විදේශීය හා දේශීය වශයෙන් බිහි කරන ලද නුමුහුම් බඩඉරිඟු ආර 23ක් යොදා ගනිමින් අණුක ලක්ෂණීකරණය සිදු කෙරිණි. පරීක්ෂා කර බලන ලද නුමුහුන් ආර තුළ ඉහළ ජානමය විවිධත්වයක් ඇති බව එම විශ්ලේෂණය තුළින් අනාවරණය විය. මැනවින් ක්‍රියාකාරී වන බඩඉරිඟු දෙමුහුම් බිහිකිරීම සඳහා වඩා උචිත මාපිය ආර තෝරා ගැනීමේදී මෙම අධ්‍යයනයෙන් ජානමය දුරස්තථභාවය පිළිබඳව ලද තොරතුරු ප්‍රයෝජනවත් වනු ඇත.

## නලස්ථ හා පැළෑටි ගෘහ තත්ත්වයන් යටතේ ඩයස්කොරියා, බතල, අර්තාපල් සහ කෙසෙල් විශේෂවල පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය

නලස්ථ මෙන්ම පැළෑටි ගෘහ තත්ත්වය යටතේ ද ඩයස්කොරියා බෝග විශේෂවල ජාන සම්පත් එකතුන් 70ක් නඩත්තු කර ඇත. නලස්ථ තත්ත්වය යටතේ බතල ජාන සම්පත් එකතුන් 190ක් සහ පැළෑටි ගෘහ තත්ත්ව යටතේ බඳුන්ගත ආකාරයෙන් එකතුන් 114ක්ද නඩත්තු කර ඇත. අර්තාපල් එකතුන් 15ක්ද නලස්ථ තත්ත්වය යටතේ නඩත්තු කර ඇත.

## කෙසෙල් නලස්ථව සංරක්ෂණය කිරීම සඳහා ඒවායෙහි දිගු සංරක්ෂණ කාලය හඳුනා ගැනීම

නලස්ථ තත්ත්වය යටතේ දේශීය කෙසෙල් එකතුන් සඳහා වඩා සුදුසු සංරක්ෂණ කාලය හඳුනා ගැනීම පිණිස මෙම අධ්‍යනය සිදු කරන ලදී. විවිධ නලස්ථ සංරක්ෂණ මාධ්‍ය සංයෝග 9ක් යටතේ කෙසෙල් එකතුන් 03ක් (රතඹලා, ඇම්බන් සහ පුලතිසි) පරීක්ෂා කෙරෙමින් පවතී. මෙම පරීක්ෂණ තව දුරටත් සිදුවේ.

## පැළෑටි ජාන සම්පත් තොරතුරු කළමනාකරණ ක්‍රමය

වර්තමානයේ ජාන සම්පත් එකතුන් 13,109ක ක්ෂේත්‍ර දත්ත ද වී, බඩඉරිඟු, කුරක්කන්, තණ හාල්, ඉදල්, ඉරිඟු, කව්පි, මුං, උඳු, සෝයා බෝංචි, තෝර පරිප්පු, රටකජු, බෝංචි, දඹල, මෑ, වම්බටු, තක්කාලි, මාළු මිරිස්, බණ්ඩක්කා, වට්ටක්කා, පතෝල, කරවිල, තම්පලා, නියං වැටකොළු, අබ සහ තල ඇතුළු බෝග 25ක ලක්ෂණීකරණ දත්ත ද මෙම දත්ත මූලයෙහි අන්තර්ගත වේ.

## පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ගවේෂණ ඒකකය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. පුහුණු කණ්ඩායම්වල දැනුම වැඩිදියුණු කිරීම පිණිස පාසැල් ගුරුවරුන්, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ගොවීන් සහ රජයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි මෙම වැඩසටහන් ප්‍රධාන වශයෙන්ම සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන් බොහොමයක් එක් දින පුහුණු වැඩසටහන් වූ අතර විශ්වවිද්‍යාල සිසුහු සහ ඩිප්ලෝමාලාභීහු සමහරක් මාස 1-6 සේවා සංස්කරණ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූහ.

**වගු අංක 2.1.4.5 : පුහුණු කණ්ඩායම් සංඛ්‍යාව**

| පුහුණු කණ්ඩායම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| පාසැල් | 3508 |
| විශ්වවිද්‍යාල | 1012 |
| කෘෂිකර්ම පාසැල් | 303 |
| ගුරුවරුන් | 152 |
| ගොවීන් | 306 |
| වෙනත් (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, විදේශිකයින් ආදිය) | 1304 |
| **එකතුව** | **6585** |

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- සාම්ප්‍රදායික ප්‍රභේදවල, නිර්දේශිත ප්‍රභේදවල පැළෑටි ජාන සම්පත් හා වෙනත් ජානමය ද්‍රව්‍ය හා බෝග වල් දර්ශ ගවේෂණය හා එක්රැස් කිරීම
- පැළෑටි ජාන සම්පත් සංරක්ෂණ කටයුතු අඛණ්ඩව කරගෙන යාම
  - නලස්ථ හා පැළෑටි ගෘහ තත්ත්ව යටතේ බතල, අර්තාපල් සහ කෙසෙල් යන බෝග සංරක්ෂණය හා නඩත්තු තිරීම
  - ගබඩා කර තැබීමේදී ක්‍රියාකාරීවන ආකාරය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම
- පැළෑටි ජාන සම්පත් ලක්ෂණීකරණය, ඇගයීම, සහ ගුණනය
  - ගෙවතු සඳහා සුදුසු බෝග එකතුන් තෝරා ගැනීම
  - නියඟයට ඔරොත්තු දෙන ආකාරය සම්බන්ධයෙන් වී ජනකප්ලාස්ම එකතුන් අණුක සහ රූපාණු දර්ශීය වශයෙන් ලක්ෂණීකරණය කිරීම
  - සුවඳැල් නැමති සාම්ප්‍රදායික වී ප්‍රභේදයේ එකතුන් පිළිබඳ අණුක ලක්ෂණීකරණය
  - වල් බණ්ඩක්කා විශේෂවල කහ විචිත්‍ර වෛරස් රෝගයට ප්‍රතිරෝධී ජාන සලකුණු කිරීම
  - විදේශීය හා දේශීය වශයෙන් බිහිකරන ලද නුමුහුම් බඩඉරිඟු ආර අතර පවතින ජානමය සම්බන්ධය අධ්‍යයනය කිරීම
  - අඹ දෙමුහුම් කිරීමේ හැකියාව පරීක්ෂා කර බැලීම
  - සෙමෙන් වර්ධනය වීම ප්‍රේරණය කිරීම මගින් කෙසෙල් නලස්ථ සංරක්ෂණය සඳහා ඒවායෙහි දිගු සංරක්ෂණ කාලය හඳුනා ගැනීම
- අල බෝගවල නලස්ථ තත්ත්ව යටතේ ආකන්ද ඇති කිරීම සඳහා ප්‍රශස්ත තත්ත්වයන් හඳුනා ගැනීම
- දත්ත කළමනාකරණ ක්‍රමය නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම
- ජාතික තොරතුරු හුවමාරු යාන්ත්‍රණය නඩත්තු කිරීම
- පැළෑටි ජාන සම්පත් බෙදා හැරීම
- පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී/ සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 08 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 04 |
| වැඩසටහන් සහකාර | 02 |
| සංවර්ධන නිලධාරි | 02 |
| පර්යේෂණ උප සහකාර | 04 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 |
| ගබඩාකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 04 |
| ලොරි සහායක | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| විදුලි ශිල්පී | 03 |
| මුරකරු | 05 |
| කම්කරු | 16 |
| කම්කරු (කොන්ත්‍රාත් පදනම) | 22 |
| **එකතුව** | **85** |

# 2.2 ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක

ශ්‍රී ලංකා ජාතික පැළෑටි නිරෝධායන සේවයට පැවරී ඇති වගකීම වනුයේ මෙරට කෘෂිකර්මාන්තය සහ ආශ්‍රිත කර්මාන්තවල දියුණුව සඳහා පළිබෝධ වලින් තොර පැළ සහ පැළ නිෂ්පාදන ආනයනය කිරීම සහ අපනයනය කිරීම සඳහා පහසුකම් සැලසීමයි. මෙම වගකීම ඉටු කිරීම සඳහා පර්යේෂණ මෙන්ම සේවාවන්ද පාදක කරගත් නිරෝධායන කාර්යයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදි.

ජාතික පැළෑටි නිරෝධායන සේවය මගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් වනුයේ උද්භිද ස්වස්ථතාව සහතික කිරීම, ආනයන කරන සහ අපනයනය කරන පැළෑටි සහ පැළෑටි නිෂ්පාදන පරික්ෂා කිරීම හා ඒවාට අවශ්‍ය ප්‍රතිකර්ම කිරීම, රඳවා ගනු ලැබූ නියැදි පරික්ෂා කිරීම සහ මේ පිළිබඳ උනන්දුවක් දක්වන කණ්ඩායම්වලට පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පැළෑටි නිරෝධායනයේ සියළුම අංශ පිළිබඳ දැනුම බෙදා දීමයි. එමෙන්ම, මෙම ආයතනය තම කටයුතු වලදී නිරතුරුවම ජාතික පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනෙකුත් ආයතන සහ මධ්‍යස්ථාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි.

## අයවැය

පුනරාවර්තන, මූලධන හා ව්‍යාපෘති වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 2.2.1 හි දැක්වේ.

**වගු අංක 2.2.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 7,033,000 | 3,696,354 | 53 |
| පුනරාවර්තන | 8,974,325 | 8,142,538 | 91 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යටතේ වූ ව්‍යාපෘතිය | 2,620,700 | 2,493,308 | 95 |
| **එකතුව** | **18,628,025** | **14,332,200** | **77** |

## ප්‍රගතිය

### පැළෑටි නිරෝධායන කටයුතු

2013 වසරේදී පැළෑටි නිරෝධායන මෙහෙයුම් අංශය විසින් ඉටු කළ කාර්යයන් වගු අංක 2.2.2 හි දැක්වේ

**වගු අංක 2.2.2: 2013 වසරේදී ඉටු කරන ලද කාර්යයන්**

| කාර්යය | කාර්යඵල |
|---|---|
| රඳවා ගත් තොග ලියාපදිංචිය | 346 |
| රඳවා ගත් සංඛ්‍යාව | 326 |
| පරීක්ෂණ ලියාපදිංචි කිරීම | 1444 |
| ප්‍රවේශ ස්ථාන වෙත යවන ලද පරීක්ෂණ වාර්තා ගණන | 1375 |

| කාර්යය | කාර්යඵල |
|---|---|
| පරීක්ෂා කිරීම සඳහා කොහු නිෂ්පාදන ලියාපදිංචි කිරීම | 503 |
| පරීක්ෂා කරන ලද කොහු නිෂ්පාදන සඳහා වාර්තා | 492 |
| පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද නියැදි ලියාපදිංචි කිරීම | 19 |
| උද්භිද ස්වස්ථතා සහතික නිකුත් කිරීම | 06 |
| විනාශ කරන ලද ගැටළු සහිත තොග සංඛ්‍යාව | 953 |
| නිකුත් කරන ලද ආනයන බලපත්‍ර සංඛ්‍යාව | 3292 |

පැළෑටි නිරෝධායන කටයුතු වලට අදාළ මෙම කාර්යයන්ට අමතරව මෙම ආයතනය පැළෑටි නිරෝධායන සහ ක්‍රියා පටිපාටිය පිලිබඳ පුළුල් පුහුණු වැඩසටහන් 10ක සම්බන්ධීකරණය සහ මෙහෙයවීම සිදු කරන ලදි.

## කීට විද්‍යාව

### අපනයනය කරන සහ ආනයනය කරන තොග ව්‍යාධිජනක සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම

#### අපනයන

- අපනයන විසිතුරු පැළ තවාන් 16කින් එක්රැස් කරගත් විසිතුරු පැළ නියැදි 12339ක් පැළෑටි පරපෝෂිත වටපණුවන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදි. නියැදි 532ක් පැළෑටි වටපණු ආසාදනයට ලක් වී තිබුණි.

- අපනයනය සඳහා ඇති විසිතුරු පැළ නියැදි 18498ක් කෘමි පළිබෝධ සහ මයිටාවන් සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කෙරිණි. කිසිදු ආසාදිත තත්ත්වයක් වාර්තා නොවීය.

- කොහු නිෂ්පාදන කර්මාන්ත ශාලා 17කින් එක්රැස් කරගත් අපනයනය කරන කොහු නියැදි 413ක් කෘමි පළිබෝධ, මයිටාවන්, පාංශු ආසාදන කාරක සහ පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදි. ආසාදන කාරක 06ක් වාර්තා විය.

- අපනයන විසිතුරු පැළ තවාන් මගින් ඉදිරිපත් කරන ලද වෙනත් විශේෂ නියැදි 26ක් පැළෑටි පරපෝෂිත වටපණුවන් හා කෘමි පළිබෝධ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදි. ඔවුන්ගේ පළිබෝධ නිරීක්ෂණ වැඩසටහනට සහයක් වශයෙන් සිදු කෙරිණි.

#### ආනයන

- ආනයනය කරන ලද බීජ අර්තාපල් තොග 33ක් වරායේදී පරීක්ෂා කර බලන ලදි. මෙම නියැදි එක්රැස් කරගෙන කෘමි පළිබෝධ සහ පැළෑටි පරපෝෂිත වටපණුවන් සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කෙරුණු අතර කිසිදු ආසාදනයක් වාර්තා නොවීය.

- ආනයනය කරන ලද දෙමුහුම් බඩ ඉරිඟු, රටකජු, පුවක්, කජු, ස්පැග්නම් (Sphagnum) පීට් මොස්, ලිලියම් බල්බ, පැසවීමට ලක් කළ කොකෝ ඇට යනාදිය ඇතුළු රෝපණ ද්‍රව්‍ය 255ක් කෘමි පළිබෝධ, මයිටාවන් සහ පැළෑටි පරපෝෂිත වටපණුවන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලද අතර නියැදි 8ක් සාමාන්‍ය ගබඩා පළිබෝධ හේතුවෙන් ආසාදනය වී තිබූ බව සොයා ගැනිණි. එමෙන්ම, ඉන්දුනීසියාවෙන් ආනයනය කරන ලද පුවක් නියැදියක්ද ක්‍රිප්ටොලෙස්ටස් විශේෂ (*Cryptolestess* spp.) හේතුවෙන් ආසාදනය වී තිබුණි.

### පුහුණු කිරීම

විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ පාසැල් සිසුන් රැසකට කීට විද්‍යා අංශය යටතේ පුහුණුව ලබා දෙන ලදි. අපනයන විසිතුරු පැළ තවාන් කාර්යය මණ්ඩල සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් පැවැත්විණි.

## ව්‍යාධිවේදය

### අපනයන සහ ආනයන තොග ව්‍යාධිජනක සම්බන්ධයෙන් පරික්ෂා කර බැලීම

#### අපනයන තොග

#### විසිතුරු පැළ

අපනයන විසිතුරු පැළ 11138ක් පරික්ෂා කර බලා පහත සඳහන් ව්‍යාධිජනක සොයා ගන්නා ලදි. ම්‍යුකර් විශේෂය (Mucor sp.,), ඇස්පර්ගිලස් විශේෂය (Aspegillus sp.,), ෆ්‍යුසාරියම් විශේෂය (Fusarium sp.,), කොලෙලොට්‍රොට්‍රිකම් විශේෂය (Colletotrichum sp.,), මැක්‍රොෆොමිනා විශේෂය (Macrophomina sp.,), පෙනිසිලියම් විශේෂය (Penicillium sp.,), රයිසෝෆස් විශේෂය (Rhizopus sp.,), සැන්තොමොනාස් විශේෂය (Xanthomonas sp.,), සහ අර්විනියා විශේෂය (Erwinia sp.,), පෙස්ටලෝසියා විශේෂ (Pestalosia spp.,), කර්වුලේරියා විශේෂය (Cuvularia sp.,), එන්ටෙරෝබැක්ටර් ක්ලෝආ (Enterobacter cloea.,), එන්ටෙරෝබැක්ටර් කැන්සෙරෝගිනස් (Enterobacter cancerogenus)

#### කොහු

කොහු නිෂ්පාදන කම්හල් වලින් එක්රැස් කරගත් අපනයනය සඳහා ඇති කොහු නියැදි 114ක් පැළැටි ව්‍යාධිජනක සම්බන්ධයෙන් පරික්ෂාවට ලක් කෙරිණි. එක්රැස් කරගත් කොහු නියැදිවල ම්‍යුකර් විශේෂය (Mucor sp.,), ඇස්පර්ගිලස් විශේෂය (Aspegillus sp.,), පෙනිසිලියම් විශේෂය (Penicillium sp.,), රයිසොපස් විශේෂය (Rhizopus sp.,), තැලවියොප්සිස් පැරඩොක්සා (Thalaviopsis parsdoxa) තිබී සොයා ගන්නා ලදි.

මෙම ව්‍යාධිජනක අතරින් තැලවියෝපිසිස් පැරඩොක්සා (Thalaviopsis paradora) නිරෝධායන වැදගත්කමකින් යුත් පළිබෝධයෙකු වශයෙන් සැළකේ.

#### පටක රෝපිත පැළ

පරීක්ෂා කිරීම් 115කදී පැළෑටි 1139331ක් පරික්ෂා කර බලන ලදි. පරික්ෂා කිරීම් වලදී ආසාදිත නියැදි තිබූ බහාලුම් ප්‍රතික්ෂේප කරන ලද අතර නිෂ්පාදන වල ගුණාත්මය ඉහළ නැංවීම පිණිස අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි. උපදෙස් ලබාදීමෙන් පසු ආසාදන තත්ත්ව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී තිබුණි.

#### ආනයන තොග

#### බීජ අර්තාපල්

බීජ අර්තාපල් නියැදි 80ක් පරික්ෂා කර පහත සඳහන් රෝග හඳුනා ගන්නා ලදි.

රිදී පටල රෝගය, පොදු කබොළු රෝගය, මෘදු කුණු වීම, කළු පටල රෝගය, ජාලාකාර රෝගය සහ වියළි කුණුවීම. මෙහිදී නිරෝධායන ව්‍යාධිජනක කිසිවක් සොයා ගැනීමට නොලැබුණි. ජියෝට්‍රිකම් කැන්ඩිඩම් (Geotricum candidum), කොලෙටොට්‍රිකම් අල්ට්‍රාමෙන්ටේරියම් (Colletotricum altramentarium) සහ කර්වුලේරියා විශේෂය (Curvularia sp.) නියැදි වලින් අනාවරණය කරගත් අනෙකුත් ව්‍යාධිජනක වේ.

#### බීජ සහ අනෙකුත් රෝපණ ද්‍රව්‍ය

නියැදි 276ක් පරික්ෂා කර බැලූ අතර නිරෝධායන ව්‍යාධිජනක කිසිවක් නොතිබුණි.

## එවන ලද නියැදි පරීක්ෂා කිරීම

නියැදි 06ක් පරීක්ෂා කර බැලූ අතර යෝජනා/ සොයා ගැනීම් වගකිව යුතු පාර්ශ්ව වෙත ලබා දෙන ලදි.

## පුහුණු කිරීම්

- පුහුණු වැඩසටහන් 07ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් සිදු කරන ලදි.
- උපාධි අපේක්ෂකයින් සහ ඩිප්ලෝමා සිසුන් 43ක් අධීක්ෂණය කරන ලදි.

## පර්යේෂණ වැඩසටහන්

- බීජ අර්තාපල්වල ඇති රැල්ස්ටෝනියා සොලනේසියාරුම් [(Ralstonia solanacearum (E.F.Smith)] අණුක තාක්ෂණය මගින් හඳුනා ගැනීම, අණුක තාක්ෂණය මගින් ආසාදිත ඩ්‍රසීනා සැන්ඩ්‍රියානා (Dreceana Sandreana) පත්‍රවල කාරක ජීවියා හඳුනා ගැනීම සහ සුදුසු පාලන ක්‍රමයක් සොයා ගැනීම පිළිබඳ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.
- ඩ්‍රැසීනා සැන්ඩ්‍රියානාවල (Draceana Sandreana) පත්‍රවල තෙල් පැල්ලම් රෝගයේ කාරක ජීවියා හඳුනා ගැනීම සහ පාලනය කිරීම.
- කෝඩිලයින්වල (Cordyline fruticosa glauca) නටුව කුණුවීමේ කාරක ජීවීන් හඳුනා ගැනීම
- එලිසා තාක්ෂණය මගින් බඩඉරිඟු ස්ට්‍රීක් වෛරසය, බඩඉරිඟු ස්ට්‍රිප් වෛරසය සහ බඩඉරිඟුවල ඩ්වෝෆ් මොසායික් වෛරස් පරීක්ෂා කර බලන ලදි. නියැදි 53ක් පරීක්ෂා කර බලන ලද අතර එක් වෛරසයක් හෝ නොතිබුණි.
- මස්තු විද්‍යාත්මක ක්‍රමය යොදා ගනිමින් අර්තාපල් A වෛරසය, අර්තාපල් M වෛරසය සහ අර්තාපල් S වෛරසය ආනයනික බීජ අර්තාපල් වල තිබේදැයි පරීක්ෂා කර බලන ලදි. නියැදි 75ක් පරීක්ෂාවට ලක් කෙරුණු අතර කිසිදු වෛරසයක් නොතිබුණි.

## වල් පැළෑටි විද්‍යාව

### අපනයන සහ ආනයන තොගවල ව්‍යාධිජනක ඇත්දැයි පරීක්ෂා කර බැලීම්

- **අපනයන**

අපනයනය සඳහා වූ කොහු බත් නිෂ්පාදන 743ක් පරීක්ෂා කර බලන ලද අතර ඉන් 17ක් ජීව්‍ය බීජ එකතු වී අපවිත්‍ර වී තිබූ අතර 109ක් වැලි මිශ්‍රවීමෙන් අපවිත්‍ර වී තිබුණි.

- **ආනයනය**

වල් බීජ අඩංගු දැයි පරීක්ෂා කර බැලීම සඳහා එළවළු බහාලුම් 97ක නියැදි පරීක්ෂා කර බලන ලද අතර සුදුරු තොග 04ක්, බීජ ලූණු තොග 02ක්, කැරට් බීජ තොග 04ක් සහ කොත්තමල්ලි තොග 01ක් වල් බීජ හේතුවෙන් අසාදනය වී තිබුණු අතර ඉන් කීපයක් නිරෝධායන වැදගත්කමින් යුතු ඒවා විය. ඒවා නම් : යුෆෝබියා ඩෙන්ටාටා (Euphorbia dentata), සෝගම් හැල්පෙන්ස් (Sorghum halpens), කොන්වොල්ව්‍යුලස් ආර්වෙන්සිස් (Convolvulus arvensis), චෙනෝපෝඩියම් ඇල්බම් (Chenapodium album), පොලිගොනම් විශේෂ (Polygonum spp.) සහ රුමෙක්ස් විශේෂ (Rumex spp.)

### පුහුණු

විශ්වවිද්‍යාල, තාක්ෂණික විද්‍යාල සහ පාසැල් සිසුන් විශාල සංඛ්‍යාවක් වල් පැළෑටි විද්‍යා අංශය යටතේ පුහුණු කරන ලදි.

### පර්යේෂණ වැඩසටහන්

කොකෝ පිටි නිෂ්පාදනවල ජීව්‍ය බීජ තිබේදැයි පරීක්ෂා කර බැලීමට සිදු කරන වර්ධනය පිළිබඳ පරීක්ෂණය (grow – out

test ලෝක සම්මත පරීක්ෂණ පටිපාටිය) සම්පූර්ණ කිරීම සඳහා මාසයකට ආසන්න කාලයක් අවශ්‍ය වේ. කොකෝ පීට් නිෂ්පාදනවල පැවති වල් බීජවල සුප්තතාව බිඳ හෙලීම සඳහා ප්‍රතිකර්ම කීපයක් සිදු කරන ලදි. උණු වතුර ප්‍රතිකර්මය (80 - 90C°) මගින් වල් බීජ සුප්තතාව බිඳ හෙලීමට හැකි වූ අතර ඒ අනුව වර්ධනය පිළිබඳව සිදු කරන පරික්ෂණය (grow – out test) සඳහා කාලය දින 10 – 15කින් අඩු කළ හැකි විය.

**පශ්චාත් නිරෝධායන අධ්‍යයනය :** ෆැලෝපියා කොන්වොල්වුලස් (Fallopia convolvulus) ශ්‍රී ලංකාවේ සොයා ගත නොහැකි විනාශකාරි වල් පැළෑටියකි. එම වල් පැළෑටියේ වර්ධන පරාමිතීන් සහ පරිසරවේදය (ඇලීලොපතික බලපෑම් සහ තරඟකාරීත්වය) පිළිබඳව අධ්‍යයනය කළ අතර අවසන් වාර්තාව පසුව සකස් කෙරෙනු ඇත.

### විමර්ශන එකතුව නඩත්තු කිරීම

- නව වල් පැළෑටි 4ක් එක්රැස් කර සංරක්ෂණය කෙරිණි.
- නව වල් පැළෑටි බීජ විශේෂ 15ක් එක්රැස් කර සංරක්ෂණය කරන ලදි.

## ප්‍රතිකර්ම තාක්ෂණය

### වාණිජ ධූමකරණය

**වගු අංක 2.2.3: 2013 වසරේදී කටුනායක ජාතික පැළෑටි නිරෝධායන සේවයේදී සිදු කළ ධූමායන**

| ධූමකරණය කළ ද්‍රව්‍ය | ධූමකරණ සංඛ්‍යාව |
|---|---|
| කොහු හා කොහු නිෂ්පාදන | 16 |
| දැව සහ දැව භාණ්ඩ | 12 |
| මල් | 04 |
| කුළු බඩු | 01 |
| පලතුරු | 02 |
| වෙනත් (Gatton calamus) | 07 |
| පැළ (ස්ට්‍රෝබෙරි) | 01 |
| කැපූ පත්‍ර | 01 |
| **එකතුව** | **44** |

### නිරෝධායන ප්‍රතිකර්ම අධීක්ෂණය කිරීම

අපනයනකරුවන්ගේ ඉල්ලීම පරිදි, පෞද්ගලික ධූමකරුවන් විසින් ලී ඇසුරුම් සහ අනෙකුත් පැළෑටි හා පැළෑටි නිෂ්පාදන සඳහා සිදු කළ ධූමකරණ 281ක් සහතිකකරණ කටයුතු සඳහා ප්‍රතිකර්ම තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් අධීක්ෂණය කරන ලදි.

ඕස්ට්‍රේලියානු ධූමකරණ බලයලත් සංකීර්ණයට සම්බන්ධ වීම සඳහා 2013 මාර්තු සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී විගණන වැඩසටහන් සිදු කරන ලදි.

## 2014 වසර සඳහා සැලැස්ම

- තත්ත්වයෙන් උසස් පැළ සහ පැළ නිෂ්පාදන අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- ආනයනික බීජ අර්තාපල් වල ගුණාත්මක තත්ත්වය තහවුරු කර ගැනීම.
- ආනයනික පැළ සහ පැළ නිෂ්පාදන වල ගුණාත්මක තත්ත්වය තහවුරු කර ගැනීම.
- ආනයනික බීජ, පලතුරු සහ එළවළු වල ගුණාත්මක තත්ත්වය තහවුරු කර ගැනීම
- උද්භිද ස්වස්ථතා අවශ්‍යතාවයන් සපුරා නොමැති ආනයන වැළැක්වීම.
- පශ්චාත් ප්‍රවේශ නිරෝධායනය.

- අපනයන සහ ආනයන පැළ සහ පැළ නිෂ්පාදන වලින් සොයා ගත් පළිබෝධ තුරන් කිරීමේ ප්‍රතිකර්ම
- විමර්ශන එකතුව නඩත්තු කිරීම
- පාර්ශ්වකරුවන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- නිරෝධායන ආශ්‍රිත පර්යේෂණය
- පැළ තවාන් ලියාපදිංචි කිරීම
- ප්‍රතිකර්ම සපයන්නන් සතු පහසුකම් ඇගයීම
- උද්භිද ස්වස්ථතා සහතික නිකුත් කිරීම
- ආනයන බලපත්‍ර නිකුත් කිරීම (පැළ සහ පැළ නිෂ්පාදන)

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

### ජාතික පැළෑටි නිරෝධායන සේවය, කටුනායක

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 05 |
| කෘෂිකර්ම නිලධාරි | 02 |
| පරිපාලන නිලධාරි | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර | 05 |
| පර්යේෂණ නිලධාරි | 06 |
| සංවර්ධන නිලධාරි | 02 |
| කෘෂිකර්ම උපදේශක | 15 |
| බීජ තාක්ෂණික ශිල්පී | 01 |
| තාක්ෂණික සහායක | 01 |
| රසායනාගාර උප උපදේශක | 01 |
| කළමනාකරණ සහකාර | 06 |
| රියදුරු | 05 |
| විදුලි ශිල්පී | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| කම්කරු | 04 |
| කම්කරු - කොන්ත්‍රාත් | 07 |
| මුරකරු | 06 |
| **එකතුව** | **73** |

### පැළෑටි නිරෝධායන සේවය, වරාය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථානභාර පර්යේෂණ නිලධාරි | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 04 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 03 |
| වැඩසටහන් සහකාර | 01 |
| පර්යේෂණ සහකාර | 06 |
| කෘෂිකර්ම උපදේශක | 11 |
| කළමනාකරණ සහකාර | 01 |
| කම්කරු (ස්ථිර) | 01 |
| **එකතුව** | **28** |

### පැළෑටි නිරෝධායන සේවය, ගුවන්තොටුපළ

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 01 |
| පර්යේෂණ සහකාර | 02 |
| කෘෂිකර්ම උපදේශක | 13 |
| කළමනාකරණ සහකාර | 01 |
| කම්කරු | 02 |
| **එකතුව** | **20** |

### පැළෑටි නිරෝධායන සේවය, ගන්නොරුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| කම්කරු | 01 |
| **එකතුව** | **02** |

## 2.3 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය

අස්වැන්න ඉහළ නංවාලීමටත් ගුණාත්මක නිෂ්පාදනයක් බිහි කිරීමට සහ ඒකක නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහාත් වඩාත් වැදගත් යෙදුම් වනුයේ තත්ත්වයෙන් උසස් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍යයයි. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය මගින් බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම සහ දිවයින පුරා කාර්යක්ෂමව අලෙවි කිරීමෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු, අර්තාපල් යන බෝගවල නිර්දේශිත දේශීය ප්‍රභේද වල මූලික බීජ සහ පලතුරු සහ එළවළු වල තත්ත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම බෙදා හැරීම සහ අලෙවි කිරීම මෙම මධ්‍යස්ථානය මුහුණ දෙන අභියෝග වන අතර ඉහත සඳහන් මූලික බීජ සහ සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා මෙම අංශයේ අධීක්ෂණය යටතේ බීජ ගොවිපළ 20ක් ක්‍රියාත්මක වේ. කෙසේ වුවද, දිවයින පුරා විසිර පවතින නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක කලාපීය ඒකක 13 මගින් තෝරා ගත් කොන්ත්‍රාත් වගාකරුවන් හරහා වී සහ වෙනත් ක්ෂේත්‍ර බෝගවල සහතික කළ බීජ සහ එළවළු බෝගවල සම්මත බීජ නිෂ්පාදනය කරනු ලබයි. අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය), අතිරේක අධ්‍යක්ෂ ( එළවළු සහ රෝපණ ද්‍රව්‍ය), අතිරේක අධ්‍යක්ෂ (අර්තාපල්), මූලස්ථාන නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් සහ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්ගේ මඟ පෙන්වීම සහ සුපරීක්ෂණය යටතේ කලාපීය මට්ටමින් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් (බීජ) හරහා වත්මන්හි බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථාන සිය කාර්යයන් ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලාංකීය ගොවි ප්‍රජාව වෙත තරඟකාරී මිළ ගණන් වලට ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය සැපයීම සහතික කිරීම මෙම අංශයේ මෙහෙවර වන අතර මූලික සහ සහතික කළ/සම්මත බීජ සහ සහතික කළ රෝපණ ද්‍රව්‍ය රජයේ ගොවිපළ තුළදී නිෂ්පාදනය කිරීම, බීජ නිෂ්පාදකයින් සඳහා මූලික බීජ සැපයීම, කොන්ත්‍රාත් වගාකරුවන් හරහා සහතික කළ බීජ ගුණනය කිරීම සහ වාණිජ වගාකරුවන් වෙත සැපයීම, රජයේ ගොවිපළ කළමනාකරණය කිරීම, බීජ ව්‍යාපාර සංවර්ධනය සහ සම්බන්ධීකරණය, බීජ වල ස්වාරක්ෂක තොග (BUFFER STOCKS) නඩත්තු කිරීම සහ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයුම සම්බන්ධීකරණය කිරීම ප්‍රධාන කාර්යයන් වේ.

### පරමාර්ථ:

මූලික සහ සහතික කළ බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, සැකසුම් කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම සහතික කිරීම.

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය කර්මාන්තයක් බිහි කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම.

පාර්ශ්වකරුවන් සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළිබඳ සියළුම අංශ සම්බන්ධයෙන් අවශ්‍ය පුහුණු පහසුකම් සහ තොරතුරු ලබාදීම.

### රටතුළ බීජ හා රෝපණ ද්‍රව්‍යවල සුරක්ෂිතභාවය ඇති කිරීම

මෙම මධ්‍යස්ථානයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා 2012/13 මහ සහ 2013 යල කන්න ඇතුළත් වන පහත දැක්වෙන කාර්යයන් 2013 වසරේදී ඉටු කරන ලදි.

## අයවැය

**වගු අංක 2.3.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂ | ප්‍රතිපාදනය (රු.මිලියන) | වියදම (රු.මිලියන) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 65.775 | 44.70 | 68 |
| පුනරාවර්තන | 79.8 | 157.6 | 197 |
| බීජ නිෂ්පාදන වැඩසටහන | 250.0 | 223.47 | 89 |
| JICA | 29.4 | 13.6 | 46 |
| කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන | 200.0 | 193.81 | 97 |
| **එකතුව** | **624.98** | **633.18** | **101** |

## ප්‍රගතිය

### බිත්තර වී නිෂ්පාදනය සහ සැපයුම

#### රජයේ බීජ ගොවිපළ වල මූලික බිත්තර වී සහ සහතික කළ බිත්තර වී නිෂ්පාදනය

රජයේ බීජ ගොවිපළ 10කදී නිර්දේශිත වී ප්‍රභේද 25ක අත්තිවාරම් බිත්තර වී සහ ලියාපදිංචි බිත්තර වී නිෂ්පාදනය කරන ලදී. බතලගොඩ වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සහ එහි සහායක මධ්‍යස්ථාන වන බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, අම්බලන්තොට වී පර්යේෂණ ස්ථානය, ලබුදූව කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය යන ආයතන මගින් ලද අභිජනක බීජ යොදා ගනිමින් අත්තිවාරම් බිත්තර වී නිපදවිය. නිෂ්පාදිත අත්තිවාරම් බීජ ඇසුරින් ලියාපදිංචි බිත්තර වී නිපදවා එම බීජ සහතික කළ බිත්තර වී නිපදවා ගැනීමට යොදා ගැනීමටත් එමගින් පරිභෝජනය සඳහා වී නිෂ්පාදනය කිරීමත් සිදු කෙරේ.

2012 වසරේදී නිෂ්පාදිත ලියාපදිංචි බිත්තර වී (RSP) ප්‍රමාණය බුසල් 122,156ක් පමණ වන අතර එම ප්‍රමාණය ජාතික සහතික කළ බිත්තර වී (CSP) අවශ්‍යතාවෙන් 25%ක් වූ (බුසල් 1,600,000) සැලසුම් කරන ලද කන්නමය සැපයුම නිෂ්පාදනය කිරීම සඳහා වන අවශ්‍යතාවය ඉක්ම වූවකි. කෙසේවුවද නිෂ්පාදනය කරන ලද ලියාපදංචි කළ බිත්තර වී (RSP) ප්‍රමාණය සහතික කළ බිත්තර වී වල (CSP) මුළු වාර්ෂික ජාතික අවශ්‍යතාවයෙන් (6,400,000) 76%ක් (බුසල් 4,864,000ක්) නිපදවීම සඳහා ප්‍රමාණවත් විය.

අත්තිවාරම් බිත්තර වී (FSP) නිෂ්පාදිත ප්‍රමාණය බුසල් 7844ක් වූ අතර එම ප්‍රමාණය ජාතික අත්තිවාරම් බිත්තර වී (FSP) අවශ්‍යතාවය (බුසල් 4000) ඉක්ම වූවකි. ඊට අමතරව අත්තිවාරම් බිත්තර වී (FSP) සහ ලියාපදිංචි කළ බිත්තර වී (RSP) නිෂ්පාදන ක්‍රියාවලියේදී තත්ත්වයෙන් බාල වීම හේතුවෙන් සහතික කළ බිත්තර වී (CSP) බුසල් 11,154ක් නිපදවිය.

2012/13 මහ සහ 2013 යල කන්න වලදී ගොවිපළවල් වලදී නිෂ්පාදිත මූලික බිත්තර වී නිෂ්පාදනය පිළිබඳ තොරතුරු වගු අංක 2.3.2හි දැක්වේ.

වගු අංක **2.3.2: 2013** වසරේදී රජයේ බීජ ගොවිපළ වලදී නිෂ්පාදනය කළ මූලික බිත්තර වී ප්‍රමාණය (මෙ.ටො)

| ගොවිපළ | 2012/13 මහ | | | 2013 යල | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **FSP** | **RSP** | **CSP** | **FSP** | **RSP** | **CSP** | **FSP** | **RSP** | **CSP** |
| අළුත්තරම | 4.182 | 72.98 | 5.92 | 9.84 | 95.65 | 14.74 | 14.02 | 168.63 | 20.66 |
| මල්වත්ත | 4.82 | 87.88 | 8.53 | 12.92 | 169.43 | 75.32 | 17.74 | 257.31 | 83.85 |
| පොළොන්නරුව | 13.71 | 331.61 | 0 | 12.81 | 348.00 | 0 | 26.52 | 679.61 | 0 |
| බට අත | 2.58 | 60.84 | 13.97 | 0 | 38.34 | 18.27 | 2.58 | 99.18 | 32.24 |
| අම්බන්තොට | 3.34 | 84.46 | 4.78 | 3.22 | 57.11 | 0 | 6.56 | 141.57 | 4.78 |
| මහ ඉලුප්පල්ලම | 33.89 | 349.18 | 56.92 | 24.33 | 213.28 | 18.35 | 58.22 | 562.46 | 75.27 |
| කන්තලේ | 6.36 | 169.29 | 0.08 | 17.63 | 222.52 | 4.08 | 23.99 | 391.81 | 4.16 |
| මුරුන්කන් | 3.16 | 57.60 | 11.30 | 0 | 0 | 0 | 3.16 | 57.60 | 11.30 |
| පරන්තන් | 4.88 | 69.99 | 10.95 | 3.14 | 24.17 | 22.79 | 8.02 | 94.16 | 33.74 |
| කරඩියනාරු | 0 | 17.12 | 9.72 | 0 | 34.75 | 22.92 | 0 | 51.87 | 32.64 |
| **එකතුව (මෙ.ටො)** | **76.92** | **1300.95** | **122.17** | **83.89** | **1203.25** | **176.47** | **160.81** | **2504.25** | **298.64** |
| **එකතුව (බුසල්)** | **3752** | **63461** | **5960** | **4092** | **58695** | **5194** | **7844** | **122156** | **11154** |

FSP - අත්තිවාරම් බීජ නිෂ්පාදනය

RSP - ලියාපදිංචි කළ බීජ නිෂ්පාදනය

CSP - සහතික කළ බීජ නිෂ්පාදනය

බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය පූර්ව වර්ෂ වලදී කොන්ත්‍රාත් බිත්තර වී නිෂ්පාදන වැඩසටහන හරහා සහතික කළ බිත්තර වී (CSP) නිෂ්පාදනය කළ මුත් කෘෂිකර්ම අමාත්‍යාංශය ගත් තීරණයකට අනුව 2013 වසරේදී එම වැඩසටහන ක්‍රියාත්මක නොකරන ලදි.

## බිත්තර වී නිකුත් කිරීම

2013 වසරේදී බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය මගින් බීජ නිෂ්පාදනය සහ වාණිජ වගාව සඳහා නිකුත් කරන ලද මුළු බිත්තර වී ප්‍රමාණය පිළිබඳ තොරතුරු වගු අංක 2.3.3.හි දැක්වේ. පූර්ව කන්නයේදී අභිජනක බීජ මගින් නිෂ්පාදනය කරන ලද අත්තිවාරම් බීජ ලියාපදිංචි කළ බිත්තර වී නිපදවීම සඳහා යොදා ගනු ලැබේ. ලියාපදිංචි කළ බිත්තර වී සහ යම් ප්‍රමාණයකින් අත්තිවාරම් බිත්තර වී සහතික කළ බිත්තර වී නිෂ්පාදකයන් සඳහා සපයනු ලබන අතර ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික අංශයේ සමාගම්, ගොවි සමුපකාර සහ අනෙකුත් ගොවි සංවිධාන, ගොවීන් සහ ඇතැම් මහවැලි සහ පළාත් කෘෂිකර්ම ගොවිපළ වල් මගින් සහතික කළ බිත්තර වී නිෂ්පාදනය කරනු ලැබේ. 2013 වසරේදී සපයන ලද මුළු ලියාපදිංචි කළ බිත්තර වී ප්‍රමාණය මෙ.ටො. 2215.92 (බුසල් 108,094ක්) වූ අතර සපයන ලද සහතික කළ බිත්තර වී ප්‍රමාණය මෙ.ටො. (බුසල් 15,640ක්) විය.

**වගු අංක 2.3.3: 2013 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සපයන ලද බිත්තර වී ප්‍රමාණය**

| කන්නය | වැඩසටහන | අත්තිවාරම් | ලියාපදිංචි | උප එකතුව | සහතික කළ | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | මෙ.ටො | බුසල් |
| 2013 යල | ගොවිපළ | 25.91 | 5.35 | 31.26 | 0.57 | **31.83** | **1553** |
| | කොන්ත්‍රාත් වගාව | 0 | 0 | 0 | 0 | **0** | **0** |
| | පෞද්ගලික | 3.67 | 290.0 | 293.67 | 11.42 | **305.09** | **14882** |
| | ව්‍යාප්ති | 5.95 | 641.28 | 647.23 | 72.88 | **720.11** | **35127** |
| | **උප එකතුව (මෙ.ටො)** | **35.53** | **936.63** | **972.16** | **84.87** | **1057.03** | |
| | **උප එකතුව (බුසල්)** | **1733** | **45689** | **47422** | **4140** | | **51562** |
| 2013/14 මහ | ගොවිපළ | 34.5 | 3.94 | 38.44 | 0.94 | **39.38** | **1921** |
| | කොන්ත්‍රාත් වගාව | 0 | 0 | 0 | 0 | **0** | **0** |
| | පෞද්ගලික | 8.53 | 319.51 | 328.04 | 5.55 | **333.59** | **16273** |
| | ව්‍යාප්ති | 17.55 | 955.84 | 973.39 | 229.27 | **1202.66** | **58666** |
| | **උප එකතුව (මෙ.ටො)** | **60.58** | **1279.29** | **1339.87** | **235.76** | **1575.63** | |
| | **උප එකතුව (බුසල්)** | **2955** | **62404** | **65359** | **11500** | | **76859** |
| 2013 වසර සඳහා නිකුත් කිරීම | ගොවිපළ | 60.41 | 9.29 | 69.70 | 1.51 | **71.21** | **3474** |
| | කොන්ත්‍රාත් වගාව | 0 | 0 | 0 | 0 | **0** | **0** |
| | පෞද්ගලික | 12.20 | 609.51 | 621.71 | 16.97 | **638.68** | **31155** |
| | ව්‍යාප්ති | 23.50 | 1597.12 | 1620.62 | 302.15 | **1922.77** | **93793** |
| | **උප එකතුව (මෙ.ටො)** | **96.11** | **2215.92** | **2312.03** | **320.63** | **2632.66** | |
| | **උප එකතුව (බුසල්)** | **4688** | **108094** | **112782** | **15640** | | **128422** |

## වෙනත් ක්ෂේත්‍ර බෝගවල බීජ නිෂ්පාදනය සහ බෙදා හැරීම

2013 වසරේදී බීජ පන්ති කීපයක් (අත්තිවාරම්, ලියාපදිංචි, සහතික කළ සහ වාණිජ බීජ) නිපදවීම සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග 12ක ප්‍රභේද 33ක් යොදා ගන්නා ලදී. නිෂ්පාදිත මුළු ප්‍රමාණය මෙ.ටො. 615ක් වූ අතර එය 2012 වසරේදී නිෂ්පාදිත (මෙ.ටො. 514) ප්‍රමාණයට වඩා 20%කින් පමණ ඉහළ ප්‍රමාණයකි.

## මූලික බීජ (අත්තිවාරම් සහ ලියාපදිංචි කළ) බීජ නිෂ්පාදනය

මෙම වසරේ නිෂ්පාදිත මුළු මූලික බීජ ප්‍රමාණය (අත්තිවාරම් සහ ලියාපදංචි) කි.ග්‍රෑ. 99,816ක් වූ අතර එය පසුගිය වසරේ නිෂ්පාදිත (කි.ග්‍රෑ. 70,750) ප්‍රමාණයට වඩා 41%කින් වැඩි ප්‍රමාණයකි. වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය කිරීමේ කඩිනම් වැඩසටහන සඳහා බීජ ඉල්ලුම ඉහළ බැවින් මුං, සෝයා බෝංචි සහ රටකජු වැනි බෝගවල මූලික බීජ නිෂ්පාදනය සැලකිය යුතු මට්ටමකින් වැඩි විය. ප්‍රමාණවත් පමණ ස්වාරක්ෂක තොග පවතින බැවින් බඩඉරිඟු බීජ අඩුවෙන් නිෂ්පාදනය කෙරිණි. මෙම වසරේදී රජයේ බීජ ගොවිපළ වලදී නිෂ්පාදිත අත්තිවාරම් බීජ සහ රජයේ ගොවිපළ සහ කොන්ත්‍රාත් බීජ ගොවිපළ යටතේ නිෂ්පාදිත ලියාපදිංචි බීජවල ප්‍රමාණයන් වගු අංක 2.3.4හි දැක්වේ.

## සහතික කළ බීජ නිෂ්පාදනය

වෙනත් ක්ෂේත්‍ර බෝගවල සහතික කළ බීජ ප්‍රධාන වශයෙන්ම කොන්ත්‍රාත් බීජ ගොවිපළ හරහා නිපද වූ නමුත් 'සම්පත්' බඩඉරිඟු ප්‍රභේදයේ දෙමුහුම් බීජ මහ ඉලුප්පල්ලම, අළුත්තරම සහ බට අත පිහිටා තිබෙන රජයේ බීජ ගොවිපළ වලදී නිපදවන ලදී. මෙම වසරේදී සිදු කළ ගොවි සහ කොන්ත්‍රාත් වැඩසටහන් වලින් ඉහළ නිෂ්පාදනයක් අත්කර ගැනිණි. සහතික කළ බීජ නිෂ්පාදනය මෙ.ටො. 515ක් වූ අතර එය 2012 වසරට වඩා 16%ක වර්ධනයකි (වගු අංක 2.3.5). මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ මෙම වසරේදී මුං, සෝයා බෝංචි සහ බඩඉරිඟු (විවෘතව පරාගනය වන) බීජ වල කොන්ත්‍රාත් වැඩසටහන පුළුල් කිරීමයි. කොළ පොහොර බෝගයක් රජයේ බීජ ගොවිපළවල සහ පර්යේෂණ ස්ථානවල ප්‍රයෝජනයට ගැනීම සඳහා සන්හෙම්ප් වල වාණිජ බීජ ප්‍රමාණවත් පමණ නිෂ්පාදනය කරන ලදී.

## වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ

2013 වසරේදී නිකුත් කරන ලද මූලික බීජ (අත්තිවාරම් සහ ලියාපදිංචි) සහ සහතික කළ බීජ ප්‍රමාණයන් වගු අංක 2.3.6හි දැක්වේ. 2013 වසරේදී නිකුත් කළ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ප්‍රමාණය මෙ.ටො. 470.62ක් වූ අතර එය පසුගිය වසරේදී නිකුත් කළ ප්‍රමාණයට වඩා 14.7%කින් අඩුවීමකි. ප්‍රධාන වශයෙන්ම බඩඉරිඟු, සෝයා බෝංචි සහ මුං බීජ සඳහා පැවැති අඩු ඉල්ලුමක් රටකජු සහ කව්පි බීජ සැපයුම අඩුවීමත් මෙයට හේතු විය.

වගු අංක **2.3.4:** වෙනත් ක්ෂේත්‍ර බෝගවල මූලික බීජ නිෂ්පාදනය **- 2013** වසර

| බෝගය | අත්තිවාරම් | | | ලියාපදිංචි | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බීජ ගොවිපළ | | | බීජ ගොවිපළ | | | කොන්ත්‍රාත් වැඩසටහන | | | | |
| | **2012/ 13** මහ | **2013** යල | එකතුව | **2012/ 13** මහ | **2013** යල | එකතුව | **2012/ 13** මහ | **2013** යල | එකතුව | උප එකතුව | මූලික නිෂ්පාදනය |
| උඳු | 1498 | 922 | 2420 | 511 | 997 | 1508 | 953 | 5938 | 6891 | 8399 | 10819 |
| මිරිස් බීජ | 165 | 443 | 607 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 607 |
| කව්පි | 289 | 0 | 289 | 3675 | 2262 | 5937 | 1015 | 1865 | 2880 | 8817 | 9106 |
| තල | 0 | 15 | 15 | 0 | 103 | 103 | 57 | 410 | 467 | 570 | 585 |
| මුං | 522 | 822 | 1344 | 275 | 1358 | 1633 | 648 | 40099 | 40747 | 42380 | 43723 |
| රටකජු | 1739 | 85 | 1824 | 351 | 4675 | 5026 | 237 | 0 | 237 | 5262 | 7086 |
| කුරක්කන් | 350 | 601 | 951 | 1559 | 1026 | 2584 | 228 | 274 | 502 | 3086 | 4037 |
| බඩඉරිඟු බීජ (OPV)* | 1436 | 0 | 1436 | 1275 | 2854 | 4129 | 3905 | 1263 | 5168 | 9297 | 10733 |
| සෝයා බෝංචි | 200 | 0 | 200 | 420 | 859 | 1279 | 0 | 11642 | 11642 | 12921 | 13121 |
| **එකතුව** | **6198** | **2887** | **9086** | **8066** | **14132** | **22198** | **7043** | **61489** | **68532** | **90731** | **99816** |

***OPV-** විවෘතව පරාගනය වන ප්‍රභේද

**වගු අංක 2.3.5: 2013 වසරේදී රජයේ බීජ ගොවිපළ වලදී සහ කොන්ත්‍රාත් වගාව යටතේ සහතික කළ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)**

| බෝගය | බීජ ගොවිපළ | | | | | | | කොන්ත්‍රාත් වැඩසටහන | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012/13 මහ | | එකතුව | 2013 යල | | එකතුව | උප එකතුව | 2012/13 මහ | | එකතුව | 2013 යල | | එකතුව | උප එකතුව | |
| | Ct/St/F1 | Com. | | Ct/St/F1 | Com. | | | Ct/St/F1 | Com. | | Ct/St/F1 | Com | | | |
| උඳු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 25411 | 1159 | 26570 | 18437 | 1507 | 19944 | 46514 | 46514 |
| මිරිස් බීජ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3070 | 0 | 3070 | 5319 | 0 | 5319 | 8389 | 8389 |
| කව්පි | 0 | 0 | 0 | 181 | 0 | 181 | 181 | 3375 | 365 | 3740 | 14812 | 3095 | 17907 | 21647 | 21828 |
| තල | 161 | 0 | 161 | 0 | 0 | 0 | 161 | 669 | 108 | 777 | 1411 | 547 | 1958 | 2735 | 2896 |
| මුං | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 9217 | 1811 | 11028 | 123464 | 40749 | 164213 | 175241 | 175241 |
| රටකජු | 85 | 0 | 85 | 782 | 9680 | 1750 | 1835 | 11281 | 13613 | 24894 | 27722 | 33077 | 60799 | 85693 | 87528 |
| කුරක්කන් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1377 | 56 | 1433 | 456 | 0 | 456 | 1889 | 1889 |
| බඩඉරිඟු (OPV)* බීජ | 858 | 0 | 858 | 539 | 0 | 539 | 1397 | 65515 | 2565 | 68080 | 16245 | 3249 | 19494 | 87574 | 88971 |
| බඩඉරිඟු (සම්පත්) බීජ | 4154 | 0 | 4154 | 537 | 0 | 537 | 4691 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4691 |
| සෝයා බෝංචි | 0 | 0 | 0 | 265 | 0 | 265 | 265 | 3958 | 284 | 4242 | 43938 | 24946 | 68884 | 73126 | 73391 |
| සන්හෙම්ප් | 0 | 17 | 17 | 0 | 4067 | 4067 | 4084 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4084 |
| **Total** | **5258** | **17** | **5275** | **2304** | **5035** | **7339** | **12614** | **123873** | **19961** | **143834** | **251804** | **107170** | **358974** | **502808** | **515422** |

Ct. – සහතික කළ
St. – සම්මත
Com. – වාණිජ
***OPV-** විවෘතව පරාගනය වන ප්‍රභේද

**වගු අංක 3.2.6: 2013 වසරේදී වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිකුත් කිරීම (කි.ග්‍රෑ.)**

| බෝගය | 2013 යල (කි.ග්‍රෑ) | | | | | | 2013/14 මහ (කි.ග්‍රෑ) | | | | | | 2013 වසර (කි.ග්‍රෑ) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **Br.** | **Fd/Ba** | **Rg** | **Ct./St /F1** | **Cm.** | **එකතුව** | **Br** | **Fd/Ba** | **Rg** | **Ct./St/ F1** | **Cm** | **එකතුව** | **Br** | **Fd/ Ba** | **Rg** | **Ct/St/ F1** | **Cm** | **මුළු එකතුව** |
| උඳු | 75 | 335 | 1247 | 15268 | 4357 | 21282 | 43 | 123 | 3085 | 25648 | 1637 | **30526** | 119 | 458 | 4332 | 40916 | 5994 | **51818** |
| මිරිස් | 2 | 158 | 0 | 162 | 1999 | 2321 | 3 | 308 | 0 | 912 | 2945 | **4168** | 5 | 466 | 0 | 1074 | 4944 | **6489** |
| කව්පි | 0 | 526 | 4876 | 4462 | 203 | 10067 | 42 | 315 | 1908 | 8182 | 1692 | **12139** | 42 | 841 | 6784 | 12644 | 1895 | **22206** |
| තල | 20 | 35 | 312 | 690 | 231 | 1288 | 0 | 5 | 199 | 2684 | 454 | **3342** | 20 | 40 | 511 | 3374 | 685 | **4630** |
| මුං | 84 | 1446 | 5762 | 9934 | 6119 | 23345 | 65 | 176 | 24761 | 126059 | 19720 | **170780** | 149 | 1622 | 30523 | 135993 | 25839 | **194125** |
| රටකජු | 168 | 581 | 285 | 7903 | 15269 | 24205 | 97 | 693 | 1820 | 28547 | 47575 | **78731** | 265 | 127391 | 2105 | 36450 | 62843 | **102936** |
| කුරක්කන් | 9 | 61 | 678 | 237 | 177 | 1162 | 4 | 30 | 2526 | 1427 | 272 | **4259** | 13 | 1475 | 3204 | 1664 | 449 | **5421** |
| බඩඉරිඟු (OPV) | 50 | 887 | 6892 | 716 | 0 | 8545 | 206 | 588 | 5247 | 33422 | 0 | **39462** | 256 | 0 | 12139 | 34138 | 0 | **48007** |
| බඩඉරිඟු (දෙමුහුම්) | 0 | 0 | 0 | 274 | 0 | 274 | 0 | 0 | 0 | 1070 | 0 | **1070** | 0 | 872 | 0 | 1344 | 0 | **1344** |
| සෝයා බෝංචි | 80 | 596 | 556 | 2617 | 3735 | 7584 | 172 | 276 | 4590 | 16494 | 4011 | **25542** | 252 | 3 | 5146 | 19111 | 7746 | **33126** |
| සන්හෙම්ප් | 0 | 3 | 0 | 0 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | **0** | 0 | 0 | 0 | 0 | 0 | **3** |
| බී ලූණු | 0 | 0 | 0 | 0 | 308 | 308 | 0 | 0 | 0 | 0 | 216 | 216 | 0 | 0 | 0 | 0 | 524 | **524** |
| **Total** | **488** | **4627** | **20608** | **42263** | **32398** | **100383** | **632** | **2512** | **44136** | **244445** | **78521** | **370245** | **1119** | **7140** | **64744** | **286708** | **110919** | **470628** |

Br - අභිජනන
Fd/Ba - අත්තිවාරම්/ මූලික
Rg - ලියාපදිංචි
Cm - වාණිජමය

## එළවළු බීජ නිෂ්පාදනය සහ සැපයුම

### මූලික බීජ නිෂ්පාදනය

මෙරට එළවළු බෝග 18ක කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලද ප්‍රභේද 55ක් තිබෙන අතර එම ප්‍රභේද කීපයක මූලික බීජ නිෂ්පාදනය රජයේ බීජ ගොවිපළ එකොළහකදී සිදු කරන ලදි. (වගු අංක 2.3.7). ප්‍රධාන වශයෙන් බෝංචි බීජ නිෂ්පාදනය කිරීම අඩු වූ බැවින් 2013 වසරේදී නිෂ්පාදිත බීජ ප්‍රමාණය 2012 වසරේදී නිෂ්පාදිත ප්‍රමාණයට වඩා අඩු විය. (කි.ග්‍රෑ. 6213.70)

**වගු අංක 2.3.7: රජයේ බීජ ගොවිපළ වල මූලික එළවළු බීජ නිෂ්පාදනය - 2013**

| බෝගය | නිෂ්පාදිත ප්‍රමාණය (කි.ග්‍රෑ) | | එකතුව |
|---|---|---|---|
| | 2012/13 මහ | 2013 යල | |
| බෝංචි | 1897.0 | 590.0 | **2487.0** |
| කරවිල | 43.3 | 43.7 | **87.0** |
| වම්බටු | 0 | 37.3 | **37.3** |
| බුෂිටාවෝ | 423.1 | 45.0 | **468.1** |
| මෑ | 357.5 | 191.0 | **548.5** |
| බණ්ඩක්කා | 0 | 139.1 | **139.1** |
| පතෝල | 79.1 | 95.0 | **174.1** |
| දඹල | 124.0 | 49.2 | **173.2** |
| තක්කාලි | 41.3 | 65.5 | **106.8** |
| තම්පලා | 172.0 | 0 | **172.0** |
| වැටකොළු | 0 | 3.6 | **3.6** |
| පිපිඤ්ඤා | 19.1 | 86.1 | **105.2** |
| පැණි කොමඩු | 1.2 | 0 | **1.2** |
| රාබු | 300.0 | 0 | **300.0** |
| **එකතුව** | **3157.6** | **1345.5** | **4503.1** |

## සම්මත බීජ නිෂ්පාදනය

පෞද්ගලික සහ රාජ්‍ය අංශ දෙකම සම්මත එළවළු බීජ නිෂ්පාදනයෙහි නිරත වූ අතර කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ රජයේ බීජ ගොවිපළ වලදී බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය මගින් නිපදවන ලද බීජ ප්‍රමාණයන් වගු අංක 2.3.8හි දැක්වේ. 2013 වසරේදී නිෂ්පාදිත බීජ ප්‍රමාණය පූර්ව වර්ෂයේදී නිෂ්පාදිතයට වඩා 50%කින් (කි.ග්‍රෑ. 42,809.3) ඉහළ ප්‍රමාණයකි. කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ කරවිල බුෂිටාවෝ, මෑ, පතෝල, දඹල, රාබු සහ පිපිඤ්ඤා බීජ ඉහළ ප්‍රමාණයක් මිළදී ගැනීම මෙයට හේතු විය.

වගු අංක 2.3.8: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සම්මත එළවළු බීජ නිෂ්පාදනය කළ ප්‍රමාණය (කි.ග්‍රෑ) - 2013

| බෝගය | ගොවිපළ වැඩසටහන | | | කොන්ත්‍රාත් වැඩසටහන | | | මුළු |
|---|---|---|---|---|---|---|---|
| | 2012/13 | 2013 | | 2012/13 | 2013 | | |
| | මහ | යල | එකතුව | මහ | යල | එකතුව | එකතුව |
| බෝංචි | 0 | 0 | 0 | 18626.5 | 96.0 | 18722.5 | **18722.5** |
| කරවිල | 51.9 | 126.9 | 178.8 | 2257.4 | 4616.0 | 6873.4 | **7052.2** |
| වම්බටු | 97.8 | 42.0 | 139.8 | 0 | 84.1 | 84.1 | **223.9** |
| බූෂිටාවෝ | 412.3 | 228.3 | 640.6 | 1776.0 | 6851.7 | 8627.7 | **9268.3** |
| මාළුමිරිස් | 70.8 | 108.6 | 179.4 | 1.3 | 0 | 1.3 | **180.7** |
| පිපිඤ්ඤා | 40.6 | 0 | 40.6 | 381.1 | 548.9 | 930.0 | **970.6** |
| වැටකොළු | 248.0 | 55.1 | 303.1 | 959.1 | 0 | 959.1 | **1262.0** |
| මෑ | 164.8 | 117.2 | 282.0 | 8418.2 | 1847.1 | 10265.3 | **10547.3** |
| බණ්ඩක්කා | 642.0 | 0 | 642.0 | 2459.0 | 0 | 2459.0 | **3101.0** |
| පතෝල | 247.7 | 200.0 | 447.7 | 1897.0 | 2413.4 | 4310.4 | **4758.1** |
| තක්කාලි | 123.0 | 188.0 | 311.0 | 78.9 | 190.2 | 269.1 | **580.1** |
| දඹල | 1030.0 | 191.0 | 1221.0 | 1996.2 | 2065.5 | 4061.7 | **5282.7** |
| තම්පලා | 541.3 | 0 | 541.3 | 0 | 0 | 0 | **541.3** |
| රාබු | 100.0 | 0 | 100.0 | 1779.0 | 0 | 1779.0 | **1879.0** |
| නිවිති | 25.6 | 0 | 25.6 | 0 | 0 | 0 | **0** |
| **එකතුව** | **3795.8** | **1257.1** | **5052.9** | **40629.7** | **18712.9** | **59342.6** | **64395.5** |

## දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය

බීජ ගොවිපළවලදී වම්බටු ප්‍රභේදයක සහ තක්කාලි ප්‍රභේද දෙකක $F_1$ බීජ සාර්ථකව නිපදවිය. (වගු අංක 2.3.9) කුණ්ඩසාලේ, අඹේපුස්ස සහ අළුත්තරම ගොවිපළවලදී වම්බටු බීජ නිපදවූ අතර තක්කාලි බීජ කුණ්ඩසාලේ ගොවිපළේදී පමණක් නිපදවිය. බෝග දෙකෙන්ම නිපදවන ලද $F_1$ බීජ ප්‍රමාණය 2012දී නිපද වූ ප්‍රමාණයට වඩා අඩු විය.

**වගු අංක 2.3.9: රජයේ ගොවිපළවල දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.) – 2013**

| බෝගය | 2012/13 | 2013 | එකතුව |
|---|---|---|---|
| | මහ | යල | |
| තක්කාලි | 1.5 | 2.3 | 3.8 |
| වම්බටු | 21.18 | 15.0 | 36.18 |
| **එකතුව** | **22.68** | **17.3** | **39.98** |

## එළවළු බීජ බෙදාහැරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අලෙවි කුටි සහ ලියාපදිංචි අලෙවිකරු ජාලය හරහා එළවළු බීජ බෙදා හරින ලදි. මෙම අලෙවිකරු ජාලයට ගොවිජන සේවා මධ්‍යස්ථාන, සමුපකාර සමිති, ගොවි

සංවිධාන, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පෞද්ගලික ලියාපදිංචි බීජ වෙළඳුන් අයත් වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් සපයන ලද එළවළු බීජ ප්‍රමාණයන් පිළිබඳ විස්තර වගු අංක 2.3.10හි දැක්වේ.

2013 වසරේදී මූලික බීජ සැපයුම සුළු ප්‍රමාණයකින් අඩු වූ අතර 2012 වසර හා සංසඳනාත්මකව 2013 සම්මත බීජ සැපයුම බෙහෙවින් අඩු විය. කෙසේවුවද, 2013 වසරේ සමස්ථ සැපයුම 2012 වසරට වඩා සැලකිය යුතු අන්දමින් අඩු විය.

**වගු අංක 2.3.10: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සපයන ලද එළවළු බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) – 2013**

| බෝගය | මූලික | | | සම්මත | | | මුළු |
|---|---|---|---|---|---|---|---|
| | **2013** | **2013/14** | | **2013** | **2013/14** | | |
| | යල | මහ | එකතුව | යල | මහ | එකතුව | එකතුව |
| බෝංචි | 74.3 | 80.8 | 155.1 | 4242.6 | 2981.4 | 7224.0 | **7379.1** |
| කරවිල | 122.8 | 357.94 | 480.7 | 128.6 | 1974.1 | 2102.7 | **2583.4** |
| වම්බටු | 4.73 | 3.585 | 8.3 | 87.06 | 410.56 | 497.6 | **505.9** |
| බුෂිටාවෝ | 370.3 | 80.9 | 451.2 | 210.2 | 744.15 | 954.4 | **1405.6** |
| මාළුමිරිස් | 3.74 | 1.0 | 4.7 | 79.6 | 154.13 | 233.7 | **238.5** |
| පිපිඤ්ඤා | 12.4 | 1.2 | 13.6 | 36.65 | 20.88 | 57.5 | **71.1** |
| වැටකොළු | 28.8 | 200.25 | 229.1 | 30.6 | 1020.75 | 1051.4 | **1280.4** |
| මෑ | 146.2 | 61.0 | 207.2 | 671.0 | 3620.85 | 4291.9 | **4499.0** |
| බණ්ඩක්කා | 200.65 | 168.195 | 368.8 | 705.9 | 2645.75 | 3351.7 | **3720.5** |
| තිබ්බටු | 0.005 | 0 | 0 | 0 | 1.5 | 1.5 | **1.5** |
| රාබු | 5.14 | 126.5 | 131.6 | 60.0 | 510.45 | 570.5 | **702.1** |
| පතෝල | 60.4 | 40.2 | 100.6 | 195.2 | 476.85 | 672.1 | **772.7** |
| නිවිති | 1.4 | 0.95 | 2.4 | 38.1 | 73.05 | 111.2 | **113.5** |
| පැණි කොමඩු | 0 | 0 | 0 | 41.5 | 11.6 | 53.1 | **53.1** |
| තක්කාලි | 8.425 | 71.44 | 79.9 | 45.72 | 752.73 | 798.5 | **878.3** |
| දඹල | 201.2 | 158.2 | 359.4 | 74.6 | 520.15 | 594.8 | **954.2** |
| තම්පලා | 100.26 | 9.2 | 109.5 | 31.0 | 61.05 | 92.1 | **201.5** |
| **එකතුව** | **1340.8** | **1361.31** | **2702.1** | **6678.3** | **15979.95** | **22658.3** | **25360.3** |

## දිවිනැගුම වැඩසටහන සඳහා එළවළු බීජ ගෙවතු වගා පැකට් සැපයීම

2013 වසරේදී දිවි නැගුම වැඩසටහන සඳහා බෝග 06ක බීජ පැකට් මිලියන 1.2කට වැඩි ප්‍රමාණයක් බෙදා හරින ලදි.

## බීජ අර්තාපල් නිෂ්පාදනය සහ නිකුත් කිරීම

2012/13 මහ කන්නයේදී ග්‍රැනෝලා ප්‍රභේදයේ පූර්ව මූලික ($G_0$), මූලික

($G_1$,$G_2$,$G_3$) සහ සහතික කළ බීජ නිෂ්පාදනය පිළවෙළින් මෙ.ටො 0.515ක්, මෙ.ටො. 32.065ක් සහ මෙ.ටො. 52.86ක් විය. 2013 යල කන්නයේදී මෙම ප්‍රභේදයේ පූර්ව මූලික, මූලික සහ සහතික කළ බීජ නිපද වූ ප්‍රමාණය පිළවෙළින් මෙ.ටො. 1.507ක්, මෙ.ටො. 253.726ක් සහ මෙ.ටො. 131.415ක් විය. 2012/13 මහ සහ 2013 යල කන්න වලදී පැවැති අනපේක්ෂිත අධික වර්ෂාපතනය හේතුවෙන් අපේක්ෂිත ඉලක්කය සපුරාගත නොහැකි විය. 2013 වසරේදී නිෂ්පාදිත මුළු බීජ ප්‍රමාණය මෙ.ටො. 471.728ක් විය. (වගු අංක 2.3.11)

**වගු අංක 2.3.11 : 2013 වසරේදී නිෂ්පාදිත පූර්ව මූලික ($G_0$ ) මූලික $G_1$, $G_2$ සහ $G_3$ සහ සහතික කළ ($C_1$ සහ$C_2$) බීජ අර්තාපල් ප්‍රමාණය (මෙ.ටො) ග්‍රැනෝල්ලා ප්‍රභේදය**

| කන්නය | පූර්ව මූලික | මූලික | සහතික කළ | එකතුව |
|---|---|---|---|---|
| 2012/13 මහ | 0.155 | 32.065 | 52.860 | 85.080 |
| 2013 යල | 1.507 | 253.726 | 131.415 | 386.648 |
| **එකතුව** | **1.662** | **285.791** | **184.275** | **471.728** |

2013 වසරේ දී බීජ නිෂ්පාදකයින් සඳහා නිකුත්කරන ලද බීජ ප්‍රමාණය මෙ.ටො. 391.3ක් විය. (2013 යල කන්නයේදී මෙ.ටො.164.7ක් සහ 2012/13 මහ කන්නයේදී මෙ.ටො. 228.4ක් විය.)

## 2013 වසරේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ සැපයුම

ගොවිපළ අත්තිකාරම් ගිණුම යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළ 20කදී රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර පලතුරු බෝග සහ වෙනත් බෝග කිහිපයක බද්ධ පැළ, මුල් ඇදුණු දඬු කැබලි, බීජ පැළ සහ මොරෙයියන් නිපදවන ලදි. නිෂ්පාදිත මුළු රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය 768,045ක් වූ අතර එම ප්‍රමාණය 2012 වසරේ දී නිෂ්පාදිත ප්‍රමාණයට වඩා 40%කින් පමණ (547,019) වැඩි වීමකි. කෙසේ වුවද, මෙයට මිටි මුරුංගා බීජ පැළ 261,313ක් ඇතුළත් වූ අතර දිවි නැගුම වැඩසටහන සඳහා බෙදා දෙන ලදි.

පලතුරු බෝග 17ක බද්ධ පලතුරු පැළ 344,941ක් නිපදවූ අතර එම පැළ ප්‍රමාණය 2012 වසරේ දී නිෂ්පාදිත පැළ ප්‍රමාණයට වඩා (311,066) 10.8%කින් පමණ වැඩි වීමකි.

සමස්ථ රෝපණ ද්‍රව්‍ය සැපයුම් ප්‍රමාණය 599,999ක් වූ අතර එම ප්‍රමාණය 2012 වසරේ නිෂ්පාදිත ප්‍රමාණයට වඩා (230,895) 160%ක පමණ වර්ධනයකි. 2013 වසරේ සැපයුම් 78%ක් වූ අතර 2012 වසරේ සැපයුම 42%ක් විය.

**වගු අංක 2.3.12 : 2013 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළ තුළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ සැපයුම**

| බෝගය | නිෂ්පාදනය | නිකුත්කිරීම |
|---|---|---|
| **බද්ධ පැළ** | | |
| අලිපේර | 10012 | 9212 |
| බෙලි | 2715 | 1333 |
| දූරියන් | 9753 | 6183 |
| දිවුල් | 1721 | 1827 |
| වරකා | 12221 | 8102 |
| උගුරැස්ස | 1139 | 567 |
| දෙහි | 3028 | 1957 |

| බෝගය | නිෂ්පාදනය | නිකුත්කිරීම |
|---|---|---|
| අඹ | 147705 | 87766 |
| ජම්නාරං | 13522 | 8528 |
| ජම්බු | 3244 | 1386 |
| දෙඩම් | 69852 | 47166 |
| රඹුටං | 50550 | 38834 |
| සැපදිල්ලා | 1646 | 1704 |
| කාමරංකා | 4358 | 4542 |
| මැංගුස් | 232 | 52 |
| පෙයාර්ස් | 4768 | 4667 |
| ඇපල් | 149 | 133 |
| උසස් ශ්‍රේණියේ පැළ | 2164 | 1937 |
| වෙනත් | 6162 | 4020 |
| **උප එකතුව** | **344941** | **229916** |
| **බෝගය** | **නිෂ්පාදනය** | **නිකුත්කිරීම** |
| **මුලු ඇදුණු කඳ කැබලි** | | |
| මිදි | 390 | 376 |
| ජම්බු | 2021 | 2323 |
| දෙළුම් | 704 | 491 |
| ලෙමන් | 1582 | 1199 |
| ඩ්‍රැගන් ෆෲට් | 2713 | 1718 |
| වැල් දොඩම් | 200 | 177 |
| ගම්මිරිස් | 3765 | 3755 |
| උසස් ශ්‍රේණියේ පැළ | 6 | 4 |
| වෙනත් | 10388 | 9836 |
| **උප එකතුව** | **21769** | **19879** |
| **බීජ පැළ** | | |
| ඇඹරැල්ලා | 6765 | 7394 |
| කාමරංගා | 1257 | 750 |
| පැපොල් | 9650 | 6348 |
| දෙළුම් | 31586 | 24822 |

| බෝගය | නිෂ්පාදනය | නිකුත්කිරීම |
|---|---|---|
| පේර | 7060 | 6763 |
| සෙස්බනියා | 3534 | 2875 |
| මුරුංගා | 261313 | 261313 |
| කරපිංචා | 95 | 84 |
| දෙහි | 27506 | 15407 |
| නෙල්លි | 390 | 331 |
| අනෝදා | 3855 | 2227 |
| වැල්දොඩම් | 3307 | 4331 |
| දොඩම් | 10000 | 500 |
| උසස් ශ්‍රේණියේ පැළ | 1 | 1 |
| වෙනත් | 15589 | 13801 |
| **උප එකතුව** | **381908** | **346947** |
| **මොරෙයියන්** | | |
| කෙසෙල් | 1427 | 1457 |
| අන්නාසි | 18000 | 1800 |
| **එකතුව** | 768045 | 599999 |
| එළවළු බඳුන් | **17733** | **14117** |

## අත්තිකාරම් ගිණුමේ ක්‍රියාකාරිත්වය

කෘෂිකාර්මික ගොවිපළ නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමේ 2013 වර්ෂයේ මුළු ආදායම රු. 424,160,945 වන අතර එහි වියදම රු. 413,984,763කි. 2013 වර්ෂයේ මුළු වියදම ඉක්මවා රු. 10,176,182ක ආදායමක් උපයා ඇති අතර එමගින් රු. 138,315,003ක දළ ලාභයක් හා රු. 7,899,390ක් වන ශුද්ධ ලාභයක් ජනනය වේ. 2013 වසරේ අත්තිකාරම් ගිණුමේ ක්‍රියාකාරිත්වය වගු අංක 2.3.13න් දැක්වේ.

වගු අංක 2.3.13: අත්තිකාරම් ගිණුමේ ක්‍රියාකාරීත්වය - 2013

| ගොවිපළ | ලාභය / පාඩුව (රු.) |
|---|---|
| අළුත්තරම | -6,269,957 |
| අම්බලන්තොට | 3,521,201 |
| අඹේපුස්ස | 563,119 |
| බටඅත | -583,337 |
| කඳපොල | 8,506,046 |
| කන්තලේ | 12,133,825 |
| කරදියනාරු | -13,115,232 |
| කුණ්ඩසාලේ | 6,411,842 |
| මහ ඉලුප්පල්ලම | 4,960,038 |
| මල්වත්ත | 5,434,585 |
| මීපිලිමාන | 2,593,324 |
| මිද්දෙනිය | -2,782,333 |
| මුරුන්කන් | 374,838 |
| පරන්තන් | 4,571,213 |
| පිදුරුතලාගල | 16,900,889 |
| පොළොන්නරුව | 19,170,824 |
| රහංගල | 3,676,805 |
| සීතාඑළිය | 13,980,511 |
| උඩරදැල්ල | 12,664,226 |
| වෙනත් (අලෙවි මධ්‍යස්ථාන/ නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය) | 45,602,576 |
| **එකතුව** | **138,315,003** |

## 2014 වසර සඳහා සැලැස්ම

- බීජ ගොවිපළවල ඵලදායීතාව ඉහළ නංවාලීමට සහ මූලික බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා භූමිය සංවර්ධනය කිරීම, ජලසම්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම, යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණය වැඩි කිරීම සහ කෘෂිකාර්මික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු
- ගොවිපළ සංවර්ධනය යටතේ අඛණ්ඩවම සිදු කිරීම.
- කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩසටහන් ශක්තිමත් කිරීම සහ වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු වල සහතික කළ බීජ නිෂ්පාදනය කිරීම ඉහළ නැංවීම
- 2014 දිවි නැගුම ජාතික වැඩසටහන සඳහා එළවළු බීජ පැකට් සහ රෝපණ ද්‍රව්‍ය සැපයුමට 50%කින් දායකත්වය ලබාදීම.
- නවබීජ අලෙවි මධ්‍යස්ථාන විවෘත කිරීමෙන් බීජ බෙදාහැරීම ඉහළ නංවාලීම.
- බීජ ඇසුරුම් වැඩිදියුණු කිරීම.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 03 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 17 |
| සහකාර අධ්‍යක්ෂ | 03 |
| කෘෂිකර්ම නිලධාරි | 14 |
| ගණකාධිකාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 136 |
| ගොවිපළ යන්ත්‍ර උපදේශක | 01 |
| තාක්ෂණ සහායක | 12 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර | 03 |
| සංවර්ධන නිලධාරි | 25 |
| පරිපාලන නිලධාරි | 02 |
| කළමනාකරණ සහකාර | 82 |
| ගොවිපළ ලිපිකරු | 30 |
| රියදුරු | 66 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 33 |
| කාර්මික ශිල්පී | 03 |
| විදුලි කාර්මික | 02 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 03 |
| පෙදරේරු | 01 |
| වඩුබාස් | 03 |
| බද්ධකරු | 32 |
| සංචාරක බංගලා භාරකරු | 06 |
| කාර්යාල කාර්ය සහායක | 07 |
| ගබඩාකරු | 24 |
| මුරකරු | 147 |
| ලොරි පවිත්‍රකරු | 10 |
| විශේෂ ගබඩා කම්කරු | 01 |
| සනීපාරක්ෂක කම්කරු | 03 |
| කම්කරු (iii ශ්‍රේණිය) | 304 |
| **එකතුව** | **977** |

## 2.4 සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය

සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය කෘෂිකාර්මික ප්‍රතිපත්ති, පර්යේෂණ හා සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම සහ සමාජ ආර්ථික පර්යේෂණ හා කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණ සිදු කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශයට සහාය වෙමින් ප්‍රධාන උපදේශක ආයතනය වශයෙන් කටයුතු කරයි. කෘෂි සංඛ්‍යා ලේඛන තොරතුරු සම්පාදනය කිරීම පිණිස මෙම මධ්‍යස්ථානය සංඛ්‍යා ලේඛන ඒකකයක් පවත්වාගෙන යයි. මෙම මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දේශීය හා විදේශීය අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘති සම්බන්ධීකරණයහි ද නියැලෙයි. 2013 වර්ෂයේදී සමාජ ආර්ථික පර්යේෂණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණය මගින් කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල ආර්ථික හා මූල්‍යමය ශක්‍යතාව විශ්ලේෂණය කිරීම හා කෘෂිකර්මාන්තයේ ආයෝජනය සහ යෙදවුම් ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කෙරිණි. පර්යේෂණ න්‍යාය පත්‍රය හඳුනා ගැනීම සහ එය ප්‍රමුඛතා අනුව සැකසීම මගින් මෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තිවල මෑත කාලීන වෙනස් කම් හා ගෝලීය හා දේශීය ආර්ථික පරිසරයේ වෙනස්කම් හමුවේ ආහාර හිගය පිළිබඳ ගැටළු විසඳීම පිණිස ක්‍රමෝපාය සකස් කිරීමේදී ප්‍රතිපත්ති සම්පාදකයින්ට මග පෙන්වීම මගින් ද මෙම මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා දායක විය. එමෙන්ම, දිස්ත්‍රික්ක සහ කන්න පදනම මත ප්‍රධාන ආහාර බෝග සියල්ලෙහිම පිරිවැය හා ආදායම් පිළිබඳ දත්ත මූලයක් සකස් කිරීමේ පුළුල් වැඩසටහන ද අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.

### අයවැය

මූලධන පුනරාවර්තන හා විශේෂ ව්‍යාපෘති යටතේ ලද අයවැය ප්‍රතිපාදන සහ දරන ලද වියදම වගු අංක 2.4.1හි දැක්වේ.

**වගු අංක 2.4.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 2,439,500 | 2,202,838 | 90 |
| පුනරාවර්තන | 4,247,378 | 4,170,873 | 98 |
| **ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම** | | | |
| සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථාන පර්යේෂණ | 1,331,600 | 1,265,855 | 95 |
| පර්යේෂණ නිලධාරීන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම | 1,960,300 | 0 | 0 |
| **එකතුව** | **8,018,478** | **9,978,778** | **77** |

## ප්‍රගතිය

### සමාජ ආර්ථික පර්යේෂණ

සමාජ ආර්ථික පර්යේෂණ අධ්‍යයන 13 අතරින්, අධ්‍යයන 7ක් නිම කරන ලද අතර එක් අධ්‍යයනයක් අත්හැර දැමිණි. ඉතිරි අධ්‍යයන 5 2014 වර්ෂයේදී අඛණ්ඩව සිදු කෙරෙනු ඇත. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය කෙරෙහි දේශගුණික විපර්යාසය මගින් ඇතිවන බලපෑම, දේශගුණික විපර්යාසය පිළිබඳ ගොවීන්ගේ අවබෝධය සහ ඔවුන් ඒ සඳහා අනුවර්තනය වන ආකාරය, පහත රට තෙත් කලාපය පිළිබඳ සමාජ ආර්ථික අධ්‍යයනය, ශ්‍රී ලංකාවේ වී වගා තාක්ෂණයන් පිළිගැනීමට ගොවීන් තුළ ඇති කැමැත්ත, ආහාර බෝග නිෂ්පාදනය කෙරෙහි වන ජීවීන් හේතුවෙන් මතුවන අවධානම තක්සේරු කිරීම හා 2011/12 මහ සහ 2012 යල කන්නවල වගා පිරිවැය අධ්‍යයන මෙලෙස නිම කරන ලද සමාජ ආර්ථික අධ්‍යයන විය.

### බෝග නිෂ්පාදනයේ පිරිවැය හා ආදායම්

වගා පිරිවැය අධ්‍යයන තොරතුරු කන්නමය වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් නිතිපතා සිදු කෙරෙන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. වී සහ අතිරේක ආහාර බෝග, මුල් හා ආකන්ද බෝග සහ එළවළු පිළිබඳ පිරිවැය හා ආදයම් අධ්‍යයන 2011/12 මහ හා 2012 යල කන්නවලට අදාළව ප්‍රකාශයට පත් කරන ලදී.

2012/13 මහ කන්නයේ ක්ෂේත්‍ර දත්ත එක් රැස් කිරීම සහ දත්ත වගු ගත කිරීම අවසන්ව ඇති අතර 2013 යල කන්න අධ්‍යයනයේ ක්ෂේත්‍ර දත්ත එක් රැස් කිරීම 85%කින් නිමවී ඇත. වී, එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර බෝගවලට අදාළ සාමාන්‍ය අස්වැන්න, දළ හා ශුද්ධ ඉපැයුම්, මුළු හා ඒකක නිෂ්පාදන පිරිවැය, ගොවියාට ලැබුණු මිල ගණන් මෙන්ම ඒවාට අදාළ තොරතුරු ප්‍රකාශන තුළ අන්තර්ගත විය. මෙම දත්ත ගොවි ක්ෂේත්‍ර මට්ටමේදී බෝග නිෂ්පාදනය හා අලෙවිකරණය පිළිබඳ තිරණ ගැනීමේදී ද ජාතික මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී සහ ප්‍රතිපත්ති මගින් ඇති කරන බලපෑම් විශ්ලේෂණය කිරීමේදී ද ප්‍රයෝජනවත් වේ. 2013 යල කන්නය සහ 2013/14 මහ කන්නය පිළිබඳ අතුරු වාර්තා සම්පාදනය කර අවසන් කෙරිණි.

### පහත රට තෙත් කලාපය පිළිබඳ සමාජ ආර්ථික අධ්‍යයනය

පහත රට තෙත් කලාපයේ වත්මන් නිෂ්පාදන තත්වය, වී වගා බිම් ප්‍රමාණය හා සාමාන්‍ය අස්වැන්න විශ්ලේෂණය කිරීම සහ එම කලාපයේ වී නිෂ්පාදනයේ සාපේක්ෂතා වාසිය තක්සේරු කිරීම සඳහා එම කලාපයේ ඵලදායිතාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව සමීක්ෂණයක් (Benchmark Survey) සිදු කෙරිණි. එහි ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ වියළි හා අතරමැදි කලාපවලට සාපේක්ෂව තෙත් කලාපයේ සාමාන්‍ය අස්වැන්න හා නිෂ්පාදනය වඩා ස්ථාවර වූ බවයි. 1.01 (මාතර) සිට 1.26 (කොළඹ) අතර පරාසයක පැවති දේශීය සම්පත් පිරිවැය සහසංගුණක තෙත් කලාපය තුළ වී නිෂ්පාදනයේ සුළු සාපේක්ෂතා අවාසියක් පෙන්නුම් කළේය.

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේශගුණික විපර්යාසය සම්බන්ධයෙන් ගොවීන්ට ඇති අවබෝධය සහ එයට ඔවුන් අනුවර්තනය වන ආකාරය

දේශගුණය කෘෂි නිෂ්පාදනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයකි. නිෂ්පාදනයේ උච්චාවචනයන් ආහාර සුරක්ෂිතතාව කෙරෙහි විශාල බලපෑමක් ඇති කරන අතර දේශගුණික විපර්යාසයට වැඩි වශයෙන්ම ගොදුරු වන්නේ සුළු

ගොවීන්ය. එමනිසා ගොවීන්ගේ ආදායම කෙරෙහි දේශගුණික විපර්යාසය බලපාන ආකාරය, ගොවීන්ගේ දැනුවත්භාවය, අනුවර්තන විකල්ප සහ අනුවර්තන තීරණය කරන සාධක මෙන්ම අනුවර්තන බාධක පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා 2013 අප්‍රේල් මාසයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේශගුණික විපර්යාසයට වැඩි වශයෙන්ම ගොදුරු විය හැකි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 3ක අධ්‍යයනයක් පවත්වන ලදී. එහි ප්‍රතිඵල මගින් පෙන්වා දෙන ලද්දේ ගොවීන්ගෙන් 97%ක් අහිතකර දේශගුණික තත්වය හේතුවෙන් බලපෑමට ලක්වන බවත් නියඟය එම ප්‍රදේශයේ වඩාත්ම කැපී පෙනෙන දේශගුණික උපද්‍රවය බවත්ය. එමෙන්ම නියඟය හේතුවෙන් කන්න 4 තුළම කෘෂිකාර්මික ආදායමින් 44%ක් බැගින් අහිමි වේ.

## කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණය

කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණ අධ්‍යයන 5ක් වසර තුළ සිදු කෙරිණි. ශ්‍රී ලංකාවේ වී වගාවේ මුළු සාධක ඵලදායිතාව සාධක අනුව වෙන් වෙන් වශයෙන් දැක්වීම, ශ්‍රී ලංකාවේ වැඩි යෙදවුම් ප්‍රමාණයක් යොදා ඉහළ අස්වැන්නක් ලබා ගැනීම පිණිස වී වගා කිරීම සහ වී වගාවේ විවිධාංගීකරණය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ ක්‍රමය පිළිබඳ අධ්‍යයනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද බීජවල පිරිවැය පදනම් කරගත් මිල තක්සේරු කිරීම සහ ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු සඳහා කරන ආයෝජනයේ ආර්ථිකමය බලපෑම එම අධ්‍යයනය වූ අතර එම අධ්‍යයන 5ම අවසන් අදියරෙහි විය.

## ශ්‍රී ලංකාවේ ලූනු වගා උප ක්ෂේත්‍රය කෙරෙහි වෙළඳාම නිදහස් කිරීමෙන් ඇතිවෙන බලපෑම

ශ්‍රී ලංකාවේ ලූනු වගා උප ක්ෂේත්‍රය කරෙහි වෙළඳාම නිදහස් කිරීමේ ප්‍රතිපත්ති මඟින් ඇතිවන බලපෑම විමසා බැලීම පිණිස අධ්‍යයනයක් පැවැත්විණි. වසර 2000 - 2010 දක්වා කාල පරිච්ඡේදයට අදාළ ද්විතියික දත්ත අධ්‍යයනය සඳහා භාවිත කෙරිණි. රතුලූනු හා ලොකුලූනු නිෂ්පාදකයින් සඳහා හිතකර ආරක්ෂණයක් සහ සාපේක්ෂතා වාසියක් ඇති බව ප්‍රතිඵල මඟින් පෙන්වා දිණි. මෙහිදී වෙළඳාම නිදහස් කිරීමෙන් ඇතිවූ සමස්ත සුභසාධනමය බලපෑම් තක්සේරු කරන ලද අතර එය ලොකුලූනු සම්බන්ධයෙන් රු.මි. 16ක් සහ රතුලූනු සම්බන්ධයෙන් රු.මි. 870ක් විය.

## වී වගාවේ නිෂ්පාදන කාර්යක්ෂමතාව හා ගොවිපළ ලාභදායිත්වය

නිෂ්පාදනයේදී වැඩිවන නිෂ්පාදන කාර්යක්ෂමතාව වී වගාවේ ගොවිපළ ලාභදායිත්වය කෙරෙහි බලපාන අකාරය විශ්ලේෂණය කිරීම පිණිස අධ්‍යයනය සිදුකරන ලදී. ජල සම්පාදනයේදී ජලය පවතින කාල සීමාව තුළ (අම්පාර, අනුරාධපුරය, හම්බන්තොට සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක) සහ වර්ෂා පෝෂිත ක්‍රමයේදී ජලය පවතින කාල සීමාව තුළ (ගම්පහ හා කළුතර දිස්ත්‍රික්ක) 2008/09 මහ සහ 2009 යල කන්නවලට අදාළ දත්ත විශ්ලේෂණය කරන ලදී. ජල සම්පාදිත ක්‍රමයේදී තාක්ෂණික කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මගින් ජලය පවතින කාල සීමාව තුළ 23% - 32% අතර ප්‍රමාණයකින් ද තාක්ෂණික හා සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතා මග හරවා ගැනීමෙන් 64%ක් දක්වා 30%කින් ද ගොවිපළ ලාභ ඉහළ නංවා ගැනීමට හැකි බව මෙම අධ්‍යයනයෙන් පෙන්වා

දෙනු ලැබේ. වර්ෂාපෝෂිත ක්‍රමයේදී ජලය පවතින කාල සීමාව තුළ තාක්ෂණික අකාර්යක්ෂමතා මහ හරවා ගැනීම මගින් අක්. 1කට රු. 11,900 - රු. 16,200 අතර පරාසයකින් ද තාක්ෂණික මෙන්ම සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතා මග හරවා ගැනීම මගින් අක්. 1කට රු. 21,300 - රු. 26,850 අතර පරාසයකින් ද ලාභ වර්ධනය කරගත හැකිය.

## ශ්‍රී ලංකාවේ වියළි මිරිස් නිෂ්පාදනය පිළිබඳ විශ්ලේෂණය

ශ්‍රී ලංකාව මිරිස් නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිතවීමේ හැකියාව විමසා බැලීම පිණිස අධ්‍යයනයක් පවත්වන ලදී. අධ්‍යයනයේ ප්‍රතිඵල මගින් පෙන්වා දෙන ලද්දේ වියළි මිරිස් කි.ග්‍රෑ. 1ක සිල්ලර මිල මූර්ත අගය අනුව රු. 385 - රු. 203 දක්වා පහත වැටි අතර 1995 සහ 2011 යන වර්ෂවල ජාතික මිරිස් අස්වැන්න හෙ. 1කට ටො 0.7 - ටො 0.92 දක්වා වැඩි වූ බවයි. ශ්‍රී ලංකාව වියළි මිරිස් නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිතවීමේ ඉලක්කය ජය ගැනීම සඳහා ඉහළ ඵලදායිතා මට්ටම් ළඟා කර ගැනීම අවශ්‍ය වේ.

## නිෂ්පාදනය හා අලෙවිකරණය පිළිබඳ අධ්‍යයන

සීතා එළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන පිළිබඳ ඇගයීම, බඩඉරිඟු නිෂ්පාදනය සහ අලෙවිකරණය පිළිබඳ අධ්‍යයනය, මහ ඉලුප්පල්ලම හා කුණ්ඩසාලේ බීජ ගොවිපළවල ඵලදායිතාව සහ ලාභදායිත්වය පිළිබඳ අධ්‍යයනය සහ දශක 2ක කාලයක් පුරා ශ්‍රී ලංකාවේ වීවල අලෙවිකරණ ආන්තිකය පිළිබඳ අධ්‍යයනය වශයෙන් අධ්‍යයනය 4 ක් පවත්වන ලදී. අධ්‍යයන 3ක් දත්ත විශ්ලේෂණ අදියරෙහි වූ අතර අනෙක් අධ්‍යයනය දත්ත එක් රැස් කිරීමේ අදියරයෙහි පවතී.

## නුවරඑළියේ ගොවීන්ගේ මට්ටමින් සිදු කරන අවිධිමත් බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන පිළිබඳ ඇගයීම

සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයෙන් කුඩා අර්තාපල් ආකන්ද ලබා ගන්නා ගොවීන් විසින් සිදු කරන අවිධිමත් බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන ඇගයීමේ පොදු අරමුණෙන් 2012 යල කන්නයේදී සහ 2012/13 මහ කන්නයේදී නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කෙරිණි. $G_2$ බීජ අර්තාපල් වගා කිරීම සඳහා $G_1$ බීජවලින් 35%ක ප්‍රමාණයක් යොදා ගැනිණි. ඒ අනුව, $G_0$ සිට පරිභෝජන අර්තාපල් දක්වා වන පූර්ණ චක්‍රයෙහිම නියැළෙන ලද්දේ ගොවීන් කිහිප දෙනෙකු පමණි. $G_0$, $G_1$ සහ $G_2$ බීජ අර්තාපල් නිෂ්පාදන අනුපාතයන් පිළිවෙළින් 1:4, 1:7 සහ 1:10 වශයෙන් පවතී. පුහුණු වැඩසටහන් සඳහා ගොවීන්ගෙන් 80%ක් පමණ සහභාගි වුවද ඔවුන්ගෙන් 50%කට අධික සංඛ්‍යාවක් අනුගමනය කරන ලද්දේ නිර්දේශිත ප්‍රධාන පිළිවෙත් 15 අතරින් පිළිවෙත් 4ක් පමණි. ප්‍රමාණවත් ව්‍යාප්ති සේවාවන් නොමැති වීම, ගොවීන්ට ගමනාගමනය සම්බන්ධයෙන් මුහුණ පෑමට සිදුවන දුර පිළිබඳ ගැටලුව, නිසි කලට අර්තාපල් සැපයිය නොහැකිවීම, නව තාක්ෂණයන් මඳවීම සහ බීජ අර්තාපල් සඳහා විධිමත් අලෙවිකරණ මාර්ග නොමැතිවීම මෙම වැඩසටහනෙහි පවතින අඩුපාඩු වේ.

## කෘෂිකාර්මික දත්ත කළමනාකරණය

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය, සැලසුම් හා පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සලසමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ එයින් පරිබාහිර සේවාලාභීන් සඳහා දත්ත ලබාදීම අඛණ්ඩව සිදු කළේය.

## ඇග්ස්ටැට් 2013

ආහාර බෝග අංශයේ වැදගත් ලක්ෂණ රැගත් තොරතුරු අඩංගු වන කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන පිළිබඳ මෙම කුඩා ග්‍රන්ථය සම්පාදනය කර ප්‍රකාශයට පත් කරන ලදී. ඇග්ස්ටැට් 2013, X වන වෙළුම තුළ සමාජ ආර්ථික දත්ත, ඉඩම්වල ස්වභාවය, වගා බිම් ප්‍රමාණය සහ නිෂ්පාදනය, ආනයන හා අපනයන, එක් පුද්ගලයෙකු සඳහා පවතින ප්‍රමාණය, තොග හා සිල්ලර මිල ගණන් වැනි විවිධ තොරතුරු අන්තර්ගත විය. මෙහි ඇතුළත් සංඛ්‍යා ලේඛනමය තොරතුරු පර්යේෂකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ශිෂ්‍යයින්, විද්‍යාර්ථීන්, පරිපාලකයින්, ගොවීන් සහ ව්‍යවසායකයන් විසින් වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ.

## බෝග පුරෝකථනය

බෝග පුරෝකථනය සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ මාසික ප්‍රකාශනයක් වන අතර එමගින් වී, වෙනත් ක්ෂේත්‍ර බෝග හා එළවළු ආදියට අදාළව බෝග වගාව, නිෂ්පාදන පුරෝකථනය, නිෂ්පාදනයේ කලාපීය ව්‍යාප්තිය, අස්වනු නෙළන කාලසීමා, සීමාන්තික කාලගුණික තත්වයන් ඇතිවීම, පළිබෝධ සහ රෝග හා සම්බන්ධ තොරතුරු සපයනු ලැබේ. වසර තුළ බෝග පුරෝකථන වාර්තා 12ක් සකස් කරන ලදී.

## ව්‍යාපෘති සැලසුම් කිරීම, පිළියෙල කිරීම සහ සම්බන්ධීකරණය කිරීම

සමාජ ආර්ථික හා සැලසුම් මධ්යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන / මධ්‍යස්ථානවලින් ව්‍යාපෘති සැලසුම් එක්රැස් කර ඒවා මහා භාණ්ඩාගාරය සමග විමසා බැලීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළේය. මෙම මධ්‍යස්ථානය විෂය ක්ෂේත්‍ර පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම සම්බන්ධීකරණය සහ අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කළේය.

## සකස් කරන ලද සැලසුම්

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන්ම වෙනත් ක්ෂේත්‍ර බෝගවලට අදාළව 2013 - 2015 කාල පරිච්ඡේදය සඳහා නිෂ්පාදන සැලැස්ම සම්පාදනයේ නියළිණි. මෙම නිෂ්පාදන සැලැස්ම යටතේ 2013 යල සහ 2013/14 මහ කන්න සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන ඉලක්ක සහ බීජ අවශ්‍යතාව හඳුනා ගන්නා ලදී.

## මානව සම්පත් පිළිබඳ වත්මන් තත්වය සහ මානව සම්පත් සංවර්ධනය

ජ්‍යෙෂ්ඨ කෘෂි ආර්ථික විද්‍යාඥ ආචාර්ය අර්.එම්. හේරත් මහතා මෙම මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ ආවරණය කිරීම පිණිස පත් කරන ලදී. කෘෂි ආර්ථික විද්‍යාඥ සහකාර එස්. මතගවීර මහතා සහ වැඩසටහන් සහකාර එන්.එල්. සුධීර මහතා කෘෂි ආර්ථික විද්‍යාඥයින් වශයෙන් උසස් කරන ලදහ. කෘෂි ආර්ථික විද්‍යාඥ සහකාර අයි.යූ. සිවිරත්න මිය සේවයෙන් විශ්‍රාම ගත් අතර එක් කෘෂි ආර්ථික විද්‍යාඥයෙක් සහ කෘෂි ආර්ථික විද්‍යාඥ සහකාරවරු 3දෙනෙක් වසර තුළ බඳවා ගන්නා ලදහ. කෘෂි ආර්ථික විද්‍යාඥවරු දෙදෙනෙක් අධ්‍යයන කටයුතු හා රැකියා සඳහා නිවාඩු ලබාගෙන විදේශගතව සිටිති. සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය 2013 ජූලි 8 – 9 දක්වා ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී තම තාක්ෂණික කාර්ය මණ්ඩලය වෙනුවෙන් වගා පිරිවැය අධ්‍යයනවලට අදාළව හැකියා වර්ධනය කිරීමේ වැඩමුළුවක් සංවිධානය කළේය.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- ප්‍රධාන ආහාර බෝග පිළිබඳ වගා පිරිවැය අධ්‍යයනය
- සෝයා බෝංචි නිෂ්පාදනය සම්බන්ධයෙන් පවතින තත්වය විශ්ලේෂණය කිරීම
- ශ්‍රී ලංකාව තුළ වී වගාවේ තාක්ෂණ ව්‍යාප්තිය සහ භාවිතය
- APSIM මොඩලය යොදා ගනිමින් තෙත් කලාපය සඳහා ලාභදායී ගොවිතැන් ක්‍රමය ආදර්ශනය කිරීම
- අන්තර්ජාලය පදනම් කරගත් බෝග පුරෝකථන ක්‍රමයක් බිහි කිරීම
- වී වගාව සඳහා නව පොහොර නිර්දේශය ඇගයීම
- කුණ්ඩසාලේ බීජ ගොවිපළෙහි ඵලදායිතාව සහ ලාභදායිත්වය පිළිබඳ අධ්‍යයනය
- හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කවල ලොකු ලූනු නිෂ්පාදනය පිළිබඳව සිදු කෙරෙමින් පවතින ඇගයීම් අධ්‍යයනය
- බෝග පුරෝකථනය
- වත්මන් කෘෂිකාර්මික තොරතුරු අන්තර්ගත කුඩා ග්‍රන්ථය ( ඇග්ස්ටැට් ) සම්පාදනය
- ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘති, අවබෝධතා ගිවිසුම් සහ විෂය ක්ෂේත්‍ර පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් සම්බන්ධීකරණය
- ව්‍යාපෘති / යෝජනා පිළියෙල කිරීම, මෙහෙයවීම සහ අදාළ ස්ථාන වෙත යොමු කිරීම
- පලතුරු ගම්මාන වැඩසටහන ඇගයීම
- ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියේ එළවළු බීජ ව්‍යාපෘතිය මෙහෙයවීම හා ඇගයීම සහ එහි වගා පිරිවැය විශ්ලේෂණය

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරි / සේවක සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| කෘෂි ආර්ථික විද්‍යාඥ | 14 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 01 |
| කෘෂි ආර්ථික විද්‍යාඥ සහකාර | 11 |
| සංවර්ධන නිලධාරි | 03 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| පරිපාලන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 |
| රියදුරු | 05 |
| කම්කරු | 03 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| **එකතුව** | **51** |

# 3.1 ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය

ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ අභිමතාර්ථය වනුයේ මෙරට ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ ගොවි ප්‍රජාවේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස ආහාර බෝග අංශයේ ඉහළම ඵලදායිතා මට්ටම ළඟාකර ගැනීමයි. මෙම මධ්‍යස්ථානය ව්‍යාප්ති කටයුතු, පුහුණුව, කෘෂිකාර්මික අධ්‍යාපනය සහ විභාග යන ප්‍රධාන අංශ 4 කෙරෙහි අවධානය යොමු කරයි. ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ ඒකක විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ අන්තර් පළාත් ඒකක හරහා ඉටු කරන සෘජු ව්‍යාප්ති වැඩසටහන්
- පළාත් සහ මහවැලි ප්‍රදේශ සමග සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ව්‍යාප්ති වැඩසටහන්
- සේවා සංස්කරණ අභ්‍යාස ආයතන තුනේදී, දිස්ත්‍රික් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථාන හතරේදී සහ ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයේදී ව්‍යාප්ති කාර්ය මණ්ඩලය, ගොවීන්, ව්‍යවසායකයින් සහ අනෙකුත් පිරිස් සඳහා පවත්වන පුහුණු වැඩසටහන්
- කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස, වවුනියාව සහ කරපිංච කෘෂිකර්ම විද්‍යාලවල දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම
- තරුණ ගොවි සමාජ කටයුතු සිදුකිරීම
- බිඳුණුවැව මී මැසි සංවර්ධන ඒකකයේ මී මැසි සංවර්ධන කටයුතු සිදු කිරීම
- පැළෑටි පෝෂණ හා කාබනික කෘෂිකර්ම ඒකකය විසින් මෙරට පරිසර හිතකාමී කෘෂිකර්ම වැඩසටහන් ප්‍රචලිත කිරීම
- කෘෂි ව්‍යපාර සංවර්ධන වැඩසටහන්, වෙනත් ක්ෂේත්‍ර බෝග සංවර්ධන වැඩසටහන්, ක්ෂුද්‍ර ජල සම්පාදන සහ ආරක්ෂිත කෘෂිකර්ම හා කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම
- බිබිලේ උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනයේ උද්‍යාන බෝග සංවර්ධන සහ පුහුණු කටයුතු
- ලබුදූව, අනුරාධපුර සහ වාරියපොළ පිහිටි විශේෂ පුහුණු මධ්‍යස්ථානවලදී ගොවීන්, නිලධාරීන්, පාසැල් හැරගිය පිරිස්, පාසැල් සිසුන් සහ මහජනයා සඳහා කෙටි කාලීන වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලා

## අයවැය

**වගු අංක 3.1.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.මිලියන) | වියදම (රු.මිලියන) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 54.08 | 33.18 | 61 |
| පුනරාවර්තන | 142.62 | 133.87 | 94 |
| **විශේෂ ප්‍රාග්ධන ව්‍යාපෘති කෘෂිකර්ම** | | | |
| **දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ලද අරමුදල්** | | | |
| පුහුණුව සහ හැකියා වර්ධනය | 17.20 | 17.20 | 100 |
| කෘෂිකර්ම පුහුණු ගොවිපළ | 17.50 | 16.20 | 93 |

| වැය ශීර්ෂ | ප්‍රතිපාදනය (රු.මිලියන) | වියදම (රු.මිලියන) | වියදම් % |
|---|---|---|---|
| අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ලද අරමුදල් | | | |
| සහල් අපනයන කලාප | 5.13 | 3.42 | 67 |
| ප්‍රචලිත සාම්ප්‍රදායික එළවළු වර්ගවල බීජ වඩාත් සුලභ කිරීම | 3.00 | 2.68 | 89 |
| දේශීය වශයෙන් සුදුසු යහපත් කෘෂිකාර්මික පිළිවෙත් බිහි කිරීමේ වැඩසටහන | 1.31 | 0.59 | 45 |
| ආහාර සැකසීම පිළිබඳ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම මගින් ග්‍රාමීය ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සහ ආහාර සැකසීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශය දිරිමත් කිරීම | 2.00 | 0.16 | 8 |
| ජනතාවගේ ඉහළ පෝෂණ මට්ටමක් සහ යහපත සඳහා ජෛව විවිධත්වය සංරක්ෂණ කිරීම සහ තිරසාරව භාවිත කිරීම මුඛ්‍යධාරා ගත කිරීම | 2.00 | 0.04 | 2 |
| **එකතුව** | **244.84** | **207.34** | **85** |

## ප්‍රගතිය

### විශේෂ ව්‍යාපෘති

#### පුහුණුව සහ හැකියා වර්ධනය

මෙම විශේෂ ව්‍යාපෘතිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් සහ නිපුණතාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ දේශීය පුහුණු වැඩසටහන් 44ක් පවත්වන ලද අතර විදේශීය පුහුණු වැඩසටහන් 12කට සහභාගීවීම සඳහා නිලධාරීන්ට පහසුකම් සලසන ලදී. එයට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 3දෙනෙකුට සිය පශ්චාත් උපාධිය සඳහා අරමුදල් ලබාදෙන ලදී. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 78දෙනෙකු සඳහා අවසන් විභාගය පවත්වන ලදී. බීජ සහතික කිරීමේ සේවය මගින් අලුතින් බඳවා ගන්නා ලද කෘෂිකර්ම උපදේශකයින් සඳහා හඳුන්වා දුන් බෝග සායන වැඩසටහන සඳහා පහසුකම් සැලසීමද මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවිණි.

#### කෘෂිකර්ම පුහුණු ගොවිපළ ඉඩම් සංවර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ, ඩිප්ලෝමා පාඨමාලාව පවත්වන කෘෂිකර්ම පාසැල් 5ක, සේවා සංස්කරණ අභ්‍යාස ආයතන 3ක, ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයෙහි, වාරියපොළ හා ලබුදුව පිහිටි විශේෂ පුහුණු මධ්‍යස්ථානවල සහ බිබිලේ උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනයෙහි ගොවිපළ ඉඩම් සංවර්ධනය කරන ලදී. එමෙන්ම මෙම ව්‍යාපෘතිය යටතේ බෝග වගාව සහ නඩත්තු කිරීම, ගොවිපළ උපකරණ මිලදී ගැනීම, වැට සහ ගොවිපළෙහි මාර්ග සංවර්ධන කිරීමේ කටයුතු ද සිදු කෙරිණි.

#### සහල් අපනයන කලාප ව්‍යාපෘතිය

මහවැලි 'සී' හා 'බී' කලාපවලට අයත් ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලද සහල්

අපනයන ව්‍යාපෘතිය සඳහා උසස් තත්ත්වයේ බිත්තර වී නිෂ්පාදනය කිරීමේ අරමුණ ඇතිව 2013 වර්ෂයේදී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරිණි. මේ යටතේ Bg 11/65 (බාස්මතී වර්ගය) සහ සුවඳැල් හා පච්ච පෙරුමාල් යන සාම්ප්‍රදායික වී ප්‍රභේද වගා කරන ලද අතර බිත්තර වී, පැරෂුට් තැටි සහ තාක්ෂණික සහාය ලබාදීම මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ සඳහා සහාය විණි. බිත්තර වී නිපදවීම සඳහා වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙ. 80කි.

## ප්‍රචලිත සාම්ප්‍රදායික එළවළු ප්‍රභේදවල බීජ සුලභ කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ සාම්ප්‍රදායික එළවළු ප්‍රභේදවල බීජ නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථාන 16 සඳහා අරමුදල් ලබාදෙන ලදී. 2013 වර්ෂයේදී බීජ පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් නිපදවන ලදී.

**වගු අංක 3.1.2: නිපදවන ලද එළවළු බීජ ප්‍රමාණයන්**

| එළවළු වර්ගය | නිපදවන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ) |
|---|---|
| තක්කාලි | 7.16 |
| තිබ්බටු | 7.07 |
| වම්බටු | 13.2 |
| තලන බටු | 46.21 |
| වට්ටක්කා | 16.15 |
| බණ්ඩක්කා | 31 |
| කැකිරි | 198 |
| මෑ | 19.25 |
| කරවිල | 23 |

සාම්ප්‍රදායික එළවළු බීජ සුලභ කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා ගෙවතු මට්ටමින් වගා කිරීම පිණිස ගොවීන් අතර එළවළු බීජ වර්ග 5ක් සහිත පැකට් බෙදා හැරීමට අපේක්ෂිතය.

## ජනතාවගේ ඉහළ පෝෂණ මට්ටමක් සහ යහපත උදෙසා ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සහ තිරසාරව භාවිතා කිරීම මුඛ්‍යධාරාගත කිරීම

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ තෝරාගත් ප්‍රදේශවල (ගම්පල, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ථානයක, උඩුකුඹුර, මහනුවර දිස්ත්‍රික්කයේ ස්ථානයක, අඹතැන්න, රත්නපුර දිස්ත්‍රික්කයේ ස්ථානයක) මහජනයාව දැනුවත් කිරීම සහ අලෙවිකරණ දාමයක් ස්ථාපිත කිරීමයි.

2013 වර්ෂයේදී ව්‍යාපෘතිය සැලසුම් කිරීම පිණිස එම එක් එක් ප්‍රදේශයෙහි චාරිකා කළ අතර තෝරා ගත් ප්‍රදේශවල ගෙවතු වගාව සහ ආහාර පෝෂණය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. එමෙන්ම කොළඹ අලෙවිසැලක් ස්ථාපිත කිරීම පිළිබඳ තක්සේරුවක් සකස් කර නිම කෙරිණි.

## ආහාර සැකසුම් කිරීම පිළිබඳ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම මගින් ග්‍රාමීය ගොවීන්ගේ ආදයම වැඩිදියුණු කිරීම සහ ආහාර සැකසුම් කිරීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශය දිරිමත් කිරීම

ආහාර සැකසුම් කිරීම සම්බන්ධයෙන් ගොවි කාන්තා ව්‍යවසායකයින් පුහුණු කිරීම සහ ඔවුන්ගේ අදායම ඉහළ නංවා ගැනීමට සහාය වීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි. නුවරඑළිය, මාතලේ, කුරුණෑගල, පුත්තලම, මොණරාගල, මඩකලපුව, ගම්පහ, ගාල්ල, හම්බන්තොට, අම්පාර ප්‍රදේශවල සහ සියලුම අන්තර්පළාත් ප්‍රදේශවල මෙය ක්‍රියාත්මක කරන ලදී.

2013 වර්ෂයේදී ආහාර සැකසුම් තාක්ෂණය සහ ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය පිළිබඳ පුහුණු පංති 8ක් පවත්වන ලදී. එමෙන්ම, ප්‍රතිලාභීහු 101දෙනකු ද තෝරා ගන්නා ලදහ. ව්‍යාපාරය ආරම්භ කිරීමට සහායක් වශයෙන් ව්‍යවසායකයින්ට ලබාදීම අවශ්‍ය උපකරණ හඳුනා ගෙන ඇති අතර එම උපකරණ මිලදී ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

## අන්තර් පළාත් ප්‍රදේශවල ව්‍යාප්ති කටයුතු

ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම යටතට ගැනෙන ප්‍රදේශවල පිහිටා ඇති අන්තර් පළාත් ප්‍රදේශ 6 හි කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතු ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිපාලනය යටතේ පවතී. අම්පාර, අනුරාධපුරය, හම්බන්තොට, මොණරාගල, පොළොන්නරුව සහ මහනුවර යන දිස්ත්‍රික්කවල කොටස් අන්තර් පළාත් ප්‍රදේශ වශයෙන් වෙන් කර සීමා දක්වා ඇත.

2012/13 මහ සහ 2013 යල කන්නවල අන්තර් පළාත් ප්‍රදේශ තුළ වී වගා කරන ලද බිම් ප්‍රමාණයන් පිළිවෙළින් හෙ. 181,560ක් සහ හෙ. 137,905ක් විය. 2012 යල කන්නය සමග සසඳා බැලූ විට, 2013 යල කන්නයේ වගා කරන ලද බිම් ප්‍රමාණය හෙ. 13,260කින් වර්ධන වී ඇත.

වසර තුළ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කළ බිම් ප්‍රමාණය ඉහළ නැංවීම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරිණි. අන්තර් පළාත් ප්‍රදේශ 6හි ප්‍රධාන වශයෙන්ම ලොකු ලූනු, රතු ලූනු, බඩඉරිඟු, මුං, රටකජු, තල, කව්පි, සෝයා බෝංචි, මිරිස්, කුරක්කන් සහ උඳු වගා කරන ලදී. 2012/13 මහ කන්නයේදී හෙ. 35,607කද 2013 යල කන්නයේදී හෙ. 16,407කද ක්ෂේත්‍ර බෝග වගා කරන ලදී. 2011/12 මහ කන්නයට සහ 2012 යල කන්නයට සාපේක්ෂව 2012/13 මහ කන්නයේදී සහ 2013 යල කන්නයේදී වගා කළ බිම් ප්‍රමාණයන් පිළිවෙළින් හෙ. 10,204කින් සහ හෙ. 4702කින් වර්ධනය වී තිබිණි. තෙවැනි කන්නයේදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම එම බෝග වගා බිම් ප්‍රමාණය ඉහළ යෑමට උපකාරී විය.

එක් එක් අන්තර් පළාත් ප්‍රදේශය පිළිබඳ තොරතුරු සහ එම ප්‍රදේශවල ක්‍රියාකාරීත්වය පහත දැක්වේ.

## අන්තර් පළාත් ප්‍රදේශය - හම්බන්තොට

හම්බන්තොට අන්තර් පළාත් ප්‍රදේශය තුළ ප්‍රධාන වාරිමාර්ග යටතේ හෙ. 15,000ක පමණ ද සුළු වාරිමාර්ග යටතේ හෙ. 1,400ක ද වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ හෙ. 50ක ද වී වගා බිම් ප්‍රමාණයක් පවතී. බෝග වගාව සඳහා වාරිමාර්ග පහසුකම් සලසන ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම වන්නේ ලුණුගම්වෙහෙර, රිදියගම සහ සමනල වැවයි. මෙම වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ යල සහ මහ වශයෙන් ප්‍රධාන වගා කන්න 2ක් සහ එම ප්‍රධාන කන්න 2 අතර තෙවැනි කන්නයක්ද වගා කෙරේ.

වලව සහ කිරිඳිඔය යන කොටස් දෙකෙන් හම්බන්තොට අන්තර් පළාත් ප්‍රදේශය සමන්විත වේ. හම්බන්තොට සහ රත්නපුර යන දිස්ත්‍රික්ක 2 ආවරණය කරමින් මෙම කොටස් 2 තුළ ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ මග පෙන්වීම යටතේ කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු සිදු කෙරේ. මෙම කොටස් 2න් අම්බලන්තොට, හම්බන්තොට, තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, සූරියවැව සහ බලංගොඩ යන ප්‍රදේශීය ලේකම් කොට්ඨාස 6 ආවරණ වේ. ව්‍යාප්ති කටයුතු ගොවිජන සේවා මධ්‍යස්ථාන 7ක සිදු කෙරෙන අතර ඒ යටතෙහි පවතින ප්‍රදේශ වනුයේ අම්බන්තොට, ලූනම, බදගිරිය, වීරවිල, යෝධකණ්ඩිය, බෙරලිහෙල සහ කල්තොටය. කිරිඳිඔය කෘෂිකාර්මික කලාපයේ පිහිටි දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු

මධ්‍යස්ථානය පුද්ගලයින් 25දෙනෙකු සඳහා නේවාසික පුහුණු පහසුකම් ලබාදීමට සමත්ය.

## 2012/13 මහ සහ 2013 යල කන්න තුළ අත් කරගත් කාර්යඵල

### වී

මඩ ඉඩම්වල කෙසෙල් සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව ඉහළ යෑමේ හේතුවෙන් වී වගා කළ බිම් ප්‍රමාණය අඩු වී තිබිණි. කෙසේවුවද, 2012/13 මහ කන්නයේදී දෙවරක් ඇති වූ ගංවතුර වී බෝගය කෙරෙහි ද අහිතකර අයුරින් බලපෑය. සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට මෙ.ටො. 7.1ක් පමණ විය.

වී වගාව තුළ පැවති ප්‍රධාන ගැටලුව වූයේ අධික වල් පැළෑටිනාශක භාවිතයයි. වී වගාවේ වල් පැළෑටිනාශක භාවිතය අඩු කිරීම පිණිස පැළ සිටුවන හඳුන්වා දීම සඳහා ආදර්ශන 2ක් පවත්වන ලදී.

වී නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමග සහයෝගයෙන් විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවිණි. හෙ. 680ක වී වගා කිරීම (යාය 07) පිණිස අමාත්‍යාංශය විසින් මූල්‍යමය සහාය ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික සහාය ද ලබා දෙන ලදී. බිත්තර වී, ටාර්පෝලීන් වැනි යෙදවුම් රැසක් ගොවි කණ්ඩායම් වෙත ලබාදෙන ලදී. යථෝක්ත යායවලදී පිළිවෙත් මාලාවක් වශයෙන් සමෝධානික පිළිබෝධ කළමනාකරණය, සමෝධානික පැළෑටි පෝෂණ ක්‍රමය පිළිබඳ සංකල්ප, නිසි බිම් සැකසුම් තාක්ෂණයන් යොදා ගන්නා ලදී.

### තෙවැනි කන්නයේ මුං වගාව

සීමිත බිම් ප්‍රදේශයකින් අස්වැන්න වැඩිකර ගැනීමේ අභියෝගය කුඹුරු ඉඩම්වල තෙවැනි කන්නයන් වශයෙන් මුං වගා කිරීම මගින් ජය ගැනිණි. 2013 වර්ෂයේදී හෙ. 4703ක මුං වගා කරන ලදී. මහ කන්නයෙන් පසු හෙ. 1600ක පමණ ද ඉතිරි බිම් ප්‍රමාණයේ යල කන්නයෙන් පසුවද මෙම බෝගය වගා කෙරිණි. මෙම බිම් ප්‍රමාණයෙන් ගොවීන් මුං මෙ.ටො. 3,540ක් නිපදවන ලද අතර එයින් වාර්තා ගත වූ ආදායම රු. මිලියන 780ක් පමණ විය. ගොවි කණ්ඩායම් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින බීජ, ටාපෝලින් වැනි යෙදවුම් රැසක් සපයන ලද අතර තාක්ෂණික සහාය ද ලබාදිණි. සමෝධානික පළිබෝධ කළමනාකරණ තාක්ෂණය ද හඳුන්වා දෙන ලදී. 50%ක බීජ ප්‍රමාණයක් ගොවීන් විසින්ම සපයා ගැනීමට යටත්ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ඉතිරි බීජ ප්‍රමාණය සපයන ලදී.

මහ කන්නය අවසන් වීමත් සමගම අම්බලන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ හෙ. 1,600ක් වගා කරමින් විශේෂ තෙවන කන්න වගා වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. නිෂ්පාදනය මෙ.ටො. 1,000ක් වූ අතර එහි වටිනාකම රු. මිලියන 225ක් විය. හෙ. 385ක් සඳහා ජලෙන්ට් ඵුඩ් සමාගම සමග ඉදිරි අලෙවි ගිවිසුමක් අත්සන් කරන ලදී. ලුණුගම්වෙහෙර දකුණු ඉවුරේ යල කන්නය ප්‍රමාද වීම හේතුවෙන් හෙ. 800ක් වූ මුල් ඉලක්කය අඩු කෙරිණි.

### අවාරයේ ලොකු ලූනු වගා කිරීම

දිවයින පුරාම නිෂ්පාදනයක් නොවුණු අප්‍රේල් සිට ජූලි දක්වා වූ කාලයේ අස්වනු නෙළා ගැනීමේ අරමුණෙන් මහ කන්නය තුළ ලොකු ලූනු වගා බිම් ප්‍රමාණය ඉහළ නැංවීම පිණිස 2010 වර්ෂයේ සිට ප්‍රයත්න ගණනාවක් දරන ලදී. මහ කන්නයේදී හෙ. 11ක් ද යල කන්නයේදී හෙ. 4.35ක් ද වගා කරන ලදී. මහ කන්නයේදී ඇති වූ ගංවතුර තත්ත්වයන් හේතුවෙන් ක්ෂේත්‍ර ගණනාවකට හානි වූ අතර සමහර ක්ෂේත්‍ර වලින් ලැබුණේ හෙ.1කට මො.ටො. 10-

12ක අස්වැන්නකි. අවාරයේ වගාවේ සමස්ත නිෂ්පාදනය මෙ.ටො. 60ක් විය. 2014 වර්ෂයේදී වගා බිම් ප්‍රමාණය හෙ. 300 දක්වා වර්ධනය කිරීම පිණිස 2013 යල කන්නයේදී නිලධාරීන්ගේ හා ගොවීන්ගේ මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී.

## කුරක්කන් නිෂ්පාදනය

2012/13 මහ කන්නයේ කුරක්කන් වගාවෙන් මෙ.ටො. 400ක පමණ නිෂ්පාදනයක් ලබා ගැනිණි. කුරක්කන් පිටි යොදා ගනිමින් කෑම වර්ග (ready to serve foods) පිළියෙල කිරීම පිණිස ගොවීහු දිරිගන්වන ලදහ. ඖෂධ නමැති කුරක්කන් ප්‍රභේදය වගා කර බීජ නිෂ්පාදනය කිරීමට ද ගොවීහු දිරිගන්වන ලදහ.

## රතු ලූනු බීජ නිෂ්පාදනය

ගොවීන් 16දෙනකු යොදා ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර එහිදී බීජ කි.ග්‍රෑ. 13.8ක් ද බල්බ කි.ග්‍රෑ. 1,546ක් ද නිපදවන ලදී. සත්‍ය බීජ නිපදවීම පිණිස ගොවීන් දිරිමත් කිරීම සහ අවාරයේ වගාව දිරිමත් කිරීම පිණිස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. බීජ නිෂ්පාදනය හැරුණු විට, 2013 යල කන්නයේදී හෙ. 22.6ක රතු ලූනු වගා කරන ලදී. වසන්තීකරණය කරන ලද 'වේධාලන්'බල්බ නොමිලයේ ලබාදිණි. දැල් සහ පොලිතීන්වලින් 50%ක ප්‍රමාණයක් ගොවීන් විසින්ම සපයා ගන්නා අතර ඉතිරි ප්‍රමාණය ඔවුන්ට ලබා දෙන ලදී.

## පලතුරු සහ එළවළු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළෑටි සංරක්ෂණ සේවයේ සහයෝගය ඇතිව එළවළු වගාව සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ සංකල්පය හඳුන්වා දී තාක්ෂණික දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවල පුළුල් වගා ක්‍රම භාවිතය සමගින් කෙසෙල් වගා බිම් ප්‍රමාණයේ ඉහළ යෑමක් කැපී පෙනිණි.

## කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 24,875ක මුදලක් වෙන් කරන ලදී. තෝරා ගන්නා ලද ගොවීන් 10,000කට කොම්පෝස්ට් නිපදවීම සඳහා සහනාධාරයක් වශයෙන් පොලිතීන්, උදැල්ලක්, මුල්ලුවක් සහ එප්පාවල රොක් ෆොස්ෆේට් කි.ග්‍රෑ. 25ක් බැගින් ලබා දෙන ලදී. එම ගොවීහු කොම්පෝස්ට් මෙ.ටො. 17,000ක් නිපදවා ඔවුන්ගේ වගාව සඳහා යොදා ගත්හ. ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාගේ අනුග්‍රහය යටතේ ජාතික මට්ටමේ ක්ෂේත්‍ර දිනයක් පවත්වන ලදී.

## අන්තර් පළාත් ප්‍රදේශය - මහනුවර

මහනුවර අන්තර් පළාත් ප්‍රදේශයට මහනුවර, මාතලේ සහ බදුල්ල දිස්ත්‍රික්කවල මිණිපේ, විල්ගමුව, කන්දකැටිය, රිදීමාලියද්ද, මහියංගනය යන ප්‍රදේශීය ලේකම් කොට්ඨාස 5 ඇතුළත් වේ. මෙම අන්තර් පළාත් ප්‍රදේශයට ප්‍රධාන වාරිමාර්ගලට අයත් මඩ ඉඩම් හෙ. 11,737ක් ද ගොඩ ඉඩම් හෙ. 7,403ක් ද ගොවි පවුල් 22,397ක් ද ඇතුළත් වේ. මෙම ප්‍රදේශයේ වාරිමාර්ග යෝජනා ක්‍රම 6ක් පවතී. යල සහ මහ යන කන්න 2දීම ගොවීහු මහා පරිමාණයෙන් මඩ ඉඩම්වල වී වගා කරති. යල කන්නයේදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගා බිම් ප්‍රමාණය වර්ධනය විය. ගොවීහු අනෙකුත් ප්‍රභේදවලට වඩා සුදු දිගු හැඩැති ප්‍රභේද වගා කිරීමට වැඩි කැමැත්තක් දක්වති. කන්න 2 තුළම වඩා වැඩි ප්‍රමාණයක වගා කරන ප්‍රධාන වෙනත් ක්ෂේත්‍ර බෝග වනුයේ බඩඉරිඟු, රටකජු, මුං සහ මිරිස්ය.

## 2012/13 මහ කන්නය

2012/13 කන්නය තුළ වී වගා බිම් ප්‍රමාණයේ ඉලක්කය හෙ. 13,487කි. මෙයට ප්‍රධාන වාරිමාර්ග යටතේ ඉලක්ක කළ හෙ. 11,737ක් සහ වර්ෂාපෝෂිත තත්ත්වය යටතේ ඉලක්ක කළ හෙ. 1,750ක් ඇතුළත් විය. මෙයින් ප්‍රධාන වාරිමාර්ග සහ වාර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ පිළිවෙළින් හෙ. 11,668ක් සහ හෙ.1,854ක් වගා කරන ලදී. ඒ අනුව, වර්ෂාපෝෂිත තත්ත්වය යටතේ ඉලක්ක කළ ප්‍රමාණයට වඩා වගා කළ බිම් ප්‍රමාණය වැඩි විය. ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවල හෙ. 11,737කින් මෙ.ටො. 56, 337.6ක අස්වැන්නක් ලබා ගැනුණු අතර සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට මෙ.ටො. 4.8ක් විය. වර්ෂාපෝෂිත තත්ත්වය යටතේ සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට මෙ.ටො. 3ක් විය. වෙළඳපළ මිල අනුව, වී අස්වැන්නෙහි වාණිජමය වටිනාකම රු. මිලියන 1980.7ක් විය. ප්‍රදේශයේ වී නිෂ්පාදනය තුළින් ජාතික නිෂ්පාදනයට 2.35%ක දායකත්වයක් ලැබිණි. වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව යටතේ, හෙ. 343ක වගා බිම් ප්‍රමාණයකින් මෙ.ටො. 2,058ක බඩඉරිඟු අස්වැන්නක් නෙළා ගැනිණි. මෙම බඩඉරිඟු නිෂ්පාදනයේ වාණිජමය වටිනාකම රු. මිලියන 61.7ක් විය. රටකජු වගා කළ බිම් ප්‍රමාණය හෙ. 53.5ක් වූ අතර නිෂ්පාදිතයේ වටිනාකම රු. මිලියන 10.43ක් විය. අමු මිරිස් නිෂ්පාදනය සඳහා හෙ. 58ක මිරිස් වගා කෙරිණි.

## විශේෂ වැඩසටහන්

මව් බල්බ කි.ග්‍රෑ. 1200ක් යොදා ගනිමින් හෙ. 1/10ක බිම් ප්‍රමාණයක ලොකු ලූනු බීජ නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. අධික වර්ෂාව හේතුවෙන්, අපේක්ෂිත ඉලක්කය ළඟා කර ගැනීමට නොහැකි විය. කෙසේවුවද, ලොකු ලූනු සත්‍ය බීජ කි.ග්‍රෑ. 54ක් නිපදවන ලදී. මෙම වැඩසටහනෙහි අරමුණ වුයේ ලොකු ලූනු වගාකරුවන් සඳහා ස්වයං බීජ නිෂ්පාදන ක්‍රමය හඳුන්වාදීමයි.

## 2013 යල කන්නය

ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ යල කන්නය සඳහා ඉලක්ක කළ වී වගා බිම් ප්‍රමාණය හෙ. 6,599ක් වූ නමුදු ඉලක්කය ඉක්මවමින් හෙ. 8,510ක වී වගා කෙරිණි. මෙයින් හෙ. 1කට මෙ.ටො. 42,550ක වී නිෂ්පාදනයක් වාර්තා විණි. නිෂ්පාදනයේ වාණිජමය වටිනාකම රු. මිලියන 1361.6ක් විය. හෙ. 2,456ක බඩඉරිඟු වගා කරන ලද අතර එයින් මෙ.ටො. 15,964ක නිෂ්පාදනයක් ලබා ගැනිණි. එහි වාණිජමය වටිනාකම රු. මිලියන 511ක් විය. රටකජු වගාබිම් ප්‍රමාණය හෙ. 130ක් වූ අතර එයින් මෙ.ටො. 195ක නිෂ්පාදනයක් ලබා ගැනිණි. මිරිස් සහ කව්පි වගා බිම් ප්‍රමාණයන් පිළිවෙළින් හෙ. 24ක් සහ 7ක් විය. හෙ. 10ක ලොකු ලූනු වගාවෙන් හෙ. 1කට මෙ.ටො. 17.5ක සාමාන්‍ය අස්වැන්නක් වාර්තා විණි. 2013 යල කන්නය තුළ මුං වගා කළ බිම් ප්‍රමාණය හෙ. 607ක් විය. එහි සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට කි.ග්‍රෑ. 1,500ක් වූ අතර ඒ සඳහා වෙළඳපොළ මිල කි.ග්‍රෑ. 1කට රු. 220ක් විය. මුං වගාවෙන් ගොවීන්ට වැඩි ආදයමක් ලැබිණි. මුං සඳහා ඇති ඉල්ලුම සපුරාලීම පිණිස සහ වෙනත් දිස්ත්‍රික්කවල තෙවැනි කන්නයේ මුං වගාව ප්‍රවර්ධන කිරීම පිණිස හසලක අන්තර් පළාත් ප්‍රදේශයේ හෙ. 100ක බීජ නිෂ්පාදන වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී. හසලක අන්තර් පළාත් ප්‍රදේශයේ ගොවීන් විසින් වාණිජමය හා සහතික කළ බීජ නිෂ්පාදනය කරන ලදී. ගොවීහු වාණිජමය බීජ නිෂ්පාදනයෙන් හෙ.1කට රු. 162,500ක ලාභයක් ද සහතික කළ බීජ නිෂ්පාදයෙන් හෙ.1කට රු. 300,000ක ලාභයක් ද ලබා ගත්හ.

## විශේෂ ව්‍යාපෘතිවල කාර්යඵල

- හෙ. 5.2ක බිම් ප්‍රමාණයක ගොවීන් 106දෙනෙකුගේ සහභාගිත්වයෙන් අවාරයේ ලොකු ලූනු ආදර්ශන ස්ථාපිත කෙරිණි. සාමාන්‍ය අස්වැන්න හෙ.1කට මෙ.ටො. 15ක් වූ අතර වෙළඳපොළ මිල අනුව, කි.ග්‍රෑ. 1කට රු. 80 බැගින් හෙ. 1කට ලැබූ ලාභය රු. 875,000ක් විය.
- කන්දෙකැටිය ප්‍රදේශයේ ගොවීන් 276දෙනෙකුගේ සහභාගිත්වයෙන් ආදර්ශන මට්ටමේ හෙ. 80ක පමණ මුං වගාවක් ස්ථාපිත කරන ලදී. මෙයින් මෙ.ටො. 85ක අස්වැන්නක් ලබා ගැනිණි. සාමාන්‍ය අස්වැන්න හෙ.1කට කි.ග්‍රෑ. 1062.5ක් වූ අතර මුං වගාවෙන් ගොවීහු රු. මිලියන 17ක අදායමක් ලබා ගත්හ.
- ගොවි ව්‍යවසායකත්ව පාසැල් වැඩසටහන යටතේ ගොවි කණ්ඩායම් 5ක් (80දෙනෙක්) පුහුණු කරන ලදහ. දැනට සාමාජිකයෝ 38 දෙනෙක් බිත්තර වී නිෂ්පාදනය, රටකජු බීජ නිෂ්පාදනය, බිම්මල් වගාව සහ කුකුළු පාලනය වැනි විවිධ ව්‍යාපාරවල නියැළී සිටිති.
- ගොවීන් 60දෙනෙකුගේ සහභාගිත්වයෙන් කන්දෙකැටිය ප්‍රදේශයේ හෙ. 0.3ක බිම් ප්‍රමාණයක ලොකු ලූනුවල ස්වයං බීජ නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ස්ථාපිත කරන ලදී. ව්‍යාපෘතියෙන් මව් බල්බ කි.ග්‍රෑ. 3,600ක් ලබා දෙන ලදී.
- කාබනික පොහොර නිෂ්පාදනය කිරීම හා භාවිතය යටතේ ගොවීන් 3450කගේ සහභාගිත්වයෙන් ව්‍යාපෘති ප්‍රවර්ධන වැඩසටහන පවත්වන ලද අතර එම ගොවීහු කාබනික පොහොර මෙ.ටො. 6900ක් නිපදවූහ.

## අන්තර් පළාත් ප්‍රදේශය - අම්පාර

අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර් පළාත්) උහන, දමන, අඩල්ච්චේන සහ සමන්තුරේ යන කෘෂිකාර්මික පරිපාලන කලාප 4න් සමන්විත වේ. මෙම කලාප 4ට ගොවිජන සේවා මධ්‍යස්ථාන 25ක්, කෘෂිකර්ම උපදේශක කොට්ඨාස 85ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16ක් සහ ග්‍රාම නිලධාරි කොට්ඨාස 430ක් ඇතුළත් වේ.

අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජල සම්පාදන ප්‍රභවය ඉගිනියාගල පිහිටි සේනානායක සමුද්‍රයයි. එහි ධාරිතාව අක්කර අඩි 770,000ක් වන අතර එමගින් ගල්ඔය වම් හා දකුණු ඉවුරු ජනපදවල පිහිටි කුඩා වැව් 10ක් සඳහා ජලය සැපයේ. එයට අමතරව වෙනත් කුඩා වැව් 13ක් ද වන අතර ඒ සියල්ල අම්පාර දිස්ත්‍රිකකයේ වී වගාව කෙරෙහි විශාල සහායක් ලබාදේ.

මිරිස් සහ රටකජු නිපදවීම සඳහා 2013 වර්ෂයේදී අම්පාර අන්තර් පළාත් ප්‍රදේශය තුළ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් අරමුදල් සපයන ලද විශේෂ ව්‍යාපෘති 4ක් ක්‍රියාත්මක කරන ලදී. පලතුරු ගම්මාන සහ තිරසර යාය ද (සාම්ප්‍රදායික වී ප්‍රභේද) ස්ථාපිත කෙරිණි. එයට අමතරව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අරමුදල් සපයන ලද 'ගල්ඔය නවෝදය' ව්‍යාපෘතිය ද අන්තර් පළාත් ප්‍රදේශයේදී ක්‍රියාත්මක කරන ලදී.

## අන්තර් පළාත් ප්‍රදේශය - මොණරාගල

මොණරාගල අන්තර් පළාත් ප්‍රදේශයට සියඹලාණ්ඩුව, ඔක්කම්පිටිය, ඇතිමලේ සහ තෙලුල්ල යන ගොවිජන සේවා මධ්‍යස්ථාන කොට්ඨාස ඇතුළත් වේ. මෙම අන්තර් පළාත් ප්‍රදේශයේ පවතින ප්‍රධාන වාරිමාර්ග ක්‍රම වන්නේ මුතුකණ්ඩිය, ඇතිමලේ, කොටියාගල, සද්ධාතිස්ස, හඳපානාගල යන වැව් සහ කුඹුක්කන් ඔය අමුණයි. ප්‍රධාන, සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම සහ වාර්ෂාපෝෂිත ජල සම්පාදන ක්‍රමය යටතේ වී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙ. 16,476ක් විය. වගා කරන ලද ප්‍රධාන බෝගය වී වූ අතර බඩඉරිඟු

දෙවැනි ස්ථානයට පත්විය. මෙම අන්තර් පළාත් ප්‍රදේශයේ 2012/13 මහ කන්නය තුළ වී වගා කරන ලද බිම් ප්‍රමාණය හෙ. 16,585ක් වූ අතර එයින් ජාතික වී නිෂ්පාදනයට දායකත්වය මෙ.ටො. 66,073ක් විය.

නිතිපතා සිදු කෙරෙන තාක්ෂණික වැඩසටහන් හැරුණු විට, 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල කාර්යඵල පහත දැක්වේ.

### උසස් තත්ත්වයේ බිත්තර වී නිෂ්පාදන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ සහතික කළ බීජ නිෂ්පාදන වැඩසටහන ගොවීන් 36දෙනෙකුගේ සහභාගිත්වයෙන් හෙ. 28ක ක්‍රියාත්මක කරන ලදී. මෙයින් ලද මුළු අස්වැන්න මෙ.ටො. 28.5ක් පමණ විය. එයට අමතරව, ස්වයං බීජ නිෂ්පාදන වැඩසටහන ද ගොවීන් 90දෙනෙකුගේ සහභාගිත්වයෙන් හෙ. 35ක් තුළ ක්‍රියාවට නැංවිණි. එයින් මෙ.ටො. 112ක බිත්තර වී නිෂ්පාදනයක් සිදුවිණි.

### වෙනත් ක්ෂේත්‍ර බෝග වැඩසටහන

අන්තර් පළාත් ප්‍රදේශය තුළ 2012/13 මහ කන්නයේදී හෙ. 2.75ක බිම් ප්‍රමාණයක අවාරයේ ලොකු ලූනු වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ගොවීන්ට බීජ, පොලිතීන් සහ රසායන ද්‍රව්‍ය ලබා දෙන ලදී. මෙහි සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට කි.ග්‍රෑ. 488ක් බව නිරීක්ෂණ කිරීමට ලැබිණි. එමගින් මෙම ප්‍රදේශයේ ලොකු ලූනු සාර්ථකව වගා කළ හැකි බව අනාවරණය විය.

මිරිස් නිෂ්පාදන වැඩසටහන ද ක්‍රියාත්මක කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙම වැඩසටහනට අරමුදල් සපයන ලද අතර හෙ. 375ක බිම් ප්‍රමාණයක් සඳහා බීජ කි.ග්‍රෑ. 375ක් සපයාදීම මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සහාය ලබා දෙන ලදී. මෙම වැඩසටහන මිරිස් මෙ.ටො. 1875ක් නිපදවීම මගින් ජාතික මිරිස් නිෂ්පාදනයට දායක විය. මිරිස් වගාවේ පත්‍ර කුඩාවීමේ රෝගය පාලනය කිරීම සඳහා කෘමීන්ට ඇතුළු විය නොහැකි දැල් ආවරණයක් සහිතව මළු තුළ වගා කිරීමේ ක්‍රමය හඳුන්වා දෙන ලදී. සාමාන්‍ය වගා පිළිවෙත්වලදීට වඩා මෙම පිළිවෙත් තුළින් වැඩි අස්වැන්නක් ලැබුණු අතර රෝග පැතිරීම ද අඩු විය. කුරක්කන් සහ උඳු සැකසුම් කිරීම සඳහා බීජ, ටාපෝලින් සහ ඇඹරුම් යන්ත්‍ර සැපයීම මගින් ගොවීන්ට සහාය ලබාදිණි.

## අන්තර් පළාත් ප්‍රදේශය - අනුරාධපුරය

අනුරාධපුර අන්තර් පළාත් ප්රදේශය මගින් අනුරාධපුරය, කුරුණෑගල, මාතලේ සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල ඇති ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම 12ක් ආවරණ වේ. කෘෂිකර්ම උපදේශක කොට්ඨාස 35ක් සහ ග්‍රාම නිලධාරි කොට්ඨාස 175ක් මෙයට අන්තර්ගත වේ. නිතිපතා සිදු කෙරෙන තාක්ෂණික වැඩසටහනට අමතරව 2013 වර්ෂයේදී ක්රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන් පහත දැක්වේ.

### විශේෂ කාර්යඵල

### මැද කන්නයේ මුං වගාව

2013 යල කන්නය සහ 2013/14 මහ කන්නය අතරතුර මැද කන්න මුං වගා වැඩසටහන සාර්ථකව සිදු කෙරිණි. මෙම වැඩසටහන යටතේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙ. 873ක් විය. ප්‍රධාන වගා ප්‍රදේශ රාජාංගනය, උස්ගල-සියඹලාන්ගමුව, නුවරවැව සහ වාහල්කඩ ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ පවතී. මෙයින් ලබා ගන්නා ලද සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට කි.ග්‍රෑ. 80ක් විය. අස්වැන්න සඳහා පැවති වෙළඳපොළ මිල කි.ග්‍රෑ. 1කට රු. 200.00 - රු 220.00 අතර වූ හෙයින් ගොවීන්ට වැඩි ලාභයක්

ලැබිණි. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් වෙළඳපළ සබඳතා සම්පාදනය කර දිණි.

## වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රවර්ධන වැඩසටහන

වෙනත් ක්ෂේත්‍ර බෝග ආනයන අඩු කිරීම පිණිස කෘෂිකර්ම අමාත්‍යාංශයේ මුල්‍යමය සහායෙන් විශේෂ ප්‍රවර්ධන වැඩසටහනක් සිදු කෙරිණි. අනුරාධපුර අන්තර් පළාත් ප්‍රදේශය තුළ සෝයා බෝංචි, මිරිස් හා තල වගාව කෙරෙහි ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරන ලදී. යල කන්නයේ සෝයා බෝංචි, මිරිස් සහ තල වගා කළ බිම් ප්‍රමාණයන් පිළිවෙළින් හෙ. 3,078ක්, හෙ. 441ක් සහ 3,681ක් විය. පෙර යල කන්නයට සාපේක්ෂව වගා බිම් ප්‍රමාණයන්හි වර්ධනය පිළිවෙළින් හෙ. 1,408ක්, හෙ. 56ක් සහ හෙ. 1,520ක් විය.

## වී පැරෂුට් ක්‍රමයට වගා කිරීම

පැරෂුට් ක්‍රමය භාවිත කරමින් 2012/13 මහ සහ 2013 යල කන්න තුළ කුඹුරු ඉඩම් හෙ. 2,400ක් වගා කරන ලදී. මෙම ක්‍රමය භාවිතා කිරීම මඟින් වගා පිරිවැය අඩුවීම, අස්වැන්න හා ලාභය වැඩිවීම, බිත්තර වී අවශ්‍යතාව අඩුවීම සහ වල් පැල පාලනය ආදී වාසි රැසක් ගොවීන්ට අත්විය.

## ගොවි ව්‍යවසාය පාසැල් වැඩසටහන

මෙම වැඩසටහන නියමු ව්‍යාපෘතියක් වශයෙන් අනුරාධපුර අන්තර් පළාත් ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලදී. දැනට අනුගමනය කරන කෘෂිකර්ම ක්‍රමවේදය ව්‍යවසායක් බවට පත්කරගැනීම පිණිස ගොවීන්ට පුහුණුව ලබා දී ඉදිරියේදී භාවිත කිරීම පිණිස සැලසුම්ද සකස් කර දෙන ලදී. ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘතිය ගොවි කණ්ඩායම් 5ක සහභාගිත්වයෙන් කෘෂිකර්ම උපදේශක කොට්ඨාස 5ක ක්‍රියාත්මක කරන ලදී.

## අන්තර් පළාත් ප්‍රදේශය - පොළොන්නරුව

පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශයට සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාප 3ක් ද ගොවිජන සේවා මධ්‍යස්ථාන 8ක් ද කෘෂිකර්ම උපදේශක කොට්ඨාස 35ක් ද ඇතුළත් වේ. මෙම ප්‍රදේශය මැදිරිගිරිය, හිඟුරක්ගොඩ, ලංකාපුර, තමන්කඩුව සහ ඇළහැර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහෙන් සමන්විත වේ. මෙම අන්තර් පළාත් ප්‍රදේශයේ පවතින සමස්ත වගා බිම් ප්‍රමාණය හෙ. 96,000ක් වන අතර මෙහි ගොවි පවුල් 46,092ක් සිටිති. මෙහි පවතින ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම වනුයේ පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය සහ ගිරිතලේයි. මෙම ප්‍රදේශයේ වගා කරන ප්‍රධාන බෝගය වී වන අතර ලොකු ලූනු, රටකජු, බඩ ඉරිඟු වැඩි බිම් ප්‍රමාණයක වගා කර ඇත.

## විශේෂ කාර්යඵල

- ජාතික වී නිෂ්පාදනයට මෙම ප්‍රදේශයේ දායකත්වය 2.35%කි. 2012/13 මහ කන්නයේ වී නිෂ්පාදනය හෙ. 1ට මෙ.ටො. 127,800ක් වූ අතර යල කන්නයේ හෙ. 1ට මෙ.ටො.165,517ක් විය. මෙය ජාතික වී නිෂ්පාදනයෙන් 6%ක් වූ අතර පෙර වසරට සාපේක්ෂව නිෂ්පාදනය 4.6%කින් ඉහළ යාමකි. මෙම ප්‍රදේශයේ වගා කරන වඩාත්ම ප්‍රචලිත වී ප්‍රභේදය Bg 352 වන අතර Bg 366 සහ Bg 300 වැඩි බිම් ප්‍රමාණයක වගා කෙරේ. වසර තුළ සාමාන්‍ය වී අස්වැන්න හෙ. 1ට මෙ.ටො. 6 දක්වා ඉහළ නංවා ගැනීම පිණිස සමෝධානික බෝග කළමනාකරණය යාය, පැරෂුට් යාය, යාන්ත්‍රීකරණ යාය වැනි කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු ද සමෝධානික පැළෑටි පෝෂණ ක්‍රමය හා පත්‍රවර්ණ සටහන් භාවිතය වැනි ආදර්ශන ද උපයෝගී කර ගැනිණි. කන්න පුරා පුහුණු පංති

1850ක්, ක්ෂේත්‍ර දින 74ක් සහ බෝග සායන 76ක් පවත්වන ලදී.

- මෙම අන්තර් පළාත් ප්‍රදේශයේ වගා කිරීම වර්ධනය වෙමින් පැවති වෙනත් ක්ෂේත්‍ර බෝග වූයේ ලොකු ලූනු (හෙ. 151) සහ රටකජු (හෙ. 283). පෙර වසරට සාපේක්ෂව මෙම බෝග වගා කළ බිම් ප්‍රමාණයන් පිළිවෙළින් 7%කින් සහ 61%කින් වර්ධනය වී තිබිණි. 2013 යල කන්නයේදී හෙ. 71ක සෝයා බෝංචි වගාව ද හෙ. 180ක තෙවැනි කන්නයක් වශයෙන් මුං වගාව ද ආරම්භ කර තිබිණි. පසුගිය වසරට සාපේක්ෂව රතු ලූනු, කව්පි, මුං සහ උඳු වගා බිම් ප්‍රමාණයන් වර්ධනය වී තිබූ අතර අනෙකුත් ක්ෂේත්‍ර බෝග බිම් ප්‍රමාණයන් අඩු වී තිබුණි. 2012/13 මහ කන්නයේ දී ලොකු ලූනු ගබඩා (මෙ.ටො.10) ලබා දී ලොකු ලූනු අසුරන රාක්ක ද (කි.ග්‍රෑ. 50) ගොවීන් අතර බෙදා හරින ලදී. කන්න 2 තුළම පුහුණු පංති 879ක් සහ ක්ෂේත්‍ර දින 42ක් පැවැත්විණි.

- අන්තර් පළාත් ප්‍රදේශය තුළ කෙසෙල් වගාවේ අඛණ්ඩ වර්ධනයක් සිදු විණි. වාණිජමය හෝ ගෙවතු මට්ටමින් කෙසෙල් හෙ. 328ක් ද අඹ හෙ. 438ක් ද පැපොල් හෙ. 58ක් ද දෙහි හෙ. 130ක් ද වගා කර ඇත. මෙම ප්‍රදේශයේ එළවළු බෝග වැඩි වශයෙන්ම වගා කරනුයේ මඩ ඉඩම්වලය. වසර පුරාම එයින් හෙ. 103ක වට්ටක්කා ද, හෙ.106ක බණ්ඩක්කා ද , හෙ. 116ක මෑ ද වගා කරන ලදී. කන්න 2 තුළම පලතුරු වගාව පිළිබඳ පුහුණු පංති 56ක් සහ ක්ෂේත්‍ර දින 10ක් ද එළවළු වගාව පිළිබඳ පුහුණු පංති 136ක් සහ ක්ෂේත්‍ර දින 2ක් ද පවත්වන ලදී.

- ගොවි ව්‍යවසාය පාසැල් ව්‍යාපෘතිය අන්තර් පළාත් ප්‍රදේශය තුළ දියත් කරන ලද අතර එය පුහුණුව ලත් කෘෂිකර්ම උපදේශකයන් විසින් සාර්ථකව ආරම්භ කරන ලදී. සාමාජිකයින් 456දෙනෙකුගේ සහභාගිත්වයෙන් කාන්තා කෘෂිකර්ම සංවිධාන 25ක් ස්ථාපිත කෙරිණි. ආහාර හා පෝෂණය, දේශීය ආහාර ප්‍රවර්ධනය, මුළුතැන්ගෙය කළමනාකරණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් 148ක් පැවැත්විණි. ප්‍රජාව අතර දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව "කොළකැඳ" සකස් කරන ස්ථාන 11ක් ස්ථාපිත කරන ලදී. කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා විදුලි බලයෙන් ක්‍රියාකරන ජල පොම්ප 3ක්, රෝද 2 ට්‍රැක්ටරයට ආඳන ලද ජල පොම්ප 22ක් සහ හෙ. 55ක් සඳහා පැරෂුට් තැටි බෙදා හරින ලදී.

### සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - ගන්නොරුව

ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය ජාතික මට්ටමේ ප්‍රධාන කෘෂිකාර්මික පුහුණු ආයතනය වන අතර කෘෂිකර්ම නිලධාරීන්ගේ, ව්‍යවසායකයින්ගේ, ගොවීන්ගේ සහ කෘෂිකර්මය කෙරෙහි උනන්දුවක් දක්වන අනෙක් පිරිසගේ දැනුම, නිපුණතා, සහ ආකල්ප වැඩිදියුණු කිරීමේ වගකීම දරයි.

2013 වර්ෂයේ දී පුහුණු වැඩසටහන් 149ක් (මිනිස් දින 13,460ක්) ක්‍රියාත්මක කරන ලද අතර එයින් වැඩසටහන් 102ක් (මිනිස් දින 10,685ක්) නිලධාරීන් සඳහා ද වැඩසටහන් 18ක් (මිනිස් දින 969ක්) ගොවීන් සඳහා ද වූ අතර ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 29ක් ද (මිනිස් දින 1,806ක්) පවත්වන ලදී. එමෙන්ම වැඩමුළු /සම්මන්ත්‍රණ/ රැස්වීම්/ සාකච්ඡා 94ක් ද (මිනිස් දින 10,594ක්) පවත්වන ලදී.

## සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - අඟුණකොළපැලැස්ස

මෙය දකුණු පළාතේ පිහිටුවා ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කෘෂිකාර්මික පුහුණු ආයතනයක් වන අතර නිලධාරීන්ගේ, ව්‍යවසායකයින්ගේ, ගොවීන්ගේ සහ කෘෂිකර්මය කෙරෙහි උනන්දුවක් දක්වන අනෙක් පිරිසගේ දැනුම, නිපුණතා සහ ආකල්ප වැඩිදියුණු කිරීමේ වගකීම දරයි. ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක හා හම්බන්තොට අන්තර් පළාත් ප්‍රදේශය තුළ සිටින ඉහත දක්වන ලද කණ්ඩායම් සඳහා සේවා සංස්කරණ පුහුණුව ලබා දෙයි.

වසර තුළ පුහුණු වැඩසටහන් 75ක් (මිනිස් දින 7528ක්) සිදුකරන ලද අතර එයින් වැඩසටහන් 58ක් නිලධාරීන් සඳහා ද වැඩසටහන් 4ක් (මිනිස් දින 174ක්) ගොවීන් සඳහා ද ක්ෂේත්‍ර පුහුණු වැඩසටහනක් ද (මිනිස් දින 35ක්), එළිමහන් පුහුණු කාර්යයන් 12ක් ද (මිනිස් දින 174ක්) ගොවීන් සඳහා ද (මිනිස් දින 5145ක් ) පැවැත්විණි. එමෙන්ම වැඩමුළු/ සම්මන්ත්‍රණ/ රැස්වීම්/ සාකච්ඡා ද (මිනිස් දින 491ක්) පැවැත්විණි.

## සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - හංසයාපාලම, අරලගංවිල

මහවැලි බී කලාපයේ පිහිටි අරලගංවිල සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සඳහා මෙන්ම අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන නිලධාරීන් සඳහා ද පුහුණු වැඩසටහන් පවත්වයි. එයට අමතරව මෙම ආයතනය විසින් මහවැලි බී, සී, ඩී සහ ජී කලාපවල සහ අම්පාර හා පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශවල සිටින ගොවීන් සහ ව්‍යවසායකයින්ට පුහුණුව ලබාදෙන ලදී.

2013 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 60ක් (මිනිස් දින 1956ක්) පවත්වන ලද අතර එයින් වැඩසටහන් 16ක් (මිනිස් දින 571ක්) නිලධාරීන් සඳහා ද වැඩසටහන් 15ක් (මිනිස් දින 385ක්) ගොවීන් සඳහා ද වූ අතර ක්ෂේත්‍ර පුහුණු 29ක් ද (මිනිස් දින 1000ක්) ඒ අතර විය. ගොවිපළ සංවර්ධන වැඩසටහන සහ ඉඩම් සංවර්ධන වැඩසටහන යටතේ ගොවිපළ සංවර්ධනය කිරීම මගින් මෙම ආයතනය ශක්තිමත් කරන ලදී. එයට අමතරව, සාම්ප්‍රදායික එළවළු බීජ නිෂ්පාදනය පිළිබඳ විශේෂ ව්‍යාපෘතිය යටතේ මෙම පුහුණු ආයතනය විසින් සාම්ප්‍රදායික එළවළු බීජ නිෂ්පාදනය කරන ලදී.

## ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය

අනුරාධපුරයේ පිහිටි ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය ගොවිපළ යාන්ත්‍රීකරණය පිළිබඳ ජාතික මට්ටමේ එකම පුහුණු ආයතනය වේ.

මෙම මධ්‍යස්ථානයට පහත සඳහන් අංශ සම්බන්ධයෙන් පුහුණුව ලබාදීමේ වගකීම පැවරේ.

### යන්ත්‍රසූත්‍ර ක්‍රියා කරවීම සහ නඩත්තුව පිළිබඳ පාඨමාලා

- රෝද 4 ට්‍රැක්ටර් ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 10
- රෝද 2 ට්‍රැක්ටර් ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 5
- ජල පොම්ප ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 2
- ඉසින යන්ත්‍ර ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 2
- අස්වනු නෙළන සහ කොළ මඩින යන්ත්‍ර ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 2

- සංයුක්ත අස්වනු නෙළන ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 2

### අලුත්වැඩියා පාඨමාලා

- රෝද 2 ට්‍රැක්ටර් (K75) අලුත්වැඩියා කිරීම - දින 5
- ජල පොම්ප අලුත්වැඩියා කිරීම - දින 5
- ඉසින යන්ත්‍ර අලුත්වැඩියා කිරීම - දින 5

2013 වර්ෂයේ දී ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය පුහුණු වැඩසටහන් 61ක් (මිනිස් දින 6097ක්) පවත්වන ලද අතර, ඒ අතර නිලධාරීන් සඳහා වැඩසටහන් 13ක් ද (මිනිස් දින 781), ගොවීන් සඳහා වැඩසටහන් 15ක් ද (මිනිස් දින 746ක්), විශ්වවිද්‍යාල, පාසැල්, කාර්මික විද්‍යාල සහ කෘෂිකර්ම විද්‍යාලවල සිසුන් සඳහා වැඩසටහන් 30ක් (මිනිස් දින 3525ක්) අන්තර් ගත විය.

එයට අමතරව, මෙම මධ්‍යස්ථානය ගොවිපළ යාන්ත්‍රීකරණය හා සම්බන්ධ ව්‍යාපෘති කටයුතු කරගෙන යෑම පිණිස ක්ෂේත්‍ර ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට සහාය වේ. එමෙන්ම අවශ්‍ය ආයතන සඳහා ගොවිපළ යාන්ත්‍රීකරණය පිළිබඳ උපදේශක සේවා ද සපයයි.

AP 400 යන වී පැළ සිටුවනයේ ක්‍රියාකාරීත්වය ඇගයීම පිණිස අනුරාධපුර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගේ සහාය ඇතිව රඹෑව සහ ශ්‍රාවස්තිපුර ගොවි ක්ෂේත්‍රවල අත්හදා බැලීමක් සිදු කිරීම මෙම වසරේ දී අත්කරගත් විශේෂ කාර්ය ඵලයකි. සාම්ප්‍රදායික වැපිරීම් ක්‍රමයට සාපේක්ෂව සෙ.මී. 30 x සෙ.මී. 14 සහ සෙ.මී. 30 x සෙ.මී. 22 පරතරයන්ගෙන් පැළ සිටුවීම මඟින් 16%ක සහ 9%ක පමණ අස්වනු වර්ධනයක් සිදු විය.

### ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අනුරාධපුරය

අනුරාධපුරය ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය 1994 මැයි මස 02 දින දෑ අවුරුදු කෘෂිකර්ම පාඨමාලාව පැවැත්වීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපිත කරන ලදී. අනතුරුව, 2002 වර්ෂයේදී මෙම විද්‍යාලය විශේෂ පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කර රජයේ නිලධාරීන්, ගොවීන් සහ පාසැල් සිසුන් ආදී පිරිස් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් රාශියක් පවත්වන ලදී.

2013 වර්ෂයේ දී මෙම විද්‍යාලය විසින් මහවැලි ක්ෂේත්‍ර සහයකයින් 37 දෙනෙකු සඳහා එක් වසරක ප්‍රායෝගික කෘෂිකර්ම සහතික පාඨමාලාවක් පවත්වන ලදී. එයට අමතරව, කෙටිකාලීන පුහුණු වැඩසටහන් වශයෙන් ගෙවතු වගාව (පාසැල් සිසුන්/ ගොවීන් සඳහා), වී වගාව සහ භූමි අලංකරණය (ගොවීන් සඳහා) පිළිබඳ එක් දින පාඨමාලා පවත්වන ලදී.

### ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - වාරියපොළ

වාරියපොළ ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය 1994 වර්ෂයේදී ආරම්භ කරන ලද්දේ කෘෂිකර්මය කෙරෙහි උනන්දුවක් දක්වන තරුණ පිරිසට කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබාදීම පිණිසය. කෙසේ වුවද, 2003 වර්ෂයෙන් පසු මෙහි පැවති සම්පත් ඌනතාව හේතුවෙන් ඩිප්ලෝමා පාඨමාලාව නොපැවැත්විණි. ඉන්පසු 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් සඳහා එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී. 2013 වර්ෂයේ දී මෙහි නාමය විශේෂ කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය වශයෙන් වෙනස් කෙරිණි. මෙම පුහුණු මධ්‍යස්ථානය වර්තමානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා වෙනත් රජයේ ආයතනවල නිලධාරින් සහ ගොවීන් සඳහා

කෘෂිකර්ම පුහුණු පවත්වයි. වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව විශේෂයෙන්ම සහයෝගිතා පුහුණු වැඩසටහන් සංවිධානය කර පවත්වන ලදී. නව කෘෂිකාර්මික තාක්ෂණයන් ලබා දීමේ අරමුණ ඇතිව ගෙවතු සහ අනෙකුත් ආදර්ශන නඩත්තු කරන ලදී.

මෙම ආයතයේදී 2013 ජූලි 06 -10 දක්වා 'ගොවි සතිය' සාර්ථකව පැවැත්වීම මෙම වසරේදී අත්කරගත් විශේෂ කාර්යඵලයක් වශයෙන් දැක්විය හැකිය.

## ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - ලබුදූව

ලබුදූව ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය 1994 වර්ෂයේදී කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබාදීමේ අරමුණින් ආරම්භ කරන ලද අතර 2000 වර්ෂය දක්වා එය අඛණ්ඩව සිදු කෙරිණි. පසුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් සඳහා එක් අවුරුදු පාඨමාලාවක් හඳුන්වා දෙන ලදී.

2013 වර්ෂයේදී අත්කරගත් විශේෂ කාර්යඵලයක් වශයෙන් 2013 පෙබරවාරි සහ ඔක්තෝම්බර් මාසවලදී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර සිසුන් සඳහා අවසන් විභාග පවත්වන ලදී. එමෙන්ම පාසැල් සිසුහු, ගොවීහු, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් පිරිස් බොහොමයක් මෙම ආයතනයේ ආදර්ශන ක්ෂේත්‍රය නැරඹීමට පැමිණියහ. එයට අමතරව, ගොවීන්, නිලධාරීන් සහ පොදු මහජනයා සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

## උද්‍යාන බෝග පුහුණු සහ සංවර්ධන ආයතනය - බිබිල

බිබිල කෘෂිකර්ම විද්‍යාලය සහ බිබිල උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පර්යේෂණ ගොවිපළ ඒකාබද්ධ කර 2003 අප්‍රේල් 01 දින උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය ස්ථාපිත කරන ලදී. මෙම ආයතනය මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත.

මෙම ආයතනයේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

- උද්‍යාන බෝග වගාව පිළිබඳ නව තාක්ෂණය හඳුන්වා දීම සහ ගොවිපළ ලාභදායී වාණිජමය ආදර්ශ ගොවිපළක් වශයෙන් පවත්වාගෙන යාම
- නව තාක්ෂණය යොදා ගනිමින් විවිධ වර්ගයේ පලතුරු පැළ විශාල පරිමාණයෙන් නිපදවීම
- ක්ලෝන සංරක්ෂණය
- රජයේ නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන්, ගොවීන් සහ පාසැල් හා විශ්වවිද්‍යාල සිසුන් සඳහා නව කෘෂිකාර්මික තාක්ෂණය සමගින් පුහුණු වැඩසටහන් ඉදිරියට ගෙන යාම
- පුහුණුව අරමුණු කරගත් ආදර්ශන ක්ෂේත්‍ර ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම
- නව නිර්දේශ පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය
- තොරතුරු තාක්ෂණ ආයතනයක් වශයෙන් ක්‍රියා කිරීම

මෙම ආයතන පහත සඳහන් විෂයයන් යටතේ පුහුණුව ලබා දෙයි.

- බද්ධ පලතුරු පැළ නිෂ්පාදනය
- ජල සම්පාදනය සහ ජල කළමනාකරණය
- වාණිජමය පලතුරු වගාව සහ පසු අස්වනු තාක්ෂණය
- මී මැසි පාලනය
- කාබනික කෘෂිකර්මය
- භූමි අලංකරණය සහ මල්වගාව
- බිම්මල් නිෂ්පාදනය
- ආරක්ෂිත කෘෂිකර්මය

- කජු නිෂ්පාදනය

## විශේෂ කාර්යඵල

ඉඩම් සංවර්ධනය පිළිබඳ විශේෂ ව්‍යාපෘතිය යටතේ කෙසෙල් (කෝලිකුට්ටු) පැළ 2000ක් පමණ ස්ථාපිත කර ආරක්ෂිත ගෘහයක් ද (ව.මී. 480) අලුත්වැඩියා කරන ලදී.

ගොවිපළ සංවර්ධන වැඩසටහන යටතේ හෙ. 7.6ක වී වගාකර මෙ.ටො. 5ක් බිත්තර වී වශයෙන් විකුණන ලද අතර ඉතිරිය සිසුන්ගේ පරිභෝජනය සඳහා කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයට ලබා දුණි.

එයට අමතරව, හෙ. 0.5ක පැෂන් ෆෘට් වගාවක් ද හෙ. 1.5ක දොඩම් වගාවක් ද ස්ථාපිත කරන ලදී. පේර, දෙළුම් සහ ජම නාරං මව් ශාක උද්‍යානයක් ස්ථාපිත කරන ලදී. ආදර්ශන ගොවිපළෙහි පාංශු සංරක්ෂණය උදෙසා ගල්වැටි ද (ව.අ. 100) ඉදි කෙරිණි.

වාණිජමය පලතුරු පැළ නිෂ්පාදන වැඩසටහන යටතේ, පලතුරු පැළ නිෂ්පාදනය සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය අරමුදල් සපයන ලදී. පලතුරු පැළ 62,000ක් නිපදවන ලද අතර එම පැළ අලෙවියෙන් ලද ලාභය රු. 1,793,483ක් විය.

2013 වර්ෂයේදී එළවළු සහ පලතුරු අලෙවියෙන් උපයා ගන්නා ලද ආදායම රු. 2,257,473 කි.

එයට අමතරව, 2013 වර්ෂයේදී මෙම ආයතනය විසින් ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නිලධාරීන් (මිනිස් දින 80), දෙපාර්තමේන්තුවේ බද්ධකරුවන් (මිනිස් දින 1060), විශ්වවිද්‍යාල සිසුන් (මිනිස් දින 150), ගොවීන් (මිනිස් දින 250), පැළ තවාන් සංවර්ධන සහායකයින් (NVQ මට්ටම 3 - මිනිස් දින 500) සහ අනෙකුත් පිරිස් (මිනිස් දින 768) සඳහා පුහුණු ගණනාවක් පවත්වන ලදී.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - වීරවිල

වීරවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය පහත රට වියළි කලාපයේ ($DL_5$ - $DL_{1b}$) පිහිටා ඇත. මෙම මධ්‍යස්ථානය 1986 වර්ෂයේදී ලුණුගම්වෙහෙර ජනාවාස ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කෙරිණි. මෙම මධ්‍යස්ථානයේ අරමුණ ගොවි ප්‍රජාව, පාසැල් සිසුන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම සහ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීමයි.

මෙම පුහුණු මධ්‍යස්ථානය 2013 වර්ෂයේදී ගොවි පුහුණු 30ක් (මිනිස් දින 1121), නිලධාරී පුහුණු 07ක් (මිනිස් දින 171ක්) සහ වැඩමුළු 4ක් (මිනිස් දින 96ක් ) පවත්වන ලදී.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - වාවින්න

වාවින්න දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය අම්පාර දිස්ත්‍රික්කයේ පොල් වගා ජනපදයක පිහිටා ඇත. මෙම ආයතනය ගොවීන්, නිලධාරීන්, පාසැල් සිසුන් සහ අනෙකුත් පිරිස් සඳහා කෘෂිකාර්මික ශිල්පඥාණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වයි. 2013 වර්ෂය තුළ මෙම ආයතනය විසින් පුහුණු වැඩසටහන් 66ක් (මිනිස් දින 2939ක්) පවත්වන ලදී. මෙතුළ නිලධාරී පුහුණු 25ක් ද (මිනිස් දින 1490ක්) ගොවි පුහුණු 11ක් ද (මිනිස් දින 361ක්) සහ වෙනත් පුහුණු 30ක් ද (මිනිස් දින 1088ක්) ඇතුළත් විය.විවිධ අංශ සම්බන්ධයෙන් වැඩමුළු 12ක් ද (මිනිස් දින 144ක් ) පැවැත්විණි.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - පොළොන්නරුව

පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කදුරුවෙල නගරයේ පිහිටා ඇත. මෙම මධ්‍යස්ථානය ආදර්ශ ගොවිපළක් වශයෙන් පවතින අතර එහි වගාකර ඇති බිම් ප්‍රමාණය අක්කර 4.5කි. ආදර්ශ ගොවිපළෙහි වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු, පලතුරු, සහ වෙනත් බෝග (පොල්) පවතී. එය තාක්ෂණික දැනුම සේම එක් එක් බෝගය වගා කිරීමේ ක්‍රම ද ගොවීන්ට ලබා දෙයි. එමෙන්ම එය ගෙවතු වගාව, මීමැසි පාලනය සහ බිම්මල් වගාව පිළිබඳ දැනුම ද ලබා දෙයි.

2013 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 33ක් (මිනිස් දින 503ක්) පවත්වන ලද අතර එයට නිලධාරී පුහුණු වැඩසටහන් 12ක් ද (මිනිස් දින 482), ගොවි පුහුණු 14ක් ද (මිනිස් දින 171ක්) සහ ගොවීන් සඳහා එළිමහන් පුහුණු 7ක්ද (මිනිස් දින 103ක්) ඇතුළත් විය.

ඒ හැරුණු විට, මෙම මධ්‍යස්ථානයේ දී 2013.09.06 – 2013.09.10 දක්වා ‘රජරට කෘෂි දැක්ම’ නැමති ප්‍රදර්ශනය ද පවත්වන ලදී.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - පාලමුණේ

පාලමුණේ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය 2007 සැප්තැම්බර් මස 23 දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බාර දෙන ලදී.

මෙම පුහුණු මධ්‍යස්ථානයේ අරමුණ වගා සංවර්ධනය උදෙසා උදෙසා ගොවීන්ට, මෙම ක්ෂේත්‍රයේ හා සම්බන්ධ කෘෂිකර්ම නිලධාරීන්ට, ගුරුවරුන්ට, පාසැල් සිසුන්ට, සමෘද්ධි ප්‍රතිලාභීන්ට සහ මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් සඳහා දමිළ මාධ්‍යයෙන් කෘෂිකාර්මික තාක්ෂණයන් පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබා දීමයි.

2013 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 33ක් (මිනිස් දින 1193ක්) පවත්වන ලද අතර එතුළ නිලධාරී පුහුණු 14ක් (මිනිස් දින 474ක්), ගොවි පුහුණු 06ක් (මිනිස් දින 203ක්), ක්ෂේත්‍ර පුහුණු 3ක් (මිනිස් දින 82ක්), පාසැල් සිසුන් සඳහා පුහුණු 4ක් (මිනිස් දින 123ක්) සහ අනෙකුත් පිරිස සඳහා පුහුණු 5ක් (මිනිස් දින 228ක් ) ඇතුළත් විය.

## ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන

ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට පැවරී ඇති මෙහෙවර වන්නේ පවුල් ඒකකවල ජීවන තත්ත්වය සහ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීම මගින් කෘෂිකාර්මික සංවර්ධනයට කාන්තාවන්ගේ දායකත්වය වර්ධනය කිරීමයි. මෙම වැඩසටනෙහි අරමුණ වඩා යහපත් කුටුම්භ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ කාන්තාවන් කෙරෙහි අවධානය යොමු කරමින් කුටුම්භ සඳහා ආදායම් උත්පාදන කටයුතු ආරම්භ කිරීමයි. ඒ ඒ කෘෂිකර්ම පරිපාලන දිස්ත්‍රික්කවල නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) කාර්යාලයට අනුයුක්ත ගොවි කාන්තා ව්‍යාප්ති නිලධාරීන් විසින් මූලික මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

## ව්‍යාප්ති කටයුතු

2013 වර්ෂයේ දිස්ත්‍රික්ක ව්‍යාප්ති නිලධාරීන් 36 දෙනෙකුට ගොවි කාන්තා ව්‍යාප්ති වැඩසටහන් පිළිබඳ පුහුණු ලබාදිණි. ආහාර හා පෝෂණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳව ගොවි ව්‍යවසායකයින් 403දෙනෙකුට පමණ පුහුණුව ලබා දිණි. එයට අමතරව, කාන්තා සංවිධාන 131ක් ද ස්ථාපිත කරන ලදී. ගෙවතු වගාව සහ මුළුතැන්ගෙයි

තත්ත්වය වැඩිදියුණු කිරීම මගින් කුටුම්භ 1,043ක් සංවර්ධනය කරන ලදී. ගොවි කාන්තා ව්‍යාප්තිය සම්බන්ධයෙන් පවත්වන ලද වෙනත් ව්‍යාප්ති වැඩසටහන් වූයේ ලිපි 8ක් පළ කිරීම, රූපවාහිනී වැඩසටහන් 03ක්, ගුවන්විදුලි වැඩසටහන් 04ක්, ක්ෂේත්‍ර දින 25ක් පැවැත්වීම සහ අධ්‍යයන චාරිකා 06කි. එයට අමතරව, ප්‍රදර්ශන 11කදී ප්‍රදර්ශන කුටි පවත්වාගෙන යන ලදී.

මෙම ඒකකයෙන් ඉටු කරන ලද වෙනත් විශේෂ කාර්යයන් පහත දැක්වේ.

- දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන යටතේ, ගොවි කාන්තා ව්‍යවසායකයින්ගේ සහභාගිත්වයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ - 2013 ප්‍රදර්ශනයේදී අලෙවි සැල් 4ක් සංවිධානය කරන ලදී.
- නව ව්‍යවසායකයින් කණ්ඩායමකට (26 දෙනෙකු) පුහුණුව ලබා දී ඔවුන්ගේ දේශීය ආහාර අලෙවි කර ගැනීම පිණිස ගන්නොරුව කෘෂි තාක්ෂණික උද්‍යානයේ "හෙළ බොජුන් අලෙවි පියසට" සම්බන්ධ වීමේ අවස්ථාව ලබා දෙන ලදී.
- දේශීය ආහාර සහිත තවත් "හෙළ බොජුන් අලෙවි පියසක්" හම්බන්තොට, බටඅත චමල් රාජපක්ෂ උද්‍යානයේ විවෘත කරන ලදී.

එයට අමතරව, පහත සඳහන් විශේෂ ව්‍යාපෘති 2ක ද මෙම ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලදී.

- ආහාර සැකසුම් කිරීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශය දිරිමත් කිරීම සඳහා ආහාර සැකසුම්කරණ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම මගින් ග්‍රාමීය ගොවීන්ගේ ආදායම වැඩි දියුණු කිරීම
- ජනතාවගේ පෝෂණය සහ දියුණුව සඳහා ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම හා තිරසාරව භාවිත කිරීම

## කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවය

කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවයට පැවරී ඇති වගකීම වන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු රාමුව තුළ පවතින කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනයට සහය වීමයි. පහත සඳහන් කාර්යයන් මගින් මෙම ඒකකය එම වගකීම සපුරාලයි.

- ව්‍යවසායකයින් වීමට අපේක්ෂා කරන්නන් සඳහා කෘෂි ව්‍යාපාර සම්බන්ධ කෙටිකාලීන දැනුවත් කිරීමේ සහ නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විශේෂඥ කණ්ඩායමක් විසින් කෘෂිකාර්මික දේපල හිමිකරුවන් සහ ආයෝජකයින් සඳහා ගොවිපළේදී තාක්ෂණික උපදේශන සේවා ලබා දීම
- ව්‍යවසායකයින්ට අවශ්‍ය පරිදි තාක්ෂණික තොරතුරු හා දත්ත ලබාදීම සහ ඔවුන් අදාළ පාර්ශවකරුවන් සමග සම්බන්ධ කිරීම
- විශ්වසනීය යෙදවුම් හා සේවා ගොවීන්ට ලබාදීම පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහයෝගය ලබන 'කෘෂි සේවා පියස' වශයෙන් හඳුන්වන කෘෂි සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම
- ගොවිපළ ව්‍යවසාය පාසැල් ප්‍රවේශය හඳුන්වා දීම මගින් සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ පුහුණුව සහ හැකියා වර්ධනය කිරීම පිළිබඳ නියමු ව්‍යාපෘතියේ තාක්ෂණික සහ මූල්‍යමය සහාය ඇතිව අදාළ පුහුණු පැවැත්වීම මගිනි ගොවීන්ගේ ව්‍යවසායකත්ව නිපුණතා ප්‍රවර්ධනය කිරීම පිණිස දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ට සහාය වීම

### විශේෂ කාර්යඵල

- පුහුණුවන්නන් 266දෙනෙකු සඳහා කෘෂි ව්‍යවසාය පිළිබඳ පුහුණු වැඩසටහන් 10ක් පවත්වන ලදී.

- දන්ඕවිට, හේවාදිවෙල, දඹුල්ල සහ පොතුහැර නව කෘෂි සේවා පියසි 4ක් ස්ථාපිත කරන ලදී. මූලික කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ කෘෂි සේවා පියසි කළමනාකරුවන් 47දෙනෙකුට ද තාක්ෂණික පුහුණුව ලබාදිණි.
- දිස්ත්‍රික්ක 12ක ව්‍යාප්ති නිලධාරීන් 170දෙනෙකුට ගොවිපළ ව්‍යවසායකත්ව පාසැල් පිළිබඳ පුහුණුකරුවන් වශයෙන් පුහුණුව ලබා දෙන ලදී. 2013 වර්ෂයේදී, පුහුණු කරන ලද නිලධාරීහු තම දිස්ත්‍රික්ක තුළ තෝරාගත් ගොවි කණ්ඩායම් සඳහා ගොවිපළ ව්‍යවසාය පාසැල් 10ක් පැවැත්වූහ.

## මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව, බණ්ඩාරවෙල

මීමැසි සංවර්ධන ඒකකයේ වගකීම වන්නේ ගොවීන් අතර මීමැසි පාලනය සංවර්ධනය කිරීම සහ ව්‍යාප්ත කිරීමයි. මීමැසි පාලනය පිළිබඳ නව තාක්ෂණය ප්‍රචාරණය කිරීම පිණිස, මෙම ඒකකය විසින් පහත සඳහන් පහසුකම් ලබාදෙනු ලැබේ.

- ගොවීන්, නිලධාරීන්, සිසුන් සහ උනන්දුවක් දක්වන අනෙකුත් පිරිස පුහුණු කිරීම
- මීමැසි පාලන උපකරණ නිෂ්පාදනය
- මීමැසි පාලන උපකරණ නිෂ්පාදකයින් පුහුණු කිරීම, ලියාපදිංචි කිරීම සහ සහතික කිරීම
- මීමැසි පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට තාක්ෂණික සහාය ලබාදීම
- පර්යේෂණ කටයුතු

නිලධාරීන්, ගොවීන් සහ විශ්වවිද්‍යාල සිසුන් සඳහා මීමැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 18ක් ද මීමැසි පාලන උපකරණ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 2ක් ද පවත්වන ලදී.

එයට අමතරව, මෙම ඒකකය විසින් මීපැණි කි.ග්‍රෑ. 367ක් ද මීමැසි ජනපද 240ක් ද මීමැසි පෙට්ටි 320ක් ද දුම් විසුරුවණ 150ක් ද පිලා වදරාමු 175ක්ද මීවද රාමු 197ක් ද රැජිණ ගේට්ටු 775ක් ද නිෂ්පාදනය කරන ලදී. ආදිවාසි ජනයාට නව මීමැසි පාලන පිළිවෙත් හඳුන්වාදීම පිණිස, හෙන්නානිගල මීමැසි පාලන ගම්මානයක් ද ස්ථාපිත කරන ලදී.

වසර තුළ පුහුණුකරුවන් පුහුණු කිරීම ද මීමැසි පාලන පුහුණුකරුවන් වශයෙන් කෘෂිකර්ම උපදේශකයින් කණ්ඩායමක් ස්ථාපිත කිරීම ද සිදු කෙරිණි.

## තරුණ ගොවි සමාජ

මෙම ගොවි සමාජ, තරුණ ගොවි සමාජ ව්‍යාපාරයෙහි ගම් මට්ටමින් ස්ථාපිත ආයතනයි. තරුණ ගොවි සමාජ ව්‍යාපාරයේ අනෙකුත් අංග වනුයේ දිස්ත්‍රික්ක මට්ටමේ මූලික උපදේශක කමිටුව, පළාත් උපදේශක කමිටුව සහ ජාතික මට්ටමේ සංගමයයි. සාමාජිකත්වයෙහි සහභාගිත්වය ඇතිව මෙම කමිටු මගින් විවිධ මට්ටම්වලින් අදාළ කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

තරුණ ගොවි සමාජ 1,000ක් පමණ ස්ථාපිත කර ඇති අතර ඒවායින් 1/3ක් පමණ මුලස්ථානයේ ලියාපදිංචි කර ඇත.

2013 වර්ෂයේදී කෘෂිකාර්මික ව්‍යාප්තියට තරුණ ගොවි පරම්පරාව සහභාගි කරවා ගැනීම සඳහා දීප ව්‍යාප්ත වැඩසටහන් පවත්වන ලදී.

නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 9ක්ද තරුණ ගොවි සමාජ සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 45ක් ද පවත්වන ලදී. තරුණ ගොවි සමාජ විසින් සංස්කෘතික වැඩසටහන් 85ක්, ආගමික වැඩසටහන් 78ක්, අධ්‍යාපනික වැඩසටහන් 30ක් සහ සමාජයීය වැඩසටහන් 27ක් පවත්වන ලදී. එයට අමතරව, තරුණ ගොවීන් සඳහා

ප්‍රධාන වශයෙන්ම ගුවන්විදුලි ප්‍රශ්න විචාරාත්මක තරඟ 18ක් සඳහා පහසුකම් සපයන ලදී.

## ජල කළමනාකරණ හා ආරක්ෂිත කෘෂිකර්ම ඒකකය

ජල කළමනාකරණ සහ ආරක්ෂිත කෘෂිකර්ම ඒකකය තාක්ෂණ ජනනයට අදාළව පහත සඳහන් විෂයන් සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලයට හා ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවට එම තාක්ෂණය ප්‍රචාරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරයි.

- ජල සම්පාදනය සහ ජල සම්පාදන කළමනාකරණය
- ක්ෂුද්‍ර ජල සම්පාදන කළමනාකරණය සහ පොහොර මිශ්‍ර ජලය යෙදීම
- පාලිත පාරිසරික කෘෂිකර්මය (ආරක්ෂිත කෘෂිකර්මය - ආරක්ෂිත ගෘහ, වර්ෂා ආරක්ෂිත ආවරණ, දැල් ගෘහ)
- වාණිජමය වශයෙන් වාර්ෂික හා බහුවාර්ෂික බෝග වගාකිරීම (උසස් තාක්ෂණ යොදා ගනිමින් වාණිජමය ගොවිපළ සැලසුම් කිරීම)
- දියුණු තවාන් කළමනාකරණය

කුඩා සහ විශාල පරිමාණයේ ගොවිපළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ප්‍රචාරණය කිරීම ද මෙම ඒකකය විසින් ඉටු කරන වැදගත් කාර්යභාරයකි.

### කාර්යඵල

- ගොවීන් සහ නිලධාරීන් සඳහා ජල කළමනාකරණය සහ ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණ ප්‍රචාරණය සහ වැඩමුළු පැවැත්වීම
- ජපාන අන්තර්ජාතික සහයෝගිතා අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘතිය යටතේ කුණ්ඩසාලේ බීජ ගොවිපළෙහි අක්. 5ක ආක්ෂිත ගෘහයක් සහ බිංදු ජල සම්පාදන ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම. ඒ හැරුණුවිට, අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම හා ආරක්ෂිත ගෘහ පිළිබඳ තක්සේරු සහ සැලසුම් පිළියෙල කිරීම පිණිස තාක්ෂණ සහාය ලබාදීම
- ආරක්ෂිත කෘෂිකාර්මික තාක්ෂණය සහ ජල සම්පාදන කළමනාකරණය යටතේ පවතින මුළු බිම් ප්‍රමාණය සොයා ගැනීමට හා පසුගිය වසරවල ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමවල ප්‍රගතිය සොයා ගැනීමට ක්ෂේත්‍ර සමීක්ෂණයක් පැවැත්වීම

## සැලසුම් සහ ප්‍රගති මෙහෙයුම් ඒකකය

ව්‍යාප්ති සහ පුහුණු මධ්‍යස්ථානයේ මූල්‍ය සහ තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කිරීම සහ එම කටයුතු පිළිබඳ ප්‍රගති මෙහෙයුම් කටයුතු කිරීම මෙම සැලසුම් සහ ප්‍රගති මෙහෙයුම් ඒකකයේ ප්‍රධාන වගකීමයි.

2013 වර්ෂයේදී මෙම ඒකකය විසින් ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ උප ඒකක සහ මධ්‍යස්ථාන සියල්ලෙහි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලදී. එමෙන්ම මූලධන සහ පුනරාවර්තන හා විශේෂ ව්‍යාපෘති ප්‍රතිපාදන සහ තාක්ෂණික කටයුතු පිළිබඳ මාසික ප්‍රගති වාර්තා ද මෙමගින් පිළියෙළ කෙරිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව, මහ බැංකු වාර්තාව හා පාර්ලිමේන්තු අයවැය කථාව සඳහා තොරතුරු ලබාදීමෙහි ද අදාළ ආයතනවල තොරතුරු සපයා දීම් ද සිදු කෙරිණි. වාර්ෂික අයවැය සඳහා ඉදිරිපත් කිරීම

පිණිස ලද යෝජනා ද මෙම ඒකකය විසින් සම්පාදනය කරන ලදී. එයට අමතරව, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය පිළිබඳ තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තු තොරතුරු අඩවියෙහි යථාවත් කර දක්වන ලදී.

## කෘෂිකර්ම අධ්‍යාපන සහ විභාග ඒකකය

අධ්‍යාපන හා විභාග ඒකකය අධ්‍යාපන, විභාග සහ විෂය මාලා සංවර්ධනය යන අනු ඒකක තුනෙන් සමන්විත වේ. කෘෂිකර්ම විද්‍යාල කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස, වවුනියාව සහ කරපිංච යන ස්ථානවල පිහිටා ඇති අතර අධ්‍යාපන අනු ඒකකය යටතේ ක්‍රියාකාරී වේ. යථෝක්ත විද්‍යාල විසින් පෙර ලබා දෙන ලද ඩිප්ලෝමා පාඨමාලාව 2013 වසරේ සිට 'කෘෂිකාර්මික නිෂ්පාදනය සහ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව' වශයෙන් සංශෝධනය කරන ලදී. 2013 වර්ෂය අවසානය වනවිට, සිසුහු 513දෙනෙක් යථෝක්ත විද්‍යාලවල කෘෂිකාර්මික නිෂ්පාදනය සහ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හදාරමින් සිටියහ.

විභාග අනු ඒකකය වාර්ෂිකව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා විවිධ විභාග පවත්වයි. මෙමගින් දෙපාර්තමේන්තුමය විභාග සහ කාර්යක්ෂමතා කඩඉම් විභාග 15ක් ද පවත්වන ලද අතර 2013 වර්ෂය අවසානයට මෙම විභාග සඳහා පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව 910ක් විය. රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විභාගය - 2012, ගොවිපළ ලිපිකරු (III වන ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත සහ විවෘත තරඟ විභාගය - 2012/2013 සහ තාක්ෂණික සහකාර (කෘෂිකර්ම පර්යේෂණ/ව්‍යාප්ති) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2013 පවත්වන ලද අතර 2013 වසර තුළ එම විභාග සඳහා පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව පිළිවෙළින් 1,641ක්, 5058ක් සහ 1,292ක් විය.

එයට අමතරව, 2014-2016 අධ්‍යයන වර්ෂය සඳහා කෘෂිකර්ම විද්‍යාල ප්‍රවේශ විභාගය පවත්වන ලද අතර එම විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව 2,428ක් විය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සඳහා එක් අවුරුදු ප්‍රායෝගික පුහුණු වැඩසටහනට අදාළ විභාගය 2005 වර්ෂයේ සිට පවත්වන ලදී.

විෂය මාලා සංවර්ධන අනු ඒකකය ද විවිධ වූ වැදගත් කාර්යයන් ඉටු කරයි. වෘත්තීය අධ්‍යාපන කොමිසම සඳහා නිපුණතා පදනම් කරගත් පුහුණුවට අදාළ විෂය මාලා සංවර්ධනය කිරීම පිණිස තාක්ෂණික සහාය මුළුමනින්ම ලබාදෙන ලද්දේ මෙම ඒකකය විසිනි. එයට අමතරව, නිපුණතා පදනම් කරගත් පුහුණුව හා සම්බන්ධ වන විෂය මාලාවක් කෘෂිකර්ම විද්‍යාල පද්ධතියට හඳුන්වා දෙන ලදී. නිපුණතා පදනම් කරගත් පුහුණු ක්‍රමය සහ පාඩම් සැලසුම් සමග කෘෂිකර්ම විද්‍යාල කථිකාචාර්යවරුන් සම්බන්ධීකරණය 2013 වර්ෂයේදී මෙම ඒකකය විසින් ඉටු කරන ලද වැදගත් කාර්යයන් වේ.

2013 වර්ෂය තුළ විවිධ කෘෂිකර්ම විද්‍යාල තුළ සිටි සිසුන් සංඛ්‍යාව පහත දැක්වේ.

වගු අංක **3.1.3: 2013** වර්ෂය අවසානය වනවිට කෘෂිකර්ම පාසැල්වල අධ්‍යයන කටයුතුවල නිරතව සිටි සිසුන් සංඛ්‍යාව

| කෘෂිකර්ම විද්‍යාලය | වසර | මාධ්‍යය | | | | | | එකතුව | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල | | දමිළ | | ඉංග්‍රීසි | | | |
| | | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු | | |
| කුණ්ඩසාලේ | පළමු | 45 | 23 | 20 | 07 | 20 | 12 | 127 | 229 |
| | දෙවන | 29 | 31 | 09 | 08 | 08 | 17 | 102 | |
| අඟුණකොළපැළැස්ස | පළමු | 31 | 21 | | | | | 52 | 89 |
| | දෙවන | 26 | 11 | | | | | 37 | |
| පැල්වෙහෙර | පළමු | 41 | 15 | | | | | 56 | 107 |
| | දෙවන | 40 | 11 | | | | | 51 | |
| වවුනියාව | පළමු | | | 22 | 8 | | | 30 | 64 |
| | දෙවන | | | 16 | 18 | | | 34 | |
| කරපිංච | පළමු | | | | | | | | 24 |
| | දෙවන | 24 | | | | | | 24 | |
| **එකතුව** | | **236** | **112** | **67** | **41** | **28** | **29** | **513** | **513** |

### කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සඳහා එක් අවුරුදු ප්‍රායෝගික කෘෂිකර්ම පුහුණු පාඨමාලාව

මෙම පාඨමාලාවෙන් ඉලක්ක කළ කණ්ඩායම වන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ය. 2005 වර්ෂයේදී පුහුණු මධ්‍යස්ථාන 8කදී මෙම පාඨමාලාව ආරම්භ කරන ලද අතර සියලුම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් පාඨමාලාව සම්පූර්ණ කරන තුරු එය අඛණ්ඩව පවත්වාගෙන යෑමට අපේක්ෂා කරන ලදී. 676ක් වූ පළමු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් කණ්ඩායම 2006 වර්ෂයේදී ද 246ක් වූ දෙවන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් කණ්ඩායම 2008 වර්ෂයේදී ද 278ක් වූ තෙවන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරුවන් කණ්ඩායම 2011 වර්ෂයේදී ද පුහුණු පාඨමාලාව සම්පූර්ණ කළහ. 2013 මාර්තු මාසයේදී, 2012/13 කණ්ඩායමේ සිසුන් 68ක් සඳහා සහ පෙර වසරවලට අදාළව යළි පෙනීසිටින්නන් 42දෙනකු සඳහා අවසන් විභාගය පවත්වන ලදී. 2013 වර්ෂයේදී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරු 99දෙනෙක් පුහුණුව සම්පූර්ණ කළහ.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් නොවුණු හෙයින් මෙම පුහුණු කාර්යයන් 2013 වර්ෂයේදී සිදු නොකෙරිණි.

### කාබනික කෘෂිකර්ම සහ පැළෑටි පෝෂක කළමනාකරණ ඒකකය

මෙම ඒකකය විසින් 2013 වර්ෂයේදී ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් වූයේ අපනයනය සඳහා සහල් නිෂ්පාදනය කිරීම, අපනයන කටයුතු සඳහා සාම්ප්‍රදායික වී ප්‍රභේද වගා කිරීම ප්‍රචලිත කිරීම සහ මෙරට පරිසර හිතකාමී කෘෂිකර්මය ප්‍රචලිත කිරීම පිණිස අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. පරිසර හිතකාමී කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දිවයින පුරා කාබනික ගම්මාන ක්‍රියාත්මක කර ඇත.

### කාර්යඵල

- බිත්තර වී වගා කිරීම පිණිස හෙ. 80ක් සඳහා තාක්ෂණික සහ මූල්‍යමය සහාය ලබාදීම
- ජාතික ගොවි සතිය පිළිබඳ 5 දින වැඩමුළුවක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම
- නව කෘෂිකාර්මික තාක්ෂණ ප්‍රචාරණය කිරීම සඳහා වැඩමුළු 4ක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම
- ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු 3ක් සංවිධානය කිරීම
- ව්‍යාප්ති සහ පුහුණු මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ව්‍යාප්ති කටයුතු අධීක්ෂණය
- එයට අමතරව, මෙම ඒකකය විසින් පාංශු පරීක්ෂාව සහ ජීව්‍යතාව පරීක්ෂා කරන ලද බීජ නිෂ්පාදනය සම්බන්ධීකරණය ද සිදු කෙරිණි.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- අන්තර් පළාත් ප්‍රදේශ 6හි කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන්
  - මෙරට ආහාර සුරක්ෂිතතාව සනාථ කිරීම පිණිස අන්තර් පළාත් ප්‍රදේශවල වගා කරන ප්‍රධාන බෝගය වන වීවල ඵලදායිතාව වර්ධනය කිරීම පිණිස 2014 වර්ෂය තුළ අවධානය යොමු කෙරෙනු ඇත. ප්‍රධාන වාරිමාර්ග, සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ වගා කන්න තුළ මෙම කාර්යය ඉටු කර ගැනීම පිණිස තාක්ෂණික කටයුතු සහ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක

කෙරෙනු ඇත. ප්‍රජාව විසින්ම උසස් තත්ත්වයේ බිත්තර වී නිපදවා ගැනීමක් ද මෙමගින් අපේක්ෂා කෙරේ.

- ආනයන අඩුකර විදේශ විනිමය ඉතිරි කර ගැනීම පිණිස අවාරයේ සහ තෙවැනි කන්නය තුළ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම අවධාරණය කෙරෙනු ඇත. ලොකු ලූනු හා මිරිස් වගාව සම්බන්ධනේ වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා දීප ව්‍යාප්ත මට්ටමින් විශේෂ වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනු ඇත. වගා බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය වැඩි කිරීම සහ උසස් තත්ත්වයේ බීජ නිපදවීම සඳහා ව්‍යාප්ති කටයුතු ක්‍රියාත්මක කෙරෙනු ඇත.
- ශාක පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන් සහ කෘෂි පාරිසරික කලාපය අනුව සුදුසු පලතුරු ප්‍රභේද හඳුන්වාදීම මගින් පලතුරු නිෂ්පාදනය පුළුල් කෙරෙනු ඇත. ඒ ඒ අන්තර් පළාත් ප්‍රදේශය විසින් යෝග්‍ය පරිදි එළවළු නිෂ්පාදන කටයුතු ද ශක්තිමත් කෙරෙනු ඇත.

- කෘෂිකර්ම විද්‍යාලවල කෘෂිකර්ම අධ්‍යාපන වැඩසටහන
  - කෘෂිකර්ම විද්‍යාල 5හි දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා වැඩසටහන පැවැත්වීම
  - සිසුන් 248දෙනෙකු ඩිප්ලෝමාලාභීන් ලෙස විද්‍යාලයෙන් පිටව යනු ඇති අතර නව කණ්ඩායමක් පාඨමාලාව සඳහා බඳවා ගැනෙනු ඇත.
- නිලධාරීන් සහ ගොවීන් සඳහා සේවා සංස්කරණ අභ්‍යාස ආයතන 3, දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන 4, ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය සහ මීමැසි සංවර්ධන ඒකකය තුළ කෘෂිකාර්මික පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විශේෂ පුහුණු මධ්‍යස්ථාන 4කදී, වාරියපොළ, ලබුදූව, අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාලවලදී සහ බිබිල උද්‍යාන බෝග පුහුණු සංවර්ධන ආයතනයේදී කෙටි කාලීන කෘෂිකර්ම පුහුණු වැඩසටහන් පැවැත්වීම. බෝග මගින් භූමි අලංකරණය සහ නාගරික කෘෂිකර්මය පිළිබඳ විශේෂ පුහුණු පාඨමාලාවක් 2014 වර්ෂයේ සිට ලබුදූව කෘෂිකර්ම විද්‍යාලයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මෙම පාඨමාලාව අවු. 18-35 අතර වයස් කාණ්ඩයේ පසුවන පාසැල් හැරගිය පිරිස් සඳහා පැවැත්වෙනු ඇත. එමෙන්ම 2014 වර්ෂයේදී බිබිල උද්‍යාන බෝග පුහුණු සහ සංවර්ධන ආයතනයේ දැනට පවතින හෙ. 10ක් වූ අඹ වගාව පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.
- 2014 වර්ෂයේදී විභාග සඳහා නියමිත දින වකවානු අනුව පහත සඳහන් විභාග පැවැත්වීම
  - දෑවුරුදු ඩිප්ලෝමා වැඩසටහනෙහි විභාග
  - කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සඳහා වන එක් අවුරුදු පුහුණු පාඨමාලාවට අදාළව යළි පෙනී සිටින්නන් වෙනුවෙන් පවත්වන විභාග
  - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තුමය විභාග
  - කෘෂිකර්ම විද්‍යාලවලට පුහුණුවන්නන් බඳවා ගැනීමේ තරඟ විභාග
  - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග
  - කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගනු ලබන රජයේ නිලධාරීන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය පිණිස පවත්වනු ලබන විභාග

- තරුණ ගොවි සමාජ සාමාජිකයින් සඳහා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සහ වෙනත් පුහුණු වැඩසටහන් පැවැත්වීම
- කාන්තා කෘෂි ව්‍යාප්ති වැඩසටහන
  - කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සහ ගන්නොරුව, ප්‍රධාන කාර්යාල සහ තාක්ෂණික උද්‍යානය යන ස්ථානවල පිහිටා ඇති අලෙවි පියසි සඳහා නව ව්‍යවසායකයින් පුහුණු කිරීම
  - ජංගම ආහාර ආදර්ශන ඒකකය විසින් ක්ෂේත්‍ර මට්ටමින් දේශීය ආහාර ආදර්ශන පැවැත්වීම
  - කුඩා පොත්, ෆ්ලිප් චාර්ට් වැනි පුහුණු උපකාරක පිළියෙල කිරීම
  - ආදයම් උත්පාදනය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳව ආහාර පර්යේෂණ ඒකකය සමග සිදු කරන සහයෝගිතා ව්‍යාපෘතිය
  - ගුවන්විදුලි හා රූපවාහිනී වැඩසටහන් සහ ප්‍රදර්ශන මගින් තාක්ෂණ ප්‍රචාරණය
  - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දේශීය ආහාර අලෙවි කරන 'හෙළ බොජුන් අලෙවි පියස' වශයෙන් හඳුන්වන නව අලෙවි සැල ස්ථාපිත කිරීම
- කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන්
  - ගොවි ව්‍යවසායකත්ව පාසැල් වැඩසටහන හම්බන්තොට හා අම්පාර අන්තර් පළාත් ප්‍රදේශ හා හම්බන්තොට, මාතර, ගාල්ල, ගම්පහ පළාත් ප්‍රදේශ සඳහා හඳුන්වාදීම
  - අන්තර් ජාලය පදනම් කරගත් අලෙවිකරණ තොරතුරු ක්‍රමය යථාවත් කිරීම සහ අනෙකුත් ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය කිරීම පිණිස දිස්ත්‍රික් කෘෂි ව්‍යාවසාය සංවර්ධන ඒකක ස්ථාපිත කිරීම
  - රාජ්‍ය - පෞද්ගලික හවුල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර සහායක වැඩසටහන (Business Incubator) හා අනෙකුත් අදාළ ආයතන සමග සම්බන්ධව කටයුතු කිරීම
  - කෘෂි සේවා පියස වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ එම වැඩසටහන වර්තමාන කෘෂිකාර්මික ක්‍රමය සමග සම්බන්ධ කිරීම
  - එක් එක් ගොවීන් සහ කණ්ඩායම් සඳහා හඳුන්වා දිය හැකි ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් පිළිබඳ අධ්‍යයනය සිදු කිරීම. ගොවි ණය පහසුකම් ලබාදීම හා ඔවුන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර ඔවුන් සවි බලගැන්වීම සඳහා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම
  - අතරමැදියන්ගේ මැදිහත්වීම් අවම කිරීම සඳහා ගොවීන්ගේ වෙළඳපළ ස්ථාපිත කිරීම. මෙවන් වෙළඳපළ මගින් අපේක්ෂා කරන අනෙකුත් අරමුණු නම් අඩු මිලකට නිපැයුම් අලෙවි කිරීම, සරල අගය එකතු කිරීමේ ක්‍රම හඳුන්වාදීම සහ දේශීය දැ සඳහා පුමුඛත්වය ලබාදීමයි.
  - මධ්‍යම හා විශාල පරිමාණ වාණිජමය ගොවිපළ සංවර්ධනය යටතේ උපදේශක සේවා ලබාදීම
  - සහභාගීවන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම පිණිස කෘෂි ව්‍යාපාර පදනම් කරගත් පුහුණු වැඩසටහන් සැලසුම් කර පැවැත්වීම
- ක්ෂුද්‍ර ජල සම්පාදනය සහ ආරක්ෂිත කෘෂිකර්මය
  - වැසි ආවරණ, ආරක්ෂිත කෘෂිකර්මය සහ ක්ෂුද්‍ර ජල සම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම
  - ක්ෂුද්‍ර ජල සම්පාදනය සහ ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ ජාතික කමිටුවට අදාළ කාර්යයක් සිදු කිරීම

## විශේෂ ව්‍යාපෘති

- කෘෂිකර්ම විද්‍යාලවල, සේවා සංස්කරණ අභ්‍යාස ආයතනවල, ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු

මධ්‍යස්ථානයේ සහ මීමැසි සංවර්ධන ඒකකයේ ඉඩම් සංවර්ධන කටයුතු

- ව්‍යාප්ති සහ පුහුණු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ ඔවුන්ගේ හැකියා වර්ධනය
- 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද 'පැල්වෙහෙර කෘෂිකර්ම විද්‍යාලයේ නව නේවාසිකාගාරයක් ඉදි කිරීම' සහ 'නිපුණ වෘත්තිකයින් බිහි කිරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල සංවර්ධනය කිරීම' පිළිබඳ ව්‍යාපෘති අඛණ්ඩව කරගෙන යාම

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී/සේවක සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 03 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 21 |
| සහකාර අධ්‍යක්ෂ | 28 |
| කෘෂිකර්ම නිලධාරි | 17 |
| කථිකාචාර්ය | 50 |
| කථිකාචාර්ය (කොන්ත්‍රාත්) | 05 |
| විෂයානුගත විශේෂඥ | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 13 |
| වැඩසටහන් සහකාර | 19 |
| සංවර්ධන නිලධාරි | 26 |
| කෘෂිකර්ම උපදේශක | 307 |
| පර්යේෂණ සහකාර | 01 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 01 |
| ගොවිපළ යන්ත්‍ර උපදේශක | 01 |
| තාක්ෂණික නිලධාරි | 01 |
| මීමැසි පාලක | 06 |
| කාර්මික ශිල්පි | 01 |
| බද්ධකරු | 07 |
| වඩුකාර්මික | 04 |
| පුස්තකාලයාධිපති | 01 |
| පරිපාලන නිලධාරි | 02 |
| කළමනාකරණ සහකාර සේවය | 83 |
| භාෂා පරිවර්තක (ඉංග්‍රීසි) | 01 |
| තාක්ෂණික සහායක | 04 |
| යන්ත්‍ර උපස්ථායක | 01 |
| ගබඩා පාලක | 11 |
| ගොවිපළ ලිපිකරු | 05 |
| කාර්යාල කාර්ය සහායක | 14 |
| සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| මුරකරු | 43 |
| ස්ටුවර්ඩ් | 03 |
| අරක්කැමි | 18 |
| මුරකරු | 72 |
| සනීපාරක්ෂක කම්කරු | 05 |
| රියදුරු | 64 |
| ලොරි සහායක | 01 |
| විදුලි ශිල්පි | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 14 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකාරු | 01 |
| ජල පොම්ප ක්‍රියාකරු | 01 |
| කම්කරු | 205 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 167 |
| **එකතුව** | **1232** |

# 3.2 තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය - පේරාදෙණිය

ජාතික සමෘද්ධිය උදෙසා කෘෂිකර්මාන්තයේදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙහි විශිෂ්ඨත්වය සපුරා ගැනීම මෙම මධ්‍යස්ථානයෙහි දැක්ම වේ.

ආහාර බෝග අංශය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායි කිරීමත්, කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තු තොරතුරු සහ සේවාවන් කෙරෙහි ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීමත් වඩාත් ප්‍රජා කේන්ද්‍ර පාලනයක් නිර්මාණය උදෙසා කෘෂිකර්මාන්තයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම මධ්‍යස්ථානයෙහි මෙහෙවර වේ.

මෙම නව මධ්‍යස්ථානය, 2012 මාර්තු 01 වන දින ස්ථාපිත කරනු ලැබූ අතර මෙම මධ්‍යස්ථානය සතු කාර්යභාරය වන්නේ ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය හරහා කෘෂිකාර්මික තොරතුරු එක්රැස් කිරීම, සම්පාදනය සහ ව්‍යාප්තිය සහ ප්‍රදර්ශනය පැවැත්වීම සහ කෘෂිකර්ම තාක්ෂණ උද්‍යානයන් පවත්වාගෙන යාමත්ය.

ගොවි විකාශන සේවාව, ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය, කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නෝරුව සහ බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානය මෙම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය යටතේ පවතින ආයතන වේ. "මහින්ද චින්තන අනාගත දැක්ම" අපේක්ෂිත පරිදි කෘෂිකාර්මික තොරතුරු හුවමාරුව පිළිබඳ රජයේ ප්‍රතිපත්තීන්ට අනුකූලව ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය ගන්නෝරුවෙහි ස්ථාපිත කිරීම උදෙසා නව ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කරනු ලැබ ඇත.

## අයවැය

විවිධ වැය ශීර්ෂයන් යටතේ ලැබූ ප්‍රතිපාදන සහ වියදම 3.2.1 වගුවෙහි දක්වනු ලැබේ.

**වගුව 3.2.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---:|---:|---:|
| ප්‍රාග්ධන | 27,256,327 | 22,856,236 | 84 |
| පුනරාවර්තන | 46,526,530 | 40,852,761 | 88 |
| **ව්‍යාපෘති** | | | |
| මාධ්‍ය වැඩසටහන | 20,000,000 | 19,765,219 | 99 |
| කෘෂි උද්‍යාන | 4,500,000 | 4,166,645 | 93 |
| දැයට කිරුළ - 2013 | 17,000,000 | 17,000,000 | 100 |
| දැයට කිරුළ - 2014 | 5,000,000 | 4,965,443 | 99 |
| බෝග අනාවැකි | 1,900,000 | 1,875,000 | 99 |
| **එකතුව** | **122,182,857** | **111,481,305** | **91** |

## ප්‍රගතිය

### ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය

ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය යනු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය යටතේ පවතින ප්‍රධාන තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හට තොරතුරු සන්නිවේදන අවශ්‍යතාවයන්හිද අවශ්‍ය පහසුකම් සැපයීම මෙම මධ්‍යස්ථානයෙහි ප්‍රධාන වගකීම වේ. එමනිසා කෘෂිකර්මාන්තයේ සංවර්ධනය උදෙසා අවශ්‍ය වන පුළුල් ක්ෂේත්‍රයක උපදේශාත්මක මුද්‍රිත තොරතුරු පත්‍රිකා සැකසීමේ කාර්යයහි නිරත වන අතර ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත සංවර්ධන උදෙසා තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.

- ජාතික රූපවාහිනියේ සතිපතා ඉරිදා ප.ව 6.30ට “ගොවිබිමට අරුනලු” සහ සිකුරාදා ප.ව 6.15ට විකාශය වන “මිහිකත දිනුවෝ” යන වැඩසටහන් 2ක නිෂ්පාදනය
- කෘෂිකාර්මික ප්‍රකාශනයන් සැකසුම් කිරීම සහ නිෂ්පාදනය එනම් පත්‍රිකා, පොස්ටර්, විශාල දැන්වීම් පුවරු සඳහා මුද්‍රණ, බැනර්
- ගන්නෝරුව සහ බට අත කෘෂි තාක්ෂණ උද්‍යාන කළමනාකරණය
- කෘෂිකාර්මික ප්‍රදර්ශන සංවිධානය : දැයට කිරුළ, ගොවි සතිය
- කෘෂිකාර්මික උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම “ ගොවි සහන සරණ සේවාව” (කෙටි ඇමතුම් අංකය 1920)
- වෙබ් අඩවි වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තු (www.agridept.gov.lk) විකි ගොවියා වෙබ් අඩවිය (www.goviya.lk) ශ්‍රී ලංකාවේ සහල් පිළිබඳ දත්ත බැංකුව
- විවිධ බෝග සහ විෂයන් පිළිබඳ Interactive Multimedia දෘඩකාංග තැටි නිෂ්පාදනය.
- සයිබර් ව්‍යාප්ති ප්‍රවර්ධනය සහ AgMIS ගොවි දත්ත වගුව
- ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉගෙනුම් ආධාරක සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ තාක්ෂණයන් පිළිබඳ පුහුණු වැඩසටහන

### ප්‍රගතිය

#### පුහුණුව

පුහුණු වැඩසටහන් 16

#### දෘශ්‍යමය සන්නිවේදනය

තාක්ෂණික ප්‍රකාශන - 07

පත්‍රිකා/කුඩා පොත් - 63

විශාල දැන්වීම් පුවරු / පෝස්ටර් - 357

ආරාධනා පත්‍ර / සුබ පැතුම් පත්/ ලේබල්/ ස්ටිකර්/ නාමපුවරු - 2083

බැනර් - 55

#### වීඩියෝ /ඡායාරූපකරණය

මිහිකත දිනුවෝ - 51

ගොවිබිටම අරුනළු - 46

වෙනත් වාර්තා වැඩසටහන් - 19

රූපවාහිනි කෙටි දැන්වීම් - 01

ද්වීත්ව සේවා - 264

ඩිජිටල් ඡායාරූප - 13,650

#### තොරතුරු තාක්ෂණය

IMM CD - ROMS – 04

වෙබ් අඩවි යාවත්කාලින කිරීම - 797 (DOA / Wikigoviya/RKB/Krushilanka Portal/AFACI – ATIN)

දෘඩකාංග සහ මෘදුකාංග නඩත්තු - 873

### ගොවි සහන සරණ උපදේශක සේවා

මෙහෙයවනු ලැබූ ගොවි ගැටළු - 37,663

ස්කයිප් (වීඩියෝ දුරකථන ඇමතුම්) - 75

### ප්‍රදර්ශන

දැයට කිරුළ, ගොවි සතිය, පොදු.රා.නා.ස) - 04

### කෘෂි උද්‍යාන - ගන්නෝරුව

නරඹන්නන් (පාසල් ශිෂ්‍යයින්) - 60,921

නරඹන්නන් (වැඩිහිටි) - 25,157

අදායම - රුපියල් 854,880

## කෘෂිකර්ම මුද්‍රණ ඒකකය

ක්ෂේත්‍ර ව්‍යාප්ති කටයුතු සඳහා ආධාරවීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි මුද්‍රිත ප්‍රකාශනයන් පළ කිරීම සහ බෙදා හැරීම කෘෂිකර්ම මුද්‍රණ ඒකකය මගින් සිදු කෙරේ. කෘෂිකර්ම මුද්‍රණ සහ තොරතුරු සේවාව මෙම ඒකකය යටතට පැමිණේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ මුද්‍රණ අවශ්‍යතාවයන් මෙම මුද්‍රණ ඒකකය මගින් ඉටු කරන අතරම අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශයේ මුද්‍රණ අවශ්‍යතාවයන්ද ඉටු කෙරේ. අලෙවි ආකාරයෙන් හෝ නොමිලේ මෙම මුද්‍රිත ප්‍රකාශන බෙදාහැරීමේ වගකීම තොරතුරු මධ්‍යස්ථානය සතු වේ. අලෙවි මධ්‍යස්ථානයන්හි මෙම ප්‍රකාශන සහ දෘඩකාංග තැටි අලෙවි කිරීම මගින් මෙම ඒකකය උපයා ගත් ආදායම ආසන්න වශයෙන් මිලියන 2.6ක ආදායමක් උපයා ගැනිණි.

## ප්‍රගතිය

මෙම ඒකකය මගින් 2013 වර්ෂයේදී මුද්‍රිත සම්පූර්ණ නව ප්‍රකාශන සංඛ්‍යාව 21කි. (පිටපත් 51,500) පොත් 13ක් (පිටපත් 30,000) නැවත මුද්‍රණය කරනු ලැබීය. විවිධ විෂයන් යටතේ වූ පත්‍රිකා 350,000ක පිටපත් මුද්‍රණය කර බෙදා හරිනු ලැබිණි. මෙයට අමතරව වෙනත් අංශයන්හි නව ප්‍රකාශන 15ක්ද මුද්‍රණය කරනු ලැබීය.

**වගුව 3.2.2: නැවත මුද්‍රණය කළ ප්‍රකාශන විස්තර**

| ප්‍රකාශනයෙහි නම | පිටපත් සංඛ්‍යාව |
|---|---|
| වාර්ෂික කෙසෙල් පැළ කිරීම (සිංහල) | 5,025 |
| කෘෂි රසායනයක් ලෙස කොහොඹ (සිංහල) | 1525 |
| පැපොල් (සිංහල) | 500 |
| මීමැසි පාලනය (සිංහල) | 1,000 |
| අඹ (සිංහල) | 2,500 |
| අන්නාසි වගාව (සිංහල) | 2,000 |
| එළවළු වගාව සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය | 2,000 |
| කෙසෙල් මොරෙය්යන් නිෂ්පාදනය (සිංහල) | 2,010 |
| එළවළු වගාව (සිංහල) | 6,000 |
| මිරිස් (සිංහල) | 1,750 |
| කාබනික පොහොර (දෙමළ) | 500 |
| කාබනික පොහොර (සිංහල) | 5,000 |
| මිරිස් (දෙමළ) | 150 |

**වගු අංක 3.2.3: ප්‍රගති අලෙවිය (රු.)**

| අලෙවි මධ්‍යස්ථානය | ආදායම (රු.) |
|---|---|
| අංක 1 - ගලහ හන්දිය | 1,246,487.60 |
| අංක 2 - ගන්නෝරුව | 1,300,002.00 |

වගුව 3.2.4: 2013 වර්ෂයේ මුද්‍රිත නව පොත්

| පොතේ නම | පිටපත් සංඛ්‍යාව |
| --- | --- |
| රඹුටන් (සිංහල) | 3,000 |
| කෘෂි - තාක්ෂණ වෙළුම 14- අංක 1-2 (දෙමළ) | 500 |
| කෘෂි - තාක්ෂණ වෙළුම 14 අංක 3-4 (දෙමළ) | 500 |
| කෘෂි - තාක්ෂණ වෙළුම 14 අංක 3-4 (සිංහල) | 5,000 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග වල පළිබෝධකයින් සහ මයිටාවන් (සිංහල) | 3,160 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග වල පළිබෝධකයින් සහ මයිටාවන් (දෙමළ) | 1,000 |
| මාෂ බෝග වගාව (සිංහල) | 500 |
| මාෂ බෝග වගාව (දෙමළ) | 250 |
| අංකුර බද්ධය සහ රිකිලි බද්ධය (සිංහල) | 2,500 |
| අංකුර බද්ධය සහ රිකිලි බද්ධ (දෙමළ) | 1,000 |
| ගොවිකම් සඟරාව වෙළුම 43 - අංක3 | 5,000 |
| ගොවිකම් සඟරාව වෙළුම 44 - අංක 1 | 5,000 |
| ගොවිකම් සඟරාව වෙළුම 44 - අංක 2 | 5,000 |
| නලස්ථ වගාව | 5,000 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිය වසර (ඉංග්‍රීසි) | 500 |
| සහල් පදනම් නිෂ්පාදන (දෙමළ) | 1,500 |
| කෘෂි - තාක්ෂණ වෙළුම 15 අංක 1 – 4 (සිංහල) | 4,000 |
| කෘෂි - තාක්ෂණ වෙළුම 15 අංක 1 – 4 (දෙමළ) | 500 |
| ලොග් පොත හා දිනපොත් | 5,500 |
| කමකිලිල් විලක්කම් වෙළුම 51 අංක 1 | 1,000 |
| කමකිලිල් විලක්කම් වෙළුම 51 අංක 2 | 1,000 |

වගුව 3.2.6: 2013 වසරේ වෙනත් අවශ්‍යතාවයන් සඳහා වූ ප්‍රකාශනයන්

| අංශය/ ප්‍රකාශනයෙහි නම | පිටපත් සංඛ්‍යාව |
| --- | --- |
| **සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය** | |
| බෝග ව්‍යවසායික අයවැය 2012 (ඉංග්‍රීසි) | 700 |
| නිෂ්පාදනය සැලසුම් (එළවළු සහ පලතුරු) (සිංහල) | 100 |
| වගා පිරිවැය - 2011- යල (ඉංග්‍රීසි) | 206 |
| වගා පිරිවැය - 2011 - මහ (ඉංග්‍රීසි) | 210 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග (ඉංග්‍රීසි) | 202 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග (ඉංග්‍රීසි) | 202 |
| **කෘෂිකර්ම අමාත්‍යාංශය** | |
| බෝග නිෂ්පාදන වැඩසටහන 2012/13 (ඉංග්‍රීසි) | 300 |

| අංශය/ ප්‍රකාශනයෙහි නම | පිටපත් සංඛ්‍යාව |
|---|---|
| **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** | |
| Tropical Agriculturist (ඉංග්‍රීසි) | 700 |
| වාර්ෂික කාර්ය සාධන වාර්තාව (ඉංග්‍රීසි) | 100 |
| වාර්ෂික කාර්ය සාධන වාර්තාව (2011,2012) (දෙමළ) | 100 |
| වාර්ෂික කාර්ය සාධන වාර්තාව (2011, 2012) (සිංහල) | 200 |
| නව බෝග ප්‍රභේද (ඉංග්‍රීසි) | 750 |
| **කෘෂි ව්‍යවසායික සංවර්ධන සහ තොරතුරු ස්ථානය** | |
| ගොවි ව්‍යාපාරික පාසල් (සිංහල) | 3,000 |
| **ව්‍යාප්ති හා පුහුණු අංශය** | |
| තාක්ෂණික කුඩා පොත් (සිංහල) | 160 |
| පත්‍රිකා | 60,000 |
| **බීජ සහතික කිරීමේ ස්ථානය** | |
| පැල තවාන් කරුවන්ගේ නාම ලේඛණ | 3,025 |
| **වී පර්යේෂණ සංවර්ධන ආයතනය** | |
| වී සඳහා නව පොහොර නිර්දේශයන් (දෙමළ) | 3,000 |

වගුව **3.2.6:** වෙනත් මුද්‍රිත සංක්ෂිප්තය

| ප්‍රකාශන වර්ග | පිටපත් සංඛ්‍යාව |
|---|---|
| පත්‍රිකා | 366,087 |
| ලේඛන | 18,195 |
| තොරතුරු පුවත් නිවේදන | 4,450 |
| ලදුපත් පොත් | 212 |
| ආකෘති පත්‍ර | 210,576 |
| ලිපිගොනු කවර | 10,833 |
| බීජ සහතික කිරීමේ සේවය පොත් | 7,536 |
| හමුවීම් පත් | 3,530 |
| සහතිකපත් | 5,500 |
| ආරාධනා පත්‍ර | 4,901 |
| බෝග සායන පොත් | 1,084 |
| පෝස්ටර් | 99,850 |
| ප්‍රශ්ණ පත්‍ර | 2,250 |
| බෝග අනාවැකි වැඩසටහන් පොත් | 25,000 |
| බෝග අනාවැකි වැඩසටහන් ආකෘති පත්‍ර | 175,000 |
| ශිෂ්‍ය වාර්තා පොත් | 600 |
| විගණන වාර්තා | 100 |
| පාර්ලිමේන්තු පනත් | 100 |
| බීජ ලේබල් | 2,400,000 |
| දිවි නැගුම සඳහා බීජ ලේබල් | 1,000,000 |

## ගොවි විකාශන සේවාව

ගොවි ප්‍රජාවගේ දැනුම සහ ආකල්ප වෙනස් කිරීම උදෙසා කාලීන සහ අදාල කෘෂිකාර්මික තොරතුරු ව්‍යාප්ත කිරීම පිණිස කෘෂිකාර්මික ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය සහ විකාශනය සම්බන්ධ කටයුතු සම්බන්ධ වගකීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවි විකාශන සේවාව හට පැවරේ.

මෙම සේවාවෙහි අරමුණු

- ගොවීන් අතර වඩාත් ඵලදායී නව කෘෂිකාර්මික පිළිවෙත් මාලාවන් පිළිබඳ දැනුවත් කිරීම.
- වගා කිරීමේදී මුහුණපාන ගැටළු පිළිබඳව දැනුවත්කිරීම සහ මෙම ගැටළු සඳහා ඵලදායී විසඳුම් ලබාදීම.
- කෘෂිකර්මාන්තය යනු ලාභදායී ආදායම් උත්පාදන මාර්ගයන් බව පිළිබඳව ගොවීන් අතර රුචිකත්වයක් ඇති කිරීම.
- ගොවීන් අතර කෘෂිකර්මාන්තය පිළිබඳව ධනාත්මක ආකල්ප ඇති කිරීම.
- විවිධ කෘෂිකාර්මික පිළිවෙත් මාලා හා සම්බන්ධ පාරිසරික සහ වෙනත් අහිතකර උපද්‍රව සහිත ප්‍රතිඵලයන් පිළිබඳව ගොවි ප්‍රජාව දැනුවත් කිරීම.
- කෘෂිකර්මාන්තය හා සම්බන්ධ අදාල බලධාරීන් විසින් හඳුන්වා දෙනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් පිළිබඳව ගොවීන්ගේ දර්ශනය සහ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබාදීම.
- රටෙහි ආහාර සුරක්ෂිතබව, පෝෂණ සහ රසායන ද්‍රව්‍ය වලින් තොර ආහාර ද්‍රව්‍ය ලබාගැනීම උදෙසා නිවෙස් වල ගෙවතු වගාව ප්‍රවර්ධනය.
- රටේ තරුණ තරුණියන්ගේ ජීවිතය ගෙනයාම උදෙසා ජීවන වෘත්තියක් බවට කෘෂිකර්මාන්තය පත් කිරීම

ප්‍රධාන ගොවි විකාශන ඒකකය කොළඹ නාරාහේන්පිට පිහිටා ඇති අතර අනුරාධපුර, මහනුවර, මාතර උප ඒකක 3කි. විවිධ ගුවන්විදුලි නාලිකාවන් ඔස්සේ සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම මෙම සේවාව තුළින් ගුවන් විදුලි වැඩසටහන් විකාශය කෙරේ. " සිංහල ජාතික සේවයෙහි" "සන්ධ්‍යා සේවය" විශේෂ කාලයේදී බොහෝ ගුවන්විදුලි වැඩසටහන් විකාශය කිරීමට හැකිවිය.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සම්බන්ධීකරණය ඇතුව "තරුණ ගොවි සමාජ ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහන" පැවැත්වීම. "ගුවන් විදුලි ශ්‍රාවකයන්ගේ සමාජ" යන සංකල්පය හඳුනාවාදීම උදෙසා රටපුරා ගුවන් විදුලි ශ්‍රාවකයන් එක්රුස් කිරීම. ගුවන් විදුලි වාඩසටහන් ප්‍රචලිත කිරීම උදෙසා මෙම ශ්‍රාවකයින් හට පුහුණු වැඩසටහන්, වැඩමුළු දිරිමත් කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිචාර ලබාගැනීම.

2014 වර්ෂයේ සජීවී ගුවන් විදුලි නාලිකාවක් ආරම්භ කිරීමේ අරමුණු ඇතිව කෘෂි FM වෙබ් ගුවන් විදුලි (www.krushifm.lk) පරීක්ෂණ විකාශනයන් ලෙස දියත් කරනු ලැබීය.

## ප්‍රගතිය

**වගුව 3.2.7: 2013 වර්ෂයේ ශ්‍රවකයින්ගේ සමාජ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු**

| ඒකකය | පුහුණු හා වැඩමුළු සංඛ්‍යාව | |
|---|---|---|
| | ඉලක්කගත | ප්‍රගතිය |
| කොළඹ | 06 | 06 |
| මහනුවර | 06 | 17 |
| අනුරාධපුර | - | - |
| මාතර | 07 | 06 |

ගොවි විකාශන සේවාව මඟින් ඉටුකරනු ලැබූ වෙනත් කාර්යයන් පහත දැක්වේ.

ක්ෂේත්‍ර දින, පුහුණු සහ උත්සව වලදී මාධ්‍ය ආවරණය සහ නිවේදන - 08

කුටි/ ප්‍රදර්ශන - 05

ප්‍රදර්ශන වලදී මහජනතාවට ආමන්ත්‍රණ ක්‍රමය මෙහෙයවීම - 05

දුරකථන මාර්ගයෙන් නොමිලේ උපදේශක සේවා - 667

වගුව **3.2.8: 2013** වර්ෂයේ විකාශය කළ ගුවන් විදුලි වැඩසටහන්

| දිනය | වේලාව | ගුවන් විදුලි වැඩසටහන | විකාශන ආකාරය | නිෂ්පාදන ඒකකය | සංඛ්‍යාත |
|---|---|---|---|---|---|
| සඳුදා | පෙ.ව 9.00 - 10.00 | ගොවිතැනට පැයක් | සජීවි සාකච්ඡාව | කොළඹ | FM 91.7/91.9 |
| | ප.ව 6.45 - 7.00 | ගොවි ගෙදර | සඟරාමය වැඩසටහන | කොළඹ | FM 91.7/91.9* |
| | ප.ව 7.00 - 7.09 | රන්කෙත අද්දර | සඟරාමය වැඩසටහන | අනුරාධපුර | FM 91.7/91.9* |
| | ප.ව 7.10 - 7.16 | සන්නස | කාලීන කෘෂිකාර්මික තොරතුරු | මාතර | FM 91.7/91.9* |
| | ප.ව 7.16 - 7.30 | ගොවිසර | සඟරාමය වැඩසටහන | කොළඹ | FM 91.7/91.9* |
| බදාදා | ප.ව 6.45 - 7.00 | සාරභූමි | සඟරාමය වැඩසටහන | කොළඹ | FM 91.7/91.9* |
| | ප.ව 7.00 - 7.10 | සරුකෙත | සඟරාමය වැඩසටහන | අනුරාධපුර | FM 91.7/91.9* |
| | ප.ව 7.10 - 7.20 | ලියසරණිය | සඟරාමය වැඩසටහන | කොළඹ | FM 91.7/91.9* |
| | ප.ව 7.23 - 7.30 | තිරසාර | පාරිසරික හිතකර වගා පිළිවෙත් | මාතර | FM 91.7/91.9* |
| | ප.ව 7.00 -7.30 | Kurinchi Malahara | සඟරාමය වැඩසටහන | මහනුවර | FM 107.3/107.5 |
| බ්‍රහස්පතින්දා | පෙ.ව 8.30 - 9.00 | වයඹ ගෙවත්ත | සජීව වැඩසටහන | මහනුවර | FM 90.1 |
| | පෙ.ව 9.00 - 9.30 පසුගිය බ්‍රහස්පතින්දා පෙ.ව පෙ.ව 9.00 - 10.00 | රුහුණු ගෙවත්ත | සජීව වැඩසටහන | මාතර | FM 107.3/107.5 |
| | ප.ව. 6.35 - 7.30 | ගොවිජන මඩල | සජීව වැඩසටහන | මහනුවර | FM 91.7/91.9* |

| දිනය | වේලාව | ගුවන් විදුලි වැඩසටහන | විකාශන ආකාරය | නිෂ්පාදන ඒකකය | සංඛ්‍යාත |
|---|---|---|---|---|---|
| සිකුරාදා | පෙ.ව 7.00 - 8.00 | Vettu Thottam | සජීව සාකච්ඡාව | කොළඹ | FM 102.1/102.3 |
| | පෙ.ව 8.00 - 9.00 | අස්වැන්න | සජීව සාකච්ඡාව | මහනුවර | FM 107.3/107.5 |
| | ප.ව 7.00 - 7.15 | කෘෂි චාරිකා | සඟරාමය වැඩසටහන | මහනුවර | FM 91.7/91.9* |
| | ප.ව 7.15 - 7.30 | Laby Bird | නාට්‍ය | මාතර | FM 91.7/91.9 * |
| | ප.ව 7.00 - 7.15 | Muhaduhal | විචිත්‍රාංග | මහනුවර | FM 107.3/107.5 |
| සෙනසුරාදා | පෙ.ව 6.45 - 7.00 | කෘෂි චාරිකා | සඟරාමය වැඩසටහන | මහනුවර | FM 107.3/107.5 |
| | පෙ.ව 8.00 - 8.15 | ගොවිබිම | සඟරාමය වැඩසටහන | මහනුවර | FM 107.3/107.5 |
| | ප.ව 6.35 - 6.45 | සෙයිලම | පටිගත කළ වැඩසටහන | කොළඹ | FM 91.7/91.9* |
| | ප.ව 6.45 - 7.00 | කඳ මල්ල | සඟරාමය වැඩසටහන | මාතර | FM 91.7/91.9* |
| | ප.ව 7.00 - 7.30 | කොරටුව | සඟරාමය වැඩසටහන | කොළඹ | FM91.7/91.9* |
| | ප.ව 7.30 - 8.00 | Thunaththa | සාකච්ඡාව | අනුරාධපුර | FM 104.4/105.7 |
| | ප.ව 7.30 - 7.45 | Wanna Marudam | සඟරාමය වැඩසටහන | කොළඹ | FM 102.1/102.3 |
| | ප.ව 9.15 - 9.30 | Ulavav Illum | සඟරාමය වැඩසටහන | කොළඹ | FM 104.7/104.9 |
| ඉරිදා | පෙ.ව 9.45- 10.00 | බොරදිය මංකඩ | සඟරාමය වැඩසටහන | මහනුවර | FM 107.3/ 107.5 |

- සන්ධ්‍යා සේවය ඔස්සේ විකාශනය

**වගුව 3.2.9: 2013 වර්ෂයේ විකාශනය කළ ගුවන් විදුලි වැඩසටහන්**

| ඒකකය | ගුවන් විදුලි වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| කොළඹ | ගොවිතැනට පැයක් | 52 | 47 |
| | ගොවි ගෙදර | 52 | 48 |
| | ගොවිසර | 52 | 39 |
| | සාරභූමි | 49 | 44 |
| | කොරටුව | 52 | 50 |
| | සෙයිලම | 52 | 49 |

| ඒකකය | ගුවන් විදුලි වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| කොළඹ | ගොවිජන මඩල | 40 | 42 |
| | ලියසරණිය | 52 | 39 |
| | Vettu Thottam | 52 | 43 |
| | Ulavar Illum | 52 | 28 |
| | Wasanna Marudam | 52 | 41 |
| මහනුවර | අස්වැන්න | 52 | 48 |
| | ගොවිබිම | 52 | 51 |
| | කලවිට | 120 | 120 |
| | කෘෂි චාරිකා | 41 | 35 |
| | අත්තම | 120 | 120 |
| | Kurunchi Malahara | 52 | 52 |
| | Muhaduhal | 52 | 51 |
| | බොරදිය මංකඩ | 52 | 51 |
| | ගොවිජන මඩල | 04 | 03 |
| | වයඹ ගොවත්ත (පැය 1) | 12 | 10 |
| | වයඹ ගෙවත්ත (පැය 1/2 ) | 40 | 40 |
| | කෙටි පණිවිඩ | 1000 | 988 |
| අනුරාධපුර | කෙත්බිම | 52 | 50 |
| | රන්කෙත අද්දර | 43 | 40 |
| | තුනැත්ත | 52 | 48 |
| | ගොවිජන මඩල | 04 | 03 |
| මාතර | රුහුණු ගෙවත්ත | 50 | 50 |
| | රුහුණු බිමයි - ගොවිදැතයි | 26 | 22 |
| | අස්වැද්දුම | 77 | 77 |
| | සළුපලිය | 09 | 09 |
| | තිරසාර | 43 | 40 |
| | කදමල්ල | 51 | 50 |
| | හතදිය | 07 | 07 |
| | සන්නස | 42 | 40 |
| | ගොවිදැතට අපේ සවිය | 504 | 504 |
| | Laby Bird | 42 | 38 |

## කෘෂි තාක්ෂණ උද්‍යානය බටඅත

කෘෂිකර්ම ක්ෂේත්‍රය, ගොවීන්, විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ව්‍යවසායකයින් යන කෘෂි ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නා වූ පාර්ශ්වයන්ගේ හැකියා වර්ධන මෙම උද්‍යානයෙහි ප්‍රධාන අරමුණු වේ. පෘථුල ප්‍රායෝගික දැනුමක් ලබාගන්නා අතරම කෘෂි විද්‍යාල පිළිබඳ අධ්‍යයනය කිරිමට අවස්ථාවක් ලබාදෙමින් පාසල් සිසුන් මෙහි ප්‍රධාන ඉලක්කගත කණ්ඩායමයි.

කෘෂි විද්‍යාව ඉගෙනුම උදෙසා ගොවීන්, පාසල් සිසුන් සහ සාමාන්‍ය මහජනයා හට මෙම උද්‍යානය පරාදීසයක් වනවා පමණක් නොව කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයද මෙම උද්‍යානයෙහි තවත් අරමුණකි. ශ්‍රී ලංකාව නැරඹීමට පැමිණීම දිරිමත් කිරීම මෙහි මුලිකම අරමුණ වන අතර මෙය ඓතිහාසික ස්ථාන, වන ජීවී, වෙරලබඩ ප්‍රදේශයන්ට අමතරව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය පිළිබඳ නව සංකල්පයකි.

එමනිසා බටඅත යනු කෘෂිකර්මාන්තය පිළිබඳ උනන්දුවක් දක්වන්නා වූ පුද්ගලයන්හට පරාදිසියකි. මනස්කාන්ත දර්ශනයන්ගෙන් සිත් වසඟකරවන සුළු මෙම උද්‍යානය ගිමන් නිවීම සඳහා බංකු සහිත ආවරණය කළ ස්ථාන, දර්ශන පතයට හසුවන්නා වූ ඇළ, කුඹුරු බහුල වශයෙන් දක්නට ලැබේ.

උද්‍යානය සතුව විශාල එළවළු පැළ සංඛ්‍යාවක් ඇත. සජීවී කෘෂි ජෛව විවිධත්වයකින් යුක්තය. සෞන්දර්යයෙන් පිරිපුන් මනස්කාන්ත පරිසරයක පිහිටි සජීවි කෘෂි බෝග කෞතුකාගාරයකි. මැත කාලීන වශයෙන් යෝග්‍ය ගෙවතු අලංකරණයකින් යුක්තය. පාර දෙපැත්තෙහි වියලි කලාපීය පාරිසරික තත්ත්වයන්ට යෝග්‍ය ගෙවතු අලංකරණයෙන් සමන්විතය. පාර දෙපැත්තෙහි ඩ්‍රැගන් ෆෘට්, බඩවැටි තීරු දෙකක් සේ වගා කර තිබේ. පතොක් කුලයට අයිති මෙම ඩ්‍රැගන් ෆෘට් ශාකය වියළි කලාපයට වඩාත් ඔරොත්තු දේ. මෙම පලතුරු ආහාරයට ගත හැකි අතර (ශ්‍රී ලංකාවේ අගය වැඩි බෝග පිළිබඳව පණිවිඩයක් ලබාදෙමින්) ඉතාමත් මිල අධික පලතුරකි.

මෙම ගෙවත්තෙහි අනෙක් වැදගත් කරුණ වන්නේ කෘෂිකාර්මික අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීමයි. ලෝකයේ සාමාන්‍ය ගෙවතු සහ උද්‍යාන මෙන් නොව නරඹන්නන් සඳහා මාර්ගෝපදේශ ලබාදීම උදෙසා 15 දෙනෙකු උද්‍යාන තුළ සේවයෙහි යෙදවා ඇත. මෙම මාර්ගෝපදේශක සේවාව තුළින් ( මෙම සේවාව ලබා දෙනු ලබන්නේ කෘෂිකර්ම ඩිප්ලෝමාධාරීන් පිරිසකි) ගොවීන්, පාසල් සිසුන් සහ වෙනත් සාමාන්‍ය මහජනතාව වෙත උද්‍යානයේ එක් එක් අංශයන් පිළිබඳ දැනුම දෙනු ලබයි.

මෙයට අමතරව සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ස්වයං අවබෝධය ලැබෙන පරිදි උපදේශාත්මක තාක්ෂණික නාමපුවරු සවිකර තිබීමයි.

### ප්‍රගතිය

**වගුව 3.2.10: 2013 වර්ෂයේ මූල්‍යමය ප්‍රගතිය**

| විස්තරය | ආදායම (රු.) |
|---|---|
| පාසල් සිසුන් | 69,705.00 |
| වෙනත් සිසුන් | 34,180.00 |
| වැඩිහිටි | 426,820.00 |
| සංචාරක ළමුන් | 600.00 |
| වැඩිහිටි සංචාරකයින් | 26,800.00 |
| රථගාල ගාස්තු | 47,880.00 |
| ශ්‍රවණාගාරය | 3000.00 |
| ගොවි නිෂ්පාදන | 168,360.00 |
| **එකතුව** | **777,345.00** |

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ | 02 |
| කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂ | 03 |
| විෂයානුගත විශේෂඥ | 01 |
| කෘෂිකර්ම නිලධාරී | 08 |
| කථිකාචාර්ය | 02 |
| සංවර්ධන නිලධාරි | 14 |
| තොරතුරු තාක්ෂණ නිලධාරි | 01 |
| වැඩසටහන් සහකාර | 03 |
| මාධ්‍ය සහකාර | 03 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර | 03 |
| චිත්‍ර ශිල්පි | 02 |
| කෘෂිකර්ම උපදේශක | 46 |
| රාජ්‍ය කළමනාකරන සහකාර | 14 |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික | 01 |
| ඡායාරූප ශිල්පී | 02 |
| පොත් බඳින්නා | 01 |
| යන්ත්‍ර පරිචාරක | 04 |
| අකුරු අමුණන්නා | 02 |
| ගොවිපල් ලිපිකරු | 02 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 17 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| වීඩියෝ ඡායාරූප ශිල්පී | 01 |
| වීඩියෝ ඡායාරූප සංස්කරණ සහායක | 01 |
| වීඩියෝ ආලෝකකරණ සහායක | 01 |
| වීඩියෝ සහායක | 01 |

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ශබ්ද පටිගතකරු | 02 |
| ප්‍රදර්ශන සහායක | 01 |
| ගබඩාකරු | 04 |
| මුරකරු | 30 |
| ලොරි සහායක | 01 |
| වඩුකරු | 01 |
| පැස්සුම්කරු | 01 |
| විදුලි ශිල්පී | 01 |
| විදුලි ශිල්පී සහායක | 01 |
| කාර්මික ශිල්පී | 02 |
| යාන්ත්‍රික ශිල්පී | 01 |
| පින්තාරුකරු | 01 |
| කම්කරු (ස්ථිර) | 19 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 191 |
| **එකතුව** | **399** |

# 4.1 පාලන අංශය

පාලන අංශයේ කාර්යභාරය කෘෂිකර්ම දෙපාර්තමේන්තු අනුයුක්ත නිලධාරීන් හා සම්බන්ධ විවිධ ආයතනික කටයුතු ඉටු කිරීමයි. තනතුරු පුරප්පාඩු පිරවීම පිණිස අනුමැතිය ලබා ගැනීම විශේෂිත නිර්ණායක ප්‍රකාරව අයදුම්පත් කැඳවීම, අදාළ ලිඛිත විභාග හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, පත්වීම සඳහා වඩාත්ම සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීම, බඳවා ගැනීම සහ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් හා විනය කරුණු ආදියට අදාළ සියලුම අංශ සම්බන්ධයෙන් පෞද්ගලික ලිපිගොනු හරහා කටයුතු කිරීම වැනි රජයේ නිලධාරින් පිළිබඳ ආයතනික කරුණුවලට අදාළ විවිධ කාර්යයන් ඉටු කිරීම මෙන්ම රජයේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම වශයෙන් මෙම කටයුතු විවිධ වේ. මෙම අංශය විවිධ අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තු උපදේශක කමිටුව හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස් කාර්යාලය සමග මෙන්ම පරිපාලනමය කරුණු සම්බන්ධයෙන් අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමගද කටයුතු කරයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ මග පෙන්වීම හා උපදෙස් අනුව මෙම සමස්ත ක්‍රියාදාමය සම්බන්ධීකරණය කිරීමේ වගකීමද මෙම අංශයට පැවරී ඇත.

## අයවැය

**වගු අංක : 4.1.1 වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 11,149,004 | 10,137,338 | 91 |
| පුනරාවර්තන | 17,830,567 | 15,995,518 | 90 |
| **එකතුව** | **28,979,571** | **261,132,856** | **91** |

## ප්‍රගතිය

### පත් කිරීම්

කෘෂිකර්ම දෙපාර්තමේන්තු ඉතිහාසයේ වසරක් තුළ සිදු කළ වැඩිම බඳවා ගැනීම් සංඛ්‍යාව 2013 වර්ෂයේදී සිදු කෙරිණි. එය වසර ගණනක් පුරා පැවති දැඩි කාර්ය මණ්ඩල හිඟය සැලකිය යුතු අයුරින් මග හරවාලීමට සමත් විය. සිදු කරන ලද බඳවා ගැනීම් පිළිබඳ විස්තර වගු අංක 4.1.2හි දැක්වේ.

**වගු අංක 4.1.2: 2013 වර්ෂයේදී සිදු කරන ලද පත්කිරීම්**

| තනතුර | පත් කිරීම් සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 91 |
| පර්යේෂණ නිලධාරි | 17 |
| කථිකාචාර්ය | 11 |

| තනතුර | පත් කිරීම් සංඛ්‍යාව |
|---|---|
| කෘෂි ආර්ථික විද්‍යාඥ | 03 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 07 |
| රියදුරු | 100 |
| කාර්මික ශිල්පී | 19 |
| යන්ත්‍ර ශිල්පී | 09 |
| වීඩියෝ සංස්කාරක | 02 |
| යාන්ත්‍රික ශිල්පී | 12 |
| යන්ත්‍ර පරිචාරක | 01 |
| ශ්‍රව්‍ය පටිගත කිරීම් ශිල්පී | 02 |
| වීඩියෝ / ඡායාරූප ශිල්පී සහායක | 02 |
| වෙටර් | 04 |
| ආදර්ශන සහායක | 02 |
| වීඩියෝ සහායක | 02 |
| වීඩියෝ සංස්කරණ සහායක | 02 |
| වීඩියෝ ආලෝකකරණ/ ඉලෙක්ට්‍රිකල් සහායක | 04 |
| මී මැසි පාලක | 07 |
| අරක්කැමි | 13 |
| මුරකරු | 29 |
| බද්ධකරු | 02 |
| තාක්ෂණික සහකාර | 89 |
| පර්යේෂණ උප සහකාර | 13 |
| පර්යේෂණ සහකාර | 01 |
| ගොවිපළ ලිපිකරු | 46 |
| **ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරන ලද පත් කිරීම්** | |
| සංවර්ධන සහකාර | 209 |
| **එකතුව** | **858** |

## උසස් කිරීම්

**වගු අංක 4.1.3: 2013 වර්ෂයේදී සිදු කරන ලද උසස් කිරීම්**

| තනතුර | උසස් කිරීම් සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය II/I | 03 |
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය, I වන පංතිය | 04 |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ), I/ II | 18 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 03 |
| **ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරන ලද උසස් කිරීම්** | |
| රියදුරු II අ/1 | 10 |

## ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කිරීම

කම්කරු 200

## සේවයෙන් විශ්‍රාම ගැනීම

**වගු අංක 4.1.4: 2013 වර්ෂයේදී සිදු වූ විශ්‍රාම ගැනීම්**

| තනතුර | විශ්‍රාම ගැනීම් සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 14 |
| ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය | 01 |
| කෘෂිකර්ම උපදේශක | 27 |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ) | 03 |

| තනතුර | විශ්‍රාම ගැනීම් සංඛ්‍යාව |
|---|---|
| පර්යේෂණ නිලධාරි | 12 |
| පර්යේෂණ සහකාර | 04 |
| පර්යේෂණ සහකාර (විශේෂ) | 01 |
| පර්යේෂණ උප සහකාර | 05 |
| අකුරු අමුණන්නා | 01 |
| කථිකාචාර්ය | 03 |
| විෂයානුගත විශේෂඥ | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අධි ශ්‍රේණිය) | 01 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 27 |
| ගොවිපළ ලිපිකරු | 01 |
| රියදුරු | 08 |
| විදුලි ශිල්පී | 01 |
| ගබඩාකරු | 01 |
| යන්ත්‍ර ශිල්පී | 01 |
| පැස්සුම්කරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| යාන්ත්‍රික ශිල්පී | 01 |
| යාන්ත්‍රාගාර ක්‍රියාකරු | 02 |
| පෙදරේරු | 01 |
| වැද්දුම්කරු | 01 |
| වඩු කාර්මික | 01 |
| විශේෂ ගබඩා කම්කරු | 02 |
| මුරකරු | 15 |
| කම්කරු | 66 |
| සනීපාරක්ෂක කම්කරු | 05 |
| ස්ටුවර්ඩ් | 01 |

| තනතුර | විශ්‍රාම ගැනීම් සංඛ්‍යාව |
|---|---|
| අරක්කැමි | 01 |
| බද්ධකරු | 01 |
| විශේෂ කම්කරු | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 |

## සේවයේ සිටියදී මියයාම

**වගු අංක 4.1.5: 2013 වර්ෂයේදී සේවයේ යෙදී සිටියදී මියයාම**

| තනතුර | මියගිය සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකර්ම උපදේශක | 01 |
| පර්යේෂණ සහකාර | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| බද්ධකරු | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 |

## වෙනත් තනතුරුවලට නිදහස් කිරීම

| | |
|---|---|
| කෘෂිකර්ම නිලධාරි | 01 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 02 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| මුරකරු | 03 |

### සේවය අත්හැර යාම

| | |
|---|---|
| සංචාරක බංගලා භාරකරු | 02 |
| මුරකරු | 22 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 01 |

**සේවයෙන් ඉල්ලා අස්වීම**

| | |
|---|---|
| කෘෂිකර්ම උපදේශක | 23 |
| පර්යේෂණ සහකාර | 14 |
| ගොවිපළ යාන්ත්‍රික උපදේශක | 02 |

**පළාත් සභාවලට නිදහස් කිරීම**

| | |
|---|---|
| කෘෂිකර්ම උපදේශක | 07 |
| පර්යේෂණ සහකාර | 03 |
| වැඩ පරීක්ෂක | 01 |
| වැඩසටහන් සහකාර | 01 |

**විනය පරීක්ෂණ**

වගු අංක **4.1.6: 2013** වර්ෂයේදී පැවති විනය පරීක්ෂණ

| කාණ්ඩය | **2013** වර්ෂය ආරම්භ වනවිට පැවති විනය පරීක්ෂණ සංඛ්‍යාව | **2013** වර්ෂයේදී ආරම්භ කරන ලද විනය පරීක්ෂණ සංඛ්‍යාව | **2013** වර්ෂයේදී නිම කරන ලද විනය පරීක්ෂණ සංඛ්‍යාව | **2013.12.31** දිනට අවසන් නොවී පැවති විනය පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධිමත් විනය පරීක්ෂණ : | 38 | 38 | 25 | 41 |
| මූලික විමර්ශන රජයේ/අභ්‍යන්තර | 19 | 13 | 08 | 24 |
| විගණන පෙත්සම් පරීක්ෂණ | 43 | 50 | 14 | 79 |
| එකතුව | **100** | **91** | **47** | **144** |

වගු අංක **4.1.7:** මුදල් රෙගුලාසි **104** යටතේ සිදු කරන පරීක්ෂණ

| **2013** වර්ෂය ආරම්භයේදී පැවති පරීක්ෂණ සංඛ්‍යාව | **2013** වර්ෂයේදී ආරම්භ කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | **2013** වර්ෂයේදී නිම කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | **2013.12.31** දිනට අවසන් නොවී පැවති පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|
| 486 | 185 | 135 | 536 |

## ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය සහ වැටුප් අත්තිකාරම් වර්ග

**වගු අංක 4.1.8: ණය මුදල් සහ වැටුප් අත්තිකාරම් පිළිබඳ විස්තර**

| ණය වර්ගය | අනුමත කළ චවුචර් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| ආපදා ණය | 1128 | 124,138,283 |
| බයිසිකල් ණය | 31 | 186,000 |
| දේපළ ණය | 65 | 76,052,260 |

## අග්‍රහාර රක්ෂණ ක්‍රමය

- රෝහල් ගාස්තු සහ ඇස් කණ්ණාඩි වෙනුවෙන් ප්‍රතිපූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කළ අයදුම් පත්‍ර සංඛ්‍යාව - 1050
- බිල්වල වටිනාකම - රු. 11,045,423
- ඉදිරිපත් කරන ලද හදිසි අනතුරු හිමිකම් පෑම් සංඛ්‍යාව - අයදුම් පත්‍ර 06 (නිර්දේශ කර ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙත ඉදිරිපත් කරන ලදී.)
- ඉදිරිපත් කරන ලද ස්වාභාවික මරණ සඳහා හිමිකම් පෑම් සංඛ්‍යාව - 12
- ස්වාභාවික මරණ සඳහා හිමිකම්පෑම්වල වටිනාකම - රු. 1,200,000

## ඇප තැන්පත්

- විශ්‍රාම ගැනීමෙන් පසු ඇප තැන්පතු නිදහස් කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව - 100
- නිදහස් කරන ලද ඇප තැන්පතු වටිනාකම - රු. 2,796,073.80
- රජයේ ගිණුමට බැර කරන ලද මුදල - රු. 4,822,713.85

## විශ්‍රාම ගැනීම

විශ්‍රාම වැටුප් ශාඛාවට ලැබුණු ලිපිගොනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

- විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා - 235
- මරණ පාරිතෝෂිකය සඳහා - 11
- පාරිතෝෂික ගෙවීම් සඳහා - 29
- විශ්‍රාම වැටුප් පරිවර්තනය සඳහා - 50
- බාල වයස්කාර ලදුපත් මුදා හැරීම - 07

## පශ්චාත් උපාධි හැදෑරීම සඳහා විදේශ ගත වූ නිලධාරීන් සංඛ්‍යාව

ආචාර්ය උපාධිය :

පර්යේෂණ නිලධාරි - 01

## පශ්චාත් උපාධි නිමකර යළි මෙරටට පැමිණි නිලධාරීන් සංඛ්‍යාව

විද්‍යාපති උපාධිය :

නියෝජ්‍ය අධ්‍යක්ෂ - 01

දර්ශනපති උපාධිය :

පර්යේෂණ නිලධාරි - 01

දර්ශන විශාරද උපාධිය :

නියෝජ්‍ය අධ්‍යක්ෂ - 01
පර්යේෂණ නිලධාරි - 03

## මෙරට තුළ අධ්‍යානය කටයුතු සඳහා නිදහස් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව

දර්ශන විශාරද උපාධිය :

කෘෂිකර්ම නිලධාරි - 08

දර්ශනපති උපාධිය:

පර්යේෂණ නිලධාරි - 09

විද්‍යාපති උපාධිය :

ගණකාධිකාරි - 01
යාන්ත්‍රික ඉංජිනේරු - 01
පර්යේෂණ නිලධාරි - 02
කෘෂිකර්ම නිලධාරි - 01
කථිකාචාර්ය - 03

ව්‍යාපාර පරිපාලනපති උපාධිය :

ගණකාධිකාරි - 01

විද්‍යාවේදී උපාධිය :

කෘෂිකර්ම උපදේශක - 10

ඩිප්ලෝමා පාඨමාලා:

පරිපාලන නිලධාරි - 02
ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති - 01

## මෙරටදී අධ්‍යයන කටයුතු නිම කළ නිලධාරීන් සංඛ්‍යාව

විද්‍යාපති උපාධිය :

නියෝජ්‍ය අධ්‍යක්ෂ - 01
කථිකාචාර්ය - 01

විද්‍යාවේදී උපාධිය :

කෘෂිකර්ම උපදේශක - 11

## පුහුණු, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා විදේශගත වීම්

**වගු අංක 4.1.9: 2013 වර්ෂයේ විදේශ ගතවීම්**

| තනතුර | විදේශ ගත වීම් සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | 03 |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | 02 |
| අධ්‍යක්ෂවරුන් | 18 |
| ප්‍රධාන ඉංජිනේරු | 02 |
| ප්‍රධාන ගණකාධිකාරි | 01 |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් | 04 |
| පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් | 02 |
| ගණකාධිකාරිවරුන් | 06 |
| අතිරේක අධ්‍යක්ෂවරුන් | 17 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් | 25 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් | 05 |
| ඒකක ප්‍රධානි | 01 |
| ඉංජිනේරුවරුන් | 05 |
| පර්යේෂණ නිලධාරීන් | 58 |
| කෘෂි ආර්ථික විද්‍යාඥයින් | 06 |
| කථිකාචාර්යවරුන් | 02 |
| කෘෂිකර්ම නිලධාරින් | 04 |
| පරිපාලන නිලධාරින් | 01 |
| කෘෂිකර්ම උපදේශක | 43 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරින් | 02 |
| වැඩසටහන් සහකාරවරුන් | 02 |
| පර්යේෂණ සහකාරවරුන් | 02 |
| අයවැය සහකාර | 01 |
| මූල්‍ය සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| ගොවිපළ යාන්ත්‍රික උපදේශක | 01 |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාරවරුන් | 02 |
| විදුලි ශිල්පී | 01 |
| සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| කම්කරු | 02 |

## මෙරට පුහුණුව

**වගු අංක 4.1.10: 2013 වර්ෂයේ පවත්වන ලද දේශීය පුහුණු**

| වසර තුළ සංවිධානය කරන ලද පුහුණු | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ගබඩා කටයුතු පිළිබඳ පුහුණුව (ගබඩා රාජකාරි කටයුතුවල නිරත නිලධාරින් සඳහා) | 46 |
| විනයානුකූල පියවර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සඳහා පුහුණුව | 117 |
| රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සඳහා විශ්‍රාම වැටුප් ලිපිගොනු යාවත්කාලීන කිරීම පිළිබඳ වැඩමුළුව | 137 |
| රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සඳහා මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂණ සිදු කිරීම පිළිබඳ පුහුණුව | 134 |
| රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සඳහා දත්ත මූල විශ්ලේෂණ පාඨමාලාව (පියවර 4කින් යුතු) | 80 |

## මෙරට පැවති සම්මන්ත්‍රණවලට සහභාගි වූ නිලධාරීන්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද පුහුණු

- මාණ්ඩලික නොවන නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව - 783
- පුහුණු සඳහා සහභාගි වූ මාණ්ලික නොවන නිලධාරීන් සංඛ්‍යාව - 10
- මාණ්ඩලික නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව - 25
- පුහුණු සඳහා සහභාගි වූ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව - 10

## අයකර ගැනීම්

- මේ වනවිටත් සේවයේ සිටින ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් 2013 වර්ෂයේදී රජයට අය කර ගන්නා ලද මුළු මුදල - රු. 145,289.40
- සේවය අත්හැර ගොස් සිටින ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් රජයට අයකර ගන්නා ලද මුළු මුදල - රු. 2,062,664.44

## කාර්ය මණ්ඩලය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| අධ්‍යක්ෂ (පාලන) | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | 01 |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | 02 |
| පරිපාලන නිලධාරි | 06 |
| භාෂා පරිවර්තක | 03 |
| නීති සහකාර | 02 |
| සංවර්ධන නිලධාරී | 17 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 86 |
| කාර්යාල කාර්ය සහායක | 21 |
| රියදුරු | 08 |
| මුරකරු | 06 |
| සනීපාරක්ෂක කම්කරු | 02 |
| නුපුහුණු කම්කරු | 20 |
| එකතුව | 177 |

# 4.2 ඉංජිනේරු අංශය - පේරාදෙණිය

ඉංජිනේරු අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය උසස් තත්ත්වයේ යටිතල පහසුකම් කඩිනමින් සැපයීමයි. ඉංජිනේරු අංශයට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන් සපුරාලීමේ පහසුව සඳහා මහ ඉලුප්පල්ලමේ ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය සහ ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපළවල් 4ක් පිහිටුවා ඇත.

මෙම අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන අයුරින් වර්ගීකරණය කළ හැකිය.

- මූලධන වත්කම් ප්‍රසම්පාදනය :
  - සිවිල් ඉංජිනේරු කාර්යයන්
  - යන්ත්‍ර සූත්‍ර, වාහන සහ කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය
- යටිතල පහසුකම් නඩත්තු කිරීම
  - ගොඩනැගිලි නඩත්තු කිරීම
  - වාහන සහ යන්ත්‍ර සූත්‍ර
  - කාර්යාලීය උපකරණ
- ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියළුම අංශ සඳහා ඉංජිනේරු උපදේශක සේවා සැපයීම
- කුණ්ඩසාලේ පිහිටි පානීය ජල සැපයුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- ගරාජ, සේවා ස්ථාන සහ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් සකස් කිරීම.

ඉංජිනේරු අංශය විසින් ඉටු කරන සේවා වැඩිදියුණු කර ව්‍යාප්ත කිරීම පිණිස ස්ථාන 4ක (කුණ්ඩසාලේ, සීතා එළිය, පොළොන්නරුව සහ අඟුණකොළපැලැස්ස) ප්‍රාදේශීය යාන්ත්‍රික වැඩපොළ පිහිටුවා ඇත. මෙම වැඩපොළ මගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් වනුයේ වාහන අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීමයි. එයට අමතරව, ප්‍රදේශයේ සිවිල් ඉංජිනේරුමය අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කාර්යක්ෂමව කටයුතු කිරීම පිණිස වැඩ පරීක්ෂකවරු ප්‍රාදේශීය කාර්යාල 3කට යොදවා ඇත.

## අයවැය

2013 වර්ෂයේ විවිධ වැය ශීර්ෂ යටතේ ලද අයවැය ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 4.2.1 හි දැක්වේ.

**වගු අංක 4.2.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 4,221,000 | 3,366,951 | 80 |
| පුනරාවර්තන | 10,243,180 | 9,576,077 | 93 |
| **එකතුව** | **14,464,180** | **12,943,028** | **89** |

## ප්‍රගතිය

ඉටු කරන කාර්යයන් පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

- මෙම අංශය විසින් සිදු කළ නව ඉදිකිරීම් සහ අළුත් වැඩියා කටයුතු - ඇස්තමේන්තු පිළියෙළ කිරීම, ටෙන්ඩර් කළමනාකරණය සහ

කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම, වැඩකටයුතු අධීක්ෂණය සහ ගෙවීම් අනුමත කිරීම මෙයට ඇතුළත් වේ.

- විශේෂයෙන්ම කාර්ය මණ්ඩල හිඟය ඇතුළු මානව සම්පත් සම්බන්ධයෙන් පවතින සීමාවන් හේතුවෙන් අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලීම මත පමණක් මෙම අංශය විසින් ඇස්තමේන්තු සකස් කරන ලදි.

2013 වර්ෂයේදී සිවිල් ඉංජිනේරු අංශය විසින් ඉටු කරන ලද සිවිල් ඉංජිනේරු කාර්යයන් පිළිබඳ සාරාංශය වගු අංක 4.2.2 හි දැක්වේ.

**වගු අංක 4.2.2: 2013 වසරේ ඉටු කරන ලද සිවිල් ඉංජිනේරු කාර්යයන්හි සාරාංශය**

| කාර්යය | ලද ඉල්ලීම් සංඛ්‍යාව | ඉටු කරන ලද කාර්යයන් |
|---|---|---|
| නව ඉදිරිකිරීම් | 147 | |
| අළුත් වැඩියා කිරීම් | 302 | |
| යවන ලද ඇස්තමේන්තු | | 233 |
| ටෙන්ඩර් කැඳවීම් | | 0 |
| සුළු අළුත්වැඩියා | | 250 |
| සකස් කළ ඇස්තමේන්තු | | 339 |

**වගු අංක 4.2.3: වසර තුළ ඉටු කරන ලද සිවිල් ඉංජිනේරු කාර්යයන්හි වටිනාකම (අංශ අනුව සාරාංශය)**

| අංශය/විස්තරය | ඉටු කරන ලද කාර්යයන් සංඛ්‍යාව | ලබා දුන් මුදල (රු.) |
|---|---|---|
| පාලන | 07 | 6,430,639.10 |
| මුදල් | 02 | 540,883.00 |
| වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 01 | 757,150.00 |
| බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ සේවය | 13 | 4,825,395.50 |
| ව්‍යාප්ති හා පුහුණු | 14 | 19,246,734.00 |
| සමාජ ආර්ථික හා සැලසුම් | 04 | 1,295,310.00 |
| උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 08 | 7,957,165.63 |
| බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය | 25 | 27,148,389.95 |
| ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය | 02 | 2,564,834.41 |
| ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 01 | 875,532.00 |

| අංශය/විස්තරය | ඉටු කරන ලද කාර්යයන් සංඛ්‍යාව | ලබා දුන් මුදල (රු.) |
|---|---|---|
| ඉංජිනේරු | 07 | 5,684,840.10 |
| පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | 03 | 1,472,175.00 |
| තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය | - | 0.00 |
| **එකතුව** | **87** | **78,826,048.69** |

## යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරු වැඩ කටයුතු වල ප්‍රගතිය

2013 වසරේදී සිදු කරන ලද කාර්යයන් පහත දැක්වේ.

- කාර්යය සම්පාදනය

- ගරාජ සහ සේවා ස්ථාන ලියාපදිංචි කිරීම
- සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

- **2013 වසරේදී සිදු කරන ලද වාහන අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම්**

ඉංජිනේරු අංශයේ විවිධ අංශ මගින් ඉටු කරන ලද කාර්යයන්හි සාරාංශය වගු අංක 4.2.3හි දැක්වේ.

වගු අංක **4.2.3:** වාහන අළුත් වැඩියා කිරීම් සහ නිර්දේශ ලබාදීම

| ස්ථානය | විශාල අළුත් වැඩියා කිරීම් | සුළු අළුත් වැඩියා කිරීම් | නිර්දේශ කිරීම | කෙරීගෙන යන කාර්යයන් | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 30 | 421 | 451 | 03 | 905 |
| කුණ්ඩසාලේ | 06 | 90 | 08 | - | 104 |
| පොළොන්නරුව | 03 | 59 | 88 | - | 150 |
| අඟුණකොළපැලැස්ස | 13 | 130 | 170 | - | 313 |
| සීතා එළිය | 15 | 139 | 140 | 01 | 295 |
| **එකතුව** | **67** | **839** | **857** | **04** | **1767** |

## යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ප්‍රසම්පාදනය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අංශ සඳහා ඉංජිනේරු අංශය මගින් ප්‍රසම්පාදනය කළ භාණ්ඩවල මුළු වටිනාකම වගු අංක 4.2.4හි දැක්වේ.

**වගු අංක 4.2.4: 2013 වසරේ ඉංජිනේරු අංශය මගින් ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩවල වටිනාකම**

| අංශය | එකතුව (රු.) |
|---|---:|
| ඉංජිනේරු අංශය | 741,202 |
| පාලන අංශය | 924,472 |
| මුදල් අංශය | 1,433,616 |
| ව්‍යාප්ති හා පුහුණු අංශය | 4,649,789 |
| සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය | 363,310 |
| බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය | 16,673,949 |
| ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය | 1,439,712 |
| උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය | 3,692,412 |
| බීජ සහතික කිරීමේ සහ පැළෑටි ආරක්ෂණ මධ්‍යස්ථානය | 1,285,488 |
| ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය | 7,462,942 |
| වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය | 3,392,826 |
| ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය | 232,072 |
| තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය | 850,894 |
| කෘෂිකර්ම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 510,489 |
| ASDA කාර්යාලය | 174,302 |
| ජාතික පැළෑටි නිරෝධායන සේවය | 343,288 |
| ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | 3,327,130 |
| **එකතුව** | **39,553,879** |

**වගු අංක 4.2.5: 2013 වසරේදී මිළදී ගන්නා ලද අයිතම ප්‍රමාණය**

| අයිතමය | ප්‍රමාණය |
|---|---|
| ඩෙස්ක්ටොප් පරිගණක | 47 |
| ලැප්ටොප් පරිගණක | 33 |
| ලේසර් ප්‍රින්ටර් | 50 |
| ඩොට් මැට්‍රික්ස් ප්‍රින්ටර් | 04 |
| අළුත් වැඩියා කළ පරිගණක | 74 |
| ඩිජිටල් ෆෝටෝකොපි මැෂින් | 20 |
| යූපීඑස් (UPS) | 145 |
| ඩිජිටල් කැමරා | 52 |

| අයිතමය | ප්‍රමාණය |
|---|---|
| රයිඩර් | 05 |
| රොටවේටර් | 09 |
| ඇඟිලි සලකුණු යන්ත්‍ර | 15 |
| දම්වැල් කියත් (Chain saw) | 33 |
| පෝර්ටබල් PA සිස්ටම් | 01 |
| නැප්සැක් ඉසින | 121 |
| පෝරු (Harrow) | 02 |
| කුඩා කල්ටිවේටර් | 04 |
| මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් | 16 |
| ෆැක්ස් මැෂින් | 10 |
| ඩිජිටල් ඩුප්ලිකේටර් | 05 |
| තණ කොළ කපන යන්ත්‍ර | 24 |
| රෝද හතරේ ට්‍රැක්ටර් ඇඳුම් | 08 |
| ජල පොම්ප | 05 |
| ටැබ්ලට් PC | 03 |
| වර්ණ ලේසර් | 04 |
| දැති නගුල් | 05 |
| සීඩ් ෆර්ටිලයිසර් | 02 |
| **එකතුව** | **697** |

**වගු අංක 4.2.6: ඉංජිනේරු අංශය මගින් සිදු කරන ලද මූලධන කටයුතුවල වටිනාකම**

| කාර්යය | අගය (රු.) |
|---|---|
| සිවිල් ඉංජිනේරු ඉදිකිරීම | 78,826,049 |
| උපකරණ ප්‍රසම්පාදනය | 39,553,879 |
| ටයර් මිළදී ගැනීම | 223,200 |
| **එකතුව** | **118,379,927** |

## කුණ්ඩසාලේ පානීය ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමය දිනපතා මහවැලි නදියේ ජලය ගැලුම් 200,000ක් පමණ පොම්ප කරයි. ජල පොම්පාගාරය දිනකට පැය 18ක් ක්‍රියාත්මක වන අතර එහි බලශක්ති පරිභෝජනය කි.වො. 60ක් පමණ වේ.

මෙම ජලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින විවිධ ආයතන වලට මෙන්ම දෙපාර්තමේන්තුවට අයත් නොවන පරිශ්‍රවලටද සපයනු ලැබේ. වසර මුළුල්ලේම පානීය හා ගෘහස්ථ අවශ්‍යතා සඳහා ක්ලෝරීන් එක් කරන ලද ජලය සැපයෙන අතර නියං සමයේදී අවශ්‍යතාව අනුව කෘෂිකාර්මික ගොවිපළෙහි ඇති වැවටද ක්ලෝරීන් රහිත ජලය සපයනු ලැබේ.

## වෙනත් සේවා

ඉංජිනේරු අංශය ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, වැඩකටයුතු අධීක්ෂණය හා වාහන, උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු පරීක්ෂා කර බලා නිර්දේශ කිරීම මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන, මධ්‍යස්ථාන හා ඒකක ගණනාවකට සහාය ලබාදුණි. අබලි වාහන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ පරීක්ෂා කිරීමද තාක්ෂණික ඇගයීම් කටයුතු වලදී ක්‍රියාකාරීව නිරත වීම සහ ටෙන්ඩර් මණ්ඩල වලට උපදේශ සේවා සැපයීමද මෙම අංශය මගින් සිදු කෙරේ.

## ඉංජිනේරු අංශයේ කාර්ය මණ්ඩලය

මෙම අංශයේ පවතින පුහුණු තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් වැඩ ප්‍රමාණය, කාර්යක්ෂමතාව සහ කාර්ය සාධනය කෙරෙහි දැඩි බලපෑම් එල්ල විය. තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු රැසක් පවතින අතර මෙම ගැටළුව හේතුවෙන් සිවිල් ඉංජිනේරු වැඩ කටයුතු මෙන්ම කුණ්ඩසාලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වැනි නිතිපතා කෙරෙන කටයුතු ඉටු කිරීමේදීද විවිධාකාර දුෂ්කරතාවන්ට මුහුණ පෑමට

සිදුව ඇත. වර්තමානයේ, සිවිල් ඉංජිනේරු අංශයේ වැඩකටයුතු මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් වැඩ පරීක්ෂකවරුන්, ගොඩනැගිලි ඕවසියර්වරුන් සහ සැලසුම් ශිල්පීන් සංඛ්‍යාවක් නොමැත.

## කාර්ය මණ්ඩලය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු | 02 |
| සිවිල් ඉංජිනේරු | 02 |
| විදුලි ඉංජිනේරු | 01 |
| ඉංජිනේරු සහකාර | 08 |
| පරිපාලන නිලධාරි | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 13 |
| සංවර්ධන නිලධාරි | 05 |
| රියදුරු | 06 |
| කාර්මික ශිල්පි | 18 |
| විදුලි ශිල්පි | 03 |
| වඩු කාර්මික | 02 |
| පෙදරේරු | 02 |
| තාක්ෂණික ශිල්පි | 07 |
| යන්ත්‍ර ශිල්පි | 05 |
| ගබඩාකරු | 03 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| මුරකරු | 08 |
| කම්කරු | 10 |
| **එකතුව** | **99** |

# 4.2.1 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය - මහ ඉලුප්පල්ලම

ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මහ ඉලුප්පල්ලම කෘෂිකර්ම සංකීර්ණය තුළ පිහිටා ඇත. මෙම මධ්‍යස්ථානය පිහිටුවා ඇත්තේ නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීම හා කෘෂි නිෂ්පාදනවල තත්ත්වය, ඵලදායිතාව සහ පරිමාව වර්ධනය කර ගැනීම පිණිස ගොවිපළ යාන්ත්‍රීකරණ තාක්ෂණය හඳුන්වාදීමෙන් ශ්‍රී ලංකාව තුළ යෝග්‍ය ගොවිපළ යාන්ත්රීකරණයක් ප්‍රවර්ධනය කිරීමටය.

මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පවතින සමාජ ආර්ථික තත්ත්වයන්ට හා ක්ෂේත්‍ර තත්ත්වයන්ට ගැලපෙන ඵලදායී කෘෂිකර්ම යාන්ත්‍රීකරණ තාක්ෂණයන් හඳුන්වා දීමයි. මෙමගින් ඉටු කරන කාර්යයන් පහත දැක්වේ.

- ප්‍රමුඛතා හා සීමාකාරක අනුව, විවිධ වගා ක්‍රමවල යාන්ත්‍රීකරණ අවශ්‍යතා හඳුනා ගැනීම
- සාර්ථක වෙතැයි අපේක්ෂා කරන යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ඒවායේ නිර්මාණය, කාර්යයන්, ආරක්ෂිත බව හා සමාජ ආර්ථික සාධක පදනම් කර ගනිමින් තෝරා ගැනීම හා පරීක්ෂා කර බැලීම
- දේශීය තත්ත්වයන්ට සුදුසු කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර සහ උපකරණ නිර්මාණය, නවීකරණය හා අනුවර්තනය
- තෝරාගත් උපකරණ සඳහා තාක්ෂණික සැලසුම්, පරීක්ෂණ වාර්තා සහ උපදෙස් අත්පොත් සකස් කිරීම
- යෝග්‍ය කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණය දේශීය නිෂ්පාදකයින්ට ලබාදීම සහ ඔවුන්ගේ හැකියාවන් ඉහළ නැංවීම
- ගොවීන් සහ අනෙකුත් පරිශීලකයින් අතර කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය හා තාක්ෂණයන් ප්‍රචලිත කිරීම පිණිස කෘෂිකාර්මික ව්‍යාප්තියෙහි නිරත ආයතනවලට හා අනෙකුත් ආයතන වලට සහාය වීම

මෙම මධ්‍යස්ථානය අංශ 5කින් සමන්විතය. එනම්,

1. පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පරීක්ෂණ හා ඇගයීම් අංශය
3. කෘෂිකාර්මික හා කර්මාන්ත ව්‍යාප්ති අංශය
4. ගොවිපළ යන්ත්‍ර සූත්‍ර නඩත්තු හා අලුත්වැඩියා අංශය
5. පරිපාලන අංශය

## අයවැය

**2013** වර්ෂයේ සඳහා විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම වගු අංක **4.2.1.1**හි දැක්වේ.

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| පුනරාවර්තන | 8,160,371 | 7,703,659 | 94 |
| මූලධන | 3,616,000 | 3,537,021 | 98 |
| **එකතුව** | **11,776,371** | **11,240,680** | **95** |

## ප්‍රගතිය

### රෝද 4 ට්‍රැක්ටරයට ආඳන ලද පොහොර යොදන උපකරණ සහිත පැළ සිටුවනය

රෝද 4 ට්‍රැක්ටරයට ආඳන ලද පැළ සිටුවනයට පොහොර යොදන උපකරණයක් ද එක් කිරීම මඟින් බඩ ඉරිඟු වගාවේදී බීජ සිටුවීමට වැය වන කාලය, ඉන්ධන ප්‍රමාණය හා මිනිස් බල අවශ්‍යතාවය අඩුවේ. මෙය බඩඉරිඟු, සෝයා බෝංචි, මුං, උඳු සහ කව්පි වගාව සඳහා යොදා ගත හැකිය.

### රෝද 2 ට්‍රැක්ටර් රොටවේටරයට සම්බන්ධ කරන ලද බීජ වප්කරය - පැද යා නොහැකි මාදිළිය (Walking Type)

බීජ වැපිරීම හා බිම් සැකසීම එක්වරම සිදු කළ හැකි පරිදි රෝද 2 ට්‍රැක්ටර් රොටවේටරයට බීජ වප්කරයක් එක් කිරීම මඟින් ගොඩබිම් වගාව සඳහා වැයවන කාලය, ඉන්ධන හා මිනිස් බල අවශ්‍යතාව අඩුවේ.

### රෝද 2 ට්‍රැක්ටර් රොටවේටරයට සම්බන්ධ කරන ලද බීජ වප්කරය - පැදයන මාදිළිය (Riding Type)

බීජ වැපිරීම හා බිම් සැකසීම එක්වර සිදුකළ හැකි පරිදි රෝද 2 ට්‍රැක්ටර් රොටවේටරයට බීජ වප්කරය එක් කිරීම මඟින් ගොඩබිම වගාව සඳහා වැය වන කාලය, ඉන්ධන ප්‍රමාණය සහ මිනිස් බල අවශ්‍යතාවය අඩු වේ.

### රෝද 4 ට්‍රැක්ටර් රොටවේටරයට සම්බන්ධ කරන ලද බීජ වප්කරය

මහා පරිමාණයේ ගොවීන්ට බිජ වැපිරීම සහ බිම් සැකසීම එක්වර සිදු කළ හැකි පරිදි රෝද 4 ට්‍රැක්ටර් රොටවේටරයට බීජ වප්කරය සම්බන්ධ කිරීම මඟින් ගොඩබිම වගාව සඳහා වැයවන කාලය, ඉන්ධන ප්‍රමාණය සහ මිනිස් බල අවශ්‍යතාව අඩුවේ.

### කුරක්කන් කොළ මඩින හා ධාන්‍ය ඇට වෙන්කර ගන්නා යන්ත්‍රය

කුරක්කන්වල අතින් කොල මැඩ පොතු ඉවත් කර ධාන්‍ය ඇට වෙන්කර ගැනීම වෙනුවට විදුලි මෝටරයක් සහිත යන්ත්‍රයක් හඳුන්වා දීම මගින් එම කාර්යය සඳහා ගතවන කාලය, ඉන්ධන ප්‍රමාණය සහ මිනිස් බල අවශ්‍යතාවය අඩුවේ.

### රෝද 4 ට්‍රැක්ටරයට ආඳන ලද අන්වක්ෂ ප්‍රවාහ ජල පොම්පය

මහා පරිමාණ ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට ඇති ජල පොම්පයේ ධාරිතාව වැඩි කෙරිණි.

### කෘෂිකාර්මික හා කර්මාන්ත ව්‍යාප්තිය

පසුගිය වසරේදී පවත්වන ලද දැයට කිරුළ, ගොවි සතිය, ටෙක්නො 2013 යන ප්‍රදර්ශන සඳහා ක්‍රියාකාරීව සහභාගි විණි. බඩඉරිඟු සහ වෙනත් ක්ෂේත්‍ර බෝගවල යාන්ත්‍රීකරණ පිළිවෙත් මාලා සම්බන්ධ රූපවාහිනී වැඩසටහන් විකාශනය කරන ලදී. එයට අමතරව, වී සහ බඩඉරිඟු වගා පිළිවෙත් පිළිබඳ ක්ෂේත්‍ර ආදර්ශන ද සාර්ථකව සිදු කෙරිණි.

**වගු අංක 4.2.1.2: 2013 වර්ෂයේදී සිදු කළ ව්‍යාප්ති වැඩසටහන්**

| වැඩසටහන් වර්ගය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| ක්ෂේත්‍ර ආදර්ශන | 28 |
| රූපවාහිනී වැඩසටහන් | 3 |
| ගුවන්විදුලි වැඩසටහන් | 1 |
| ප්‍රදර්ශන | 5 |
| අභ්‍යන්තර පුහුණු | 9 |

## පරීක්ෂා කිරීම් සහ ඇගයීම් අංශය

ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මෙරට නිපදවන ලද හෝ ආනයනය කරන ලද කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර පරීක්ෂා කිරීම හා ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින එකම රාජ්‍ය ආයතනයයි. 2013 වර්ෂයේදී මෙම මධ්‍යස්ථානය විසින් පහත දැක්වෙන යන්ත්‍ර සූත්‍ර පරීක්ෂා කර බලන ලදී.

**වගු අංක 4.2.1.3: 2013 වර්ෂයේදී පරීක්ෂා කර බලන ලද යන්ත්‍ර සූත්‍ර**

| යන්ත්‍ර වර්ගය | පරීක්ෂා කිරීම සඳහා ලද යන්ත්‍ර සංඛ්‍යාව | නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව |
|---|---|---|
| රෝද 4 ට්‍රැක්ටර් | 4 | 4 |
| රෝද 2 ට්‍රැක්ටර් | 1 | 1 |
| බලවේග ඉසින | - | 3 |
| අතින් ක්‍රියා කරවන ඉසින යන්ත්‍ර | 2 | 1 |
| කල්ටිවේටර් | 1 | 1 |
| කොළ මඩින යන්ත්‍ර | | 1 |
| සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍ර | - | 1 |
| උදළු | 1 | 2 |
| කොකු නඟුල | - | 1 |
| රොටවේටරය | 3 | 1 |
| රොටෝස්ලැෂර් | - | 1 |
| පැළ සිටුවනය | 1 | - |
| බලවේග වල් පැළ නෙළනය | 1 | - |
| **එකතුව** | **14** | **17** |

## ගොවිපළ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ අංශය

2013 වර්ෂයේදී පහත සඳහන් නිර්දේශ, අලුත්වැඩියා සහ සේවා සැපයීම මෙම අංශය මගින් සිදු කෙරිණි.

**වගු අංක 4.2.1.4: 2013 වර්ෂයේදී සිදු කළ අලුත්වැඩියා කටයුතු සහ සේවා**

| කාර්යය | සංඛ්‍යාව |
|---|---|
| අලුත්වැඩියා | |
| එන්ජින් | 06 |
| ගියර් බොක්ස් | 08 |
| වෙනත් | 51 |
| නිර්දේශ | 174 |
| සේවා | 18 |

## කාර්යය මණ්ඩලය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු | 03 |
| ඉංජිනේරු සහකාර | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| රියදුරු | 04 |
| ගබඩාකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| යන්ත්‍ර සහායක | 01 |
| යාන්ත්‍රික ශිල්පි | 03 |
| යන්ත්‍ර ශිල්පි | 03 |
| තාක්ෂණික ශිල්පි | 04 |
| පෑස්සුම්කරු | 01 |
| බෙලෙක්කරු | 01 |
| කම්මල්කරු | 01 |
| වඩුකාර්මික | 01 |
| මුරකරු | 03 |
| නුපුහුණු කම්කරු | 07 |
| කොන්ත්‍රාත් කම්කරු | 29 |
| **එකතුව** | **71** |

# 4.3 මුදල් අංශය - පේරාදෙණිය

## මුදල් අංශයේ ප්‍රධාන අරමුණු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පහත අරමුණු සපුරා ගැනීමෙහිලා මනා මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම

- වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම
- බැංකු ගිණුම් පවත්වාගෙන යාම
- දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන්කිරීම
- දෙපාර්තමේන්තු ආදායම් රැස්කිරීම සහ ගිණුම්ගත කිරීම
- පෞද්ගලික පඩිනඩි ඇතුලත්ව සියලුම පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සිදු කිරීම
- අභ්‍යන්තර විගණන කාර්යයන් ඉටුකිරීම
- මූල්‍යමය ප්‍රගති වාර්තා සැකසීම සහ ඇගයීම
- දේශීය හා විදේශීය රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ මූල්‍යමය කාර්යයන් සම්බන්ධීකරණය
- විදේශීය ගෙවීම්
- ගොවිපල අත්තිකාරම් ගිණුම් කටයුතු ක්‍රියාත්මක කිරීම
- විසර්ජන හා ආදායම් ගිණුම් ඇතුලත්ව අවසන් ගිණුම් සැකසීම
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම
- සේවකයින්ට ණය ලබාදීම
- පරිගණක උපයෝගීතාවය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳව පුද්ගලයින් පුහුණු කිරීම

## ප්‍රගතිය

### ප්‍රාග්ධන වියදම්

වගුව **4.3.2:** ප්‍රාග්ධන වියදම් **- 2013**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති විස්තරය | සංශෝධිත ඇස්තමේන්තුව (රු.මිලියන) | වියදම (රු.මිලියන) | ප්‍රගතිය % වශයෙන් |
|---|---|---|---|---|
| 285-1-1 | පරිපාලනය හා ආයතනික සේවා | 34.460 | 27.897 | 81 |
| 285-2-2 | කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධනය | 466.638 | 334.569 | 72 |
| 285-2-3 | කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණුව | 321.462 | 225.393 | 70 |
| 285-2-4 | බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණය | 710.000 | 555.617 | 78 |
| **එකතුව** | | **1,532.560** | **1,143.476** | **75** |

අග්‍රිම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රාග්ධන ව්‍යාපෘතීන්හි අපේක්ෂිත මූල්‍යමය ප්‍රගතීන් 2013 වර්ෂයේදී සපුරා ගැනීමට නොහැකි විය.

## පුනරාවර්තන වියදම

**වගුව 4.3.2: 2013 වර්ෂය තුළදී පුනරාවර්තන වියදම් (රු.මිලියන)**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති විස්තරය | සංශෝධිත ඇස්තමේන්තුව (රු.මිලියන) | වියදම (රු.මිලියන) | ප්‍රගතිය % වශයෙන් |
|---|---|---|---|---|
| 285-1-1 | පරිපාලනය සහ ආයතනික සේවා | 290.149 | 289.825 | 99 |
| 285-2-2 | කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන | 854.602 | 854.371 | 99 |
| 285-2-3 | කෘෂිකර්ම ව්‍යාප්ති සහ පුහුණු | 626.914 | 626.338 | 99 |
| 285-2-4 | බීජ සහතිකකිරීමේ සහ පැළෑටි සංරක්ෂණ | 496.040 | 495.643 | 99 |
| **එකතුව** | | **2,267.704** | **2,266.176** | **99** |

## අත්තිකාරම් ගිණුම් කාර්යයන්

වගුව 4.3.3: අත්තිකාරම් ගිණුම් - 2013 (රු.මිලියන)

| විස්තරය | අනුමත සීමාව (සංශෝධිත) | සත්‍ය ප්‍රමාණය |
|---|---|---|
| **1. කෘෂිකර්ම ගෙවිපල නඩත්තුව** | | |
| උපරිම වියදම් සීමාව | 416.000 | 413.170 |
| අවම ලැබීම් සීමාව | 416.000 | 422.781 |
| **2. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | |
| උපරිම වියදම් සීමාව | 185.000 | 110.691 |
| අවම ලැබීම් සීමාව | 135.000 | 159.005 |

2012 ගිණුම් සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නිරීක්ෂණ 2013 වර්ෂයේදී ලැබිණි. ඒ අනුව, විගණකාධිපතිවරයා 28502 දරන ගොවිපල අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් පහත මතයක් දැරීය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2013.12.31 දිනට ගොවිපල අත්තිකාරම් ගිණුමෙහි මූල්‍යමය තත්ත්වය සම්බන්ධයෙන් 2012.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍යමය කාර්යයන්හි 2.2 ඡේදයේ සඳහන් තොරතුරුවලින් ප්‍රතිඵල කළ බලපෑම හැරෙන්නට සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කරන බවට මතයක්

දරනු ලබයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම අත්තිකාරම් ගිණුමක් සම්බන්ධ මතයක් ලැබුණු පළමු අවස්ථාවේ මෙය වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම සහ ආදායම් ගිණුම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ලබාදී ඇත. (a) සිට (g) දක්වා වූ පොදු නිරීක්ෂණයන් සහ ප්‍රධාන විගණන සොයා ගැනීම් අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම සහ සැසඳුම් ප්‍රකාශන 2012.12.31 දිනට මූල්‍යමය වාර්තා සහ පොත් වලට අනුව සතුටුදායක ලෙස සකස් කර ඇත. මෙයද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පළමුවරට ලැබූ යහපත් නිරීක්ෂණයකි.

## ආදායම් රැස්කිරීම්

**වගුව 4.3.4: 2013 වර්ෂයේ ආදායම් රැස්කිරීම්**

| ආදායම් ශීර්ෂය | විස්තරය | සත්‍ය ලැබීම් (රු.මිලියන) |
|---|---|---|
| 20-02-02-99 | ණය පොළිය | 13.928 |
| 20-03-99-00 | වෙනත් ලැබීම් | 99.454 |
| 20-02-01-01 | කුලී සහ වෙනත් | 19.295 |
| 20-03-02-18 | දෙපාර්තමේන්තු අලෙවි සහ වෙනත් ගාස්තු | 181.639 |
| 20-04-01-00 | වැන්දඹු සහ අනත්දරු | 62.422 |
| 20-06-02-00 | ප්‍රාග්ධන වත්කම් අලෙවිය | 8.123 |
| **එකතුව** | | **344.861** |

## කාර්ය මණ්ඩලය

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී | 01 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | 03 |
| සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 04 |
| අයවැය සහකාර | 02 |
| භාෂා පරිවර්තක | 01 |
| සංවර්ධන නිලධාරි | 20 |
| රාජ්‍ය කළමනාකරණ සහායක | 87 |
| කාර්යාල කාර්ය සහායක | 13 |
| රියදුරු | 05 |
| නුපුහුණු කම්කරු | 10 |
| **එකතුව** | **147** |

# 4.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය

ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම ආයතන හා මධ්‍යස්ථාන විසින් සිදු කරන කාර්යයන් හා වැඩසටහන්වලට අදාළ මෙහෙයුම් හා ඇගයීම් කටයුතු පිළිබඳ වගකීම දරයි. එයට අමතරව, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්, වාර්ෂික කාර්ය සාධන වාර්තාව, මාසික ප්‍රගති වාර්තා සහ අනෙකුත් අදාළ වාර්තා සම්පාදනය කිරීමේ වගකීම ද දරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් ඵලදායී කිරීම පිණිස ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවීම ද ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය මගින් සිදු කෙරේ.

## අයවැය

**වගු අංක 4.4.1: වාර්ෂික අයවැය - 2013**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 1,850,000 | 922.783 | 50 |
| පුනරාවර්තන | 1,934,150 | 1,679,406 | 87 |
| **එකතුව** | **3,784,150** | **2,602,189** | **69** |

## ප්‍රගතිය

### ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය

පහත සඳහන් කාණ්ඩ යටතේ 2013 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කරන ලදී.

- මූලධන වියදම්
- පුනරාවර්තන වියදම්
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අරමුදල් ප්‍රතිපාදනය කරන විශේෂ ව්‍යාපෘති
- කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් අරමුදල් ප්‍රතිපාදනය කරන විශේෂ ව්‍යාපෘති
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු තාක්ෂණික වැඩසටහන
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන සැලැස්ම

### මූලධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳ ප්‍රගති මෙහෙයුම් කටයුතු

මූලධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳව භෞතික හා මූල්‍ය ප්‍රගති මෙහෙයුම් කටයුතු 2013 වර්ෂයේදී ද අඛණ්ඩව සිදු කෙරිණි. මූලධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳ මාසික ප්‍රගති වාර්තා සම්පාදනය කර කෘෂිකර්ම අමාත්‍යාංශයට යවන ලදී.

**වගු අංක 4.4.2 : 2013 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 550 | 374 | 68 |
| පුනරාවර්තන | 2,267 | 2,266 | 100 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ ඇති ව්‍යාපෘති | 982 | 796 | 81 |
| කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ඇති ව්‍යාපෘති | 81 | 65 | 79 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති | 97 | 92 | 95 |
| පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති | 0.069 | 0.058 | 84 |
| **එකතුව** | **3,977** | **3,593** | **90** |

## විශේෂ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති මෙහෙයුම් කටයුතු

### කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘති

කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘති 14ක ප්‍රගති මෙහෙයුම් කටයුතු කර ඒවායෙහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා කෘෂිකර්ම අමාත්‍යාංශයට යවන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය වගු අංක 4.4.3හි දැක්වේ.

**වගු අංකය 4.3.3: 2013 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | ආයතනය | ප්‍රතිපාදනය (රු. මිලියන) | සංශෝධිත ප්‍රතිපාදනය (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම් % |
|---|---|---|---|---|---|
| 1. බීජ නිෂ්පාදන සහ මිලදී ගැනීමේ වැඩසටහන | බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය | 250.00 | 297.99 | 223.31 | 75 |
| 2. කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන | බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය | 200.00 | 157.01 | 96.57 | 62 |
| 3. යටිතල පහසුකම් සංවර්ධනය, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය | වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 75.00 | 72.94 | 54.28 | 74 |

| ව්‍යාපෘතිය | ආයතනය | ප්‍රතිපාදනය (රු. මිලියන) | සංශෝධිත ප්‍රතිපාදනය (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම් % |
|---|---|---|---|---|---|
| 4. වෙනත් ක්ෂේත්‍ර බෝගවල නව දෙමුහුම් සහ එළිමහනේ පරාගණය වූ ප්‍රභේද බිහි කිරීම | ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 100.00 | 85.80 | 44.24 | 52 |
| 5. පලතුරු ගම්මාන 100ක් ස්ථාපිත කිරීම | පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 30.00 | 30.00 | 29.76 | 99 |
| 6. පටක රෝපණය මගින් වැදගත්කමක් සහිත බෝගවල උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 30.00 | 30.00 | 29.17 | 97 |
| 7. ප්‍රචලිත සාම්ප්‍රදායික එළවළු බීජ සුලභ කිරීම | උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 5.00 | 5.00 | 4.38 | 88 |
| 8. පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම | ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය | 14.00 | 14.00 | 6.99 | 50 |
| 9. බීජ පනත ක්‍රියාත්මක කිරීම තුළින් උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයක් ඇති කිරීම | බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය/ බීජ සහතික කිරීමේ සේවය | 20.00 | 20.00 | 16.80 | 84 |
| 10. බීජ සහතික කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම | බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය/ බීජ සහතික කිරීමේ සේවය | 100.00 | 100.00 | 91.99 | 92 |
| 11. මානව සෞඛ්‍යය හා පරිසරය කෙරෙහි කෘෂි රසායන මගින් ඇතිවිය හැකි හානිය අවම කිරීම | බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය | 40.00 | 40.00 | 0.82 | 2 |
| 12. මාධ්‍ය වැඩසටහන | තොරතුරු සහ සංනිවේදන මධ්‍යස්ථානය | 20.00 | 20.00 | 19.08 | 95 |

| ව්‍යාපෘතිය | ආයතනය | ප්‍රතිපාදනය (රු. මිලියන) | සංශෝධිත ප්‍රතිපාදනය (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම් % |
|---|---|---|---|---|---|
| 13. කෘෂිකර්ම විද්‍යාලවල ඉඩම් සංවර්ධනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 61.00 | 61.31 | 44.58 | 73 |
| 14. පුහුණුව සහ හැකියා වර්ධනය | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය/ තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානය | 20.60 | 27.77 | 26.79 | 96 |
| 15. පරීක්ෂණ විද්‍යාගාරයක් ඉදි කිරීම | ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය, මහ ඉලුප්පල්ලම | 5.00 | 5.00 | 0.11 | 2 |
| 16. ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘති | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 60.00 | 54.45 | 49.45 | 91 |
| 17. බණ්ඩාරවෙල පර්යේෂණ ස්ථානයේ කාර්යාලය සහ විද්‍යාගාරය | උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 25.00 | 25.00 | 0 | 0 |
| 18. කෘෂි තාක්ෂණ උද්‍යාන | තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානය | 4.50 | 4.50 | 4.17 | 93 |
| 19. ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම | තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානය | 125.00 | 125.00 | 106.60 | 85 |
| 20. පැල්වෙහෙර කෘෂිකර්ම පාසලේ නව නේවාසිකාගාරයක් ඉදිකිරීම | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 50.00 | 50.00 | 0 | 0 |
| 21. කෘෂිකර්ම විද්‍යාලය සංවර්ධනය කිරීම | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 100.00 | 2.06 | 2.06 | 100 |
| 22. සුළු පරිමාණ ව්‍යාපෘතිය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 10.00 | 22.85 | 22.85 | 100 |
| **එකතුව** | | **1,345.10** | **1,250.68** | **874** | **70** |

## අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘති

විවිධ ව්‍යාපෘති වෙනුවෙන් කෘෂිකර්ම, ආර්ථික සංවර්ධන සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති යන අමාත්‍යාංශවලින් කෘෂිකර්ම, දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන ලැබිණි. මෙම ව්‍යාපෘතිවල මූල්‍යමය ප්‍රගතිය පිළිවෙලින් වගු අංක 4.4.4, 4.4.5, සහ 4.4.6හි දැක්වේ.

**වගු අංක 4.4.4: කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදන මුදල (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම් % |
|---|---|---|---|
| 1. දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ පරිසර හිතකාමී පරිසර පද්ධතියක් ඉදි කිරීම | 10.00 | 4.70 | 47 |
| 2. ක්ෂේත්‍ර සම්බන්ධීකරණ වියදම් - රතු ලූනු | 0.10 | 0.09 | 99 |
| 3. විශේෂ සංවර්ධන වැඩසටහන - 2013 | 0.05 | 0.05 | 100 |
| 4. දෙදින කන්න රැස්වීම - 2013 මැයි | 0.29 | 0 | 0 |
| 5. වීරපාන ගොවිපළින් ලබාගත් පලතුරු පැළවලට ගෙවීම | 0.01 | 0 | 0 |
| 6. ඉංගිරිය වැඩිහිටි ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන | 0.80 | 0.44 | 56 |
| 7. අර්තාපල් පරිභෝජනය ඉහළ නැංවීමේ වැඩසටහන | 19.50 | 18.35 | 94 |
| 8. තරුණ කෘෂි ව්‍යවසායකයින්ගේ වැඩසටහන, ගාල්ල | 0.10 | 0.10 | 100 |
| 9. දැයට කිරුළ - 2013 - භූමිය සංවර්ධනය | 17.00 | 16.99 | 100 |
| 10. දැයට කිරුළ - 2013 - පලතුරු බෝග ප්‍රවර්ධනය හා සංවර්ධනය | 0.50 | 0.49 | 99 |
| 11. දැයට කිරුළ - 2013 - කොළ එළවළු හා අල වර්ග රෝපණය | 0.55 | 0.37 | 68 |
| 12. දැයට කිරුළ - ප්‍රා.කෘ.ප.ම. මාකඳුර | 1.12 | 0 | 0 |
| 13. දැයට කිරුළ - 2014 - අන්තර් පළාත් ප්‍රදේශය, අනුරාධපුරය | 0.28 | 0 | 0 |

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදන මුදල (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම % |
|---|---|---|---|
| 14. දැයට කිරුළ - 2014 - භූමිය සංවර්ධනය | 5.00 | 4.49 | 90 |
| 15. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීම | 5.95 | 5.38 | 90 |
| 16. දත්ත රැස් කිරීම හා ආකෘතිපත්‍ර මුද්‍රණය | 1.90 | 1.87 | 99 |
| 17. රතු ලූනු බීජ නිෂ්පාදනය | 5.00 | 4.95 | 99 |
| 18. සහල් අපනයන වැඩසටහන | 5.13 | 0.62 | 12 |
| 19. මුරුන්කන්, පරන්තන් බීජ ගොවිපළ වැඩසටහන | 6.92 | 5.08 | 73 |
| 20. මුරුන්කන් පරන්තන් බීජ ගොවිපළ වැඩසටහන | 1.05 | 0.51 | 48 |
| 21. විගණන හා මූල්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 0.07 | 0.02 | 31 |
| **එකතුව** | **81.30** | **64.51** | **79** |

**වගු අංක 4.4.5: ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම් % |
|---|---|---|---|
| 1. දිවි නැගුම ජාතික වැඩසටහනෙහි කෘෂිකාර්මික අංශයෙහි පුහුණුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | 0.099 | 0.099 | 100 |
| 2. මුදල් අමාත්‍යාංශ නිලධාරීන් සඳහා මිටි මුරුංගා පැළ ලබාදීම | 0.112 | 0.112 | 100 |
| 3. දිවි නැගුම වැඩසටහන v අදියර - මිටි මුරුංගා පැළ ලබාදීම | 97.326 | 92.418 | 95 |
| 4. 2012 වර්ෂයේ නොගෙවූ බිල්පත් නිරවුල් කිරීම | 0.083 | 0.082 | 99 |
| **එකතුව** | **97.620** | **92.711** | **95** |

වගුඅංක 4.4.6: පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු. මිලියන) | වියදම (රු. මිලියන) | වියදම් % |
|---|---|---|---|
| 1. භාවිතයෙන් පසු ඉවතලන පළිබෝධනාශක බඳුන් බැහැර කිරීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 0.069 | 0.058 | 84 |

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යඵල

2013 වර්ෂයට අදාළව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යඵල පිළිබඳ තොරතුරු සම්පාදනය කර පාර්ලිමේන්තු අයවැය කථාවට අදාළ ප්‍රගති වාර්තාවෙහි ද මහබැංකු වාර්ෂික වාර්තාවෙහි ද ඇතුළත් කිරීම පිණිස කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යවන ලදී.

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2012 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සම්පාදනය කර පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. මෙම වාර්තාව අදාළ අමාත්‍යාංශ, විශ්වවිද්‍යාල, පුස්තකාල සහ අනෙක් අදාළ ආයතන වලට ද බෙදා හරින ලදී.

## වෙනත් වාර්තා

මහින්ද චින්තනය යටතේ ක්‍රියාත්මක කරන කාර්යන්වල සහ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 50 ඉක්මවන ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා සම්පාදනය කර කෘෂිකර්ම අමාත්‍යාංශයට යවන ලදී.

## මානව සම්පත් පිළිබඳ තත්ත්වය

මෙම ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරී ආවරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්.එම්. රණතුංග බණ්ඩාර මහතා පත් කරන ලදී. වසර තුළ සංවර්ධන නිලධාරීහු තිදෙනෙක් ද බඳවා ගන්නා ලදහ. එක් වැඩසටහන් නිලධාරියෙක් සහ සංවර්ධන නිලධාරියෙක් මුදල් අංශයට ස්ථාන මාරුකර යවන ලදහ.

## 2014 වර්ෂය සඳහා සැලැස්ම

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීම
- මූලධන සහ පුනරාවර්තන කාර්යයන්හි සහ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගති මෙහෙයුම් කටයුතු
- භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ මාසික සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සම්පාදනය කිරීම
- මහ බැංකු වාර්තාව සහ අයවැය කතාව සඳහා තොරතුරු සැපයීම
- රු. මිලියන 50 ඉක්ම වූ ව්‍යාපෘතිවලට අදාළ ප්‍රගති වාර්තා සම්පාදනය

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී/ සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 02 |
| භාෂා පරිවර්තක | 03 |
| වැඩසටහන් සහකාර | 01 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| සංවර්ධන නිලධාරි | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| රියදුරු | 03 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| කම්කරු | 03 |
| මුරකරු | 02 |
| **එකතුව** | **21** |

# 5. කාලගුණ වාර්තාව

ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාප නියෝජනය කරන කෘෂි කාලගුණික මධ්‍යස්ථාන 12කින් 2012/2013 මහ (සැප්තැම්බර් - පෙබරවාරි) සහ යල (මාර්තු - අගෝස්තු) කන්න වලදී එක් රැස් කරගත් කාලගුණික දත්ත සාරාංශ ගත කර තිබෙන මෙම වාර්තාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්භාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ දේශගුණික විද්‍යා අංශයෙන් පිළියළ කරන ලදි.

කන්න දෙකේදී ලද සමුච්චිත වර්ෂාපතනය වගු අංක 5.1හිද මධ්‍යස්ථාන 12ක මාසික වර්ෂාපතනය සහ වසර 10ක සාමාන්‍ය පිළිවෙළින් වගු අංක 5.2හි සහ 5.3හි දැක්වේ. අනෙකුත් වැදගත් කෘෂි කාලගුණික පරාමිතීන් වන විභව වාෂ්පීකරණ උත්ස්වේදනය (විවෘත තැටි වාෂ්පීකරණය මගින් අගයන ලද) උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාව, දීප්තිමත් හිරු එළිය පැවති පැය ගණන සහ සුළගේ ප්‍රවේගය යනාදියෙහි මාසික මධ්‍යන්‍ය අගය පිළිවෙළින් වගු අංක 5.4, 5.5, 5.6, 5.7 සහ 5.8හි දැක්වේ.

පොදුවේ ගත් කළ 2012/2013 මහ කන්නයේදී දිවයිනේ සියළුම පළාත් ලද වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා පැවති අතර මාසික මධ්‍යන්‍යය හා සංසඳනාත්මකව ලද වර්ෂාපතනය කන්නය පුරාවටම හිතකර අයුරින් ව්‍යාප්තව පැවතුණි. 2013 යල කන්නයේදී ලද වර්ෂාපතන ප්‍රමාණය සහ ව්‍යාප්තිය සාමාන්‍යයෙන් මෙම කන්නයේදී ලැබෙන වර්ෂාපතන රටාවට සමීප අයුරින් පැවතුණි.

## පහතරට තෙත් කලාපය

### බෝඹුවල (WL$_1$b)

2012/2013 මහ කන්නයේදී මෙම කලාපය ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 1,510ක් වූ එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 14%කින් වැඩි වූවක් වන අතර නොවැම්බර් සහ ජනවාරි හැරුණු විට කන්නයේ සෙසු මාස වලදී ඉහළ වර්ෂාපතනයක් ලැබීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව විය. මාසික විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් ජනවාරි මාසයේදී හැරුණු විට සෙසු මාසවලදී ලද සමුච්චිත වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක පැවතුණි.

2013 යල කන්නයේදී වාර්තා වූ සමුච්චිත වර්ෂාපතනයේ සෘණාත්මක විෂමතාවය 9%ක් පමණක් වූ අතර අප්‍රේල් සහ අගෝස්තු මාසවලදී ලද වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව පහළ මට්ටමක පැවතීම මෙයට ප්‍රධාන හේතුව විය. මෙයට සමගාමීව අගෝස්තු මාසයේ සමුච්චිත විභව වාෂ්පීකරණ අගය එම මාසයේ ලද සමුච්චිත වර්ෂාපතනය ඉක්මවා පැවති මුත් කන්නයේ සෙසු මාස වලදී ලද සමුච්චිත වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවතුණි. මේ අනුව, මෙම කලාපයේ වගා කරන උඩරට බෝග කෙරෙහි පාංශු තෙතමනයේ අහිතකර තත්ත්වයන් බලපෑමට පැවති ඉඩකඩ අඩු විය.

## මැද රට තෙත් කලාපය

### පේරාදෙණිය (WM$_2$b)

2012/2013 මහ කන්නයේදී මෙම කලාපය ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 1,848ක් පමණ වූ අතර එය දිගු කාලීන සාමාන්‍යය හා සංසන්දනාත්මකව 80%ක වැඩි වීමකි. සැප්තැම්බර් සහ නොවැම්බර් මාස හැරුණු විට කන්නයේ සෙසු මාස

වලදී ලද වර්ෂාපතනය සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා පැවතීම මෙම ධනාත්මක විෂමතාවයට ප්‍රධාන හේතුව විය. මෙම කලාපයේ සාමාන්‍යයෙන් වියළි කාලගුණික තත්ත්වයක් පවතින මාස වලදී එනම් ජනවාරි සහ පෙබරවාරි මාස වලදී 150%ක් ඉක්මවා වර්ෂාව ඇද හැලුණු අතර මේ හේතුවෙන් ඉහළ පසු අස්වනු හානි සහිතව බෝග අස්වනු කෙරෙහි අහිතකර තත්ත්වයන් උදාවන්නට ඇත. මෙම තත්ත්වය මෙම කලාපයේ පලතුරු ශාක වල මල් හට ගැනීම කෙරෙහිද අයහපත් අන්දමින් බලපාන්නට ඇත.

2013 යල කන්නයේ මැයි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ලැබීම හේතුවෙන් දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව ලද වර්ෂාපතනය 37%ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි. එහෙත් අන්තර් මෝසම් සමයේ මුල් කාලයේදී (මාර්තු - අප්‍රේල්) ලද වර්ෂාපතනය දිගු කාලීන සාමාන්‍යයට වඩා පහළ මට්ටමක පැවති මුත් වාෂ්පීකරණ උත්ස්වේදන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් විය. පූර්ව කාලගුණ වාර්තා සළකා බැලීමේදී පසුගිය වසර දෙකේ යල කන්න කෘෂිකාර්මිකව වියළි තත්ත්වයකින් පැවතුණි. ඒ අනුව, නිරිතදිග මෝසම් සුළං ප්‍රවාහය මනාව පැවතීම හේතුවෙන් 2013 යල කන්නය මෙම කලාපයට සුපුරුදු කාලගුණික රටාවෙන් යුතු වූ අතර කන්නයේ සෑම මාසයකදීම ලද වර්ෂාපතනය කන්නය පුරාවටම පැවති විභව වාෂ්පීකරණ උත්ස්වේදනයට වඩා ඉහළින් පැවතුණි.

## උඩරට තෙත් කලාපය

### සීතා එළිය (WU$_3$)

2012/2013 මහ කන්නයේදී ලද මි.මී. 1590ක් පමණ වූ සමුච්චිත වර්ෂාපතනය මෙම කලාපයේ දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 42%කින් පමණ වැඩි වුවක් වන අතර මධ්‍යම කඳුකරයට ඔක්තෝම්බර් මාසයේ සිට පෙබරවාරි මාසය දක්වා සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ඇද හැලීම මෙයට ප්‍රධාන හේතුව විය. පෙබරවාරි මාසයේදී ලද සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 200%ක වර්ධනයකි. කන්නය පුරාවටම පැවති විභව වාෂ්පීකරණ උත්ස්වේදනය කන්නයේ සෑම මසකම ලද වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක පැවති අතර කන්නය තුළදී පැවති උපරිම උෂ්ණත්වය සෙ.15$^0$ - සෙ 23$^0$ දක්වාද අවම උෂ්ණත්වය සෙ. 6$^0$ - සෙ. 15$^0$ දක්වා පරාසයේද පැවතුණි.

යල කන්නයේදී WU$_3$ කලාපය මි.මී. 1,279ක වර්ෂාපතනයක් ලද අතර එය දිගු කාලීන සාමාන්‍යයට වඩා 64%කින් වර්ධනය වුවකි. විශේෂයෙන්ම නිරිතදිග මෝසමේ අධි ක්‍රියාකාරීත්වය හේතුවෙන් ජුනි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා සෑම මාසයකදීම සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ලැබීම යල කන්නයේදී ලද වර්ෂාපතනයේ මෙම ධනාත්මක විෂමතාවයට ප්‍රධාන හේතුව විය. කන්නයේ සෑම මසකදීම ලද වර්ෂාපතනය ඒ ඒ මාසවල විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ඉක්මවා පැවතුණි. කන්නය තුළදී පැවති උපරිම උෂ්ණත්වය සෙ. 16$^0$ - සෙ. 24$^0$ දක්වාත් අවම උෂ්ණත්වය සෙ. 7$^0$ - සෙ. 15$^0$ දක්වාත් වූ පරාසයක පැතිර පැවතුණි.

## පහතරට අතරමැදි කලාපය

### බතලගොඩ (IL$_1$a)

2012/2013 මහ කන්නයේදී මි.මී. 1,558ක් ලෙස වාර්තා වූ සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍යය හා සංසන්දතාත්මකව 44%ක වර්ධනයකි. ඔක්තෝම්බර්, දෙසැම්බර් සහ ජනවාරි මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවන ලද වර්ෂාපතනය මෙයට හේතුව වූ අතර සමුච්චිත මාසික වර්ෂාපතන

වර්ධනය දෙසැම්බර් සහ ජනවාරි මාස වලදී පිළිවෙලින් 200%ක් සහ 170%ක් විය. කන්නය තුළදී ජල හිඟ තත්ත්වයක් උදාවීමට අවස්ථාවක් කිසිසේත්ම නොපැවතුණි.

යල කන්නයේදී මෙම කලාපය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසදනාත්මකව 17%කින් වර්ධනය වූ වර්ෂපතනයක් ලද අතර මාර්තු, මැයි සහ ජුනි මාස වලදී මනා වැසි ලබමින් සාර්ථක වූ කන්නයක් බවට පත් විය. මෙය, කලාපයේ මෑත අතීතයේදී සිදු නොවූ සංසිද්ධියකි.

### මොණරාගල ($IL_{1c}$)

දිවයිනේ තෙත් කලාප වලට පටහැනිව මෙම කලාපය 2012/2013 මහ කන්නයේදි ලද සමුච්චිත වර්ෂපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 5%කින් පමණ අඩු වූවක් වන අතර සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු වර්ෂාපතනයක් ලැබීම මෙයට ප්‍රධාන හේතුව විය. එසේ වුවද, සැප්තැම්බර් මාසයේදී හැරුණු විට වර්ෂාපෝෂිත උඩරට බෝග කෙරෙහි හිතකර පාංශු තෙතමන තත්ත්වයක් සහතික කරමින් කන්නයේ සෙසු සෑම මාසයකදීම පැවති විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ලද වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක පැවතුණි.

2013 යල කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 571ක් වූ අතර එය දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 8%කින් පමණ අඩු වූවක් වන අතර අප්‍රේල්, මැයි සහ ජුනි මාස වලදී ලද වර්ෂාපතනය සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවතීම මෙයට ප්‍රධාන හේතුව විය. ජුනි සහ ජුලි මාස වලදී ලද වර්ෂාපතනය වායු ගෝලයේ වාෂ්පීකරණ උත්ස්වේදන ඉල්ලුමට වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවතුණි.

## මැද රට අතරමැදි කලාපය

### කුණ්ඩසාලේ ($IM3_a$)

2012/2013 මහ කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 869ක් වූ එහි දිගු කාලීන සාමාන්‍යය හා සංසන්දනාත්මකව 80%කට පමණ ආසන්න වූ වර්ධනයක් වන අතර මහ කන්නයේදි වාර්තා වූ මෙම ධනාත්මක වෙනසට සැප්තැම්බර් මාසය හැරුණු විට කන්නයේ සෙසු සෑම මාසයකදීම ලද සාමාන්‍ය වර්ෂාපතනය ඉක්ම වූ වැසි ප්‍රධාන හේතුව විය. ඔක්තෝම්බර් මාසයේදී පමණක් ලද සමුච්චිත වර්ෂාපතනයේ වර්ධනය 200%ක් පමණ විය.

යල කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 897ක් වූ අතර එය දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 56%ක වර්ධනයක් වන අතර කන්නයේදී ධනාත්මක වර්ෂාපතන විෂමතාවයක් අත් නොවිදි එකම මාසය අප්‍රේල් මාසය විය. මි.මී. 72ක් වූ දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව මැයි සහ ජුනි මාස වලදී ලද සමුච්චිත වර්ෂාපතනය පිළිවෙළින් 70%ක සහ 200%ක වර්ධනයකි. කෙසේ වුවද, ජුලි සහ අගෝස්තු මාස වලදී පැවති විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ලද සමුච්චිත වර්ෂාපතනයට වඩා වැඩි විය.

## උඩරට අතරමැදි කාලපය

### බණ්ඩාරවෙල (IU3c)

මධ්‍යම කඳුකරයේ අනෙකුත් ප්‍රදේශ වලට අනුකූලව මෙම කලාපය 2012/2013 මහ කන්නයේදී එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 49%කින් පමණ වර්ධනය වූ වැසි ලද අතර සැප්තැම්බර් මාසයේදී හැරුණු විට කන්නයේ සෙසු සියළුම මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ලබමින් සාම්ප්‍රදායික කෘෂිකර්ම වගා ක්‍රම වලට හිතකර අයුරින් ව්‍යාප්තව පැවතුණි. කන්නයේ සෑම

මාසයකදීම විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ලද වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක පැවතුණු අතර කන්නය තුළ පැවති උපරිම උෂ්ණත්වය සෙ. $19^0$ - සෙ. $29^0$ දක්වාත් අවම උෂ්ණත්වය සෙ $9^0$ - සෙ $19^0$ දක්වාත් වූ පරාසයේ පැතිර පැවතුණි.

2013 යල කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 661ක් වූ එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 8%කින් වර්ධනය වූවක් වන අතර මෙම ඍණාත්මකව විෂමතාවයට මුල්ම අන්තර් මෝසම් වැසි කාලය වන මාර්තු සහ අප්‍රේල් මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩුවෙන් වැසි ලැබීම ප්‍රධාන හේතුව විය. කෙසේ වුවද, එම මාස වලදී මාසික සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් සමුච්චිත වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවතුණි. කන්නය තුළ පැවති උපරිම උෂ්ණත්වය සෙ. $22^0$ - සෙ. $30^0$ දක්වාත් අවම උෂ්ණත්වය සෙ. $13^0$ - සෙ. $20^0$ දක්වාත් වූ පරාසයේ පැතිර පැවතුණි.

## වියළි කලාපය

### මහ ඉලුප්පල්ලම ($DL_1b$)

**$DL_1b$** කෘෂි පාරිසරික කලාපයේ උතුරු මැද කොටස මහ කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 1,372ක් වූ අතර එය අපේක්ෂිත ප්‍රමාණයට වඩා 34%ක වර්ධනයකි. සැප්තැම්බර් සහ නොවැම්බර් මාස හැරුණු විට කන්නයේ සෙසු මාසවලදී ලද වර්ෂාපතනයේ ධනාත්මක වෙනස සමුච්චිත වර්ෂාපතනයේ මෙම වර්ධනයට හේතුව විය. සැප්තැම්බර් මාසයේදී හැරුණු විට සෙසු සෑම මාසයකම විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් මාසික වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවතුණි.

2013 යල කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 402ක් වූ දිගු කාලීන සාමාන්‍යය හා සංසන්දනාත්මකව 5%කින් අඩු වූවක් වන අතර අප්‍රේල් මාසයේ සිට ජූනි මාසය දක්වා ලද වර්ෂාව සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවතීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව විය. අප්‍රේල් මාසයේ සිට ජූලි මාසය දක්වා පැවති සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් සමුච්චිත වර්ෂාපතනය ඉක්මවා ගොස් තිබුණු අතර මේ හේතුවෙන් අතිරේක ජල සම්පාදනයකින් තොර වූ උඩරට බෝග පාංශු තෙතමනයේ අහිතකර තත්ත්වයන්ට ලක් වන්නට ඇත.

### අඟුණකොළපැළැස්ස ($DL_1b$)

වියළි කලාපයේ අනෙකුත් ප්‍රදේශවල මෙන් දකුණු පළාතේ $DL_1b$ කෘෂි පාරිසරික කලාපය 2012/2013 මහ කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 780ක් වූ එහි දිගු කාලීන සාමාන්‍යය හා සංසන්දනාත්මකව 71%කින් පමණ වර්ධනය වූවක් වන අතර මෙම ධනාත්මක වෙනසට කන්නයේ සෑම මාසයකදීම සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා මනාව ව්‍යාප්ත වූ වැසි ලැබීම හේතු විය. මේ අතර, වර්ෂාපෝෂිත උඩරට ගොවිතැන් කටයුතු වලදීද බෝග කෙරෙහි අහිතකර බලපෑම් වලින් තොර තත්ත්වයක් සහතික කරමින් සෑම මාසයකදීම පැවති සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය මාසික වර්ෂාපනයට වඩා පහළ මට්ටමක පැවතුණි.

මෙම කලාපය 2013 යල කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 488ක් වූ එහි දිගු කාලීන සාමාන්‍යයට බොහෝ දුරට සමාන විය. සාමාන්‍යයෙන් වියළි කාලගුණයක් පවතින අගෝස්තු මාසයේදී සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු ප්‍රමාණයකින් වැසි ලැබීම 6%කට ආසන්න වූ සුළු පහත වැටීමට ප්‍රධාන හේතුව විය. මාර්තු සහ මැයි මාස හැරුණු විට කන්නයේ සෙසු මාස වලදී ලද සමුච්චිත වර්ෂාපතනයට වඩා විභව වාෂ්පීකරණ උත්ස්වේදනය අධික විය. ඒ අනුව, අතිරේක ජල සම්පාදනයක් සිදු නොවී නම්

වර්ෂාපෝෂිත උඩරට බෝග වර්ධනය වන අවධියේදී පාංශු තෙතමනයේ අහිතකර තත්ත්වයන්ට ලක් වන්නට ඇත.

### අරලගංවිල ($DL_2b$)

වියළි කලාපයේ නැගෙනහිර ප්‍රදේශය 2013/2013 මහ කන්නයේදී මි.මී. 2,334ක සමුච්චිත වර්ෂාපතනයක් ලද අතර මෙය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 48%ක ධනාත්මක විෂමතාවයකි. සැප්තැම්බර් සහ නොවැම්බර් මාස වලදී හැරුණු විට කන්නයේ සෑම මාසයකදීම සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ලැබීම මෙයට ප්‍රධාන හේතුව වූ අතර සැප්තැම්බර් මාසයේදී හැරණු විට කන්නයේ සෙසු සියළුම මාස වලදී වායුගෝලයේ වාෂ්පීකරණ ඉල්ලුම සමුච්චිත වර්ෂාවට වඩා පහළ මට්ටමක පැවතුණි. මේ අනුව, කඳුකර ප්‍රදේශවල වගා කරන බෝග කෙරෙහි අහිතකර පාංශු තෙතමන තත්ත්වයන් වර්ධනය වීමේ ඉඩකඩ නොපැවතුණි.

මෙම කලාපයේ යල කන්නය සාමාන්‍යයෙන් වියළි කාලගුණික තත්ත්වයකින් පැවති අතර එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව සමුච්චිත වර්ෂාපතනය 10%කින් අඩු වූවක් වන අතර ජූනි මාසය වැසි තොර මාසයක් විය. මෙම තත්ත්වය මෙම ප්‍රදේශයේ යල කන්නයට පොදු ලක්ෂණයකි. මෙම යල කන්නයද සුපුරුදු පරිදි මෙම ප්‍රදේශයේ පූර්ව යල කන්න හා සමාන විය.

### වීරවිල ($DL_5$)

මෙම ප්‍රදේශයෙන් වාර්තා වූ මි.මී. 1,232ක් වූ සමුච්චිත කන්නමය වර්ෂාපතනය මි.මී. 815ක් වූ දිගු කාලීන සාමාන්‍යය හා සංසන්දනාත්මකව 50%ක පමණ වර්ධනයකි. නොවැම්බර් මාසයේදී හැරුණු විට කන්නය පුරාවටම ලද වර්ෂාපතනය මනාව ව්‍යාප්තව පැවතුණි. තවද, උඩරට බෝග කෙරෙහි අහිතකර පාංශු තෙතමන තත්ත්වයකින් තොර වූ කාලගුණික රටාවකින් යුතුව සෑම මාසයකදීම පැවති සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ලද වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක පැවතුණි.

කන්නයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 392ක් වූ අතර එය දිගු කාලීන සාමාන්‍ය හා සංසදනාත්මකව 22%ක වර්ධනයකි. අප්‍රේල් මාසය හැරුණු විට කන්නයේ සෙසු සෑම මාසයකදීම සාමාන්‍ය වැසි ඉක්මවා වැසි ලද මුත් එම මාස මි.මී. 100ක් හෝ ඊට වැඩි වර්ෂාවක් නොලද බැවින් තෙත කාලගුණයකින් යුත් මාස ලෙස සැලකිය නොහැකිය. මාර්තු හා මැයි මාස හැරුණු විට කන්නයේ අනෙකුත් සියළුම මාසවල සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය එම මාස වල සමුච්චිත වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක පැවතුණි. දැඩි සූර්ය රශ්මිය සහ වේගවත් සුළං සහිතව කන්නය පුරාවට අධික උණුසුම් කාලගුණයක් පැවති අතර දිවයිනේ වියළිම ප්‍රදේශය වශයෙන් මෙම වසරේදීද පැවති මෙම කාලගුණය අසාමාන්‍ය තත්ත්වයක් නොවීය.

වගු අංක 5.1: 2012/2013 මහ සහ යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය (මි.මී)

| කෘෂි කාලගුණික මධ්‍යස්ථානය | කෘෂි පාරිසරික කලාපය | 2012/13 මහ සැප්. - පෙබ. | දස වසරක මහ කන්නයේ සාමාන්‍යය (2002 - 11) | 2013 යල මාර්තු - අගෝ. | දස වසරක යල කන්නයේ සාමාන්‍යය (2002 - 11) |
|---|---|---|---|---|---|
| බෝඹුවල | $WL_{1b}$ | 1722.0 | 1510.2 | 1433.5 | 1569.3 |
| පේරාදෙණිය | $WM_{2\,b}$ | 1847.9 | 1025.4 | 1341.0 | 978.0 |
| සීතා එළිය | $WU_3$ | 1589.9 | 1121.8 | 1278.9 | 778.3 |
| බතලගොඩ | $IL_{1a}$ | 1558.5 | 1080.9 | 883.0 | 753.3 |
| මාකඳුර | $IL_{1a}$ | 1412.9 | 1086.1 | 1158.6 | 966.8 |
| මොණරාගල | $IL_{1c}$ | 1280.0 | 1343.7 | 570.8 | 623.4 |
| කුණ්ඩසාලේ | $IM_{3a}$ | 1590.5 | 869.3 | 897.4 | 574.1 |
| බණ්ඩාරවෙල | $IU_{3c}$ | 1623.1 | 1087.7 | 612.4 | 661.0 |
| මහ - ඉලුප්පල්ලම | $DL_{1b}$ | 1371.7 | 1026.3 | 381.8 | 401.8 |
| අඟුණකොළපැලැස්ස | $DL_{1b}$ | 1335.1 | 780.0 | 455.7 | 487.8 |
| අරලගංවිල | $DL_{2b}$ | 2333.4 | 1572.2 | 383.3 | 420.1 |
| වීරවිල | $DL_5$ | 1232.0 | 815.2 | 392.5 | 322.0 |

වගු අංක **5.2: 2012/13** මාසික වර්ෂාපතනය **(මි.මී)**

| කෘෂි කාලගුණික මධ්‍යස්ථානය | 2012 | | | 2013 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ. |
| බෝඹුවල | 427.9 | 528.7 | 325.5 | 217.9 | 36.5 | 185.5 | 211.6 | 155.6 | 467.8 | 302.9 | 231.1 | 64.5 |
| පේරාදෙණිය | 21.8 | 764.5 | 269.7 | 381.1 | 254.6 | 156.2 | 165.5 | 287.4 | 200.8 | 347.3 | 165.9 | 174.1 |
| සීතා එළිය | 68.2 | 440.9 | 271.2 | 391.0 | 235.7 | 182.9 | 162.0 | 170.1 | 171.9 | 378.7 | 233.7 | 162.5 |
| බතලගොඩ | 21.6 | 410.1 | 249.0 | 545.8 | 235.7 | 96.3 | 148.8 | 138.6 | 321.0 | 154.5 | 72.7 | 47.4 |
| මාකඳුර | 60.3 | 698.5 | 240.7 | 268.2 | 76.3 | 68.9 | 220.7 | 95.1 | 335.1 | 338.4 | 77.6 | 91.7 |
| මොණරාගල | 80.0 | 247.1 | 332.9 | 221.7 | 277.6 | 120.7 | 130.6 | 176.3 | 95.1 | 7.4 | 43.3 | 118.1 |
| කුණ්ඩසාලේ | 22.4 | 563.6 | 262.9 | 375.5 | 267.4 | 98.7 | 132.3 | 163.5 | 137.7 | 214.3 | 78.6 | 171.0 |
| බණ්ඩාරවෙල | 79.7 | 470.8 | 314.5 | 321.8 | 261.6 | 174.7 | 102.3 | 182.6 | 135.3 | 54.9 | 70.8 | 66.5 |
| මහ - ඉලුප්පල්ලම | 14.7 | 551.9 | 162.3 | 373.1 | 188.7 | 81.0 | 165.0 | 36.4 | 30.0 | 9.1 | 32.2 | 109.1 |
| අඟුණකොළපැලැස්ස | 99.3 | 315.7 | 369.1 | 254.7 | 164.2 | 132.1 | 112.2 | 87.2 | 146.6 | 64.5 | 41.3 | 3.9 |
| අරලගංවිල | 13.2 | 532.5 | 325.2 | 742.7 | 501.2 | 218.6 | 142.2 | 38.8 | 101.9 | 0.0 | 64.2 | 36.2 |
| වීරවිල | 47.6 | 326.7 | 241.8 | 371.2 | 129.2 | 115.5 | 82.5 | 22.5 | 181.0 | 37.9 | 25.5 | 43.1 |

**වගු අංක 5.3: මාසික වර්ෂාපතන මධ්‍යනාය මි.මී. (2002 - 2011)**

| කෘෂි කාලගුණික මධ්‍යස්ථානය | මාසය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ. |
| බෝඹුවල | 267.9 | 450.4 | 389.8 | 206.2 | 98.5 | 83.8 | 167.8 | 297.1 | 436.3 | 269.9 | 194.8 | 203.3 |
| පේරාදෙණිය | 127.0 | 255.5 | 308.1 | 172.4 | 96.1 | 61.5 | 167.5 | 292.9 | 124.0 | 142.8 | 137.1 | 113.8 |
| සීතා එළිය | 125.1 | 252.0 | 280.9 | 216.9 | 178.7 | 62.6 | 130.1 | 169.9 | 153.5 | 123.5 | 107.2 | 94.1 |
| බතලගොඩ | 107.9 | 327.1 | 313.6 | 179.3 | 88.4 | 57.4 | 136.1 | 258.6 | 113.3 | 94.1 | 77.7 | 73.6 |
| මාකඳුර | 159.5 | 388.0 | 299.5 | 113.4 | 64.6 | 49.6 | 152.6 | 235.6 | 220.2 | 172.7 | 92.1 | 93.7 |
| මොණරාගල | 114.4 | 310.3 | 395.4 | 269.5 | 180.5 | 79.6 | 116.5 | 257.9 | 106.7 | 23.1 | 41.4 | 77.9 |
| කුණ්ඩසාලේ | 75.9 | 182.5 | 249.7 | 177.6 | 107.7 | 72.0 | 117.5 | 178.6 | 80.7 | 72.2 | 58.1 | 66.9 |
| බණ්ඩාරවෙල | 110.9 | 289.6 | 288.2 | 202.0 | 127.7 | 67.2 | 150.6 | 221.6 | 135.0 | 47.9 | 46.3 | 59.6 |
| මහ - ඉලුප්පල්ලම | 91.4 | 269.0 | 295.6 | 189.7 | 104.5 | 70.6 | 101.5 | 182.9 | 57.9 | 10.6 | 21.2 | 27.7 |
| අඟුණකොළපැලැස්ස | 89.1 | 152.2 | 251.4 | 153.0 | 79.1 | 45.3 | 103.0 | 120.7 | 102.3 | 47.1 | 47.9 | 66.8 |
| අරලගංවිල | 53.9 | 274.7 | 405.0 | 409.5 | 289.6 | 151.0 | 97.8 | 136.3 | 73.4 | 20.4 | 33.3 | 59.1 |
| වීරවිල | 41.6 | 162.0 | 289.5 | 174.1 | 95.3 | 48.3 | 75.3 | 131.9 | 50.0 | 13.1 | 17.0 | 34.6 |

**වගු අංක 5.4: මාසික විභව වාෂ්පීකරණ උත්ස්වේදනය (මි.මී) – 2012/2013**

| කෘෂි කාලගුණික මධ්‍යස්ථානය | 2012 | | | | 2013 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ. |
| බෝඹුවල | 76.8 | 79.4 | 74.4 | 64.5 | 71.9 | 73.9 | 84.3 | 88.8 | 76.9 | 69.6 | 71.9 | 69.4 |
| පේරාදෙණිය | 76.8 | 76.9 | 52.8 | 62.0 | 81.8 | 73.9 | 79.4 | 81.6 | 69.4 | 55.2 | 57.0 | 71.9 |
| සීතා එළිය | 52.8 | 37.2 | 36.0 | 52.1 | 52.1 | 42.6 | 62.0 | 64.8 | 32.2 | 14.4 | 24.8 | 54.6 |
| බතලගොඩ | * | * | * | * | * | * | * | * | * | * | * | * |
| මාකඳුර | 79.2 | 104.2 | 81.6 | 74.4 | 84.3 | 78.4 | 116.6 | 103.2 | * | * | 81.8 | 89.3 |
| මොණරාගල | 110.4 | 104.2 | 74.4 | 69.4 | 69.4 | 69.4 | 81.8 | 86.4 | 89.3 | 69.6 | 96.7 | 76.9 |
| කුණ්ඩසාලේ | 100.8 | * | * | * | * | 53.8 | 69.4 | 74.4 | 74.4 | 57.6 | 84.3 | 76.9 |
| බණ්ඩාරවෙල | 72.0 | 64.5 | 50.4 | 54.6 | 67.0 | 62.7 | 79.4 | 76.8 | 74.4 | 62.4 | 74.4 | 86.8 |
| මහ - ඉලුප්පල්ලම | 122.4 | 74.4 | 48.0 | 37.2 | 52.1 | 51.5 | 76.9 | 84.0 | 94.2 | 98.4 | 106.6 | 106.6 |
| අඟුණකොළපැලැස්ස | 98.4 | 104.2 | 72.0 | 76.9 | 94.2 | 89.6 | 109.1 | 110.4 | 94.2 | 98.4 | 106.6 | 136.4 |
| අරලගංවිල | 144.0 | * | 67.2 | 57.0 | 64.5 | 65.0 | 79.4 | 86.4 | 109.1 | 156.0 | 148.8 | 146.3 |
| වීරවිල | * | 71.9 | 64.8 | 64.5 | 81.8 | 71.7 | 81.8 | 96.0 | 79.4 | 96.0 | 126.5 | 143.8 |

* - දත්ත නැත

**වගු අංක 5.5: උපරිම සහ අවම වායුගෝලීය උෂ්ණත්වය (සෙ$^0$) – 2012/2013**

| කෘෂි කාලගුණික මධ්‍යස්ථානය | 2012 | | | | | | | | 2013 | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැප්. | | ඔක්. | | නොවැ. | | දෙසැ. | | ජන. | | පෙබ. | | මාර්තු | | අප්‍රේල් | | මැයි | | ජූනි | | ජූලි | | අගෝ. | |
| | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. | උප. | අව. |
| බෝඹුවල | 30.6 | 24.3 | 30.9 | 23.6 | 31.4 | 23.4 | 30.9 | 23.1 | 31.0 | 22.4 | 31.7 | 23.7 | 32.1 | 23.8 | 32.4 | 24.4 | 31.2 | 25.3 | 29.9 | 24.4 | 30.1 | 24.3 | 30.1 | 24.2 |
| පේරාදෙණිය | 29.4 | 21.7 | 29.6 | 21.0 | 29.0 | 20.8 | 27.9 | 20.6 | 27.6 | 19.8 | 29.4 | 20.1 | 30.9 | 21.6 | 31.2 | 21.9 | 29.6 | 22.8 | 27.2 | 22.3 | 27.5 | 22.4 | 28.8 | 21.5 |
| සීතා එළිය | 19.5 | 13.0 | 20.0 | 12.9 | 20.2 | 12.5 | 18.7 | 11.8 | 18.9 | 9.9 | 19.5 | 10.4 | 20.8 | 10.8 | 22.1 | 12.5 | 20.9 | 13.8 | 18.1 | 13.0 | 18.5 | 13.1 | 19.9 | 12.8 |
| බතලගොඩ | 32.2 | 24.1 | 32.2 | 23.0 | 30.3 | 22.4 | 29.6 | 22.7 | 29.0 | 21.0 | 31.0 | 21.9 | 32.9 | 23.5 | 33.5 | 24.7 | 31.1 | 25.5 | 29.6 | 24.6 | 29.9 | 24.6 | 30.9 | 24.1 |
| මාකඳුර | 31.8 | 23.8 | 32.0 | 23.4 | 31.8 | 22.7 | 31.4 | 22.6 | 31.1 | 22.1 | 32.1 | 22.4 | 33.0 | 23.0 | 32.6 | 24.5 | 32.0 | 25.1 | 30.1 | 23.8 | 30.1 | 24.4 | 30.8 | 24.2 |
| මොණරාගල | 36.7 | 22.4 | 32.6 | 22.7 | 31.2 | 22.3 | 29.1 | 21.9 | 28.9 | 21.3 | 30.7 | 21.0 | 32.4 | 23.1 | 34.2 | 22.9 | 33.7 | 23.4 | 33.7 | 22.3 | 34.3 | 22.0 | 34.4 | 21.5 |
| කුණ්ඩසාලේ | 31.0 | 21.7 | 30.7 | 21.0 | 29.5 | 20.5 | 28.0 | 20.9 | 27.7 | 19.1 | 29.4 | 19.4 | 31.2 | 21.1 | 32.3 | 21.8 | 30.6 | 22.5 | 27.9 | 22.3 | 28.6 | 22.3 | 29.8 | 21.3 |
| බණ්ඩාරවෙල | 27.8 | 16.2 | 25.5 | 16.7 | 24.8 | 16.6 | 23.6 | 15.6 | 23.0 | 14.4 | 24.6 | 15.0 | 26.3 | 15.7 | 27.5 | 16.3 | 27.5 | 17.1 | 26.1 | 17.1 | 26.4 | 16.7 | 27.2 | 15.7 |
